# කාර්ය සාධන වාර්තාව

# 2017

ප්‍රධාන ලේකම් කාර්යාලය

සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

උතුරු මැද පළාත් සභාව

අනුරාධපුර

**+94252222238/ncpplanning@yahoo.com**

# ප්‍රධාන ලේකම්තුමාගේ පණිවිඩය



2017 වර්ෂයේ කාර්ය සාධන වාර්තාවට පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම ඉමහත් සතුටට කරුණකි. යථෝක්ත වර්ෂයේ උතුරු මැද පළාතේ සංවර්ධන ක්‍රියාවලිය මෙහෙයවමින් අපේක්ෂිත ඉලක්ක කරා පළාත රැගෙන යාමට කටයුතු කිරීමට හැකිවීම විශේෂ කොට සලකමි.

2016 වර්ෂයේ මෙන්ම 2017 වර්ෂයේදී ද පළාත් සභාව ප්‍රධාන කාර්යයන් 39 ක් ඔස්සේ සංවර්ධන ක්‍රියාවලිය මෙහෙය විය. අධ්‍යාපන, සෞඛ්‍ය, කෘෂිකර්මය, ප්‍රාදේශීය සංවර්ධන, වාරිමාර්ග, පශු සම්පත්, සමාජ ආරක්ෂණ හා සමාජ සුභසාධනය, ග්‍රාම සංවර්ධනය, පරිවාස හා ළමා රක්ෂණ සේවා, මාර්ග සංවර්ධන යන අංශ මේ අතරින් කැපී පෙනේ.

මධ්‍යම රජයෙන්, පළාත් අරමුදල්, හා වෙනත් විදේශීය අරමුදල් යටතේ පළාත් සංවර්ධන කාර්ය වඩාත් කාර්යක්ෂමව මෙන්ම ඵලදායීව ඉලක්කගත අරමුණු ළඟාකර ගැනීම සඳහා පළාත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා වෙනත් අනුබද්ධිත ආයතන මනාව මෙහෙය විය හැකි වූ වසරකි. ඒ නිසාම අපේක්ෂිත ඉලක්ක සාධනය කර ගැනීම සඳහා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අනෙකුත් අනුබද්ධිත ආයතන මනා අභිප්‍රේරණයකින්, කණ්ඩායමක් ලෙස කටයුතු කිරීම සඳහා මග පෙන්වීමට හැකිවීම තුළ 2016 වර්ෂයට සාපේක්ෂව ඉහළ කාර්ය සාධනයක් කරා පළාත රැගෙන යාමට හැකි වූ බව විශ්වාස කරමි.

විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමාගේ දිළිඳුකම පිටුදැකීම, මත් උවදුර මැඩලීම, සමාජ රැකවරණය තහවුරු කිරීම, යහපාලන සංකල්පය සමාජගත කිරීම වැනි ප්‍රමුඛ අභිමතාර්ථයන් සාධනය කර ගැනිම කෙරෙහි අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල ප්‍රතිපාදන යොදවමින් ඒ සඳහා ආරම්භයක් ලබා දීමට හැකි වූ වර්ෂයක් ලෙස 2017 වර්ෂය දකිමි.

විශේෂයෙන්ම පළාත් අධ්‍යාපන අංශය නගා සිටුවීම කෙරෙහි අභියෝගයක්ව පැවති භෞතික සම්පත් වල ඌනතාවය සැලකිය යුතු ප්‍රමාණයකින් මගහරවා ගැනීමට අධ්‍යාපන විශේෂ ව්‍යාපෘතිය තුළින් ලද සහය සිහිපත් කරන අතර උතුරු මැද පළාතට දැවැන්ත සමාජ ගැටළුවක්ව පවතින වකුගඩු රෝගය නිවාරණය සඳහා විවිධ වැඩසටහන් කිරීමට හැකි වීම ද 2017 වර්ෂය තුළ කැපී පෙනේ.

ඒ අනුව සමස්තයක් ලෙස 2017 වර්ෂය වඩාත් ඉලක්කගත වැඩසටහනක් හා සැලසුම් සහගතව ක්‍රියාත්මක කළ හැකි වූ, 2016 වර්ෂයට සාපේක්ෂව පළාතට ජයග්‍රහණ රැසක් අත්කර ගැනීමට හැකි වූත් සාර්ථක වර්ෂයක් ලෙස සිහිපත් කරන අතර 2017 වර්ෂයේ සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ගරු පළාත් ආණ්ඩුකාරතුමාගේ හා ප්‍රධාන අමාත්‍යතුමා ප්‍රමුඛ ගරු පළාත් අමාත්‍යතුමන්ලා හා ගරු මන්ත්‍රීතුමන්ලා ඇතුළු අමාත්‍යාංශ ලේකම්වරු, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු හා ආයතන ප්‍රධානීන් ලබාදුන් සහයෝගයට ස්තූතිවන්ත වෙමි.

එච්.එම්.පී.බණ්ඩාර,

ප්‍රධාන ලේකම්,

උතුරු මැද පළාත් සභාව,

අනුරාධපුර.

# ප්‍රවේශය



උතුරු මැද පළාත් සභාවේ ආයතන මගින් 2017 වසරේ ඉටුකරන ලද කාර්යයන්වල ප්‍රගතිය ඇතුළත් කාර්ය සාධන වාර්තාව සකස් කර ඉදිරිපත් කිරීමට ලැබීම සතුටට කරුණකි.

විවිධ මූලාශ්‍රයන්ගෙන් ලද ප්‍රතිපාදන උපයෝගී කරගනිමින් සංවර්ධන ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කළ හැකි විය. එහිදී යටිතල පහසුකම් සංවර්ධනය, සමාජ සුභසාධනය, සමාජ ආරක්ෂණය යන අංශයන් කෙරෙහි වැඩි අවධානය යොමු කරමින් සංවර්ධන කාර්යයන් සාර්ථකව ක්‍රියාත්මක කිරීමටත් ඒවායේ ප්‍රතිඵල හා ප්‍රතිලාභ පළාතේ මහජනතාවට සමීප කිරීමටත් හැකිවීම පළාත ලද ජයග්‍රහණයකි.

පළාතේ දැක්ම ළඟාකර ගැනීම සඳහා සකස් කර ක්‍රියාත්මක කරන ලද සැලසුම්, වැඩසටහන්, ව්‍යාපෘති, ජාතික හා ජාත්‍යන්තර ප්‍රතිපත්තින් [තිරසර සංවර්ධන අභිමතාර්ථ] ද සැලකිල්ලට ගනිමින් වර්ෂයේ සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කළ හැකි විය.

විශේෂයෙන්ම අධ්‍යාපන, සෞඛ්‍ය ක්ෂේත්‍රය හා සමාජ ආරක්ෂණ සේවා ,කෘෂිකර්ම හා සත්ත්ව නිෂ්පාදන, ග්‍රාමීය යටිතල පහසුකම්, ග්‍රාම සංවර්ධන යන අංශයන්ගේ සංවර්ධන කටයුතු ද ,පළාත් මාර්ග පද්ධතිය තුළ අවශ්‍යයෙන්ම සංවර්ධනය කළ යුතු ග්‍රාමීය මාර්ග ද ඇතුළුව පළාත් මාර්ග පද්ධතිය තුළ සැලකිය යුතු සංවර්ධනයක් ඇති කිරීමටත්, පළාතේ ආදායම් උත්පාදන මාර්ග පුළුල් කිරීමටත් ,පළාත් සංචාරක අංශයේ සංවර්ධනය උදෙසා අත්‍යාවශ්‍ය යටිතල පහසුකම් සැලකිය යුතු මට්ටමකින් සංවර්ධනය කිරීමටත්, පළාතේ ජනතාවට ප්‍රබල අභියෝගයක්ව පැවති පිරිසිදු පානීය ජලය ලබා ගැනීම සඳහා පානීය ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් පළාතේ ප්‍රබල ගැටලුවක්ව පවතින වකුගඩු රෝග නිවාරණ කටයුතු සඳහා දායකත්වය සැපයීමත් ඇතුළු පළාතේ ප්‍රමුඛ ගැටළුවලට යම් සාධනීය මට්ටමකින් සම්බන්ධවීමටත් හැකිවූ වසරක් ලෙසද සඳහන් කරමි.

එපමණක් ද නොව විදේශ අරමුදල් යටතේ ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධීකරණය කරමින් හා විමධ්‍යගත වැඩසටහන ක්‍රියාත්මක කරමින් සමස්ත පළාත් සංවර්ධන වැඩසටහන නියාමනය හා ඇගැයුම් කරමින් සංවර්ධනාත්මක දිශානතියකට යොමු කළ හැකි විය.

එසේම පළාතේ සංවර්ධන ක්‍රියාවලිය වඩාත් තිරසර පදනමක් තුළ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සංවර්ධන සැලස්මක් සකස් කිරීමේ කාර්යය ''තිරසර, ඒකාබද්ධ ප්‍රතිඵල පාදක සංවර්ධන සැලැස්ම''නමින් ග්‍රාම නිළධාරි කොට්ඨාශ මට්ටමින් සැකසීම ආරම්භ කිරීමට හැකිවීම ඉතාමත් සතුටට කරුණකි.

මෙම සංවර්ධන ක්‍රියාවලියේදී ගරු ආණ්ඩුකාරතුමා, ගරු ප්‍රධාන අමාත්‍ය තුමා ,ගරු පළාත් සභා අමාත්‍යතුමන්ලා සහ ගරු මන්ත්‍රීතුමන්ලා ද, පළාත් පාලන ආයතන නිලධාරීන් , ප්‍රධාන ලේකම්තුමා, අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානින් හා ප්‍රාදේශිය ලේකම්තුමන්ලා ඇතුළු අනෙකුත් රාජ්‍ය ආයතන හා සංවිධාන ද ප්‍රජා දායකත්වය ද සපයමින් පළාත් සංවර්ධන කාර්යය ශක්තිමත්කර ගැනීම සඳහා දායකත්වය සැපයූ සියළු දෙනාම ද ගෞරවයෙන් සිහිපත් කරමි.


පී.බී . දයාරත්න,

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ( සැලසුම් ),

ප්‍රධාන ලේකම් කාර්යාලය,

උතුරු මැද පළාත.

# උතුරු මැද පළාත





රජරට නුවරකලාවිය නොහොත් වැව් බැඳි රාජධානිය ලෙස විරුධාවලිය ලද උතුරු මැද පළාත, ශ්‍රී ලංකාවේ ප්‍රථම සහ ද්විතීය රාජධානි ඇතුළත් වූ අතිශයින්ම පුණ්‍යවන්ත වූ ස්වර්ණ භූමියකි.

අනුරාධපුර සහ පොළොන්නරුව ලෙස වර්තමානයේදී භාවිතාවන පරිපාලන දිස්ත්‍රික්ක දෙකෙන් සමන්විත උතුරු මැද පළාත එයටම ආවේණික, අනන්‍ය, අද්විතීය අගයන්ගෙන් හා ශ්‍රී විභූතීන්ගෙන් සමන්විතය. අග්‍රගණ්‍ය සහ අසමසම අගයන් හා ජාතික උරුමයන් රැසක් දැයට දායාද කරමින් එම පෞඩත්වය මිහිදන්ව සහ ඇතැම් විට ඉස්මතු වී පෙනෙමින් ශ්‍රේෂ්ඨ ජාතියක විශ්මයජනක ගමන් මඟ යළි යළිත් සුජාතවන පරපුරට නිහඬව කියා දෙයි. සිංහල රාජ්‍ය වංශකතාව, ශිෂ්ටාචාරය හා සංස්කෘතියේ ප්‍රභවය හා විකාශනය මෙන්ම සිදු වූ ප්‍රවණතා පිළිබඳ සැලකීමේදී ශ්‍රී ලංකාව සංවර්ධිත රටක් බවට පත් කිරීමේදී ඒ සඳහා අවශ්‍යවන ඓතිහාසික ශක්තිමත් අඩිතාලම රජරටින් සපයයි.



ශ්‍රී ලංකාවේ ජනාවාසකරණය, ජල ශිෂ්ටාචාරය රාජ්‍ය වංශ කතාව, දේශපාලනය, කළමනාකරණය හා පරිපාලනය, බෞද්ධ දර්ශනය, පුරාවිද්‍යාව-වාස්තු විද්‍යාව, මූර්ති හා කැටයම් කලාව, භාෂාව හා සාහිත්‍ය, ආදී සංස්කෘතිකාංග මෙන්ම ඒ මත ගොඩනැගුණු ශිෂ්ටාචාරයන් හා සභ්‍යත්වයන් ලොවට කියාපාන්නේ රජරට පුණ්‍ය භූමියෙන් ය. නවතම ප්‍රතිපත්ති, සැලසුම්, ක්‍රමෝපායන් සහ තාක්ෂණය සොයා අප යා යුතු වන්නේ රජරට පැවති ශ්‍රී විභූතිය වෙතට ගමන් කිරිමෙනි.




ක්‍රි.පූ. 543 දී පමණ එනම් සම්බුද්ධ පරිනිර්වාණ දිනයේදීම සිදු වූ විජයාවතරණයෙන් පසු අනුරාධ නම් සෙනෙවියෙකු අනුරාධ නැකතින් මල්වතු ඔය අසල අනුරාධපුර ජනාවාසය ආරම්භ කරන ලදී. ක්‍රි.පූ. 4 දී පමණ ජෝතිය නැමැති ජෛන බමුණකුගේ සැලසුමකට අනුව පණ්ඩුකාභය රජතුමා විසින් අනුරාධපුර නගරය නිර්මාණය කර ඇත. එම නගර නිර්මාණය වර්තමානයේදී අගනගර නිර්මාණයේදී අනුගමනය කරනු ලබන අංගෝපාංග බහුතරයකගෙන් සමන්විත වී තිබීම විශ්මයජනකය.

පොළොන්නරුව මුලින්ම අගනුවර කරගත්තේ චෝල ආක්‍රමණිකයන් විසින්ය. ක්‍රි.ව 1070 පමණ චෝල ආක්‍රමණිකයන් පළවා හැර පළමුවන විජයබාහු රජු විසින් අගනුවර ලෙස පොළොන්නරුව තෝරා ගෙන ඇත. චෝල පාලන සමයේදී ජනනාතමංගලම් ලෙස හැඳින් වූ පොළොන්නරු යුගය කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ දී ශ්‍රී ලංකාවේ කැපී පෙනෙන වකවානුවකි. අනුරාධපුර මෙන්ම ජල ශිෂ්ටාචාරය මත පදනම් වූ මෙම යුගය විශ්මිත කලා නිර්මාණ හා භාෂා සාහිත්‍ය අතින්ද ස්වර්ණමය යුගයකි. එම කාලයේදී මෙරටින් පිට රටට පවා සහල් යැවූ බව පැරණි පොත පතෙහි සඳහන් වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වන සංශෝධනයට සමගාමීව 1987 අංක 42 දරණ පළාත් සභා පණතින් සැලසුණු අවකාශයට අනුව ශ්‍රී ලංකාවේ පළාත් සභා ක්‍රමය ස්ථාපිත විය. මේ අනුව යහපාලන සංකල්පයට අනුගත වීම රජයේ ප්‍රධාන අරමුණක් වන අතර ඊට අනුව යමින් ශ්‍රී ලංකාවේ දේශපාලන හා පරිපාලන ව්‍යුහය තුළ පළාත් සභා ක්‍රමය හැරවුම් ලක්ෂයක් වන අතර පළාත් සභා ක්‍රමය තුළින් බලය බෙදා හැරීම සහ ප්‍රාදේශීයව පවත්නා සමාජ ආර්ථික සංවර්ධන විෂමතා අවම කිරීම සඳහා මූලික දායකත්වයක් පළාත තුළින් සපයා ඇත. මධ්‍යම රජයට අමතරව මධ්‍යම රජයේ නියාමනයට අනුව පළාතේ සංවර්ධන පරිපාලන සමාජ සුභසාධන හා සමාජ ආරක්ෂණ මෙන්ම පුනරුත්ථාපන හා ප්‍රතිසංවර්ධන කටයුතු වලදී ද ප්‍රධානම කළමනාකරණ කේන්ද්‍රස්ථානය වන්නේ පළාත් සභාවයි. පළාතක ජන ජීවිතයේ යහපැවැත්ම, සමෘද්ධිමත් බව, සුභසිද්ධිය, තිරසාර බවට බාධා පමුණුවන පීඩාවන්, ප්‍රබල අභියෝග හා ගැටලු හඳුනාගෙන ඒ සඳහා තිරසාර, කඩිනම්, විධිමත් සහ ඉලක්කගත පිළියම් යෙදීමට පළාත් සභා ක්‍රමය යොදාගෙන ඇත.







පරිපාලන දිස්ත්‍රික්ක අටකින් ද [8] මායිම්ව පිහිටා ඇති උතුරු මැද පළාත, දිවයිනේ විශාලම පරිපාලන දිස්ත්‍රික්කය වේ. පළාතේ සම්පූර්ණ ජනගහනය 1,401,561ක් වන අතර මුළු භූමි ප්‍රමාණය වර්ග කිලෝ මීටර 10,645ක් පමණ වේ. එය ශ්‍රී ලංකාවේ සමස්ත භූමි ප්‍රමාණයෙන් 16% ක ප්‍රමාණයකි. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ විසිනවයකින් ද [29], මහනගර සභා දෙකකින් ද [02], ප්‍රාදේශීය සභා විසිපහකින් ද [25], ග්‍රාම නිලධාරී වසම් නමසිය අසූ අටකින් ද [988] සමන්විත වේ. උතුරු මැද පළාතේ ජනගහනය ශ්‍රී ලංකාවේ සමස්ත ජනගහනයෙන් 6.5%ක පමණ ප්‍රතිශතයකි. පළාතේ මුළු පවුල් සංඛ්‍යාව 365,000 ක් පමණ වන අතර සමෘද්ධි සහනාධාර හිමි පවුල් සංඛ්‍යාව 83,180ක් පමණ වේ. දළ දේශීය නිෂ්පාදිතයට පළාතෙන් කරනු ලබන දායකත්වය 5.8%ක ප්‍රතිශතයකි.

ජනසනත්වය දෙස බැලීමේදී වර්ග කිලෝ මීටර එකක පදිංචි පුද්ගලයන් සංඛ්‍යාව 142 කි. මෙහිදී විශේෂත්වය වන්නේ ජනසනත්වය අනුව පොළොන්නරුව දිස්ත්‍රික්කයට වඩා අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජනසනත්වය ඉහළ අගයක් ගැනීමයි. පළාතේ භූමි ප්‍රමාණයෙන් විවිධ ප්‍රමාණයේ ජලාශයන්ගෙන් වර්ග කිලෝ මීටර 782ක් පමණ ආවරණය වී ඇත. සමස්ත ජනගහනයෙන් 5%ක් පමණ නාගරිකව ජීවත් වේ. පළාතේ පවතින විවිධ සම්පත් සහ විභව ශක්තීන් අතර මානව සම්පත, සරුසාර පස, ජලය, වනාන්තර, දැව, පොස්පේට්, රෝස තිරුවානා, සත්ව හා මිරිදිය, ධීවර සම්පත, පරිසර පද්ධතිය සහ විශේෂයෙන්ම එල්ලංගා ස්වරූපයේ වාරි පද්ධතිය සහ 250,000 ද ඉක්මවා ඇති පළාතේ ගව සම්පත විශේෂිත වේ.

# උතුරු මැද පළාතේ වැදගත් සමාජ ආර්ථික තොරතුරු

## 01. භූමි ප්‍රමාණය හා විශාලත්වය

| දිස්ත්‍රික්කය | ප්‍රමාණය(ව.කි.මී) | | |
|---|---|---|---|
| | ගොඩබිම් ප්‍රමාණය | අභ්‍යන්තර ජලාශ | මුළු භූමි ප්‍රමාණය |
| අනුරාධපුර | 6,601 | 578 | 7,179 |
| පොළොන්නරුව | 3,262 | 204 | 3,466 |
| උතුරු මැද පළාත | 9,863 | 782 | 10,645 |

මූලාශ්‍රය: මූලික සංඛ්‍යාන අත්පොත 2015,සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## 02. ජනගහනය හා ජනඝනත්වය [2016]

| විස්තරය | 2012 | 2016 |
|---|---|---|
| මුළු ජනගහනය | 1,260,000 | 1,401,561[රැස් කරන ලද දත්ත] |
| ජන්ද හිමි ජනගහනය | 967516[2015] | 982,568 |
| නාගරික ජනගහනය | 50,595 | 700,078 ඇස්තමේන්තුගත |
| ග්‍රාමීය ජනගහනය | 121,652 | 1,331,483 ඇස්තමේන්තුගත |
| ජනඝනත්වය | 128 | 142 |

මූලාශ්‍රය: රැස් කරන ලද තොරතුරු, සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## 03. සමාජ ආර්ථික දර්ශක [2015/2016]

| විස්තරය | 2015 | 2016 |
|---|---|---|
| පළාත් දළදේශීය නිෂ්පාදිතය [රු.මිලියන] | 607,000 | - |
| ජාතික නිෂ්පාදිතයට පළාතේ දායකත්වය [%] | 5.4 | |
| සමෘද්ධි ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 86,126 | 83,180 |
| දරිද්‍රතා අනුපාතය | [2012/2013] 7.3 | 3.3 |
| විරැකියා අනුපාතය [2014] | 3.3 | - |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව,2017

## 04. අධ්‍යාපන

| විස්තරය | 2015 | 2016 | 2017 |
|---|---|---|---|
| පාසල් සංඛ්‍යාව | 806 | 811 | 814 |
| ගුරුවරුන් සංඛ්‍යාව | 16,101 | 16,264 | 16.674 |
| ශිෂ්‍ය සංඛ්‍යාව | 273,806 | 280,963 | 289.971 |
| ගුරු සිසු අනුපාතය | 1:17 | 1:17 | 1:17 |
| පරිගණක සාක්ෂරතාව [%] | 21.2 | 21.6 | 20.9 |

මූලාශ්‍රය:පාසල් නාමාවලිය හා අධ්‍යාපනික දත්ත 2018 , උතුරු මැද පළාත

## 05. ජාතික විභාග ප්‍රතිඵල

| විස්තරය | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|
| අ.පො.ස.සා.පෙළ සමත් ප්‍රතිශතය (උ.පෙ.සඳහා සුදුසුකම් ලැබූ) | 65.25 | 66.61 | 69.94 | 70.03 |
| අ.පො.ස උ.පෙ. සමත් ප්‍රතිශතය (විශ්ව විද්‍යාල ප්‍රවේශය ලැබීමට සුදුසුකම් ලැබූ) | 59.12 | 59.56 | 63.36 | 63.01 |

මූලාශ්‍රය:පාසල් නාමාවලිය හා අධ්‍යාපනික දත්ත 2018, උතුරු මැද පළාත

## 06. සෞඛ්‍ය තොරතුරු

| විස්තරය | 2014 | 2015 | 2016 |
|---|---|---|---|
| දළ උපත් අනුපාතිකය | 17.5 | 17.2 | 17.0 |
| දළ මරණ අනුපාතිකය | - | 5.5 | 5.1 |
| ළදරු උපත් අනුපාතිකය | 7.3 | - | - |

මූලාශ්‍රය: සමාජ ආර්ථික සංඛ්‍යාලේඛන දත්ත 2017, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 07. අනෙකුත් සෞඛ්‍ය අංශය හා සම්බන්ධ තොරතුරු

| විස්තරය | 2017 |
|---|---|
| ශික්ෂණ රෝහල් සංඛ්‍යාව | 1 |
| මහ රෝහල් සංඛ්‍යාව | 1 |
| මූලික රෝහල් සංඛ්‍යාව | 5 |
| ප්‍රාදේශීය රෝහල් සංඛ්‍යාව | 48 |
| ප්‍රාථමික සෞඛ්‍ය සත්කාර ඒකක සංඛ්‍යාව | 35 |

මූලාශ්‍රය: මූලික සංඛ්‍යාන අත්පොත 2015, සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## 08. කෘෂි නිෂ්පාදනය

| විස්තරය | 2015/2016 මහ | 2016 යල |
|---|---|---|
| වී වගා කරන භූමි ප්‍රමාණය (හෙක්.දහස්) | 161.5 | 112.5 |
| වාර්ෂික වී නිෂ්පාදනය (මෙ.ටො.දහස්) | 657.3 | 466.3 |
| අතිරේක ආහාර බෝග නිෂ්පාදනය (මෙ.ටො) | 87,989 | - |
| වාර්ෂික එළවළු නිෂ්පාදනය ( මෙ.ටො) | 40,959 | - |
| | 2015 | 2016 |
| වාර්ෂික මිරිදිය ධීවර නිෂ්පාදනය (මෙ.ටො) | 23860(2014) | - |
| වාර්ෂික කිරි නිෂ්පාදනය (ලීටර් මිලියන) | 35.9 | - |

මූලාශ්‍රය: මූලික සංඛ්‍යාන අත්පොත 2015, සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## 09. සමාජ තත්වය


| විස්තරය | 2012/2013 |
|---|---|
| විදුලිබල පහසුකම් සහිත නිවාස (%) | 87.4 |
| ආරක්ෂිත පානීය ජල පහසුකම් සහිත පවුල් (%) | 93.4 |
| ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් සහිත නිවාස (%) | 98.6 |
| ස්ථිර තත්වයේ නිවාස (%) | 94.6 |

මූලාශ්‍රය: මූලික සංඛ්‍යාන අත්පොත 2015, සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## 10. දළදේශීය නිෂ්පාදිතයට පළාතේ දායකත්වය

| අංශය | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|
| කෘෂිකාර්මික | 60,451 | 71,682 | 82,107 | 73,640 |
| කාර්මික | 104,018 | 104,514 | 121,752 | 134,287 |
| සේවා | 291,827 | 346,932 | 393,420 | 424,443 |
| **එකතුව** | **489,622** | **561,261** | **643,673** | **690,728** |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව, 2017




## 11. මධ්‍යන්‍ය මාසික ආදායම

| අංශය | 2003/04 | | 2016 | |
|---|---|---|---|---|
| | උ.මැ.ප | ශ්‍රී ලංකාව | උ.මැ.ප | ශ්‍රී ලංකාව |
| ඒක පුද්ගල ආදායම | 3,814 | 3,968 | 16,567 | 16,377 |
| කුටුම්භ ආදායම | 15,624 | 17,109 | 60,298 | 62,237 |
| ආදායම් ලබන්නෙකුගේ ආදායම | 11,093 | 10,754 | 35,186 | 33,894 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව, 2017

## දැක්ම

සංවර්ධනයේ ප්‍රතිලාභ මැනවින් හිමිකරගත් අභිමානවත් ප්‍රජාවක්.

## මෙහෙවර

සියළුම පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන්, පළාතේ පවතින සියළුම සම්පත්වල හා විභවතාවන්ගෙන් ප්‍රශස්ථ උපයෝජනයෙන්, පළාතේ මානව සම්පත් සංවර්ධනය ප්‍රමුඛ කරගත් ආර්ථික සංවර්ධන ප්‍රවේශයකින් විනිවිදභාවයෙන් යුතුව පළාත සංවර්ධනය කරමින් ජාතික සංවර්ධනයට ඍජු හා අඛණ්ඩ ලෙස දායක වීම.

## පළාත් සභාවේ ප්‍රධාන කාර්යයන්

- නීතිය හා සාමය පවත්වාගෙන යාම.
- පළාත් සභා පරිපාලනය.
- මූල්‍ය කළමනාකරණය.
- මානව සම්පත් කළමනාකරණය.
- ඉඩම් පරිපාලනය හා සංවර්ධනය.
- වාරිමාර්ග සංවර්ධනය.
- කෘෂිකර්ම සංවර්ධනය.
- පශු සම්පත් සංවර්ධනය.
- කර්මාන්ත සංවර්ධනය.
- ප්‍රාදේශීය සංවර්ධනය.
- සමූපකාර සංවර්ධනය.
- ප්‍රජා සංවර්ධනය.
- රෝහල් සේවාවන් සංවර්ධනය හා පවත්වාගෙන යාම.
- මහජන සෞඛ්‍ය සේවාවන් සංවර්ධනය.
- පොදු සෞඛ්‍ය සේවාවන් සහ පෝෂණ කටයුතු.
- දේශීය වෛද්‍ය සේවාවන්.
- පර්යේෂණ හා සංවර්ධන.
- ප්‍රාථමික හා ද්විතීක අධ්‍යාපනය.
- අධ්‍යාපන ප්‍රවේශය සහ සහභාගීත්වය දියුණු කිරීම.
- අධ්‍යාපන සැලසුම් හා පාලන සේවා.
- ක්‍රීඩා සංවර්ධනය.
- සංස්කෘතික සංවර්ධනය.
- සමාජ ආරක්ෂණය හා සමාජ සුභසාධනය.
- සංවර්ධන සැලසුම්කරණය හා මෙහෙයවීම.
- මාර්ග සංවර්ධනය.
- තොරතුරු තාක්ෂණය.
- මාර්ගස්ථ මගී ප්‍රවාහනය.
- ග්‍රාම සංවර්ධනය.
- ඉදි කිරීම් සහ ඉංජිනේරු සේවා.
- නිවාස සංවර්ධනය.
- පළාතේ විගණන හා විමර්ශන කටයුතු.
- පළාතේ ප්‍රතිපත්ති, සැලසුම්කරණය හා පසුවිපරම් කටයුතු.
- පළාත් ආදායම් කටයුතු.
- පළාත් පාලන කටයුතු.
- සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ.
- සංස්කෘතික හා කලා සංවර්ධනය.
- මුල් ළමාවිය සංවර්ධනය.
- පරිවාස හා ළමාරක්ෂක.
- මාර්ග සංවර්ධන හා මගී ප්‍රවාහන කටයුතු.

## පළාත් ගීතය

දිලේ රන්වැලි සෑ හිසින් හිරු
රන් කිරණ ගෙන සිළුමිණේ
සැලේ මහ බෝ ළදළු පවනින්
සිසිල පතුරා බුදු ගුණේ

සයුරු පරදන වැව් තලා මත
සිය දහස් සියපත් පිපේ
අත වනා සිරිකතට හිනැහෙයි
රන් කරල් පුලතිසි කෙතේ

සව් සිරින් ගැදි පැදි කුසුම් මී
පන් හිඳෙන් උතුරා හැලේ
රළු පරළු සෙල් කුළු මෙලෙක් වී
රූ රටා විස්කම් මැවේ


සියකමින් නොව යුතුකමින් සිත්
පහන් කළ විරු පරපුරේ
ගැමුණු පැරකුම් රජුන් විකුමන්
දිසෙයි යළි රජරට බිමේ

| | | |
|---|---|---|
| පද රචනය | - | පූජ්‍ය පල්ලේගම හේමරතන හිමි |
| සංගීතය | - | විශාරද කරුණාරත්න විජේවර්ධන |


## පළාත් පුෂ්පය [ඇහැල මල]



## පළාත් ධජය



# උතුරු මැද පළාත - ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ





## අනුරාධපුර දිස්ත්‍රික්කය

1. ගලෙන්බිඳුණුවැව
2. ගල්නෑව
3. හොරොව්පොතාන
4. ඉපලෝගම
5. කහටගස්දිගිලිය
6. කැබිතිගොල්ලෑව
7. කැකිරාව
8. මහවිලච්චිය
9. මැදවච්චිය
10. මිහින්තලේ
11. නාච්චාදූව
12. නොච්චියාගම
13. මධ්‍යම නුවරගම් පළාත
14. නැගෙනහිර නුවරගම් පළාත
15. පදවිය
16. පලාගල
17. පලුගස්වැව
18. රාජාංගනය
19. රඹෑව
20. තලාව
21. තඹුත්තේගම
22. තිරප්පනේ

## පොළොන්නරුව දිස්ත්‍රික්කය

1. දිඹුලාගල
2. ඇලහැර
3. හිඟුරක්ගොඩ
4. ලංකාපුර
5. මැදිරිගිරිය
6. තමන්කඩුව
7. වැලිකන්ද


උතුරු මැද පළාත් සභා සංවිධාන ව්‍යුහය

## උතුරු මැද පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමන්, ගරු ප්‍රධාන අමාත්‍යතුමන් ඇතුළු ගරු අමාත්‍ය මණ්ඩලය.

| අ.අ | තනතුර | නම |
|---|---|---|
| 01 | උතුරු මැද පළාත් ගරු ආණ්ඩුකාරවර | පී.බී.දිසානායක මැතිතුමා |
| 02 | උතුරු මැද පළාත් නීතිය හා සාමය, මුදල් හා ක්‍රමසම්පාදන, පළාත් පාලන, ග්‍රාමීය යටිතල පහසුකම් හා විශේෂ ව්‍යාපෘති, සංචාරක, අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ ඉංජිනේරු ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු ප්‍රධාන අමාත්‍ය | එස්.එම්.පේෂල ජයරත්න බංඩාර මැතිතුමා |
| 03 | උතුරු මැද පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, පරිසර සහ පළාත් සභා කටයුතු පිළිබඳ ගරු අමාත්‍ය | එම්.හේරත් බණ්ඩා මැතිතුමා |
| 04 | පළාත් ඉඩම්, වාරිමාර්ග, මහා මාර්ග, නිවාස,ග්‍රාම සංවර්ධන හා කාන්තා කටයුතු පිළිබඳ ගරු අමාත්‍ය | ඩබ්.කේ.සරත් ඉලංගසිංහ මැතතුමා |
| 05 | උතුරු මැද පළාත් කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ව නිෂ්පාදන, සත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු පිළිබඳ ගරු අමාත්‍ය | සම්පත් ශ්‍රී නිලන්ත වික්‍රමආරච්චි මැතිතුමා |
| 06 | උතුරු මැද පළාත් සමුපකාර, වෙළෙඳ හා ආහාර, ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ කර්මාන්ත සංවර්ධන කටයුතු පිළිබඳ ගරු අමාත්‍ය | සුසිල් ගුණරත්න මැතිතුමා |

## උතුරු මැද පළාත් සභාවේ ගරු ධුරධාරී මන්ත්‍රීවරුන්

| අ.අ | නම | තනතුර | පක්ෂය |
|---|---|---|---|
| 1 | ගරු ඩී.එම්.අමරතුංග මැතිතුමා | සභාපති | එක්සත් ජාතික පක්ෂය |
| 2 | ගරු ජයන්ත මාරසිංහ මැතිතුමා | නියෝජ්‍ය සභාපති | එක්සත් ජනතා නිදහස් සන්ධානය |
| 3 | ගරු අනිල් රත්නායක මැතිතුමා | විපක්ෂනායක | එක්සත් ජාතික පක්ෂය |
| 4 | ගරු එන්.වී.සමන්ත මැතිතුමා | සභානායක (2017.09.19 දින) | එක්සත් ජනතා නිදහස් සන්ධානය |
| 5 | ගරු කල්‍යාණවතී කරල්ලියද්ද මැතිතුමිය | ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක | එක්සත් ජනතා නිදහස් සන්ධානය |
| 6 | ගරු.එම්.එම්.ඩොනල්ඩ් මැතිතුමා | විපක්ෂයේ ප්‍රධාන සංවිධායක(2017.05.09) | එක්සත් ජාතික පක්ෂය |

## උතුරු මැද පළාත් සභාවේ ගරු මන්ත්‍රීවරුන්

| | | | |
|---|---|---|---|
| 1 | ගරු එස්.එම්.රංජිත් සමරකෝන් මැතිතුමා.(හිටපු ගරු අමාත්‍යතුමා) | පළාත් සභා මන්ත්‍රී | එක්සත් ජනතා නිදහස් සන්ධානය. |
| 2 | ගරු ආර්.එම්.පී.බී.රත්නායක මැතිතුමා.( හිටපු ගරු අමාත්‍යතුමා) | පළාත් සභා මන්ත්‍රී | එක්සත් ජනතා නිදහස් සන්ධානය. |
| 3 | ගරු කේ.එච්.නන්දසේන මැතිතුමා. ( හිටපු ගරු අමාත්‍යතුමා) | පළාත් සභා මන්ත්‍රී | එක්සත් ජනතා නිදහස් සන්ධානය. |
| 4 | ගරු එච්.බී.සේමසිංහ මැතිතුමා. ( හිටපු ගරු අමාත්‍යතුමා) | පළාත් සභා මන්ත්‍රී | එක්සත් ජනතා නිදහස් සන්ධානය. |
| 5 | ගරු ජී.වීරසේන මැතිතුමා. | පළාත් සභා මන්ත්‍රී | එක්සත් ජනතා නිදහස් සන්ධානය. |
| 6 | ගරු ටී.එම්.ආර්.සිරිපාල මැතිතුමා. (හිටපු ගරු සභාපති) | පළාත් සභා මන්ත්‍රී | එක්සත් ජනතා නිදහස් සන්ධානය. |
| 7 | ගරු.ජී.ජී.චන්ද්‍රසේන මැතිතුමා. | පළාත් සභා මන්ත්‍රී | එක්සත් ජනතා නිදහස් සන්ධානය. |
| 8 | ගරු ඩබ්ලිව්.එම්.උපාලි විජේකෝන් මැතිතුමා. | පළාත් සභා මන්ත්‍රී | එක්සත් ජනතා නිදහස් සන්ධානය. |
| 9 | ගරු ඒ.අතුකෝරළ මැතිතුමා. | පළාත් සභා මන්ත්‍රී | එක්සත් ජනතා නිදහස් සන්ධානය. |
| 10 | ගරු ජනක් මහේන්ද්‍ර අධිකාරි මැතිතුමා. | පළාත් සභා මන්ත්‍රී | එක්සත් ජනතා නිදහස් සන්ධානය. |
| 11 | ගරු පී.බී.කුමාර මැතිතුමා. | පළාත් සභා මන්ත්‍රී | ජාතික නිදහස් පෙරමුණ |
| 12 | ගරු කේ.පි.සරත් කුමාරසිරි මැතිතුමා. | පළාත් සභා මන්ත්‍රී | එක්සත් ජනතා නිදහස් සන්ධානය. |
| 13 | ගරු අබ්දුල් රහීම් අබ්දුල් හුසේන් මැතිතුමා. | පළාත් සභා මන්ත්‍රී | එක්සත් ජනතා නිදහස් සන්ධානය. |
| 14 | ගරු වසන්ත සමරසිංහ මැතිතුමා. | පළාත් සභා මන්ත්‍රී | ජනතා විමුක්ති පෙරමුණ |
| 15 | ගරු එස්.එච්.එම්.අන්සාර් මැතිතුමා. | පළාත් සභා මන්ත්‍රී | එක්සත් ජාතික පක්ෂය |
| 16 | ගරු එච්.ජී.පී.කේ.කේ නෙල්සන් මැතිතුමා. | පළාත් සභා මන්ත්‍රී | එක්සත් ජාතික පක්ෂය |
| 17 | ගරු එස්.ඒ.ජනක ප්‍රියන්ත සමරසිංහ මැතිතුමා. | පළාත් සභා මන්ත්‍රී | එක්සත් ජාතික පක්ෂය |
| 18 | ගරු කේ. අනුරාධනායක මැතිතුමා. | පළාත් සභා මන්ත්‍රී | එක්සත් ජාතික පක්ෂය |
| 19 | ගරු ආර්.එම්.ප්‍රසන්න මහින්දරත්න මැතිතුමා. | පළාත් සභා මන්ත්‍රී | එක්සත් ජාතික පක්ෂය |
| 20 | ගරු අරුණ බුද්ධික ගුණසේකර මැතිතුමා. | පළාත් සභා මන්ත්‍රී | එක්සත් ජාතික පක්ෂය |
| 21 | ගරු ඩබ්ලිව්.එම්.රෝහණ බංඩාර විජේසුන්දර මැතිතුමා. | පළාත් සභා මන්ත්‍රී | එක්සත් ජාතික පක්ෂය |
| 22 | ගරු පී.සහීදු මැතිතුමා. | පළාත් සභා මන්ත්‍රී | එක්සත් ජාතික පක්ෂය |

## පටුන


| | | පිටු අංකය |
|---|---|---|
| 01. | ආණ්ඩුකාරවර ලේකම් කර්යාලය | 1 |
| 02. | පළාත් සභාව සහ පළාත් සභා ලේකම් කාර්යාලය | 18 |
| 03. | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව | 28 |
| 04. | පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව | 38 |
| **05.** | **ප්‍රධාන ලේකම් කාර්යාලය** | 42 |
| 5.1. | පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව | 54 |
| 5.2. | පළාත් භාණ්ඩාගාරය | 70 |
| 5.3. | පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව | 82 |
| 5.4. | පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුව | 90 |
| 5.5. | පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකය | 96 |
| 5.6. | පළාත් ආදායම් දෙපාර්තමේන්තුව | 104 |
| **06.** | **පළාත් ප්‍රධාන අමාත්‍යාංශය** | 110 |
| 6.1. | පළාත් පාලන දෙපාර්තමේන්තුව | 132 |
| 6.2. | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 146 |
| 6.3. | පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව | 166 |
| 6.4. | සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය | 186 |
| 6.5. | මුල් ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරිය | 192 |
| 6.6. | පුස්තකාල සේවා මණ්ඩලය | 198 |

**07.** **පළාත් කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය, ධීවර සහ නිවාස කටයුතු අමාත්‍යාංශය** 210

7.1. පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව 230

7.2. පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව 248

**08.** **පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, පරිසර සහ පළාත් සභා කටයුතු අමාත්‍යාංශය** 268

8.1. පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව 278

8.2. පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව 300

8.3. පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව 314

8.4. පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව 326

**09.** **පළාත් ප්‍රවාහන, ක්‍රීඩා සහ යෞවන කටයුතු, සමුපකාර වෙළඳ හා අහාර සහ කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය** 350

9.1. පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව 364

9.2. පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව 370

9.3. කර්මාන්ත සංවර්ධන අධිකාරිය 384

9.4. මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය 390

9.5. පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව 398

**10.** **පළාත්, ඉඩම් , වාරිමාර්ග ,මාර්ග සංවර්ධන, ග්‍රාම සංවර්ධන, නිවාස හා කාන්තා කටයුතු අමාත්‍යාංශය** 408

10.1. පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව 416

10.2. පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව 428

10.3. පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව 438

10.4. පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය 454

ඇමුණුම් 464-483

මෙය හිස්ව තබන ලද පිටුවකි

# ආණ්ඩුකාරවර ලේකම් කාර්යාලය

01

## ආණ්ඩුකාරවර ලේකම් කාර්යාලය පිළිබඳ මූලික විග්‍රහය

### ජාතික විධායකයේ පළාත් නියෝජනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ආ (1) අනු ව්‍යවස්ථාව අනුව සෑම පළාත් සභාවකම ආණ්ඩුකාර ධුරයක් පවතී. 154 ආ (2) අනුව ව්‍යවස්ථාවප්‍රකාර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිතුමාගේ අත්සන යටතේ වූ අධිකාරී පත්‍රයකින් පත් කෙරෙන ආණ්ඩුකාර ධුරය පළාත් සභාවක ජනාධිපතිතුමාගේ නියෝජිතයා ලෙස වූ කාර්යභාරයක් ද ඉටු කරනු ලබයි.

ජනාධිපතිතුමාගේ විධානය මත ආණ්ඩුකාරතුමා විසින් ගනු ලබන තීරණ අවසානාත්මක වන අතර, එය අධිකරණයක දී ප්‍රශ්න කළ නොහැකි බලයකි.

ආණ්ඩුකාරධූරය සතු බලතල

1. විධායක බලතල
2. මූල්‍ය බලතල
3. පරිපාලන බලතල

### 01. විධායක බලතල

13 වන ව්‍යවස්ථා සංශෝධනයෙන් පළාත් සභාවක විෂය ක්ෂේත්‍රය පිළිබඳ ආණ්ඩුකාරවර ධූරය සතු විධායක බලතල 154 හා (ඇ) 154 (ඊ) ව්‍යවස්ථා පරිදි සෘජුව හෝ අමාත්‍ය මණ්ඩලය මගින් හෝ නිළධාරීන් මගින් හෝ ක්‍රියාත්මක කළ හැකිය.

### පළාත් සභා කටයුතු පිළිබඳ බලතල

- 154 අ (8) (අ) වගන්තිය අනුව ආණ්ඩුකාරවරයා නිශ්චය කරන

### අමාත්‍ය මණ්ඩලය පිළිබඳ බලතල

- 154 ඊ (4) වගන්තිය අනුව ප්‍රධාන අමාත්‍යවරයා පත් කිරීම.
- 154 ඊ (5) වගන්තිය අනුව අමාත්‍යවරුන් 4 දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් පළාත් අමාත්‍ය මණ්ඩලය පත් කිරීම.
- අමාත්‍යවරු අතර විෂයන් බෙදීම.
- 154 අ (11) (අ) වගන්තිය අනුව පළාතේ පරිපාලනය සම්බන්ධ සහ නීති සම්පාදනය පිළිබඳ අමාත්‍ය මණ්ඩලය ගන්නා සියලු යෝජනා දැන ගැනීම.
- 154 අ (11) (ආ) වගන්තිය අනුව පළාතේ පරිපාලනය සම්බන්ධ සහ නීති සම්පාදනය සඳහා වූ යෝජනා පිළිබඳ තොරතුරු ලබා ගැනීම.
- 154 අ (11) (ඇ) වගන්තිය අනුව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී නොමැති එහෙත් අමාත්‍ය වරයෙකු විසින් ගන්නා ලැබූ තීරණයක් සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් සලකා බැලීම සඳහා ඉදිරිපත් කරන ලෙස ආණ්ඩුකාරවරයාට නියම කළ හැකිය.

අවස්ථාවකදී නියම කරනු ලබන වේලාවක සභාව කැඳවීම.

- 154 අ (8) ( ආ) වගන්තිය අනුව සභාව වාර අවසාන කිරීම.
- 154 අ (10) (අ) වගන්තිය අනුව සභාව ඇමතීම හා ඒ සඳහා මන්ත්‍රීවරුන් කැඳවීමට නියමයන් කිරීම.
- 154 අ (8) (ඇ) වගන්තිය අනුව සභාව විසුරුවා හැරීම.

## 02. මූල්‍ය බලතල

- 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 19 (5) වගන්තිය අනුව පළාත් සභා අරමුදල් භාරය, අරමුදලට මුදල් ගෙවීම ආදී සියලු රීති මගින් විධිමත් කිරීම.
- 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 20 (1) වගන්තිය අනුව පළාතේ හදිසි අවස්ථා අරමුදල පිළිබඳ භාරය දැරීම හා පාලනය සඳහා රීති සෑදීම.
- 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 23 (2) වගන්තිය අනුව පළාත් සභා අරමුදලේ ගිණුම් සම්බන්ධ විගණකාධිපතිවරයාගේ වාර්තා අනුව පළාත් සභාවට ඉදිරිපත් කිරීම.
- 1990 අංක 28 දරන පළාත් සභා (සංශෝධන) පනතේ 27 (4) වගන්තිය අනුව පළාත් සභාව විසුරුවා හැර හෝ කටයුතු කිරීම නතර කර ඇති අවස්ථාවක පළාතේ පරිපාලන කටයුතු සඳහා අරමුදලෙන් වියදම් කිරීමට අනුමැතිය දීම.
- 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 24 (1) වගන්තිය අනුව බදු පැනවීම, අහෝසි කිරීම, අඩු කිරීම, වෙනස් කිරීම, විධිමත් කිරීම, ඊට අදාල නීති සංශෝධනය , පළාත් සභා අරමුදල් විසර්ජනය කිරීම , පළාත් සභා අරමුදලට මුදල් භාර ගැනීම සහ වියදම් දැරීම සඳහා වූ ප්‍රඥප්ති නිර්දේශ කිරීම.
- 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 24 (1) වගන්තිය අනුව වාර්ෂික විසර්ජන ප්‍රඥප්තිය ඇතුළු ක්‍රියාත්මක වන ප්‍රඥප්ති සහ නව ප්‍රඥප්ති අනුමැතියට පෙර සලකා බලන ලෙස සභාවට දැන්වීම.
- 154 (ඌ) වගන්තිය අනුව පළාත් සභාවෙන් අනුමත කළ වියදම් සඳහා බලය දීම.
- 154 (ඌ) වගන්තිය අනුව පරිපූරක ප්‍රදානයන් සඳහා අනුමැතිය ලබා දීම.
- 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 28 (2) වගන්තිය අනුව ප්‍රදාන කිරීමට නිර්දේශ කිරීම.
- 154 (ඌ) වගන්තිය අනුව වාර්ෂික විසර්ජන ප්‍රඥප්තිය අනුමත කිරීම.

## 02. පරිපාලන බලතල

- 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32 (1) වගන්තිය අනුව පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධාරීන් පත් කිරීම, උසස් කිරීම, මාරු කිරීම,

සේවයෙන් පහ කිරීම සහ විනය පාලන කටයුතු කිරීම.

- 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 33 වගන්තිය අනුව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව පත් කිරීම.
- 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32 (2) වගන්තිය අනුව බලතල පැවරීම, නියෝග නිකුත් කිරීම.
- 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 33 (8) වගන්තිය අනුව විනය අභියාචනා පිළිබඳ අවසන් තීරණ ගැනීම.

1987 අංක 42 දරන පළාත් සභා පනතට අනුව උතුරු මැද පළාත් රාජ්‍ය සේවය සම්බන්ධයෙන් හා මූල්‍ය පාලනය සම්බන්ධයෙන් හා මූල්‍ය පාලනය සම්බන්ධ සියලු බලතල ආණ්ඩුකාර ධූරයට හිමිව ඇත. එම බලතල අවස්ථානුකූලව අදාළ නිලධාරීන් වෙත පවරා උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ , පළාතේ මූල්‍ය පාලනයේ හා පළාත සංවර්ධනයේ , සියලු කටයුතු මෙහෙයවීම, අධීක්ෂණය හා මග පෙන්වීම සඳහා පහත කාර්යයන් සිදු කෙරේ.

- පළාත් සභාවේ අමාත්‍යාංශ ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානීන් පත් කිරීම.
- විසර්ජන ප්‍රඥප්ති නිර්දේශ කර ඉදිරිපත් කිරීම, පරිපූරක ඇස්තමේන්තු නිර්දේශ කිරීම.
- විසර්ජන ප්‍රඥප්ති අනුමත කිරීම.
- දීප ව්‍යාප්ත සේවයේ නිලධාරීන් අනුයුක්ත කිරීම/ස්ථාන මාරු කිරීම/නිදහස් කිරීම.
- විශ්‍රාමික නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත පත් කිරීම.
- දීප ව්‍යාප්ත සේවයේ වැඩ බැලීම , පත් කිරීම, පාරිශ්‍රමික අනුමත කිරීම.
- විධිමත් විදේශ ගමන් වෙනුවෙන් ශ්‍රී ලංකාවෙන් බැහැරට යාමට අනුමැතිය දීම.
- සියලු නව බඳවා ගැනීම්, පත් කිරීම් සඳහා අනුමැතිය ලබා දීම.
- දීමනා හා ගාස්තු අතිරේක පාරිශ්‍රමික ගෙවීමට අනුමැතිය දීම.
- බඳවා ගැනීමේ පටිපාටි සහ ව්‍යවස්ථා සංග්‍රහ අනුමත කිරීම / සංශෝධන සඳහා අනුමැතිය ලබා දීම.
- අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ පෞද්ගලික ලිපි ගොනු සම්බන්ධ කටයුතු කිරීම වැටුප් වර්ධක හා කාර්ය සාධන වාර්තා අනුමත කිරීම.
- ආණ්ඩුකාරවර අරමුදලින් ලබා දෙන ආධාර හා පරිත්‍යාග පිළිබඳව කටයුතු කිරීම.
- පළාත් සභා රාජ්‍ය සේවයට අදාල නිලධාරීන්ගේ ආයතන කටයුතු සඳහා ආයතන අධ්‍යක්ෂ ලෙස ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා දීම.

- මධ්‍යම රජයේ චක්‍රලේඛ පළාත් සභා රාජ්‍ය සේවයට අදාල කිරීම.
- උතුරු මැද පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ විනය නියෝග වලට එරෙහිව අභියාචනා පිළිබඳ තීරණ ලබා දීම.
- උතුරු මැද පළාත් සභා නිලධාරීන්ගෙන්, අමාත්‍යාංශවලින් , ආයතනවලින් ලැබෙන ලිපි පෙත්සම් පිළිබඳ කටයුතු කිරීම.
- පළාත් සභාවේ රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ අභියාචනා දුක් ගැනවිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම.
- වෘත්තීය සමිති ඉල්ලීම් අනුව සාකච්ඡා කැඳවීම, රැස්වීම් පැවැත්වීම, වාර්තා නිකුත් කිරීම.

## දැක්ම

"අභිමානවත් ජනතාවක්, සමෘද්ධිමත් පළාතක්"

## මෙහෙවර

"ව්‍යවස්ථාපිත කටයුතු, ප්‍රතිපත්ති සම්පාදනය, ආයතනික කටයුතු, මූල්‍ය නියාමනය සහ සමාජ - ආර්ථික කටයුතු සියලු පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව ජාතික ප්‍රතිපත්තියට අනුගතව සාධාරණ හා සමාන ක්‍රමවේද අනුව අභිමානවත් ජනතාවක් ජීවත්වන සමෘද්ධිමත් පළාතක් බිහිකිරීම සඳහා අඛණ්ඩව දායකවීම".

## අරමුණු

- ගුණාත්මක පළාත් රාජ්‍ය සේවයක් ස්ථාපිත කිරීම.
- විධිමත් මූල්‍ය කළමනාකරණයක් ඇති කරලීම.
- පළාතේ සංවර්ධනය සඳහා ප්‍රතිපත්තියක් සකස් කිරීම.
- මහජන ගැටලු විසඳීම සඳහා මගපෙන්වීම.
- සාරධර්ම පිළිපදින සමාජයක් කරා යොමු කිරීමට කටයුතු කිරීම.

## ප්‍රධාන කාර්යයන්




## ප්‍රධාන උපාය මාර්ගයන්

පළාතේ පරිපාලන හා මූල්‍ය යාන්ත්‍රණය ක්‍රියාකරවීමේ ප්‍රධානම ආයතනය වශයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හා පළාත් සභා පනතින් ගරු ආණ්ඩුකාරතුමා වෙත පැවරී ඇති බලතල පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හා ප්‍රධාන ලේකම් ඇතුළු පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන් හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් ක්‍රියාත්මක කරවීම.

එසේම ජනතා සුභසාධනය හා සමාජ සංවර්ධනය ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒමට අවශ්‍ය ජාතික හා පළාත් සැලසුම් නිර්දේශයන් අනුව ක්‍රියාත්මක වෙමින් ඒ සඳහා ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට පළාත් අමාත්‍ය මණ්ඩලය දැනුවත් කිරීම.

## කාර්යය මණ්ඩල සංයුතිය

| විස්තරය | ගරු ආණ්ඩුකාරතුමා සහ පුද්ගලික කාර්යය මණ්ඩලය | ආණ්ඩුකාර ලේකම් ඇතුලු කාර්ය මණ්ඩලය |
|---|---|---|
| අනුමත සංඛ්‍යාව | 25 | 21 |
| සේවයේ නියුතු සංඛ්‍යාව | 25 | 17 |
| පුරප්පාඩු සංඛ්‍යාව | - | 04 |

## මෙහෙයුම් ප්‍රතිඵල- පුනරාවර්තන වියදම්


| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය | 2017 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 25.44 | 24.59 | 0.85 | 96.67 |
| ගමන් වියදම් | 0.47 | 0.43 | 0.04 | 92 |
| සැපයීම් | 5.83 | 5.32 | 0.50 | 91.40 |
| නඩත්තු වියදම් | 2.12 | 1.50 | 0.62 | 70.78 |
| ගිවිසුම්ගත සේවා | 2.91 | 2.48 | 0.42 | 85.43 |
| මාරු කිරීම් | 0.08 | 0.08 | 0 | 98.42 |
| වෙනත් | 7.82 | 6.91 | 0.90 | 88.53 |
| **එකතුව** | **44.67** | **41.34** | **3.33** | **92.55** |

## මූලධන වියදම - 2017

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය | 2017 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 1.36 | 1.33 | 0.02 | 98.43 |
| මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 4.73 | 4.18 | 0.55 | 88.46 |
| වෙනත් මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 7.66 | 2.58 | 5.08 | 33.70 |
| **එකතුව** | **13.74** | **8.10** | **5.65** | **58.91** |

## සංවර්ධන වැඩ පිළිබඳ කාර්ය සාධනය -පසුගිය වසර 03ක ප්‍රාග්ධන වැය වීම්

| වර්ෂය | PCDG(රු.මි) | එකතුව (රු.මි) |
|---|---|---|
| 2015 | 8.90 | 8.90 |
| 2016 | 15.09 | 15.09 |
| 2017 | 8.10 | 8.10 |




## දිගුකාලීන හා කෙටිකාලීන අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ප්‍රධාන කාර්යයන්

| අරමුණු | ක්‍රියාත්මක කළ ව්‍යාපෘති | ප්‍රධාන ක්‍රියාකාරකම් | වෙන්කළ මුදල (රු.මි.) | ප්‍රගතිය(%) | |
|---|---|---|---|---|---|
| | | | | භෞතික | මූල්‍ය |
| පළාතේ ජනතාවගේ සාරධර්ම ප්‍රවර්ධනය කිරීම | උතුරු මැද පළාත් සාරධර්ම ප්‍රවර්ධන ව්‍යාපෘතිය | 01. රාජ්‍ය සේවකයන්, පාසල් දූදරුවන් ඇතුළු සියළු ජනයාගේ රස වින්දනය වැඩිදියුණු කිරීම සඳහා ගුණාත්මක බවින් සාහිත්‍යමය ඉහළ රසවින්දන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>02. "සදාචාර සම්පන්න දරු පරපුරක් ගොඩ නගමු" පාසල් ළමුන් වෙනුවෙන් විශේෂ වැඩසටහන් මාලාව<br>03. අධ්‍යාපන ආධාර දීමනා<br>04. අවම පහසුකම් සහිත තෝරාගත් ආගමික ස්ථාන වල යටිතල පහසුකම් සංවර්ධනය,දහම් අධ්‍යාපනය වැඩිදියුණු කිරීම හා අසරණභාවයට පත් අයට ආධාර උපකාර කිරීම<br>05. ප්‍රජාව දැනුවත් කිරීමේ කාලීන වැඩසටහන්<br>06. සමාජයේ විවිධ ක්ෂේත්‍රවල ප්‍රගමනය වෙනුවෙන් පළාත තුළ කටයුතු කරන පුරෝගාමී සමාජ ක්‍රියාකාරීන් ඇගයීම. | 2.45 | 100 | 96.74 |



## උතුරු මැද පළාත් සාරධර්ම ප්‍රවර්ධන ව්‍යාපෘතිය යටතේ සිදුකරන ලද වැඩසටහන්

### 01. අධ්‍යාපන ආධාර ලබාදීම.

2016 වර්ෂයේ 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේ දිස්ත්‍රික් කුසලතාවයන් ඇගයීම,2016 වර්ෂයේ අ.පො.ස. සා/පෙළ විභාගයේ දිස්ත්‍රික් කුසලතාවයන් ඇගයීම හා 2016 වර්ෂයේ උසස් පෙළ විභාගයේ දිස්ත්‍රික් කුසලතාවයන් ඇගයීම සඳහා අධ්‍යාපන ආධාර ලබාදීම මේ යටතේ සිදු කරන ලදී.

| අ. අං | ආධාර වර්ගය | ස්ථානය | අනුරාධපුර දිස්ත්‍රික්කය | | පොළොන්නරුව දිස්ත්‍රික්කය | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | සංඛ්‍යාව | මුදල (රු.මි) | සංඛ්‍යාව | මුදල (රු.මි) | සංඛ්‍යාව | මුදල (රු.මි) |
| 01 | 2016 වර්ෂයේ පහ ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේ දිස්ත්‍රික් කුසලතාවයන් ඇගයීම සඳහා මුදල් ආධාර ලබාදීම | 1 | 6 | 0.03 | 5 | 0.025 | 11 | 0.055 |
| | | 3 | - | - | 2 | 0.008 | 2 | 0.008 |
| 02 | 2016 වර්ෂයේ අ.පො.ස. සා/පෙළ විභාගයේ දිස්ත්‍රික් කුසලතාවයන් ඇගයීම සඳහා මුදල් ආධාර ලබාදීම | 1 | 1 | 0.007 | 1 | 0.007 | 2 | 0.014 |
| | | 2 | 4 | 0.022 | 1 | 0.005 | 5 | 0.03 |
| | | 3 | - | - | 3 | 0.015 | 3 | 0.015 |
| 03 | 2016 වර්ෂයේ උසස් පෙළ විභාගයෙන් දිස්ත්‍රික් කුසලතාවයන් ඇගයීම සඳහා මුදල් ආධාර ලබාදීම | 1 | 7 | 0.07 | 6 | 0.06 | 13 | 0.13 |
| | | 2 | 6 | 0.045 | 5 | 0.038 | 11 | 0.08 |
| | | 3 | 5 | 0.025 | 7 | 0.035 | 12 | 0.06 |
| එකතුව | | | **29** | **0.199** | **30** | **0.193** | **59** | **0.392** |

**02. ආගමික ස්ථාන නගා සිටුවීම සඳහා ආධාර ලබාදීම.**

අනුරාධපුර දිස්ත්‍රික්කයේ තිරප්පනේ, නැ.නු.ප, ම.නු.ප, තලාව, හොරොව්පතාන, කහටගස්දිගිලිය හා ගල්නෑව යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පිහිටි ආගමික මධ්‍යස්ථාන සඳහා රු.මි 0.17ක ආධාර මුදල් ලබා දෙන ලදි.

**ආගමික ස්ථාන නගා සිටුවීම සඳහා දායකත්වය ලබා දිම.**

| අ. අං | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ආගමික ස්ථානය | | | | | | | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | පන්සල් | | මුස්ලිම් පල්ලි | | හිංදු කෝවිල් | | ක්‍රිස්තියානි පල්ලි | | | |
| | | ගණන | මුදල (රු.මි) | ගණන | මුදල (රු.මි) | ගණන | මුදල (රු.මි) | ගණන | මුදල (රු.මි) | ගණන | මුදල (රු.මි) |
| 01 | තිරප්පනේ | 3 | 0.03 | 1 | 0.01 | - | - | - | - | 4 | 0.04 |
| 02 | නැ.නු.ප | 2 | 0.02 | - | - | - | - | - | - | 2 | 0.02 |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 03 | ම.නු.ප | 1 | 0.01 | - | - | 1 | 0.01 | - | - | 2 | 0.02 |
| 04 | තලාව | 2 | 0.02 | - | - | - | - | 1 | 0.01 | 3 | 0.03 |
| 05 | හොරොව්පොතාන | 4 | 0.04 | - | - | - | - | - | - | 4 | 0.04 |
| 06 | කහටගස්දිගිලිය | 1 | 0.01 | - | - | - | - | - | - | 1 | 0.01 |
| 07 | ගල්නෑව | 1 | 0.01 | - | - | - | - | - | - | 1 | 0.01 |
| | **මුළු එකතුව** | 14 | 0.14 | 1 | 0.01 | 1 | 0.01 | 1 | 0.01 | 17 | 0.17 |

## 03. පාසල් ළමුන් සඳහා විශේෂ වැඩසටහන් පැවැත්වීම.

මේ යටතේ වෘත්තීය පුහුණු ආයතනවලින් පවත්වන පුහුණු වැඩසටහන් පිළිබඳ සිසු දරු දැරියන් දැනුවත් කිරීම හා කරීකත්වය , පෞර්ෂත්වය හා ආකල්ප සංවර්ධනය සඳහා විශේෂ වැඩසටහන් පවත්වන ලදී.



| අ/ අං | වැඩසටහන | ක්‍රියාකාරකම | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| 01. | වෘත්තීය පුහුණු ආයතනවලින් පවත්වන පුහුණු වැඩසටහන් පිළිබඳ සිසු දරු දැරියන් දැනුවත් කිරීමේ වැඩසටහන | වෘත්තීය පුහුණු නිලධාරීන් සම්බන්ධකර ගනිමින් සාමාන්‍ය පෙළ හා උසස්පෙළින් පසු පාසල් අධ්‍යාපනයෙන් ඉවත්වන සිසුන් සඳහා වෘත්තීය පුහුණු වැඩසටහන් පිළිබඳව විදුහල්පතිවරුන් , මාර්ගෝපදේශන විෂය භාර ගුරු භවතුන් හා ගුරු උපදේශකවරුන් දැනුවත්කර එමගින් සිසු දරු දැරියන් දැනුවත් කිරීමට කටයුතු කිරීම. | 700 |

| | | | |
|---|---|---|---|
| 02. | කථිකත්වය , පෞර්ෂත්වය හා ආකල්ප සංවර්ධන වැඩසටහන | ආචාර්ය හසන්ත හෙට්ටිආරච්චි මහතා විසින් සිසු දරු දැරියන්ගේ කථිකත්වය , පෞර්ෂත්වය හා ආකල්ප සංවර්ධනය උදෙසා වූ පැය තුනක පමණ දේශනයක් පැවැත්වීම | 3600 |

## 04.රසවින්දන වැඩසටහන් තුළින් රස වින්දනය නගා සිටුවීම සඳහා දායකත්වය.

| අනු අංකය | වැඩසටහනේ නම | ආරාධිත දේශක | ස්ථානය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | මියුරු ගීයක සොඳුරු රුව ගුණ | සනත් කේ විමලසිරි මහතා | හොරොව්පොතාන | 750 |
| | | | පොළොන්නරුව | 550 |
| 02 | ගීතයෙන් ජීවිතාලෝකණය | ආචාර්ය රත්න ශ්‍රී විජේසිංහ මහතා | අනුරාධපුර මධ්‍ය විද්‍යාලය | 800 |
| 03 | සංගීතයෙන් ජීවිතය සොයමු | මහාචාර්ය මහානාම වික්‍රමසිංහ මහතා | අනුරාධපුර | 150 |

## 05. ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන්.

| අනු අංකය | වැඩසටහනේ නම | ආරාධිත දේශක | පැවැත්වූ ස්ථානය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01. | රසිකත්වය, පෞරුෂත්වය හා ආකල්ප සංවර්ධනය | ආචාර්ය හසන්ත හෙට්ටිආරච්චි මහතා | උතුරු මැද පළාත් සභා ශ්‍රවණාගාරයේදී | 600 |
| | | | අනුරාධපුර බන්ධනාගාර පරිශ්‍රයේදී | 450 |
| 02. | ජීවිතය සමාජය හා රාජ්‍ය සේවය | අත්තනායක එම් හේරත් මහතා | උතුරු මැද පළාත් සභා ශ්‍රවණාගාරයේදී | 650 |
| 03. | සුවබර දිවියට සංස්කෘතියක් හදමු (රෝග නිවාරණ වැඩ සටහන) | කේ.ඩබ්.ජී.එස්. බණ්ඩාර මහතා | පළාත් සභා ශ්‍රවණාගාරයේදී | 300 |

## 06.මහජන ආධාර හා විවිධ සහයෝගයන් ලබා දීම.

| අ. අං | ක්‍රියාකාරකම | ආධාර ලබාදුන් / සහයෝගය ලබාදුන් ස්ථානය හෝ පුද්ගලයින් | ප්‍රමාණය / මුදල(රු.මි) |
|---|---|---|---|
| 01. | නියගයෙන් පීඩා විඳින ජනතාවට ජල ටැංකි බෙදා දීම | විලච්චිය ප්‍රා.ලේ. කාර්යාලයට | ලීටර් 1000 ටැංකි 40 |
| | | නොච්චියාගම ප්‍රා.ලේ. කාර්යාලයට | ලීටර් 1000 ටැංකි 10 |
| 02. | ආනන්ද හේරත් මහතා විසින් පවත්වන ලද සාර සඳ සංගීත වැඩසටහන සඳහා ආධාර ලබාදීම | ආනන්ද හේරත් මහතා | 0.012 |
| 03. | දීප දස්සක දාහතරවන ජාතික මහා පිංකමට ආධාර කිරීම | ජනාධිපති ලේකම් කාර්යාලය | 0.044 |
| 04. | මිහින්තලා සාහිත්‍ය උත්සවයට ආධාර කිරිම | මිහින්තලේ ප්‍රා.ලේ. කාර්යාලය | 0.015 |
| 05. | ඇඳගල පොසොන් කලාපයට ආධාර කිරිම | වෙළඳ එක්සත් සංගමයට | 0.006 |
| 06. | 2017 - පළාත් ක්‍රීඩා උළෙල සඳහා ආධාර කිරිම | අධ්‍යාපන දෙපාර්තමේන්තුවට | 0.03 |
| 07. | ලෝක ළමාදින උත්සවය සඳහා ආධාර කිරිම | නාච්චාදූව සිංහල මහා විද්‍යාලය | 0.01 |
| 08. | පොළොන්නරුව ලුම්බිණි ප්‍රාථමික විද්‍යාලයට ඡායා පිටපත් යන්ත්‍රයක් ආධාර කිරිම | පොළොන්නරුව ලුම්බිණි ප්‍රාථමික විද්‍යාලය | ඡායා පිටපත් යන්ත්‍ර 01 |
| 09. | පළාතේ අසරණභාවයට පත්වී සිටින පුද්ගලයන් සඳහා මුදලින් ආධාර කිරීම | තෝරාගත් පුද්ගලයින් 07 දෙනෙකු සඳහා | 0.12 |
| 10. | කලායතන නගා සිටුවීම සඳහා ආධාර කිරිම | කුමුදුනී කලායතනය | 0.02 |
| 11. | දහම් පාසල් සඳහා ආධාර කිරීම | සිරිසඟබෝ දහම් පාසල | 0.02 |
| 12. | සමිති සඳහා ආධාර ලබාදීම් | එප්පාවල සමගි ලිහිණි සමිතිය | 0.015 |
| | | සුචරිතගම තරුණ එක්සත් සුභසාධක සමිතිය | 0.025 |

## 07. ලේ දන්දීමේ වැඩසටහන

| අනු අංකය | ක්‍රියාකාරකම | සහභාගී වූ සංඛ්‍යාව | වැඩසටහන් ගණන |
|---|---|---|---|
| 01. | 01. ලේ දන්දීම | 150 | 01 |
| 02. | 01. දියවැඩියා පරීක්ෂාව<br>02. අධි රුධිර පීඩන පරීක්ෂාව<br>03. වකුගඩු පරීක්ෂාව<br>04. අක්ෂි හා ශ්‍රවන පරීක්ෂාව<br>05. ලේ දන්දීම | 200<br>200<br>200<br>200<br>221 | 01 |

**ඉහත සඳහන් වැඩසටහන්වලට අමතරව ආණ්ඩුකාර ලේකම් කාර්යාලය මගින් වෙනත් වැඩසටහන් ද පවත්වන ලදී.**

### 01. රජරට ස්වර්ණ සම්මාන 2017 අභිමන් පුරවැසි හරසර උළෙල

විවිධ ක්ෂේත්‍රයන් ඔස්සේ උතුරු මැද පළාතට අභිමානයක් එක්කරමින් නූතන සමාජ ප්‍රගමනයට සිය විශිෂ්ට දායකත්වය කැප කරන ලද විශිෂ්ටයන් ඇගයීම සඳහා රජරට ස්වර්ණ සම්මාන 2017 අභිමන් පුරවැසි හරසර උළෙල උතුරු මැද පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ උපදේශකත්වය යටතේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලද අතර, එහිදී පළාතේ විශිෂ්ටයන් රන් පවුමකින් හා ස්වර්ණ සම්මානයකින් පිදුම් ලබන ලදී. තවද මෙම උළෙලට සමගාමීව රජරට වාරි ශිෂ්ටාචාරයේ නොමැකෙන පියසටහන් ඇතුළත් සමරු කලාපයක් එළිදැක්වීමද සිදුකරන ලදී.

**ස්වර්ණ සම්මානලාභීන් පිළිබඳ විස්තර**

| අනු අංකය | ක්ෂේත්‍රය | සම්මාන ලාභීන් ගණන | සම්මානලාභීන්ගේ නම් |
|---|---|---|---|
| 01 | අනුස්මරණීය සම්මාන | 06 | 01. පූජ්‍යපාද මාතර කිලගම ශ්‍රී සීලාලංකාර නායක හිමිපාණන් වහන්සේ<br>02. සංගීතවේදී විශාරද ගුණදාස කපුගේ මහතා<br>03. අධිනීතිඥ රංබණ්ඩා සෙනෙවිරත්න මහතා<br>04. ප්‍රවීණ සන්නිවේදක ස්වර්ණ ශ්‍රී බණ්ඩාර මහතා<br>05. සද්ව්‍යවසායක ධම්මික සිරිවර්ධන මහතා<br>06. ප්‍රවීණ ක්‍රීඩා උපදේශක කුමුදු කුමාර සිල්වා මහතා |
| 02 | වෘත්තීයවේදී | 03 | 01. වෛද්‍ය තිලක් අබේසේකර මහතා<br>02. මහාචාර්ය සේන නානායක්කාර මහතා<br>03. පී.ඩී. ලලිතා පද්මිණී මහත්මිය |
| 03 | සාහිත්‍ය කලා | 07 | 01. කරුණාරත්න ජයතිලක මහතා<br>02. මහින්ද චන්ද්‍රසේකර මහතා<br>03. විශාරද කරුණාරත්න විජේවර්ධන මහතා<br>04. සේනානායක වේරලියද්ද මහතා<br>05. දර්ශන රුවන් දිසානායක මහතා<br>06. ශාන්ති දිසානායක මහත්මිය<br>07. පී.ඒ. සමන් පුෂ්පකුමාර මහතා |

| අනු අංකය | ක්ෂේත්‍රය | සම්මාන ලාභීන් ගණන | සම්මානලාභීන්ගේ නම් |
|---|---|---|---|
| 04 | පාරම්පරික වෙදකම | 02 | 01. පී. වීරසිංහ මහතා<br>02. සී.එම්. මුතුබණ්ඩා මහතා |
| 05 | පාරම්පරික ශිල්ප කලා | 01 | 01. සුමේදලාල් දොඩංගොඩ ආරච්චිගේ මහතා |
| 06 | නව නිර්මාණ / පර්යේෂණ | 03 | 01. නාමල් උදාර ජයවර්ධන මහතා<br>02. චිත්‍රානන්ද කපුගේ මහතා<br>03. සමන් ජානක ගුණවර්ධන මහතා |
| 07 | ක්‍රීඩා / ශාරීරික අධ්‍යාපන | 03 | 01. එන්. කරුණාරත්න මහතා<br>02. මයික් කුක් මහතා<br>03. චින්තක ගීතාල් විදානගේ මහතා |
| 08 | ව්‍යවසායක | 02 | 01. පී.එච්.පී. ධර්මසිරි මහතා<br>02. බාලදුරගේ චන්ද්‍රසිරි මහතා |
| 09 | සමාජසේවා | 01 | 01. එම්.ඩබ්. කරුණාරත්න මහතා |
| එකතුව | | **28** | |

## 02. පළාත් රණවිරු සැමරුම් උළෙල පැවැත්වීම

රට, දැය, සමය වෙනුවෙන් තම ජීවිතය පූජාකල වීරෝධාර රණවිරුවන් අනුස්මරණය කිරීම සඳහා වාර්ෂිකව පවත්වනු ලබන රණවිරු සැමරුම් උළෙල 2017 වර්ෂයේද ගරු ආණ්ඩුකාරතුමාගේ හා ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් උතුරු මැද පළාත් රණවිරු ස්මාරකය අභියසදී උත්සවාකාරයෙන් පවත්වන ලදි.

ඒ සම්බන්ධයෙන් වන සවිස්තර සටහනක් පහතින් සඳහන් කර ඇත.

| අ. අ | සහභාගී වූ පිරිස් | සංඛ්‍යාව | සිදුකරන ලද ක්‍රියාකාරකම් |
|---|---|---|---|
| 01 | පළාතේ ආගමික නායකයින් , ගරු ආණ්ඩුකාරතුමා, ගරු ප්‍රධාන අමාත්‍යතුමා හා පළාත් සභාවේ අනෙකුත් ගරු අමාත්‍යතුමන්ලා රණවිරු සේවා අධිකාරියේ සභාපතිනිය ඇතුළු රාජ්‍ය නිලධාරීන් හා උළෙල සඳහා අනුග්‍රහය දක්වන ලද රාජ්‍ය නොවන ආයතනවල ප්‍රධානීන් | 80 | මියගිය රණවිරුවන් අනුස්මරණය කරමින් රණවිරු ස්මාරකය අභියස පුෂ්පෝපහාර දැක්වීම හා රණවිරු උළෙල මෙහෙයවීමේ කටයුතු. |
| 02 | ත්‍රිවිධ හමුදා නිලධාරීන්, පොලිස් නිලධාරීන් හා සිවිල් ආරක්ෂක බලකා නිලධාරීන් | 300 | ආචාර පෙළපාලිය හා බියුගල් වාදනය |
| 03 | මියගිය රණවිරුවන්ගේ දෙමාපියන් ඇතුළු ඥාතීන් | 1000 | රණවිරු ස්මාරකය අභියස පුෂ්පෝපහාර දැක්වීම. |





## 03. විදේශීය දූත කණ්ඩායම් සඳහා අවශ්‍ය පහසුකම් සලසා දීම

ගරු ආණ්ඩුකාරතුමා හමුවීමට පැමිණෙන විදේශීය දූත කණ්ඩායම් සඳහා අවශ්‍ය පහසුකම් සලසාදීම ආණ්ඩුකාර කාර්යාලය මගින් සිදුකරන අතර මෙම වර්ෂයේදී පැමිණි දූත කණ්ඩායම් පිළිබඳ සවිස්තර වාර්තාවක් පහතින් සඳහන් කර ඇත.

| අනු අංකය | දූත පිරිස | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|
| 01. | ජපාන තානාපති ඇතුළු කණ්ඩායම | 04 |
| 02. | කොරියානු තානාපති ඇතුළු කණ්ඩායම | 04 |
| 03. | පකිස්ථානු මහ කොමසාරිස් ඇතුළු කණ්ඩායම | 05 |
| 04. | තායිලන්ත නියෝජ්‍ය අගමැතිතුමා ඇතුළු කණ්ඩායම | 25 |
| 05. | චීන ව්‍යාපාරික කණ්ඩායම | 25 |
| | එකතුව | 63 |

## 04. 2017 වර්ෂයේදී ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ විවෘත කිරීම්/ ජාතික උත්සව.

| අනු අංකය | විවෘත කිරීම / ජාතික උත්සවය | ඡායාරූප |
|---|---|---|
| 01. | ජාතික නිදහස් උත්සවය |  |
| 02. | පහළ තලාව ග්‍රාමීය සෞඛ්‍ය මධ්‍යස්ථානය විවෘත කිරීම |  |
| 03. | කහටගස්දිගිලිය රෝහලේ සායන මධ්‍යස්ථානය විවෘත කිරීම |  |

| | | |
|---|---|---|
| 04. | කලාවැව රෝහලේ බාහිර රෝගී අංශය විවෘත කිරීම |  |
| 05. | ගලෙන්බිදුණුවැව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය විවෘත කිරීම |  |

**05.2017 වර්ෂය තුළදී බඳවා ගැනීම් , ස්ථානමාරු කිරීම්, අන්තර්ග්‍රහණය කිරීම්, උසස්වීම් , විශ්‍රාම ගැන්වීම් හා විදේශ නිවාඩු සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතීන් ලබා දී ඇත.**

| අනු අංකය | විස්තරය | අනුමැතිය ලබාදී ඇති සංඛ්‍යාව |
|---|---|---|
| 01. | බඳවාගැනීම් | 1099 |
| 02. | ස්ථානමාරු | 383 |
| 03. | අන්තර්ග්‍රහණය කිරීම් | 77 |
| 04. | උසස්වීම් | 307 |
| 05. | විශ්‍රාම ගැන්වීම් | 45 |
| 06. | විදේශ නිවාඩු | 535 |

**06.ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රධානත්වයෙන් පළාතේ ව්‍යාපාරිකයන්ගේ ගැටළු සාකච්ඡා කිරීම සඳහා පවත්වන ලද රැස්වීම්.**

| අනු අංකය | ව්‍යාපාරික කණ්ඩායම | සහභාගී වූ නිළධාරින් | සහභාගී වූ සංඛ්‍යාව | සාකච්ඡා කළ කරුණු |
|---|---|---|---|---|
| 01. | පළාත් වාහන සේවා සපයන්නන්ගේ සංගමය | අමාත්‍යාංශ ලේකම්වරුන් , යාන්ත්‍රික ඉංජිනේරුවන් හා වාහන සේවා සපයන ආයතන හිමියන් | 25 | පළාතේ වාහන සේවා සපයන්නන් මුහුන පා සිටින ගැටළු |
| 02. | පළාතේ ඖෂධ හිමියන්ගේ සංගමය | සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් ,පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ හා ඖෂධ සපයන වෙළඳසැල් හිමියන් | 25 | පළාතේ ඖෂධ ශාලා හිමියන්ගේ ගැටළු නිරාකරණය |

**07.** **ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලද අමාත්‍යාංශ මට්ටමේ රැස්වීම් හා වෙනත් රැස්වීම්.**

| අනු අංකය | අමාත්‍යාංශ | සහභාගී වූ සංඛ්‍යාව | පවත්වා ඇති වාර ගණන | සාකච්ඡා කළ කරුණු |
|---|---|---|---|---|
| 01. | ප්‍රධාන අමාත්‍යාංශය | 05 | 01 | අමාත්‍යාංශයේ අයවැය ඇස්තමේන්තු සකස්කිරීම් සම්බන්ධයෙන් |
| 02. | සෞඛ්‍ය අමාත්‍යාංශය | 05 | 01 | - එම - |
| 03. | වාරිමාර්ග අමාත්‍යාංශය | 05 | 01 | - එම - |
| 04. | කෘෂිකර්ම අමාත්‍යාංශය | 05 | 01 | - එම - |
| 05. | සමුපකාර අමාත්‍යාංශය | 05 | 01 | - එම - |
| 06. | සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් | 20 | 03 | උතුරු මැද පළාතේ අමාත්‍යාංශ යටතේ ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන් හා ඒ හා සම්බන්ධ ගැටළු පිළිබඳ සාකච්ඡා කරන ලදි. |

**08.** **මහජන හමුව පැවැත්වීම තුළින් ජනතා ගැටලුවලට සවන් දීම හා විසඳීම.**

උතුරු මැද පළාත් සභාව විසුරුවා හැරීමෙන් පසු ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රධානත්වයෙන් හා සියළුම ලේකම්වරුන්ගේ සහභාගීත්වයෙන් මහජන දින වැඩසටහන් සෑම සතියකම බදාදා දින පළාත් සභා ශ්‍රවණාගාරයේදී පවත්වනු ලබන අතර එහිදී පළාතේ ජනතාවගේ ගැටළු වලට විසඳුම් ලබාදීමක් සිදු කරනු ඇත.

**09.** **වෙනත් විවිධ කාර්යයන්**

2017 වර්ෂය තුළ පහත සඳහන් කාර්යයන් ද ගරු ආණ්ඩුකාරතුමා විසින් සිදු කරන ලදි.

01. අයගම අවතැන්වූවන් සඳහා උපකාරකිරීමට පළාත් සභාවේ ආයතන මෙහෙයවීම ගරු ආණ්ඩුකාරතුමාගේ මගපෙන්වීම යටතේ සිදුකරන ලදි.
02. ප්‍රඥප්ති සකස් කිරීමට ප්‍රධාන ලේකම් වෙත අනුමැතිය ලබාදීම.
03. 2018 වාර්ෂික මුදල් ප්‍රකාශය අනුමත කිරීම.
04. පරිපූරක අනුමත කිරීම.
05. බඳවා ගැනීමේ පරිපාටි අනුමත කිරීම හා සංශෝධනය කිරීම් අනුමත කිරීම.
06. ගරු ආණ්ඩුකාරතුමා වෙත ඉදිරිපත් කරන අභියාචනා සඳහා කටයුතු කිරීම.
07. පළාත් පාලන ආයතන වලට අදාළ උසාවි දඩ මුදල් නිදහස්කිරීම් සඳහා අනුමැතිය ලබාදීම.
08. පළාත් සභාවේ අමාත්‍යාංශ ලේකම්/ දෙපාර්තමේන්තු ප්‍රධානීන් පත්කිරීම.
09. විශ්‍රාමික නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත පත්කිරීම.
10. දීප ව්‍යාප්ත සේවයේ වැඩ බැලීම , පත්කිරීම, පාරිශ්‍රමික අනුමත කිරීම.
11. දීමනා හා ගාස්තු අතිරේක පාරිශ්‍රමික ගෙවීමට අනුමැතිය දීම.

12. අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ පෞද්ගලික ලිපි ගොනු සම්බන්ධ කටයුතු කිරීම වැටුප් වර්ධක හා කාර්ය සාධන වාර්තා අනුමත කිරීම.

13. මධ්‍යම රජයේ චක්‍රලේඛ පළාත් සභා රාජ්‍ය සේවයට අදාළ කිරීම.

## මෙහෙයුම් සමාලෝචනය හා සංවර්ධන කාර්ය පිළිබඳ කාර්ය සාධනය

පුනරාවර්තන වියදම් 92.55% ඉක්මවා ඇත. මූලධන වියදම් 58.91% කි.

* ආණ්ඩුකාර සම්මේලනය මෙම වර්ෂයේ නොපැවැත්වීම නිසා ඒ සඳහා වෙන්කරන ලද රු.මි. 5 ක් ඉතිරි වීම මත මුළු උපයෝජනය 36.43% කින් අඩුවී 58.91%ක් බවට පත් වී ඇත.

පළාතේ සංවර්ධන කටයුතු සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ මගපෙන්වීම හා දායකත්වය නිරන්තරයෙන් සිදුකෙරේ. එම කටයුතු සඳහා ආණ්ඩුකාර කාර්යාලයේ දායකත්වයද ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් පරිදි ප්‍රශස්ත අයුරින් ලබා දෙනු ලැබේ.

පළාත් සභා පනතින් ගරු ආණ්ඩුකාරවරයා වෙත පැවරුණු බලතල යටතේ ක්‍රියාත්මක වෙමින් 2017 වර්ෂය තුළදී පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරන යෝජනා සලකා බලා අනුමැතිය ලබාදීම හෝ කොමිෂන් සභාව වෙත අවශ්‍ය උපදෙස් ලබාදීම සිදු කරන ලදී.

පළාතේ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ දායකත්වය සහ නියාමනය ආණ්ඩුකාරවර කාර්යාලය මගින් සිදුකරනු ලබන අතර, ඒ මගින් පළාතේ සංවර්ධන කාර්යය වේගවත් කිරීමට අදාල මගපෙන්වීම හා දායකත්වය ලබාදීම සිදු විය. විශේෂයෙන්ම ජාතික නායකත්වයේ පළාත් අභිනියෝජනය මගින් මධ්‍යම ආණ්ඩුව හා පළාත් සභාව අදාල මනා සම්බන්ධීකරණය ඇති කරමින් ප්‍රතිපත්තිමය තීන්දු තීරණ ක්‍රියාත්මක කිරීම 2017 වසරේදීද සිදු විය.

2017 වර්ෂයේ උතුරු මැද පළාත් සභාවට අදාල වාර්ෂික ප්‍රතිපත්ති ප්‍රකාශය අදාල වර්ෂයේ සැසිවාරය විවෘත කරමින් පළාත් සභාව වෙත ඉදිරිපත් කිරීම සිදු විය. ඒ තුළින් උතුරු මැද පළාත මධ්‍යම රජයේ ඉලක්කගත දර්ශක වෙත අවධානය යොමු කරමින් 2017 වර්ෂය තුළ ඉලක්ක සහගතව තිරසාර සංවර්ධනයක් කරා මෙහෙයවිය හැකි අයුරින් ප්‍රතිපත්ති සම්පාදනයකොට ගෞරවණීය සභාව ආමන්ත්‍රණය කිරීම සිදු විය.

දෛනිකව කාර්යාලය වෙත පැමිණෙන සේවාලාභීන්ගේ ගැටළුවලට පිළියම් යෙදීම එමෙන්ම ඔවුන්ට තම ගැටළු විසඳා ගැනීම සඳහා නිසි මාර්ගය වෙත නිවැරදිව යොමු කිරීමද සිදු කිරීමට හැකි විය. එසේම අතිගරු ජනාධිපතිතුමාගේ පළාත් නියෝජනය ලෙස කටයුතු කරමින් පළාත තුළ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරිමට, ජාතික ප්‍රතිපත්තීන්ට අනුව පළාත් ප්‍රතිපත්ති සකස්කර ගැනීම සඳහා අවශ්‍ය උපදෙස්, මගපෙන්වීම සඳහා 2017 වසර තුළදීද කටයුතු කරන ලදී.

# පළාත් සභා ලේකම් කාර්යාලය

02

## පළාත් සභා ලේකම් කාර්යාලය පිළිබඳ මූලික විග්‍රහය

### පළාත් සභාවේ සංයුතිය

| | සංඛ්‍යාව |
|---|---|
| අමාත්‍යවරුන් | 05 |
| සභාපති | 01 |
| නියෝජ්‍ය සභාපති | 01 |
| විපක්ෂනායක | 01 |
| සභා නායක | 01 |
| ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක | 01 |
| විපක්ෂයේ ප්‍රධාන සංවිධායක | 01 |
| අනෙකුත් මන්ත්‍රිවරුන් | 22 |
| එකතුව | **33** |

### මහජන නියෝජිතයින්

| දිස්ත්‍රික්කය | පාර්ලිමේන්තු | පළාත් සභා |
|---|---|---|
| අනුරාධපුර | 08 | 22 |
| පොළොන්රුව | 05 | 11 |
| එකතුව | **13** | **33** |

#### දැක්ම

"මනා ක්‍රියාකාරිත්වයෙන් යුත් ජනතාවාදි පළාත් සභාවක්, සමෘද්ධිමත් පළාතක්".

#### මෙහෙවර

"උතුරු මැද පළාතේ සමස්ත පළාත් සභා කටයුතුවල සංවර්ධනය උදෙසා සැසි හා රැස්වීම් කටයුතු සහ කාරක සභා කටයුතු අදාල පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව බල ගැන්වීම"

#### දිගුකාලීන හා කෙටි කාලීන අරමුණු

#### දිගුකාලීන අරමුණු

පළාත් ව්‍යවස්ථාදායකයේ තීරණ කාර්යක්ෂම ලෙස ක්‍රියාවට නංවමින් පොදුවේ පළාතේ ජන ජීවිතය ඉහළ නැංවීමට දායක වීම.

#### කෙටි කාලීන අරමුණු

- පළාත් සභාවට පැවරී ඇති නෛතික බලතල ක්‍රියාත්මක කිරීම උදෙසා පිහිටුවා ඇති ආයතන (පළාත් සභාව සහ කමිටු) විධිමත්ව හා අඛණ්ඩව පවත්වා ගෙන යැම තුළින් ජනතාවගේ එදිනෙදා ප්‍රශ්න හා ගැටළු නිරාකරණය කිරීම.
- ගරු සභාපතිතුමා, උප සභාපතිතුමා ඇතුළු ධූරධාරීන්ගේ සහ ගරු පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ රාජකාරී ඉටුකිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම.
- ඉහත I හා II කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීම උදෙසා ලේකම් කාර්යාලය පවත්වාගෙන යාම.

## ප්‍රධාන කාර්යයන්




## කාර්ය මණ්ඩල සංයුතිය

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 22 |
| 2 | සේවයේ නියුතු | 27 |
| 4 | අනියම් | 01 |

## මෙහෙයුම් ප්‍රතිඵල- පුනරාවර්තන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය (රු.මි) | 2017 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 93.82 | 93.82 | 0.00 | 100 |
| ගමන් වියදම් | 0.19 | 0.19 | 0.00 | 100 |
| සැපයිම් | 12.03 | 12.03 | 0.00 | 100 |
| නඩත්තු වියදම් | 2.06 | 2.06 | 0.00 | 100 |
| ගිවිසුම්ගත සේවා | 4.53 | 4.53 | 0.00 | 100 |
| මාරු කිරීම් | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| සහනාධාර | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| **එකතුව** | **112.63** | **112.63** | **0.00** | **100** |

## මූලධන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය(රු.මි) | 2017 වර්ෂයේ වියදම(රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගෘහ භාණ්ඩ හා කාර්යාලීය | 0.50 | 0.47 | 0.03 | 94 |
| යන්ත්‍ර හා යන් ත්‍රෝපකරණ | 0.30 | 0.10 | 0.20 | 33 |
| වෙනත් | 0.20 | 0.00 | 0.20 | 00 |
| **එකතුව** | **1.00** | **0.57** | **0.43** | **57** |

## මෙහෙයුම් සමාලෝචනය හා සංවර්ධන කාර්ය පිළිබඳ කාර්යසාධනය

තිරසාර සංවර්ධනය මගින් ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්වය ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒම සඳහා අවශ්‍ය දේශපාලන නායකත්වය ලබා දීම සඳහා ක්‍රියාත්මක වන ප්‍රධානම ආයතනය වන මෙම පළාත් සභාව එහි ගෞරවය හා අභිමානය සුරැකෙන ආකාරයෙන් පවත්වාගෙන යෑම සඳහා අවශ්‍ය මූලික පහසුකම් සියල්ලක්ම පාහේ සපුරා ගැනීමට සමත් වී ඇත.

### 3.1 පළාත් සභා සැසි හා රැස්වීම් කටයුතු විධිමත් කිරීම.

උතුරු මැද පළාත් සභාවේ 6 වන පළාත් සභාවේ 6 වන සැසිවාරය 2017.01.31 වන දින උතුරු මැද පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රධානත්වයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමා, ගරු අමාත්‍ය මණ්ඩලය, ගරු මන්ත්‍රීවරුන් හා නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් උත්කර්ශවත් අන්දමින් ආරම්භ කරන ලදී. මෙදින රැස්වීමේදී ගරු ආණ්ඩුකාරතුමන් විසින් 2017 වර්ෂයේ ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කරන ලදී.

2017.02.07 වන දින පළාත් සභා රැස්වීම පවත්වන ලදී. පළාත් සභා කාර්ය පටිපාටි රීති සංග්‍රහයේ 15(1) වගන්ති ප්‍රකාරව 2017 වර්ෂයේ පළාත් සභා රැස්වීම් පැවැත්වීමට නියමිත දිනයන් පහත සඳහන් අයුරින් ගරු සභාපතිතුමා විසින් නිවේදනය කරන ලදී. ඒ අනුව සෑම මසකම පළමුවන ඉරිදාට පසු එළඹෙන අඟහරුවාදා දිනය සහ තුන්වන ඉරිදාට පසු එළඹෙන අඟහරුවාදා දිනය වන අතර මසකට සභා රැස්වීම් 02 බැගින් පවත්වනු ලබන බවත් යම්කිසි හෙයින් නිවාඩු දිනයක් වුවහොත් පසු දිනය ඒ සඳහා යොදා ගන්නා බවත් නිවේදනය කරන ලදී.

පළාත් සභා රැස්වීම් පවත්වන ලද දිනයන් පහත සඳහන් පරිදි වේ.

| අනු අංකය | මාසය | 2017 වර්ෂයේ |
|---|---|---|
| 1 | පෙබරවාරි | 07, 21 |
| 2 | මාර්තු | 07, 21 |
| 3 | අප්‍රේල් | 04, 18 |
| 4 | මැයි | 09, 23 |
| 5 | ජූනි | 06, 20 |

| ගිවිසුම්ගත සේවා | 0.61 | 0.38 | 0.23 | 62 |
| මාරු කිරීම් | 0.18 | 0.17 | 0.01 | 94 |
| සහනාධාර | 0.05 | 0.01 | 0.04 | 20 |
| **එකතුව** | **11.53** | **9.29** | **2.24** | **81** |

### මූලධන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2017 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදි කිරිම් | 2.00 | 0.11 | 1.86 | 06 |
| යන්ත්‍ර සූත්‍ර සවි කිරිම් හා උපකරණ | 2.00 | 0.66 | 1.34 | 33 |
| **එකතුව** | **4.00** | **0.77** | **3.20** | **19.3** |

### සංවර්ධන වැඩ පිළිබඳ කාර්ය සාධනය- පසුගිය වසර 03ක ප්‍රාග්ධන වැය විම්(වියදම්)

| වර්ෂය | PCDG (රු.මි) | මුළු වියදම (රු.මි) |
|---|---|---|
| 2015 | 0.37 | 0.37 |
| 2016 | 2.48 | 2.48 |
| 2017 | 0.77 | 0.77 |




### දිගුකාලීන හා කෙටිකාලීන අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ප්‍රධාන කාර්යයන් හා සම්බන්ධ ව්‍යාපෘති පිළිබඳ විශ්ලේෂණය.

| අනු අංකය | අරමුණු | අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය/ව්‍යාපෘති | ප්‍රධාන ක්‍රියාකාරකම | වෙන් කළ මුදල (රු.මි) | ප්‍රගතිය (%) | |
|---|---|---|---|---|---|---|
| | | | | | භෞතික | මූල්‍ය |
| 1. | කාර්යාලීය නිලධාරීන්,විගණන හා විමර්ශන නිලධාරීන් සඳහා අවශ්‍ය භෞතික පහසුකම සැපයීම | කාර්යාලය සඳහා අවශ්‍ය කාර්යාලීය ගෘහ භාණ්ඩ මිලදී ගැනීම | ඩෙස්කටොප් පරිගණක 04<br>UPS 04<br>ඡායා පිටපත් යන්ත්‍ර 01<br>පරිගණක මුද්‍රණ යන්ත්‍ර 04<br>වර්ණ පරිගණක මුද්‍රණ යන්ත්‍ර 01<br>Tablet යන්ත්‍ර 01 | 2 | 100 | 33 |
| 2 | | 02.කාර්යාලය සඳහා අවශ්‍ය යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම | විධායක පුටු 04<br>ලී අල්මාරි 01<br>විධායක මේස 01<br>විධායක පුටු 01<br>පරිගණක මේස 04 | 2 | 100 | 5 |

### මෙහෙයුම් සමාලෝචනය හා සංවර්ධන කාර්ය පිළිබඳ කාර්ය සාධනය

වාර්ෂික සැලැස්ම අනුව විගණන හා විමර්ශන වාර්තා 120ක් නිකුත් කර ඇත. කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම නිසා වාර්ෂික සැලැස්මේ ඉලක්කයන් 100%ක් සම්පූර්ණ කර ගැනීම දුෂ්කර කටයුත්තක්ව පවතී.

විගණන නිලධාරීන් ප්‍රමාණය 25 දෙනෙක් දක්වා වැඩිකර ගැනීම සඳහා අනුමැතිය ලබාගෙන ඇත. එම තනතුරු සඳහා බඳවා ගැනීමේ පටිපාටිය සකස් කර අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

2017 වර්ෂය තුළ ගරු ආණ්ඩුකාරතුමාගේ,ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ සහ ප්‍රධාන ලේකම්ගේ යොමු කිරීම මත විශේෂිත විමර්ශන කටයුතු 06ක් සිදු කරන ලදී.

**2017** වර්ෂයේදී විගණන හා කළමනාකරණ රැස්වීම් පැවැත්වීම තුළින් උතුරු මැද පළාතේ අමාත්‍යාංශය තුළ මූල්‍ය කළමනාකරණයේදී ඇති ගැටළු හඳුනා ගැනීම හා එම ගැටළු සාකච්ඡාකර විසඳුම් ඉදිරිපත් කිරීම සිදු කරන ලදී.

| අනු අංකය | අමාත්‍යාංශය | පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව |
|---|---|---|
| 1 | පළාත් ප්‍රධාන අමාත්‍යාංශය | 03 |
| 2 | පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය | 03 |
| 3 | පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය | 03 |
| 4 | පළාත් ප්‍රවාහන අමාත්‍යාංශය | 03 |
| 5 | පළාත් වාරිමාර්ග අමාත්‍යාංශය | 03 |

එම අමාත්‍යාංශ යටතේ ඇති දෙපාර්තමේන්තු හා අධිකාරී තුළ ගැටළු හඳුනා ගැනීම සහ ඒ සඳහා විසඳුම් යෝජනා කර විධිමත් මූල්‍ය පාලනයක් ඇති කිරීම සඳහා වෙන් වෙන් වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු පවත්වන ලදී.

**විධිමත් මූල්‍ය පාලනයක් ඇති කිරීම සඳහා වෙන් වෙන් වශයෙන් පවත්වන ලද විගණන හා කළමනාකරණ කමිටු-2017**

| අනු අංකය | දෙපාර්තමේන්තුව/ආයතනය | විගණන හා කළමනාකරණ කමිටු පවත්වන ලද වාර ගණන |
|---|---|---|
| 1 | පළාත් සභාව හා පළාත් සභා ලේකම් කාර්යාලය | 02 |
| 2 | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව | 02 |
| 3 | සමුපකාර සේවක කොමිෂන් සභාව | 01 |
| 4 | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 02 |
| 5 | පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව | 03 |

### විධිමත් මූල්‍ය පාලනයක් ඇති කිරීම සඳහා වෙන් වෙන් වශයෙන් පවත්වන ලද විගණන හා කළමනාකරණ කමිටු - 2017

| අනු අංකය | දෙපාර්තමේන්තුව/ආයතනය | විගණන හා කළමනාකරණ කමිටු පවත්වන ලද වාර ගණන |
|---|---|---|
| 6 | පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 04 |
| 7 | පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | 01 |
| 8 | පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව | 02 |
| 9 | පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව | 01 |
| 10 | පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | 01 |
| 11 | පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | 01 |
| 12 | පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව | 01 |
| 13 | මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය | 01 |
| 14 | පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව | 02 |
| 15 | පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව | 01 |
| 16 | පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව | 02 |

උතුරු මැද පළාත් සභා ආයතනික ව්‍යුහය තුළ ඇති සෑම ආයතනයකම යම් නිශ්චිත කාලයකදී කරන ලද ආයතනික කටයුතු මෙන්ම මිණුම් ක්‍රියාවලිය ද ඇතුළත්ව සමස්ත කළමනාකරණ කාර්යයන් පිරික්සීම මෙම දෙපාර්තමේන්තුවට නියම වී ඇති අතර අප ආයතනය තුළ කාර්ය මණ්ඩලය කුඩා කණ්ඩායමක් වුවද කණ්ඩායමක් ලෙස කණ්ඩායම් හැඟීමෙන් හා විශාල කැප වීමකින් යුක්තව ක්‍රියා කිරීම තුළින් ආයතනික අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා ක්‍රියාකළ හැකි විය.

එමනිසාම මහජන මුදල් වැය කිරීමේදී විනිවිද භාවය මෙන්ම නීත්‍යානුකූල හා නිවැරදිභාවය ඇති කිරීමට ක්‍රියා කිරීම සඳහා මගපෙන්වීම් කිරීමටත් හැකි වූ වසරකි. විශේෂයෙන්ම විගණන කළමනාකරණ කමිටු හරහා ශක්තිමත් මූල්‍ය පාලනයක් හා මූල්‍ය විනයක් සහිත ආයතන රාමුවක් පළාත් සභාව තුළ ගොඩනැගීමට දායකත්වය සැපයිය හැකි වූ වසරකි.

එක් එක් අමාත්‍යාංශ හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු හා අධිකාරී තුළ ඇති වූ ගැටළු හඳුනා ගැනීම සහ ඒ සඳහා සාධාරණ විසඳුම් යෝජනා කර විධිමත් මූල්‍ය පාලනයක් ඇති කිරීම තුළින් කාර්යක්ෂමතාවය හා ඵලදායී රාජ්‍ය සේවයේ නිර්මාණය කිරීම සඳහා සක්‍රිය දායකත්වයක් සැපයීමට හැකිවූ ඉලක්ක සහගතව හා සුභවාදීව ගමන් කිරීමට හැකිවූ වර්ෂයක් ලෙස 2017 වර්ෂය විග්‍රහ කළ හැක.

මෙය හිස්ව තබන ලද පිටුවකි

# පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකය

**5.5**

## දැක්ම

"පරිපූර්ණ මහජන සේවකයෙක්, ගුණාත්මක රාජ්‍ය සේවයක්"

## මෙහෙවර

"ජාතික ප්‍රතිපත්තියට අනුගතව පළාතේ රාජ්‍ය සේවකයින්ගේ ධාරිතා ඉහළ නැංවීම, පුහුණු අවශ්‍යතා තක්සේරුව, කාර්යසාධන නියාමනය සියලු පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව සංවිධානය කරමින් ජනතාවාදී රාජ්‍ය සේවයක් බිහි කිරීමට අඛණ්ඩව දායකවීම."

## දිගුකාලීන අරමුණු හා කෙටිකාලීන අරමුණු

### දිගුකාලීන අරමුණු

රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නිළධාරීන් පුහුණු කිරීම තුළින් කාර්යක්ෂම හා ඵලදායී රාජ්‍ය සේවයක් ඇති කිරීම.

### කෙටිකාලීන අරමුණු


රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නිළධාරීන් පුහුණු කිරීම.

## ප්‍රධාන කාර්යයන්

- රාජ්‍ය සේවකයින්ගේ ධාරිතා සංවර්ධනය
- පුහුණු අවශ්‍යතා තක්සේරුව
- කාර්යසාධන නියාමනය
- ආයතනික ධාරිතා සංවර්ධනය
- යහ පාලනය

## කාර්ය මණ්ඩල සංයුතිය

| | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | අනුමත සංඛ්‍යාව | 37 |
| 02 | සේවයේ නියුතු සංඛ්‍යාව | 27 |
| 03 | පුරප්පාඩු සංඛ්‍යාව | 10 |
| 04 | අනියම් | 01 |



මෙහෙයුම් ප්‍රතිඵල- පුනරාවර්තන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2017 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 13.01 | 14.93 | - 1.92 | 114.76 |
| ගමන් වියදම් | 0.60 | 0.23 | 0.37 | 38.33 |
| සැපයීම් | 3.60 | 1.49 | 2.11 | 41.39 |
| නඩත්තු වියදම් | 1.80 | 0.97 | 0.83 | 53.89 |
| ගිවිසුම්ගත සේවා | 8.15 | 1.78 | 6.37 | 21.84 |
| මාරු කිරීම් | 0.27 | 0.057 | 0.22 | 22.22 |
| වෙනත්(කාර්ය මණ්ඩල පුහුණු) | 6.10 | 6.3 | - 0.2 | 104.26 |
| **එකතුව** | **33.53** | **25.76** | **7.72** | **76.95** |

පුනරාවර්තන වියදම් දරමින් සංවර්ධන ස්වභාවයේ වැඩ ඉටු කිරීම.


| අනු අංකය | ව්‍යාපෘතිය/වැඩසටහන | ප්‍රධාන ක්‍රියාකාරකම | අපේක්ෂිත ප්‍රතිඵල | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|
| 01 | 2017 වාර්ෂික පුහුණු සැලැස්ම අනුව සහ පළාත් රාජ්‍ය ආයතන වල ඉල්ලීම අනුව පුහුණු වැඩසටහන් පැවැත්වීම | උතුරු මැද පළාත් සභාවේ සියළුම රාජ්‍ය සේවකයින් සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම, පැවැත්වීම හා පසුවිපරම් කිරීම | උතුරු මැද පළාත් සභාවේ සියළුම රාජ්‍ය සේවකයින්ගේ දැනුම කුසලතා වර්ධනය හා ආකල්ප සංවර්ධනය තුලින් ගුණාත්මක රාජ්‍ය සේවයක් ඇති කිරීම. | 2017 වර්ෂයේ පුහුණුව ලැබූ පුහුණු ලාභීන් ගණන 5279කි |

මූලධන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2017 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි හා ඉදිකිරීම් | 60.00 | 57.94 | 2.06 | 96.57 |
| යන්ත්‍ර සූත්‍ර සවිකරීම් හා උපකරණ | 0.50 | 0.00 | 0.50 | 0.00 |
| වෙනත් මූලධන වත්කම්,පුනරාවර්තන හා වැඩිදියුණු කිරීම | 0.90 | 0.00 | 0.90 | 0.00 |
| **එකතුව** | **61.40** | **57.94** | **3.46** | **94.36** |

**සංවර්ධන වැඩ පිළිබඳ කාර්ය සාධනය - පසුගිය වසර තුනක ප්‍රාග්ධන වැයවීම්.**

| වර්ෂය | PSDG | වෙනත් ප්‍රතිපාදන | මුදල රු.මි |
|---|---|---|---|
| 2015 | 6.16 | - | 6.16 |
| 2016 | 4.40 | - | 4.40 |
| 2017 | 58.39 | 5.51 | 63.90 |




**දිගු කාලීන හා කෙටි කාලීන අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ප්‍රධාන කාර්යයන් හා සම්බන්ධ ව්‍යාපෘති**

ශ්‍රී ලංකාවේ ජනවාර්ගික ගැටුම් නිසා බලපෑමට ලක්වූ දිස්ත්‍රික්කයන්හි වෙසෙන ජනතාවගේ ජීවන තත්වය ඉහළ නැංවීම සඳහා ඉදිරිපෙළ ක්ෂේත්‍ර නිලධාරින්ගේ ධාරිතාවන් ඉහළ නැංවීම සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරිම කැපී පෙනුණි.

**ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 29 ආවරණය කරමින් ඉදිරිපෙළ නිලධාරීන් 360 ක් පුහුණු කිරීමට 2017 වර්ෂය තුළ දී හැකිවිය.**

| අනු අංකය | අරමුණ | අරමුණ ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | ප්‍රධාන ක්‍රියාකාරකම | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ගණන | වෙන් කළ මුදල රු.මි | ප්‍රගතිය (%) | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය |
| 01. | ශ්‍රී ලංකාවේ ජනවාර්ගික ගැටුම් නිසා බලපෑමට ලක්වූ දිස්ත්‍රික්කයන් හි වෙසෙන ජනතාවගේ ජීවන තත්වය ඉහළ නැංවීම | උතුරු මැද පළාතේ සේවයේ නියුතු තෝරාගත් ඉදිරිපෙළ නිලධාරීන් ප්‍රජා සංවර්ධනය හා ප්‍රජාව බලගැන්වීම පිළිබඳ පුහුණු කිරිම | ඉදිරිපෙළ නිලධාරීන් සඳහා මොඩියුල 5ක් යටතේ පුහුණු වැඩසටහන් පැවැත්වීම | 29 | 6.46 | ඉදිරිපෙළ නිලධාරීන් 360 ක් පුහුණු කිරීම | 85% |

## 2017 වර්ෂයේදී පවත්වන ලද වෙනත් පුහුණු වැඩසටහන්

| අංකය | වැඩසටහන | දින ගණන | සහභාගි වූ සංඛ්‍යාව | මුළු වියදම (රු.මි) |
|---|---|---|---|---|
| 01 | ධාරිතා සංවර්ධනය - පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව | 3 | 20 | 0.048 |
| 02 | කළමනාකරණ සහකාර නිලධාරින්ගේ කාර්ය සාධනය ඉහළ නැංවීම | 2 | 26 | 0.032 |
| 03 | පළාත් ආදායම් දෙපාර්තමේන්තු නිලධාරින් සඳහා වූ පරිගණක පුහුණු වැඩමුළුව | 4 | 24 | 0.062 |
| 04 | මූලික විමර්ශණ පුහුණු වැඩමුළුව | 3 | 25 | 0.050 |
| 05 | අත්තිකාරම් ගිණුම් පුහුණු වැඩමුළුව | 2 | 29 | 0.036 |
| 06 | විශ්‍රාම වැටුප් සකස් කිරිම | 2 | 45 | 0.052 |
| 07 | ගැටුම් කළමනාකරණය | 1 | 30 | 0.020 |
| 08 | සාමාන්‍ය හැසිරිම හා විනය | 2 | 20 | 0.029 |
| 09 | පරිගණක පුහුණු වැඩමුළුව | 3 | 25 | 0.049 |
| 10 | ප්‍රසම්පාදන ක්‍රියාවලිය | 2 | 35 | 0.044 |
| 11 | කණිෂ්ඨ සේවක කාර්ය සාධනය ඉහළ නැංවිම | 2 | 35 | 0.036 |
| 12 | වැටුප් පරිවර්තන සකස් කිරිම පිළිබඳ පුහුණු වැඩමුළුව | 2 | 35 | 0.046 |
| 13 | පරිගණක පුහුණු වැඩමුළුව | 3 | 25 | 0.044 |
| 14 | සේවක වරප්‍රසාද අයිතිවාසිකම් හා වගකීම් | 1 | 42 | 0.022 |
| 15 | ව්‍යාපෘති වාර්තා සකස් කිරිම | 3 | 80 | 0.047 |
| 16 | මූලික විමර්ශණ | 3 | 60 | 0.046 |
| 17 | අන්තර්ජාල භාවිතය | 2 | 45 | 0.031 |
| 18 | මූලික ගිණුම්කරණය | 3 | 43 | 0.071 |
| 19 | පෞද්ගලික ලිපිගොණු නඩත්තුව | 2 | 80 | 0.043 |
| 20 | රියදුරු කාර්ය සාධනය ඉහළ නැංවීම | 2 | 40 | 0.030 |

| අංකය | වැඩසටහන | දින ගණන | සහභාගී වූ සංඛ්‍යාව | මුළු වියදම (රු.මි) |
|---|---|---|---|---|
| 21 | ප්‍රධාන කළමනාකරණ සහකාර නිලධාරීන්ගේ කාර්යභාරය | 1 | 40 | 0.023 |
| 22 | මූලික ගිණුම්කරණය පිළිබඳ පුහුණු වැඩමුළුව | 3 | 122 | 0.103 |
| 23 | අන්තර්ජාල භාවිතය | 2 | 54 | 0.036 |
| 24 | මූල්‍ය සාක්ෂරතාවය ඉහළ නැංවීම | 1 | 100 | 0.021 |
| 25 | තොරතුරු දැනගැනීමේ පනත | 1 | 200 | 0.098 |
| 26 | මහජන සම්බන්ධතාවය හා සන්නිවේදනය | 1 | 35 | 0.028 |
| 27 | පරිගණක පුහුණු වැඩමුළුව | 2 | 50 | 0.036 |
| 28 | වැටුප් පරිවර්තන සකස් කිරිම පිළිබඳ පුහුණු වැඩමුළුව | 2 | 60 | 0.038 |
| 29 | ආකල්ප සංවර්ධන පුහුණු වැඩමුළුව | 3 | 78 | 0.293 |
| 30 | වත්කම් කළමනාකරණය | 1 | 30 | 0.009 |
| 31 | SLIP ක්‍රමය භාවිතා කරමින් වැටුප් සකස් කිරීම | 2 | 40 | 0.043 |
| 32 | සේවක වරප්‍රසාද අයිතිවාසිකම් හා වගකීම් | 2 | 80 | 0.041 |
| 33 | පරිපාලන නිතිය හා අධිකරණ කටයුතු | 2 | 350 | 0.173 |
| 34 | බෝ නොවන රෝග නිවාරණය පිළිබඳ පුහුණු වැඩමුළුව | 1 | 300 | 0.107 |
| 35 | පරිගණක පුහුණු වැඩමුළුව | 2 | 40 | 0.03 |
| 36 | අභියෝග කළමනාකරණය | 1 | 35 | 0.021 |
| 37 | විගණන නිලධාරි පුහුණු වැඩමුළුව | 3 | 165 | 0.050 |
| 38 | විශ්‍රාම වැටුප් සකස් කිරිම | 2 | 90 | 0.057 |
| 39 | අන්තර්ජාල භාවිතය | 2 | 40 | 0.029 |
| 40 | පොත් මිලදී ගැනීම | | | 0.072 |
| 41 | මුල්‍ය සාක්ෂරතාවය ඉහළ නැංවීම පුහුණු වැඩමුළුව II | 1 | 50 | 0.025 |
| 42 | ප්‍රසම්පාදන ලියවිලි සකස්කිරිම පිළිබඳ පුහුණු වැඩමුළුව | 2 | 86 | 0.059 |
| 43 | පොත් මිලදී ගැනීම | - | - | 0.045 |

වෙනත් පුහුණු වැඩසටහන් ඉතිරි කොටස...

| අංකය | වැඩසටහන | දින ගණන | සහභාගි වූ සංඛ්‍යාව | මුළු වියදම |
|---|---|---|---|---|
| 44 | පරිගණක පුහුණු වැඩමුළුව | 2 | 54 | 0.036 |
| 45 | ව්‍යාපෘති කළමනාකරණය | 3 | 75 | 0.047 |
| 46 | රියදුරු කාර්යසාධනය ඉහල නැංවීම | 2 | 80 | 0.043 |
| 47 | පරිගණක පුහුණු වැඩමුළුව | 2 | 52 | 0.034 |
| 48 | අභියෝග කළමනාකරණය හා ක්ලමත කළමනාකරණය | 1 | 43 | 0.024 |
| 49 | තොරතුරු නිළධාරි පුහුණු වැඩමුළුව | 3 | 111 | 0.089 |
| 50 | පරිගණක පුහුණු වැඩමුළුව | 2 | 44 | 0.029 |
| 51 | උපදේශණය පුහුණු වැඩමුළුව | 2 | 78 | 0.042 |
| 52 | ආකල්ප සංවර්ධන පුහුණු වැඩමුළුව | 2 | 70 | 0.238 |
| 53 | රියදුරු ප්‍රාරම්භක පුහුණු වැඩමුළුව | 3 | 105 | 0.061 |
| 54 | ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි ප්‍රාරම්භක පුහුණු වැඩමුළුව | 0 | 20 | 3.2 |
| 55 | තොරතුරු නිළධාරි දැනුවත් කිරීමේ පුහුණු වැඩමුළුව | 3 | 80 | 0.061 |
| 56 | සාමන්‍ය හැසිරීම හා විනය | 1 | 28 | 0.021 |
| 57 | පුහුණු සැලැස්ම සකස් කිරීම | 1 | 50 | 0.053 |
| 58 | අන්තර්ජාල භාවිතය | 2 | 50 | 0.032 |
| 59 | පරිගණක දෘඩාංග | 2 | 30 | 0.198 |
| 60 | දෙමළ භාෂා පුහුණු වැඩමුළුව (සං.නි/කළ.සහකාර) | 12 | 1320 | 0.029 |
| 61 | දෙමළ භාෂා පුහුණු වැඩමුළුව (කණිෂ්ඨ සේවක) | | 180 | 0.081 |
| | **එකතුව** | **127** | **5279** | **6.436** |

## 2017 වර්ෂයේ මෙහෙයුම් සමාලෝචනය හා සංවර්ධන කාර්ය පිළිබඳ කාර්ය සාධනය

2017 වර්ෂයේ පුහුණු සැලැස්මට අනුව පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය වර්ධනය කිරීමේ අරමුණින් විවිධ විෂය ක්ෂේත්‍රයන් ඔස්සේ වැඩසටහන් 43 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණි. 2017 වර්ෂය අවසන් වනවිට විෂය ක්ෂේත්‍රයන්ට අදාල මෙන්ම විෂය බාහිර හා වෙනත් ආයතනවල ඉල්ලීම මත වැඩසටහන් 59ක් පවත්වන ලදී.

දිගුකාලීන වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක කළ ජපන් රජයේ JICA ව්‍යාපෘතිය මඟින් උතුරු මැද පළාතේ ගැටුම් පැවති ප්‍රදේශවල ප්‍රජා සංවර්ධනය ඇති කිරිම හා ප්‍රජාව බලගැන්වීමේ අරමුණින් ඉදිරිපෙළ නිලධාරීන් පුහුණු කිරීම සාර්ථක ව්‍යාපෘතියක් ලෙස සිදුකරන ලදී.

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී පුහුණු මධ්‍යස්ථානයේ භෞතික සම්පත් සහ පහසුකම් ප්‍රමාණවත් නොවීමේ ගැටළුවට මුහුණු දීමට සිදු වුවද සැලසුම්ගත වැඩසටහන ක්‍රියාත්මක කිරිමට හැකිවිය.

මෙය හිස්ව තබන ලද පිටුවකි

# පළාත් ආදායම් දෙපාර්තමේන්තුව

5.6

## දැක්ම

"ප්‍රශස්ත බදු රැස්කිරීමේ ක්‍රියාවලියක්, සංවර්ධිත පළාතක්."

## මෙහෙවර

"සංවර්ධිත පළාතක් බිහිකිරීම සඳහා බදු හා ගාස්තු රැස් කිරීම, බදු හා ගාස්තු ගෙවන්නන්ගේ ආකල්ප සහ අනෙකුත් රාජ්‍ය ආයතන සමග සම්බන්ධීකරණය, අදාල පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව සංවර්ධනය කිරීම."

## දිගු කාලීන අරමුණු හා කෙටිකාලීන අරමුණු

### දිගු කාලීන අරමුණු

- සියළු බදු හා ගාස්තු ආදායම් රැස් කිරීම ඉහළ නැංවීම.
- ස්වේච්ජා බදු අනුකූලතාව වර්ධනය.

### කෙටිකාලීන අරමුණු

- උතුරු මැද පළාත් සභාව විසින් පළාත් ආදායම් දෙපාර්තමේන්තුව වෙත, වාර්ෂික මුදල් ප්‍රකාශයෙන් එක් එක් ආදායම් ප්‍රභවයන් සඳහා ඇස්තමේන්තු කර ඇති ආදායම්, හැකි උපරිමයෙන් රැස් කිරීම.

## ප්‍රධාන කාර්යයන්

- බදු හා ගාස්තු පැනවීම හා අයකිරීම.
- රැස් කරනු ලබන ආදායම මාසිකව වාර්තා කර පළාත් භාණ්ඩාගාරය වෙත මාරු කිරීම.
- අධිකරණ දඩ හා මුද්දර ගාස්තු වශයෙන් රැස්කරන ආදායම පළාත් පාලන ආයතන වලට බෙදාහැරීම සඳහා නිර්දේශ ලබාදීම.

## ප්‍රධාන උපාය මාර්ගයන්

- බදු හා ගාස්තු ගෙවන්නන්ගෙන් හා විවිධ ආයතන වලින් තොරතුරු කැදවීම.
- බදු හා ගාස්තු ගෙවන්නන් කැදවා සම්මුඛ සාකච්ඡා තුළින් පෙර බදු හා ගාස්තු අය කිරීම.
- බදු/ ගාස්තු ගෙවන්නන් හා නොතාරිස්වරුන් දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම.
- හිඟ බදු හා ඌණ මුද්දර ගාස්තු අය කිරීම.
- චංචල හා නිශ්චල දේපළ තහනම් කිරීම.
- බැංකු ගිණුම් තහනම් කිරීම.
- නඩු පැවරීම.

### කාර්ය මණ්ඩල සංයුතිය

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 51 |
| 2 | සේවයේ නියුතු | 40 |
| 3 | පුරප්පාඩු | 11 |
| 4 | අනියම් | 02 |
| 5 | කොන්ත්‍රාත් | 01 |

### මෙහෙයුම් ප්‍රතිඵල - පුනරාවර්තන වියදම්.

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය (රු.මි.) | 2017 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 32.99 | 29.47 | - | 89 |
| ගමන් වියදම් | 0.62 | 0.30 | 0.32 | 48 |
| සැපයීම් | 0.82 | 0.78 | 0.04 | 95 |
| නඩත්තු වියදම් | 0.67 | 0.61 | 0.06 | 91 |
| ගිවිසුම් ගත සේවා | 1.48 | 1.43 | 0.05 | 97 |
| මාරු කිරීම් | 0.64 | 0.48 | 0.16 | 75 |
| සහනාධාර (වෙනත්) | 0.35 | 0.19 | 0.16 | 54 |
| **එකතුව** | **37.57** | **33.26** | **4.31** | **89** |

පළාත් භාණ්ඩාගාරයේ අංක NCP/CS/PT/B/01/03(2017) හා 2017.12.31 දිනැති ලිපියට අනුව පුනරාවර්තන ඉතිරි ප්‍රතිපාදන අවුරා තබා ඇත. (බල අංකය NCP/CS/PT/B/01/03(56) )

### මූලධන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි.) | 2017 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි හා ඉදිකිරීම් | 13.0 | 10.24 | 2.80 | 78 |
| යන්ත්‍ර සූත්‍ර සවි කිරීම හා උපකරණ | 0.30 | 0.29 | - | 99 |
| වෙනත් මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 0.60 | 0.60 | - | 99 |
| **එකතුව** | **13.90** | **11.13** | **2.80** | **80** |


### ආදායම් ඉපයීම්

| ශීර්ෂය | ඉලක්කය (රු.මි) | සත්‍ය ආදායම (රු.මි) | එකතු කිරීමේ ප්‍රගතිය (%) |
|---|---|---|---|
| 10-02-04-05 මත්පැන් බලපත්‍ර ගාස්තු | 60.00 | 64.50 | 107 |
| 10-02-07-01 දේපල පැවරීම මත මුද්දර ගාස්තු | 125.0 | 176.1 | 141 |
| 10-02-07-02 අධිකරණ ලියවිලි මත | 5.00 | 3.70 | 74 |

| | | | |
|---|---|---|---|
| මුද්දර ගාස්තු | | | |
| 10-02-09-00 පිරිවැටුම් බද්ද | 1.50 | 0.90 | 64 |
| 20-03-02-27 ඖෂධ හා රසායන බද්ද | 2.00 | 1.10 | 54 |
| 20-03-02-30 ඛනිජ බද්ද | 5.80 | 5.30 | 92 |
| 20-03-03-01 උසාවි දඩ | 190.0 | 208.9 | 110 |
| **එකතුව** | **389.30** | **460.50** | **118** |

### සංවර්ධන වැඩ පිළිබඳ කාර්ය සාධනය- පසුගිය වසර 03 ක ප්‍රාග්ධන වැය වීම

| වර්ෂය | PCDG (රු.මි) | මුදල (රු.මි) |
|---|---|---|
| 2015 | 4.20 | 4.20 |
| 2016 | 9.80 | 9.80 |
| 2017 | 11.10 | 11.10 |




## *අංශය තුළින් ඉටුකර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු අංක -10*

**රටවල් තුළ සහ ඒවා අතර අසමානතාවය අඩු කිරීම**

10.1. 2030 වන විට ජනගහනයේ පහළ මට්ටමේ සිටින 40%හි ආදායම් වර්ධනය ජාතික මට්ටමේ සාමාන්‍ය අගයට වඩා වැඩියෙන් ප්‍රගතිශීලි ලෙස වර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම.

10.4 විශේෂයෙන්ම මුල්‍ය, වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිපත්ති භාවිතයට ගැනීම.

### මෙහෙයුම් සමාලෝචනය හා සංවර්ධන කාර්ය පිළිබඳ කාර්ය සාධනය

- **10-02-04-05- මෙරට මත්පැන් බලපත්‍ර ගාස්තු**

  පළාත තුළ ඇති මත්පැන් අලෙවිසැල් ගණන 137 කි. මෙම මත්පැන් බලපත්‍ර වලින් අපේක්ෂිත ආදායම රු.මි. 60.0කි. රැස් කළ ආදායම රු. මි. 64.4කි. මෙම වැඩි වීමට හේතුව පසුගිය වර්ෂයට අදාල බලපත්‍ර ගාස්තු ද මෙම වසර තුළදී ගෙන්වා ගැනීමයි.

- **10-02-07-01 දේපල පැවරීම මත මුද්දර ගාස්තු**

  මෙහි ඉලක්කය රු. මි. 125.0කි. රැස් කළ ආදායම් රු. මි. 176.1කි. මෙම ඉලක්කය විශාල වශයෙන් ඉක්මවීමට හේතු වූයේ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් ඔප්පු විමර්ශනය කිරීම හා අතිරේක මුද්දර ගාස්තු අය කිරීම හේතුවෙන් දේපල මිලදී ගන්නන් බොහෝ දුරට දේපලවල පවත්නා වෙළඳපල වටිනාකම මත මුද්දර ගාස්තු ගෙවීමට පෙළඹීමයි. තවද දේපළ වල වෙළඳපල මිල විශාල වශයෙන් ඉහළ යාමද මීට බලපෑ එක් හේතුවකි.

♦ **10-02-07-02- අධිකරණ ලියවිලි මත මුද්දර ගාස්තු**

ආදායම් ඉලක්කය රු.මි. 5.0කි. රැස් කළ ආදායම රු.මි. 3.69කි. උතුරු මැද පළාත තුළ ඇති දිසා අධිකරණ, මහා අධිකරණ, සිවිල් අභියාචනාධිකරණවලින් පවරනු ලබන නඩුවලට අදාලව ගොනු කරනු ලබන ලේඛන මත මෙම මුද්දර ආදායම තීරණය වේ.

♦ **10-02-09-00- ව්‍යාපාර පිරිවැටුම් බද්ද**

ඉලක්කය රු. මි. 1.5කි. රැස් කර ගත හැකි වූයේ රු. මි. 0.95 කි. 2010 වර්ෂයේ සිට අහෝසි කරන ලද මෙම බද්දේ ඉතිරිව ඇත්තේ හිඟ බදු අය කිරීම පමණි. අය කළ හැකි සියළු හිඟ පිරිවැටුම් බදු මේ වන විට අය කර ගෙන ඇත. තව දුරටත් අය කළ යුතුව ඇති හිඟ බදු අය කිරීම ඉතා දුෂ්කර නිසා ආදායම් ඉලක්ක සපුරා ගත නොහැකි විය.

♦ **20-03-02-27 ඖෂධ හා රසායන ද්‍රව්‍ය බද්ද**

ඉලක්කය රු. මි. 2.0 කි. රැස් කළ ආදායම රු. මි. 1.07 කි. ආදායම් ඉලක්ක සපුරා ගැනීමට නොහැකි වීමට හේතුව ප්‍රඥප්ති ප්‍රකාරව අර්ථ දක්වා ඇති වෙළඳ පරිශ්‍රය හා සම්බන්ධව අර්ථ දැක්වීම් අනුව, මතු වූ ගැටළු තත්ත්වයන් නිසා බදු අය කිරීම තාවකාලිකව ප්‍රමාද වීමයි. නමුත් ආණ්ඩුකාර තුමා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව මේ වන විට තත්ත්වය සමථයකට පත්වී ඇත. ඉදිරියේදී නියමිත පරිදි ඉලක්ක සපුරා ගැනීමට හැකිවනු ඇත.

♦ **20-03-02-30- ඛනිජ සම්පත් බද්ද**

අපේක්ෂිත ඉලක්කය රු. මි. 5.8 කි. රැස් කළ හැකි වූයේ රු. මි. 5.32 කි. මෙම ඌණතාවයට හේතු වූයේ පසුගිය වසර කිහිපය තුල විශාල ප්‍රමාණයේ ව්‍යාපෘති ක්‍රියාත්මක නොවීම හේතුවෙන් පළාත තුළ පවත්වා ගෙන ගිය ගල් වැඩපලවල් විශාල ප්‍රමාණයක් වැසී යාමයි. එසේ වූවත් 2016ට සාපේක්ෂව ආදායම රු.මි. 0.2කින් වර්ධනය කරගෙන ඇත.

♦ **20-03-03-01 උසාවි දඩ මුදල්**

අපේක්ෂිත ඉලක්කය රු. මි. 190.0 කි. රැස් කළ ආදායම රු. මි. 208.88 කි. මෙම වර්ධනයට හේතු වූයේ මාසික දඩ මුදල් නියමිත කාලය තුළ දී උසාවි වලින් ගෙන්වා ගැනීමට ක්‍රියා කිරීමයි. පළාත තුළ පිහිටි මහේත්‍රාත් අධිකරණවල පනවනු ලබන දඩ ප්‍රමාණය අනුව මෙම ආදායම තීරණය වේ.

**විදේශ ආධාර මත ක්‍රියාත්මක කරන ලද UNDP සංවර්ධන ව්‍යාපෘති තුලින් ජනිත කළ ප්‍රතිලාභ විශ්ලේෂණය කිරීම**

එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල මගින් උතුරු මැද පළාතේ පළාත් ආදායම් දෙපාර්තමේන්තු කාර්ය භාරය ශක්තිමත් කිරිම සදහා රුපියල් මිලියන 1.35ක ප්‍රතිපාදන ලබා දි ඇත.ඒ මගින් ක්‍රියාත්මක ව්‍යාපෘති පිළිබඳ විස්තර.

## විදේශ ආධාර මත ක්‍රියාත්මක කරන ලද UNDP සංවර්ධන ව්‍යාපෘති

| අ.අ | ව්‍යාපෘතිය | තමන්ගේ විෂය පථයට හසුවන අරමුණ | මුදල | | ප්‍රගතිය | | කෙටි කාලීන/දිගු කාලීන ප්‍රතිඵල |
|---|---|---|---|---|---|---|---|
| | | | වෙන් කළ (රු.මි.) | වියදම (රු.මි.) | භෞතික (%) | මූල්‍ය (%) | |
| 1 | නොතාරිස්වරුන් දැනුවත් කිරීමේ වැඩමුළු 2 ක් පැවැත්වීම | ආදායම් අය කිරීම සහ වර්ධනය කිරීම පිළිබඳ නොතාරිස්වරුන් දැනුවත් කිරීම. | 0.15 | 0.12 | 100 | 81 | මුද්දර ගාස්තු නිවැරදිව ගෙවීම සඳහා නොතාරිස්වරුන් පෙළඹවීම. |
| 2 | දෙපාර්තමේන්තු වේ නව දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීම. | ආදායම් එකතු කිරීම පරිපාලනය කිරීම සඳහා පරිගණක ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම. | 1.20 | - | 50 | - | නිවැරදි තොරතුරු කඩිනමින් ලබා ගැනීම තුළින් පළාතේ ආදායම් ඉහළ නැංවීම. |

### 2017 වර්ෂයේ කාර්ය සාධනය ළඟා කර ගැනීම පිළිබඳ අදහස.

අධිකරණ ලියවිලි මත මුද්දර ගාස්තු, ව්‍යාපාර පිරිවැටුම් බද්ධ, ඖෂධ හා රසායන බද්ධ සහ ඛනිජ සම්පත් බද්ධ වර්ෂයේ ආදායම් ඉලක්ක කරා ළඟා වීමට නොහැකි වු අතර, සමස්ත ආදායම 118.02% කින් සම්පූර්ණ කිරීමට හැකි වී ඇත. ඊට හේතු වූයේ දෙපාර්තමේන්තුවට සෘජු බලපෑමක් කළ හැකි ආදායම වන දේපළ පැවරීම මත මුද්දර ගාස්තු අය කිරීම යටතේ





ඔප්පු විමර්ශනය කිරීම විධිමත් කිරීම තුළින් ඌණ මුද්දර ගාස්තු අය කිරීම හා දේපළ මිලදී ගන්නන් වෙළඳපොළ වටිනාකමට ඔප්පු ලිවීමට පෙළඹීම තුළින් එම ආදායම 140.08% කින් සම්පූර්ණ කිරීමට හැකිවීමයි. තවද මත්පැන් බලපත්‍ර ගාස්තු ආදායම එම වර්ෂය තුළදීම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් ගෙන්වා ගැනීමට ක්‍රියා කිරීම ද ඊට බලපා ඇත.

උසාවි දඩ ආදායම109.08% ඉහළ යාමද මීට බලපෑ එක් හේතුවකි.අධිකරණ ලියවිලි මත මුද්දර ගාස්තු , පිරිවැටුම් බද්ද ඖෂධ හා රසායන බද්ද හා ඛනිජ සම්පත් බද්ද ප්‍රායෝගික හේතූන් මත ඉලක්ක කරා ලගා වීමට නොහැකි වුව ද අනෙකුත් ආදායම් විශාල වශයෙන් ඉලක්ක ඉක්ම වීමට හැකි වූයේ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ හැකියාව හා උනන්දුවෙන් වැඩ කිරීම හේතුවෙනි.

## කාර්ය සාධනය කරා ළඟා වීමේ දී මුහුණ දුන් ගැටළු

බදු හා ගාස්තු අයකිරීමේ දී ව්‍යවස්ථාපිත බලතල ඇත්තේ තක්සේරුකරුවන්ටය. අනුමත කාර්ය මණ්ඩලය අනුව තක්සේරුකරුවන් 11දෙනෙක් සිටිය යුතු නමුත්, දැනට සිටින්නේ 05දෙනෙක් පමණි. ඉන් නිලධාරීන් දෙදෙනෙක් අනුරාධපුර හා පොළොන්නරු කාර්යාලවල නියෝජ්‍ය කොමසාරිස් තනතුරුවල රාජකාරි ආවරණය කරයි. පොළොන්නරුව කාර්යාලයේ තක්සේරුකරුවන් 04 දෙනෙක් සිටිය යුතු නමුත්, දැනට පරිපාලන හා බදු අයකිරීමේ සියළු කටයුතු කරනු ලබන්නේ එක් නිලධාරියෙක් පමණි. මෙම තත්ත්වය ආදායම් රැස්කිරීමට බාධාවක් වී ඇත. තවද පොළොන්නරු කාර්යාලයේ ක්ෂේත්‍ර රාජකාරි සඳහා යෙදවීමට සුදුසු වාහනයක් නොමැති අතර තාවකාලික පිළියමක් ලෙස ප්‍රධාන ලේකම්ගේ උපදෙස් මත කොමසාරිස්ගේ නිල රථය යොදවා ඇත.

# 06

# උතුරු මැද පළාත් නීතිය හා සාමය, මුදල් හා ක්‍රම සම්පාදන, පළාත් පාලන, ග්‍රාමීය යටිතල පහසුකම් හා විශේෂ ව්‍යාපෘති, සංචාරක, අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ, ඉංජිනේරු ඉදි කිරිම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය.

උතුරු මැද පළාතේ පුස්තකාල සංඛ්‍යාව

| දිස්ත්‍රික්කය | පුස්තකාල සංඛ්‍යාව |
|---|---|
| අනුරාධපුර | 31 |
| පොළොන්නරුව | 21 |
| උතුරු මැද පළාත | 52 |

මුල් ළමාවිය සංවර්ධනය

| දිස්ත්‍රික්කය | පෙර පාසල් සංඛ්‍යාව | ගුරුවරු සංඛ්‍යාව | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|
| අනුරාධපුර | 940 | 1,623 | 22,455 |
| පොළොන්නරුව | 374 | 610 | 10,559 |
| **එකතුව** | **1,314** | **2,233** | **33,014** |

සංචාරක පැමිණීම

| දිස්ත්‍රික්කය | 2015 | 2016 |
|---|---|---|
| අනුරාධපුර | 61,880 | 78,022 |
| පොළොන්නරුව | 138,308 | 144,184 |
| **එකතුව** | **200,188** | **222,206** |

දැක්ම හා මෙහෙවර

**මෙහෙවර**

**" සියලු පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව පළාත් පාලනය, පළාත් මාර්ග, ග්‍රාමීය යටිතල පහසුකම්,විකල්ප බලශක්ති,ජනමාධ්‍ය හා සන්නිවේදනය,පුස්තකාල,මුද්‍රණ හා තාක්ෂණික සේවා, ජනතා සුභසාධනය හා සවිබල ගැන්වීම, සංචාරක, අධ්‍යාපනය, සංස්කෘතික, මුල් ළමාවිය අධ්‍යාපන කටයුතු සංවර්ධනය කිරීම සහ පළාතේ තොරතුරු තාක්ෂණය ප්‍රවර්ධනය කිරීම**

**දැක්ම**

**යහපත් සමාජයක්, සෞභාග්‍යමත් පළාතක්**

## දිගුකාලීන අරමුණු හා කෙටිකාලීන අරමුණු

### දිගුකාලීන අරමුණු

1. තිරසාර සංවර්ධනයක් කරා සමාජීය,ආර්ථික කටයුතු ඵලදායීව සහ කාර්යක්ෂමව ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම.

2. ප්‍රමාණාත්මක හා ගුණාත්මක අධ්‍යාපන සංවර්ධනයක් ඇති කිරීම.

3. උතුරු මැද පළාතේ සංස්කෘතික උරුමයන් ආරක්ෂාකර ගනිමින් සංචාරක ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම.

### කෙටිකාලීන අරමුණු

1. පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීම හා විධිමත් සංවර්ධනයක් තුළින් ජනතාවගේ
2. දෛනික කටයුතු පහසු කිරීම.

3. ජනතාවගේ සමාජ සංවර්ධනය ඉහළ මට්ටමකට ගෙන ඒම සඳහා අධ්‍යාපන සංවර්ධනය තහවුරු කිරීම.

4. පළාතේ තරුණ තරුණියන් සම්පතක් ලෙස සලකා ඒකාබද්ධ සංවර්ධනයට වැඩි දායකත්වයක් ලබාගත හැකිවන පරිදි තරුණ සංවර්ධන වැඩසටහන් හඳුනා ගැනීම හා ක්‍රියාත්මක කිරීම.

5. මාර්ග පද්ධතිය විධිමත්ව හා සංවිධානාත්මකව වැඩි දියුණු කිරීම තුළින් ජනතාවගේ කාර්යයන් පහසු කිරීම හා පළාත තුළ ඒකාබද්ධ සංවර්ධනයට ඉඩකඩ සැකසීම.


6. රටේ ජීවනාලිය බඳු ළමා පරපුරේ අනාගතය ශක්තිමත් කිරීම සඳහා පූර්ව ළමා සංවර්ධන මධ්‍යස්ථාන නගා සිටුවීම.

1. පළාත් සාම්ප්‍රදායික සංස්කෘතික සාරධර්ම ආරක්ෂාකර ගැනීම හා වර්තමාන පරම්පරාව ඒ පිළිබඳ දැනුවත් කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙන්ම තරුණ තරුණියන්ගේ සෞන්දර්යාත්මක හැකියාවන් වර්ධනය කිරීම.

2. අධික විදුලි අවශ්‍යතාවයන්ට පිළියම් වශයෙන් විකල්ප බලශක්ති ක්‍රම හඳුන්වාදීම.

3. සංචාරක කර්මාන්තය වැඩි දියුණු කිරීම උදෙසා විවිධ පුහුණු වැඩසටහන් පැවැත්වීම හා සංචාරක ගම්මාන ඇති කිරීම සඳහා පහසුකම් සැලසීම.

### ප්‍රධාන කාර්යයන්




### ප්‍රධාන උපාය මාර්ගයන්.

- ❖ නීතිය හා සාමය පවත්වා ගැනීමට පළාත් සභාව සියළු ආරක්ෂක අංශ ඒකාබද්ධව ක්‍රියාත්මක වීම.
- ❖ පළාත් පාලනය ආයතන පරිපාලනය කිරීම හා මූල්‍ය පාලනය සඳහා මාසික,තෛයිමාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.
- ❖ පළාතේ ජන ජීවිතය යථාවත් කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය.
- ❖ ආර්ථික සමාජීය යටිතල පහසුකස් සංවර්ධනය.
- ❖ ආයතනික ධාරිතා සංවර්ධනය.
- ❖ අධ්‍යාපන සංවර්ධනය.
- ❖ යහපාලනය.

### කාර්ය මණ්ඩල සංයුතිය

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 94 |
| 2 | සේවයේ නියුතු | 70 |
| 3 | පුරප්පාඩු | 24 |
| 4 | අනියම් | 01 |




### මෙහෙයුම් ප්‍රතිඵල-පුනරාවර්තන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2017 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 55.99 | 55.99 | 0 | 100 |
| ගමන් වියදම් | 1.86 | 1.86 | 0 | 100 |
| සැපයීම | 14.39 | 14.39 | 0 | 100 |
| නඩත්තු වියදම් | 13.26 | 13.26 | 0 | 100 |
| ගිවිසුම්ගත සේවා | 6.32 | 6.32 | 0 | 100 |
| **එකතුව** | **91.82** | **91.82** | **0** | **100** |

### මූලධන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2017 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 6,534.38 | 2,118.57 | 4415.81 | 32.42 |
| වෙනත් මූලධන වත්කම් පුනරාවර්තන හා වැඩිදියුණු කිරීම | 10.00 | 8.48 | 1.52 | 84.80 |
| **එකතුව** | **6544.38** | **2127.05** | **4417.33** | **32.50** |

## *අංශය තුළින් ඉටුකර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු අංක - 01*

**සියළු තන්හී පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම.**

1.1. 2030 වන විට ලෝකයේ සියළුම ස්ථානවල වෙසෙන පුද්ගලයින්ගේ අන්ත දරිද්‍රතාවය තුරන් කිරීම.

## *අංශය තුළින් ඉටුකර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු අංක - 02*

**සාගින්න නැතිකර , ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම.**

2.1. 2030 වන විට සාගින්න තුරන් කිරීම සහ විශේෂයෙන්ම ළදරුවන්ද ඇතුළත්ව දරිද්‍රතාවයෙන් පෙළෙන සහ අවදානමට ලක් වී තිබෙන ජනතාවට ආරක්ෂාකාරී,පෝෂණයෙන් යුත්, ප්‍රමාණවත් ආහාර වසර පුරා ලබා ගැනීමට හැකි බව තහවරු තිරීම.

2.2. 2030 වන විට කුඩා පරිමාණ ආහාර නිෂ්පාදකයින්ගේ විශේෂයෙන් කාන්තාවන්ගේ ස්වදේශික ජනයාගේ ගොවි පවුල් හා ධීවරයින්ගේ කෘෂිකාර්මික ඵලදායිතාවය සහ ආදායම ,ඉඩම්වලට ආරක්ෂාකාරීව සහ සමාන ලෙස ප්‍රවේශ වීමේ අවස්ථාවන් ,අනෙකුත් නිෂ්පාදන සම්පත් හා ප්‍රදානයන් .දැනුම ,මූල්‍ය සේවා,වෙළෙඳපොළ සහ වටිනාකම් එකතු කිරීම හා ගොවිපළ නොවන රැකියා සඳහා අවස්ථාවන් ලබා දීම මගින් දෙගුණ කිරීම.

2.4. 2030 වන විට තිරසර ආහාර නිෂ්පාදන පද්ධති පැවතීම තහවරු කිරීම.

## *අංශය තුළින් ඉටුකර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු අංක - 07*

**සියල්ලන් සඳහා දැරිය හැකි, විශ්වසනීය, තිරසර සහ නවීන බලශක්ති සැපයුම සහතික කිරීම.**

7.1. 2030 වන විට සියළු දෙනාටම අඩු මිලකට ලබා ගත හැකි විශ්වාසදායී නවීන බලශක්ති මූලාශ්‍රවලට ප්‍රවේශ විය හැකි බව තහවරු කිරීම.

7.2. 2030 වන විට ලෝක බලශක්ති මූලාශ්‍රයන්හි පුනර්ජනනීය බලශක්ති කොටස ඉහළ නැංවීම.

7.3. 2030 වන විට ලෝක බලශක්ති කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමේ අනුපාතිකය දෙගුණයක් කිරීම.

## *අංශය තුළින් ඉටුකර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු අංක - 08*

**සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායි සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම.**


8.2. විවිධාංගීකරනය,තාක්ෂණය ඉහළ නැංවීම සහ නවෝත්පාදන තුළින් සහ ඉහළ වටිනාකම් එකතු කරන ලද සහ ශ්‍රමය සඳහා වැඩි ඉල්ලුමක් ඇති ක්ෂේත්‍ර පිළිබඳ අවධානය යොමු කිරීම තුළින් ඉහළ මට්ටමේ ආර්ථික නිෂ්පාදිතයක් ලබා ගැනීම.

8.6. 2020 වන විට අධ්‍යාපනය නොලබන පුහුණුවක් නොලබන රැකියාවක් නොමැති යෞවනයින්ගේ සංඛ්‍යාව සැලකිය යුත මට්ටමින් අඩු කිරීම.

8.9. 2030 වන විට දේශීය සංස්කෘතිය,නිෂ්පාදනය හා රැකියා අවස්ථාවන් ප්‍රවර්ධනය කරන්නා වූ තිරසර සංචාරක කර්මාන්ත පිළිබඳ ප්‍රතිපත්ති සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

## සංවර්ධන වැඩ පිළිබඳ කාර්ය සාධනය - පසුගිය වසර 03ක ප්‍රාග්ධන වැයවීම (වියදම්)

| වර්ෂය | PSDG (රු.මි) | PCDG (රු.මි) | WB (රු.මි) | වෙනත් ප්‍රතිපාදන( රු.මි) | මුළු වියදම (රු.මි.) |
|---|---|---|---|---|---|
| 2015 | 199.54 | 349.97 | - | 386.68 | 936.19 |
| 2016 | 416.56 | 359.13 | 305.46 | 428.65 | 1,509.80 |
| 2017 | 1607.68 | 221.82 | 12.17 | 2004.54 | 3846.21 |




## මෙහෙයුම් සමාලෝචනය හා සංවර්ධන කාර්ය පිළිබඳ කාර්ය සාධනය

**පළාතේ ග්‍රාමීය ජනතාවගේ ආදායම් උත්පාදන අවස්ථා ජනිත කිරීම 2017**

### 01. TJC අඹ වගා ව්‍යාපෘතිය

ව්‍යාපෘතියේ පළමු අදියර 2015 වර්ෂයේ ආරම්භ කළ අතර අක්කර 289.88ක අඹ වගාකර ඇත.ප්‍රතිලාභීන් ගණන 521කි.අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රා.ලේ.කො. 26ක හා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍රා.ලේ.කො. 6ක අඹ වගාකර ඇත.

2017 වර්ෂයේ ව්‍යාපෘතියේ දෙවැනි අදියර යටතේ ග්‍රාමීය ඉඩම් අක්කර 170ක හා පාසල්වල ඉඩම් අක්කර 30ක අඹ වගා කිරීමට කටයුතු සලසා ඇත.

වගා කටයුතු සඳහා පුහුණු වැඩසටහන් හා උපදේශකත්වය සපයන අතර වගාව කප්පාදු කිරීමට අවශ්‍ය උපකරණ ද ලබා දී ඇත.

| | |
|---|---|
| 2015 | - රු. 8 889 950.50 |
| 2016 | - රු. 950 075 |
| 2017 | - රු. 6308 132 |





### T.J.C අඹ වගා ව්‍යාප්ත කිරීමේ ව්‍යාපෘතියේ අරමුණු

- පළාතේ T.J.C අඹ නිෂ්පාදනය වැඩි කිරීම.
- වැඩි පාර්ශවකරුවන් ප්‍රමාණයක් අඹ වගාව සඳහා යොමුකරලීම.
- නිෂ්පාදනයන්ගෙන් වැඩි ප්‍රමාණයක් දේශීය හා විදේශීය වෙළඳපොල වෙත යොමුකරලීම.
- පළාතේ ආන්ත්‍රික ඉඩම්වලින් වැඩි ප්‍රමාණයක් අඹ වගා කිරීම සඳහා යොදා ගැනීම.
- පළාතේ වාණිජ බෝග වගාව ප්‍රචලිත කිරීම.



පළාතේ වරින්වර වෙනස් වූ කාලගුණ තත්වයන් හේතුවෙන් වගාවන් සඳහා හානිකර තත්වයන් මතු වී ඇත.පසුගිය වසරේ ඇති වූ නියං තත්වයන් හේතුවෙන් වැඩි පිරිසකගේ වගාවන්ගෙන් යම් ප්‍රමාණයක් විනාශ වී ගොස් ඇති අතර එම විනාශ වූ වගාවන් නැවත යථා තත්වයට පත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.ඒ සඳහා නැවත පැල ලබා දීමට යෝජනා කර ඇත.එසේම වගා කටයුතු සඳහා අවශ්‍ය වතුර මෝටර් 40 % සහන පදනම මත ලබා දීමට ද 2018 වසරේ යෝජනා කර ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා 2015,2016 හා 2017 වසර වලදී රු.මි. 16ක් වියදම් දරා ඇත.

## 02. දිරිය සහන වැඩසටහන

| | |
|---|---|
| 2015 වර්ෂයේ ප්‍රතිලාභින් ගණන | - 374 |
| 2016 වර්ෂයේ ප්‍රතිලාභින් ගණන | - 174 |
| 2017 වර්ෂයේ ප්‍රතිලාභින් ගණන | - 377 |

### ව්‍යාපෘතියේ අරමුණු

- ✶ උතුරු මැද පළාතේ ස්වයං රැකියාලාභින්,අඩු පරිමාණ නිෂ්පාදකයින් සහ නව ස්වයං රැකියා ආරම්භ කරන්නන් සවිබල ගැන්වීම.
- ✶ ප්‍රතිලාභීන්ගේ ආදායම් මට්ටම කැපී පෙනෙන ඉහළ මට්ටමකට ගෙන ඒම සඳහා සහය වීම.
- ✶ නිෂ්පාදනයන් සඳහා වෙළඳපොළ අවස්ථාවන් පුළුල් කිරීමට අවශ්‍ය සහය ලබාදීම.
- ✶ නිෂ්පාදනයන් සිදුකිරීමට අවශ්‍ය තාක්ෂණික දැනුම ලබාදීම.

- ආහාර නිෂ්පාදනය
- කුළුබඩු නිෂ්පාදනය
- ඇදුම් මැසීම
- සත්ව පාලනය
- මල් වගාව
- වෙළදාම
- විසිතුරු මසුන් ඇති කිරීම
- බ්ලොක් ගල් නිෂ්පාදනය
- කෘෂිකාර්මික නිෂ්පාදන වැඩිදියුණුව
- රූපලාවන්‍ය ක්ෂේත්‍රය
- වඩු කර්මාන්තය



- ✓ **2015 වර්ෂයේ වියදම - 99 000/-**
- ✓ **2016 වර්ෂයේ වියදම - 6 161 411.31**
- ✓ **2017 වර්ෂයේ වියදම - 10 952 630.11**

- පෙදරේරු කර්මාන්තය
- විදුලි කාර්මික ක්ෂේත්‍රය

යන අංශයන් වැඩිදියුණු කර ගැනීම සඳහා උපකරණ හා අමුද්‍රව්‍ය ලබාදීම අංශ සඳහා සහය ලබාදීම සිදුකරයි. ලබාදෙනු ලබන උපකරණ හෝ භාණ්ඩවල වටිනාකමින් 60%ක් ප්‍රධාන අමාත්‍යාංශය මගින් ගෙවනු ලබයි.

## 2017 වර්ෂයේ දී එකතුව වු නව නිෂ්පාදන කරුවන්ගේ තාක්ෂණික දැනුම වර්ධනය සඳහා අමාත්‍යාංශය මගින් සැපයු තාක්ෂණික සහාය වැඩසටහන්.

1. නිෂ්පාදනයන් සඳහා වෙළඳපොළ සම්බන්ධතාවය ඇතිකර ගැනීම/ ශිල්පීය සකස්කර ගැනීම/ ගුණාත්මක භාණ්ඩ නිෂ්පාදනය පිළිබඳ පුහුණුව ලබාදීම.
2. ජංගම සේවාව හා කර්මාන්ත වෙළඳ ප්‍රදර්ශන සමූහ ප්‍රතිලාභීන් සහභාගී කරවීම.
3. ප්‍රතිලාභීන් සඳහා ව්‍යාපාර ලියාපදිංචිය පිළිබඳ පුහුණුව ලබාදීම.
4. ප්‍රතිලාභීන් සඳහා සාරි ජැකට් පුහුණුව ලබාදීම.
5. ප්‍රතිලාභීන් සඳහා ලෙදර් බෑග් හා සපත්තු පුහුණුව ලබාදීම සිදුකර ඇත.

| ව්‍යාපෘතියේ අවධානම | යෝජනා - 2018 |
|---|---|
| ➢ ප්‍රතිලාභීන්ගේ නිරන්තර කැපවීම හා නවෝත්පාදන රඳවා ගැනීම අඩු වීම. | ➢ පළාතේ නිෂ්පාදනයන් සඳහා අවශ්‍ය වෙළඳපොළ සම්බන්ධතාවයක් ඇතිකර ගැනීමට අවශ්‍ය මැදිහත්වීම සිදුකළ යුතුය. |
| ➢ සමස්ත පවුලේ කැපවීම හා අවධානම අඩු වීම. | ➢ ගුණාත්මක නිෂ්පාදනයන් සිදුකර ගැනීමට අවශ්‍ය පුහුණුවීම් ලබාදීම. |
| ➢ වෙළඳපොළ අවධානම / නිෂ්පාදනයන් සඳහා ගැලපෙන මිලක් නොමැතිකම හා අතරමැදියන් සම්බන්ධ වීම. | ➢ නිෂ්පාදනයන් වැඩිදියුණු කර ගැනීමට අවශ්‍ය ණය පහසුකම් ලබාදීම සඳහා කටයුතු කිරීම. |

## 03.සංචාරක ප්‍රවර්ධන කටයුතු
## රු.මිලි. 1.5

### 01.

සංචාරක මාර්ගෝපදේශකයින් පුහුණු කිරීම තුළින් දෙස් විදෙස් සංචාරකයින් සඳහා නිවැරදි හා ගුණාත්මක බවින් යුත් තොරතුරු ලබාදීම.

### 02.

සංචාරක සත්කාරක සේවා පුහුණු වැඩසටහන යටතේ පුහුණු පාඨමාලා පිළිබඳ දැනුවත් කර හෝටල් ක්ෂේත්‍රෙය් විදේශීය රැකියා සඳහා පළාතේ තරුණ තරුණියන් යොමු කිරීම.

### 03.

ප්‍රංශ භාෂා පුහුණු වැඩසටහන යටතේ විදේශ භාෂා පුහුණු ලබාදීම තුළින් විවිධ ක්ෂේත්‍රයන්හි විදේශීය රැකියා අවස්ථාවන් සඳහා පළාතේ තරුණ තරුණියන් යොමු කිරීම.

### 04.

සංචාරක කර්මාන්තයේ නියැලි සිටින විවිධ පාර්ශවකරුවන් දැනුවත් කිරීමේ මාධ්‍යයන් ක්‍රියාත්මක කිරීම තුළින් ගුණාත්මක සංචාරක කර්මාන්තයක් පළාත තුළ ඇති කිරීම.







**2016-2017 වර්ෂවලදී සංචාරක අමාත්‍යාංශයෙන් ලද ප්‍රතිපාදන වලින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති.**

| අ.අ | ව්‍යාපෘතිය | වෙන්වී ඇති මුදල (රු.මි.) | ලබා දී ඇති මුළු මුදල (රු.මි.) | 2017.12.30 වියදම (රු.මි.) | අතැති බිල් (රු.මි.) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|---|
| 01 | අනුරාධපුර ඉසුරුමුණිය රථගාල අසල සනීපාරක්ෂක පහසුකම් පද්ධතිය ඉදිකිරීම | 17 | 9.8 | 9.8 | 9.94 | 100 |
| 02 | අනුරාධපුර සමාධි පිළිමය, රථගාල අසල සනීපාරක්ෂක පහසුකම් පද්ධතිය ඉදිකිරීම | 17 | 10.66 | 10.76 | 6.63 | 100 |
| 03 | නුවර වැව වැව් බැම්ම මත සංචාරකයින්ට ගමන්කල හැකි ඇවිදින මන්තීරුවක් සකස් කිරීම (Foot Path) | 18.2 | 10.83 | 10.83 | 4.23 | 100 |
| 04 | මැදිරිගිරිය වටදාගෙය අසල පොකුණ හා අවට සංචාරක ආකර්ශනීය ස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම | 19.98 | 3.99 | 3.99 | 13.88 | 100 |
| 05 | ත්‍රෛමාසික සත්කාරක සේවා පුහුණු පාඨමාලාව | 0.49 | 0.25 | 0.25 | | 100 |
| 06 | සංචාරක පාර්ශවකරුවන් දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම | 0.29 | 0.24 | 0.24 | 0.06 | 100 |
| **එකතුව** | | **72.96** | **35.77** | **35.87** | **34.74** | |

## 01. සනීපාරක්ෂක පහසුකම් ප්‍රවර්ධනය



ඓතිහාසික හා පෞරාණික වටිනාකමකින් යුත් උතුරු මැද පළාත ශ්‍රී ලංකා රාජධානි යුගයේ දීර්ඝතම ඉතිහාසයකට උරුමකම් කියන අනුරාධපුර හා පොළොන්නරුව යන දිස්ත්‍රික්ක දෙකින් සමන්විත වේ.



මෙහි ඓතිහාසික වටිනාකමකින් යුත් පූජනීය ස්ථාන, පෞරාණික නටබුන් හා පාරිසරික වටිනාකමකින් යුත් ස්ථාන ආදි දෙස් විදෙස් සංචාරකයින්ට නැරඹිය හැකි ස්ථාන සමූහයකින් සමන්විත වේ.

මෙම දිස්ත්‍රික්ක දෙකින් සමන්විත වූ උතුරු මැද පළාත අනිකුත් පළාත්වලට වඩා සංචාරකයකුට නැරඹිය හැකි ස්ථාන බොහොමයකින් යුක්ත වේ. එසේම ඉතා ආකර්ශණීය ස්ථාන වලින්ද සමන්විත වේ. එබැවින් උතුරු මැද පළාත සංචාරක ව්‍යාපාරයේ විශේෂ වැදගත් කමක් හිමිකර ගනී.

## 02. ඉසුරුමුණිය පූජා භූමියට සනීපාරක්ෂක පහසුකම් පද්ධතියක් ස්ථාපිත කිරීම

**ඇස්තමේන්තු මුදල රු.මි. 19.5**

දෙස් විදෙස් සංචාරකයින් විශාල පිරිසක් ඇදී එන උතුරු මැද පළාත ආකර්ෂණීය පළාතක්වන බැවින් සංචාරක ආකර්ෂණීය ස්ථාන හා පූජා භූමියට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින්ට මූලික අවශ්‍යතා සපුරාලීම අත්‍යාවශ්‍යවන අතර සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා සංචාරකයින්ට අවශ්‍ය පහසුකම් ස්ථාපිත කර දීම ද ඒ අතරින් ප්‍රමුඛතම මෙන්ම වැදගත්ම කාර්යභාරයකි. වන්දනාමාන කරන




පිරිසට පහසුකම් සලසා දීමේ අරමුණින් ඉසුරුමුණිය පූජා භූමියට සනීපාරක්ෂක පහසුකම් පද්ධතියක් ස්ථාපිත කරන ලදි.



## 03. රුවන්වැලිසෑය රථගාල අභියස සනීපාරක්ෂක පහසුකම් පද්ධතියක් ස්ථාපිත කිරීම





දිනකට දෙස් විදෙස් සංචාරකයින් බොහෝ දෙනෙක් අනුරාධපුර පිහිටි මහමෙව්නා උයනෙහි රුවන්වැලිසෑය වැඳ පුදා ගැනීම අමතක නොකරන බැවින් පැමිණෙන සංචාරකයින්ගේ විඩාව සහ මහන්සිය දුරු කරලීම මෙන්ම තම මූලික අවශ්‍යතාවයන් සපුරාලීම උදෙසා රුවන්වැලිසෑය රථගාල අභියස ද ඉතා පිරිසිදු සනීපාරක්ෂක පහසුකම් පද්ධතියක් ස්ථාපිත කරන ලදි. මෙම ව්‍යාපෘති පූජා භූමිවල නිර්මාණවලට කිසිදු බලපෑමක් නොවන පරිදි පරිසර හිතකාමී ලෙස ක්‍රියාත්මක කිරීමට සුදුසු තාක්ෂණික නිර්මාණශීලි හා තිරසාර සැලසුම් සහිතව ක්‍රියාත්මක කරන ලදි.

## 04. කුට්ටම් පොකුණ හා සමාධි පිළිමය අතර රථගාල අසල සනීපාරක්ෂක පහසුකම් පද්ධතියක් ස්ථාපිත කිරීම



අනුරාධපුර පූජා නගරයට පැමිණෙන සංචාරකයින් කුට්ටම් පොකුණ නැරඹීම මෙන්ම සමාධි පිළිමය ද වැඳ පුදා ගනී. එමෙන්ම සමාධි පිළිමයෙන් හා කුට්ටම් පොකුණෙන් බොහෝ දුරට තම සංචාරක ග මනාන්තය අවසන් කරලීම සිදු කරනු ලබයි. එසේ හෙයින් පැමිණෙන සංචාරකයින්ගේ යටිතල පහසුකම් සපුරාලීම උදෙසා මෙලෙස සනීපාරක්ෂක පහසුකම් පද්ධතියක් ස්ථාපිත කරන ලදී.

## 05. දීප උයන සනීපාරක්ෂක පහසුකම් පද්ධතිය ඉදිකිරීම

**පො**ළොන්නරු නගරයට ආසන්නව පූජා භූමියට යාබදව නිශ්ශංකලතා මණ්ඩපයට පිවිසෙන දීප උයන නම් බිම් කොටස පොදු පහසුකම්වලින් යුත් සංචාරක ආකර්ශනිය ස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමේ අරමුණින් සංචාරකයෙකුට අවශ්‍ය ජාත්‍යන්තර ප්‍රමිතියකින් යුත් සනීපාරක්ෂක පහසුකම් පද්ධතියක් හා දෙස් විදෙස් සංචාරකයෙක්ට ගිමන් නිවාගත හැකි ආකර්ශනීය පරිසරයක් ගොඩනැගීම මෙම ව්‍යාපෘතිය තුළින් බලාපොරොත්තු වේ.



## 06 හබරණ සංචාරක තොරතුරු මධ්‍යස්ථානය ඉදිකිරීම

වෙන් කළ මුදල 166,000,000.00
- වියදම 165,872,391.82



**ක්‍රියාත්මක වෙමින් පවතින විශේෂ ව්‍යාපෘතියකි**

දෙස් විදෙස් සංචාරකයින්ගේ නෙත ගැටෙන ආකර්ෂණීය ස්ථාන බොහෝමයකින් සමන්විත අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්ක මෙන්ම දඹුල්ල, සීගිරිය, මාතලේ ඓතිහාසික නගර හා වන අලින් පහසුවෙන් දැකගත හැකි මින්නේරිය,කවුඩුල්ල වනරක්ෂිත මෙන්ම ත්‍රිකුණාමලය ආකර්ෂණීය වෙරළ තීරය යනාදී ලංකාවේ ප්‍රධාන සංචාරක ස්ථානයන්හි කේන්ද්‍රස්ථානයක් ලෙස හබරණ නගරය ඉතා වැදගත් ස්ථානයක් හිමිකර ගනී. අනුරාධපුරය හා පොළොන්නරුව දිස්ත්‍රික්ක දෙක මැද පිහිටි හබරණ නගරය දඹුල්ල, මහනුවර,මාතලේ අළු විහාරය හා කොළඹ හා අනෙකුත් ප්‍රදේශ සම්බන්ධ කිරීම මෙන්ම සංචාරකයින්ගේ ආකර්ෂණය දිනා ඇති ත්‍රිකුණාමලය හා උතුර යා කරන සංධිස්ථානයක් වීම ද හබරණ නගරයේ ඇති විශේෂත්වයකි.විශේෂයෙන් ලංකාවේ සංචාරය සඳහා පැමිණෙන විදේශීය සංචාරකයින් මෙන්ම දේශීය සංචාරකයින් ද වැඩි වශයෙන් මෙම ප්‍රදේශවල සංචාරය කරනු ලබයි.

**ව්‍යාපෘති නිමවුම්**

- ❖ තොරතුරු මධ්‍යස්ථානය
- ❖ වෙළද සංකීර්ණය
- ❖ නවාතැන් පහසුකම් ලබාගත හැකි කබානා 5 ක්
- ❖ ජාත්‍යන්තර ප්‍රමිතියකින් යුත් භෝජනාගාර
- ❖ ජාත්‍යන්තර ප්‍රමිතියකින් යුත් රැස්වීම් ශාලාව
- ❖ විවේකාගාර
- ❖ අභ්‍යන්තර මාර්ග පද්ධතිය හා ප්‍රවේශ දොරටු
- ❖ සූර්ය බලැති විදුලිලාම්පු
- ❖ වාහන නතර කළහැකි රථගාල
- ❖ අකර්ෂණීය පරිසරයකින් යුත් සංචාරක කලාපය

**ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිලාභ**

- ➢ හබරණ නගරය පළාතේ සංචාරක කේන්ද්‍රීය ස්ථානයක් ලෙස සංවර්ධනය වීම.



- ➢ පළාතට පැමිණෙන සංචාරකයින්ට අවශ්‍ය තොරතුරු හා පහසුකම් එකම ස්ථානයකින් ලබා දීමට හැකි වීම
- ➢ පළාත තුළ සංචාරක කටයුතු වර්ධනය වීම මඟින් සෘජු හා වක්‍ර රැකියා අවස්ථා වර්ධනය වීම.
- ➢ සංචාරක කර්මාන්තයේ විවිධාංගිකරණය

## 07.මින්නේරිය ආයුර්වේද පංචකර්ම මධ්‍යස්ථානය ඉදිකිරීම

**සංචාරක අංශයේ ප්‍රවර්ධන සඳහා පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කිරිම**

විවිධ හේතුන් මත දෙස් විදෙස් සංචාරකයින් විශාල පිරිසක් ඇදි එන උතුරු මැද පළාත ආකර්ශනීය පළාතක් වන බැවින් සංචාරකයින්ට අවශ්‍ය පහසුකම් ස්ථාපිත කර දීම හා එම පහසුකම් හඳුන්වාදීම ස්ථාන සිතියම් මගින් පෙන්වාදීම අවශ්‍ය වේ.

එමෙන්ම කාලීන අවශ්‍යතාවයක්ව පවතින පළාතේ සංචාරක තොරතුරු ඇතුළත් වෙබ් පද්ධතියක් සකස් කිරිමට අවධානය යොමු කර ඇත.

මේ තුළින් දෙස් විදෙස් සංචාරකයින්ට නවීන තාක්ෂණය භාවිතා කරමින් පළාත තුළ සංචාරකයින්ට නැරඹීමට අවශ්‍ය හා නැරඹිය හැකි ස්ථාන , එම ස්ථානවල තොරතුරු ලබාගෙන ඉදිරි කටයුතු සැලසුම්කර ගැනීමට හැකියාව ඇත.

එමෙන්ම දන්නා හඳුනන ස්ථාන වලට අමතරව සැඟවුන ඓතිහාසික හා පාරිසරික ස්ථාන පිළිබඳවද තොරතුරු සොයාගෙන එම ස්ථාන නැරඹීමට හැකියාව ලැබේ. තවද මෙම සංචාරක අංශයේ ප්‍රවර්ධනය පහත සඳහන් පරිදි වැඩසටහන්
මගින්ද මෙම පළාතට ඇදී එන පිරිස වර්ධනයක් ලබා ගත හැකි බව පෙනේ.


01. ජාතික මට්ටමේ ප්‍රදර්ශන සඳහා සහභාගි වීම.
02. ජාත්‍යන්තර ප්‍රමිතියකින් යුත් වීඩියෝ වාර්තාමය වැඩසටහනක් සකස් කිරීම.
03. ජාත්‍යන්තර ප්‍රමිතියකින් යුත් පින්තූර පොතක් නිර්මාණය කිරීම.
04. පළාත පිළිබඳ ආකර්ෂණය වැඩි කිරීම සඳහා තොරතුරු සහිත වෙබ් පද්ධතියක් නිර්මාණය කිරීම.

## 08. උද්‍යාන අලංකරණය - (රු.මිලි 80)

දෙස් විදෙස් සංචාරකයින් සඳහා ආකර්ශනිය පරිසරයන් ගොඩනැගීම තුළින් පළාතට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින් ප්‍රමාණය වර්ධනය කර ගැනීම අපේක්ෂා කෙරේ.

**1.පොළොන්නරුව දීප උයන සංවර්ධනය කිරිම**

**වෙන් කළ මුදල 15000,000.00**



**පො**ළොන්නරුව ඓතිහාසික ස්ථාන, මින්නේරිය ජාතික වනෝද්‍යානය, පරාක්‍රම සමුද්‍රය වැනි ස්ථාන ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයින් බොහෝ දෙනෙකු නැරඹීමට කැමති ස්ථාන වේ. එනමුත් මෙම ස්ථාන නැරඹීමට පැමිණෙන සංචාරකයින්ට අවශ්‍ය පහසුකම් හා ගිමන් නිවාගත හැකි ප්‍රියමනාප ස්ථානයක් නොතිබීම සංචාරක ව්‍යාපාරයේ ප්‍රවර්ධනයට බාධාවක්ව පවති.එබැවින් එය මගහරවා ගැනීම සඳහා ගත් එක් අවස්ථාවක් ලෙස පහසුකම් සහිත දීප උයන සංවර්ධන ව්‍යාපෘතිය හඳුන්වා දිය හැක.මෙය පූජා භූමියේ නිර්මාණයන්ට හානියක් නොවන ලෙස පුරාවිද්‍යා දෙපාර්තමේන්තු උපදෙස් මත ආකර්ශනීය පෙනුමක් ලබාදිය හැකි පරිදි නිර්මාණය කරලීය.

**ක්‍රියාකාරකම්**

- වගුරු බිම පස් පුරවා ව්‍යාපෘතියට සුදුසු පරිදි භූමිය සැකසීම.
- දීප උයනට දොරටුව ඉදිකිරීම ප්‍රවේශ දොරටුව පරිසර හිතකාමී ලෙස නිර්මාණය කිරීම.
- නිශ්ශංක ලතා මණ්ඩපය දක්වා පිවිසෙන මාර්ගය ගල් අතුරා සැකසීම.
- ප්‍රවේශ මාර්ගය හා අභ්‍යන්තර අතුරු මාර්ග පද්ධතිය ඉදිකිරීම.
- දිය අගල් හරහා ගමන් කිරීම සඳහා පාලම් ස්ථාපිත කිරීම.

ව්‍යාපෘති භූමිය අලංකාර ලෙස දෙස් විදෙස් සංචාරකයෙකුට ගිමන් නිවා ගැනීමට සුදුසු ආකාරයට පරිසරය නිර්මාණය කිරීම.

01. මේ සඳහා පරිසරයට සිසිලසක් දෙන (කුඹුක්) වැනි ගස් රෝපණය කිරීම.
02. වැඩුනු ගස් වටේ අසුන් ගත හැකි පරිදි අලංකාර බැමි ඉදිකිරීම.
03. සංචාරකයන්ට ව්‍යාපෘති භූමියෙහි ගමන් කිරීමට ගමන් කළ හැකි පරිදි ගල් අතුරා මාර්ග සැකසීම.
04. පා පැදි රඳවා තැබීම සඳහා කොන්ක්‍රීට් පා පැදි රැඳවුම් ඉදිකිරීම.
05. ව්‍යාපෘති භූමියෙහි ජලය බැස යාම සඳහා කාණු පද්ධතිය ඉදිකිරීම.
06. ව්‍යාපෘති භූමිය වටා ආරක්ෂිත වැටක් ඉදිකිරීම.
07. දිය අගල ප්‍රියමනාප අකාරයට සැකසීම.
08. ව්‍යාපෘති භූමියට විදුලිය සැපයීම.(විදුලි ආලෝකය හාසූර්යාලෝකය යොදා ගනිමින්)

රාත්‍රිය සඳහා ආලෝකය වඩා වැදගත් වන නිසා ආකර්ෂණය ඇති කිරීමට ආලෝක පද්ධතියක් සවි කිරීම හා ව්‍යාපෘති භූමියට ඇතුළුවීමේ මාර්ග අතුරුමාර්ග හා සුදුසු අනිකුත් ආලෝකය අවශ්‍ය තැන් සඳහා සූර්ය බලය යොදා ආලෝකමත් කිරීම.(Solar Power Street Lamps)


09. ව්‍යාපෘති භූමියට අවශ්‍ය ජලය සැපයීම භූමි අලංකරණයට හා අනිකුත් අවශ්‍යතා සඳහා.
10. පානීය ජල අවශ්‍යතාවය ලබාදීම.
11. පානීය ජල අවශ්‍යතාවය සඳහා පිංතාලියක් ඉදිකිරීම.
12. රථ වාහන නැවතීම සඳහා රථ ගාලක් ස්ථාපිත කිරීම.

**ආකර්ෂණීය පළාතක් නිර්මාණය කිරීමේ වැයම 2017 වර්ෂයේදීද ඉදිරියට.**

## 2. නුවර වැවේ වැව් බැම්ම ආකර්ෂණීය ලෙස සංවර්ධනය කිරීම
## ඇස්තමේන්තු මුදල රු.මි. 35

අනුරාධපුරයට පැමිණෙන සංචාරකයින් ආකර්ෂණය කරගත හැකිවන පරිදි නුවර වැවේ වැව් බැම්ම ආකර්ෂණීය ලෙස සංවර්ධනය කිරීම සංචාරක ප්‍රවර්ධන උදෙසා හඳුනාගත් ව්‍යාපෘතියක් වූ අතර සංචාරක අමාත්‍යාංශය හා ඒකාබද්ධව ක්‍රියාත්මක කළ වයාපෘතියකි.





දේශියද විදේශිය සංචාරකයින් බහුලව ගැවෙසෙන මෙම ප්‍රදේශයේ ජිවත්වන විවිධ වෘත්තිකයින්ගේ, විවිධ ක්‍රිඩාවල නියැලෙන්නන් ශරිරික ව්‍යයායාමවල නියලිම උදේසා ඇවිදින මං තිරුව භාවිතා කරනු ලැබේ. එසේම අවට විවත්වන ජනතාවගේ එදිනෙදා පිඩාකාරි ජිවිත රටාවෙන් ඈත් වී තම කායික මානසික විවේකිව ගත කිරිමට මෙම ස්ථානය උපයෝගි කර ගනියි. දිනක 400-500 අතර පිරිසක් සවස 4 සිට රාත්‍රි 8 වන තුරුත් , උදේ 6 සහ 7 අතර කාලයෙත් මෙම ස්ථානය භාවිතා කරනු ඇත.

## 3 .පොළොන්නරුව වටදාගෙය අවට පරිසරය අලංකාර කිරිම



උතුරු මැද පළාත සංචාරකයකුට නැරඹිය හැකි ස්ථාන බොහොමයකින් යුක්ත වන අතර වටදාගෙය ඉතා අකර්ශණිය ස්ථාන අතරින් තවත් එක් ස්ථානයකි. මෙය ඉහළින් ආගමික වටිනාකමක් ඇති හෙයින් එම ස්ථානය අවට



පරිසරය අලංකාර කිරීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී.

- මං තිරුව සෑදීම.
- සූර්යය බල ලාම්පුවලින් ආලෝකය සැපයිම.
- අවට පරිසරය අලංකාර කිරිම.
- වැව පිරිසිදු කිරිම.

## ලෝක සංචාරක දින ප්‍රදර්ශනය - 2017

### ආකේඩ් උද්‍යානය

### මෙහෙයවීම :- ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

### උතුරු මැද පළාත් ප්‍රදර්ශණ කුටිය




ලෝක සංචාරක දිනය සැමරීමේ උත්සවය කොළඹ ආකේඩ් උද්‍යානයේ දී 2017 වර්ෂයේ දී "Sustainable Tourism" තේමාව යටතේ පවත්වන ලදි. ඊට සමගාමීව සංචාරක වෙළඳ ප්‍රදර්ශනයක් එම ස්ථානයේ පවත්වන ලදි. ඒ සඳහා උ.මැ.ප. නියෝජනය කිරීම සඳහා අඩි 10 – 20 වෙළඳ කුටියක් සකස් කර උ.මැ.ප. ආකර්ෂණීය සංචාරක ස්ථාන හා පළාත පිළිබඳ ප්‍රසිද්ධියක් දෙස් විදෙස් සංචාරකයින් හට ලබාදෙන ලදි. තවද පළාත් සංචාරක කර්මාන්තය නියුක්ත කුඩා කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන ද එම ස්ථානයේ දී අලෙවි කර ඔවුන් සඳහා වෙළඳපළ අවස්ථා ලබා ගැනීමට පහසුකම් සපයන ලදි. ඒ සඳහා රු.113,926ක මුදලක් වැය විය.

## ජීවිතාරක්ෂක පුහුණු වැඩසටහන

**ව්‍යාපෘති වියදම = රු.650,000**

- උතුරු මැද පළාතේ රැකියා විරහිත පිහිනීමට හැකියාවක් ඇති තරුණ තරුණියන්හට ජාත්‍යන්තර ජීවිතාරක්ෂක පුහුණු සහතිකය ලබාදීම තුළින් පිහිනුම් තටාක හා වෙරළ ආරක්ෂක ජීවිතාරක්ෂක රැකියා සඳහා දෙස් විදෙස් අවස්ථා ලබාදීම. පුහුණු කළ සංඛ්‍යාව 50කි.
- පාසල් සිසුන් සඳහා පිහිනුම් හා ජීවිතාරක්ෂක මූලික සහතිකය සඳහා පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

## සංචාරක ප්‍රවර්ධන කටයුතු හා පුහුණු වැඩසටහන්

- සංචාරක ක්ෂේත්‍රයේ කර්මාන්තකරුවන් හා රැකියාවල නියුතු වූවන්ගේ ධාරිතා සංවර්ධන පුහුණුවක් පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කරන ලදි.
- ඒ සඳහා මෙම ක්ෂේත්‍රයේ කටයුතු කරන පාර්ශවකරුවන් 65 දෙනෙකු දින 03ක් පමණ සංචාරක කර්මාන්තය පිළිබඳ මූලික දැනුවත් කිරීම් රජරට විශ්වවිද්‍යාලය සංචාරක පීඨය කථිකාචාර්යවරුන් විසින් දේශන පවත්වන ලදි. මේ සඳහා සංචාරක අමාත්‍යාංශය මූල්‍යමය ප්‍රතිපාදන ලබාදෙන ලදි.

## සංචාරක ප්‍රවර්ධන රූපවාහිනි වැඩසටහන ( ආදරණීය ශ්‍රී ලංකා )

- අනුරාධපුර හා පොළොන්නරුව යන දිස්ත්‍රික්කවල සංචාරක කර්මාන්තය සඳහා දියුණු කළ හැකි ඉහළ විභවතාවයක් පවතින ස්ථාන පිළිබඳ රූපවාහිනි ප්‍රචාරක මගින් ඉරිදා සවස 7.30ට විකාශණය කරන ලදි.

## පුනර්ජනනීය බලශක්ති භාවිතය ප්‍රවර්ධනය කිරීම මඟින් පරිසර සංරක්ෂණය කරා....................

**රු.මිලි. 10**

- 2015 වර්ෂයේ දී ග්‍රාමීය ප්‍රදේශවල මංසන්ධි ආශ්‍රිතව සියලුම පළාත් පාලන කොට්ඨාශ ආවරණය වන පරිදි විථි ලාම්පු 58ක් ස්ථාපිත කිරීම.
- 2016 වර්ෂයේ දී සංචාරක ආකර්ශනීය ස්ථානවල සහ වෙනත් විශේෂිත ස්ථානවල විථි ලාම්පු 160ක් ස්ථාපිත කිරිමට කටයුතු කරමින් පවතී.
- 2017 වර්ෂයේ දී 41ක් ස්ථාපිත කරන ලදි.

| වර්ෂය | දිස්ත්‍රික්කය | | වෙන් කළ මුදල (රු.මි.) |
|---|---|---|---|
| | අනුරාධපුර | පො/නරුව | |
| 2015 | 42 | 16 | 5 |
| 2016 | 65 | 35 | 10 |
| 2017 | - | 41 | - |
| **එකතුව** | **107** | **92** | **15** |

ලෝකයේ මේ වනවිට විකල්ප බල ශක්ති ප්‍රභවයන් කෙරෙහි විශාල අවධානයක් යොමු වි ඇති බව පැහැදිලිය.
එහිදි ජාතිකප්‍රතිපත්තිය තුළ පුනර්ජනනීය බලශක්ති ප්‍රචලිත කිරිම කෙරෙහි අවධානය යොමු වී ඇත.

## හොඳම පාසල ළඟම පාසල
## මුළු ප්‍රතිපාදන වෙන් කිරීම රු.මිලියන 7,100.00

පාසල් පද්ධතිය තුළ තිබෙන භෞතික අවශ්‍යතාවයන් යටතේ කාලයක් තිස්සේ සම්පූර්ණ නොවීම තුළින් පළාතේ දරුවන්ගේ අධ්‍යාපන මට්ටම් ඉහළ නැංවීමට නොහැකි විය.එම තත්වයට පිළියමක් අරමුණින් හොඳම පාසල ළඟම පාසල ව්‍යාපෘතිය මෙරට දරු පරපුරේ අභිවෘද්ධිය වෙනුවෙන් ඉමහත් අත්වැලක් විය.

මානව සම්පත්වලින් පිරි ආයතනයක්වන පාසලෙහි භෞතික සම්පත් ඵලදායී කාර්යක්ෂම හා සිත්ගන්නා අයුරින් කළමණාකරණය කළ යුතුය. පාසල් ගොඩනැගිලි හා සම්පත් නඩත්තු කිරීම පිළිබඳව නිරන්තරයෙන්ම අවධානය යොමුවන බැවින් පාසල් ඇතුළුව පන්ති කාමර වෙනත් පන්ති කාමර ගොඩනැගිලි ඉදිකිරීම හා නවිකරණ කටයුතු කිරීම මේ යටතේ සිදුවිය.

| අ. අ | සංරචකය | ඇස්තමේන්තු පිරිවැය (රු.මි) | 2017 වෙන් කිරීම (රු.මි) | මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|---|
| 01 | පාසල්වල කුඩා නවීකරණ කටයුතු - පාසල් (461) | 628.82 | 699.00 | 402.33 |
| 02 | පාසල්වල ප්‍රධාන නවීකරණ කටයුතු-පාසල් (100) | 223.82 | 210.00 | 110.03 |
| 03 | ප්‍රාථමික ඉගෙනුම් ආධාරක මධ්‍යස්ථාන (Single Stored - පාසල් 58) | 626.85 | 590.00 | 340.94 |
| 04 | ප්‍රාථමික ඉගෙනුම් ආධාරක මධ්‍යස්ථාන (Double Stored - පාසල් 15) | 321.13 | 306.00 | 88.35 |
| 05 | පන්ති කාමර ගොඩනැගිලි ඉදිකිරීම - (පාසල් 36) | 1,450.22 | 205.00 | 454.12 |
| 06 | විදුහල්පති නිල නිවාස ඉදිකිරීම - (30) | 206.04 | 150.00 | 115.36 |
| 07 | ගුරු නිවාස ඉදිකිරීම (22) | 402.46 | 281.45 | 193.89 |
| 08 | ද්විතියක විද්‍යාගාර ඉදිකිරීම - (42) | 909.26 | 630.00 | 127.12 |
| 09 | ආපනශාලා ඉදිකිරීම - (13) | 179.03 | 65.00 | 56.38 |
| 10 | ක්‍රිඩා සංකීර්ණ ඉදිකිරීම - (08) | 204.80 | 128.00 | 10.25 |
| 11 | සෞන්දර්ය ඒකක ඉදිකිරීම - (04) | 164.73 | 176.00 | 81.05 |
| 12 | තාක්ෂණික ගොඩනැගිලි ඉදිකිරීම - (32) | 678.04 | 480.00 | 172.66 |
| 13 | සනීපාරක්ෂක ඒකක ලබාදීම - (331) | 397.71 | 292.16 | 257.52 |
| 14 | ජල පහසුකම් ලබාදීම - (75) | 20.78 | 17.41 | - |
| 15 | විදුලි පහසුකම් ලබාදීම - (810) | 126.98 | 150.58 | 56.06 |
| 16 | පාසල් දන්ත වෛද්‍ය ඒකක ඉදිකිරීම - (03) | 36.07 | 14.40 | 23.63 |
| 17 | පාසල් දන්ත වෛද්‍ය ඒකක නවීකරණය කිරීම - (06) | 8.75 | 4.60 | 0.25 |
| | එකතුව | **6,585.49** | **6481.45** | **1956.73** |

හොඳම පාසල ළඟම පාසල ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන

| මුළු ප්‍රතිපාදන වෙන් කිරීම (රු.මි) | ඇස්තමේන්තු පිරිවැය (රු.මි) | 2017 සඳහා වෙන් කිරීම (රු.මි) | මූල්‍ය ප්‍රගතිය 12/30 දිනට (රු.මි) |
|---|---|---|---|
| **7,100** | **6,585.49** | **6481.45** | **1956.73** |

පාසල් පද්ධතියේ සංවර්ධනය උදෙසා දායකත්වය

උතුරු මැද පළාතේ පාසල් 814ක් ස්ථාපිතකර ඇති අතර, සමස්ත පාසල් පද්ධතියේ ප්‍රමාණාත්මක හා ගුණාත්මක සංවර්ධනය සඳහා 2017 වර්ෂයේදී පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ පහත පරිදි රු.මිලියන 823.8ක ප්‍රතිපාදන මුදලක් වෙන්කර තිබුණි.

| | | |
|---|---|---|
| **01.** | පාසල් ගොඩනැගිලි සංවර්ධනය | රු.මිලියන 298.3 |
| **02.** | තෝරාගත් පාසල් අංග සම්පූර්ණ පාසල් ලෙස සංවර්ධනය කිරීම | රු.මි. 176.5 |
| **03.** | ප්‍රාථමික පාසල් ගොඩනැගිලි සංවර්ධනය සඳහා | රු.මි. 124 |
| **04.** | අඩක් නිමකළ පාසල් ගොඩනැගිලි සංවර්ධනය සඳහා | රු.මි. 148.7 |
| **05.** | කාර්යාල ගොඩනැගිලි සංවර්දනය සඳහා | රු.මි. 16.7 |
| **06.** | වැට මායිම් නිරවුල් කිරීම සඳහා | රු.මි. 2.3 |

පාසල්වල සිදුවන හදිසි අළුත්වැඩියා කටයුතු, ක්‍රීඩාපිටි සකස් කිරීම, කලාප හා කොට්ඨාශ අධ්‍යාපන කාර්යාල ඉදිකිරීම හා නඩත්තු කටයුතු මෙන්ම පාසල්වලට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම් සඳහා ද අනෙකුත් ප්‍රතිපාදන යොදවා ගැනිණි.

ලෝක බැංකු ආධාර මුදල්


| අ.අං | වැඩසටහන | ව්‍යාපෘති ගණන | | වෙන් වූ මුදල(රු) | | වියදම(රු) | |
|---|---|---|---|---|---|---|---|
| | | ප්‍රා.ස | කො.කාර්යාල | ප්‍රා.සය. | කො.කාර්යාල | ප්‍රා.ස | කො.කාර්යාල |
| 1 | පාසල්වල මූලික යටිතල පහසුකම් සංවර්ධනය | 3 | 2 | 17.26 | 7.51 | 10.36 | 4.24 |
| 2 | පාසල් ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම | 1 | 1 | 6.00 | 0.45 | 3.73 | - |
| 3 | පාසල් සෞන්දර්ය ඒකක ඉදිකිරීම | 5 | 3 | 18.69 | 2.79 | 6.10 | 3.39 |
| 4 | පාසල්වල ගුරු නේවාසිකාගාර ඉදිකිරීම | 4 | 7 | 5.60 | 5.54 | 3.38 | 2.59 |
| 5 | කොට්ඨාස කාර්යාල ගොඩනැගිලි ඉදි කිරීම | 9 | - | 49.28 | - | 39.84 | - |
| 6 | පාසල් උපකරණ මිල දී ගැනීම | 11 | - | - | - | - | - |
| | | **33** | **13** | **96.83** | **16.29** | **63.41** | **10.22** |

**පූර්ව ළමාවිය සංවර්ධනය උදෙසා අමාත්‍යාංශ දායකත්වය**

- 2016 වර්ෂයේ දී 35,000ක් පමණ වන පෙර පාසල් දරුවන්ගේ පෙරපාසල්වල භෞතික සම්පත් සංවර්ධනය සඳහා රු.මි.25ක් වෙන් කර ඇත.
- 2016 සංවර්ධන සැලැස්මට අනුව අනුරාධපුර හා පොළොන්නරුව ප්‍රධාන දිස්ත්‍රික්ක දෙක ආවරණය වන පරිදි නවීන පහසුකම් සහිත අංග සම්පූර්ණ පෙර පාසල් 02ක් ඉදිකිරීමේ කටයුතු ආරම්භ කළ අතර 2017 වර්ෂයේ දී ද 11 අදියර යටතේ රු.මි.5.4 බැගින් ප්‍රතිපාදන වෙන් කර ඇත.
- පෙර පාසල් දරුවන්ගේ හා ගුරුවරුන්ගේ මානසික හා ආකල්ප සංවර්ධනය සඳහා පුහුණු වැඩසටහන් සඳහා රු.මි.2.4ක මුදලක් වෙන් කර ඇත.මේ යටතේ පෙර පාසල් පාලිකාවන් මෙන්ම දෙමව්පියන්ගේ ආකල්ප හා හැකියාවන් සංවර්ධනය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

**පූර්ව ළමාවිය සංවර්ධන අධිකාරිය සඳහා සම්පත් මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා රු.මිලි.24ක මුදලක් වෙන් කර ඇති අතර එහි ඉදිකිරීම් කටයුතු දැනට සිදුවෙමින් පවති.**

**උතුරු මැද පළාත් අධ්‍යාපන සංවර්ධන අරමුදල ක්‍රියාත්මක කිරීම.**

- 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 -9 වන උප ලේඛනයේ උ 01 වගන්තිය හා 1987 අංක 07 දරණ පළාත් සභා පනත යටතේ උතුරු මැද පළාත් සභාව මගින් 1348/8 හා 2013 අංක 05 දරණ ප්‍රඥප්තිය යටතේ උතුරු මැද පළාත් අධ්‍යාපන සංවර්ධන අරමුදල ස්ථාපනය කර ඇත.
- උතුරු මැද පළාතේ අධ්‍යාපනය ප්‍රමුඛ තලයට ගෙන ඒම සඳහා මානසික සමබරතාවයකින් යුතුව අධ්‍යාපන කටයුතු ඉදිරියේ අසරණ නොවී අභිමානයෙන් යුතුව සමාජයට මුහුණ දීමට හැකි වාතාවරණයක් ගොඩනැන්වීම අරමුදලේ ප්‍රමුඛ පරමාර්ථය වේ.
- පළාත් සභා සංවර්ධන ප්‍රදාන , සාමූහික ප්‍රදාන, පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන හා අනිකුත් දේශීය හා විදේශීය අරමුදල් මගින් ප්‍රතිලාභ ලබාදිය නොහැකි සිසු අවශ්‍යතා සඳහා ප්‍රතිලාභ ලබා දීම මේ මගින් සිදු කෙරේ. ඒ සඳහා අවශ්‍ය මූල්‍ය උත්පාදනය 2013 හා 2015 වර්ෂවලදී අධ්‍යාපන සංවර්ධන අරමුදල් ලොතරැයිය අලවියෙන් ලබාගන්නා ලදී.






- 2015 වර්ෂයේදී අධ්‍යාපන සංවර්ධන අරමුදල මඟින් පහත සඳහන් විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී;

- **2015 වර්ෂයේදී අධ්‍යාපන සංවර්ධන අරමුදල මඟින් ක්‍රියාත්මක කළ විශේෂ වැඩසටහන්**
  - 2015 වර්ෂයේ ශිෂ්‍යත්ව විභාගය සමත්වු 2198 ඇගයීමට ලක් කිරිම.
  - දැඩි ආර්ථික අපහසුතා සහිත සිසුන් 5000 ක් සඳහා පාසල් උපකරණ කට්ටල ලබාදිම.
  - දැඩි ආර්ථික අපහසුතා සහිත ඉතා දුෂ්කර මාර්ග ගෙවා පාසල් යන සිසුන් සඳහා පාපැදි ලබාදීම.
  - ජාතික ජාත්‍යන්තර තරඟ සඳහා සුදුසුකම් ලැබූ සිසුන් සඳහා ගමන් වියදම් ලබාදීම.
  - සමස්ත ලංකා මට්ටමෙන් ඉහළ ජයග්‍රාහකයන් ඇගයීම සඳහා මූල්‍ය ත්‍යාග පිරිනැමීම.
  - ජාත්‍යන්තර තරඟ ජයග්‍රාහකයන් සඳහා මූල්‍ය ත්‍යාග පිරිනැමීම.

**2017 - අධ්‍යාපන සංවර්ධන අරමුදලින් ලබාදුන් ප්‍රතිලාභ**

| අනු අංකය | විස්තරය | ආදායම (රු.මි) | |
|---|---|---|---|
| 01. | ලොතරැයි ආදායම | 11,850,720.00 | |
| | විස්තරය | ප්‍රතිලාභින් සංඛ්‍යාව | වැය කළ මුදල (රු.මි) |
| 02. | දැඩි ආර්ථික අපහසුතා සහිත පාසල් සිසුන් 10000ක් සඳහා 2017 පාසල් වාරය සඳහා පාසල් උපකරණ සැපයීම. | 10000 | 1.06 |
| 03. | ලොතරැයි මුද්‍රණය හා අනිකුත් වියදම්. | - | 1.24 |
| 04. | ලොතරැයි ජයග්‍රාකයන් වෙත ත්‍යාග පිරිනැමීම. | 70 | 1.43 |
| 05. | පාසල් යෑම සඳහා ගමනාගමන දුෂ්කරතා සහිත සිසුන්ට පාපැදි ලබාදීම. | 2 | 0.03 |
| 06. | ජාතික හා ජාත්‍යන්තර තරඟ සහභාගීත්වයට මූල්‍යාධාර ලබාදීම. | 50 | 0.34 |
| | **එකතුව** | **10122** | 4.10 |

## පසුගාමී හා හුදකලා ගම්මාන ව්‍යාපෘතිය අංක 01
## වියදම් කළ ඇස්තමේන්තු මුදල මිලියන 13 ක් (13,000,000.00)

සංවර්ධන ක්‍රියාවලියේ ඇසට නොපෙනෙන හා අවධානයට ලක් නොවු හා අවම අවධානයක් සහිත හුදකලා වූ ගම්මානවල ජන ජීවිතය නගා සිටුවීම සඳහා යටිතල පහසුකම්, මූලික අවශ්‍යතාවයන් සංවර්ධනය කිරීම සඳහා වන ව්‍යාපෘතියකි. මේ යටතේ 2017 වර්ෂයේ කැබිතිගොල්ලෑව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ සෑම ග්‍රාම නිලධාරි වසමක්ම ආවරණය වන පරිදි එක් නිවස බැගින් ඉදිකිරිම මෙම ව්‍යාපෘතියේ ඉලක්කය විය.

ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයෙන් ග්‍රාම නිලධාරි වසම් 26 ආවරණයවන පරිදි එක් නිවසක් සඳහා රු. ලක්ෂ 05 බැගින් (මිලි.05) නිවාස 26ක් සඳහා රු.මිලි.13ක් වැය කරන ලදි.

## 2017 වර්ෂයේ කාර්ය සාධනය ළඟා කර ගැනීම පිළිබඳව අදහස

2016 හා සසඳා බලන විට 2017 වර්ෂය තුළ 2016 වර්ෂයට සාපේක්ෂව ඉහළ කාර්යසාධනයක් කරා ලගාවීමට හැකි වූ බව ප්‍රකාශ කළ හැක.

විශේෂයෙන්ම පළාතේ අධ්‍යාපන අංශයේ සංවර්ධනය සඳහා පැවති භෞතික මෙන්ම මානව සම්පත් අවශ්‍යතා 2017 වර්ෂය තුළ දී සැලකිය යුතු මට්ටමකින් සම්පූර්ණ කර ගැනීමට හැකි විය.එහිදී පාසල් ගොඩනැගිලි, පන්ති කාමර අවශ්‍යතා, විද්‍යාගාර අවශ්‍යතා ආදී පාසල් පද්ධතායේ සංවර්ධනය උ දෙසා භෞතික අවශ්‍යතා සම්පූර්ණ කිරීමට හැකිවිය. එසේම පළාත් රැකියා විරහිත ජනතාව සඳහා ස්වයං රැකියා අත්වැලක් සැපයීම සඳහා දිරිය සහන වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් මෙන්ම ගෘහස්ථ ප්‍රතිලාභීන් ප්‍රමාණයට ද වගාව සඳහා භාවිතා නොකළ ඉඩම්වල ආර්ථික වගාවක් ලෙස අඹ වගා ව්‍යාපෘතිය ද කැපී පෙනේ. එමෙන්ම ගෘහස්ථ සංචාරක නිවාස, දිරිය සහන, සංචාරක, අධ්‍යාපන, පූර්ව ළමාවිය, .

නිවාස, ග්‍රාමීය යටිතල පහසුකම් යනාදිය කැපී පෙනෙන වෙනස්කම් කිරීමට හැකිවිය.

සංචාරක අංශයේ ප්‍රවර්ධනය සඳහා කැපී පෙනෙන ලෙස ආයෝජනය කිරීමට 2017 වර්ෂය තුළ හැකිවිය. ඒ යටතේ,

- දෙස් විදෙස් සංචාරකයින්ට අවශ්‍ය තොරතුරු හා දත්ත පහසුවෙන් ලබාගත හැකිවීම.
- අන්තර්ජාල පහසුකම් ලබාගත හැකිවීම.
- විදේශ මුදල් පහසුවෙන් හුවමාරු කරගත හැකිවීම.
- සංචාරකයින්ට අවශ්‍ය පහසුකම් ලබාගත හැකිවීම.
- සංචාරක තොරතුරු මධ්‍යස්ථාන වෙත පැමිණෙන සංචාරකයින්ට සුදුසු සංචාරකයින් තෘප්තිමත් වීම.

විශේෂයෙන්ම විශේෂ අවශ්‍යතා සහිත වූවන් සඳහා ආධාර ලබාදීම සඳහා ප්‍රධාන අමාත්‍යාංශ අරමුදලෙන් ප්‍රතිලාභ ලබාදීමට හැකිවිය.

මෙය හිස්ව තබන ලද පිටුවකි

# පළාත් පාලන දෙපාර්තමේන්තුව

6.1

| විස්තරය | අනුරාධපුර | පොළොන්නරුව | එකතුව |
|---|---|---|---|
| මහ නගර සභා | 1 | 1 | 2 |
| ප්‍රාදේශිය සභා | 18 | 7 | 25 |
| ප්‍රාදේශිය සභා මන්ත්‍රීවරු | 202 | 90 | 292 |

**ප්‍රාදේශිය සභා - අනුරාධපුර**

| | | |
|---|---|---|
| 1. මිහින්තලේ | 8. ඉපලෝගම | 15. රාජාංගනය |
| 2. ගලෙන්බිදුනුවැව | 9. කහටගස්දිගිලිය | 16. නොච්චියාගම |
| 3. රඹෑව | 10. නැගෙනහිර නුවරගම් පළාත | 17. හොරොව්පොතාන |
| 4. කැබිතිගොල්ලෑව | 11. මධ්‍යම නුවරගම් පළාත | 18. පලාගල |
| 5. පදවිය | 12. කැකිරාව | |
| 6. ගල්නෑව | 13.තිරප්පනේ | |
| 7. මැදවච්චිය | 14. තලාව | |

**ප්‍රාදේශිය සභා - පොළොන්නරුව**

| | |
|---|---|
| 1. ඇලහැර | 5. ලංකාපුර |
| 2. වැලිකන්ද | 6. පොළොන්නරුව |
| 3. මැදිරිගිරිය | 7. හිඟුරක්ගොඩ |
| 4. දිඹුලාගල | |

**පළාත් පාලන මාර්ග**

| ග්‍රාමීය මාර්ග | අනුරාධපුර (කි.මී) | පොළොන්නරුව (කි.මී) | එකතුව |
|---|---|---|---|
| තාර | 270.00 | 292.00 | 562.00 |
| බොරළු මාර්ග | 7,893.27 | 3,079.41 | 10,972.68 |
| කොන්ක්‍රීට් මාර්ග | 90.62 | 101.79 | 192.41 |
| කුට්ටිගල් මාර්ග | 90.52 | 191.40 | 281.92 |
| කාපට් මාර්ග | 639.30 | 61.00 | 700.30 |
| **එකතුව** | **8,983.71** | **3,728.60** | **12,709.31** |

## පළාත් පාලන පොදු පහසුකම්

| අනු අංකය | පොදු පහසුකම් වර්ගය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | පුස්තකාල | 60 |
| 2 | ප්‍රාදේශිය සභා ජල ව්‍යාපෘති | 152 |
| 3 | නල ළිං | 3899 |
| 4 | සුසාන භූමි | 1607 |
| 5 | ප්‍රජා ශාලා | 911 |
| 6 | මාතෘ නිවාස | 229 |
| 7 | පොදු වෙළඳපල | 45 |
| 8 | ක්‍රීඩා භූමි | 339 |
| 9 | ගිනි නිවන මධ්‍යස්ථාන | 2 |
| 10 | පෙර පාසල් | 991 |
| 11 | උද්‍යාන | 24 |
| 12 | ආදාහනාගාර | 5 |
| 13 | සතිපොළ | 45 |
| 14 | ආයුර්වේද බෙහෙත් ශාලා | 53 |
| 15 | බටහිර බෙහෙත් ශාලා | 82 |
| 16 | උත්සව ශාලා | 61 |
| 17 | පිහිණුම් තටාක | 1 |
| 18 | ගිනි නිවන මධ්‍යස්ථාන | 2 |
| 19 | වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන | 36 |

### දැක්ම

"අවශ්‍යතා සපුරා ගත් තෘප්තිමත් ප්‍රජාවක්".

### මෙහෙවර

පළාත් පාලන ආයතනවල මිතුරෙකු, මගපෙන්වන්නෙකු, නියාමකයෙකු සහ දාර්ශනිකයෙකු වශයෙන් විනිවිද භාවයකින් යුතුව සමාජ හා ආර්ථික යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම, සේවා සැපයීම, කාර්යක්ෂම කිරීම සියළුම පාර්ශවකරුවන් අතර මනා සම්බන්ධතා ශක්තිමත් කිරීම මගින් ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීමට සහය වීම.

### දිගු කාලීන අරමුණු හා කෙටි කාලීන අරමුණු

### දිගු කාලීන අරමුණු

1. පළාත් පාලන ආයතනවල ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය.
2. පළාත් පාලන ආයතනවල සමාජ යටිතල පහසුකම් සංවර්ධනය.
3. පාර්ශවකරුවන් අතර මනා සම්බන්ධීකරණය.
4. ආයතනික ධාරිතා සංවර්ධනය.
5. යහ පාලනය ස්ථාපිත කිරීම.

### කෙටි කාලීන අරමුණු

1. පළාත් පාලන ආයතන වල මං මාවත් වැඩි දියුණු කිරීම.
2. කාර්යක්ෂම වෙළඳ පහසුකම් ඇති කිරීම.
3. ප්‍රජා ජල පහසුකම් වැඩි දියුණු කිරීම.
4. ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා තිරසාර යාන්ත්‍රණයක් සැකසීම.
5. පොදු සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම.
6. පුස්තකාල පහසුකම් වැඩි දියුණු කිරීම.
7. පෙර පාසල්වල යටිතල පහසුකම් සංවර්ධනය.
8. කාලීනව අතුරු ව්‍යවස්ථා පැනවීම.
9. පළාත් පාලන බල ප්‍රදේශවල සුසාන භූමි සංවර්ධනය.
10. පළාත් පාලන බල ප්‍රදේශවල ළමා උද්‍යාන, ක්‍රීඩා පිටි සංවර්ධනය.

11. පළාත් පාලන ආයතනවල සඵලතාවය හා කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම.

12. පළාත් පාලන ආයතන පුද්ගලික අංශය, මධ්‍යම රජය හා පළාත් සභාව අතර මනා සම්බන්ධතාවක් පවත්වා ගැනීම.

13. පළාත් පාලන ආයතනවල කාර්යක්ෂම මනා පුහුණුවකින් යුත් කාර්යය මණ්ඩල ස්ථාපිත කිරීම.

14. පළාත් පාලන ආයතන හරහා ක්‍රියාත්මක කර්මාන්ත අධීක්ෂණය.

### ප්‍රධාන කාර්යයන්


1. පළාත් පාලන ආයතනවලට තේරී පත්වූ මහජන නියෝජිතයින් පළාත් පාලන විෂය ක්ෂේත්‍රයෙහි දැනුවත් කිරීම හා මර්ගෝපදේශකත්වය ලබා දීම.
2. පළාත් පාලන ආයතනවල ශක්තීන් ගොඩනැගීම.
3. පළාත් පාලන ආයතනවල මූල්‍යමය ශක්තීන් ගොඩනැගීම.
4. සම්බන්ධීකරණ කටයුතු.

### ප්‍රධාන උපායමාර්ගය

පළාත් පාලන දෙපාර්තමේන්තුවේ පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන සහකාර කොමසාරිස්වරුන්, පළාත් පාලන ආයතන භාර විමර්ෂණ නිළධාරීන්ගේ සම්බන්ධීකරණයෙන් පළාත් පාලන ආයතන වල කටයුතු නිරීක්ෂණය හා අධීක්ෂණය.

### කාර්ය මණ්ඩල සංයුතිය

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 114 |
| 2 | සේවයේ නියුතු | 70 |
| 3 | පුරප්පාඩු | 48 |




### පුනරාවර්තන වියදම

| වියදමේ ස්භාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි.) | 2017 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 43.36 | 42.2 | 1.16 | 97.32 |
| ගමන් වියදම් | 2.09 | 0.86 | 1.23 | 41.15 |

| | | | | |
|---|---|---|---|---|
| සැපයීම් | 4.35 | 2.54 | 1.80 | 58.39 |
| නඩත්තු වියදම් | 1.80 | 1.29 | 0.51 | 71.67 |
| ගිවිසුම් ගත සේවා | 1.95 | 1.34 | 0.61 | 68.72 |
| මාරු කිරීම් | 888.88 | 724.94 | 163.94 | 81.56 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 1.50 | 0.51 | 0.99 | 34.00 |
| **එකතුව** | **943.93** | **773.68** | **170.24** | **81.96** |

## පුනරාවර්තන වියදම් දරමින් සංවර්ධන ස්වභාවයේ වැඩකටයුතු ඉටු කිරීම

| අංකය | ව්‍යාපෘතිය/ වැඩසටහන | ප්‍රධාන ක්‍රියාකාරකම | අපේක්ෂිත ප්‍රතිඵල | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|
| 1 | ඉපලෝගම පූජා භූමි සංවර්ධනය | 497 කාගම 6 ඇල ශ්‍රී අභයාරාම විහාරස්ථානයේ සංඝාවාසයේ සංවර්ධන කටයුතු සිදු කිරීම. | ඉපලෝගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඇති ආගමික සිද්ධස්ථාන සංවර්ධනය කිරීම. | 1800 ක් පමණ |
| 2 | ගල්නෑව පූජා භූමි සංවර්ධනය | ගල්නෑව, 464 කඳුළුගමුව උස්ගල තුලානේ වනවාසී ආරණ්‍යය ආවාස ගෙයි ටයිල් ඇතිරීම. | ගල්නෑව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඇති ආගමික සිද්ධස්ථාන සංවර්ධනය කිරීම. | 1625ක් පමණ |
| 3 | ලංකාපුර පූජා භූමි සංවර්ධනය | සෝමාවතිය පුදබිමේ ඉදිකරන ලද කළමනාකරණ මධ්‍යස්ථානයේ ඉතිරි වැඩ නිම කිරීම. | ලංකාපුර ප්‍රාදේශීය සභාවේ නිලධාරීන්ට හා සෝමාවතිය පුද බිම වන්දනා කිරීමට පැමිණෙන බැතිමතුන් සඳහා පහසුකම් සැපයීම මැනවින් ඉටු කිරීම. | දිනකට 400ක් පමණ |

මූලධන වියදම්

| වියදමේ ස්භාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි.) | 2017 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| වාහන | 0.4 | 0.4 | - | 100 |
| යන්ත්‍ර හා යන්ත්‍රාපකරණ | 0.1 | - | 0.1 | - |
| **එකතුව** | **0.5** | **0.4** | **0.1** | **80** |

## *අංශය තුළින් ඉටුකර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු අංක - 06*

**සැමට ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබා ගැනීම සහ ඒවායේ තිරසර කළමනාකරණය සහතික කිරිම.**

6.1. 2030 වන විට සියළු දෙනාට සමානාත්මතාවයෙන් යුතුව ආරක්ෂාකාරී සහ අඩු මිලකට පානිය ජලය ලබා ගැනීමට හැකි විම.

6.2. 2030 වන විට සියළුම දෙනාට ප්‍රමාණවත් ලෙස සහ සමානාත්මතාවයෙන් යුක්තව සනීපාරක්ෂාව සහ ස්වස්ථතාව ලබා ගැනීමට හැකි වීම.

## *අංශය තුළින් ඉටුකර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු අංක - 09*


**සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ සහ තිරසාර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරිගැන්වීම.**

9.4. 2030 වන විට යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ කර්මාන්ත තිරසර කිරීම සඳහා නව තාක්ෂණය මගින් සංවර්ධනය කිරීම, කර්මාන්ත ක්‍රියාවලියේදී සම්පත් කාර්යක්ෂම ආකාරයට භාවිතා කිරීම වැඩිදියුණු කිරීම සහ පිරිසිදු සහ පරිසරයට සුදුසු ගුණාත්මකභාවයෙන් ඉහළ තාක්ෂණයන් උපයෝගි කර ගැනීම.

9.5. විද්‍යාත්මක පර්යේෂණ වැඩි දියුණු කිරිම.

පසු ගිය වසර තුනක ප්‍රාග්ධන වැය වීම.

| වර්ෂය | PSDG (රු.මි) | PCDG (රු.මි) | WB (රු.මි) | වෙනත් ප්‍රතිපාදන (රු.මි) | මුළු මුදල (රු.මි) |
|---|---|---|---|---|---|
| 2015 | 110.79 | 37.95 | - | 33.01 | 181.74 |
| 2016 | 74.99 | 179.54 | 470.35 | - | 724.87 |
| 2017 | 111.76 | 2.22 | 595.51 | - | 709.49 |
| එකතුව | **297.54** | **219.71** | **1,065.86** | **33.01** | **1,616.10** |




## 2017 වර්ෂයේ සංවර්ධන කාර්යය පිළිබඳ කාර්ය සාධනය

**අරමුණ** - ප්‍රාදේශීය සහා මාර්ග වැඩි දියුණු කිරීම

**ව්‍යාපෘතිය** - ග්‍රාමීය මාර්ග ඉදි කිරීම හා නඩත්තු කිරිම

| ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ ස්ථානය | ප්‍රතිලාභීන් ගණන | ව්‍යා.ගණන කි.මී. | වෙන් කළමුදල (රු.මි) | ප්‍රගතිය( %) | |
|---|---|---|---|---|---|
| | | | | භෞතික | මූල්‍ය |
| පදවිය | 25367 | 1 | 1.05 | 100 | 50 |
| කැබිතිගොල්ලෑව | 1725 | 1 | 1.86 | 100 | 0 |
| මැදවච්චිය | 2940 | 1 | 2.65 | 100 | 0 |
| රඹෑව | 1081 | 1 | 2.87 | 100 | 42 |
| හොරොව්පොතාන | 8200 | 1 | 2.70 | 80 | 25 |
| කහටගස්දිගිලිය | 6500 | 1 | 2.87 | 80 | 0 |
| ගලෙන්බිදුණුවැව | 1000 | 1 | 2.94 | 90 | 0 |
| මිහින්තලේ | 4500 | 1 | 1.79 | 100 | 0 |

| ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ ස්ථානය | ප්‍රතිලාභීන් ගණන | කි.ලෝ.මී. ගණන | වෙන් කළ මුදල (රු.මි) | ප්‍රගතිය( %) | |
|---|---|---|---|---|---|
| | | | | භෞතික | මූල්‍ය |
| තිරප්පනේ | 9300 | 1 | 1.58 | 100 | 0 |
| ම.නු.ප | 30911 | 2 | 4.08 | 80 | 0 |
| නැ.නු.ප | 15503 | 2 | 3.44 | 80 | 59 |
| නොච්චියාගම | 150 | 1 | 2.58 | 60 | 0 |
| රාජාංගනය | 8500 | 1 | 1.50 | 100 | 0 |
| තලාව | 3500 | 2 | 4.66 | 50 | 0 |
| ඉපලෝගම | 28000 | 1 | 2.29 | 100 | 0 |
| ගල්නෑව | 650 | 1 | 2.15 | 100 | 0 |
| කැකිරාව | 850 | 1 | 1.86 | 50 | 0 |
| පලාගල | 900 | 1 | 2.51 | 50 | 0 |
| හිගුරක්ගොඩ | 45000 | 1 | 2.15 | 80 | 68 |
| මැදිරිගිය | 24449 | 1 | 3.22 | 50 | 0 |
| ලංකාපුර | 42000 | 1 | 2.01 | 70 | 41 |
| දිඹුලාගල | 1000 | 1 | 4.01 | 50 | 0 |
| තමන්කඩුව | 40000 | 1 | 3.94 | 50 | 0 |
| ඇලහැර | 600 | 0 | 2.05 | 0 | 0 |
| වැලිකන්ද | 9750 | 1 | 2.15 | 50 | 20 |
| එකතුව | | | 64.91 | | |

අරමුණ - ග්‍රාමීය ජනතාවට පිරිසිදු පානීය ජලය ලබා දීම

ව්‍යාපෘතිය - පානීය ජල යෝජනා ක්‍රම ඉදි කිරීම

| අනු අංක ය | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ ස්ථානය | ප්‍රතිලාභීන් ගණන | වෙන් කළ මුදල (රු.මි) | භෞතික (%) | මූල්‍ය (%) |
|---|---|---|---|---|---|
| 1 | පදවිය සී-යාය | 2685 | 8.61 | 15 | 1 |
| 2 | නොච්චියාගම ඉහල වැටියාව පානීය ජල යෝජනා ක්‍රමය | – | 6.90 | 20 | 1 |
| 3 | කැබිතිගොල්ලෑව යකාවැව පානීය ජල ව්‍යාපෘතිය 03 අදියර ක්‍රියාත්මක කිරීම | 235 | 5.49 | 30 | 5 |
| 4 | වැලිකන්ද සිංහපුර පානීය ජල යෝජනා ක්‍රමයේ ඉදි කිරීම් | - | 5.00 | 0 | 0 |

අරමුණ - කසල කළමනාකරණය

ව්‍යාපෘතිය - මල අපවහන පද්ධතිය ඉදිකිරිම හා හා පරිසර සංරක්ෂණ වැඩසටහන්

| අනු අංකය | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කල ස්ථානය | වෙන් කළ මුදල (රු.මි) | භෞතික (%) | මූල්‍ය (%) |
|---|---|---|---|---|
| 1 | අනුරාධපුර මහ නගර සභාවේ මල අපවහන පද්ධතිය හා අප ජල පිරි පහදුව.(3 වන අදියර) | 14.17 | 90 | 81 |
| 2 | පළාත් පාලන ආයතන 26 ක කසල කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් හා පරිසර සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරිම. | 0.03 | 100 | 100 |

අරමුණ - වෙනත් පළාත් පාලන සේවා වැඩි දියුණු කිරිම

ව්‍යාපෘතිය - පළාත් පාලන ආයතනවල පුස්තකාලවල ගුණාත්මකභාවය වැඩි කිරිම

| අනු අං කය | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ ස්ථානය | වෙන් කළ මුදල (රු.මි) | භෞතික (%) | මූල්‍ය (%) |
|---|---|---|---|---|
| 1 | අනුරාධපුර මහ නගර සභාවේ පුස්තකාල | 0.10 | 80 | 0 |
| 2 | පදවිය ප්‍රාදේශීය සභාවේ පුස්තකාල | 0.10 | 100 | 100 |
| 3 | කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාවේ පුස්තකාල | - | 100 | 0 |
| 4 | මැදවච්චිය ප්‍රාදේශීය සභාවේ පුස්තකාල | 1.00 | 100 | 100 |
| 5 | රඹෑව ප්‍රාදේශීය සභාවේ පුස්තකාල | 0.10 | 100 | 94 |
| 6 | හොරොව්පොතාන ප්‍රාදේශීය සභාවේ පුස්තකාල | 0.10 | 100 | 0 |
| 7 | කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභාවේ පුස්තකාල | 0.10 | 100 | 100 |
| 8 | ගලෙන්බිදුණුවැව ප්‍රාදේශීය සභාවේ පුස්තකාල | 0.10 | 100 | 0 |
| 9 | මිහින්තලය ප්‍රාදේශීය සභාවේ පුස්තකාල | 0.10 | 100 | 99 |
| 10 | තිරප්පනේ ප්‍රාදේශීය සභාවේ පුස්තකාල | 0.10 | 100 | 100 |

| | පළාත් පාලන ආයතනවල පුස්තකාලවල ගුණාත්මකභාවය වැඩි කිරීම | | | |
|---|---|---|---|---|
| 11 | **ම.නු.ප ප්‍රාදේශීය සභාවේ පුස්තකාල** | **0.10** | **100** | **100** |
| 12 | නැ.නු.ප ප්‍රාදේශීය සභාවේ පුස්තකාල | 0.10 | 100 | 0 |
| 13 | නොච්චියාගම ප්‍රාදේශීය සභාවේ පුස්තකාල | 0.10 | 100 | 0 |
| 14 | රාජාංගනය ප්‍රාදේශීය සභාවේ පුස්තකාල | 0.10 | 100 | 100 |
| 15 | තලාව ප්‍රාදේශීය සභාවේ පුස්තකාල | 0.10 | 100 | 100 |
| 16 | ඉපලෝගම ප්‍රාදේශීය සභාවේ පුස්තකාල | 0.10 | 100 | 0 |
| 17 | ගල්නෑව ප්‍රාදේශීය සභාවේ පුස්තකාල | 0.10 | 100 | 99 |
| 18 | කැකිරාව ප්‍රාදේශීය සභාවේ පුස්තකාල | 0.10 | 100 | 0 |
| 19 | පලාගල ප්‍රාදේශීය සභාවේ පුස්තකාල | 0.10 | 100 | 0 |
| **එකතුව** | | **2.7.** | | |

**අරමුණ** - ග්‍රාමීය ප්‍රදේශවල පෙර පාසල්වල පහසුකම් සංවර්ධනය කිරීම
**ව්‍යාපෘතිය** - වෙනත් විවිධ සේවා පහසුකම් සංවර්ධනය

| අංකය | ව්‍යාපෘති අරමුණ | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ ස්ථානය | වෙන් කළ මුදල (රු.මි) | භෞතික (%) | මූල්‍ය (%) |
|---|---|---|---|---|---|
| 1 | ආදර්ශ පෙර පාසලක් ලෙස සංවර්ධනය කිරීම. | කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභා පෙර පාසල | 0.60 | 100 | 0 |
| 2 | නිරෝගී කාර්යක්ෂම සෞඛ්‍ය කම්කරු පිරිසක් බිහි කිරීම. | සෞඛ්‍ය කම්කරුවන්ගේ සෞඛ්‍ය පහසුකම් වැඩි දියුණු කිරීම. | 0.40 | 100 | 54 |
| 3 | කාර්යක්ෂම රාජ්‍ය සේවයක් ඇති කිරීම. | පළාත් පාලන ආයතනවල හා පළාත් පාලන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා පුහුණු පැවැත්වීම. | 1.00 | 100 | 73 |
| 4 | පළාත් පාලන ආයතනවල සුසාන භූමි ආදාහනාගාර පහසුකම් ඇති කිරීම. | තලාව එප්පාවල ආදාහනාගාරය ඉදි කිරීම. | 6.80 | 40 | 1 |
| 5 | පළාත් පාලන ආයතනවල පුස්තකාලවල ගුණාත්මකභාවය වැඩි කිරීම. | හිගුරක්ගොඩ ප්‍රාදේශීය සභාවේ පුස්තකාලවල යටිතල පහසුකම් සංවර්ධනය | 0.10 | 100 | 99 |
| | | මැදිරිගිරිය, ලංකාපුර, දිඹුලාගල, තමන්කඩුව, ඇලහැර, වැලිකන්ද යන පුස්තකාලවල ගුණාත්මකභාවය වැඩි කිරීම. | 0.60 | 100 | 100 |
| 6 | ග්‍රාමීය ප්‍රදේශවල පෙර පාසල්වල පහසුකම් සංවර්ධනය කිරීම. | වැලිකන්ද ප්‍රාදේශීය සභා පෙර පාසල ආදර්ශ පෙර පාසලක් ලෙස සංවර්ධනය කිරීම. | 0.60 | 100 | 0 |
| | | **එකතුව** | **10.1** | | |

## පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

## මඟින් ක්‍රියාත්මක කරනු ලැබූ සංවර්ධන ව්‍යාපෘති - 2017

| අනු අංකය | වැඩසටහන | පළාත් පාලන ආයතන ගණන | ව්‍යාපෘති ගණන | මූල්‍ය ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | | | අනුමත මුදල (රු.මි) | ගෙවා ඇති මුදල (රු.මි) |
| 1 | ග්‍රාමීය ප්‍රදේශවල මාර්ග කි.මී.1000ක් සංවර්ධනය කිරීමේ වැඩසටහන - 2017 | 25 | 65 | 146.20 | 36.58 |
| 2 | ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩ සටහන - 2017 | 14 | 46 | 191.89 | 8.83 |
| 3 | පසුගාමී පළාත් පාලන ආයතන සංවර්ධන සහාය වැඩසටහන - 2017 | 3 | 3 | 25.33 | - |
| 4 | පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල ප්‍රජා යටිතල පහසුකම් නඟා සිටුවීමේ ප්‍රාග්ධන වැඩසටහන - 2017 | 6 | 49 | 97.12 | - |
| | **එකතුව** | **48** | **163** | **460.55** | **45.41** |

## විදේශ ආධාර මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

## තුළින් ජනිත කළ ප්‍රතිලාභ විශ්ලේෂණය කිරීම.(ලෝක බැංකු ආධාර)

| අ.අ | ව්‍යාපෘතිය | මුදල | | ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | වෙන් කළ (රු.මි) | වැය කළ (රු.මි) | භෞතික (%) | මූල්‍ය (%) |
| 1 | පුබුදුපුර මහානාම උයන 6 වන පටුමග කාණු පද්ධතිය ඉදිකිරීම. ( 200 මීටර්) | 8.83 | 11.20 | 100 | 127 |
| 2 | නාගසේන මාවත කාණු පද්ධතිය නවීකරණය කිරීම. (400 මීටර්) | 26.18 | 35.68 | 100 | 136 |
| 3 | මැදවච්චිය නගරයේ පොදු වෙළෙඳ සංකීර්ණය ඉදිකිරීම. | 53.23 | 48.97 | 100 | 92 |
| 4 | කැකිරාව මහජන ක්‍රීඩාංගණය ප්‍රතිසංස්කරණය. | 18.52 | 32.49 | 100 | 175 |
| 5 | කුඩා කැකිරාව සේවා මාර්ගය නවීකරණය කිරීම. | 10.18 | 15.882 | 100 | 156 |
| 6 | ඉහළ වැටියාව පානිය ජල ව්‍යාපෘතියේ පෙරහුම් ධාරිතාවය ඉහළ නැංවීම. | 22.62 | 27.39 | 100 | 121 |
| 7 | නොච්චියාගම සතිපොල නවීකරණය කිරීම. | 9.50 | 13.32 | 100 | 140 |
| 8 | හල්මිල්ලකුලම පෙර පාසල සඳහා දිවාසුරැකුම් මධ්‍යස්ථානයක් ඉදිකිරීම. | 5.03 | 6.88 | 100 | 137 |
| 9 | එප්පාවල සතිපොල නවීකරණය කිරීම. | 4.47 | 7.71 | 100 | 172 |
| 10 | තලාව නගරයේ සාප්පු සංකීර්ණය ඉදිකිරීම. | 19.25 | 31.82 | 100 | 165 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 11 | හිරිගොල්ලේගම පානීය ජල ව්‍යාපෘතිය | 5.99 | 14.76 | 100 | 246 |
| 12 | අභයපුර 3වන පටුමග මීටර් 500 ක් ප්‍රතිසංස්කරණය | 5.32 | 4.66 | 100 | 88 |
| 13 | ගැලන්ට ක්‍රීඩා පිටිය තුළ ළමා උද්‍යානය සංවර්ධනය කිරිම. | 7.98 | 8.08 | 100 | 101 |
| 14 | විජයපුර ප්‍රාදේශීය සභා සංකීර්ණය තුළ බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරිම. | 15.25 | 23.99 | 100 | 157 |
| 15 | විජයපුර අනුලාදේවී මාවත කි.මී. 1.4 ක් සංවර්ධනය කිරීම. | 9.74 | 13.59 | 100 | 140 |
| 16 | මිහින්තලය සති පොල ඉදි කිරීම. | 20.51 | 27.29 | 100 | 133 |
| 17 | මිහින්තලය පෙර පාසල හා දිවාසුරැකුම් මධ්‍යස්ථානයක් ඉදිකිරීම. | 13.35 | 20.20 | 100 | 151 |
| 18 | ඒ- 12 මාර්ගයේ මැකිච්චාව හංදියේ සිට කුකුලෑව හරහා සමාධිගම දක්වා මාර්ගය ප්‍රතිසංස්කරණය. | 15.67 | 27.51 | 100 | 176 |
| 19 | ඒ-12 මාර්ගයේ සිට කුඩාපට්ටිය මාර්ගය නවීකරණය කිරීම. | 8.39 | 12.01 | 100 | 143 |
| 20 | කහටගස්දිගිලිය පොදු වෙළඳපොළ නවීකරණය. | 5.49 | 7.17 | 100 | 130 |
| 21 | කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභාවට අයත් සංචාරක මධ්‍යස්ථානය නවීකරණය කිරීම. | 3.06 | 5.29 | 100 | 173 |
| 22 | කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල ඉදිකිරීම. | 28.79 | 32.69 | 100 | 114 |
| 23 | ජේමඩුව සතිපොල නවීකරණය. | 14.29 | 18.73 | 100 | 131 |
| 24 | පණ්ඩුලගම දියවන්නා ඔය ඇල මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම. | 17.04 | 23.00 | 100 | 135 |
| 25 | 283- මහබුලංකුලම ගම්මානය සඳහා RO ජල පිරිපහදු ඒකකයක් ස්ථාපිත කිරීම. | 3.51 | 4.23 | 100 | 121 |
| 26 | 282- පහළගම ගම්මානය සඳහා RO ජල පිරිපහදු ඒකකයක් ස්ථාපිත කිරීම. | 3.32 | 3.63 | 100 | 109 |
| | උප එකතුව | **355.51** | **478.17** | | 135 |

පොළොන්නරුව දිස්ත්‍රික්කය

| අංකය | ව්‍යාපෘතිය | වෙන්කළ (රු.මි) | වැය කළ (රු.මි) | භෞතික (%) |
|---|---|---|---|---|
| 27 | පොදු වෙළඳ සංකීර්ණය-හිඟුරක්ගොඩ | 40.11 | 49.99 | 100 |
| 28 | සතිපොළ නවීකරණය-දියබෙදුම ඇලහැර | 24.74 | 29.93 | 100 |
| 29 | පන්සල් මාර්ගය නවීකරණය-බුදුරුවයාය | 4.09 | 5.76 | 100 |
| 30 | ළමා උද්‍යානය නවීකරණය-බකමූණ | 13.53 | 14.30 | 100 |
| 31 | කාණු පද්ධතිය නවීකරණය-කඳුරුවෙල විල්ලුව | 54.27 | 37.41 | 100 |
| 32 | ළමා උද්‍යානය නවීකරණය-පොළොන්නරුව | 13.57 | 12.59 | 100 |
| | උප එකතුව | **150.31** | **149.98** | |
| | එකතුව | **505.82** | **628.15** | |

**වෙනත් රේඛීය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු වලින් ලද ප්‍රතිපාදන - පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මගින් ලද ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති සාරාංශය**

| අනු අංකය | ව්‍යාපෘතිය | වෙන් කළ මුදල [රු.මිලි] | වැය කළ මුදල [රු.මිලි] |
|---|---|---|---|
| 01 | සති පොළ භූමි/වෙළඳ කුටි/අලෙවි මධ්‍යස්ථාන/කඩකාමර/ආපන ශාලා /ගබඩා/සනීපාරක්ෂක පහසුකම් සහ වෙනත් ගොඩනැගිලි ඉදිකිරීම් හා නවීකරණය | 161.71 | 93.93 |
| 02 | පුස්තකාල ගොඩනැගිලි /පරිගණක මධ්‍යස්ථාන/දිවා සුරැකුම් මධ්‍යස්ථාන/පෙර පාසල්/ළමා උද්‍යාන නවීකරණය | 41.15 | 23.22 |
| 03 | කානු පද්ධතිය අළුත්වැඩියාව | 1.30 | 1.10 |
| 04 | කාර්යාල ගොඩනැගිලි හා වාහන අළුත්වැඩියාව | 4.80 | 4.80 |
| 05 | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශවල මාර්ග තාර දමා/කොන්ක්‍රීට්/කුට්ටි ගල්/බොරළු දමා ප්‍රතිස්ස්කරණය කිරීම | 139.38 | 129.06 |
| 06 | ගෘහ භාණ්ඩ මිලදී ගැනීම | 6.29 | 5.37 |
| 07 | ක්‍රීඩා පිටි ඉදි කිරීම හා නවීකරණය | 3.91 | 4.42 |
| **එකතුව** | | **358.56** | **261.90** |

**මෙහෙයුම් සමාලෝචනය හා සංවර්ධන කාර්ය පිළිබඳ කාර්ය සාධනය.**

2017 වර්ෂය සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ මිලියන 130 ක ප්‍රතිපාදන වෙන් විය. පළාත් පාලන මාර්ග සඳහා මිලියන 71ක්ද, පානීය ජල පහසුකම් සඳහා මිලියන 26ක්ද, ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා මිලියන 20ක්ද, වෙනත් පළාත් පාලන සේවා මිලියන 13 ක්ද වශයෙන් මෙම ප්‍රතිපාදන වෙන් කරන ලදී. සමස්ත ව්‍යාපෘතිවල ප්‍රගතිය සැලකීමේදී 75% ඉක්ම වූ භෞතික ප්‍රගතියක් පෙන්වා ඇත.මීට අමතරව පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මගින් පහත දක්වා ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත.

- ග්‍රාමීය ප්‍රදේශවල මාර්ග කි.මී.1000 ක් සංවර්ධනය කිරීමේ වැඩසටහන 2017.
- ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩ සටහන 2017.
- පසුගාමී පළාත් පාලන ආයතන සංවර්ධන සහය වැඩසටහන 2017.
- පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල ප්‍රජා යටිතල පහසුකම් නගා සිටු වීමේ ප්‍රාග්ධන වැඩ සටහන 2017.

2016 වසරේ මෙන්ම 2017 වසරේ ද ක්‍රියාත්මක කළ සෞඛ්‍ය කම්කරුවන්ගේ සෞඛ්‍ය පහසුකම් වැඩි දියුණු කිරිමේ ව්‍යාපෘතිය දැක්විය හැක.

මෙම වැඩ සටහන මගින් කසල එක් රැස් කිරීමේ කටයුතුවල නිරත සියළුම සෞඛ්‍ය කම්කරුවන්ගේ සෞඛ්‍ය පරික්ෂාවක් හා රෝග විනිශ්ච පරීක්ෂාවක් සිදු කරන ලදී. මෙම වැඩ සටහන හේතුවෙන් වකුගඩු රෝගීන් හා බරපතල රෝග සහිත පුද්ගලයින් රාශියක් හඳුනාගත හැකි විය. 2018 වර්ෂයේදී මෙම වැඩ සටහන ආයතනයේ අනිකුත් සේවකයන් හා ඔවුන්ගේ පවුල්වල අය සඳහා ද ක්‍රියාත්මක කිරිමට අපේක්ෂිතයි.

මෙය හිස්ව තබන ලද පිටුවකි

# පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

6.2

## දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මකවන ආයතන

1. පාසල්
2. කලාප අධ්‍යාපන කාර්යාල
3. කොට්ඨාස අධ්‍යාපන කාර්යාල
4. අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථාන
5. ගුරු සංවර්ධන මධ්‍යස්ථාන
6. පළාත් තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන
7. පරිගණක සම්පත් මධ්‍යස්ථාන

## උතුරුමැද පළාත් පාසල් වර්ගීකරණය - 2017

| කලාපය | ජාතික පාසල් | පළාත් පාසල් | | | | එකතුව |
|---|---|---|---|---|---|---|
| | | 1AB | 1C | TYPE 2 | TYPE 3 | |
| **අනුරාධපුර දිස්ත්‍රික්කය** | | | | | | |
| අනුරාධපුර | 3 | 9 | 26 | 53 | 49 | 140 |
| කැකිරාව | 1 | 8 | 28 | 28 | 65 | 130 |
| තඹුත්තේගම | 1 | 7 | 11 | 26 | 27 | 70 |
| ගලෙන්බිඳුණුවැව | 0 | 4 | 18 | 26 | 47 | 95 |
| කහටගස්දිගිලිය | 1 | 5 | 11 | 42 | 67 | 126 |
| **එකතුව** | **6** | **33** | **94** | **175** | **255** | **563** |
| **පොළොන්නරුව දිස්ත්රික්කය** | | | | | | |
| පොළොන්නරුව | 1 | 8 | 8 | 15 | 22 | 54 |
| හිගුරක්ගොඩ | 3 | 6 | 9 | 31 | 45 | 94 |
| දිඹුලාගල | 0 | 6 | 17 | 16 | 64 | 103 |
| **එකතුව** | 4 | 20 | 34 | 62 | 131 | 251 |
| **මුළු එකතුව** | 10 | 53 | 128 | 237 | 389 | 814 |

1AB - අ.පො.ස(උ.පෙළ) විද්‍යා විෂය ධාරාව සහිත පාසල්
1C - අ.පො.ස(උ.පෙළ) පවතින නමුත් විද්‍යා විෂය ධාරාව නොමැති පාසල්
T2 -පළමුවන ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා ඇති පාසල්
T3 - පළමුවන ශ්‍රේණියේ සිට 5 හෝ 8 ශ්‍රේණිය දක්වා ඇති පාසල්

## කලාප අනුව පාසල් සහ ශිෂ්‍ය ව්‍යාප්තිය

| කලාපය | ජාතික පාසල් | පාසල් සංඛ්‍යාව |
|---|---|---|
| අනුරාධපුර | 64,088 | 140 |
| කැකිරාව | 38,807 | 130 |
| තඹුත්තේගම | 35,931 | 72 |
| ගලෙන්බිඳුණුවැව | 24,764 | 95 |
| කහටගස්දිගිලිය | 30,066 | 126 |
| **අනුරාධපුර දිස්ත්‍රික්කය** | **193,656** | **563** |
| පොළොන්නරුව | **27,199** | **54** |
| හිගුරක්ගොඩ | 35,528 | 94 |
| දිඹුලාගල | 22,229 | 103 |
| **පොළොන්නරුව දිස්ත්‍රික්කය** | **84,956** | **251** |
| **මුළු එකතුව** | **279,612** | **814** |

### විෂය ධාරාව අනුව ගුරු ව්‍යාප්තිය

| ශ්‍රේණිය | විෂය ධාරාව | ගුරුවරු සංඛ්‍යාව |
|---|---|---|
| 1-5 ශ්‍රේණි | ප්‍රාථමික / පොදු | 5242 |
| | ඉංග්‍රීසි | 714 |
| | දෙවන බස (සිංහල/දෙමළ) | 62 |
| 6-11 | ද්විතීයික | 7809 |
| 12-13 | ගණිතය/විද්‍යා විෂය ධාරාව | 272 |
| වෙනත් | තාක්ෂණික විෂය ධාරාව | 99 |
| | කලා/වාණිජ විෂය ධාරාව | 1290 |
| | විශේෂ අධ්‍යාපන | 84 |
| | පුස්තකාලයාධිපති | 239 |
| | උපදේශක | 216 |
| | අධීක්ෂණ කටයුතු | 379 |
| **එකතුව** | | **16406** |

### විභාග ප්‍රතිඵල විශ්ලේෂණය

| දිස්ත්‍රික්කය | ශිෂ්‍යත්ව විභාගය සමත් | | අ.පොස (සා.පෙළ) සමත් | | අ.පොස (උ.පෙළ) සමත් | |
|---|---|---|---|---|---|---|
| | **2015** | **2016** | **2015** | **2016** | **2015** | **2016** |
| අනුරාධපුර | 1514 | 1575 | 7839 | 8844 | 5133 | 5273 |
| පොළොන්නරුව | 683 | 792 | 3191 | 3788 | 1961 | 2021 |
| **එකතුව** | **2197** | **2367** | **11030** | **12632** | **7094** | **7294** |

### තාක්ෂණ විද්‍යාගාර හා තාත්ෂණ පීඨ

| අධ්‍යාපන කලාපය | තාක්ෂණ විද්‍යාගාර සංඛ්‍යාව | තාක්ෂණ පීඨ සංඛ්‍යාව |
|---|---|---|
| අනුරාධපුර | 12 | 02 |
| කැකිරාව | 12 | 03 |
| තඹුත්තේගම | 9 | 04 |
| ගලෙන්බිදුණුවැව | 9 | 01 |
| කැබිතිගොල්ලෑව | 12 | 03 |
| පොළොන්නරුව | 8 | 02 |
| හිඟුරක්ගොඩ | 12 | 04 |
| දිඹුලාගල | 9 | 03 |
| **එකතුව** | **83** | **22** |

## උතුරු මැද පළාතේ පාසල් ව්‍යාප්තිය - කොට්ඨාස සහ පාසල් සංඛ්‍යාව අධ්‍යාපන කලාප අනුව

| දිස්ත්‍රික්කය | කලාපය | කොට්ඨාස සංඛ්‍යාව | මුළු පාසල් සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|
| | | | ජාතික පාසල් සංඛ්‍යාව | පළාත් පාසල් සංඛ්‍යාව | එකතුව |
| අනුරාධපුර | අනුරාධපුරය | 6 | 3 | 137 | 140 |
| | කැකිරාව | 5 | 1 | 129 | 130 |
| | තඹුත්තේගම | 4 | 1 | 71 | 72 |
| | ගලෙන්බිඳුණුවැව | 3 | 0 | 95 | 95 |
| | කැබිතිගොල්ලෑව | 4 | 1 | 125 | 126 |
| **අනුරාධපුර දිස්ත්‍රික්කය** | | **22** | **6** | **557** | **563** |
| පොළොන්නරුව | පොළොන්නරුව | 2 | 1 | 53 | 54 |
| | හිඟුරක්ගොඩ | 3 | 3 | 91 | 94 |
| | දිඹුලාගල | 3 | 0 | 103 | 103 |
| **පොළොන්නරුව දිස්ත්‍රික්කය** | | **8** | **4** | **247** | **251** |
| **උතුරු මැද පළාත** | | **30** | **10** | **804** | **814** |

මෙම පාසල් අටසිය දාහතර (814) 1 ඒබී පාසල් හැට හතරකින් (64 ) , 1 සී පාසල් එකසිය විසි හතකින් (127) , 2 වර්ගයේ පාසල් දෙසිය තිස් හතකින් (237) සහ 3 වර්ගයේ පාසල් තුන්සිය අසූ හයකින් (386) සමන්විත වේ.

## පාසල් වර්ගීකරණය අනුව පාසල් සංඛ්‍යාව අධ්‍යාපන කලාප මට්ටමින්

| කලාපය | 1 AB | 1 C | 2 | 3 | එකතුව |
|---|---|---|---|---|---|
| අනුරාධපුර | 12 | 26 | 53 | 49 | 140 |
| කැකිරාව | 9 | 28 | 28 | 65 | 130 |
| තඹුත්තේගම | 8 | 11 | 26 | 27 | 72 |
| ගලෙන්බිඳුණුවැව | 4 | 18 | 26 | 47 | 95 |
| කැබිතිගොල්ලෑව | 6 | 11 | 42 | 67 | 126 |
| **අනුරාධපුර දිස්ත්‍රික්කය** | **39** | **94** | **175** | **255** | **563** |
| පොළොන්නරුව | 9 | 8 | 15 | 22 | 54 |
| හිඟුරක්ගොඩ | 9 | 9 | 31 | 45 | 94 |
| දිඹුලාගල | 7 | 16 | 16 | 64 | 103 |
| **පොළොන්නරුව දිස්ත්‍රික්කය** | **25** | **33** | **62** | **131** | **251** |
| **උතුරු මැද පළාත** | **64** | **127** | **237** | **386** | **814** |

උතුරු මැද පළාතේ 2017 වර්ෂය අවසන් වන විට පාසල් 814 ක් පැවති අතර එහි සිසුන් දෙලක්ෂ අසූනම දහස් නවසිය හැත්තෑ එකක් (289,971) ඉගෙනුම ලබයි.ක්‍රියාත්මක පාසල් 814 න් 804 ක් පළාත් සභා පාසල් වන අතර පාසල් 10 ක් ජාතික පාසල් වේ. මෙම පළාත් සභා පාසල් 804 තුළ 2017.12.31 වන විට ගුරුවරුන් 16580 කින් සමන්විත වේ.

### ගුරුවරුන් සංඛ්‍යාව සහ ශිෂ්‍ය සංඛ්‍යාව - අධ්‍යාපන කලාප අනුව

| දිස්ත්‍රික්කය | කලාපය | ගුරු සංඛ්‍යාව | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|
| අනුරාධපුර | අනුරාධපුරය | 3533 | 66956 |
| | කැකිරාව | 2450 | 40220 |
| | තඹුත්තේගම | 1834 | 37140 |
| | ගලෙන්බිදුණුවැව | 1935 | 25664 |
| | කැබිතිගොල්ලෑව | 2024 | 30846 |
| **අනුරාධපුර දිස්ත්‍රික්කය** | | **11776** | **200826** |
| පොළොන්නරුව | පොළොන්නරුව | 1316 | 27962 |
| | හිඟුරක්ගොඩ | 1847 | 37158 |
| | දිඹුලාගල | 1641 | 24025 |
| **පොළොන්නරුව දිස්ත්‍රික්කය** | | **4804** | **89145** |
| **උතුරු මැද පළාත** | | **16580** | **289971** |

උතුරු මැද පළාතේ පවතින පළාත් සභා පාසල් අටසිය හතර සඳහා විදුහල්පති ශ්‍රේණිධාරීන් එක්දහස් අසූ හතක් (1087) අනුමත වුවද 2017.12.31 දින වනවිට විදුහල්පති ශ්‍රේණිධාරීන් අටසිය පහළොස් දෙනෙකු (815) පමණක් සිටින අතර දෙසිය හැත්තෑ දෙකක (272) පුරප්පාඩුවක් පවතී. එමෙන්ම අධ්‍යාපන පරිපාලන සේවයේ නිළධාරීන් එකසිය අනූ අට දෙනෙකු (198) අනුමත වුවද මේ වන විට අධ්‍යාපන පරිපාලන සේවයේ නිළධාරීන් එකසිය පස්දෙනෙකු (105) පමණක් සිටින අතර අනූ තුන් දෙනෙකු (93) හිඟව ඇත.

### ශ්‍රේණිධාරී විදුහල්පති තොරතුරු (අධ්‍යාපන කලාප අනුව)

| කලාපය | අනුමත සංඛ්‍යාව | සිටින සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| අනුරාධපුර | 186 | 205 | 0 | 19 |
| කැකිරාව | 171 | 107 | 64 | 0 |
| තඹුත්තේගම | 111 | 94 | 17 | 0 |
| ගලෙන්බිදුණුවැව | 126 | 80 | 46 | 0 |
| කැබිතිගොල්ලෑව | 154 | 89 | 65 | 0 |
| **අනුරාධපුර දිස්ත්‍රික්කය** | **748** | **575** | **192** | **19** |
| පොළොන්නරුව | 86 | 90 | 0 | 4 |
| හිඟුරක්ගොඩ | 126 | 73 | 53 | 0 |
| දිඹුලාගල | 127 | 77 | 50 | 0 |
| **පොළොන්නරුව දිස්ත්‍රික්කය** | **339** | **240** | **103** | **0** |
| **උතුරු මැද පළාත** | **1087** | **815** | **295** | **23** |
| **සමස්ත පුරප්පාඩු සංඛ්‍යාව** | | | | **272** |

### අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරී තොරතුරු

| කලාපය | අනුමත සංඛ්‍යාව | සිටින සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| අනුරාධපුර | 25 | 15 | 10 |
| කැකිරාව | 24 | 11 | 13 |
| තඹුත්තේගම | 23 | 09 | 14 |
| ගලෙන්බිඳුණුවැව | 22 | 09 | 13 |
| කැබිතිගොල්ලෑව | 23 | 09 | 14 |
| **අනුරාධපුර දිස්ත්‍රික්කය** | **117** | **53** | **64** |
| පොළොන්නරුව | 17 | 09 | 08 |
| හිඟුරක්ගොඩ | 22 | 12 | 10 |
| දිඹුලාගල | 18 | 09 | 09 |
| **පොළොන්නරුව දිස්ත්‍රික්කය** | **57** | **30** | **27** |
| **පළාත්අධ්‍යාපන දෙපාර්තමේන්තුව** | **23** | **22** | **01** |
| **අධ්‍යාපනසම්පත් මධ්‍යස්ථානය** | **1** | **0** | **01** |
| **උතුරු මැද පළාත** | **198** | **105** | **93** |

#### දැක්ම

"අනාගත අභියෝගයන්ට මුහුණ දිය හැකි, නිපුණතා සපිරි දරු පිරිසක්, සමෘද්ධිමත් පළාතක්"

#### මෙහෙවර

"අධ්‍යාපනයේ සම අවස්ථා සලසමින් මානව සම්පත් හා භෞතික සම්පත් මනා කළමණාකාරිත්වයකින් යුතුව භාවිතා කර උතුරු මැද පළාත සමෘද්ධිමත් කිරීම සඳහා දායකත්වය සැපයීම"

#### දිගුකාලීන අරමුණු හා කෙටිකාලීන අරමුණු

#### දිගුකාලීන අරමුණු

- උතුරු මැද පළාතේ පාසල් අධ්‍යාපනය ලබන දරුවන් බුද්ධිමත් හා රැකියා වෙළඳපොළට සුදුසු නිපුණතා ඇති දරුවන් බවට පත් කිරීම.
- ඉපැරණි රජරට සංස්කෘතිය හා කෘෂි ජීවන රටාව මෙන්ම දේශීය හර පද්ධතිය හා සාරධර්ම අගය කරන පුරවැසි පිරිසක් පාසල් අධ්‍යාපනය තුළින් බිහි කිරීම.

#### කෙටිකාලීන අරමුණු

- උතුරු මැද පළාතේ අනිවාර්යය අධ්‍යාපන වයස් සීමාව තුළ සිටින සියලුම දරුවන් සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම සහ එහි ගුණාත්මකභාවය ඉහළ නැංවීම.

❖ උතුරු මැද පළාතේ පාසල්වල ඉගැන්වීම් කාර්යයයේ නියුතු ගුරුවරුන්ගේ ඉගැන්වීම් කුසලතා හා ක්‍රමවේදයන් ඉහළ තලයට ගෙන ඒමට අවශ්‍ය මග පෙන්වීම් සිදුකිරීම.

❖ උතුරු මැද පළාතේ අධ්‍යාපන ක්‍රියාවලිය සඳහා අවශ්‍ය වන්නා වූ භෞතික, මානව හා මූල්‍ය සම්පත් සැපයීම.

❖ පළාතේ පාසල් දරුවන්ගේ කායික, මානසික සංවර්ධනය සහ කුසලතා ඉහළ නැංවීම.

❖ ඵලදායී ඉගෙනුම් පරිසරයක් ගොඩ නැගිය හැකිවන පරිදි නිලධාරීන්ගේ හා විදුහල්පතිවරුන්ගේ කළමනාකරණ ශක්තිය ඉහළ නැංවීම.

### ප්‍රධාන කාර්යයන්

01. ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන ප්‍රවේශය සඳහා සම අවස්ථා වර්ධනය.

02. ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනයේ ගුණාත්මක බව වර්ධනය.

03. භෞතික සම්පත් සහ යටිතල පහසුකම් සංවර්ධනය.

04. ආයතනික ධාරිතා සංවර්ධනය.

05. යහපාලනය සහ සේවා සැපයීම ශක්තිමත් කිරීම.

### ප්‍රධාන උපාය මාර්ගයන්

01. උතුරු මැද පළාත තුළ පාසල්වල මූලික ඉඩකඩ සම්පූර්ණ කිරීම.

02. උතුරු මැද පළාත තුළ පාසල්වල උසස් තලයේ ඉඩකඩ සම්පූර්ණ කිරීම.

03. උතුරු මැද පළාත තුළ පාසල්වල මූලික උපකරණ අවශ්‍යතා සම්පූර්ණ කිරීම.


04. උතුරු මැද පළාත තුළ පාසල්වල උසස් තලයේ උපකරණ අවශ්‍යතා සම්පූර්ණ කිරීම.

05. මානව සම්පත් සංවර්ධනය.

06. ශිෂ්‍ය සංවර්ධනය.

### කාර්ය මණ්ඩල සංයුතිය

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 145 |
| 2 | සේවයේ නියුතු | 122 |
| 3 | පුරප්පාඩු | 23 |



මෙහෙයුම් ප්‍රතිඵල - පුනරාවර්තන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2017 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 9448.94 | 9448.94 | - | 100 |
| ගමන් වියදම් | 14.83 | 14.83 | - | 100 |
| සැපයිම් | 32.00 | 32.00 | - | 100 |
| නඩත්තු වියදම් | 72.60 | 72.60 | - | 100 |
| ගිවිසුම්ගත සේවා | 26.75 | 26.75 | - | 100 |
| මාරු කිරීම් | 78.96 | 78.96 | - | 100 |
| සහනාධාර | 208 | 208 | - | 100 |
| **එකතුව** | **9882.11** | **9882.11** | - | **100** |

පුනරාවර්තන වියදම් දරමින් සංවර්ධන ස්වභාවයේ වැඩ ඉටු කිරිම.

| අනු අංක | ව්‍යාපෘතිය / වැඩසටහන | ප්‍රධාන ක්‍රියාකාරකම | අපේක්ෂිත ප්‍රතිඵල | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|
| 1 | සිසු පුහුණු වැඩසටහන් | 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව අ.පො.ස. (සා/පෙළ) අ.පො.ස. (උසස් පෙළ) සිසු කඳවුරු හා සම්මන්ත්‍රණ පැවැත්වීම. | ශිෂ්‍ය සාධන මට්ටම ඉහළ නැංවීම. | 203,470 |
| 2 | ගුරු පුහුණු වැඩසටහන් | නව විෂය නිර්දේශ හඳුන්වාදීම, විෂය දැනුම යාවත්කාලීන කිරීම, විෂය නව ප්‍රවණතා හඳුන්වාදීම. නව තාක්ෂණ දැනුම ලබාදීම. | විෂයානුබද්ධ ගුරු සංවර්ධනය | 14,000 |
| 3 | සිසු තරඟ පැවැත්වීම | කලාප හා පළාත් තරග පැවැත්වීම. | සිසුන් තුළ මෘදු කුසලතා සහ විෂය සංවර්ධනය කිරීම. | 197600 |
| | | ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ තරග සඳහා සිසුන් සූදානම් කර ඉදිරිපත් කිරීම. | ජාතික හා ජාත්‍යන්තර තරග අත්දැකීම් ලබාදීම සහ පළාතේ ජයග්‍රහණ සංඛ්‍යාව ඉහළ නැංවීම. | - |
| 4 | විෂය සමගාමී වැඩසටහන් | නායකත්ව වැඩසටහන්, බාලදක්ෂ, ශිෂ්‍ය භට, අධ්‍යාපන ප්‍රදර්ශන, විස්කම් දැක්ම, රසවින්දන හා සෞන්දර්ය වැඩසටහන්, රතු කුරුස, පරිසර නියමු, ශාන්ත ජෝන් ගිලන් රථ වැඩසටහන, | සිසුන් තුළ මෘදු කුසලතා සංවර්ධනය හා උතුරු මැද පළාතේ පදක්කම්ලාභීන් ඉහළ නැංවීම. | 150,000 |

| | | | | |
|---|---|---|---|---|
| 5 | ක්‍රීඩා සංවර්ධන වැඩසටහන් | කොට්ඨාස, කලාප හා පළාත් ක්‍රීඩා තරග පැවැත්වීම හා තෝරාගත් ක්‍රීඩා 12ක් සංවර්ධනය සඳහා කොට්ඨාස, කලාප හා පළාත් සංචිත ඇති කිරීම, පුහුණු කිරීම හා තරගවලට ඉදිරිපත් කිරීම. | ක්‍රීඩා කෞශල්‍යයන් ඉහළ නැංවීම, පළාත් හා ජාතික මට්ටමේ ක්‍රීඩකයින් බිහිකිරීම. | 100,000 |
| 6 | වාර විභාග පැවැත්වීම | දෙවන හා තෙවන වාර විභාග සඳහා ප්‍රශ්න පත්‍ර සැකසීම, මුද්‍රණය, සෝදුපත් බැලීම, ප්‍රශ්නපත්‍ර බෙදා හැරීම , විභාගය පැවත්වීම. ප්‍රතිඵල විශ්ලේෂණය හා ප්‍රතිපෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | සිසු සාධන මට්ටම ඉහළ නැංවීම. | 203,470 |
| 7 | ඉගෙනුම් සහාය සඳහා නියාමන දර්ශක ලබාදීම | අධ්‍යාපන ලිත, වාර සටහන්, දින පොත හා ක්ෂේත්‍ර පොත මාණ්ඩලික නිලධාරීන් විදුහල්පති හා ගුරු උපදේශකවරු සඳහා ලබාදීම. | එකම කාල චකවානුවක පාසල් තුළ ප්‍රධාන ක්‍රියාකාරකම් සිදු කිරීම, දිරි ගැන්වීම හා කාර්යයන් පහසු කිරීම. | 18,000 |
| 8 | වෘත්තිය මාර්ගෝපදේශනය හා උපදේශන වැඩසටහන් | වෘත්තිය මාර්ගෝපදේශනය හා උපදේශන වැඩසටහන් පැවැත්වීම | ගැළපෙන අනාගත වෘත්තිය අවස්ථාවන් හඳුන්වාදීම හා මානසික සමබරතාවයෙන් යුත් දරුවන් බිහි කිරීම. | 120,000 |
| 9 | ප්‍රගති සමාලෝචන රැස්වීම් | ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම. | අන්තර් කලාප අත්දැකීම් හුවමාරු කරගැනීම, වැඩසටහන් නියාමනය | 500 |
| 10 | ගුරු සිසු ඇගයීම | කලාප හා පළාත් ඇගයීම් උළෙල පැවැත්වීම. | ගුරුවරු හා සිසුන් අභිප්‍රේරණය | 50,000 |
| 11 | මානව සම්පත් සංවර්ධනය | ශ්‍රී.ලං.අ.ප.සේ. නිලධාරිවරුන්, විදුහල්පතිවරු, ගුරු උපදේශකවරු, කළමනාකරණ සහකාරවරුන්, කණිෂ්ඨ සේවයකයින් හා සහාය සේවා සපයන නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය | මානව සම්පත සවිබල ගැන්වීම හා අත්දැකීම් හුවමාරු සඳහා අවස්ථා ලබාදීම. | 3,313 |
| 12 | පාසල් නඟා සිටුවීමේ වැඩසටහන | පාසල් නඟා සිටුවීමේ කමිටු හා නිලධාරීන් දැනුවත් කිරීම, ක්‍රියාත්මක කිරීම හා ප්‍රගති සමාලෝචන | පාසල් බලවන්ත කිරීම. | 5,000 |

| | | | | |
|---|---|---|---|---|
| 13 | නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන් | නොවිධිමත් අධ්‍යාපන පාඨමාලා පැවැත්වීම. | පාසල් හැරගිය සිසුන් හා ප්‍රජාව සඳහා වෘත්තීය පුහුණුව ලබාදීම මඟින් ජීවන තත්ත්වය ඉහළ නැංවීම. | 3,000 |
| 14 | විශේෂ අධ්‍යාපනය | විශේෂ අධ්‍යාපන ගුරු සිසු පුහුණුව | විශේෂ අවශ්‍යතා සහිත සිසුන්ගේ අන්තර්කරණ අවස්ථා වැඩිදියුණු කිරීම හා විශේෂ අධ්‍යාපන ගුරුවරු බලවන්ත කිරීම. | 1,000 |

මූලධන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2017 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| යන්ත්‍ර සූත්‍ර සවි කිරීම් හා උපකරණ | 0.5 | 0.46 | 0.03 | 92 |
| **එකතුව** | **0.5** | **0.46** | **0.03** | **92** |

## *අංශය තුළින් ඉටුකර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු අංක - 04*

**පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම.**

4.1. 2030 වන විට ඵලදායි ඉගෙනුම් ප්‍රතිඵල ලබා ගත හැකි ආකාරයෙන් සියළුම ගැහැණු ළමුන් හා පිරිමි ළමුන් නිදහස්, සමාන හා ගුණාත්මකභාවයෙන් ඉහළ ,ප්‍රාථමික,ද්විතීයික අධ්‍යාපනයක් සම්පූර්ණ කර සිටින බව තහවරු කිරීම.

4.2. 2030 වන විට සියළුම ගැහැණු ළමුන්ට හා පිරිමි ළමුන්ට ගුණාත්මක වශයෙන් ඉහළ පූර්ව ළමාවිය සංවර්ධනයට ,සත්කාර සේවාවන්ට සහ පූර්ව ප්‍රාථමික අධ්‍යාපනයට ප්‍රවේශ වීමේ අවස්ථාව පැවතීම හා එමගින් ඔවුන් ප්‍රාථමික අධ්‍යාපනයට සූදානම්ව සිටින බව තහවරු කිරීම.

4.3. 2030 වන විට සියළුම කාන්තාවන්ට සහ පිරිමින්ට ගුණාත්මක වශයෙන් ඉහළ සහ අඩු මුදලකට ලබා ගත හැකි විශ්ව විද්‍යාල අධ්‍යාපනය ද ඇතුළත්ව තාක්ෂණික,වෘත්තීය සහ තෘතීයික අධ්‍යාපනය ලබා ගැනීමට හැකි වීම.


4.4. 2030 වන විට අධ්‍යාපනයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ වෙනස්කම් තුරන් කිරීම,අධ්‍යාපනයේ සියළුම මට්ටම්වලට ප්‍රවේශ වීමේ අවස්ථාව තහවරු කිරීම.

4.5. 2030 වන විට සියළුම තරුණ තරුණියන් සහ කාන්තා,පිරිමි,වැඩිහිටි පුද්ගලයින්ගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් අකුරු හැකියාව සහ ගණන් කිරීමේ හැකියාව ලබා සිටීම.

4.6. 2030 වන විට ඉගෙනුම ලබන සියළුම දෙනා තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ දැනුම හා කුසලතාවයන් ලබාගෙන තිබීම.

**සංවර්ධන වැඩ පිළිබඳ කාර්ය සාධනය- පසුගිය වසර 03ක ප්‍රාග්ධන වැයවීම්(වියදම්)**

| වර්ෂය | PSDG (රු.මි) | PCDG (රු.මි) | WB (රු.මි) | මුළු වියදම (රු.මි) |
|---|---|---|---|---|
| 2015 | 123.99 | 103.08 | 268.67 | 495.74 |
| 2016 | - | 7.59 | 78.16 | 85.75 |
| 2017 | - | 0.46 | | 0.46 |




**රේඛීය අමාත්‍යාංශයෙන් ලද ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති**

| අනු අංකය | සංවර්ධන ව්‍යාපෘතිය | ව්‍යාපෘති සංඛ්‍යාව | මුදල | |
|---|---|---|---|---|
| | | | වෙන් කළ (රු.මි) | වැය කළ (රු.මි) |
| 1 | ගොඩනැගිලි ඉදිකිරීම් සහ අලුත්වැඩියා | 61 | 638.78 | 331.65 |
| 2 | පාසල් සඳහා සනීපාරක්ෂක පහසුකම් සැපයීම | 252 | 264.89 | 158.00 |
| 3 | පිරිවෙන් සඳහා සනීපාරක්ෂක පහසුකම් සැපයීම | 07 | 6.17 | 4.18 |
| 4 | පාසල්වල ආබාධ සහිත දරුවන් සඳහා ප්‍රවේශ පහසුකම් සහ සනීපාරක්ෂක පහසුකම් සැපයීම | 23 | 36.00 | 23.02 |

## උතුරු මැද පළාතේ සිසු සාධනය පිළිබඳ තොරතුරු

අප පළාතේ අධ්‍යාපනයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක සංවර්ධනය සඳහා විවිධ මූලාශ්‍ර මඟින් ලැබෙන අරමුදල් අරපිරිමැස්මකින් යුතුව ආයෝජනය කිරීම සඳහා විවිධ ක්‍රමෝපායන් ද ක්‍රියාත්මක කල අතර ප්‍රාථමික අධ්‍යාපනය හා ද්විතීයික අධ්‍යාපනය සඳහා වන ප්‍රවේශයන් වැඩිදියුණු කිරීම,ගුරු සංවර්ධනය,පාසල් පාදක ඇගයීම් ශක්තිමත් කිරීම,පාසල්වල භෞතික සම්පත් වැඩිදියුණු කිරීම හා අධ්‍යාපන පරිපාලන කටයුතු ශක්තිමත් කිරීම ඒ යටතේ ප්‍රධාන විය.

ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය සඳහා වන ප්‍රවේශයන් වැඩි දියුණු කිරීම යටතේ උතුරු මැද පළාතේ සිසු දරුවන්ගේ ප්‍රාථමික අධ්‍යාපන ප්‍රවේශ අවස්ථා වැඩිදියුණු කිරීම සඳහා 2017 වර්ෂයේදී නව ප්‍රාථමික පාසල් 04 ක් ආරම්භ කළ අතර උ/පෙළ විද්‍යා විෂයධාරාව ක්‍රියාත්මක පාසල් සංඛ්‍යාව 64 දක්වා ඉහළ දැමීමට හැකිවිය.


තාක්ෂණ විද්‍යාගාර 83  හි හා තාක්ෂණ විෂයධාරාව හඳුන්වා දීමත් සමඟ පාසල් 22 ක තාක්ෂණ විද්‍යා පීඨ 22 ක් ඉදිකල අතර 2017 වර්ෂය වන විට මෙම සියළු භෞතික සම්පත් සිසුන්ගේ ඉගෙනුම් අවස්ථා වැඩිදියුණු කිරීම සඳහා සිසු අයිතියට පත්කර ඇත. එමෙන්ම "සනීපාරක්ෂාව පෙරට" යන වැඩසටහන යටතේ ද්විතියික පාසල් 83 හා ජාතික පාසල් ද ඇතුලත් වන පරිදි පාසල් 87ක අංගසම්පූර්ණ කාන්තා වැසිකිළි පද්ධති ඉදිකර 2017 වර්ෂය අවසන් වන විට සිසු අයිතියට පත් කිරීමට හැකි විය.

2017 වර්ෂයේ උතුරු මැද පළාත 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව ප්‍රතිඵල අනුව දිවයිනෙන් පස්වන ස්ථානයත් ,අ.පො.ස (උ/පෙළ) ප්‍රතිඵල වලින් 9 වන ස්ථානයේ සිට 8 වන ස්ථානයටත් ලෙස වර්ධනයක් ලබා ගත හැකි විය. 2017 වර්ෂයේ 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය සඳහා 27,105 ක් පෙනී සිටි අතර සිසුන් 21,011 ක් ලකුණු 70 ට වඩා ඉහළ ලකුණක් ගැනීමට සමත් විය. එය ප්‍රතිශතයක් ලෙස 77.51% කි.

### 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව ප්‍රතිඵල ලකුණු 70 ට වැඩි (2014 සිට 2017 දක්වා )

| කලාපය | 2014 | | | 2015 | | | 2016 | | | 2017 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | 70ට වැඩි සංඛ්‍යාව | 70ට වැඩි ප්‍රතිශතය (%) | පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | 70ට වැඩි සංඛ්‍යාව | 70ට වැඩි ප්‍රතිශතය (%) | පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | 70ට වැඩි සංඛ්‍යාව | 70ට වැඩි ප්‍රතිශතය (%) | පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | 70ට වැඩි සංඛ්‍යාව | 70ට වැඩි ප්‍රතිශතය (%) |
| අනුරාධපුර | 4703 | 4021 | 85.50 | 4929 | 4161 | 84.42 | 4924 | 4119 | 83.65 | 5182 | 4094 | 79.00 |
| කැකිරාව | 2990 | 2548 | 85.22 | 3019 | 2510 | 83.14 | 3192 | 2613 | 81.86 | 3438 | 2719 | 79.09 |
| තඹුත්තේගම | 2861 | 2589 | 90.49 | 2994 | 2657 | 88.74 | 3036 | 2685 | 88.44 | 3340 | 2728 | 81.68 |


| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ගලෙන්බිඳුනුවැව | 2045 | 1742 | 85.18 | 1918 | 1563 | 81.49 | 2303 | 1916 | 83.20 | 2273 | 1666 | 73.30 |
| කැබිතිගොල්ලෑව | 2482 | 2080 | 83.80 | 2591 | 2185 | 84.33 | 2546 | 2091 | 82.13 | 2807 | 1848 | 65.84 |
| පොළොන්නරුව | 2085 | 1851 | 88.78 | 2182 | 1763 | 80.8 | 2558 | 1801 | 79.76 | 2358 | 1953 | 82.82 |
| හිඟුරක්ගොඩ | 2857 | 2510 | 87.85 | 3023 | 2376 | 78.6 | 3081 | 2368 | 76.86 | 5604 | 4411 | 78.71 |
| දිඹුලාගල | 1893 | 1605 | 84.79 | 1998 | 1480 | 74.07 | 1866 | 1365 | 73.15 | 2103 | 1592 | 75.70 |
| උතුරු මැද | 21916 | 18946 | 86.44 | 22654 | 18695 | 82.52 | 23506 | 18958 | 80.65 | 27105 | 21011 | 77.51 |
| සමස්ත දිවයින | 327648 | 258700 | 78.96 | 333672 | 254690 | 76.33 | 343757 | 260130 | 75.67 | 350462 | 243236 | 69.4 |



**2017** පැවති අ.පො.ස(උ/පෙළ) විභාගයේදී ජෛව විද්‍යා ප්‍රතිඵල අනුව සමත් ප්‍රතිශතය 43.04% ක් වේ.එය 2016 වර්ෂයට සාපේක්ෂව 1.35% ක වර්ධනයකි.භෞතික විද්‍යා අංශයේ සමත් ප්‍රතිශතය 43.81% ක් වේ.එය 2016 වර්ෂයට සාපේක්ෂව 2.18%ක වර්ධනයකි. කලා විෂය ධාරාවේ සමත් ප්‍රතිශතය 75.12% ක් වූ අතර එය 2016 ට සාපේක්ෂව 3.85% ක වර්ධනයකි.ඉංජිනේරු තාක්ෂණ විෂයධාරාව යටතේ සමත් ප්‍රතිශතය 54.85% ක් විය. එය 2016 වර්ෂයට සාපේක්ෂව 9.17%ක වර්ධනයකි. මෙය උතුරු මැද පළාතේ සිසු දරුවන්ට අධ්‍යාපන සාධනය පිළිබඳ ධනාත්මක නැඹුරුතාවයක් පෙන්නුම් කරයි. ජෛව පද්ධති තාක්ෂණවේදය විෂයධාරාවේ සමත් ප්‍රතිශතය 55.51%ක් විය.එය 2016ට සාපේක්ෂව 3.66 %ක වර්ධනයකි.වෙනත් විෂය ධාරාව යටතේ සමත් ප්‍රතිශතය 32.38%ක් වූ අතර එය 2016ට සාපේක්ෂව 1%ක පමණ වර්ධනයක් ලබා ඇත.

**අ.පො.ස.උසස් පෙළ විභාග ප්‍රතිඵල - විෂය ධාරාව අනුව (2013 -2017 )**

| විෂය | 2013 | | | 2014 | | | 2015 | | | 2016 | | | 2017 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පෙනී සිටි ශිෂ්‍ය | සමත් සංඛ්‍යාව | ප්‍රතිශතයක් ලෙස(%) | පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | සමත් සංඛ්‍යාව | ප්‍රතිශතයක් ලෙස(%) | පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | සමත් සංඛ්‍යාව | ප්‍රතිශතයක් ලෙස(%) | පෙනී සිටි ශිෂ්‍ය | සමත් සංඛ්‍යාව | ප්‍රතිශතයක් ලෙස(%) | පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | සමත් සංඛ්‍යාව | ප්‍රතිශතයක් ලෙස(%) |
| ජෛව විද්‍යා | 1770 | 691 | 39.03 | 1886 | 734 | 38.91 | 2040 | 857 | 42 | 2070 | 863 | 41.69 | 1782 | 767 | 43.04 |
| භෞතික විද්‍යා | 1072 | 446 | 41.6 | 1055 | 392 | 37.15 | 1053 | 421 | 39.98 | 1148 | 478 | 41.63 | 1164 | 510 | 43.81 |
| වාණිජ්‍ය | 3403 | 1811 | 53.21 | 3041 | 1855 | 60.99 | 2529 | 1726 | 68.24 | 2563 | 1769 | 69.02 | 2653 | 1779 | 67.05 |
| කලා | 6202 | 4037 | 65.09 | 5682 | 3936 | 69.27 | 4935 | 3421 | 69.32 | 4644 | 3310 | 71.27 | 5134 | 3857 | 75.12 |
| ඉංජිනේරු තාක්ෂණවේදය | 0 | 0 | - | 0 | 0 | - | 721 | 319 | 44.24 | 1009 | 461 | 45.68 | 731 | 401 | 54.85 |
| ජෛව පද්ධති තාක්ෂණවේදය | 0 | 0 | - | 0 | 0 | - | 500 | 291 | 58.2 | 675 | 350 | 51.85 | 490 | 272 | 55.51 |
| වෙනත් | 90 | 37 | 41.11 | 111 | 44 | 39.63 | 132 | 59 | 44.69 | 198 | 63 | 31.81 | 176 | 57 | 32.38 |




අනුමත ගුරු සංඛ්‍යාවට සාපේක්ෂව ප්‍රමාණාත්මක ගුරු සංඛ්‍යාවක් උතුරු මැද පළාතේ පාසල් පද්ධතිය තුළ සිටියද විෂයයන් අනුව සුදුසුකම්ලත් ගුරුවරුන්ගේ හිඟතාවයත්, ශ්‍රේණිධාරි විදුහල්පතිවරුන්ගේ හිඟයත්,අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරි හිඟයත්,ගුරුවරුන් හා නිලධාරීන් පළාත තුළ රඳවා ගැනීමේ ගැටළුත්, සුදුසුකම්ලත් ගුරු උපදේශක හිඟයත් වැනි මානව සම්පත් ගැටළු රාශියක් සහ පන්ති කාමර ගොඩනැගිලි ප්‍රමාණවත් නොවීම, ඩෙස් පුටු ප්‍රමාණවත් නොවීම වැනි භෞතික සම්පත් ගැටළු රාශියක් පවතින උතුරු මැද පළාතේ අධ්‍යාපන සාධනය මෙලෙස ක්‍රමික වර්ධනයක් 2017 වර්ෂය වන විට සිදුවී තිබීම පළාතක් ලෙස ලැබූ අතිවිශිෂ්ට ජයග්‍රහණයක් ලෙස සැලකිය හැකි වේ.

| කාර්ය සාධන ඉලක්ක | 2017 වර්ෂයේදී ඉටුකර ගත් ප්‍රමාණය |
|---|---|
| අනිවාර්ය අධ්‍යාපන වයසේ සියළුම දරුවන්ගේ අධ්‍යාපන ප්‍රවේශය තහවුරු කිරීම හා අ.පො.ස (සා/පෙළ) දක්වා සහභාගිත්වය ඉහළ නැංවීම. | 202 |
| ශිෂ්‍යත්ව විභාගයෙන් ලකුණු 100 ට වැඩි ප්‍රතිශතය ඉහළ නැංවීම. | 47% |
| අ.පො.ස.(සා/පෙළ) සමත් ප්‍රතිශතය ඉහළ නැංවීම. | 2017 අ.පො.ස.සා/පෙළ ප්‍රතිඵල ලැබී නොමැත |
| අ.පො.ස (සා/පෙළ) සමත් ප්‍රතිශතය අනුව පළාත් අතරින් උතුරු මැද පළාතේ ස්ථානය ඉහළ නැංවීම. | |
| අ.පො.ස.(සා/පෙළ) සිංහල සමත් ප්‍රතිශතය ඉහළ නැංවීම. | |
| අ.පො.ස.(සා/පෙළ) විද්‍යාව සමත් ප්‍රතිශතය ඉහළ නැංවීම. | |
| අ.පො.ස.(සා/පෙළ) ඉංග්‍රීසි සමත් ප්‍රතිශතය ඉහළ නැංවීම. | |
| අ.පො.ස (උ/පෙළ) සමත් ප්‍රතිශතය ඉහළ නැංවීම. | 63 |
| අ.පො.ස (උ/පෙළ) සමත් ප්‍රතිශතය අනුව පළාත් අතරින් උතුරු මැද පළාතේ ස්ථානය ඉහළ නැංවීම. | 8 |
| අ.පො.ස (උ/පෙළ) විද්‍යා හා තාක්ෂණවේදය විෂය ධාරාව සඳහා සහභාගිත්වය ඉහළ නැංවීම. | 26% |
| අ.පො.ස (උ/පෙළ) වාණිජ විෂය ධාරාව සඳහා සහභාගිත්වය ඉහළ නැංවීම. | 15% |

**2017 වර්ෂයේ ළඟාකර ගත් කාර්ය සාධන ඉලක්ක ඉතිරි කොටස...**

| | |
|---|---|
| අ.පො.ස (උ/පෙළ) කලා විෂය ධාරාව සඳහා සහභාගිත්වය අඩු කිරීම. | 31% |
| අ.පො.ස (උ/පෙළ) විද්‍යා විෂය ධාරාව සමත් ප්‍රතිශතය ඉහළ නැංවීම. | 44% |
| අ.පො.ස (උ/පෙළ) වාණිජ විෂය ධාරාව සමත් ප්‍රතිශතය ඉහළ නැංවීම. | 67% |
| අ.පො.ස (උ/පෙළ) කලා විෂය ධාරාව සමත් ප්‍රතිශතය ඉහළ නැංවීම. | 76% |
| සෞන්දර්ය තරග සඳහා සමස්ත ලංකා ජයග්‍රහණ ලබා ගන්නා ප්‍රමාණය ඉහළ නැංවීමෙන් පළාත් අතරින් උතුරු මැද පළාත ලබා ගන්නා ස්ථානය ඉහළ නැංවීම. | 6 |
| සමස්ත ලංකා මලල ක්‍රීඩා ජයග්‍රහණ සඳහා පළාත් මට්ටමේ සථානය ඉහළ නැංවීම. | 7 |
| සියලු පාසල්වල විෂය සමගාමී ක්‍රියාකාරකම් අවස්ථා පුළුල් කිරිම, සෑම ශිෂ්‍යයෙකුටම අවම වශයෙන් විෂය සමගාමී ක්‍රියාකාරකම් දෙකක නියැලීමට අවශ්‍ය පහසුකම් සපුරා දීම. | 800 |
| සියලු පාසල්වල ක්‍රීඩා අවස්ථා පුළුල් කිරීම, සෑම ශිෂ්‍යයකුටම අවම වශයෙන් ක්‍රීඩා දෙකක නියැලීමට අවශ්‍ය පහසුකම් සපුරා දීම. | 700 |
| ශිෂ්‍ය තොරතුරු තාක්ෂණ සාක්ෂරතාවය ඉහළ නැංවීම. | 68% |
| ගුරු තොරතුරු තාක්ෂණ සාක්ෂරතාවය ඉහළ නැංවීම. | 65% |
| පාසල් හැරගිය සිසුන් සඳහා ජාතික වෘත්තිය සුදුසුකම් (NVQ) 5000 පාසල් මට්ටමින් සැපයීම. | 471 |
| වෘත්තිය සුදුසුකම් ඇති ගුරු ප්‍රතිශත ඉහළ නැංවීම. | 70% |

**කාර්ය සාධන ඉලක්ක ඉටුකර ගැනීම පිළිබඳ තොරතුරු**

2017 වර්ෂයේ උතුරු මැද පළාතේ අධ්‍යාපන කාර්ය සාධන ඉලක්ක 24 ක් ඉටුකර ගැනීම අරමුණු කර ගෙන විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

මෙම ඉලක්ක කරා ළඟාවීම සඳහා 2017 වර්ෂයේ දී විශේෂිත වැඩසටහන් පළාත්, කලාප, කොට්ඨාස, පාසල් මට්ටමින් ක්‍රියාත්මක කරඇති අතර එහි ඵලදායි වර්ධනයක් දැකගත හැකි විය. අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන සඳහා 2017 වර්ෂයේ පළාත් සභා ප්‍රතිපාදන රු.මි.277.65 ක් වෙන් කළ අතර 2017 අවසන් වන විට රු.මි. 206.60 ක මුදලක් අධ්‍යාපන සංවර්ධනය සඳහා ඵලදායීව භාවිතා කල හැකි විය. ඒ යටතේ ප්‍රාථමික අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය සඳහා රු.මි.37 ක් ද ද්විතීයික අධ්‍යාපනය සඳහා රු.මි. 237 ක් ද විශේෂ අධ්‍යාපන සහ නොවිධිමත් වැඩසටහන් සඳහා රු.මි.2.15 ක් ද අධ්‍යාපන සැලසුම් හා පර්යේෂණ සඳහා රු.මි.1.5 ක් ද වෙන් කර තිබිණ.එය පහත වගුව මඟින් දක්වා ඇත.

**අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන සඳහා වෙන්කළ ප්‍රතිපාදන සහ වියදම - 2017**

| ව්‍යාපෘතිය | වැඩසටහන | එකතුව (රු.මි) | 2017.12.31 දිනට මුළු වියදම (රු.මි) |
|---|---|---|---|
| ප්‍රාථමික අධ්‍යාපනය | ගුරු/සිසු පුහුණුව | 37.00 | 23.68 |
| ද්විතීයික අධ්‍යාපනය | ගුරු සිසු ඇගයීම | 2.00 | 1.97 |
| | සිසු සාධන මට්ටම ඉහළ නැංවීම | 55.00 | 48.73 |
| | ගුරු/සිසු සංවර්ධන වැඩසටහන් | 60.00 | 51.65 |
| | ඉගෙනුම් සහාය සඳහා නියාමන දර්ශන | 15.00 | 7.86 |
| | ක්‍රීඩා සංවර්ධන | 16.00 | 12.18 |
| | ජාතික විභාග ප්‍රතිඵල ඉහළ නැංවීමේ | 80.00 | 54.29 |

| | | | |
|---|---|---|---|
| ද්විතීයික අධ්‍යාපනය | විශේෂ වැඩසටහන් | | |
| | පළාත් ජාතික හා ජාත්‍යන්තර මට්ටම් තරඟ සඳහා | 9.00 | 4.51 |
| විශේෂ අධ්‍යාපනය | ගුරු පුහුණු වැඩසටහන් | 1.00 | 0.35 |
| නොවිධිමත් අධ්‍යාපනය | ගුරු පුහුණු | 0.50 | 0.45 |
| | පාඨමාලා ගාස්තු | 0.65 | 0. 63 |
| අධ්‍යාපන සැලසුම් හා පර්යේෂණ | අනධ්‍යයන හා පුහුණු වැඩසටහන් | 0.70 | 0.27 |
| | පාඨමාලා ගාස්තු | 0.80 | 0.28 |
| **පළාත් සභා මුළු එකතුව** | | **277.65** | **206.61** |

ඉගෙනුම් සහාය සඳහා නියාමන දර්ශක සැකසීම සඳහා රු.මි.15 ක් වෙන් කළ අතර ඒ යටතේ පළාතේ සියළු පාසල්වල ක්‍රමානුකූල ක්‍රියාවලියක් සඳහා පාසල් ලිත, වාරසටහන්, ක්ෂේත්‍ර සටහන් පොත් සහ කළමණාකරණ දිනපොත් මුද්‍රණය කර ලබාදීම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය සඳහා පිටුවහලක් විය.

2017 වර්ෂයේ පුනරාවර්තන මුදල් යටතේ රු.මි.3 ක මුදලක් ගොඩනැගිලි හා ඉදිකිරීම් සඳහා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට වෙන් වූ අතර ඒ යටතේ පහත සඳහන් කාර්යයන් ඵලදායීව ඉටුකර ඇත. එමෙන්ම ප්‍රාථමික පාසල්වල නඩත්තු කටයුතු සඳහා රු.මි.10 හා ද්විතියික පාසල් නඩත්තු කටයුතු සඳහා රු.මි.12 ක් භාවිතා කළ අතර එය පහත වගුව මගින් දක්වා ඇත.

| විස්තරය | වෙන් කළ ප්‍රතිපාදනය (රු.මි) | වියදම (රු.මි) |
|---|---|---|
| ප්‍රාථමික පාසල් නඩත්තු කටයුතු (612-80-04-01-1303-22(ii) | 10.00 | 9.51 |
| ද්විතියික පාසල් නඩත්තු කටයුතු(612-81-05-01-1303-22(ii) | 12.00 | 11.25 |
| ගොඩනැගිලි හා ඉදි කිරීම්(612-03-02-01-1303-22) | 3.00 | 3.17 |

සැ.යු. ගොඩනැගිලි හා ඉදිකිරීම් වැය විෂය සඳහා රු.මි.065 ක වැය මාරුවක් ද සිදුකර ඇත.

එමෙන්ම සියළුම පළාත් සභා පාසල්වල ප්‍රාථමික අධ්‍යාපන කටයුතු සඳහා රු.මි.33 ක් හා ද්විතීයික අධ්‍යාපන කටයුතු සඳහා රු.මි.9 ක් ලෙස රු.මි.42 ක් ගුණාත්මක යෙදවුම් ලෙස ලබාදී ඇත. මෙම මුදල් භාවිතා කර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා අවශ්‍යවන පරිභෝජ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම හා ඉගෙනුම් අධාරක මිලදී ගැනීම හෝ සැකසීම සිදුකර එම මුදල් ඵලදායි ලෙස භාවිතාකර සිසු දරුවන්ගේ අධ්‍යාපන සංවර්ධන කටයුතු සඳහා භාවිතාකර ඇත.



2017 වර්ෂයේදී උතුරු මැද පළාතේ සිසු කුසලතා අනුව සමස්ත ලංකා ජයග්‍රහණ රාශියක් ලබාගත හැකි වී ඇත.

- ඉංග්‍රීසි විෂය සම්බන්ධයෙන් පද්‍ය ගායනා, අසා ලිවීම, අත් අකුරු හා ඉංග්‍රීසි නාට්‍ය යන සියලු අංශවලින් සමස්ත ලංකා ජයග්‍රහණ 18ක් අත්පත් කර ගැනීමට හැකි වී ඇත.
- ගණිත අංශයෙන් ගණිත දැනුම මිනුම තරඟයේදී සමස්ත ලංකා ස්ථාන 03 ක් ජ්‍යෙෂ්ඨ, කණිෂ්ඨ හා පිරිවෙන් අංශ යටතේ ලබා ගත හැකි විය.
- ක්‍රීඩා අංශයේ 2017 සහාය දිවීමේ කාන්තා ශූරතාවය ලබාගැනීමට උතුරු මැද පළාතේ සිසු දරුවන්ට හැකි විය. 2017 මළල ක්‍රීඩා තරඟාවලියේ දී 8 වන ස්ථානයේ සිට 7 වන ස්ථානයට පැමිණීමට හැකි විය. එමෙන්ම බර එසවීම සමස්ත ශූරතාවයත් හා අත්පන්දු ශූරතාවයත් අත්පත් කර ගත හැකි විය.
- සමස්ත ලංකා පාසල් සංගීත තරඟාවලියේ උතුරු මැද පළාත සඳහා ප්‍රථම ස්ථාන 12 දෙවන ස්ථාන 12 හා තෙවන ස්ථාන 22 ක් ලබා ගැනීමට හැකි විය.
- සමස්ත ලංකා නර්තන තරඟාවලියේදී සමස්ත ලංකා ජයග්‍රහණ 21 ක්ද සමස්ත ලංකා පාසල් නාට්‍ය හා රංග කලාව තරඟාවලියේ සමස්ත ලංකා ස්ථාන 04 ක් ද සමස්ත ලංකා ජයග්‍රහණ 07 ක් ද ලබාගැනීමට හැකි විය.
- සිංහල භාෂා තරගාවලියේ කථික තරග සඳහා සමස්ත ලංකා ජයග්‍රහණ 19ක් පද්‍ය නිර්මාණ සඳහා සමස්ත ලංකා ස්ථාන 17ක් ඇතුළුව විශාල ජයග්‍රහණ ප්‍රමාණයක් ලබාගත හැකිවිය.
- සෑම විෂයයක් යටතේම සිසු කඳවුරු, සිසු පුහුණු, ගුරු පුහුණු හා ගුරු ධාරිතා සංවර්ධන වැඩසටහන් පවත්වා ඇති අතර ඒ මඟින්ද ඒ ඒ විෂයයේ පවත්නා අඩුපාඩු අවම කරගැනීමට ළඟාකරගත යුතු ඉලක්ක කරා ළඟා වීමත් ඉලක්ක කරගනිමින් වාර විභාග ප්‍රතිඵලද විශ්ලේෂණය කර නව වැඩසටහන්, විවිධ ව්‍යාපෘති සකස් කර 2017 වර්ෂයේදී විවිධ වැඩසටහන්, ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී.

කෘෂි විද්‍යාව සහ ජෛව පද්ධති තාක්ෂණය විෂය - ගුරු පුහුණු සහ සිසු පුහුණු

ජලජීවී පුහුණු මධ්‍යස්ථානය කලාවැව

සොබාදහම් ගොවිපළ නාඋල





කෘෂි පීඨය -රජරට විශ්විද්‍යාලය





### නර්ථනය විෂය - ගුරු පුහුණු සහ සිසු පුහුණු




එක් එක් විෂය සම්බන්ධයෙන් පැවැත්වූ සිසු කඳවුරු සහ පුහුණුවලට අමතරව සිසුන්ගේ ආකල්ප වර්ධනය සඳහා සහ යහපත් ජීවන පුරුදු ඇතිකරලීමටත් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

### ගෙවතුවගා වැඩසටහන




### කාබනික පොහොර නිෂ්පාදන වැඩසටහන්



### කසල ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘති




### මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්




මෙම වැඩසටහන්වලට අමතරව ජනාධිපති කාර්යාලය මඟින් ක්‍රියාත්මක කරනු ලබන තිරසර පාසල් වැඩසටහන 2017 වර්ෂයේදී උතුරු මැද පළාත් තුළ සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී. තිරසර සංවර්ධන ඉලක්ක ජයගැනීම වෙනුවෙන් උතුරු මැද පළාතේ පාසල් අධ්‍යාපනය තුළ ගුණාත්මක වෙනස්කම් සිදු කළ අතර "සොඳුරු ළමා ලොවක් තිරසර හෙටක්" යන තේමාව ඔස්සේ තිරසර පාසල් වැඩසටහන ක්‍රියාත්මක විය.

මේ තුළ පෙළගස්වා තිබූ ක්‍රියාකාරකම්වල නියැලීම තුළින් උතුරු මැද පළාතේ සිසු දරුවන්ගේ සහභාගිත්ව ප්‍රවේශය තුළ වඩා ඵලදායීව හා නිර්මාණශීලීව සිය අධ්‍යාපන කටයුතු සිදුකිරීමට අවස්ථාව ලැබී ඇත.




තිරසර පාසල් වැඩසටහන සඳහා තෝරාගත් පාසල් සංඛ්‍යාව අධ්‍යාපන කලාප අනුව




තිරසර පාසල් වැඩසටහන යටතේ උතුරු මැද පළාතේ තෝරාගත් පාසල් 240ක කරන ලද වැඩසටහන් පහත අංශ යටතේ ක්‍රියාත්මක විය.

- කලාප හා කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරු තිරසර පාසල් සංවර්ධන වැඩසටහන පිළිබඳව දැනුවත් කිරීම.
- විදුහල්පතිවරු දැනුවත් කිරීම.
- තිරසර පාසල් වැඩසටහන - මාර්ගෝපදේශ සංග්‍රහය සියළු පාසල් වෙත ලබා දී ඇත.
- තිරසර පාසල් සංවර්ධන පළාත් , කලාප සහ පාසල් කමිටු පත්කර ඇත.
- සියලුම පාසල් සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර ඇත.
- පළාතේ තෝරාගත් සියලුම පාසල්වල මෙම වැඩසටහන 2017.01.28 දින ආරම්භ කිරීම.
- පළාත් හා කලාප මට්ටමින් ප්‍රගති සමාලෝචන සිදු කර ඇත.

2017 වර්ෂයේදී උතුරු මැද පළාතේ අධ්‍යාපන අංශයේ සංවර්ධනය සඳහා සැලකිය යුතු දායකත්වයක් සැපයීමට හැකි වූ වසරකි. එහිදී කලාප හා කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරු, විදුහල්පතිවරු දැනුවත් කිරීම හා තිරසර පාසල් සංවර්ධන වැඩසටහන පිළිබඳව දැනුවත් කිරීම සඳහා වැඩසටහන්ද, තිරසර පාසල් වැඩසටහනට අදාල මාර්ගෝපදේශ සංග්‍රහය සියළු පාසල් වෙත ලබා දීමට කටයුතු කිරීමද, තිරසර පාසල් සංවර්ධන පළාත් , කලාප සහ පාසල් කමිටු පත් කිරීමද, වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමද කැපී පෙනුණි. එසේම පළාතේ අධ්‍යාපන අංශයේ සංවර්ධනය ප්‍රගතිය කලාප මට්ටමින් ඇගයීමද සිදු විය.

මෙය හිස්ව තබන ලද පිටුවකි

# පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව

6.3

### පළාතේ කලායතන පිහිටීම

| කලායතනය | සංඛ්‍යාව |
|---|---|
| නර්තන | 147 |
| සංගීත | 14 |
| නාට්‍ය | 07 |

### ආගමික සිද්ධස්ථාන

| ආගමික සිද්ධස්ථාන | සංඛ්‍යාව |
|---|---|
| පන්සල් | 1112 |
| කෝවිල් | 42 |
| මුස්ලිම් පල්ලි | 198 |
| කතෝලික දේවස්ථාන | 47 |
| පිරිවෙන් | 57 |
| දහම් පාසල් | 978 |

### දැක්ම

"සංස්කෘතිකාංග ගරු කරන සාරධර්ම සපිරි සමාජයක්, සෞභාග්‍යවත් පළාතක්".

### මෙහෙවර

" දැහැමි කලාකාමී හා අභිමානවත් සමාජයක් බිහි කිරීම සඳහා සියලු පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව දහම් අධ්‍යාපනය නංවාලීම, උසස් කලා නිර්මාණකරණය හා රසවින්දනය දිරිගැන්වීම, අතීත සංස්කෘතික උරුමයන් හා ශිල්ප සංරක්ෂණය සහ කලාකරුවන්ගේ කුසලතා ඔප් නැංවීම".

### දිගු කාලීන අරමුණු හා කෙටි කාලීන අරමුණු

### දිගු කාලීන අරමුණු

- අත්‍යවශ්‍ය භෞතික සම්පත් සහිත දැහැමි පාසල් පද්ධතියක් සහ දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කරගත් දහම් පාසල් ප්‍රජාවක්.
- දක්ෂ කලාකරුවන්ගේ නිර්මාණ එළිදැක්වීමට කාර්යක්ෂම ක්‍රමවේදයක්
- උසස් කලා නිර්මාණ බිහි කිරීම.
- පළාතේ සංස්කෘතිකාංග අඛණ්ඩව පවත්වාගෙන යාමට විධිමත් ක්‍රමවේදයක්.
- ඉහළ ධාරිතාවයකින් යුත් කලායතන පද්ධතියක් හා කලාකරුවන් පිරිසක්.

### කෙටි කාලීන අරමුණු

- කාර්යක්ෂම ආයතන පද්ධතියක්.
- නර්තන කලාව, ලේඛණ කලාව, සංගීත හා රංග කලාව වැනි සංස්කෘතික අංගයන් ප්‍රවර්ධනයට කටයුතු සැලසීම.
- පළාතේ කලාකරුවන්ගේ හැකියාවන් හඳුනා ගැනීම හා ඇගයීමට ලක් කිරීම.

- ❖ පළාතේ ආගමික පුනර්ජීවය වෙනුවෙන් සංවර්ධන කාර්යයන් ඉටු කිරීම.

## ප්‍රධාන කාර්යයන්


- දහම් අධ්‍යාපනය නංවාලීම.
- උසස් කලා නිර්මාණ බිහි කිරීම සංවර්ධනය.
- උසස් රසාස්වාදය ප්‍රචලිත කිරීම.
- අතීත සංස්කෘතික උරුමයන් හා කලා ශිල්ප සංරක්ෂණය.
- කලාකරුවන්ගේ කුසලතා නංවාලීම.
- ආයතනික ධාරිතා සංවර්ධනය.
- යහපාලන කටයුතු සංවර්ධනය.

## ප්‍රධාන උපාය මාර්ගයන්

- ❖ දැනුවත් කිරීමේ වැඩසටහන් හා පුහුණු වැඩමුළු පැවැත්වීම.
- ❖ කලා උළෙල හා එයට සමගාමී ක්‍රියාකාරකම්.
- ❖ සංස්කෘතික සංරක්ෂණය සිදු කිරීම.
- ❖ ආයතනික ධාරිතා සංවර්ධනය.
- ❖ සංවර්ධන ආධාර (දහම් පාසල්, කලායතනාධාර, ආගමික සිද්ධස්ථාන)

## කාර්ය මණ්ඩල සංයුතිය

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 18 |
| 2 | සේවයේ නියුතු | 19 |
| 3 | පුරප්පාඩු | 02 |
| 4 | අනියම් | 0 |
| 5 | තාවකාලික | 1 |
| 6 | කොන්ත්‍රාත් | 0 |




## මෙහෙයුම් ප්‍රතිඵල- පුනරාවර්තන වියදම්

| වියදම් ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය | 2017 වර්ෂයේ වියදම් (රු. මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 10.02 | 9.43 | 0.59 | 94 |
| ගමන් වියදම් | 0.27 | 0.22 | 0.05 | 81 |
| සැපයීම් | 1.04 | 0.68 | 0.36 | 66 |
| නඩත්තු වියදම් | 1.48 | 1.79 | (0.31) | 100 |
| ගිවිසුම්ගත සේවා | 1.01 | 0.76 | 0.25 | 76 |
| මාරු කිරීම් | 0.26 | 0.18 | 0.08 | 68 |
| වෙනත් | 6.17 | 4.64 | 1.53 | 75 |
| **එකතුව** | **20.237** | **17.69** | **2.547** | **87** |

NCP/CS/PT/B/01/03(2017) හා 2017.12.31 දිනැති ලිපිය අනුව, පළාත් මුල්‍ය රීති 27.1 වගන්තිය සහ 1990 අංක 28 දරන පළාත් සභා (සංශෝධන) පනතින් 1987 අංක 41 දරන පළාත් සභා පනතේ 27 වගන්තියට ඉක්බිතිව එකතුකොට ඇති 27 (අ) නව වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ගරු ආණ්ඩුකාර තුමා විසින් ලබා දුන් අනුමැතිය පරිදි පුනරාවර්තන වැය විෂයන්හි ඉතිරි ප්‍රතිපාදන අවුරා තබා ඇත.

### පුනරාවර්තන වියදම් දරමින් සංවර්ධන ස්වභාවයේ වැඩ ඉටු කිරීම


| අනු අංකය | ව්‍යාපෘතිය/ වැඩ සටහන | ප්‍රධාන ක්‍රියාකාරකම | අපේක්ෂිත ප්‍රතිඵල | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|
| 01 | ගොඩනැගිලි අළුත්වැඩියාව | සංස්කෘතික දෙපාර්තමේන්තුවේ නව කාර්යාල ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම | නව කාර්යාල පරිශ්‍රය | කාර්යාල සේවකයන් |

### මුලධන වියදම

| වියදම් ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2017 වර්ෂයේ වියදම් (රු. මි.) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 0.05 | 0.0495 | 0.0005 | 100 |
| යන්ත්‍ර සූත්‍ර සවිකිරීම හා උපකරණ | 0.38 | 0.374285 | 0.000715 | 100 |
| වෙනත් මුලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම | 0.08 | 0.071484 | 0.003516 | 100 |
| **එකතුව** | **0.5** | **0.495269** | **0.004731** | **100** |

### සංවර්ධන වැඩ පිළිබඳ කාර්ය සාධනය - පසුගිය වසර 03 ක ප්‍රාග්ධන වැය වීම්

| වර්ෂය | PSDG වියදම (රු.මි.) | PCDG වියදම ( රු.මි.) | වෙනත් ප්‍රතිපාදන වියදම (රු.මි.) | එකතුව (රු.මි) |
|---|---|---|---|---|
| 2015 | 4.28 | 11.22 | - | 15.50 |
| 2016 | 7.70 | 35.55 | - | 43.25 |
| 2017 | 9.67 | 26.50 | 5.00 | 41.17 |



**2017 වර්ෂයේ සංවර්ධන වැඩ පිළිබඳ කාර්ය සාධනය කරා ළඟා වීම - සංවර්ධන ව්‍යාපෘති මඟින් කෙටි කාලීනව අපේක්ෂා කරන ප්‍රතිලාභ**

| අනු අංකය | ව්‍යාපෘතිය | කෙටිකාලීන බලපෑම (outcome) |
|---|---|---|
| 01. | ප්‍රාදේශිය සංස්කෘතික උළෙල | සාර්ථක නව නිර්මාණ බිහි වීම.<br>කලාකරුවන් දිරි ගැන්වීම. |
| 02. | පළාත් කලා උළෙල | සාර්ථක නව නිර්මාණ බිහි වීම.<br>කලාකරුවන් දිරි ගැන්වීම.<br>කලා කරුවන්ට ජාතික තලයට ප්‍රවිශ්ඨ වීමට අවස්ථාව සැලසීම. |
| 03. | සුභාෂණ සඟරාව | පළාතේ ලේඛකයන්ගේ හැකියාවන් හා දක්ෂතාවයන් ඔප් නැංවීම<br>නවක ලේඛකයන්ට ඔවුන්ගේ නිර්මාණ පල කිරීමට අවස්ථාව ලබා දීම. |
| 04. | කලා ප්‍රසංග පැවැත්වීම | නිවැරදි රස වින්දනයට අවස්ථාව සැලසීම.<br>උසස් කලා නිර්මාණ බිහි කිරීමට අවස්ථාව සැලසීම.<br>ආධුණික කලා ශිල්පීන් වැඩි වශයෙන් කලාව වෙත නැඹුරු වීම. |
| 05. | ආගමික කටයුතු | අවස්ථානුකූලව සිදු කල යුතු ආගමික උත්සවයන් ක්‍රියාත්මක කිරීමට දායකත්වය සැපයීම.<br>ආගමික සිද්ධස්ථාන සංවර්ධනයට දායකත්වය ලබා දීම. |
| 06. | දහම් පාසල් සංවර්ධනය | දහම් පාසල් වල අධ්‍යාපන කටයුතු කරගෙන යාම සඳහා අවශ්‍ය භෞතික සම්පත් සංවර්ධනය වීම.<br>පහසුකම් සපිරීම තුලින් දහම් අධ්‍යාපනය වෙත සිසුන් ආකර්ෂණය වීම. |
| 07. | පුහුණු වැඩමුළු පැවැත්වීම | කලා ක්ෂේත්‍රය තුළ ප්‍රවීනයන් හා විශ්ව විද්‍යාල ආචාර්යවරුන් සමඟ පුහුණු වීම් සඳහා අවස්ථාව ලැබීමෙන් තම දක්ෂතා හා හැකියා ඔප් නංවා ගැනීමට හැකි වීම. |
| 08. | ගොඩ නැගිලි හා ඉදිකිරීම් | සේවක අභිප්‍රේරණය ඇති වීම.<br>කාර්යාල කටයුතු පහසුවෙන් ඉටු කර ගැනීමට හැකි වීම. |

## දිගු කාලීන හා කෙටි කාලීන අරමුණු ඉටු කර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ප්‍රධාන කාර්යන් හා සම්බන්ධ ව්‍යාපෘතිවල ප්‍රගතිය

| අනු අංකය | අරමුණ | ක්‍රියාත්මක කල ව්‍යාපෘතිය/ ව්‍යාපෘති | ප්‍රධාන ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් ගණන | ආවරණය කල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ගණන | වෙන් කල මුදල (රු.මි) | ප්‍රගතිය (%) | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | භෞතික | මූල්‍ය |
| 01 | උසස් කලා නිර්මාණ බිහි කිරීම හා සංවර්ධනය කිරීම | ප්‍රාදේශීය සංස්කෘතික උළෙල | උතුරු මැද පළාතේ ප්‍රාදේශීය සභා 25 හා නගර සභාව තුල තරඟ පැවැත්වීම හා ප්‍රා දේශීය සංස්කෘතික උළෙල පැවැත්වීම | පළාතේ ජනතාව | සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස | 5.20 | 96 | 96 |
| | | පළාත් කලා උළෙල | 28 වන උතුරු මැද කලා උළෙලට අදාල සියළු තරඟ පවත්වා කලා උළෙල පැවැත්වීම | පළාතේ ජනතාව | සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස | 4.00 | 100 | 97 |
| 02 | කලා කරුවන්ගේ කුසලතා නංවාලීම | සුභාෂණ සඟරාව | සුභාෂණ සඟරාවේ හත්වන කලාපය ප්‍රකාශයට පත් කිරීම | පළාතේ ජනතාව | සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස | 0.15 | 100 | 89 |
| | | පුහුණු වැඩමුළු පැවැත්වීම | උඩරට නර්තන හා කෙටි චිත්‍රපටි පුහුණු වැඩමුළු පැවැත්වීම | පළාතේ ජනතාව | සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස | 1.00 | 100 | 89 |
| | | සංගීත හා නර්තන කණ්ඩායම | නැටුම් හා සංගීත කණ්ඩායම සඳහා අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීම | පළාතේ ජනතාව | සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස | 0.59 | 100 | 100 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 03 | උසස් රසාස්වාදනය ප්‍රචලිත කිරීම | කලා ප්‍රසංග පැවැත්වීම | සුරපුර රංගපීඨයේ හෝ උතුරු මැද පළාතේ තෝරාගත් සුදුසු ස්ථානයක , නාට්‍ය හෝ නර්තන ප්‍රසංගයක් පැවැත්වීම | පළාතේ ජනතාව | සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස | 0.65 | 100 | 100 |
| | | සංගීත ප්‍රසංග පැවැත්වීම | සුරපුර එළිමහන් රංග පීඨයේ සංගීත වැඩ සටහනක් පැවැත්වීම | පළාතේ ජනතාව | සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස | 0.42 | 100 | 100 |
| 04 | අතීත සංස්කෘතික උරුමයන් හා කලා ශිල්ප සංරක්ෂණය කිරීම | ආගමික හා සංස්කෘතික කටයුතු | •උඩමළුව පෝ දින වැඩ සටහන | පළාතේ ජනතාව | සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස | 1.20 | 100 | 100 |
| | | | •මිහින්තලය පොසොන් උත්සවය | පළාතේ ජනතාව | සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස | 1.50 | 100 | 100 |
| | | | •අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පෙරහැර සඳහා අනුග්‍රාහකත්වය දැක්වීම | පළාතේ ජනතාව | සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස | 2.15 | 100 | 100 |
| | | | •අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සාම්ප්‍රදායික උත්සව සඳහා අනුග්‍රාහකත්වය දැක්වීම | පළාතේ ජනතාව | සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස | 2.75 | 100 | 89 |
| | | | •ආගමික සිද්ධස්ථාන සංවර්ධනය | පළාතේ ජනතාව | සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස | 12.40 | 81 | 81 |
| | | ඓතිහාසික දළදා පෙරහැර | ඓතිහාසික දළදා පෙරහැර පැවැත්වීම | පළාතේ ජනතාව | සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස | 10.00 | 100 | 99 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 06 | දැහැමි ගුණ ගරුක සමාජයක් | දහම් පාසල් සංවර්ධනය | දහම්පාසල් වල භෞතික අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය මූල්‍යමය ආධාර ලබා දීම | පළාතේ ජනතාව | සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස | 10.00 | 40 | 22.5 |
| 07 | ධාර්තා සංවර්ධනය | ගොඩනැගිලි හා භූ ශ්‍රීම | •දෙපාර්තමේන්තු ගොඩනැගිල්ලේ නඩත්තු කටයුතු සිදු කිරීම<br>•ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ මිලදී ගැනීම<br>•යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම<br>•ගරාජයක් සකස් කිරීම | පළාතේම ජනතාව | සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස | 0.50 | 100 | 99.5 |

## උසස් කලා නිර්මාණ බිහි කිරීම හා එම අංශයේ සංවර්ධනය උදෙසා දායකත්වය

- ප්‍රාදේශීය සංස්කෘතික උළෙල

| අනු අංකය | තරඟ ඉසව්ව | සහභාගී වූ තරඟ කරුවන් සංඛ්‍යාව | පැවැත්වූ ස්ථානය |
|---|---|---|---|
| 01. | සංගීත | 1827 | ඇළහැර ප්‍රාදේශීය සභාව හැර අනෙකුත් සියළුම ප්‍රාදේශීය සභා සහ නගර සභාව තරඟහ පැවැත්විය |
| 02 | නර්තන | 2140 | |
| 03 | චිත්‍ර,මූර්ති, කැටයම්,ගොක් කලා | 2365 | |
| 04 | සාහිත්‍යය | 1720 | |
| 05 | නිවේදන | 268 | |

- පළාත් කලා උළෙල

| අනු අංකය | අංශය | තරග ඉසව්ව | වයස් සීමාව | සහභාගී වූ තරඟ කරුවන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | සංගීත අංශය | ළමා ගායනා | අවු: 12 ට අඩු | 58 |
| | | ශාස්ත්‍රීය ගායනා (ඒකල/ විවෘත) | අවු: 12 ට වැඩි | 46 |

| | | | | |
|---|---|---|---|---|
| 01 | සංගීත අංශය | ජන ගායනා (ඒකල/ විවෘත)<br>ජන ගායනා (ඒකල/ විවෘත) | අවු 18 ට අඩු හා අවු 18 ට වැඩි වශයෙන් අංශ 02 | 106 |
| | | ජන ගායනා (සාම්ප්‍රදායික) | අවු 50 ට වැඩි | 10 |
| | | ශාස්ත්‍රීය වාදන | 85 | |
| | | වේදිකා නාට්‍ය ගී (ඒකල/ විවෘත) | වයස් සීමාවක් නොමැත | 23 |
| | | නව නිර්මාණ ගායනා- සමූහ (විවෘත) | වයස් සීමාවක් නොමැත | 80 |
| | | ජන ගී ප්‍රති නිර්මාණ සමූහ (විවෘත) | වයස් සීමාවක් නොමැත | 75 |
| | | නව නිර්මාණ වාදන | වයස් සීමාවක් නොමැත | 40 |
| | | නූර්ති හා නාඩගම් ගී | වයස් සීමාවක් නොමැත | 22 |
| 02 | නර්තන අංශය | උඩරට ශාස්ත්‍රීය නැටුම් (සමූහ )ජ්‍යෙෂ්ඨ අංශය | අවු 16 ට වැඩි | 95 |
| | | පහතරට ශාස්ත්‍රීය නැටුම් නැටුම් (සමූහ )ජ්‍යෙෂ්ඨ අංශය | අවු 16 ට වැඩි | 60 |
| | | සබරගමු ශාස්ත්‍රීය නැටුම් (සමූහ ) විවෘත | අවු 16 ට වැඩි | 40 |
| | | සාම්ප්‍රදායික වන්නම් (සමූහ ) කනිෂ්ඨ අංශය | අවු 16 ට වැඩි සහ අඩු | 90 |
| | | ජන නැටුම් වන්නම් (සමූහ ) කණිෂ්ඨ අංශය | අවු 16 ට වැඩි සහ අඩු | 85 |
| | | බලි ශාන්ති කර්ම | වයස් සීමාවක් නොමැත | 55 |
| | | නව නිර්මාණ නැටුම් සමූහ / විවෘත | වයස් සීමාවක් නොමැත | 75 |
| | | ඉන්දියානු නර්තන සම්ප්‍රදාය සමූහ / විවෘත | වයස් සීමාවක් නොමැත | 95 |
| | | කෙටි මුද්‍රා නාට්‍ය (විවෘත) | වයස් සීමාවක් නොමැත | 60 |
| | | ගීත අනුව නර්තනය (ළමා - විවෘත) | අවු 12 ට අඩු හා 16 ට වැඩි | 45 |
| 03 | නිවේදන තරඟ | කනිෂ්ඨ අංශය | 18 ට අඩු | 15 |
| | | ජ්‍යෙෂ්ඨ අංශය | අවු 18 – 35 අතර | 12 |
| 04 | නාට්‍ය තරඟ | දිගු නාට්‍ය | වයස් සීමාවක් නොමැත | 200 |
| | | කෙටි නාට්‍ය | වයස් සීමාවක් නොමැත | 185 |
| | | ළමා නාට්‍ය | අවු 16 ට අඩු | 60 |
| 05 | කෙටි චිත්‍ර පටි | කෙටි චත්‍ර පටි | වයස් සීමාවක් නොමැත | 26 |

| | | | | |
|---|---|---|---|---|
| 06<br>06 | ගද්‍ය, පද්‍ය,සාහිත්‍ය<br>ගද්‍ය, පද්‍ය,සාහිත්‍ය | යොවුන් නව කථා අත්පිටපත් තරඟය | වයස් සීමාවක් නොමැත | 50 |
| | | කෙටි කථා තරඟය | වයස් සීමාවක් නොමැත | 70 |
| | | කෙටි කථා සංග්‍රහ තරඟය | වයස් සීමාවක් නොමැත | 50 |
| | | පද්‍ය රචනා තරඟය | වයස් සීමාවක් නොමැත | 78 |
| | | පද්‍ය රචනා සංග්‍රහ තරඟය | වයස් සීමාවක් නොමැත | 23 |
| | | ගී පද රචනා තරඟය | වයස් සීමාවක් නොමැත | 78 |
| | | ගී පද රචනා සංග්‍රහ තරඟය | වයස් සීමාවක් නොමැත | 46 |
| | | ළමා කතන්දර අත්පිටපත් තරඟය | අවු 12 ට අඩු | 48 |
| 07 | චිත්‍ර තරඟ | ප්‍රාථමික අංශය | 1-2 ශ්‍රේණි | 98 |
| | | පශ්චාත් ප්‍රාථමික අංශය | 3,4,5 ශ්‍රේණි | 112 |
| | | කණිෂ්ඨ අංශය | 6,7,8 ශ්‍රේණි | 127 |
| | | ජ්‍යෙෂ්ඨ අංශය | 9,10,11 ශ්‍රේණි | 95 |
| | | ජ්‍යෙෂ්ඨ ද්විතික අංශය | 12,13 ශ්‍රේණි | 72 |
| | | විවෘත අංශය | විවෘත අංශය | 16 |
| 08 | මූර්ති,කැටයම්,ගොක් කලා නිර්මාණ තරඟය | මූර්ති තරඟය | වයස් සීමාවක් නොමැත | 12 |
| | | කැටයම් තරඟය | වයස් සීමාවක් නොමැත | 6 |
| | | ගොක් කලා නිර්මාණ තරඟය | වයස් සීමාවක් නොමැත | 13 |

### කලා කරුවන්ගේ කුසලතා නංවාලීම

- වැඩමුළු පැවැත්වීම

| අනු අංකය | වැඩමුළුවේ නම | පැවැත්වූ දින ගණන | සහභාගී වූ ශිල්පීන් සංඛ්‍යාව | සහභාගී වූ සම්පත් දායකයන් |
|---|---|---|---|---|
| 01 | කෙටි චිත්‍ර පටි වැඩමුළුව | 03 | 60 | ප්‍රවීන චිත්‍ර පටි අධ්‍යක්ෂ ප්‍රසන්න විතානගේ කැමරා අධ්‍යක්ෂ දුමින්ද මඩවල |
| 02 | උඩරට නර්තන වැඩමුළුව | 03 | 96 | කොළඹ ශ්‍රී පාලි මණ්ඩලයේ කථිකාචාර්යවරු |

- නර්තන හා සංගීත භාණ්ඩ මිලදී ගැනීම

| අනු අංකය | මිලදී ගත් භාණ්ඩය | ප්‍රතිලාභීන් |
|---|---|---|
| 1 | නර්තන ඇඳුම් | මෙම උපකරණ පළාත් රාජ්‍ය නර්තන හා සංගීත කණ්ඩායමේ පරිහරණය සඳහා මිලදී ගෙන ඇත |
| 2 | බෙර සිව් | |
| 3 | බෙර ඇඳුම් | |
| 4 | ශිර්ෂ ආභරණ | |
| 5 | ගිටාර් | |
| 6 | මයික් සහ සංගීත උපකරණ සඳහා අවශ්‍ය ස්ටැන්ඩ් | |
| 7 | ඩී.වී.ඩී. යන්ත්‍රය | |

### උසස් රසාස්වාදය ප්‍රචලිත කිරීම

❖ කලා ප්‍රසංග හා සංගීත ප්‍රසංග පැවැත්වීම

| අනු අංකය | ප්‍රසංගයේ නම | පැවැත්වූ ස්ථානය | සහභාගී වූ ප්‍රේක්ෂකයන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | රොඩ්නි වර්ණකුල ශූරීන්ගේ ගී රඟ ශොභා නාට්‍ය ගීත ප්‍රසංගය | සුරපුර එළිමහන් රංගපීඨය | 2000 ක් පමණ |
| 02 | ජයලත් මනෝරත්න ශූරීන්ගේ ගුරු තරුව වේදිකා නාට්‍ය | කැබිතිගොල්ලෑව මහා විද්‍යාලය | පාසල් සිසුන් 3200 ක් පමණ |
| 03 | සෝමලතා සුබසිංහ මහත්මියගේ විකෘති වේදිකා නාට්‍ය | කැකිරාව මධ්‍ය විද්‍යාලය | පාසල් සිසුන් 2900 ක් පමණ |
| 04 | සිව් රඟ ගී වේදිකා නාට්‍ය ගීත | මැදවච්චිය සංඝිලිකනදරාව විද්‍යාලය | පාසල් සිසුන් 1500 ක් පමණ |

අතීත සංස්කෘතික උරුමයන් හා කලා ශිල්ප සංරක්ෂණය කිරීම.

**2017 වසරේ ආධාර ලබා දුන් පෙරහැර, ආදාහන පූජෝත්සව හා වෙනත් උත්සව නාම ලේඛනය**

**අනුරාධපුර දිස්ත්‍රික්කය**

| අනු අංකය | නම | මුදල (රු) |
|---|---|---|
| 01 | මිහින්තලය පොසොන් උත්සවය | 1,550,000.00 |
| 02 | ගල් මඩුව ශ්‍රී ශෛලබිම්බාරාමයේ නිකිණි පෙරහැර | 25,000.00 |
| 03 | ඇටවීරගොල්ලෑව ශ්‍රී ජයසුමනාරාමයේ ආදාහන පූජෝත්සවය | 100,000.00 |
| 04 | අනුරාධපුර පැරණි බස් නැවතුම්පොළ වීරසේකරාමයේ ආදාහන පූජෝත්සවය | 100,000.00 |
| 05 | අනුරාධපුර ථූපාරාම විහාරයේ ආදාහන පූජෝත්සවය | 125,000.00 |
| 06 | ගලෙන්බිඳුණුවැව ඥාණීස්වර පිරිවෙනේ ආදාහන පූජෝත්සවය | 125,000.00 |
| 07 | සුගතාරාම විහාරයේ ආදාහන පූජෝත්සවය | 25,000.00 |
| 08 | තලාව ආදාහන පූජෝත්සවය | 25,000.00 |
| 09 | අනුරාධපුර බටකැත්ත විහාරස්ථානයේ ආදාහන පූජෝත්සවය | 200,000.00 |
| 10 | හොරොව්පොතාන රුවන්වැලි මධ්‍ය විද්‍යාලයේ වෙස් මංගල්‍ය | 50,000.00 |
| 11 | තිරප්පනේ සදානන්ද මහ පිරිවනේ ආදාහන පූජෝත්සවය | 125,000.00 |
| 12 | අනුරාධපුර කඩ පනහ තරුණ බෞද්ධ සංගමය සංවිධානය කරන බුද්ධගයා වෙසක් අසිරිය | 100,000.00 |
| 13 | ගල්නෑව කත්තරගම පිරිවනේ ආදාහන පූජෝත්සවය | 87,500.00 |
| 14 | ගල්මඩුව ශෛලබිම්බාරාමයේ නිකිණි මහා පෙරහැර | 25,000.00 |
| 15 | කෙත්තාරාමයේ නීලගිරි ධාතු පෙරහැර සඳහා | 100,000.00 |
| 16 | බුද්ධගයා ජාතික පෙරහැර | 125,000.00 |
| 17 | සාහිත්‍ය උත්සවය | 100,000.00 |
| 18 | ශ්‍රී ඥානවිමලාරාමය | 51,000.00 |
| 19 | මැදවච්චිය නිග්‍රෝධාරාමයේ ආදාහන පූජෝත්සවය | 50,000.00 |
| 20 | විහාර මහා දේවි ආරාමයේ 55 වන සංඝමිත්තා ගුණ සමරු පෙරහැර | 50,000.00 |
| 21 | ඥානේස්වර පිරිවෙන | 50,000.00 |
| **එකතුව** | | **3,189,360.00** |

## 2017 වසරේ ආධාර ලබා දුන් පෙරහැර , හා වෙනත් ආගමික උත්සව සඳහා දායකත්වය
## පොළොන්නරුව දිස්ත්‍රික්කය

| අනු අංකය | නම | මුදල රු. |
|---|---|---|
| 01 | හිඟුරක්ගොඩ වෙසක් පෙරහැර | 100,000.00 |
| 02 | කඳුරුවෙල ජයන්ති විහාරයේ | 100,000.00 |
| 03 | පුරාන ඉසිපතන විහාරයේ පෙරහැර | 500,000.00 |
| 04 | ඓතිහාසික දිඹුලාගල පොසොන් පෙරහැර | 600,000.00 |
| 05 | පොළොන්නරුව ඓතිහාසික පොසොන් පෙරහැර | 650,000.00 |
| 06 | හිඟුරක්ගොඩ පොසොන් මිහිඳු පෙරහැර | 200,000.00 |
| 07 | අරලගංවිල ඇසල පෙරහැර | 100,000.00 |
| 08 | අරලගංවිල සද්ධාතිස්සාරාමයේ පෙරහැර | 200,000.00 |
| 09 | වෙල්ලාරගම ආදාහන පූජෝත්සවය | 50,000.00 |
| 10 | ගංගාරාමයේ ආදාහන පූජෝත්සවය | 100,000.00 |
| 11 | ශ්‍රී සුදර්ශනාරාමය සදගලතැන්න - ආදාහන පූජෝත්සවය | 100,000.00 |
| 12 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සාහිත්‍ය උත්සවය | 50,000.00 |
| 13 | ශ්‍රී ජිනේන්ද්‍රාරාමයේ - ආදාහන පූජෝත්සවය | 100,000.00 |
| 14 | දහම් පාසල් බැති ගී තරගය - මැදිරිගිරිය | 100,000.00 |
| **එකතුව** | | **2,950,000.00** |

## 2017 වසරේ ආධාර ලබා දුන් ආගමික සිද්ධස්ථාන සංවර්ධනය (අනුරාධපුර) සඳහා ලබා දුන් දායකත්වය (පළමු අදියර)

| අ අං | ප්‍රාදේශීය සභාව | ආගමික සිද්ධස්ථානය | කාර්යය | මුදල (රු) |
|---|---|---|---|---|
| 01 | කැබිතිගොල්ලෑව | පුරාණ ගල්ලෙන් රජමහ විහාරය,මැද වැව,කැබිතිගොල්ලෑව | වැසිකිළි පහසුකම් | 100,000.00 |
| 02 | කැබිතිගොල්ලෑව | ගලපිටගල ආරණ්‍ය සේනාසනය,ඊතල්විද්ද වැව. | බුදු මැදුරේ ඉදිරි කටයුතු නිම කිරීම | 100,000.00 |
| 03 | කැබිතිගොල්ලෑව | රජමහ විහාරය,ඊතල්විද්ද වැව. | වැසිකිළි පහසුකම් | 100,000.00 |
| 04 | කැබිතිගොල්ලෑව | ගෝනමරියාව, කැබිතිගොල්ලෑව | ජල පහසුකම් ලබා ගැනීම | 100,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 05 | කැබිතිගොල්ලෑව | හේරත්හල්මිල්ලෑව, කැබිතිගොල්ලෑව | සංඝාවාස අළුත්වැඩියා කිරීම | 100,000.00 |
| 06 | කැබිතිගොල්ලෑව | අභිනවාරාමය,කණුගහ වැව, කැබිතිගොල්ලෑව | වැසිකිළි පහසුකම් | 100,000.00 |
| 07 | කැබිතිගොල්ලෑව | රජමහ විහාරය කුරුළුගම | සංඝාවාසයේ ඉදිකිරීම් කටයුතු | 100,000.00 |
| 08 | කැබිතිගොල්ලෑව | සුමන අශෝකාරාමය.කහටගොල්ලෑව | සංඝාවාසයේ ඉදිකිරීම් කටයුතු | 100,000.00 |
| 09 | හොරොව්පතාන | දුටුගැමුණු රජමහ විහාරය,දුටුවැව,කපුගොල්ලෑව | බහුකාර්ය ගොඩනැගිල්ල | 500,000.00 |
| 10 | ගලෙන්බිඳුණුවැව | ශ්‍රී සංඝබෝධි විහාරය,මහදිවුල්වැව.නාමල්පුර | සංවර්ධන කටයුතු | 250,000.00 |
| 11 | මැදවච්චිය | ශ්‍රී බෝධිරාජාරාමය,රඹකුලම මැදවච්චිය | ද්‍රව්‍යමය ආධාර | 50,000.00 |
| | | **එකතුව** | | **1.600,000.00** |

## 2017 වසරේ ආධාර ලබා දුන් ආගමික සිද්ධස්ථාන සංවර්ධනය (අනුරාධපුර)සඳහා ලබා දුන් දායකත්වය (දෙවන අදියර)

| අනුඅංකය | ප්‍රාදේශීය සභාව | ආගමික සිද්ධස්ථානය | කාර්යය | මුදල (රු) |
|---|---|---|---|---|
| 01 | මහනගර සභාව | හතරැස්වල විහාරය,යාපනය පාර, අනුරාධපුර | සංඝාවාසයේ ඉදිකිරීම් කටයුතු | 100,000.00 |
| 02 | මහනගර සභාව | පුල්ලෙයාර් කෝවිල පාලක සභාව,519ඩී,ජයන්ති මාවත, පු/ර | පූජාසනයක් සකස් කිරීම | 100,000.00 |
| 03 | මහනගරසභාව | මල්ලිකාරාමය,කුට්ටං පොකුණ, අ/පුර | නවගොඩනැගිල් ලක් ඉදි කිරීම | 100,000.00 |
| 04 | මහනගරසභාව | ශ්‍රීමත් අනගාරික ධර්මපාල බෞද්ධ මධ්‍යස්ථානය බුද්ධගයා මාවත අ/පුර | විහාර මන්දිරය ඉදිරි කටයුතු කිරීම | 100,000.00 |
| 05 | රඹෑව | මුනින්දාරාමය,පරාගොඩ,පරිසන් ගස්වැව,අ/පුර | සංඝාවාස වැඩ නිම කිරීම | 100,000.00 |
| 06 | රඹෑව | ශ්‍රී/බෝධිදක්ෂිණාරාමය,වැලෑව, කැඳෑව,අ/පුර | වහලය සෙවිලි කිරීම සඳහා | 100,000.00 |
| 07 | රඹෑව | සුනන්දාරාමය,පුබුදුගම,අඹගස්වැ ව | ආරාමය සංවර්ධන කටයුතු | 100,000.00 |
| 08 | ම.නු.ප. | මහාමායාදේවි ආරාමය,පොතානගම,අ/පුර | චෛත්‍ය හා විහාර මන්දිරය ඉදිකිරීම | 100,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 09 | ම.නු.ප. | ශ්‍රී අභිනවාරාමය 279/ඒ,තන්තිරිමලේ පාර,ලෝලුගස්වැව,අ/පුර | බුද්ධ මන්දිරය ඉදිකිරීම | 100,000.00 |
| 10 | කැකිරාව | ශ්‍රී/බෝධිරුක්ඛාරාමය,ඇටවීරවැව ,මරදන්කඩවල | විහාර මන්දිරය වැඩ නිම කිරීම | 100,000.00 |
| 11 | කැකිරාව | වෙහෙරයාය පුරාණ රජමහ විහාරය.සෙම්බුකුලිය,කැකිරාව | දාන ශාලාවේ ඉදිකිරීමේ ඉදිරි කටයුතු | 100,000.00 |
| 12 | ගලෙන්බිඳුණුවැව | චේතිය ලෙන ආරණ්‍ය සේනාසනය,පහල දික්වැව | චෛත්‍ය අළුත් වැඩියාව | 100,000.00 |
| 13 | මැදවච්චිය | ශ්‍රී/භාරතීන්ද්‍ර බෞද්ධ මධ්‍යස්ථානය, මැදවච්චිය | භික්ෂු සංඝාවාසය ඉදි කිරීම | 100,000.00 |
| 14 | කහටගස්දිගිලිය | වෙහෙරගල රජමහ විහාරය,ඇල්ලවැව. | වැසිකිළි පද්ධතිය සකස් කිරීම | 100,000.00 |
| **එකතුව** | | | | **1,400,000.00** |

## 2017 පොළොන්නරුව ආගමික සිද්ධස්ථාන සංවර්ධනය සඳහා දායකත්වය

| අ අං | ප්‍රාදේශීය සභාව | ආගමික සිද්ධස්ථානය | කාර්යය | මුදල (රු) |
|---|---|---|---|---|
| 01 | ඇලහැර | අංක 67, කුඹුරේවෙල, අත්තනකඩවල ශ්‍රී මහින්දාරාම විහාරයේ | පිවිසුම් දොරටු ඉදිකිරීම් කටයුතු | 100,000.00 |
| 02 | තමණ්කඩුව | සිත්ති විනයාර් කෝවිල,සුවසෙතගම,ගල්ලැල්ල | පූජකවරුන්ට නැවතීමේ ශාලාවක් ඉදිකිරීම | 100,000.00 |
| 03 | තමණ්කඩුව | උපේක්ෂාරාමය, මා ඔය.බැදිවැව ජයන්තිපුර පොළොන්නරුව | නළ ළිඳක් සවිකර ගැනීම | 100,000.00 |
| 04 | තමණ්කඩුව | ශ්‍රී විදර්ශණාරාමය, සිංහ උදාගම.පොළොන්නරුව | සංවර්ධන කටයුතු | 100,000.00 |
| 05 | තමණ්කඩුව | ශ්‍රී විජයාරාමය, නිශ්ශංකමල්ලපුර,ගල්තඹරාව. පොළොන්නරුව | ධර්මශාලාවේ ඉදිකිරීම් කටයුතු | 100,000.00 |
| 06 | මැදිරිගිරිය | මජිදුල් අහමඩ් ජුම්මා පල්ලිය, අහමඩ්පුර,පල්ලියගොඩනැගිල්ල ,මැදිරිගිරිය | සංවර්ධන කටයුතු | 100,000.00 |
| 07 | දිඹුලාගල | ශ්‍රී සුගතාරාමය, කළුකැලේ,පොළොන්නරුව | චෛත්‍ය ඉදිකිරීම | 100,000.00 |
| 08 | දිඹුලාගල | ශ්‍රී සුදර්ශනාරාමය,සෙවනපිටිය | ධර්මශාලාවේ ඉදිකිරීම් කටයුතු | 100,000.00 |
| 09 | දිඹුලාගල | සිරි සීලාලංකාර බෞද්ධ මධ්‍යස්ථානය.අළුත් වැව,නෙළුම් වැව,සෙවනපිටිය | සංඝාවාසය ඉදිකිරීම | 100,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 10 | දිඹුලාගල | ශ්‍රී ජේතවනාරාමය,7 කණුව, දේවගල | සංවර්ධන කටයුතු | 100,000.00 |
| 11 | වැළිකන්ද | ශ්‍රී සංඝබෝධි විහාරය,බොරවැව, සෙවනපිටිය | සංඝාවාසය ඉදිරි වැඩකිරීම | 100,000.00 |
| 12 | වැළිකන්ද | සිරි මහසෙන් විහාරය,නව මහසෙන් පුර,වැළිකන්ද | චෛත්‍ය ඉදිකිරීමේ කටයුතු | 100,000.00 |
| 13 | වැළිකන්ද | අල් අබ්රාල් ජුම්මා පල්ලිය,කුඩා පොකුණ වැළිකන්ද | සංවර්ධන කටයුතු | 100,000.00 |
| 14 | වැළිකන්ද | ශ්‍රී පැරකුම් විහාරය,දිඹුලාන,පැරකුම් යාය,මහවැලි සිංහපුර,වැළිකන්ද | සංවර්ධන කටයුතු | 100,000.00 |
| 15 | වැළිකන්ද | ශ්‍රී දක්ෂිනගිරි විහාරය,කොලකනවාඩිය,නැ/මහ වැව සෙවනපිටිය වැළිකන්ද | සංවර්ධන කටයුතු | 100,000.00 |
| 16 | හිඟුරක්ගොඩ | ශ්‍රී පුන්‍යවර්ධනාරාමය, යටියන්පොතාන, | දාන ශාලාවේ ඉදිරි සංවර්ධන කටයුතු | 100,000.00 |
| 17 | හිඟුරක්ගොඩ | ශ්‍රී ගුණානන්දාරාමය,තිඹිරිගස්වැව. හබරණ | වාහල්කඩ සහිත ප්‍රාකාරය ඉදිකිරීම | 100,000.00 |
| 18 | හිඟුරක්ගොඩ | මහසෙන් රජමහ විහාරය,රජ ඇළ.මහසෙන් මාවත මින්නේරිය | සංවර්ධන කටයුතු | 100,000.00 |
| 19 | හිඟුරක්ගොඩ | හාර චන්ද්‍ර බෞද්ධ මධ්‍යස්ථානය | සංඝාවාසයක් ඉදි කිරීම | 100,000.00 |
| 20 | හිඟුරක්ගොඩ | වෙහෙරගල රජමහ විහාරය | වැසිකිළි පද්ධතිය සකස් කිරීම | 100,000.00 |
| එකතුව | | | | **2,000.000.00** |

## දැහැමි ගුණ ගරුක සමාජයක් බිහි කිරීම සඳහා දායකත්වය

| අ අං | ප්‍රාදේශීය සභාව | දහම්පාසල | කාර්යය | මුදල (රු) |
|---|---|---|---|---|
| 01 | මහ නගර සභාව | ශ්‍රී භාරතීන්ද්‍ර විහාරය ඩී.එස්.සේනානායක මාවත,111 වන පියවර,අ/පුර | දහම් පාසල් උපකරණ ලබා ගැනීම | 100,000.00 |
| 02 | මහ නගර සභාව | විහාරමහදේවි දහම් පාසල, බණ්ඩාරණායක මාවත,අ/පුර | දහම් පාසල් උපකරණ ගැනීම | 100,000.00 |
| 03 | කහටගස්දිගිලිය | ශ්‍රී/බෝධිරාජ දහම්පාසල,හෙව්වියාව මහපොතාන | දහම්පාසැල් ගොඩනැගිල්ල ඉදිකිරීම | 100,000.00 |

| අ අං | ප්‍රා.සභාව | දහම් පාසල | කාර්යය | මුදල (රු) |
|---|---|---|---|---|
| 04 | කහටගස්දිගිලිය | ශ්‍රී සරණංකර දහම් පාසල,ශ්‍රී විවේකාරාම විහාරස්ථානය, ටික්කම් පොතාන,මහ පොතාන, | වැසිකිළි පහසුකම් සලසා ගැනීම | 100,000.00 |
| 05 | රඹෑව | ශ්‍රී/සිරිසඝබෝ දහම්පාසල,ශ්‍රී/අම්බරුක්ඛාරාම පුරාණ විහාරය,අඹගහවැව,පරසන්ගස්වැව,අ/පුර. | දහම්පාසැල් ගොඩනැගිල්ල ඉදිකිරීමේ ඉදිරි කටයුතු. | 100,000.00 |
| 06 | මැදවච්චිය | දම් සිසිල දහම් පාසල,මෙත්තජී විවේකාශ්‍රමය,කටුවෙල ,මැදවච්චිය. | දහම්පාසැල් පුස්තකාලයක් සාදා ගැනීම | 100,000.00 |
| 07 | නැ.නු.ප | ශ්‍රී /ධර්මරාජ දහම්පාසල,වන්නිතම්මැන්නාව, අනුරාධපුර | දහම්පාසැල් උපකරණ | 100,000.00 |
| 08 | නොච්චියාගම | ශ්‍රී/ඤාණසාර දහම්පාසල,තපෝදනාරාමය, විල්පත්තුපාර,පහලමාරගහ වැව | දහම්පාසැල් උපකරණ | 100,000.00 |
| 09 | නොච්චියාගම | ශ්‍රී/දුටුගැමුණුදහම්පාසල,හල්මිල්ලගල, නොච්චියාගම | දහම්පාසැල් උපකරණ | 100,000.00 |
| 10 | නොච්චියාගම | සිරි ගුණරත්න දහම් පාසල,කුඩාවැව,අඹගහවැව, | දහම්පාසැල් උපකරණ | 100,000.00 |
| 11 | කැකිරාව | ධීරාණන්ද දහම්පාසල,නීකිණියාව පුරාණ රජමහ විහාරය,කැකිරාව | වැසිකිළි පහසුකම් | 100,000.00 |
| 12 | කැකිරාව | ශ්‍රී ඤාණරත්න දහම් පාසල ශ්‍රී බෝධිමළු විහාරය,මහ කැකිරාව,කැකිරාව | වැසිකිළි පහසුකම් | 100,000.00 |
| 13 | කැකිරාව | ශ්‍රී බෝධිරුක්ඛාරාමය,තිබ්බටුවැව, කැකිරාව. ( අනෝමදස්සි දහම් පාසල) | දහම්පාසැල් ගොඩනැගිල්ල ඉදිකිරීමේ ඉදිරි කටයුතු. | 100,000.00 |
| 14 | පලාගල | ශ්‍රී රේවත දහම් පාසල, නානිග්ගල රජමහ විහාරය.පලාගල | වැසිකිළි පහසුකම් හා ඩෙස් බංකු | 100.000.00 |
| 15 | පලාගල | ශ්‍රී විශාකා දහම් පාසල, දෙහිප්පාව රජමහ විහාරය,ද/හල්මිලවැව.කැකිරාව | ජල පහසුකම් ලබා ගැනීම | 100.000.00 |
| 16 | ගලෙන්බිඳුණුවැව | ශ්‍රී දම්මදින්න දහම් පාසල, ශ්‍රී බෝධිමළු විහාරය.තෝඩාමඩුව,සිවලාකුලම. | දහම්පාසැල් ගොඩනැගිල්ල ඉදිකිරීමේ ඉදිරි කටයුතු | 100,000.00 |
| 17 | ම.නු.ප. | ශ්‍රී බෝධිරුක්ඛාරාමය,මිහින්තලේ පාර,පුල්ලයාර් හංදිය, අනුරාධපුර ( ගැමුණු දහම් පාසල) | දහම්පාසැල් උපකරණ | 100,000.00 |

දැහැමි ගුණ ගරුක සමාජයක් බිහි කිරිම සඳහා දායකත්වය ඉතිරි කොටස...

| අ අං | ප්‍රා.සභාව | දහම් පාසල | කාර්යය | මුදල (රු) |
|---|---|---|---|---|
| 18 | කැබිතිගොල්ලෑව | ශ්‍රී සිද්ධාර්ථ දහම් පාසල,කණුගහවැව, බෝගහ වැව II, කැබිතිගොල්ලෑව | ජල වැංකියක් තනා ගැනීම | 100,000.00 |
| 19 | කැබිතිගොල්ලෑව | විහාරමහදේවි දහම් පාසල, අයියතිගේ වැව,කැබිතිගොල්ලෑව | දහම් පාසල සඳහා ඩෙස් බංකු සාදාගැනීම | 100,000.00 |
| 20 | කැබිතිගොල්ලෑව | ශ්‍රී/රාහුල දහම්පාසල, ශ්‍රී සංඝමිත්තාරාමය, කුඩා බෙල්ලන්කඩවල,පදවි පාර | වැසිකිළි පහසුකම් | 100,000.00 |
| 21 | කැබිතිගොල්ලෑව | ශ්‍රී ධර්මපාල දහම් පාසල, ශ්‍රී ධර්මවර්ධනාරාමය | දහම් පාසල් ගොඩනැගිල්ලේ ඉදිරි කටයුතු | 100,000.00 |
| 22 | කහටගස්දිගිලිය | රුවන්ගිරි රජමහ විහාරය,කොක්මඩුව | දහම් පාසල් ගොඩනැගිල්ලේ ඉදිරි කටයුතු | 100,000.00 |
| **එකතුව** | | | | **2,200,000.00** |

## මෙහෙයුම් සමාලෝචනය හා සංවර්ධනය පිළිබඳ කාර්ය සාධනය

සමස්තයක් වශයෙන් ගත්කල මෙම වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන් සාර්ථක ලෙස නිම කිරීමට දෙපාර්තමේන්තුවට හැකි විය. ආගමික කටයුතු ව්‍යාපෘතියෙහි ආගමික සිද්ධස්ථාන සඳහා වෙන් කර තිබූ රු.මි. 2.4 ක මුදලක් සහ දහම් පාසල් සංවර්ධන ව්‍යාපෘතියේ වෙන් කර තිබූ රු. මි. 7.75ක මුදලක් මෙම වර්ෂයේදී ලබා දීමට නොහැකි විය. අනෙකුත් සියළුම ව්‍යාපෘති දෙපාර්තමේන්තුව සාර්ථක ලෙස නිම කර ඇත.

2017 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ අරමුණු කරා ළඟා වීම සඳහා පහත සඳහන් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක විය.

### 01. ප්‍රාදේශීය සංස්කෘතික උළෙල

ප්‍රාදේශීය වශයෙන් හුදකලාව සිටින කලාකරුවන් හඳුනා ගනිමින් ඔවුන්ගේ හැකියාවන් ජාතික තලය වෙත රැගෙන ඒමේ මූලික පියවර වන්නේ මෙම වැඩසටහනයි. පළාතේ පළාත් පාලන ආයතන 26 හා සම්බන්ධ වෙමින් ප්‍රාදේශීය වශයෙන් තරඟ පවත්වා පළාත් පාලන ආයතන 26ක් තුළ මෙවර ප්‍රාදේශීය කලා උළෙල පැවැත්වීමට නියමිතව තිබිණි. එහෙත් ඇළහැර ප්‍රාදේශීය සභාව තරග නොපැවැත්වීම නිසා, රු.200,000.00 ප්‍රතිපාදන මුදල දෙපාර්තමේන්තුව වෙත නැවත ලැබිණි.

## 02. පළාත් කලා උළෙල

28 වන උතුරු මැද කලා උළෙල මෙවර ද ඉතා උත්කර්ෂවත් අයුරින් පැවැත්වීමට හැකිවිය. උතුරු මැද කලාකරුවන් ජාතික තලය වෙත දායාද කිරීමේ මූලික පියවර වන්නේ පළාත් කලා උළෙලයි. මෙහි දී පළාතේ කලා ශිල්පීන් එකම වේදිකාවක් මතට එක් කිරීම සුවිශේෂී කාර්යයක් විය.මෙහිදී ප්‍රාදේශීය කලා උළෙලේ ජයග්‍රාහී තරගකරුවන්ගේ සහභාගීත්වයෙන් උතුරු මැද කලා උළෙලේ තරග පැවැත්වේ. එනම් චිත්‍ර, නැටුම්, සංගීත, සාහිත්‍ය, කෙටි චිත්‍රපටි, නාට්‍ය, ඡායාරූප,නිවේදන ආදී විවිධ ක්ෂේත්‍ර ඔස්සේ මෙම තරග පැවැත්වේ.

2016 වර්ෂයේ උතුරු මැද කලා උළෙල සඳහා රු.මි.4.00 ක මුදලක් වෙන්කර තිබිණි. 2017 වර්ෂයේ රු.මි 5.00 ප්‍රතිපාදන මුදලක් කලා උළෙල සඳහා වෙන් විය. ඒ අනුව 2017 වර්ෂයේ 28 වන උතුරු මැද කලා උළෙල අනුරාධපුර මධ්‍ය විද්‍යාලයේදී දින දෙනක් පුරා උත්කර්ෂවත්ව පැවැත්විය.

## 03. සුභාෂණ සගරාව

උතුරු මැද පළාත තුළ විසිරී සිටින ලේඛකයන්ගේ ලේඛණ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා සහ උසස් නිර්මාණයක් පාඨකයාට ඉදිරිපත් කිරීමේ අරමුණින් සුභාෂණ සංස්කෘතික සඟරාව පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව මගින් මුද්‍රණය කර නොමිලේ පාඨකයා වෙත බෙදා හැරීම සිදු කරයි. 2016 වර්ෂය දක්වාම වසරකට කලාප දෙකක් මුද්‍රණය කළ සුභෂණ සඟරාව 2017 වසරේ රු.මි 0.15 ක මුදලක් පමණක් වෙන් වී තිබීම නිසා එක් කලාපයකින් සගරා 525 ක් මුද්‍රණය විය.

## 04. කලා ප්‍රසංග පැවැත්වීම

උතුරු මැද පළාත් සභාව යටතේ සුරපුර එළිමහන් රංගපීඨය තුළ හෝ පළාතේ තෝරාගත් සුදුසු ස්ථානයක නාට්‍ය දර්ශනයක් හෝ නර්තන, සංගීත ප්‍රසංගයක් නොමිලේ ප්‍රදර්ශනය කිරීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදු විය. මෙහිදී නව පාසල් විෂය නිර්දේශයේ ඇතුළත් නාට්‍ය පාසල් ළමුන්ට ප්‍රදර්ශණය කෙරුණි. මේ සඳහා උතුරු මැද පළාතේ දුෂ්කර ප්‍රදේශවල පාසල් ළමුන් ඉලක්ක කෙරුණි.

මේ යටතේ පහත සඳහන් පාසල්වලදී වේදිකා නාට්‍ය ප්‍රදර්ශණය කෙරුණි.

- ජයලත් මනෝරත්න ශූරීන්ගේ ගුරු තරුව වේදිකා නාට්‍ය - කැබිතිගොල්ලෑව මහා විද්‍යාලයේදී
- සෝමලතා සුබසිංහ මැතිණියගේ විකෘති වේදිකා නාට්‍ය - කැකිරාව මධ්‍ය විද්‍යාලයේදී
- රොඩ්නි වර්ණකුල ශූරීන්ගේ සිව් රඟ ශී - මැදවච්චිය සංගිලිකනදරාව විද්‍යාලයේදී

## 05. ආගමික කටයුතු

### i. ඓතිහාසික දළදා පෙරහැර

අතීතයේ සිට ලාංකික ශ්‍රී විභූතිය පෙන්නුම් කරන ඓතිහාසික දළදා පෙරහැර මෙවරද පැවැත්විණි. එහි සංස්කෘතික අංග ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය නර්තන ශිල්පීන් සම්බන්ධ කරමින් දළදා පෙරහැරේ කටයුතු සාර්ථක කර ගැනීමට අවශ්‍ය කටයුතු මෙම දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලැබෙයි.

### ii. පෝ දින වැඩසටහන

අනුරාධපුර මහා විහාරය (උඩමළුව) මසක් පාසා පොහොය දින වැඩ සටහන ක්‍රියාත්මක කිරිමට මුදලින් දායකත්වය සැපයීම මෙහිදී සිදු කෙරිණි.

### iii. අනුරාධපුර පොළොන්නරුව පෙරහැර අවස්ථාවන් සඳහා අනුග්‍රහය දැක්වීම

උතුරු මැද පළාතේ පවත්වන අනෙකුත් පෙරහැර සඳහා දායකත්වය සැපයීම මෙහිදී සිදු කෙරුණි.

### iv. අනුග්‍රාහකත්වය ලබාදෙන වෙනත් ආගමික උත්සව

උතුරු මැද පළාත තුළ ඉපැරණි සම්ප්‍රදායන් හා බැදුණු විශේෂ ආගමික උත්සව රාශියක් පවතී. එම උත්සව සහ අක්ත්‍ර පත්‍ර පිළිගැන්වීම, සෙත් පිරිත් සජ්ඣායනා,අදාහන පූජෝත්සව සඳහා ද අනුග්‍රහය ලබා දීම මේ යටතේ සිදු කෙරුණි.

### v. ආගමික සිද්ධස්ථාන සංවර්ධනය

විවිධ ආර්ථික දුෂ්කරතා මැද පවත්වාගෙන යන ආගමික සිද්ධස්ථාන සඳහා ආධාර ලබා දීම මේ යටතේ සිදු විය.

## 06. නැටුම් හා ගායන හැකියා වර්ධනය

### i. පළාත් රාජ්‍ය නර්තන කණ්ඩායම

උතුරු මැද පළාතේ නර්තන හැකියාවන්ගෙන් යුත් ආධුනික ශිල්පීන් එක්රැස් කරමින් පුහුණු දීමනාවක් සහිතව පුහුණුවීම් ලබා දෙමින් ඔවුනගේ හැකියාවන් පළාත තුළ (රාජ්‍ය උත්සව වෙනත් උත්සව සඳහා දායකත්වය සපයමින්) මෙන්ම ජාතික හා ජාත්‍යන්තර තලය වෙත රැගෙන යාමත්, සාම්ප්‍රදායික කලාවන් අනාගත පරපුර වෙත දායාද කිරීමත් මෙයින් සිදු වේ. 2017 වර්ෂයේ මූලධන වියදම් යටතේ වෙන් කර තිබූ රු.මි. 0.5 මුදලින් නර්තන කණ්ඩායම සඳහා අවශ්‍ය භාණ්ඩ හා ඇඳුම් මිලදී ගැනීම සිදු විය.

### ii. පළාත් රාජ්‍ය සංගීත කණ්ඩායම

පළාතේ ගායන හා වාදන හැකියාවන් ඇති ආධුනික ශිල්පීන් 15 දෙනෙකුගෙන් යුත් මෙම කණ්ඩායම පුහුණුවීම්වල නිරත වේ. සුභාවිත සංගීතය මෙන්ම ශාස්ත්‍රීය සංගීතය පිළිබඳ අවබෝධය ද මෙයින් ලබා දෙනු ඇත. පළාතේ සුවිශේෂී ප්‍රසංගයන් සඳහා මෙම කණ්ඩායමේ දායකත්වය ලබා දෙනු ඇත.

2017 වර්ෂයේ මූලධන වියදම් යටතේ වෙන් කර තිබූ රු.මි. 0.5 මුදලින් සංගීත කණ්ඩායම සඳහා අවශ්‍ය භාණ්ඩ හා ඇඳුම් මිලදී ගැනීම සිදු විය.

### iii. සංගීත ප්‍රසංග පැවැත්වීම.

මෙම ව්‍යාපෘතිය මඟින් සුරපුර එළිමහන් රංග පියයේදී රොඩ්නි වර්ණකුල ගුරීන්ගේ ගී රඟ සොහා වැඩ සටහන වේදිකා ගත කෙරුණි. මේ සඳහා විශාල ප්‍රේක්ෂක පිරිසක් සහභාගී විය. දිවයිනේ ප්‍රවීණ වේදිකා නාට්‍ය ශිල්පින් රැසක් සහභාගී වූ අතර මෙහිදී පැරණි නාට්‍ය ගීත ප්‍රේක්ෂකයාට රස විදීමට අවස්ථාව හිමිවිය.

## 07. දහම් පාසල් සංවර්ධනය

දැහැමි ගුණ ගරුක සමාජයක් බිහි කිරීමේ අරමුණින් යුතුව, උතුරු මැද පළාත තුල විසිරී පවතින දහම්පාසල් වල භෞතික අවශ්‍යතා සම්පූර්ණ කිරීම මේ යටතේ සිදු විය. දහම් පාසල් වල භෞතික අවශ්‍යතා සම්පූර්ණ වීම මඟින් දහම් අධ්‍යාපණය වෙත සිසුන් වැඩි වැඩියෙන් යොමු කිරීමට අපේක්ෂිතය.

## 08. පුහුණු වැඩමුළු පැවැත්වීම

උතුරු මැද කලා උළෙලට සමගාමීව පළාතේ කලායතන හා සියළුම කලාකරුවන්ගේ දැනුම අවබෝධය වර්ධනය කිරිම අරමුණු කරගනිමින් කලා ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් හා විශ්ව විද්‍යාල අචාර්යවරුන් සම්බන්ධ කර ගනිමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම් හා මුසු වූ වැඩමුළු පැවැත්වීම මෙහිදී සිදු කෙරේ. 2017 වර්ෂයේ මේ සඳහා රු.මි 1.00 ක ප්‍රතිපාදන මුදලක් දෙපාර්තමේන්තුව වෙත ලැබිණි. මෙහිදී තෙදින කෙටි චිත්‍රපටි වැඩමුළුවක් සහ තෙදින නර්තන වැඩමුළුවක් පැවැත්විය. මේ සඳහා කලාකරුවන් 200 කට ආසන්න පිරිසක් සහභාගී විය.

## ගොඩනැගිලි හා ඉදි කිරීම්

මෙහිදී දෙපාර්තමේන්තුවේ ධාරිතා සංවර්ධනය ප්‍රධාන අරමුණු කර ගනිමින් දෙපාර්තමේන්තුවට අවශ්‍ය පරිගණක, කාර්යාල පුටු, විදුලි පංකා, ඡායා පිටපත් යන්ත්‍රය, තණකොල කපන යන්ත්‍රය මිලදී ගැනීම සිදු විය. එසේම 2017 වර්ෂයේ සංස්කෘතික දෙපාර්තමේන්තුවේ කාර්යාල පරිශ්‍රය සුරපුර එළිමහන් රංගභූමි පරිශ්‍රය වෙත රැගෙන යාමට නියමිත බැවින් එහි ගරාජයක් ඉදි කිරීම හා නඩත්තු කටයුතු සිදු කිරීම මේ යටතේ සිදු විය.

## කාර්ය සාධනය කරා ළඟා වීමේදී මුහුණ දුන් ගැටළු

කාර්ය සාධනය ළඟා කර ගැනීමේ දී මුහුණු දෙන ප්‍රධාන ගැටළුව වන්නේ නිලධාරීන් ප්‍රමාණවත් නොවීම. 2013 වර්ෂයේ සිට දෙපාර්තමේන්තුවක් වශයෙන් ස්ථාපිත වූ පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුවේ ගිණුම් හා ආයතන කටයුතු සඳහා කළමනාකරණ සහකාරවරු තිදෙනෙක් පමණක් සේවයේ නිරතවේ. ඔවුන් තිදෙනා මෙම කාර්යන් සඳහා ප්‍රමාණවත් නොවන නිසා සංවර්ධන නිලධාරීන්ද ආයතන හා ගිණුම් කටයුතු වල නිරතවී සිටියි.

එසේම ප්‍රමාණවත් නිලධාරින් පිරිසක් නොසිටීම හා සංවර්ධන නිලධාරීන් ආයතන කටයුතු වල යෙදීම නිසා එක් නිලධාරියෙකුට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක් පමණ ආවරණය කිරිමට සිදු වී ඇත. එම නිසා ක්ෂේත්‍ර රාජකාරි නිසියාකාරව ඉටු කර ගැනීමට නොහැකි වී ඇත.

මෙයට හේතුව වී ඇත්තේ කලින් ඒකකයක් ලෙස සැලකුව ද පසුව දෙපාර්තමේන්තුවක් ලෙස ස්ථාපිත වූ පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව , දෙපාර්තමේන්තු රාජකාරි සියල්ල ඉටු කළ ද දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය හෝ ඒ හා සමාන සම්පත් අනුමත වී නොතිබීමයි.

# සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය

6.4

### දැක්ම

"1990 අංක 11 දරණ ප්‍රඥප්තියෙන් ලැබී ඇති විධි විධාන අනුව ස්ථාපිතකර ඇති මෙම ආයතනය මගින් පළාතේ කෘෂිකාර්මික, වාරි මාර්ග හා මහා මාර්ග ඉදි කිරීම්, ගොඩනැගිලි නඩත්තු කටයුතු වාහන හා යන්ත්‍ර සුත්‍ර නඩත්තුව, අලුත්වැඩියා කටයුතු වාහන සේවා කිරීම් කටයුතු හා සියළුම මුද්‍රණ කටයුතු මනා ගුණාත්මක භාවයෙන් යුතුව කාර්යක්ෂම ලෙස අඩු පිරිවැයකින් සපයා දීමෙන් උතුරු මැද පළාත් සභාවේ ඉලක්කගත සැලසුම්වලට සහාය දීම".

### මෙහෙවර

"උතුරු මැද පළාතේ වාරි මාර්ග ඉදි කිරීම් සඳහා යන්ත්‍ර/වාහන සැපයීම් යන්ත්‍ර හා වාහන අළුත්වැඩියාවන් හා වාහන සේවා සැපයීම, රාජ්‍ය හා පුද්ගලික අංශයන්හී සියලුම මුද්‍රණ කටයුතු කලට වේලාවට කාර්යක්ෂමව ඉටුකර දීම හා වෙනත් ව්‍යාපෘති කටයුතුවලට දායක වීමෙන් පළාතේ ජනතාවගේ ආර්ථික වෘත්තීය සඳහා දායක වීම".

### දිගුකාලීන අරමුණු හා කෙටිකාලීන අරමුණු

### දිගුකාලීන අරමුණු

- උතුරු මැද පළාත් සභාවට අරමුදල් සපයන මුලාශ්‍රයක් බවට පත් වීම සඳහා කටයුතු කිරීම.
- පළාත් සභාවට බහුවිධ සේවාවන් සපයන ආයතනයක් බවට පත් කිරීමේ අරමුණින් මුද්‍රණ, යාන්ත්‍රික හා සේවා අංශයන්ගෙන් ලබා දෙන සේවාවන් පුළුල් කිරීම තුළින් උතුරු මැද පළාත තුළ ප්‍රමුඛතම සේවා සපයන ආයතනයට පත්වීම හා ඒ තුළින් ආදායම් තත්වය ඉහළ නංවා ගැනීම.
- විවිධ අංශ කෙරෙහි වෙන් වෙන් වශයෙන් වු පරිපූර්ණ දැනුම හා කුසලතාවයෙන් උසස් මානව සම්පතක් බිහි කිරීම තුළින් පළාතේ හදිසි ඕනෑම අවශ්‍යතාවයකදී දායක වීමට හැකිවන අයුරින් කටයුතු කිරීම.
- නවීන තාක්ෂණය හා කාර්යක්ෂමතාවයකින් ඉහළ යන්ත්‍ර සුත්‍ර හා උපකරණ සහිත ආයතනයක් බවට පත්වීම තුළින් පළාත් සංවර්ධනයට දායක වීම.
- රජය විසින් ක්‍රියාත්මක කරන ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාවට නැංවීම සඳහා එමගින් රජය විසින් අපේක්ෂා කරන අරමුණු ළඟා කිරීම සඳහා සක්‍රියව දායකවන ආයතනයක් බවට පත් වීම.

### කෙටිකාලීන අරමුණු

- යාන්ත්‍රික, මුද්‍රණ හා සේවා අංශයන් සංවර්ධනය කිරීම සඳහා නව යන්ත්‍ර සුත්‍ර උපකරණ මිලට ගැනීම.

❖ සියළුම ඉදි කිරීම් හා වෙනත් යාන්ත්‍රික කටයුතු නිසි ප්‍රමිතියට හා කලට වේලාවට සිදු කර ගැනීම.
❖ පෞද්ගලික අංශය හා තරඟ කිරීමට හැකිවන පරිදි මුද්‍රණ අංශය සංවර්ධනය කිරීම.
❖ යන්ත්‍ර වාහන කුලී පදනම මත ලබා දීම තුළින් ආදායම් තත්වය වර්ධනය කර ගැනීම සඳහා කටයුතු කිරීම.
❖ වාහන සේවා අංශ මගින් අවම මිලට කඩිනම් සේවය.

## ප්‍රධාන කාර්යයන්


❖ රාජ්‍ය හා පෞද්ගලික අංශයන්හි මුද්‍රණ කටයුතු සිදු කිරීම.
❖ වාහන අළුත්වැඩියා හා සේවා කටයුතු.
❖ ටයර් සේවා කටයුතු සිදු කිරීම.
❖ උතුරු මැද පළාත තුළ විශේෂ ව්‍යාපෘති සඳහා දායක වීම.
❖ යන්ත්‍ර කුලී පදනම මත ලබා දීම.
❖ පළාත් සභාව හා අනුයුක්ත රාජ්‍ය ආයතනයන්ට ආරක්ෂක සේවා හා සනීපාරක්ෂක සේවා සැපයීම.
❖ ආපදා කටයුතුවලදී ජංගම සේවාවන් පැවැත්වීම.
❖ ප්‍රායෝගික පුහුණු හා උපදේශන කටයුතු සපයමින් සම්පත්දායකයෙකු ලෙස කටයුතු කිරීම.

## ප්‍රධාන උපාය මාර්ගයන්

❖ මුද්‍රණ අංශය මගින් කරනු ලබන සියළුම මුද්‍රණ කටයුතු සඳහා නිසි ප්‍රමිතියට අනුව නියමිත වේලාවට ලබා දීම සඳහා නවීන යන්ත්‍ර සූත්‍ර උපයෝගි කර ගැනීම.
❖ යන්ත්‍ර/වාහන කුලියට දීමෙන් ලැබෙන ආදායම් වැඩිකර ගැනීම සඳහා වැඩි වශයෙන් රාජ්‍ය හා පුද්ගලික අංශයන් වෙත යන්ත්‍ර/වාහන සැපයීම අරමුණකි.
❖ වාහන සේවා අංශය මගින් අවම මිලට කඩිනමින් සේවාවන් ලබා දීම.
❖ ආයතනයේ පළපුරුදු කාර්යක්ෂම කාර්මිකයින් ලවා වාහන අළුත්වැඩියා කිරීම සඳහා නවීන යන්ත්‍ර සූත්‍ර ලබා ගැනීම.
❖ සියළුම ඉදි කිරීම් හා වෙනත් ව්‍යාපෘති කටයුතු නිසි ප්‍රමිතියට අනුව කලට වේලාවට සිදුකර ගැනීම.
❖ ඉහත ප්‍රධාන කාර්යයන් වලට අදාලව දෙපාර්තමේන්තු හා රාජ්‍ය ආයතනවල අනුග්‍රහය ලබා ගැනීම සඳහා ප්‍රධාන අමාත්‍යාංශයේ සහාය ලබා ගැනීම.

## කාර්ය මණ්ඩල සංයුතිය

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 58 |
| 2 | සේවයේ නියුතු | 54 |
| 3 | පුරප්පාඩු | 04 |
| 4 | අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් | 14 |



මෙහෙයුම් ප්‍රතිඵල - පුනරාවර්තන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2017 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| 1. පුද්ගල පඩිනඩි | 30.60 | 27.20 | 3.40 | 88.88 |
| **එකතුව** | **30.60** | **27.20** | **3.40** | **88.88** |

මූලධන වියදම්


| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2017 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදි කිරීම් | 6.50 | 6.50 | - | 100 |
| **එකතුව** | 6.50 | 6.50 | - | 100 |

ආදායම් ඉපයීම

| ශීර්ෂය | ඉලක්කය (රු.මි) | සත්‍ය ආදායම (රු.මි) | එකතු කිරීමේ ප්‍රගතිය (%) |
|---|---|---|---|
| මුද්‍රණාල ආදායම | 75.00 | 70.15 | 93 |
| වාහන අළුත්වැඩියාව | 4.00 | 3.82 | 95 |
| ටයර් සේවා | 2.00 | 1.87 | 90 |
| යන්ත්‍ර කුලිය | 5.00 | 4.74 | 94 |
| ආරක්ෂක සේවය | 16.00 | 15.69 | 93.75 |
| **එකතුව** | **102.00** | **96.27** | **465.75** |

සංවර්ධන වැඩ පිළිබඳ කාර්ය සාධනය - පසුගිය වසර 03ක ප්‍රාග්ධන වැය වීම් (වියදම්)

| වර්ෂය | PSDG | මුළු වියදම (රු.මි) |
|---|---|---|
| 2015 | - | - |
| 2016 | 20.00 | 20.00 |
| 2017 | 6.50 | 6.50 |



## දිගුකාලීන හා කෙටිකාලීන අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ප්‍රධාන කාර්යයන් හා සම්බන්ධ ව්‍යාපෘති ප්‍රගතිය.

| ආයතනය | මුද්‍රණය කළ පුවත්පත | වාර්ෂික ආදායම (රු.මි) | වියදම (රු.මි) | දළ ලාභය (රු.මි) | විස්තරය |
|---|---|---|---|---|---|
| පූර්ව ළමාවිය සංවර්ධන අධිකාරිය | ටික්කි ටිකිරි පුවත්පත | 8.19 | 6.56 | 1.63 | පළාතේ පෙර පාසල් ළමුන්ගේ අධ්‍යාපන මට්ටම ඉහළ නැංවීම |
| පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | මධ්‍ය වාර පරීක්ෂණ ප්‍රශ්න පත්‍ර | 19.05 | 8.29 | 10.76 | මුද්‍රණාලයේ ඉහළම ආදායම් ලබන ව්‍යාපෘතිය මෙය වේ. |
| | අවසාන වාර පරීක්ෂණ ප්‍රශ්න පත්‍ර | 19.44 | 8.23 | 11.21 | |
| රජරට විශ්ව විද්‍යාලය | සහතික පත්‍ර | | 0.30 | | |
| පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | විද්‍යා ප්‍රායෝගික අත්පොත් | | 0.91 | | |
| | ඇසල මල් පොත් | | 1.53 | | |
| | ප්‍රතිශෝධන ප්‍රශ්න පත්‍ර | | 0.39 | | |
| | මියැසි රඟ රූ සමරූ කලාප | | 0.74 | | |
| | දිනපොත් හා දින දර්ශන | | 1.50 | | |

වර්ෂ 2016 හා සැසඳිමේදී වර්ෂ 2017 වඩාත් කාර්ය බහුල හා සාර්ථක වර්ෂයක් බවට පත් විය. ආයතනයේ අපේක්ෂිත අරමුණු හා ඉලක්ක ළඟා කර ගැනිමේ කාර්යයේදී 2017 වර්ෂයේ දායකත්වය ඉතා ඉහළ මට්ටමක පවතී.

උතුරු මැද පළාතේ පළාත් රාජ්‍ය ආයතන ආවරණය වන පරිදි ආරක්ෂක ඒකකයක් ඇති කිරීම ඒ අතරින් ප්‍රධාන කරුණක් විය. එහිදි රැකියා විරහිත තරුණ තරුණියන් 100කට පමණ නව රැකියා අවස්ථා ජනිත කිරීමට හැකි විය.එය රජය විසින් ක්‍රියාත්මක කරගෙන යනු ලබන රැකියා උත්පාදන වැඩසටහනට දායක වීමේ අවස්ථාවක් ලෙස හැදින්විය හැකිය.

2017 වර්ෂයේ සේවා අංශයේ කටයුතු ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ටොයොටා ලංකා සමාගම සමග ගිවිසුමකට එළඹීමේ මුලික අදියරේ සාකච්ඡා ආරම්භ කිරීමට හැකි විය. එය සේවා අංශයේ කටයුතු වර්ධනයට විශාල පිටුවහලක් විය.

යාන්ත්‍රික අංශය හා මුද්‍රණ අංශයේ කටයුතු නව මුහුණුවරකින් ඉදිරියට ක්‍රියාත්මක කිරීමේ හැකියාවක් ලැබිණි. වර්ෂ 2016 හා 2017 කාල වකවානුවේදී රු.මි.11.4ක පමණ මුදලක් මෙම අංශ සඳහා ආයෝජනය කරන ලදී. එය මෑත ඉතිහාසයේ මෙම ආයතනය සිදු කළ ඉහළම ආයෝජන වියදම විය. මුද්‍රණ අංශ සඳහා නව උපකරණ රාශියක් මිලදී ගත් අතර යාන්ත්‍රික අංශය වෙත ද උපකරණ රාශියක් මිලදී ගන්නා ලදී.

නව පරිපාලන ගොඩනැගිල්ලේ දෙවන අදියරේ ඉදි කිරීම් කටයුතු ද ක්‍රියාත්මක වෙමින් පවතී. වර්ෂ 2016දි ආයතනයේ මුල්‍ය සමාලෝචනය අනුව 2017දී 10%-15% අතර මුල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයක් අපේක්‍ෂා කරන අතර ආයතනයේ සියළුම සේවක මහත්ම මහත්මීන් සක්‍රිය දායකත්වය සපයා තිබුණි.

### කාර්ය සාධනය කරා ළඟා වීමේදී මුහුණ දුන් ගැටළු

- සමස්ත කාර්ය සාධනය පිළිබඳ අදහස් දැක්වීමේදී අප ආයතනයන් සපයන විවිධ වූ සේවාවන් නිසි වේලාවට එකඟ වූ පරිදි නිම කරදීමේදී ගැටළුකාරී තත්වයක් පැන නැගුණි. ඒ සඳහා මූලික සැලසුම් කටයුතු නොකිරීම ලෙස සඳහන් කළ හැකිය. මිලදී ගැනීමේ ක්‍රියාවලියේදී නිසි කාලයට අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා ගැනීමේ අපහසුව වර්ෂය පුරා දැඩිව තිබූ ගැටළුවකි.
- ආදායම් උත්පාදන කාර්යයේදී පෞද්ගලික අංශය මෙන් නවෝත්පාදනය, නව තාක්ෂණය භාවිතය හා යාවත්කාලීන විම, නව තරඟකාරීත්වයට සාර්ථකව මුහුණ දීමේ ක්‍රමවේදයන් සකස් කිරීම යනාදිය කාලීනව සිදු කළ යුතුව ඇත. නමුත් එවැනි තත්වයකට අප ආයතනය හැඩ ගැසී නොමැති අතර සාම්ප්‍රදායික ක්‍රමවේදයන්හී එළඹ සිටීමේ ප්‍රතිඵලයක් ලෙස දිගු කාලයක් එකම ස්ථානයක රැඳී සිටීමට සිදුව ඇත. එය ප්‍රශස්ත කාර්ය සාධනය කෙරෙහි බලපා ඇත.
- පෙර පැවති පාලන අධිකාරීන්ගේ දුර්වල පරිපාලන තීරණ හා අකාර්යක්ෂමතා හේතුවෙන් වූ ගැටළුකාරී තත්වයන් (නඩු කටයුතු/බැඳීම් නිදහස් කිරීම) මෙවන විට සමථයකට පත් කරමින් සිටින අතර විශාල මුදලක් බැඳීම් නිදහස් කිරීම සඳහා ගෙවා ඇත. එමගින් ආයෝජනයට අවශ්‍ය අරමුදලක් සීමිත වී ඇති අතර එය අපේක්ෂිත අරමුණු ඉටුකර ගෙන යාමේදී ගැටළුකාරී තත්වයකට පත්ව ඇත.

මෙය හිස්ව තබන ලද පිටුවකි.

# මුල් ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරිය 6.5

## මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳව සැකෙවින්

ළමා අවධිය,මානව සම්පත පසු කරනු ලබන සොඳුරුතම සන්ධිස්ථානයයි. ඒ සොඳුරු කඩයිම පසු කරන කිසිවෙකුත් එම කඩයිම නිදහසේ භුක්ති වින්දේද /භුක්ති විඳින්නට ඉඩ සලසා දෙන්නේ ද යන්න මහත් ගැටළුවකි.

ළමා පරපුරට, වර්තමානය වනවිට අතීතයට වඩා සංකීර්ණ වුත්, හුදකලා වුත්, ජීවිතයක් ගත කිරීමට සිදු වී තිබේ. මීට දශක 5කට පෙර දෙමාපිය වැඩිහිටි ආදරය, කරුණාව, පිළිගැනීම සුරක්ෂිතතාව, ඇගයීම, ප්‍රශංසාව ඇතිව තම නිවසේ හා අවට පරිසරයේ වැඩෙමින් සුන්දර ජීවිතයක් ගත කළ දරුවාගේ සමස්ත සංවර්ධනය සඳහා සුවදායි පරිසරයක් ගොඩනැගුණේ නිතැතිනි.

වැඩිහිටි ජීවන රටාව අවිවේකි වන වර්තමානයේදී දරුවා තම සියළු අයිතිවාසිකම් අහිමි වූ හුදකලාවේ අවධිය වන අ.වු 03-05 කාලයේදී හුදකලා පවුල් පරිසරයෙන් මිදි පෙර පාසල වෙත පිවිස, සම වයස් කණ්ඩායම් සමග සමාජානුයෝජනය වී තම ජීවිතයට අලුත් අත්දැකීම් එක්කර ගනි. මෙම ජීවන රටාවට අවතීර්ණවත්ම දරුවා පෙර පාසල් ගුරුවරිය සමග සමීප වී දරුවා සොයන ආදරය, කරුණාව, පිළිගැනීම, ප්‍රශංසාව ඇයගෙන් ලබා ගැනීමට උනන්දු වේ.

පාසල් පද්ධතිය ගොඩනැගීම සඳහා මේවන විට උතුරු මැද පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය දරුවාගේ කායික හා මානසික ක්‍රියාකාරීත්වය වර්ධනය සඳහා පෙර පාසල් ගුරුවරුන්ගේ ආකල්ප හා ධාරිතා සංවර්ධනය සඳහාත්, දෙමාපිය ආකල්ප වැඩි දියුණු කිරීම සඳහාත් දරුවාගේ ඉගෙනුම් ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට භෞතික සම්පත් සංවර්ධනය සඳහාත්, මේවන විට ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ 13 වන සංශෝධනය 09 වැනි උපලේඛනයේ 01 වන ලැයිස්තුවේ 03 වන වගන්තිය ප්‍රකාරව පළාත් සභාවට බලතල පැවරීමේ විධිවිධාන වලට අනුකූලව උතුරු මැද පළාත තුළ විධිමත් හා යහපත් මුල් ළමාවිය අධ්‍යාපන සංවර්ධනය කිරීම පිණිස පෙර පාසල් පිහිටුවීම හා අනුසාංගික කාරණා සඳහා විධිවිධාන සැලසීම පිණිස ප්‍රඥප්තියක් පිහිටුවා ඇත. එය අංක 04 දරණ උතුරු මැද පළාත් මුල් ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරිය යනුවෙන් හඳුන්වන ලදී.

එය උතුරු මැද පළාත් සභාව විසින් සම්මත කර 2004 පෙබරවාරි මස19 වන දින උතුරු මැද පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇත. ඒ අනුව උතුරු මැද පළාතේ ස්ථාපිත කර ඇත් මුල් ළමාවිය ප්‍රඥප්තියට අනුව පෙර

මගින් ලබා දුන් ප්‍රතිපාදන වලින් ගුරු පුහුණු වැඩසටහන් සඳහා ද වැය කර ඇත.

## දැක්ම

"සතුටින් පිරි නිපුණතාවයන්ගෙන් හෙබි සදාචාර සම්පන්න පෙර පාසල් දරුවන් උතුරු මැද පළාත තුළ බිහි කිරීම".

## මෙහෙවර

"උතුරු මැද පළාත තුළ විවිධත්වයෙන් යුතු, මනා ක්‍රියාකාරීත්වයෙන් හෙබි, නිසඟ කුසලතාවයෙන් යුත්, සෞන්දර්යාත්මක හැඟීමෙන් පිරිපුන්, සාරධර්ම සපිරි, පෙර පාසල් දරු පරපුරක් බිහි කිරීම සඳහා මධ්‍යම රජයේ හා පළාත් සභාවේ මෙන්ම රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන ද සම්බන්ධ කරගනිමින් 2003 අංක 04 දරණ ප්‍රඥප්තියට අනුකූලව වැඩසටහන් සම්පාදනය, සම්බන්ධීකරණය හා ඵලදායි ලෙස මෙහෙයවීම පිළිබඳව පළාතේ කේන්ද්‍රීය ආයතනයක් ලෙස කැපවීමෙන් කටයුතු කිරීම".

## දිගුකාලීන අරමුණු හා කෙටිකාලීන අරමුණු

### දිගුකාලීන අරමුණු

- ❖ ගුණාත්මක සේවා සපයන පෙර පාසල් ගුරු පද්ධතියක් ඇති කිරීම.
- ❖ මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳව මනා දැනුමක් සහිත සමාජයක් ඇති කිරීම.
- ❖ ගුණාත්මක සේවාවක් සපයන ආයතනයක් බවට ආයතනය පත් කිරීම.
- ❖ සංහිඳියාවෙන් යුත් ආයතනයක් (යහපාලනයෙන් යුත්) බවට පත් කිරීම.

### කෙටිකාලීන අරමුණු

- ❖ පෙර පාසල් ගුරුවරුන්ගේ දැනුම යාවත්කාලීන කිරීම.
- ❖ වර්තමාන ළමා ආරක්ෂණයට ගැලපෙන පරිදි දෙමාපියන් දැනුවත් කිරීම.
- ❖ ළමා සංවර්ධන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම.

### ප්‍රධාන කාර්යයන්

- ❖ පෙර පාසල් ගුරුවරුන්ගේ කුසලතා සංවර්ධනය.
- ❖ මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳව ප්‍රජාව බල ගැන්වීම.
- ❖ ආයතනික ධාරිතා සංවර්ධනය.
- ❖ යහපාලන කටයුතු සංවර්ධනය.

### ප්‍රධාන උපාය මාර්ගයන්


- ❖ ආයෝජන ධාරිතා පුළුල් කිරීම.
- ❖ මානව සම්පත් සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම.
- ❖ අධිකාරියේ අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීම සඳහා අදාල ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීම.

### අධිකාරියේ අරමුණු

- ❖ උතුරු මැද පළාත තුළ පෙර පාසල් පිහිටුවීම.
- ❖ කළමනාකරණය,අධීක්ෂණය, ලියාපදිංචිය, ශිෂ්‍යයින් ඇතුළත් කර ගැනීම, ගුරුවරුන් බඳවා ගැනීම සඳහා
- ❖ නිර්ණායක සැකසීම පෙර පාසල් පිහිටුවීම හා ඒවායේ ව්‍යාපෘති පිළිබඳව කටයුතු කිරිම.
- ❖ ඉහත අරමුණු සියල්ල හෝ ඉන් කිසිවක් ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි හෝ හිතකර විය හැකි වෙනත් සියළු ක්‍රියා කිරීම.

## කාර්ය මණ්ඩල සංයුතිය

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 40 |
| 2 | සේවයේ නියුතු | 39 |
| 3 | පුරප්පාඩු | 06 |
| 4 | අනියම් | 01 |
| 5 | කොන්ත්‍රාත් | 02 |
| 6 | අනුයුක්තව සිටින නිලධාරීන් | 04 |




## මෙහෙයුම් ප්‍රතිඵල- පුනරාවර්තන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2017 වර්ෂයේ වියදම (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 14.82 | 10.66 | 100 |
| ගමන් වියදම් | | 0.33 | 100 |
| සැපයීම් | | 0.43 | 100 |
| නඩත්තු වියදම් | | 0.37 | 100 |
| ගිවිසුම්ගත සේවා | | 11.18 | 100 |
| මාරු කිරීම් | | - | 100 |
| සහනාධාර | | - | 100 |
| **එකතුව** | **14.82** | **22.97** | **100** |

## දිගුකාලීන හා කෙටිකාලීන අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ප්‍රධාන කාර්යයන් හා සම්බන්ධ ව්‍යාපෘති පිළිබඳ තොරතුරු.

| අනු අංකය | අරමුණ | අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය/ව්‍යාපෘති | ප්‍රධාන ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් ගණන | ආවරණය කළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ගණන | වෙන් කළ මුදල (රු.මි) | ප්‍රගතිය (%) | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | භෞතික | මූල්‍ය |
| 1. | ළමා අධ්‍යාපනය පිළිබඳව දැනුවත් කිරීම | දෙමව්පියන් දැනුවත් කිරීම | වැඩසටහන් පැවැත්වීම | 5387 | 29 | 1.1 | 100 | 78.72 |
| 2. | වෙනස් වන ලෝකයට ගැලපෙන පරිදි ගුරුවරුන්ගේ ධාරිතා සංවර්ධනය | ගුරු ධාරිතා සංවර්ධනය කිරීම | ගුරුවරු,පුහුණු කිරීම, ඩිප්ලෝමා හා සහතික පත්‍ර පාඨමාලාවන් පැවැත්වීම | 1790 | 29 | 7.5 | 95 | 95.6 |

### මෙහෙයුම් සමාලෝචනය හා සංවර්ධන කාර්ය පිළිබඳ කාර්ය සාධනය

- **අනුරාධපුර හා පොළොන්නරුව ආදර්ශ පෙර පාසල් දෙකෙහි කටයුතු අවසාන කිරීම.**
- ළමා ලේකම් කාර්යාලයේ ලෝක බැංකු ව්‍යාපෘතිය යටතේ පෙර පාසල් සංවර්ධනය සඳහා රු.400,000/= බැගින් ලබා දීමට උතුරු මැද පළාතෙන් පෙර පාසල් 350ක් තෝරා ගැනීම හා දැනට 150 කට පමණ රු. 200,000/= කට ආසන්න මුදලක් ලබා දී සංවර්ධන කටයුතු ආරම්භ කිරීම.





- 2016 වර්ෂයට වඩා 2017 වර්ෂය තුළ ගුරුවරියන් 1790 ක් සඳහා උතුරු මැද පළාතේ කොට්ඨාස 29ක ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.
- දරුවන්ගේ දෙමාපියන් හා ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් කොට්ඨාස 29 තුළ ක්‍රියාත්මක කිරීම.
- එක් එක් කොට්ඨාසවල සංවර්ධන නිලධාරීන් මඟින් සෞඛ්‍ය, අත්කම්, චිත්‍ර ආදී වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- නවක සංවර්ධන නිලධාරීන් මඟින් සිදු කරන පෙර පාසල් නියාමනය.
- 2016/17 වර්ෂය සඳහා පෙර පාසල් ගුරුවරියන්ගේ වෘත්තීය සංවර්ධනය ඇති කරලීමට ගුරු සිසුවියන් 150 ක් සඳහා ඩිප්ලෝමා පාඨමාලාව ද, ගුරු සිසුවියන් 100 ක් සඳහා සහතික පත්‍ර පාඨමාලාව ද නොමිලේ ලබා දීම.

පෙර පාසල් ඉහත ක්‍රියාකාරීත්වයන්ට අමතරව දරුවන් සඳහා ද විවිධ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරයි.

- බාහිර ආයතන සමඟ ක්‍රියාත්මක වැඩසටහන්

ප්ලෑන් ශ්‍රී ලංකා ආයතනය සමඟ එක්ව විලච්චිය, කහටගස්දිගිලිය, පදවිය, මනුප ආදී කොට්ඨාසවල දරුවන්ගේ සනීපාරක්ෂාව පිළිබඳ වැඩසටහන්, සෞඛ්‍ය හා පෝෂණය, සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් ආදිය පෙර පාසල් ගුරුවරුන් සඳහා ක්‍රියාකාරකම් "ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රිසි", "යහපාලනය හා පෙර පාසල් කළමනාකරණය", විශේෂ අවශ්‍යතා ඇති දරුවන් හඳුනා ගැනීමේ පුහුණුකරුවන් පුහුණු කිරීම හා පෙර පාසල් ගුරුවරුන් පුහුණු කිරීමේ වැඩසටහන්.

මෙය හිස්ව තබන ලද පිටුවකි

# පුස්තකාල සේවා මණ්ඩලය

6.6

### දැක්ම

"උතුරු මැද පළාත තුළ යහපත් පුස්තකාල සහ තොරතුරු සේවාවක් පවත්වා ගෙන යෑම".

### මෙහෙවර

"යහපත් පුස්තකාල සහ තොරතුරු සේවාවක් පවත්වාගෙන යාම තුළින් පොතපත කියවීමෙන් දැනුම, ආකල්ප, කුසලතා වලින් පිරිපුන් සංවේදී බුද්ධිමත් ජන සමාජයක් ගොඩනැගීම".

### දිගුකාලීන අරමුණු හා කෙටිකාලීන අරමුණු

### දිගුකාලීන අරමුණු

උතුරු මැද පළාතේ පාසල්, පිරිවෙන් හා මහජන පුස්තකාල නුතන තාක්ෂණ සම්පත් ද සහිතව දියුණු පුස්තකාල සේවාවක් ලබා දෙන ආයතන ලෙස ගොඩනැගීම.

### කෙටිකාලීන අරමුණු

පොතපත කියවීමෙන් බැහැරවන ජන සමාජයේ බාල පරපුර ඉලක්ක කර ගනිමින් ඔවුන් පොතපත කියවීමට හුරු පුරුදු කිරීම.

### ප්‍රධාන කාර්යයන්

- උතුරු මැද පළාතේ පුස්තකාල සහ තොරතුරු සේවා කටයුතු සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම හා සම්බන්ධීකරණය.
- පුස්තකාල සංවර්ධනයට අවශ්‍ය කටයුතු සැලසුම් කිරීම.
- පළාත්වාසී පාඨකයන් සඳහා පුස්තකාල සහ තොරතුරු සේවා සැපයීම.
- පුස්තකාල සේවා ව්‍යාපෘතියකට අවශ්‍ය වන්නා වූ සාමූහික ප්‍රතිග්‍රහණය, මධ්‍යගත සැලසුම්කරණය, ඒකාබද්ධ සුචීන් සම්පාදනය, ප්‍රාදේශිය එකතුන් සංවර්ධනය කරලීම, අන්තර් පුස්තකාල පිරුළු සේවා, ජංගම පුස්තකාල සේවා, විඥාපන ජාල පිහිටුවීම සහ අදාළ අනෙකුත් කටයුතු සිදු කිරීම.
- පොත් පත්, වාර සඟරා ඇතුළු මුද්‍රිත මාධ්‍ය, ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය සහ පරිගණකගත තොරතුරු සේවාවන් යොදා ගනිමින් පළාත තුළ උසස් මට්ටමේ තොරතුරු සේවාවක් පවත්වාගෙන යෑම.
- පොත්පත් හා ලේඛණ උතුරු මැද පළාතට විශේෂිත වූ දුර්ලභ ලිපි ලේඛණ හා ග්‍රන්ථයන්හි අත්පිටපත්, පුස්කොළ පොත් ආදිය රැස් කිරීම හා සංරක්ෂණය.
- ජාතික, ජාත්‍යන්තර හා කලාපීය තොරතුරු ජාල හා සේවාව සම්බන්ධ වීම.
- පළාත් සභාව ක්‍රියාත්මක කරනු ලබන විවිධ සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා අවශ්‍ය තොරතුරු සහ දත්ත සැපයීම මගින් සහය වීම.


- පුස්තකාල කාර්ය මණ්ඩලය බඳවා ගැනීම හා උසස් කිරීම් පටිපාටි, විභාග පටිපාටි සකස් කිරීම.
- දැනට පවත්වාගෙන යන පුස්තකාල පිළිබඳ අධ්‍යයනය කිරීම තුළින් අදාළ පුස්තකාල සංවර්ධනය සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- පළාතේ පුස්තකාල හා තොරතුරු සේවා සංවර්ධනය සඳහා සුදුසු වෙනත් පියවර ගැනීම.

### ප්‍රධාන උපාය මාර්ගයන්

- පාසල් හා මහජන පුස්තකාල සඳහා පොත් හා පුස්තකාල කබඩ් ලබා දීම.
- පාසල්, පිරිවෙන් හා මහජන පුස්තකාලයන්හි සේවය කරන කාර්ය මණ්ඩලය පුහුණු කිරීම.
- පාඨක සමාජ හා කියවීම් කඳවුරු පැවැත්වීම.
- නිර්මාණ තරඟ පැවැත්වීම.
- ස්වයං නිර්මාණ දිරිගැන්වීම සඳහා විවිධ වැඩසටහන් සංවිධානය.

### කාර්ය මණ්ඩල සංයුතිය - 2017

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 8 |
| 2 | සේවයේ නියුතු | 7 |
| 3 | පුරප්පාඩු | 1 |




### මූලධන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2017 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම | 50.03 | 24.41 | 25.62 | 48.79 |
| **එකතුව** | **50.03** | **24.41** | **25.62** | **48.79** |

*අංශය තුළින් ඉටුකර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු අංක - 04*

**පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම.**

4.1. 2030 වන විට ඵලදායි ඉගෙනුම් ප්‍රතිඵල ලබා ගත හැකි ආකාරයෙන් සියළුම ගැහැණු ළමුන් හා පිරිමි ළමුන් නිදහස්, සමාන හා ගුණාත්මකභාවයෙන් ඉහළ , ප්‍රාථමික, ද්වීතියික අධ්‍යාපනයක් සම්පූර්ණ කර සිටින බව තහවරු කිරීම.

4.2. 2030 වන විට සියළුම ගැහැණු ළමුන්ට හා පිරිමි ළමුන්ට ගුණාත්මක වශයෙන් ඉහළ පූර්ව ළමාවිය සංවර්ධනයට ,සත්කාර සේවාවන්ට සහ පූර්ව ප්‍රාථමික අධ්‍යාපනයට ප්‍රවේශ වීමේ අවස්ථාව පැවතීම හා එමගින් ඔවුන් ප්‍රාථමික අධ්‍යාපනයට සූදානම්ව සිටින බව තහවරු කිරීම.

4.3. 2030 වන විට සියළුම කාන්තාවන්ට සහ පිරිමින්ට ගුණාත්මක වශයෙන් ඉහළ සහ අඩු මුදලකට ලබා ගත හැකි විශ්ව විද්‍යාල අධ්‍යාපනය ද ඇතුළත්ව තාක්ෂණික,වෘත්තීය සහ තෘතීයික අධ්‍යාපනය ලබා ගැනීමට හැකි වීම.


4.4. 2030 වන විට අධ්‍යාපනයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ වෙනස්කම් තුරන් කිරීම,අධ්‍යාපනයේ සියළුම මට්ටම්වලට ප්‍රවේශ වීමේ අවස්ථාව තහවරු කිරීම.

4.5. 2030 වන විට සියළුම තරුණ තරුණියන් සහ කාන්තා,පිරිමි,වැඩිහිටි පුද්ගලයින්ගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් අකුරු හැකියාව සහ ගණන් කිරීමේ හැකියාව ලබා සිටීම.

4.6. 2030 වන විට ඉගෙනුම ලබන සියළුම දෙනා තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ දැනුම හා කුසලතාවයන් ලබාගෙන තිබීම.

### සංවර්ධන කටයුතු පිළිබඳ කාර්ය සාධනය - පසුගිය වසර 03ක ප්‍රාග්ධන වැයවීම් (වියදම්)

| වර්ෂය | PCDG (රු.මි) | මුළු වියදම (රු.මි) |
|---|---|---|
| 2015 | 3.33 | 3.33 |
| 2016 | 22.86 | 22.86 |
| 2017 | 28.26 | 28.26 |




### දිගුකාලීන හා කෙටිකාලීන අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ප්‍රධාන කාර්යයන් හා සම්බන්ධ ව්‍යාපෘති

| අනු අංකය | අරමුණ | අරමුණ ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය/ව්‍යාපෘති | ප්‍රධාන ක්‍රියාකාරකම් | ප්‍රතිලාභීන් ගණන | ආවරණය කළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ගණන | වෙන් කළ මුදල (රු.මි) | ප්‍රගතිය (%) | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | භෞතික | මූල්‍ය |
| 1. | අංග සම්පූර්ණ පුස්තකාල පද්ධතියක් බිහි වීම | 01.පුස්තකාල ගොඩනැගිලි ඉදි කිරීම | පුස්තකාල ගොඩනැගිලි 02ක් ඉදි කිරීම | දිඹුලාගල සහ කළුක්කේගම මහජන පුස්තකාලයන් | කළුක්කේගම සහ දිඹුලාගල | 26.97 | 75 | 79 |
| | | 02.පාසල් හා මහජන පුස්තකාල සඳහා කියවීම පොත් ලබා දීම | පුස්තකාල සඳහා කියවීම පොත් ලබා දීම | පාසල් පුස්තකාල 43ක පාඨකයින් | උතුරු මැද පළාත තුළ | 0.82 | 100 | 98 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 1. | | 03.පාසල් පුස්තකාල සඳහා පුස්තකාල කබඩ් ලබා දීම | පුස්තකාල සඳහා කබඩ් ලබා දීම | පාසල් පුස්තකාල 55ක පාඨකයින් | උතුරු මැද පළාත තුළ | 1.17 | 100 | 99 |
| | | 02. මහජන පුස්තකාල ප්‍රමිතකරණය | මහජන පුස්තකාල සඳහා සුවි කාඩ්පත් ලබා දීම හා පුස්තකාලය ප්‍රමිතියානුකූලව සකස් කර දිම | 04. මහජන පුස්තකාල4ක පාඨකයින් | පදවිය,තලාව,ගලෙන්බි ඳුණුවැව,වැලිකන්ද | 0.10 | 100 | 86 |
| 2 | පාඨකයින් වඩාත් දැනුම සොයන පිරිසක් බවට පත් කිරිම | 01.නිර්මාන තරඟ පැවැත්වීම | පළාතේ නව ලේඛකයින්ගේ නිර්මාණ කැඳවා ජයග්‍රාහකයන්ට ත්‍යාග,සහතිකපත්‍ර ලබා දීම | 185 | උතුරු මැද පළාත තුළ | 0.30 | 100 | 74 |
| | | 02.පාඨක සමාජ ආරම්භ කිරීම | පාඨක සමාජ ආරම්භ කර ඇති පාඨක සමාජ වල තරඟ සංවිධානය කිරීම | පාසල් 138ක දරුවන් | උතුරු මැද පළාත තුළ | 0.10 | 100 | 100 |
| 3 | | පුස්තකාල කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ වැඩසටහන් | පුස්තකාල කාර්යමණ්ඩලය පුහුණු කිරීම. | 630 | උතුරු මැද පළාත තුළ | 0.58 | 100 | 100 |
| 4 | | සාර්ථක නිර්මාණ ප්‍රකාශනය සඳහා අනුග්‍රහය දැක්වීම,නිර්මාණකරණය දිරිගැන්වීම | නිර්මාණකරණය දිරිගැන්වීමක් ලෙස ලේඛකයින්ගේ පොත් මුද්‍රණය සඳහා මුද්‍රණ වියදමෙන් 1/3 ලබා දීම | 05 | උතුරු මැද පළාත තුළ | 0.21 | 100 | 86 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 5 | | ස්වයං නිර්මාණ දිරිගැන්වීමක් වශයෙන් ඔවුන්ගේ නිර්මාණ මිලදී ගැනීම | ලේඛකයින්ගේ නිර්මාණ මිලදී ගැනීම | 36 | උතුරු මැද පළාත තුළ | 0.6 | 100 | 93 |
| 6 | | ගී රස වින්දන වැඩසටහන් පැවැත්වීම | මහජනතාවගේ රසඥතාව වැඩි කිරීමේ අරමුණින් ප්‍රවීන සංගීතඥයින් සමඟන් දායකයින් | 700 | අනුරාධපුර දිස්ත්‍රික්කය තුල | 0.10 | 100 | 100 |
| 7 | | කියවීම කඳවුරු සංවිධානය සහ පැවැත්වීම | පාසල් ළමයින් සම්බන්ධව කරගනිමින් කියවීම කඳවුරු පැවැත්වීම | 2400 | | 0.10 | 100 | |

**මෙහෙයුම් සමාලෝචනය හා සංවර්ධන කාර්ය පිළිබඳ කාර්ය සාධනය**

2017 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට යෝජිත වූ සියළු ව්‍යාපෘති ක්‍රියාත්මක වූ අතර නියමිතව තිබූ පොළොන්නරුව ගී රස වින්දන වැඩසටහනට ශිල්පීන්ගෙන් දින වෙන්කර ගැනීමට නොහැකි වූ අතර ලබා දුන් දිනයන් පාසල් සිසුන්ගේ විභාග දිනයන් වූ බැවින් එම වැඩසටහන් අවලංගු කර එම මුදල් පුස්තකාල කබඩ් ලබා ගැනීම සඳහා යොදවන ලදී.

**සංවර්ධන ව්‍යාපෘති මගින් කෙටිකාලීනව අපේක්ෂා කරන ප්‍රතිලාභ**

| අනු අංකය | ව්‍යාපෘතිය | කෙටිකාලීන බලපෑම(Outcome) |
|---|---|---|
| 01 | තඹුත්තේගම සහ දිඹුලාගල නගරයේ පුස්තකාල ගොඩනැගිලි ඉදිකිරීම. | පාසල් දරුවන්ගේ දැනුම් අවශ්‍යතා සපුරා ගැනීමට අවස්ථාව ලැබීම. |
| | | පර්යේෂකයින්ට පර්යේෂණ කටයුතුවලට සහාය ලැබීම. |
| | | මහජනතාවගේ කියවීම් කුසලතාවය වර්ධනය කර ගැනීමට සහාය ලැබීම. |

| | | |
|---|---|---|
| 02 | පාසල් හා මහජන පුස්තකාල සඳහා කියවීම් පොත් ලබා දීම | පාසල් දරුවන් සහ මහජනතාවගේ දැනුම් අවශ්‍යතා සපුරා ගැනීමට සහය ලැබීම. |
| 03 | පාසල් පුස්තකාල සඳහා පුස්තකාල කබඩ් ලබා දීම | පළාතේ දුෂ්කර පාසල්වල පුස්තකාල සංවර්ධනය විම. |
| 04 | පාසල් පුස්තකාල ප්‍රමිතකරණ | පළාතේ මහජන පුස්තකාල ප්‍රමිතීන්ට අනුකූලව සකස් කිරීම. |
| 05 | නිර්මාණ තරඟ පැවැත්වීම | පාසල් දරුවන් මෙන්ම මහජනතාව නිර්මාණකරණයට යොමු වීම. |
| 06 | පාඨක සමාජ ආරම්භ කිරීම | උතුරු මැද පළාතේ පුස්තකාල භාවිතා කරන්නන් ප්‍රමාණය වැඩිවීම. |
| 07 | පුස්තකාල කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම | පළාතේ පුහුණුව ලත් පුස්තකාල කාර්යය මණ්ඩලය බිහිවීම තුළින් සංවර්ධිත පුස්තකාල සේවාවක් ලැබීම. |
| 08 | සාර්ථක නිර්මාණ ප්‍රකාශනය සඳහා අනුග්‍රහය දැක්වීම. නිර්මාණකරණය දිරිගැන්වීම | පළාතේ ලේඛකයින්ගෙන් උසස් නිර්මාණ බිහිවීම. |
| | | නිර්මාණකරනයේ නියැලෙන ලේඛකයින් ප්‍රමාණය වැඩිවීම. |
| 09 | ස්වයං නිර්මාණ දිරිගැන්වීමක් වශයෙන් ඔවුන්ගේ නිර්මාණ මිලදී ගැනීම | ලේඛකයින්ගේ උසස් නිර්මාණ විකුණා ගැනීමට ලේඛකයින්ට අවස්ථාවක් ලැබීම. |
| 10 | ගී රස වින්දන වැඩසටහන් පැවැත්වීම | රසඥතාවයෙන් යුත් ජන සමාජයක් බිහි වීම. |
| 11 | කියවීම් කඳවුරු සංවිධානය හා පැවැත්වීම | පාසල් දරුවන්ගේ කියවීම් කුසලතාව වර්ධනය වීම |
| | | පාසල් දරුවන්ගේ විෂයානුබද්ධ දැනුම සෙවීම සඳහා පාසල් පුස්තකාලය භාවිතයට යොමු වීම |

උතුරු මැද පළාත් සභා ප්‍රදාන යටතේ 2017 වර්ෂය සඳහා රු. මිලියන 34ක මුදලින් පළාතේ පුස්තකාල වෙනුවෙන් ක්‍රියාත්මක කළ වැඩසටහන්

| ව්‍යාපෘතිය | වෙන් කළ ප්‍රතිපාදන (රු.මි.) | වියදම (රු.මි.) |
|---|---|---|
| තඹුත්තේගම නගරයේ අංග සම්පූර්ණ පුස්තකාලයක් ඉදිකිරිම. (2වන අදියර) | 11.19 | 5.59 |
| පුස්තකාල 22ක් සඳහා පොත් මිලදී ගැනීම. | 0.47 | 0.45 |
| පුස්තකාල 22ක් සඳහා කබඩ් මිලදී ගැනීම. | 0.49 | 0.45 |
| පුස්තකාල පාඨක සමාජ සඳහා ත්‍යාග ලබාදීම. | 0.06 | 0.06 |
| කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම | 0.42 | 0.43 |
| කියවීම් කඳවුරු 30ක් පැවැත්වීම | 0.06 | 0.06 |
| ගී රස වින්දන වැඩසටහන් 01ක් පැවැත්වීම | 0.10 | 0.09 |
| පුස්තකාල ප්‍රමිතිකරණය | 0.06 | 0.06 |
| දිඹුලාගල නගරයේ අංග සම්පූර්ණ පුස්තකාලයක් ඉදිකිරීම (දෙවන අදියර) | 15.78 | 15.78 |
| පුස්තකාල 21ක් සඳහා පොත් මිලදී ගැනීම | 0.35 | 0.35 |
| පුස්තකාල 33ක් සඳහා කබඩ් මිලදී ගැනීම | 0.68 | 0.69 |
| පුස්තකාල පාඨක සමාජ සඳහා ත්‍යාග ලබාදීම | 0.04 | 0.04 |
| කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම | 0.16 | 0.15 |
| කියවීම් කඳවුරු 20ක් පැවැත්වීම | 0.04 | 0.03 |
| පුස්තකාල ප්‍රමිතකරණය | 0.04 | 0.03 |
| නිර්මාණ තරඟ පැවැත්වීම | 0.23 | 0.22 |
| මුද්‍රණ ආධාර ලබාදීම | 0.21 | 0.18 |
| ස්වයං නිර්මාණ මිලදී ගැනිම | 0.60 | 0.56 |

## උතුරු මැද පළාත් සභා ප්‍රධාන යටතේ 2017 වර්ෂය සඳහා රු. මිලියන 34ක මුදලක් වෙන් වී තිබූ අතර එම මුදලින් පළාතේ පුස්තකාල වෙනුවෙන් ක්‍රියාත්මක කළ වැඩසටහන් හා එහි ප්‍රගතිය

| අනු අංකය | වැඩසටහන | සංඛ්‍යාව | තත්ත්වය |
|---|---|---|---|
| 01 | තඹුත්තේගම නගරයේ අංග සම්පූර්ණ පුස්තකාලයක් ඉදිකිරීම (මෙය තඹුත්තේගම කලාප කාර්යාලයට යාබඳව ඉදි වෙමින් පවතින දෙමහල් පුස්තකාල ගොඩනැගිල්ලකි.)<br><br>පොළොන්නරුව දිස්ත්‍රික්කයේ දිඹුලාගල ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල ඉදිකර ඇති ඉඩමේ ඉදිවන දෙමහල් පුස්තකාල ගොඩනැගිල්ලකි. | 02 | දිඹුලාගල නගරයේ ඉදිවන අංග සම්පූර්ණ පුස්තකාලය<br><br><br>තඹුත්තේගම නගරයේ ඉදිවන අංග සම්පූර්ණ පුස්තකාලය<br> |
| 02 | පුස්තකාල සඳහා පොත් ලබා දීම | අනුරාධපුර 23<br>පො/නරුව 14 | |
| 03 | පුස්තකාල සඳහා අත්‍යාවශ්‍ය උපකරණ ලබා දීම. | 36 | |

| | | | |
|---|---|---|---|
| 04 | පුස්තකාල පාඨක සමාජ සඳහා ත්‍යාග ලබාදීම. පාසල් ළමුන් තුළ හා මහජනතාව තුළ කියවීම් රුචිකත්වය නන්වාලීම අරමුණු කරගනිමින් පාසල් හා මහජන පුස්තකාල වල පාඨක සමාජ පිහිටුවා පසුව ඒවා ක්‍රියාකාරී මට්ටමෙන් පවත්වාගෙන යාම සඳහා තරඟ පවත්වා ත්‍යාග ලබාදීම. | 06 |   |
| 05 | කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම අනුරාධපුර දිස්ත්‍රික්කයේ පාසල් හා මහජන පුස්තකාල කාර්ය මණ්ඩල පුහුණු කරමින් පාඨකයන්ට ගුණාත්මක සේවාවක් ලබාදීම | 07 සහභාගී වූ සංඛ්‍යාව 415 |   |
| 06 | පාසල් දරුවන් තුළ කියවීමේ කුසලතාව හා රුචිකත්වය වර්ධනය කිරීමේ අරමුණින් කියවීම් කඳවුරු සංවිධානය කිරිම. | කියවීම් කඳවුරු 50ක් පැවැත්වීම |     |
| 07 | ගී රස වින්දන වැඩසටහන් 01ක් පැවැත්වීම. අනුරාධපුර දිස්ත්‍රික්කයේ පාසල් දරුවන් තුළ රස වින්දන හැකියාව වර්ධනය කිරීමේ අරමුණින් ගී රස වින්දන වැඩසටහන් පවත්වීම. | 02 |   |

උතුරු මැද පළාත් සහා ප්‍රධාන යටතේ **2017** වර්ෂය සඳහා රු. මිලියන **34**ක මුදලක් වෙන් වී තිබූ අතර එම මුදලින් පළාතේ පුස්තකාල වෙනුවෙන් ක්‍රියාත්මක කළ වැඩසටහන් හා එහි ප්‍රගතිය ඉතිරි කොටස...

| | | | |
|---|---|---|---|
| 08 | මහජන පුස්තකාල එකම ප්‍රමිතියකට ගෙන ඒමේ අරමුණින් පුස්තකාල ප්‍රමිතිකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම | 04 | 08 |

| අංකය | වැඩසටහන | ගණන | තත්ත්වය |
|---|---|---|---|
| 09 | උතුරු මැද පළාතේ ලේඛන කලාව සඳහා උනන්දුවක් ඇති ලේඛකයින් ඇගයීම හා දිරිමත් කිරීම සඳහා නිර්මාණ තරඟ පැවැත්විම | අංශ 07ක් යටතේ | හොඳම පද්‍ය සංග්‍රහය<br>හොඳම කෙටිකතා සංග්‍රහය<br>හොඳම නවකතාව<br>හොඳම පද්‍ය සංග්‍රහය<br>හොඳම කෙටිකතා සංග්‍රහය<br>**විවෘත අංශය**<br>හොඳම පද්‍ය සංග්‍රහය<br>හොඳම කෙටිකතා සංග්‍රහය<br>හොඳම නවකතාව |
| 10 | මුද්‍රණ ආධාර ලබාදීම. උතුරු මැද පළාතේ අඩු මුල්‍ය පහසුකම් සහිත ලේඛකයින් දිරිමත් කිරීමේ අරමුණින් මුද්‍රණ ආධාර ලබාදීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. | නිර්මාන ග්‍රන්ථ 06 ක පිටපත් 886ක් | |
| 11 | ස්වයං නිර්මාණ මිලදි ගැනිම්. උතුරු මැද පළාතේ හා පිට පළාත්වල ලේඛකයින් දිරිමත් කිරිමේ ඔවුන්ගේ ස්වයං නිර්මාණ මිලදී ගන්නා ලදී. | ස්වයං නිර්මාන ග්‍රන්ථ 36 ක පිටපත් 2505ක් |  |

මෙය හිස්ව තබන ලද පිටුවකි

# පළාත් කෘෂිකර්ම, නිෂ්පාදන අලෙවි, සත්ත්ව නිෂ්පාදන , සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය

07

## පළාත් කෘෂිකර්ම, නිෂ්පාදන අලෙවි, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යාංශය පිළිබඳ මූලික විග්‍රහය

### මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය (මෙ.ටො)

| දිස්ත්‍රික්කය | 2014 | වැඩිවීම / අඩුවීම % | 2015 | වැඩිවීම / අඩුවීම % | 2016 | වැඩිවීම / අඩුවීම( %) |
|---|---|---|---|---|---|---|
| අනුරාධපුර | 16,325 | 69% | 9,650 | (41%) | 12,990 | 35% |
| පොළොන්නරුව | 7,558 | 1% | 7,160 | (5%) | 3,525 | (51%) |
| **එකතුව** | **23,883** | **39%** | **16,810** | **(30%)** | **16,515** | **(2%)** |

| | 2014 | 2015 | 2016 |
|---|---|---|---|
| ජාතික නිෂ්පදනය (මිරිදිය මත්ස්‍ය) | 75,750 | 67,300 | 73,930 |
| උතුරුමැද පළාතේ දායකත්වය | 31.53% | 25.00% | 22.34% |

### ශීතාගාර පහසුකම්

| දිස්ත්‍රික්කය | ශීතාගාර පහසුකම් | ධාරිතාවය (මෙ.ටො දිනකට) |
|---|---|---|
| අනුරාධපුර | 1 | 10 |
| පොළොන්නරුව | 1 | 5 |
| **එකතුව** | **2** | **15** |

### මිරිදිය ධීවර යාත්‍රා

| දිස්ත්‍රික්කය | 2013 | 2014 | 2015 |
|---|---|---|---|
| අනුරාධපුර | 1103 | 1103 | 1153 |
| පොළොන්නරුව | 1048 | 1048 | 1073 |
| **එකතුව** | **2151** | **2151** | **2226** |

### ග්‍රාමීය කෘෂි නිෂ්පාදන අලෙවි සමිති පිළිබඳ තොරතුරු - 2016

| දිස්ත්‍රික්කය | සමිති සංඛ්‍යාව | සාමාජික සංඛ්‍යාව | මූල්‍ය තත්වය (රු) |
|---|---|---|---|
| අනුරාධපුර | 207 | 6,259 | 4,405,431 |
| පොළොන්නරුව | 70 | 2,419 | 2,281,337 |
| **එකතුව** | **277** | **8,678** | **6,686,768** |

### දැක්ම

“ ඉසුරුමත් භූමියක්, අසිරිමත් ගොවි කැළක් ”

### මෙහෙවර

“කෘෂිකර්ම, කෘෂි හා සත්ත්ව නිෂ්පාදන ප්‍රවර්ධන හා අලෙවි, සත්ව නිෂ්පාදන හා සත්ව සෞඛ්‍ය, ධීවර සහ නිවාස කටයුතු, සියලු පාර්ශ්වකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිද භාවයෙන් යුක්තව සංවර්ධනය කිරීම”

### දිගු කාලීන හා කෙටි කාලීන අරමුණු

**01** ජාතික ප්‍රතිපත්තීන්ට අනුගතව කෘෂිකාර්මික සම්ප්‍රදායන් රැක ගනිමින් නවීන තාක්ෂණයට අනුව කෘෂිකාර්මාන්තයේ ඵලදායිතාවය සහ නිෂ්පාදනය ඉහළ නැංවීම.

**02** පළාතේ 80 % ක් වූ ගොවි ජනතාවගේ ජීවන මට්ටම ඉහළ නැංවීම.

**03** තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගත හැකි පරිදි කෘෂි කාර්මික වැඩසටහන් සකස් කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය.

**04.** තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගත හැකි පරිදි කෘෂි කාර්මික වැඩසටහන් සකස් කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය

**05.** ධිවර කර්මාන්ත තුළ ජාතික නිෂ්පාදනය සඳහා වැඩිම දායකත්වයක් සපයන පළාත වෙමින් ධීවර පවුල්වල සමාජ ආර්ථික පසුබිම සංවර්ධනය කිරීම

## කෙටිකාලීන අරමුණු

කෙටිකාලීන අරමුණු

01අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු දෙක මගින් සිදු කරනු ලබන සංවර්ධන වැඩ සටහන් කාර්යක්ෂම හා ඵලදායි අයුරින් වර්ෂය තුළ නිම කිරීම.

02. නව කෘෂි නිෂ්පාදන ක්‍රමවේද / තාක්ෂණය පිළිබඳව දැනුමෙන් පිරි ගොවි ජනතාවක් බිහිකර ගැනීම.

03. වස විස නැති ආහාර පරිභෝජනයට යොමු වන පිරිස වර්ධනය කිරීම.

04 සුළු පරිමාණ ව්‍යාවසායකයින්ට අවශ්‍ය සානුබල සැපයීම තුලින් ඔවුන්ගේ ආර්ථිකමය හැකියාව ශක්තිමත් කිරීම.

05. මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය ඉහල නැංවීම මගින් ජාතික නිෂ්පාදනයට පළාතේ දායකත්වය වර්ධනය කිරීම.

06.මත්ස්‍ය පරිභෝජනය වැඩි කිරීම මගින් පළාතේ ජනතාවගේ පෝෂණ මට්ටම ඉහළ නැංවීම.

07.ධීවර කාර්මිකයින්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීම.

08. විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ නියැලි ව්‍යාවසායකයන්ගේ දැනුම කුසලතා ආකල්ප වර්ධනය කිරීම.

## ප්‍රධාන කාර්යයන් හා ප්‍රධාන උපාය මාර්ගයන්

| අංකය | ප්‍රධාන කාර්යයන් | උපාය මාර්ග (ය) |
|---|---|---|
| 01 | අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු නියාමනය | • අධීක්ෂණය,පසුවිපරම හා ප්‍රගති සමාලෝචනය<br>• ආයතනයේ චක්‍රලේඛ නිකුත් කිරීම |
| 02 | වස විසෙන් තොර ඵලදායි නිෂ්පාදනය දිරිමත් කිරීම | • නොමිලේ බීජ කට්ටල ලබා දීම<br>• ආරක්ෂිත ගෘහ තුළ එළවළු වගාව පුහුණු කිරීම |
| 03 | ස්වයං රැකියා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | • දැනුවත් කිරීම හා වැඩමුළු<br>• මල් වගාකරුවන්ට ආරක්ෂිත ගෘහ ලබා දීම<br>• සුළු පරිමාණ ව්‍යවසායකයින් සංවිධානගත කිරීම |
| 04 | ධීවර කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම | • මත්ස්‍ය බීජ නිෂ්පාදනය<br>• මත්ස්‍ය බීජ තැන්පත් කිරීම<br>• ධිවර ආම්පන්න හා ආධාර ලබා දීම<br>• ජල ජීවී පොකුණු සංවර්ධනය කිරීම<br>• විසිතුරු මත්ස්‍ය කර්මාන්තය ප්‍රවර්ධනය<br>• මත්ස්‍ය ආයෝජන මධ්‍යස්ථාන සංවර්ධනය<br>• පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම |
| 05 | ආයතනික ධාරිතා සංවර්ධනය | • පුහුණු හා ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම<br>• ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකා සංවිධානය කිරීම<br>• කාර්යාල උපකරණ මිලදී ගැනීම |

## කාර්යය මණ්ඩල සංයුතිය

| විස්තරය | අනුමත සංඛ්‍යාව |
|---|---|
| අනුමත සංඛ්‍යාව | 73 |
| සේවයේ නියුතු සංඛ්‍යාව | 58 |
| පුරප්පාඩු සංඛ්‍යාව | 15 |
| අනියම්/කොන්ත්‍රාත්/තාවකාලික පදනමේ සිටින සංඛ්‍යාව | 01 |

## මෙහෙයුම් ප්‍රතිඵල - පුනරාවර්තන වියදම

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු. මි.) | 2017 වර්ෂයේ වියදම (රු. මි.) | ඉතිරිය (රු. මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 44.582 | 34.734 | 9.848 | 78 |
| ගමන් වියදම් | 1.5 | 1.216 | 0.284 | 81 |
| සැපයීම් | 5.372 | 4.156 | 1.216 | 77 |
| නඩත්තු වියදම් | 2.548 | 1.813 | 0.735 | 71 |
| ගිවිසුම්ගත සේවා | 4.651 | 2.475 | 2.176 | 53 |
| මාරුකිරීම් | 0.413 | 0.305 | 0.108 | 74 |
| සහනාධාර (වෙනත් පුනරාවර්තන වියදම්) | 10.4 | 3.574 | 6.826 | 34 |
| **එකතුව** | 69.466 | 48.273 | 21.193 | 44 |

මුලධන වියදම්

| වියදමේ ස්වාභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි.) | 2017 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය % |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 0.50 | 0.34 | 0.16 | 68 |
| යන්ත්‍ර සූත්‍ර සවිකිරීම් හා උපකරණ | 1.04 | 0.92 | 0.12 | 88.46 |
| වාහන | 1.55 | 1.41 | 0.14 | 90.97 |
| වෙනත් මූලධන වත්කම් වැඩිදියුණු කිරීම | 0.15 | 0.07 | 0.08 | 46.66 |
| **එකතුව** | **3.24** | **2.74** | **0.50** | **84.56** |

## *අංශය තුළින් ඉටුකර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු අංක - 02*

**සාගින්න නැතිකර, ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්වයක් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම.**

2.1. 2030 වන විට සාගින්න තුරන් කිරීම සහ විශේෂයෙන්ම ළදරුවන්ද ඇතුළත්ව දරිද්‍රතාවයෙන් පෙළෙන සහ අවදානමට ලක් වී තිබෙන ජනතාවට ආරක්ෂාකාරී,පෝෂණයෙන් යුත් ප්‍රමාණවත් ආහාර වසර පුරා ලබා ගැනීමට හැකි වීම.

2.4. 2030 වන විට තිරසර ආහාර පද්ධති පැවතීම තහවරු කිරීම සහ ජෛව පද්ධති පැවතීම තහවරු කිරීම.

2.5. 2020 වන විට බීජවල,වගා කරන ලද ශාකවල සහ ගොවිපළ සහ ගෘහාශ්‍රිත සතුන්ගේ ජානමය විවධත්වය පවත්වාගෙන යාම.

2a. කෘෂිකාර්මික නිෂ්පාදන ධාරිතාවය වැඩි කිරීම සඳහා ග්‍රාමීය යටිතල පහසුකම්,කෘෂිකාර්මික පර්යේෂණ සහ ව්‍යාප්ති සේවාවන් තාක්ෂණ සංවර්ධනය සහ ශාක සහ පශු සම්පත් ජාන බැංකු සඳහා සිදු කරන ආයෝජනය වැඩි කිරීම.

## *අංශය තුළින් ඉටුකර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු අංක - 12*

**තිරසර පරිභෝජන සහ නිෂ්පාදන රටාවන් සහතික කිරීම.**

12.1. තිරසර පරිබෝජනය හා නිෂ්පාදනය සම්බන්ධයෙන් වන දස අවුරුදු වැඩසැලැස්ම සංවර්ධනය වූ රටවල ප්‍රධානත්වයෙන් සියළුම රටවල් විසින් ක්‍රියාත්මක කිරීම.

12.2. 2030 වන විට ස්වභාවික සම්පත් තිරසර අන්දමින් කළමනාකරණය කිරීම හා කාර්යක්ෂමව භාවිතා කිරීම වෙත ළඟා වීම.

12.3. 2030 වන විට සිල්ලර හා පරිබෝජන මට්ටම්වල ඒක පුද්ගල ආහාර අපතේ යාම අවම කිරීම සහ පශ්චාත් අස්වනු හානි ඇතුළුව නිෂ්පාදන හා සැලයුම් දාමයන්හී සිදුවන්නා වූ අපතේ යාම අවම කිරීම.

12.4. 2020 වන විට පරිසර හිතකාමී අන්දමට රසායනික ද්‍රව්‍ය හා සියළුම අපද්‍රව්‍ය කළමනාකරනය කිරීම ක්‍රියාවට නැංවීම.

12.8. 2030 වන විට සියළුම ප්‍රදේශවල සිටින සියළුම දෙනාට තිරසාර සංවර්ධනය හා ස්වභාධර්මය සමග සුසංයෝගයෙන් යුත් ජීවන රටාවන් ගත කිරීම පිළිබඳව දැනුවත්භාවය තහවරු කිරිම.


## *අංශය තුළින් ඉටුකර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු අංක - 13*

**දේශගුණික විපර්යාස සහ ඒවායේ බලපෑම්වලට එරෙහිව කඩිනමින් ක්‍රියාත්මක වීම.**

13.1. ජාතික මට්ටමේ ප්‍රතිපත්ති ක්‍රමෝපායන් හා සැලසුම්වලට කාලගුණ වෙනස්කම් අවම කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම.

| වර්ෂය | PSDG | PCDG | වෙනත් ප්‍රභ: | මුදල (රු.) |
|---|---|---|---|---|
| 2015 | 18.15 | 53.21 | - | 71.35 |
| 2016 | 239.24 | 8.19 | - | 247.43 |
| 2017 | 22.12 | 6.05 | 3.46 | 31.63 |

2017 වර්ෂයේ පුනරාවර්තන හා ප්‍රාග්ධන වැය විම්වල උපයෝජනය සලකා බැලිමේදි පෙනී යන්නේ පුනරාවර්තන වැය 44%ක් සහ ප්‍රාග්ධන වැය විම් 84.56%ක්ද වන බවයි.




**සංවර්ධන වැඩ පිළිබඳ කාර්ය සාධනය**

පසුගිය වසර 03 ක කාලය සැලකිමේදී ප්‍රාග්ධන වැය සඳහා විවිධ මුල්‍ය ප්‍රභවයන් වලින් අමාත්‍යාංශීය විෂයන්ගේ සංවර්ධනය උදෙසා අරමුදල් ලැබී ඇත.

2015 වර්ෂය හා සසඳා බලන විට 2016 වර්ෂයේදී මුල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 176.08 ක අඩුවීමක් පෙන්වන අතර 2017 වර්ෂය තුළදී එය 2016 වර්ෂයට සාපේක්ෂව මිලියන 31.63 ක වැඩිවිමකි.

මෙම අරමුදල් භාවිතයෙන් පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය සතු දිගුකාලින හා කෙටිකාලින අරමුණු ඉටුකර ගැනිම මගින් දැක්ම කරා ගමන් කිරිමට මහත් පිටිවහලක් විය.

දිගුකාලීන හා කෙටි කාලීන අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ප්‍රධාන කාර්යයන්

01. කෘෂි සමිති ආශ්‍රිත ධාරිතා ප්‍රවර්ධන වැඩ සටහන මගින් කාබනික එලවළු වගාව පිළිබඳ පුහුණුව මෙන්ම මල් වගාව පිළිබඳ පුහුණු වැඩ සටහන් ද ක්‍රියාත්මක කරන ලදී. ආර්ථික ගෘහ තුල එලවළු වගාව පිළිබඳ පුහුණුව තුලින් කුටුම්භය තුල ආර්ථික වාසි නිර්මාණය කිරිමට උපාය මාර්ගයක් ලෙස සැලසුම් කරන ලදී.

02 . පුහුණු හා ධාරිතා සංවර්ධනය

- ✓ විසිතුරු මත්ස්‍ය අභිජනනය පිළිබඳ පුහුණු වැඩසටහන අත්දැකීම් හුවමාරු කර ගැනීමේ පුහුණු වැඩසටහන
- ✓ නායකත්ව පුහුණු වැඩ සටහන් මගින් නායකත්ව ගුනාංග වර්ධනය කිරිම

03. වගා කටයුතු සඳහා අඛණ්ඩව ජල සම්පාදනය කර ගැනීමේ පහසුකම් වර්ධනය කිරිම.

04. වස විසෙන් තොර ආහාර නිෂ්පාදනය කාබනික ගොවිපල ප්‍රවර්ධන වැඩසටහන

05. කෘෂි ව්‍යාවසායකයින්ගේ ජීවනෝපාය සංවර්ධනය

- ✓ ප්‍රතිලාභීන් 38 දෙනකු සඳහා 50% ප්‍රතිලාභී දායකත්වය යටතේ මල් වගාව සඳහා ආරක්ෂිත ගෘහ ලබා දීම

06. ලොකු ළූණු බීජ ව්‍යාප්තිකරණය කිරිම

- ✓ ශීතාගාර පහසුකම් ලබා දීම මහඉලුප්පල්ලම ශීතාගාරය සඳහා ආවරණ ගෘහයක් ලබා දීම

07. ධීවර කාර්මිකයින් සඳහා පහසුකම් සැපයීම ධීවර ආම්පන්න ලබා දීම ධීවර කාර්මිකයින් සඳහා ඔරු ලබා දීම ධීවර කාර්මිකයින් සඳහා දැල් ලබා දීම

08. පළාතේ මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය ඉහල නැන්වීම

09. ජලාශ සඳහා මත්ස්‍ය පැටවුන් හැරීම ජලාශ සඳහා මත්ස්‍ය ඇසිත්තන් ලබා දීම ජලාශ සඳහා දැල් කූඩු ලබා දීම

10. විසිතුරු මත්ස්‍ය කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම

11. විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ නියැලෙන ව්‍යාවසායකයින් සඳහා (රම්බඩගල්ල ) පුහුණු වැඩසටහන් පැවැත් වීම

## දිගුකාලීන හා කෙටි කාලීන අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ප්‍රධාන කාර්යයන් හා ඒ මගින් ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම් හා ඒ මගින් ලද ප්‍රතිලාභ

| අනු අංකය | අරමුණ | අරමුණ ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය / ව්‍යාපෘති | ප්‍රධාන ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් ගණන | වෙන් කළ මුදල (රු.මි) | ප්‍රගතිය | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | භෞතික (%) | මූල්‍ය (%) |
| 1 | ගොවි ජනතාවගේ හා නිලධාරීන්ගේ කෘෂි තාක්ෂණික දැනුම වර්ධනය කිරීම. | 1.1 කෘෂි සමිති ආශ්‍රිත ධාරිතා ප්‍රවර්ධන වැඩ සටහන | කාබනික එලවළු වගාව පිළිබඳ පුහුණුව. | - | 0.30 | 100 | 97 |
| | | | මල් වගාව පිළිබඳ පුහුණු වැඩ සටහන | 38 | | | |
| | | | ආර්ථික ගෘහ තුල එලවළු වගාව පිළිබඳ පුහුණුව | 61 | | | |
| | | 1.2 පුහුණු හා ධාරිතා සංවර්ධනය | ගිණිගත්හේන විසිතුරු මත්ස්‍ය අභිජනනය පිළිබඳ පුහුණු වැඩසටහන | 25 | 0.40 | 100 | 95 |
| | | | අත්දැකීම් හුවමාරු කර ගැනීමේ පුහුණු වැඩසටහන | 26 | | | |
| | | | නායකත්ව පුහුණු වැඩ සටහන්- කිතුල්ගල | 21 | | | |
| 2 | වගා කටයුතු සඳහා අඛණ්ඩව ජල සම්පාදනය කර ගැනීමේ පහසුකම වර්ධනය කිරීම. | 2.1 අනාරක්ෂිත වගා ළිං පුනරුත්ථාපනය | අනාරක්ෂිත වගා ළිං පුනරුත්ථාපනය සඳහා ආධාර ලබා දීම | 177 | 3.40 | 100 | 100 |
| | | 2.2 වගා ළිං වල ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීම. | දැනට භාවිතා කරන ලද වගා ළිං වල ජල හිඟයට පිළියමක් ලෙස එම වගා ළිං වල රොන් මඩ ඉවත් කිරීම | 59 | 1.00 | 100 | 67 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 3 | වස විසෙන් තොර ආහාර නිෂ්පාදනය | 3.1 කාබනික ගොවිපල ප්‍රවර්ධන වැඩසටහන | ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයකින් ප්‍රතිලාභීන් 10 ට අක් 1/4 ක් සඳහා ගෙවතු බීජ ලබා දීම | 270 | 0.70 | 100 | 97 |
| 4 | කෘෂි ව්‍යාවසායකයින්ගේ ජීවනෝපාය සංවර්ධනය | 4.1 ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන | ප්‍රතිලාභීන් 38 දෙනකු සඳහා 50% ප්‍රතිලාභී දායකත්වය යටතේ මල් වගාව සඳහා ආරක්ෂිත ගෘහ ලබා දීම | 31 | 3.00 | 90 | 5 |
| 5 | ලොකු ළූණු බීජ ව්‍යාප්තීකරණය කිරීම | 5.1 ශීතාගාර පහසුකම් ලබා දීම | මහ ඉලුප්පල්ලම ශීතාගාරය සඳහා ආවරණ ගෘහයක් ලබා දීම | | 7.70 | | |
| 6 | ධීවර කාර්මිකයින් සඳහා පහසුකම් සැපයීම | 6.1 ධීවර ආම්පන්න ලබා දීම | ධීවර කාර්මිකයින් සඳහා ඔරු ලබා දීම | 17 | 3.50 | 90 | 77 |
| | | | ධීවර කාර්මිකයින් සඳහා දැල් ලබා දීම | 700 | | | |
| 7 | පළාතේ මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය ඉහල නැන්වීම | 7.1 ජලාශ සඳහා මත්ස්‍ය පැටවුන් හැරීම | මත්ස්‍ය ඇඟිල්ලන් මුදා හැරීම | | 4.00 | 100 | 99 |
| | | 7.2 ජලාශ සඳහා මත්ස්‍ය ඇසිත්තන් ලබා දීම | මත්ස්‍ය ඇසිත්තන් තැන්පත් කිරීම | | 5.00 | 100 | 100 |
| | | 7.3 ජලාශ සඳහා දැල් කුඩු ලබා දීම | ජලාශ වල ඇසිත්තන් ඇඟිල්ලන් දක්වා ඇති කිරීම සහ දැල් කුඩු ලබා දීම | දැල් කුඩු 05 | 0.50 | 100 | 88 |
| 8 | විසිතුරු මත්ස්‍ය කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම | 8.1 විසිතුරු මත්ස්‍ය කර්මාන්තය සඳහා අවශ්‍ය උපකරණ ලබා දීම | වට දැල් ලබා දීම | 55 | 1.00 | 30 | 22 |
| | | | සෙවන දැල් ලබා දීම | 5 | | | |
| | | 8.2 පුහුණු වැඩ සටහන් පැවැත්වීම | විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ නියැලෙන ව්‍යවසායකයින් සඳහා(රම්බඩගල්ල ) පුහුණු වැඩ සටහන් පැවැත් වීම | 70 | 0.50 | 100 | 82 |

**2017 වර්ෂයේ කාර්ය සාධනය ළඟාකර ගැනීම පිළිබඳව සාරාංශය**

| අ.අ | ව්‍යාපෘතියේ නම | මුදල (රු.මි) | ව්‍යාපෘති ක්‍රියාකාරකම | ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| 01 | මහඉලුප්පල්ලම ශීතාගාර ආවරණ ගෘහය ඉදිකිරීම | රු. මි. 7.70 | මෙම ව්‍යාපෘතිය අවිච්ඡේද ව්‍යාපෘතියකි | | |
| 02 | පුහුණු හා ධාරිතා ප්‍රවර්ධනය | රු. මි. 4.00 | විසිතුරු මත්ස්‍ය අභිජනනය පිළිබඳ | 25 | 25 |
| | | | ක්ෂේත්‍ර අත්දැකීම් හුවමාරු වැඩසටහන | 26 | 26 |
| | | | නායකත්ව පුහුණු වැඩසටහන | 25 | 21 |
| 03 | කෘෂි සමිති ආශ්‍රිත ධාරිතා ප්‍රවර්ධන වැඩසටහන | රු. මි. 3.00 | කාබනික එළවළු වගාව පිළිබඳ පුහුණුව | 270 (ප්‍රතිලාභීන්) | 270 (ප්‍රතිලාභීන්) |
| | | | මල් වගා පුහුණු වැඩසටහන | 38 | 38 |
| | | | ආර්ථික ගෘහ තුල එළවළු වගාව පිළිබඳ | 61 | 60 |
| 04 | අනාරක්ෂිත වගා ළිං පුනරුත්ථාපනය | රු. මි. 3.4 | ස්ථිර ජල සම්පාදන ක්‍රමයක් ලබා දීම | 110 (වගා ළිං) | 177 (ප්‍රතිලාභීන්) |
| 05 | වගා ළිං ප්‍රතිසංස්කරණය කිරීම | රු. මි. 1.0 | වගා ළිංවල රොන් මඩ ඉවත් කිරීම | 100 (වගා ළිං) | 59(වගා ළිං) |
| 06 | කාබනික ගොවිපල ප්‍රවර්ධන වැඩසටහන | රු. මි. 7.0 | කෘෂි රසායන භාවිතය අවම කර කාබනික පොහොර භාවිතා කරමින් වගා කටයුතු සිදු කිරීම | 27 (ප්‍රා.ලේ.කො) | 270 (ප්‍රතිලාභීන්) |
| 07 | මල් වගාව සඳහා ආරක්ෂිත ගෘහ ලබා දීම | රු. මි. 3.0 | ආරක්ෂිත ගෘහ ඉදි කිරීම | 38 (ප්‍රතිලාභීන්) | 29 (ප්‍රතිලාභීන්) |
| 08 | ධීවර ආම්පන්න ලබා දීම | රු. මි. 3.5 | ධීවර ඔරු හා දැල් ලබා දීම | | ඔරු 17 කරමල් දැල් 700 |
| 09 | මත්ස්‍ය ඇඟිල්ලන් මුදා හැරීම | රු. මි. 4.0 | මත්ස්‍ය පැටව් තැන්පත් කිරීම | 2255680 (මත්ස්‍ය) | |
| 10 | මත්ස්‍ය ඇසිත්තන් ජලාශවල තැම්පත් කිරීම | රු. මි. 5.0 | මත්ස්‍ය ඇසිත්තන් ජලාශවලට මුදා හැරීම | | 2,330,000 (මත්ස්‍ය ඇඟිත්තන්) |

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | මුදල (රු.මි) | ව්‍යාපෘති ක්‍රියාකාරකම | ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| 11 | දැල්කූඩු ලබා දීම | රු. මි. 5.0 | මත්ස්‍ය ඇසිත්තන් ඇඟිල්ලන් දක්වා වර්ධනය කර ගැනීම සඳහා ජලාශවලට දැල් කූඩු ලබා දීම | - | 05 (දැල් කූඩු) |
| 12 | විසිතුරු මත්ස්‍ය කර්මාන්තය ප්‍රවර්ධනය | රු. මි. 1.0 | විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ නියැලෙන ප්‍රතිලාභීන් සඳහා අවශ්‍ය උපකරණ ලබා දීම | වට දැල් 55 සෙවන දැල් 05 | 22% |
| 13 | විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ ආශ්‍රිත පුහුණු වැඩසටහන් | රු. මි . 0.5 | පුහුණු වැඩසටහන් පැවැත්වීම | - | 80 (ප්‍රතිලාභීන්) |

**මෙහෙයුම් සමාලෝචනය හා සංවර්ධන වැඩ පිළිබඳ කාර්ය සාධනය -2017**

2017 වර්ෂය සඳහා උතුරු මැද පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය කෘෂි කටයුතු සඳහා රු. මි. 20 ක් හා ධීවර කටයුතු සඳහා රු. මි. 10ක් ලෙස ප්‍රධාන විෂය ක්ෂේත්‍ර දෙක යටතේ ප්‍රතිපාදන වෙන් කර තිබුණි.

**ස්වයං රැකියා ප්‍රවර්ධනය**

කෘෂි කටයුතු සඳහා වෙන් කරන ලද රු. මි. 20ක ප්‍රතිපාදනයන් කෘෂි අලෙවි සමිති සාමාජිකයන්ගේ ස්වයං රැකියා ප්‍රවර්ධනයට වෙන් කරන ලද රු. මි. 3.5 ක මුදලින් රු. මි. 1.6 බැගින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට කෘෂි කර්මාන්තය ආශ්‍රිත ස්වයංරැකියා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන මුදා හරින ලදී. ඒ යටතේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්වල සාරාංශය පහත දැක්වේ.

ඉතිරි රු. මි. 16.5 ක ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘතිවල මෙහෙයුම් ප්‍රතිඵලය හා කාර්ය සාධනය පහත පරිදි දැක්විය හැකිය.

**I . මහඉලුප්පල්ලම ශීතාගාර ආවරණ ගෘහය ඉදිකිරීම - රු. මි. 7.7**

මෙම ව්‍යාපෘතිය මෙම වර්ෂය තුළ නිම කිරීමට සැලසුම් කළ ද මෙම ව්‍යාපෘතියට ප්‍රමාණවත් පරිදි ප්‍රතිපාදන වෙන් කර ගෙන නොතිබීම හා ඇස්තමේන්තු සකස් කිරීමේ ප්‍රමාදයන් හේතු කොට ගෙන නිම කළ නොහැකි වූ අතර 2018 වර්ෂයට අවිච්ඡේද විය.

## II . පුහුණු හා ධාරිතා ප්‍රවර්ධනය

රු. මි. 4ක වැය දරමින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. ඒ යටතේ පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

| අනු අංකය | ක්‍රියාකාරකම | ඉලක්කය (නිලධාරීන් ) | ප්‍රගතිය ( නිලධාරීන් ) |
|---|---|---|---|
| 01. | විසිතුරු මතසා අභිජනනය පිළිබඳ පුහුණු වැඩසටහන | 25 | 25 |
| 02. | ක්ෂේත්‍ර අත්දැකීම් හුවමාරු වැඩසටහන | 26 | 26 |
| 03. | නායකත්ව පුහුණු වැඩසටහන | 25 | 21 |

මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කළ ඉහත ක්‍රියාකාරකම් තුළින් අමාත්‍යාංශයේ නිලධාරීන් 72 ක් සඳහා ක්ෂේත්‍රය තුළ රාජකාරි කිරීමේදි අවශ්‍ය වන්නාවූ තාක්ෂණික දැනුම , අත්දැකීම් හා නායකත්ව කුසලතා වැඩිදියුණු කර ගැනීමට හැකි විය.





## III. කෘෂි සමිති ආශ්‍රිත ධාරිතා ප්‍රවර්ධන වැඩසටහන රු. මි. 3

මෙම ව්‍යාපෘතිය යටතේ කෘෂි සමිති සාමාජිකයන්ගේ තාක්ෂණික දැනුම හා අත්දැකීම් වැඩිදියුණු කිරීම සඳහා පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී. එමඟින් දැනුමෙන් හා අත්දැකීම්වලින් පරිපූර්ණ ගොවි ජනතාවක් නිර්මාණය කර ගැනීමට හැකිවිය.



| අනු අංකය | ක්‍රියාකාරකම | ඉලක්කය (ප්‍රතිලාභීන් ) | ප්‍රගතිය (ප්‍රතිලාභීන් ) |
|---|---|---|---|
| 01 | කාබනික එළවළු වගාව පිළිබඳ පුහුණුව | 270 | 270 |
| 02. | මල් වගා පුහුණු වැඩසටහන | 38 | 38 |
| 03. | ආර්ථික ගෘහ තුළ එළවළු වගාව පිළිබඳ පුහුණුව | 61 | 60 |

## IV. අනාරක්ෂිත වගා ළිං පුනරුත්ථාපනය - රු. මි. 3.4



උතුරු මැද පළාත තුළ අනාරක්ෂිත වගා ළිං ආශ්‍රිතව ගොවිතැන් කරනු ලබන ගොවීන් විශාල පිරිසක් සිටින අතර ඔවුන්ට ස්ථිර ජල සම්පාදන ක්‍රමයක් ඇති කිරීම තුළින් අඛණ්ඩව කෘෂිකර්මාන්තයේ නියැලීමට අවස්ථාව සැලසීම මගින් ඔවුන්ගේ ආර්ථික මට්ටම ඉහළ නැංවීම මෙම ව්‍යාපෘතිය මඟින් සිදු කරන ලදී. ඒ අනුව 2016 වර්ෂයේ ප්‍රතිලාභීන් 157කට ආධාර මුදල් ලබා දෙන ලදී. එමෙන්ම 2017 වර්ෂය තුළ වගා ළිං 110 ක් සඳහා ආධාර ලබාදීමට ඉලක්ක කරන ලද අතර වර්ෂය තුළ දෙවන වාරික ලබා ගැනීමට ඉදිරිපත් වූ පිරිස අඩු බැවින් එම මුදලින් ද නව ඉල්ලුම්කරුවන් සංඛ්‍යාවකට ආධාර මුදල් පළමු වාරිකය ලබා දීමට ද හැකිවිය. ඒ අනුව 2017 වර්ෂයේ ප්‍රතිලාභීන් 177 කට ආධාර මුදල් ලබා දීමට හැකිවිය.

## V. වගා ළිං ප්‍රතිසංස්කරණය කිරීම - රු. මි. 1

මෙම වර්ෂය තුළ පැවති අධික වියළි කාලගුණ තත්වය හමුවේ ළිං ආශ්‍රිත වගාවන් සඳහා උග්‍ර ජල හිඟයකට මුහුණ පෑමට සිදු විය. එමනිසා පැවති වගාවන් විනාශවීමට පටන්ගත් අතර ඊට කඩිනම් විසඳුමක් ලෙස වගා කටයුතු සිදු කරනු ලැබූ වගා ළිං වල රොන්මඩ ඉවත් කර යම් ප්‍රමාණයක් ගැඹුරු කර ජලය සපයා ගැනීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. ඒ යටතේ වගා ළිං 100 ක් ප්‍රතිසංස්කරණය කිරීමට සැලසුම් කලද අදාල කාලය තුළ වගා ළිං 59 ක් ප්‍රතිසංස්කරණය කිරීමට හැකි විය . ඊට හේතු වුයේ වැඩසටහන ආරම්භවීමත් සමඟ මාස් කන්නය සඳහා වර්ෂාව ලැබීම නිසා ඉතිරි වගා ළිං ප්‍රතිසංස්කරණය කිරීම අවශ්‍ය නොවීය.

## VI. කාබනික ගොවිපළ ප්‍රවර්ධන වැඩසටහන රු. මි. 7

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන් 10 බැගින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 27 න් ප්‍රතිලාභීන් 270 ක් තෝරා ගෙන අවමය අක්කර ¼ ක කෘෂි රසායන භාවිතය අවම කර කාබනික පොහොර භාවිතා කර වගා කටයුතු සිදු කර එමඟින් ගොවීන් දිරි ගැන්වීමටත් අනෙකුත් ගොවීන් සඳහා ආදර්ශයක් ලබා දීමටත් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව ප්‍රතිලාභීන් 270 දෙනෙකු සඳහා ගෙවතු බීජ කට්ටල නොමිළේ ලබා දුන් අතර ආදර්ශ ගෙවතු 270 ක් සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී.



## VII. මල් වගාව සඳහා ආරක්ෂිත ගෘහ ලබා දීම රු. මි. 3

මේ යටතේ ප්‍රතිලාභීන් 38 දෙනෙකු සඳහා රු. 140,000 වටිනා ආරක්ෂිත ගෘහ 50 % ප්‍රතිලාභ දායකත්ව මත ඉදිකිරීමට කටයුතු කරන ලදී. නමුත් 50 % ප්‍රතිලාභී දායකත්වය සපයා ගැනීමට නොහැකි වීම හේතුවෙන් ප්‍රතිලාභීන් 09 දෙනෙකු අදාල ව්‍යාපෘතියෙන් ඉවත් විය. ඉතිරි 31 දෙනා අදාල ව්‍යාපෘතිය සාර්ථකව සිදු කරයි.

උතුරු මැද පළාත් කෘෂිකර්ම හා ධීවර අමාත්‍යාංශයට ධීවර ජලය සඳහා 2017 වර්ෂය සඳහා රු. මි. 10 ක් ලැබුණු අතර ඒ යටතේ ප්‍රධාන ව්‍යාපෘති 06 ක් ක්‍රියාත්මක කරන ලදී.

### ධීවර ආම්පන්න ලබා දීම. රු. මි. 3.5

පළාත තුළ ධීවර කර්මාන්තයේ නියැලෙන ධීවර කාර්මිකයන්ගෙන් ධීවර ඔරු සහ දැල් සඳහා විශාල ඉල්ලුමක් තිබුණ ද එම සම්පූර්ණ ඉල්ලුම සපුරාලීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැත. එබැවින් 2016 වර්ෂයේ දි ධීවර යාත්‍රා 21 ක් ද , කරමල් දැල් 600 ක්ද ලබා දුන් අතර 2017 වර්ෂයේ පැවති ප්‍රතිපාදන යටතේ ඔරු 17 ක් සහ කරමල් දැල් 700 ක් ධීවර කාර්මිකයන් අතර බෙදා දෙන ලදී. එමඟින් එම ප්‍රතිලාභීන් මේ වන විට සාර්ථකව එම කර්මාන්තයේ නියැලී සිටී.








### මත්ස්‍ය ඇඟිලිලන් මුදා හැරීම - රු. මි. 4

උතුරු මැද පළාත තුළ ප්‍රධාන ජීවනෝපාය මාර්ගයක් ලෙස මිරිදිය ධීවර කරමාන්තය දැකිය හැක. මෙම කර්මාන්තයේ සාර්ථකත්වය මෙන්ම එහි නිරත කාර්මිකයන්ගේ ආර්ථික මට්ටම නඟා සිටුවීමටත්, ප්‍රදේශයේ ජනතාවගේ මත්ස්‍ය පරිභෝජනය ඉහළ නැංවීමටත්, මත්ස්‍ය අස්වැන්න ඉහළ දැමිය යුතුයි. ඒ සඳහා ජලාශවල මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා මත්ස්‍ය පැටවු තැම්පත් කිරිම සිදුකළ යුතුය.

පළාතේ පවතින ජලාශ වලින් ලැබෙන මුළු ඉල්ලුම සපුරාලීම සඳහා මත්ස්‍ය පැටවු සපයා ගැනීමට නොහැකි වූ අතර පළාතම ආවරණය වන පරිදි 2016 වර්ෂය තුළ රුපියල් මිලියන 3 ක් වැය කරමින් මත්ස්‍ය පැටවු 1,500,000 ක් ද 2017 වර්ෂය තුළ මත්ස්‍ය පැටවු 2,255,680ක්ද ජලාශවල තැන්පත් කරන ලදී.

### I. මත්ස්‍ය ඇසිත්තන් ජලාශවල තැම්පත් කිරීම. රු. මි . 5

මත්ස්‍ය ඇඟිල්ලන් ලබා දීම සඳහා ප්‍රමාණවත් පරිදි සපයා ගැනීම කළ නොහැකි නිසාත් ඒ සඳහා වැඩි පිරිවැයක් දැරීමට සිදුවන නිසාත් ඊට පිළියමක් ලෙස මත්ස්‍ය ඇසිත්තන් ඇඟිල්ලන් දක්වා අදාල ජලාශ තුළම ඇති කර එම ජලාශයට මුදා හැරීම සඳහා සිදු කරන ලදී. ඒ අනුව දැල් කූඩු සහිත ජලාශ සඳහා වර්ෂය තුළ මත්ස්‍ය ඇඟිත්තන් 2,330,000 ක් දැල් කූඩු තුළ තැම්පත් කර ජලාශවලට මුදා හරින ලදී.

### II. දැල්කූඩු ලබා දීම - රු. මි. 5

මත්ස්‍ය ඇසිත්තන් ඇඟිල්ලන් දක්වා වර්ධනය කර ගැනීම සඳහා ජලාශවලට දැල් කූඩු ලබා දීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කරන ලද අතර ඒ යටතේ දැල් කූඩු සඳහා විශාල ඉල්ලුමක් පවති. එබැවින් 2016 වර්ෂයේ දැල් කූඩු 36 ක් නොමිළේ ලබා දෙන ලදී. නමුත් 2017 වර්ෂයේ පැවති ප්‍රතිපාදන යටතේ ජලාශ සඳහා දැල් කූඩු 5 ක් ලබා දුන් අතර එම දැල් කූඩු වල මේ වන විට මත්ස්‍ය ඇසිත්තන් ඇඟිල්ලන් දක්වා වර්ධනය කර ජලාශ තුළට මුදා හැරීමේ කටයුතු සිදු කරනු ලැබේ.

### III. විසිතුරු මත්ස්‍ය කර්මාන්තය ප්‍රවර්ධනය රු. මි. 1

මෙම ව්‍යාපෘතිය යටතේ විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ නියැලෙන ප්‍රතිලාභීන් සඳහා අවශ්‍ය උපකරණ ලබා දීමට සැලසුම් කරන ලදී. ඒ අනුව පළාත තුල මෙම කර්මාන්තයේ නියැලෙන පිරිස් විසින් උපකරණ සඳහා විශාල ඉල්ලුමක් ඉදිරිපත් කරන ලදී. ඒ අනුව අදාල උපකරණ මිළදී ගැනීම සඳහා මිළ ගණන් කැඳවන ලදී. ඉන්පසුව තෝරාගත් ප්‍රතිලාභීන් සඳහා අදාල උපකරණ වලට 50 % ප්‍රතිලාභ දායකත්වය ලබා දෙන ලෙස දැනුම් දුන්නද වර්ෂය අවසාන වනතෙක්ම ප්‍රමාණවත් ප්‍රතිලාභීන් සංඛ්‍යාවක් 50 % ප්‍රතිලාභ දායකත්වය ලබා නොදුන් නිසා මෙම ව්‍යාපෘතියට වෙන් කරන ලද මුළු ප්‍රතිපාදනයටම නියමිත උපකරණ මිලදී ගැනීමට නොහැකි විය. 2016 වර්ෂයේ වට දැල් 50 ක් සහ 2017 වර්ෂයේ වට දැල් 55 ක් ද ලබා දෙන ලදී. එමෙන්ම 2016 වර්ෂයේ ,



කුරුලු දැල් 50 , ඔක්සිජන් සිලින්ඩර් 9 , ජල විදුලි මෝටර් 25 ක් ද ලබා දෙන ලදී.

තවද 2017 වර්ෂයේ පැවති ප්‍රතිපාදන යටතේ සෙවන දැල් 05 ක් පමණක් මෙම ව්‍යාපෘතිය යටතේ මිලදී ගන්නා ලදී. ඒ අනුව මෙම ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය 22 % ක් තරම් ඉතා

අඩු මට්ටමකට පත් විය. උපකරණ ලබා ගත් ප්‍රතිලාභීන් අදාල යෙදවුම් භාවිතා කරමින් ඔවුන්ගේ කර්මාන්තය සාර්ථකව කරගෙන යමින් සිටී.

### IV.විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ ආශ්‍රිත පුහුණු වැඩසටහන් පැවැත්වීම-රු. මි . 0.5

මෙම ව්‍යාපෘතිය යටතේ විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ නියැලෙන ප්‍රතිලාභීන් 80 ක් සඳහා රම්බඩගල්ල පුහුණු මධ්‍යස්ථානයේදී දින 3 බැගින් වූ පුහුණු වැඩසටහන් 2 ක් පවත්වන ලදී. ඒ සඳහා ප්‍රතිලාභීන් 70 ක් සහ නිලධාරීන් 10 ක් වන සේ 80 ක් පුහුණුව සඳහා සහභාගී විය.

එමඟින් විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ දැනට නියැලෙන අය සඳහා එම කර්මාන්තය තව දුරටත් සාර්ථක කර ගෙන යාමට මෙම ව්‍යාපෘතිය උපකාරී විය .

තවද මෙම ක්ෂේත්‍රයට පැමිණෙන නවක ව්‍යවසායකයන්ටද ස්වයං රැකියාවක් ලෙස විසිතුරු මත්ස්‍ය කර්මාන්තය ආරම්භකර පවත්වාගෙන යාමට මෙම ව්‍යාපෘතිය තුළින් මඟ පෙන්වීමක් සිදු කරන ලදී.

### සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මඟින් කෙටිකාලීනව අපේක්ෂා කරන ප්‍රතිලාභ

| අනු අංකය | ව්‍යාපෘතිය | කෙටි කාලීන බලපෑම (outcome) |
|---|---|---|
| 01. | ශීතාගාර ආවරණ ගෘහය ඉදි කිරීම | • ලොකු ළූණු ව්‍යාප්තිකරණය සඳහා රැගෙන යාමේ පිරිවැය අවම වීම.<br>• ලොකු ළූණු නිෂ්පාදනය ඉහළ යෑම.<br>• ගොවීන්ගේ ආදායම ඉහළ යෑම<br>• ලොකුළූණු වගාවේ සත්‍ය බීජ නිෂ්පාදනය ඉහළ යාම |
| 02. | පුහුණු හා ධාරිතා සංවර්ධනය | • නිලධාරීන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය වීම<br>• නිලධාරීන්ගේ නායකත්ව හැකියාවන් වර්ධනය වීම<br>• අත්දැකීම් වැඩි දියුණු වීම<br>• අභිප්‍රේරණය වීම |
| 03. | කෘෂි සමිති ආශ්‍රිත ධාරිතා ප්‍රවර්ධනය | • ව්‍යවසායකත්ව හැකියාවන් සංවර්ධනය වීම<br>• වස විසෙන් තොර ආහාර රටාවකට හුරු වීම<br>• නව කෘෂි ව්‍යවසායකයින් බිහිවීම<br>• නව කෘෂි තාක්ෂණික දැනුම ගොවීන්ට ලැබීම |
| 04 | අනාරක්ෂිත වගා ළිං පුනරුත්තාපනය | • ගොවීන්ගේ වගා කටයුතු සඳහා අඛණ්ඩව ජල සැපයුම තහවුරු කිරීම.<br>• ගොවීන්ට අඛණ්ඩව වගා කටයුතු සිදුකළ හැකිවීමෙන් ඔවුන්ගේ ආදායම් තත්වයේ ස්ථිර භාවයක් ඇතිවීම.<br>• අඛණ්ඩව එළවළු නිෂ්පාදනයක් වෙළෙඳපළට ලැබීම<br>• අනාරක්ෂිත වගා ළිංවලින් ඇතිවිය හැකි අහිතකර |

| | | |
|---|---|---|
| 04 | අනාරක්ෂිත වගා ළිං පුනරුත්තාපනය | බලපෑම් නැතිවීම<br>• වගා නොවන ඉඩම් වගා කටයුතු සඳහා යොදා ගැනීම<br>• විරැකියාව අවම වීම<br>• දරිද්‍රතාවය අවම වීම |
| 05 | කාබනික ගොවිපල ප්‍රවර්ධන වැඩසටහන | • වසවිසෙන් තොර එළවළු නිෂ්පාදනය කිරීම<br>• වගා නොවන ඉඩම් වගා කටයුතු සඳහා යොමු කිරීම<br>• ගොවීන්ට අමතර ආදායමක් ලැබීම<br>• වස විසෙන් තොර එළවළු වගාව පිළිබඳව ගොවීන් දැනුවත් වීම<br>• වග ළිං වල ඵලදායිතාවය ඉහළ නැංවීම<br>• වගාවේ නිෂ්පාදන පිරිවැය අවම වීම |
| 06 | කෘෂි වගා ළිං ප්‍රතිසංස්කරණය කිරීම (වගා ළිං වල රොන්මඩ ඉවත් කිරීම ) | • නියං කාලයේදී ඇතිවූ ජල හිඟයට කෙටිකාලීන විසඳුමක් ලැබීම<br>• නියඟයෙන් වගාවන් සඳහා සිදුවෙමින් තිබූ හානිය අවම කර ගත හැකි වීම<br>• ගොවීන්ගේ ආදායම් මට්ටම ස්ථිර කර ගැනීමට මෙන්ම ඉහළ දැමීමටද හැකි වීම<br>• එළවළු නිෂ්පාදනය ඉහළ නංවා ගැනීමට හැකි වීම.<br>• වෙළෙඳපොළ එළවළු මිල ඉහළ යාමෙන් ජනතාවට සිදුවන බලපෑම අවම කර ගත හැකිවීම.<br>• නියඟයෙන් පීඩාවට පත් ගොවීන්ට යම් සහනයක් ලබා දීමට හැකි වීම |
| 07 | කුඩා පරිමාණ මල් වගා කරුවන් සංවර්ධනය කිරීමේ වැඩ සටහන | • ගොවීන්ගේ ආදායම් මට්ටම ඉහළ නැංවීම<br>• ප්‍රදේශයේ මල් නිෂ්පාදනය හා අලෙවිය ඉහළ නැංවීම<br>• ස්වයංරැකියා අවස්ථාවන් වැඩි දියුණු කිරීම<br>• මෙම ක්ෂේත්‍රයේ නව රැකියා අවස්ථාවන් බිහි කිරීම.<br>• ස්වයංරැකියා සඳහා කාන්තා සහභාගීත්වය වැඩි වීම |
| 08 | ධීවර ආම්පන්න ලබා දීම | • ධීවර කාර්මිකයන්ට පහසුවෙන් මත්ස්‍ය අස්වැන්න නෙලා ගැනීමට හැකි වීම.<br>• ධීවර කාර්මිකයින්ගේ ජීවිත සුරක්ෂිතතාවය ඇතිවීම.<br>• තහනම් ආම්පන්න ධීවර කර්මාන්තයේ යොදා ගැනීම පාලනය වීම.<br>• ධීවර කර්මාන්තයේ ඵලදායිතාවය හා කාර්යක්ෂමතාවය ඉහළ යෑම.<br>• ධීවර කාර්මිකයින්ගේ ආදායම් මට්ටම ඉහළ යෑම.<br>• ධීවර කාර්මික පවුල්වල ආර්ථික මට්ටම ඉහළ නැංවීම. |
| 09 | ජලාශ සඳහා මත්ස්‍ය ඇඟිල්ලන් මුදා හැරීම | • පළාතේ මත්ස්‍ය අස්වැන්න ඉහළ යාම.<br>• ධීවර කාර්මිකයන්ගේ ආදායම් මට්ටම ඉහළ යාම තුළින් එම පවුල් වල ආර්ථික මට්ටම වැඩි දියුණු වීම.<br>• පළාතේ ජනතාවගේ මත්ස්‍ය පරිභෝජනය ඉහළ යාම තුළින් පෝෂණ මට්ටම ඉහළ යාම<br>• මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ යාම තුළින් ධීවර ක්ෂේත්‍රය තුල ස්වයංරැකියා අවස්ථා ජනිත වීම. |

| | | |
|---|---|---|
| 09 | ජලාශ සඳහා මත්ස්‍ය ඇඟිල්ලන් මුදා හැරීම | • මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය අඩු වෙනත් ප්‍රදේශවල ජනතාවට පරිභෝජනය සඳහා අතිරික්ත මත්ස්‍ය නිෂ්පාදනය අලෙවි කිරීම |
| 10 | මත්ස්‍ය ඇසිත්තන් කූඩුවල ඇඟිල්ලන් දක්වා වර්ධනය කිරීම | • දැල් කූඩුවල මත්ස්‍ය ඇසිත්තන් ඇඟිල්ලන් දක්වා වර්ධනය කර ගැනීම තුලින් මත්ස්‍ය ඇඟිල්ලන් ලබා දීමේ පිරිවැය අවම වීම .<br>• ජලාශය තුළට ඇසිත්තන් ඇඟිල්ලන් දක්වා වර්ධනය කිරීම හේතුවෙන් ජලාශයට මුදා හැරීමෙන් පසු විනාශ වන ප්‍රමාණය අවම වීම .<br>• මත්ස්‍ය ඇඟිල්ලන් සඳහා පවතින ඉල්ලුම අඛණ්ඩව සම්පූර්ණ කළ හැකි වීම.<br>• ජලාශ සඳහා අවශ්‍ය මත්ස්‍ය පැටවු ගහනය නිසි පරිදි පවත්වා ගැනීමට හැකි වීම. |
| 11 | ජලාශ සඳහා දැල් කූඩු ලබා දීම | • ජලාශ සඳහා අවශ්‍ය මත්ස්‍ය ඇඟිල්ලන් ප්‍රමාණය අඛණ්ඩව ලබා දීමට හැකි වීම.<br>• මත්ස්‍ය ඇඟිල්ලන් ලබා දීමේ පිරිවැය අවම වීම<br>• මත්ස්‍ය නිෂ්පාදනය වර්ධනය වීම .<br>• මත්ස්‍ය ඇඟිල්ලන් මුදා හැරීමේ දී සිදුවන හානිය අවම වීම . |
| 12 | විසිතුරු මත්ස්‍ය කර්මාන්තය සඳහා උපකරණ ලබා දීම | • මෙම ක්ෂේත්‍රයේ නියුතු අය සඳහා ආර්ථික සානුබලයක් ලැබීම.<br>• විසිතුරු මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම.<br>• විසිතුරු මත්ස්‍ය නිෂ්පාදන අංශයේ ස්වයංරැකියාවල සේවා නියුක්තිය ඉහළ යාම.<br>• විසිතුරු මසුන් අපනයනය තුලින් විදේශ විනිමය ලැබීම.<br>• නවක ව්‍යාවසායකයින් මෙම ක්ෂේත්‍රයට යොමු කර ගැනීම සඳහා දිරි ගැන්වීමක් සිදු වීම. |
| 13 | පුහුණු වැඩසටහන් පැවැත්වීම | • විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ නියැලෙන ව්‍යාවසායකයින්ගේ දැනුම , කුසලතා සහ ආකල්ප සංවර්ධනය වීම.<br>• නව ස්වයංරැකියා අවස්ථා නිර්මාණය කිරීම.<br>• විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ ඵලදායිතාවය හා කාර්යක්ෂමතාවය වර්ධනය වීම.<br>• මෙම කර්මාන්තය පළාත තුළ ප්‍රචලිත කිරීම තුළින් පළාතේ විසිතුරු මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ යාම.<br>• අපනයන වෙළඳපොලට සුදුසු ආකාරයේ විසිතුරු මසුන් නිෂ්පාදනය වීම. |

## වෙනත් රේඛීය අමාත්‍යාංශ , දෙපාර්තමේන්තු වලින් ලද ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| අනු අංකය | ව්‍යාපෘතිය | අරමුණ | මුදල | | ප්‍රගතිය | | ලැබුණු කෙටිකාලීන /දිගුකාලීන ප්‍රතිඵල |
|---|---|---|---|---|---|---|---|
| | | | වෙන් කළ (රු.මි) | වැය කළ (රු.මි) | භෞතික (%) | මූල්‍ය (%) | |
| 1 | ධිවර කර්මාන්තයට අවශ්‍ය දැල් කූඩු හා කොල්ලෑ ලබා දීම | ජලාශවල ධීවර කාර්මිකයින්ගේ මසුන් ඇල්ලීමේ ප්‍රයත්නයන් ඉහල නැංවීම | 5.00 | 2.00 | 40 | 40 | මත්ස්‍ය නිෂ්පාදනය වර්ධනය වීම |
| 2 | තිරසර බලශක්ති ප්‍රභවයන් කෘෂි කර්මාන්තයට යොදා ගැනීම යටතේ සූර්ය බලශක්තියෙන් ක්‍රියාත්මක අගල් 2 විදුලි ජල මෝටර් ලබා දීම | ජාතික විදුලි බල පද්ධතියෙන් විදුලිය ලබා දිය නොහැකි ස්ථාන සඳහා විදුලිය ලබාදීම සහ විදුලිබලය සඳහා වැය වන පිරිවැය අවම කිරීම . | 2.50 | 1.18 | 50 | 47 | විදුලි බලය ලබා ගැනීම සඳහා වැය වන ඉන්ධන පරිභෝජනය අවම වීම. |
| 3 | තිරසර සංවර්ධන පාසල් සමාජ පිහිටුවීම.( මැදවච්චිය මෛත්‍රීපාල සේනානායක විද්‍යාලයේ ස්ථිර කාබනික පොහොර සකස් කිරීමේ ජීව කොටුවක් ඉදි කිරීම) | කාබනික පොහොර නිෂ්පාදනය සඳහා පාසල් ළමුන් යොමු කිරීම | 0.28 | 0.28 | 100 | 100 | වස විසෙන් තොර එළවළු පරිභෝජනය සඳහා පාසල් ළමුන් හුරු කිරීම හා පවුල වලට අමතර ආදායමක් ලබා ගත හැකි වීම |

පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් 2017 වර්ෂයේදී ඉලක්කගත වැඩසටහන් ක්‍රියාත්මක කරමින් සැලකිය යුතු කාර්ය සාධනයක් කරා ආයතනය රැගෙන යාමට හැකි වි ඇත. එහිදී අමාත්‍යාංශයට වගකීම පැවරී ඇති ධීවර විෂයේ සංවර්ධනය උදෙසා හා ධීවර අංශයේ සංවර්ධනය උදෙසා ඉලක්කගත වැඩසටහන සැලසුම්සහගතව ක්‍රියාත්මක කළ හැකි විය.

එසේම අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණය යටතේ පවතින අනෙකුත් දෙපාර්තමේන්තු 2017 වර්ෂයේ ක්‍රියාත්මක සැලැස්ම ඉලක්ක කරා ළඟා විමට අවශ්‍ය මාර්ගෝපදේශය හා උපදෙස් ලබා දීම සිදු විය. ඒ යටතේ මාසික හා අවශ්‍ය අවස්ථාවන්හීදී ප්‍රගතිය සමාලෝචනය කිරීමද ක්ෂේත්‍ර නිරීක්ෂණ මගින් සංවර්ධන ව්‍යාපෘති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමටත් අවශ්‍ය මැදිහත්වීම් සිදු කරන ලදී.

ඒ අනුව 2017 වර්ෂයේදී අපේක්ෂිත කාර්ය සාධන ඉලක්ක කරා ළඟා වීමට හැකි විය.

මෙය හිස්ව තබන ලද පිටුවකි.

# පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

7.1

## දැක්ම

“තෘප්තිමත් හා සෞභාග්‍යමත් ගොවි ප්‍රජාවක් සහිත සමෘද්ධිමත් පළාතක් බිහි කිරීම”.

## මෙහෙවර

“නව යෝග්‍ය කෘෂිකාර්මික තාක්ෂණය හා කෘෂිකාර්මික යටිතල පහසුකම් භාවිතයෙන් ආහාර සුරක්ෂිතතාව හා පරිසර හිතකාමී කෘෂිකර්මාන්තය, වාණිජ කෘෂිකර්මාන්තය හා කෘෂි ව්‍යාපාර සියළුම පාර්ශවකරුවන්ගේ මනා සහයෝගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව සංවර්ධනය කිරීම”.

## දිගුකාලීන හා කෙටිකාලීන අරමුණු

### දිගුකාලීන අරමුණු

- වී, අතිරේක බෝග,අල බෝග,එළවළු හා වෙනත් ආහාර බෝග සඳහා ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්ති හා පළාත් කෘෂිකර්ම අවශ්‍යතාවයන් හා ප්‍රමුඛතාවයන් මත පිහිටා විශිෂ්ට පළාත් කෘෂිකර්ම සංවර්ධන වැඩසටහන් ඉහළ කාර්යක්ෂමතාවයකින් හා ඵලදායිතාවයකින් සාක්ෂාත් කර ගැනීම.
- පළාත් කෘෂිකර්ම සංවර්ධන වැඩසටහන් තුළින් ගොවීන්ගේ ජීවන තත්වය ඉහළ නැංවීම, දිළිඳුකම පිටු දැකීම හා ජාතික ආහාර සුරක්ෂිතතාව හා යහපත් කෘෂි පිළිවෙත් අනුගමනය මගින් ගුණාත්මක හා ආරක්ෂාකාරි ආහාර නිෂ්පාදනය, පරිසර හිතකාමී කෘෂිකර්මාන්තයක් ළඟාකර ගැනීම.
- ජලය හා පස සංරක්ෂණය කර ගනිමින්, වෙනස් වන සමාජ, ආර්ථික හා කාලගුණික ප්‍රවණතාවයකට අනුකූලවන සේ සැකසූ වැඩසටහන් තුළින් තිරසාර කෘෂිකාර්මික ක්‍රමෝපායන් ළඟාකර ගැනීම.
- උසස් ගුණත්වයෙන් යුතු බීජ හා රෝපණ ද්‍රව්‍ය පළාත තුළ සුලභ කිරීම.
- දේශීය හා විදේශීය වෙළඳපොළ ඉලක්ක කර ගත් කෘෂිකර්මාන්තයට අවශ්‍ය සංවර්ධන වැඩසටහන් දියත් කිරීම තුළින් පළාතේ ගොවි ජනතාවගේ කෘෂි ව්‍යවසාය හැකියාවන් වර්ධනය කිරීම තුළින් තෘප්තිමත් ගොවි ජනතාවක් බිහි කිරීම.

### කෙටිකාලීන අරමුණු

- නව හා යෝග්‍ය කෘෂි තාක්ෂණය උතුරු මැද පළාත තුළ ප්‍රචලිත කිරීම
- ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය
- ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීම.
- පරිසර හිතකාමී කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය.
- වාණිජ කෘෂිකර්මාන්තය හා කෘෂි ව්‍යාපාර ප්‍රවර්ධනය.
- කෘෂිකාර්මික යටිතල පහසුකම් සංවර්ධනය.

### ප්‍රධාන කාර්යයන්

- ✓ යහපත් ව්‍යාප්ති සේවාවක් සැපයීම සඳහා ගොවිජනතාවට නව තාක්ෂණය හඳුන්වා දීම තුළින් ඔවුන්ගේ දැනුම , ආකල්ප, කුසලතාවයන් වර්ධනය කිරීම.
- ✓ ගුණාත්මක බීජ හා රෝපන ද්‍රව්‍ය නිෂ්පාදනය හා සුලභතාවය ඇතිකිරීම.
- ✓ පැළෑටි සංරක්ෂණ පනත, පාංශු සංරක්ෂණ පනත, පළිබෝධනාශක පාලන පනත, බීජ පනත වැනි පනත් ක්‍රියාත්මක කිරීම.

- ✓ මහඉළුප්පල්ලම සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයෙන් ක්ෂේත්‍ර පුහුණු හා ප්‍රායෝගික සේවාස්ථ පුහුණු ගොවීන් හා නිලධාරීන් වෙත ලබා දීම.
- ✓ පළාත තුළ පරිසර හිතකාමී යහපත් කෘෂි පිළිවෙත් අනුගමනය කරන කෘෂිකාර්මික නිෂ්පාදන ක්‍රමවේදයන් ප්‍රචලිත කිරීම.
- ✓ රටේ ආහාර සුරක්ෂිතතාවය ඇතිකිරීම මගින් ආහාර ද්‍රව්‍ය ආනයනය අඩු කිරීම.
- ✓ පළාත තුළ කෘෂිකර්මය මත පදනම් වූ කර්මාන්ත හා ව්‍යවසායකයින් හඳුනාගෙන වැඩි දියුණු කිරීම.
- ✓ ගොවීන්ගේ කෘෂි තාක්ෂණික ගැටළු හඳුනාගෙන පර්යේෂණ ආයතනයන් වෙත යොමු කිරීම.
- ✓ කෘෂිකර්මයට අදාල දත්ත හා තොරතුරු ජාලයක් හා තොරතුරු කේන්ද්‍රයක් පවත්වා ගැනීම තුළින් ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව සහ වෙනත් රාජ්‍ය ආයතනයන් මෙන්ම තොරතුරු දැන ගැනීමේ අදාල අය වෙත තොරතුරු ලබා දීම.
- ✓ කෘෂිකර්ම අමාත්‍යාංශය හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයන් සඳහා අවශ්‍ය දායකත්වය ලබා දීම.

## ප්‍රධාන උපාය මාර්ගයන්

01. වී සහ අතිරේක බෝග සඳහා නව තාක්ෂණය හඳුන්වා දීමට බෝග ආදර්ශණ සහ ක්‍රම, ආදර්ශණ කියාත්මක කිරීම.

02. පරිසර හිතකාමී කෘෂිකර්මය සඳහා ඒකාබද්ධ පාලන ක්‍රම හා යහපත් කෘෂි පිළිවෙත් අනුගමනය කරන වැඩසටහන් කිරීම.

03. අස්වනු වැඩි කිරීම සඳහා බෝගවලට ඒකාබද්ධ පැළෑටි පෝෂණ ආදර්ශණ ක්‍රියාත්මක කිරීම හා වී සඳහා පැරිෂූට් තාක්ෂණය හඳුන්වා දීම වැනි නව උචිත තාක්ෂණයන් හඳුන්වා දිම.

04. වී සහ අතිරේක බෝගවල ගුණාත්මක බීජ සුලභ කිරීම සඳහා බීජ නිෂ්පාදන යාය පිහිටුවීම හා බීජ පනත ක්‍රියාත්මක කිරීම.

05. වී සහ අතිරේක බෝග සඳහා නව තාක්ෂණය හඳුන්වා දීමට බෝග ආදර්ශණ සහ ක්‍රම, ආදර්ශණ ක්‍රියාත්මක කිරීම.

06. නව කෘෂි ව්‍යවසායකයින් බිහි කිරීම සඳහා ගොවි කාන්තා හා තරුණ ගොවි සමාජ පිහිටු වීම හා කෘෂි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

07. පාංශු සංරක්ෂණය දිරිමත් කිරීම සඳහා පාංශු සංරක්ෂණ පනත ක්‍රියාත්මක කිරීම.

08. පළිබෝධ පාලන නියාමනය සඳහා පළිබෝධ පාලන පනත ක්‍රියාත්මක කිරීම.

09. කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ යාන්ත්‍රීකරණය හඳුන්වා දිම තුළින් ඵලදායිතාව ඉහළ නැංවීම.

### කාර්යය මණ්ඩල සංයුතිය

| විස්තරය | අනුමත සංඛ්‍යාව |
|---|---|
| අනුමත සංඛ්‍යාව | 382 |
| සේවයේ නියුතු සංඛ්‍යාව | 234 |
| පුරප්පාඩු සංඛ්‍යාව | 152 |
| අනියම්/කොන්ත්‍රාත්/තාවකාලික පදනමේ සිටින සංඛ්‍යාව | 16 |

### මෙහෙයුම් ප්‍රතිඵල - පුනරාවර්තන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි.) | 2017 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පෞද්ගලික පඩිනඩි | 113.65 | 111.78 | 1.87 | 98.35 |
| ගමන් වියදම් | 3.50 | 3.15 | 0.35 | 90 |
| සැපයීම් | 6.30 | 6.11 | 0.19 | 96.98 |
| නඩත්තු වියදම | 5.22 | 4.84 | 0.38 | 92.72 |
| ගිවිසුම්ගත සේවා | 6.58 | 6.03 | 0.55 | 91.64 |
| මාරු කිරීම | 0.45 | 0.39 | 0.06 | 86.66 |
| සහනාධාර | 1.35 | 1.31 | 0.04 | 97.03 |
| **එකතුව** | **137.05** | **133.61** | **3.44** | **97.48** |

### මූලධන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි.) | 2017 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 31.39 | 28.15 | 3.24 | 89.68 |
| යන්ත්‍ර සූත්‍ර | 2.99 | 2.35 | 0.65 | 78.59 |
| වාහන | 1.50 | 1.22 | 0.28 | 81.33 |
| වෙනත් මූලධන වත්කම් පුනරාවර්තනය හා වැඩිදියුණු කිරීම | 5.35 | 5.31 | 0.04 | 99.25 |
| **එකතුව** | **41.24** | **37.04** | **4.21** | **89.82** |

## *අංශය තුළින් ඉටුකර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු අංක - 02*

**සාගින්න නැතිකර, ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්වයක් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම.**

2.1. 2030 වන විට සාගින්න තුරන් කිරීම සහ විශේෂයෙන්ම ළදරුවන් ද ඇතුළත්ව දරිද්‍රතාවයෙන් පෙළෙන සහ අවදානමට ලක් වී තිබෙන ජනතාවට ආරක්ෂාකාරී,පෝෂණයෙන් යුත් ප්‍රමාණවත් ආහාර වසර පුරා ලබා ගැනීමට හැකි වීම.

2.4. 2030 වන විට තිරසර ආහාර නිෂ්පාදන පද්ධති පැවතීම තහවුරු කිරීම සහ ජෛව පද්ධති පැවතීම තහවුරු කිරීම.

2.5. 2020 වන විට බීජවල,වගා කරන ලද ශාකවල සහ ගොවිපළ සහ ගෘහාශ්‍රිත සතුන්ගේ ජානමය විවධත්වය පවත්වාගෙන යාම.

2.a. කෘෂිකාර්මික නිෂ්පාදන ධාරිතාවය වැඩි කිරීම සඳහා ග්‍රාමීය යටිතල පහසුකම්,කෘෂිකාර්මික පර්යේෂණ සහ ව්‍යාප්ති සේවාවන් තාක්ෂණ සංවර්ධනය සහ ශාක සහ පශු සම්පත් ජාන බැංකු සඳහා සිදු කරන ආයෝජනය වැඩි කිරීම.

## *අංශය තුළින් ඉටුකර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු අංක -12*

**තිරසර පරිභෝජන සහ නිෂ්පාදන රටාවන් සහතික කිරීම.**

12.1. තිරසර පරිබෝජනය හා නිෂ්පාදනය සම්බන්ධයෙන් වන දස අවුරුදු වැඩ සැලැස්ම සංවර්ධනය වූ රටවල ප්‍රධානත්වයෙන් සියළුම රටවල් විසින් ක්‍රියාත්මක කිරීම.

12.2. 2030 වන විට ස්වභාවික සම්පත් තිරසර අන්දමින් කළමනාකරණය කිරීම හා කාර්යක්ෂමව භාවිතා කිරීම වෙත ළඟා වීම.

12.3. 2030 වන විට සිල්ලර හා පරිබෝජන මට්ටම්වල ඒක පුද්ගල ආහාර අපතේ යාම අවම කිරීම සහ පශ්චාත් අස්වනු හානි ඇතුළුව නිෂ්පාදන හා සැලයුම් දාමයන්හී සිදුවන්නා වූ අපතේ යාම අවම කිරීම.

12.4. 2020 වන විට පරිසර හිතකාමී අන්දමට රසායනික ද්‍රව්‍ය හා සියළුම අපද්‍රව්‍ය කළමනාකරනය කිරීම ක්‍රියාවට නැංවීම.

12.8. 2030 වන විට සියළුම ප්‍රදේශවල සිටින සියළුම දෙනාට තිරසාර සංවර්ධනය හා ස්වභාධර්මය සමග සුසංයෝගයෙන් යුත් ජිවන රටාවන් ගත කිරීම පිළිබඳව දැනුවත්භාවය තහවුරු කිරීම.


## අංශය තුළින් ඉටුකර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු අංක -13

**දේශගුණික විපර්යාස බලපෑම්වලට එරෙහිව කඩිනමින් ක්‍රියාත්මක වීම.**

පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන අවිච්ඡේද යටතේ තමන්කඩුව පශු වෛද්‍ය කාර්යාලයේ අළුත්වැඩියාව සඳහා රු.මි.0.99ක් මුදලක් අනුමත වී තිබුණ ද ප්‍රමාණය ඉක්ම වූ වැඩ (වහලය අළුත්වැඩියාව) ඉටුකිරීමට සිදුවූ බැවින්, රු.මි. 6.16කට ඉංජිනේරු ඇස්තමේන්තුව සංශෝධනය විය.

ඒ අනුව 2017 වර්ෂයට රු.මි.4.09 ක්වූ ප්‍රතිපාදන අවශ්‍යතාවය වෙනුවෙන් ව්‍යාපෘති සංශෝධනය කිරීමට සිදුවිය. ඒ සඳහා කිරි වලට අගය එකතු කිරීම ප්‍රවර්ධනය කිරීම ව්‍යාපෘතියෙන්, අනුරාධපුර, පොළොන්නරුව දිස්ත්‍රික්ක සඳහා වෙන්ව ඇති ප්‍රතිපාදන ඉතිරි වන බැවින් එම ව්‍යාපෘතිවලින් රු.මි.3.10 ක මුදලක් තමන්කඩුව පශු වෛද්‍ය කාර්යාලයේ අළුත්වැඩියාව සඳහා සංශෝධනයකර ක්‍රියාත්මක කරන ලදී.

ලෝක ජලභීතිකා රෝග සැමරුමට අදාල වැඩසටහන් කාලීන අවශ්‍යතාවයක් හා කඩිනමින් සිදුකළ යුතු වූ බැවින්, ගොවි පුහුණුව යටතේ සිදුකරන ලදී. එබැවින් , ඒ සඳහා වෙන් ව තිබූ රු.මි.0.7ක මුල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීය. කිරිවලට අගය එකතු කිරීම ප්‍රවර්ධන ව්‍යාපෘතිය සඳහා ප්‍රමාණවත් ව්‍යවසායකයින් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවූ නිසා ඒ සඳහා වෙන්ව ඇති රු.මි.1.4ක මුදලින් මුල්‍ය ප්‍රතිපාදන ඉතිරි වන බැවින්, හා නිලධාරි පුහුණුව, ගොවි පුහුණුව (පොළොන්නරුව) සඳහා වෙන්ව ඇති මුදලින් ඉතිරිවන ප්‍රතිපාදන භාවිතා කර ගොවි පුහුණුව (අනුරාධපුර ) සඳහා රු.මි.1.02ක වන ලෙස සංශෝධනයකර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ සේවා සැපයුම ඉහළ නැංවීමට ජංගම සායන පැවැත්වීමේ ව්‍යාපෘතිය යටතේ අත්‍යවශ්‍ය කරුණක් වූ ගවයින්ගේ වසංගත රෝග නිවාරණය සඳහා එන්නත් වැඩසටහන් ක්‍රියාත්මක කළ බැවින්, ඒ සඳහා වෙන්ව තිබූ ජංගම සායන (අනුරාධපුර ) රු.මි.0.5, ජංගම සායන (පොළොන්නරුව ) රු.මි.0.25, මුල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීය.

අනුරාධපුර,පොළොන්නරුව දිස්ත්‍රික් තුළ ක්‍රියාත්මක වූ කෘතිම සිංචන ප්‍රවර්ධන ව්‍යාපෘතිය සත්ත්ව සංවර්ධන උපදේශකයින්ගේ වෘත්තිය ක්‍රියාමාර්ග හේතුවෙන් ක්‍රියාත්මක නොවූ බැවින්, එම ව්‍යාපෘතියේ ඉතිරිවන ප්‍රතිපාදන ජංගම සායන (අනුරාධපුර ) රු.මි.1.06, ජංගම සායන (පොළොන්නරුව ) රු.මි.0.53 වන පරිදි සංශෝධනයකර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදි.

## 2017 වර්ෂයේ කාර්ය සාධනය ළඟා කරගැනිම පිළිබඳව අදහස

පවතින පහසුකම් සීමිත වුවත් කාර්ය මණ්ඩලය ඒ සියළු දුෂ්කරතා මගහරිමින් දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කෙරෙන සංවර්ධන ව්‍යාපෘති ඇතුළු සියළු සේවාවන් සඳහා ප්‍රමාණවත් දායකත්වයක් ලබා දුණි.

ගොවීන් මෙම දෙපාර්තමේන්තුවෙන් ප්‍රධාන වශයෙන් බලාපොරොත්තුවන්නේ සත්ත්ව රෝග ප්‍රතිකාර සහ පාලනයත් , සතුන්ගේ ආරය උසස් කර ගැනිමේ සේවාවන් ලබා ගැනිමයි.

එසේම රජයේ ආයතන සහ රාජ්‍ය නොවන සංවිධාන පශු සම්පත් ව්‍යාපෘතින් සඳහා දෙපාර්තමේන්තුවේ සහාය අපේක්ෂා කළ ද වර්තමානයේ දෙපාර්තමේන්තුව මුහුණ දී සිටින සත්ත්ව සංවර්ධන උපදේශකයින්ගේ හිඟය නිසා එම අපේක්ෂාවන් ඉටුකිරිම දුෂ්කර කටයුත්තක්ව ඇත. සත්ත්ව සංවර්ධන උපදේශකයින්ගේ හිඟය යම් තරමකින් හෝ මේ වනවිට අවම කර ගැනිමට කටයුතු සංවිධානය කර ඇත.

වාහන සහ රියදුරන්ගේ හිඟය සහ ඉන්ධන සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබිම ද ගැටළුවකි. ප්‍රමාණවත් තෘණ බිම් නොමැතිකම, කිරි අලෙවි කරගැනීමේ දුෂ්කරතාවය අවිධිමත් සතුන් ප්‍රවාහනය නිසා වසංගත රෝග පැතිරීම සත්ව නිෂ්පාදන ක්ෂේත්‍රයේ උන්නතියට බාධාවක්ව ඇත.

# 08

# සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, පරිසර සහ පළාත් සභා කටයුතු අමාත්‍යාංශය.

## දැක්ම

"සුව සම්පන්න හා සුරක්ෂිත ප්‍රජාවක්, සමෘද්ධිමත් පළාතක්".

## මෙහෙවර

"සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, පරිසර හා පළාත් සභා කටයුතු සියළු පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව සංවර්ධනය කිරීම".

## අරමුණු

- ගුණාත්මකභාවයෙන් ඉහළ කාර්යක්ෂම හා ඵලදායි සේවාවක් සඳහා යහපත් ආයතනික පද්ධතියක් ඇති කිරීම.
- දෙපාර්තමේන්තු කාර්යයන් අධීක්ෂණය මෙහෙයවීම හා සම්බන්ධීකරණය.
- අමාත්‍යාංශයේ සහ අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තුවල සියළු සංවර්ධන වැඩසටහන් අධීක්ෂණය, මෙහෙයවීම සහ සම්බන්ධීකරණය.
- පරිසර විෂය යටතේ නිරෝගි දිවියක් උදෙසා යහපත් පරිසරයක් ඇති කිරිම පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම.
- පරිසර දූෂණය අවම කිරීම හා පරිසර සංරක්ෂණයට දායක වෙමින් අනාගත පරපුර සඳහා සුවදායි පරිසර පද්ධතියක් නිර්මාණය කිරීම.

## ප්‍රධාන කාර්යයන්

- සෞඛ්‍ය කටයුතු
- දේශීය වෛද්‍ය කටයුතු
- සමාජ සුබසාධන කටයුතු
- පරිවාස හා ළමාරක්ෂක සේවා කටයුතු
- පරිසර කටයුතු සංවර්ධනය

## ප්‍රධාන උපාය මාර්ගයන්

- ගුණාත්මක සෞඛ්‍ය සේවයක් ඇති කිරීම.
- දේශීය වෛද්‍ය ක්‍රමය වඩාත් ප්‍රචලිත කිරීම.
- පළාතට අවශ්‍ය දේශීය නිමි ඖෂධ පළාත තුළම නිපදවීම.
- ළමා අපචාරවලට ලක්වූවන් රැකගැනීම හා පුනරුත්ථාපනය කිරීම.

- ළමා අපචාර පිළිබඳ ප්‍රජාව සහ පාසල් දරුවන් දැනුවත් කිරීම.
- ආබාධ සහිත වුවන් නගාසිටුවීමට වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- අසරණ පවුල් නඟා සිටුවීමට කටයුතු කිරීම.
- මානසික හා කායික වශයෙන් නිරෝගී ශක්ති සම්පන්න ප්‍රජාවක් බිහි කිරීම.
- නගර හා උප නගරවල පරිසර සංරක්ෂණය හා අලංකරණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- ස්වභා උයන් මහජන පරිහරණයට සුදුසු පරිදි වැඩිදියුණු කිරීම.
- පිරිසිදු පානීය ජලය මහජනතාවට ලබා දීම හා උල්පත් සංරක්ෂණය.
- පාසල් හා විශ්ව විද්‍යාල සිසුන් පරිසරය ආරක්ෂා කිරීමට නැඹුරු කිරීම.
- සියළු සංවර්ධන ව්‍යාපෘති අධීක්ෂණය කිරීම.
- සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ ප්‍රගති සමාලෝචනය .

## කාර්ය මණ්ඩලය

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1. | අනුමත | 52 |
| 2. | සේවයේ නියුතු | 39 |
| 3. | පුරප්පාඩු | 13 |

## මෙහෙයුම් ප්‍රතිඵල - පුනරාවර්තන වියදම්


| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2017 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 57.635 | 28.735 | 28.90 | 49.86 |
| ගමන් වියදම් | 1.02 | 0.79 | 0.23 | 77.45 |
| සැපයීම් | 5.59 | 5.31 | 0.28 | 94.99 |
| නඩත්තු වියදම් | 3.19 | 3.05 | 0.14 | 95.61 |
| ගිවිසුම්ගත සේවා | 4.05 | 2.97 | 1.08 | 73.33 |
| මාරු කිරීම් | 0.27 | 0.20 | 0.07 | 74.07 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 10.00 | 9.77 | 0.23 | 97.7 |
| **එකතුව** | **81.755** | **50.825** | **30.93** | **62.17** |

## මූලධන වියදම් - 2017

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2017 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 0.2 | 0.15 | 0.05 | 75 |
| යන්ත්‍ර සූත්‍ර සවි කිරීම් හා උපකරණ | 1.0 | 0.64 | 0.36 | 64 |
| ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 1.1 | 0.25 | 0.85 | 23 |
| වාහන | 2.0 | 1.17 | 0.83 | 59 |
| වෙනත් මූලධන වත්කම් පුනරාවර්තන හා වැඩිදියුණු කිරීම | 5.0 | 4.99 | 0.01 | 100 |
| ධාරිතා සංවර්ධනය | 0.7 | 0.65 | 0.04 | 94 |
| **එකතුව** | **10.0** | **7.85** | **2.15** | **79** |

## සංවර්ධන වැඩ පිළිබඳ කාර්ය සාධනය - පසුගිය වසර 03ක ප්‍රාග්ධන වැයවීම්

| වර්ෂය | PSDG (රු.මි) | PCDG (රු.මි) | WB (රු.මි) | වෙනත් ආයතන වලින් ලද (රු.මි) | මුළු වියදම (රු.මි) |
|---|---|---|---|---|---|
| 2015 | - | 23.67 | - | - | 23.67 |
| 2016 | 356.97 | 63.53 | 174.86 | 0.81 | 596.17 |
| 2017 | - | 7.85 | - | - | 7.85 |



## දිගුකාලීන හා කෙටිකාලීන අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ප්‍රධාන කාර්යයන් හා සම්බන්ධ ව්‍යාපෘති

| අනු අංකය | අරමුණ | අරමුණ ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය/ව්‍යාපෘති | ප්‍රධාන ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් ගණන | ආවරණය කළ භූගෝලීය ලේකම් කොට්ඨාශ ගණන | වෙන් කළ මුදල (රු.මි) | ප්‍රගතිය(%) | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | භෞතික | මූල්‍ය |
| **අවිච්ඡේද ව්‍යාපෘති** | | | | | | | | |
| 1. | කඩිනම් හා ගුණාත්මක සේවාවක් සපයන කාර්යක්ෂම ආයතනයක් | වාහන අළුත්වැඩියාව | වාහන අළුත්වැඩියාව | | නැ.නු.ප. | 0.52 | 100 | 100 |
| **අමාත්‍ය කාර්යාලය** | | | | | | | | |
| 2. | කඩිනම් හා ගුණාත්මක සේවාවක් සපයන කාර්යක්ෂම ආයතනයක් | වාහන අළුත්වැඩියාව | වාහන අළුත්වැඩියාව | | නැ.නු.ප. | 0.5 | - | - |
| | | අමාත්‍ය කාර්යාලය සඳහා උපකරණ මිලදී ගැනීම | අමාත්‍ය කාර්යාලය සඳහා උපකරණ මිලදී ගැනීම | | නැ.නු.ප. | 0.3 | 100 | 21 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **අමාත්‍යාංශ කාර්යාලය** | | | | | | | | |
| 3. | කඩිනම් හා ගුණාත්මක සේවාවක් සපයන කාර්යක්ෂම ආයතනයක් | වාහන අළුත්වැඩියාව | වාහන අළුත්වැඩියාව | 40 | නැ.නු.ප. | 0.98 | 100 | 66 |
| 4. | | කාර්යාල උපකරණ මිලදී ගැනීම | කාර්යාල උපකරණ මිලදී ගැනීම | 40 | නැ.නු.ප. | 0.80 | 100 | 24 |
| 5. | | යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම | යන්ත්‍රොපකරණ මිලදී ගැනීම | 40 | නැ.නු.ප. | 1.00 | 100 | 64 |
| 6. | | ධාරිතා සංවර්ධනය | කාර්ය මණ්ඩලය සඳහා බැහැරගත ක්‍රියකාරකම් වැඩසටහන් පැවැත්වීම. | 100 | නැ.නු.ප. | 0.70 | 100 | 94 |
| 7. | | අමාත්‍යාංශයට අයත් ගබඩාව අළුත්වැඩියාව | ගබඩාව අළුත්වැඩියාව | 40 | නැ.නු.ප. | 0.20 | 100 | 75 |
| **පරිසර කටයුතු** | | | | | | | | |
| 8 | ජෛව විවිධත්වය හා ජීවි අවශ්‍යතා සුරැකෙන යහපත් පරිසරයක් | උල්පත් සංවර්ධනය | ගෝනමැරියාව ජල උල්පත සංවර්ධනය | | කැබිතිගොල්ලෑව | 5.00 | 100 | 100 |

## *අංශය තුළින් ඉටුකර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු අංක - 03*

**නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුභසාධනය ප්‍රවර්ධනය කිරීම.**

3.4. 2030 වන විට බෝ නොවන රෝග නිසා සිදුවන අකල් මරණ, ප්‍රතිකාර වලින් හා වළක්වා ගැනීමේ ක්‍රම තුනෙන් එකකින් අඩුකර ගැනීම සහ මානසික සෞඛ්‍ය සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම.

3.5. හානිකර ආකාරයට මද්‍යසාර භාවිතය සහ අන්තරායකාරී ඖෂධ භාවිතය වැළැක්වීමේ ක්‍රියාමාර්ග සහ ප්‍රතිකාර ශක්තිමත් කිරීම.

3.6. 2030 වන විට මහාමාර්ගවල සිදුවන අනතුරුවලින් සිදුවන තුවාල වීම් සහ මරණ සංඛ්‍යාව අඩු කිරීම.

3.7. 2030 වන විට පවුල් සැලසුම් ක්‍රම පිළිබඳව තොරතුරු සහ අධ්‍යාපනයද ඇතුළත්ව ලිංගික සහ ප්‍රජනන සෞඛ්‍ය සත්කාරක සේවා සඳහා සියළු දෙනාටම ප්‍රවේශ වීමේ අවස්ථා තහවරු කිරීම සහ ප්‍රජනන සෞඛ්‍ය ජාතික ක්‍රමෝපායන්ට සහ වැඩසටහන්වලට ඇතුළත් කිරීම.

## *අංශය තුළින් ඉටුකර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු අංක - 05*

**ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ළඟාකර සියළු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම.**

1.1. කාන්තාවන්ට හා ගැහැණු ළමුන්ට එරෙහිව සියළුම ස්ථානයන්හී සිදුවන්නා වූ සියළුම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීම.



### මෙහෙයුම් සමාලෝචනය හා සංවර්ධන කාර්ය පිළිබඳ කාර්ය සාධනය

2017 වර්ෂයේ සංවර්ධන කටයුතු සඳහා පළාත් සභා සංවර්ධන ප්‍රදාන යටතේ රු.මි. 10 ක් වෙන්කර තිබූ අතර එයින් රුපියල් මිලියන 7.85 ක මුදලක් වැය කර ඇති අතර එය ප්‍රතිශතාත්මකව 79% කි. පුනරාවර්ථන වියදම් සඳහා රුපියල් මිලියන 56.77 ක් වෙන්කර තිබූ අතර එයින් රුපියල් මිලියන 50.95 ක මුදලක් වැය කර ඇත. එය ප්‍රතිශතාත්මකව 90% කි. මෙම අමාත්‍යාංශය යටතේ පවතින සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, පරිසර සහ පළාත් සභා කටයුතු මෙහෙයවමින් ජනතාවට ඉටුවිය යුතු සේවය උපරිම මට්ටමින් ඉටුකිරීම මගින් හොඳ මහජන සේවයක් ලබාදීමට කටයුතු කර ඇති අතර 2017 වර්ෂයේ කාර්ය සාධනය ඉහළ මට්ටමක පවතී.

## සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, පරිසර සහ පළාත් සභා කටයුතු මෙහෙයවීම සඳහා ගරු විෂයභාර අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලද ප්‍රගති සමාලෝචන රැස්වීම්

| අනු අංකය | සහභාගී වූ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | පැවැත් වූ මාසය | පැවැත්වූ වාර ගණන |
|---|---|---|---|
| 1 | • පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව<br>• පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව<br>• පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව<br>• පළාත් පරිවාස දෙපාර්තමේන්තුව | ජූනි | 02 |
| 2 | •පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව<br>•පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව<br>•පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව<br>•පළාත් පරිවාස දෙපාර්තමේන්තුව | අගෝස්තු | 01 |

## අමාත්‍යාංශ ලේකම් තුමන්ගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලද ප්‍රගති සමාලෝචන රැස්වීම්

| අනු අංකය | සහභාගී වූ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | පැවැත් වූ මාසය | පැවැත්වූ වාර ගණන |
|---|---|---|---|
| 1 | පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව<br>පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව<br>පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව<br>පළාත් පරිවාස දෙපාර්තමේන්තුව<br>පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව | මැයි | 01 |
| 2 | පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව<br>පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව<br>පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව<br>පළාත් පරිවාස දෙපාර්තමේන්තුව<br>පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව | ජූනි | 02 |
| 3 | ඉදි කිරීම් හා අළුත්වැඩියා හා සම්බන්ධ කොන්ත්‍රාත් ආයතන | ජූනි | 01 |
| 4 | පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව<br>පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව<br>පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව<br>පළාත් පරිවාස දෙපාර්තමේන්තුව<br>පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව | අගෝස්තු | 01 |
| 5 | සියළු දෙපාර්තමේන්තු ප්‍රධානින් | සැප්තැම්බර් | 02 |
| 6 | පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | ඔක්තෝබර් | 01 |
| 7 | දෙපාර්තමේන්තුවලට අදාල ඉදි කිරීම හා අළුත්වැඩියා කිරීම හා සම්බන්ධ කොන්ත්‍රාත් ආයතන | ඔක්තෝබර් | 01 |
| 8 | පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව<br>පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව<br>පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව<br>පළාත් පරිවාස දෙපාර්තමේන්තුව | ඔක්තෝබර් | 01 |
| 9 | සියළු දෙපාර්තමේන්තු ප්‍රධානින් | නොවැම්බර් | 01 |
| 10 | පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව<br>පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව<br>පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව<br>පළාත් පරිවාස දෙපාර්තමේන්තුව | දෙසැම්බර් | 03 |

### අමාත්‍යාංශය මගින් පවත්වනු ලැබූ අනිකුත් විශේෂ රැස්වීම්

| අනු අංකය | පැවැත්වූ රැස්වීම | සහභාගී වූ ආයතනය/දෙපාර්තමේන්තුව | සහභාගී වූ නිලධාරීන් සං ඛ්‍යාව |
|---|---|---|---|
| 1 | වකුගඩු සැලැස්ම සැකසීම සඳහා මූලික රැස්වීම | පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව | 15 |
| 2 | පරිසර දිනය වෙනුවෙන් වැඩසටහන් සංවිධානය කිරීම | සෞඛ්‍ය අමාත්‍යාංශය ප්‍රධාන අමාත්‍යාංශය | 20 |
| 3 | බෝ නොවන රෝග සම්බන්ධව ප්‍රජාව දැනුවත් කිරීම | පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 15 |

### දෙපාර්තමේන්තු කාර්යයන් අධීක්ෂණය

| අනු අංකය | කාර්යය | වාර ගණන |
|---|---|---|
| 1 | කාර්ය සාධන වාර්තාව සැකසීම | 01 |
| 2 | වාර්ෂික සංවර්ධන සැලැස්ම සකස් කිරීම | 01 |
| 3 | ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | 01 |
| 4 | පළාත් ප්‍රතිපත්ති ප්‍රකාශය සකස් කිරීම | 01 |
| 5 | අයවැය තොරතුරු අත්පොත සකස් කිරීම | 01 |
| 6 | පළාත් වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම | 01 |
| 7 | සංවර්ධන නිලධාරීන් සඳහා මාසික රැස්වීම් පැවැත්වීම | 12 |

### පරිසර විෂය කටයුතු

උතුරු මැද පළාත් සෞඛ්‍ය හා පරිසර අමාත්‍යාංශය මගින් පරිසර විෂයට සමගාමීව පළාතේ ඇති ස්වභාවික ජල උල්පත් සංරක්ෂණය කිරීමට කටයුතු කරන ලදී. 2017 වර්ෂය සඳහා කැබිතිගොල්ලෑව ගෝනමැරියාව උල්පත සංරක්ෂණයට කටයුතු කළ අතර ඒ සඳහා පළාත් සභා සංවර්ධන ප්‍රදාන යටතේ රු.මි.05ක ප්‍රතිපාදන වෙන් වී තිබුණි. මෙම උල්පත් ජලය ප්‍රදේශයේ පවුල් රාශියක් පරිභෝජනයට යොදා ගන්නා අතර ජල හිඟයට මෙන්ම වර්තමානයේ බහුලව පවතින වකුගඩු රෝගයට පිළියමක් ලෙසද මෙම ජලය භාවිතයට ගනු ලැබේ.

#### ගෝනමැරියාව
#### උල්පත සංරක්ෂණය කිරීමෙන්
#### ඉටුකර ගැනීමට බලාපොරොත්තු වූ අරමුණු.

- සෞඛ්‍ය හිතකර ජල පරිබෝජන රටාවකට ජනතාව හුරුකරවීම මගින් නිරෝගී සෞඛ්‍ය සම්පන්න ප්‍රජාවක් ඇති කිරීම.
- ස්වභාවික ජල උල්පත් ඇති රක්ෂිත ප්‍රදේශය හා ස්වභාවික පරිසර පද්ධතිය ආරක්ෂා කිරීම.
- මෙම ජල උල්පත් හා ස්වභාවික පරිසර පද්ධතිය අනාගතය සඳහා ආරක්ෂා කිරීමේ ඇති වැදගත්කම පිළිබඳව ජනතාවට අවබෝධ කර දීම.

| අනු අංකය | පරිසර සංවර්ධනයට දායකත්වය | සහභාගී වූ සංඛ්‍යාව | ස්ථානය | වෙන් කළ මුදල (රු.මි) |
|---|---|---|---|---|
| 01 | උල්පත් හඳුනා ගැනීම | 10 | පළාත තුළ | 5.0 |
| 02 | උල්පත් සංවර්ධනය(තෝරාගත් උල්පත්) | 05 | කැබිතිගොල්ලෑව ගෝනමැරියාව උල්පත | |
| 03 | හඳුනාගත් උල්පත් සංවර්ධනයට ඇස්තමේන්තු සැකසීම | 02 | - | |
| 04 | තෝරාගත් උල්පත ආශ්‍රිතව ප්‍රජාව සංවිධානය කිරීම හා ප්‍රජාව දැනුවත් කිරීම | 150 | කැබිතිගොල්ලෑව ගෝනමැරියාව උල්පත | |

උතුරු මැද පළාත් සෞඛ්‍ය හා පරිසර අමාත්‍යාංශය මගින් අමාත්‍යාංශයට පැවරුණු විෂයන් යටතේ පරිසර විෂයට සමගාමීව පළාතේ ඇති ස්වභාවික ජල උල්පත් සංරක්ෂණය කිරීමට දායකත්වය සපයන ලදී. ඒ යටතේ 2017 වර්ෂය සඳහා කැබිතිගොල්ලෑව ගෝනමැරියාව උල්පත සංරක්ෂණයට කටයුතු කළ අතර ඒ සඳහා රු.මි.05ක ප්‍රතිපාදන වෙන් වී තිබුණි.

මෙම ප්‍රදේශ තුළ පවතින ජල හිඟයට පිළියමක් ලෙස මෙන්ම වර්තමානයේ මෙම ප්‍රදේශවල බහුලව පවතින වකුගඩු රෝගයට ගොදුරු වීම පාලනය කිරීම සඳහා පිළියමක් ලෙස මෙම උල්පත් ජලය ප්‍රදේශයේ පවුල් අතර පරිභෝජනයට ගැනීම සඳහා මංපෙත් විවර කරන ලදී.

එසේම සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, පරිසර සහ පළාත් සභා කටයුතු මෙහෙයවීම සඳහාත් ඉලක්කගත අරමුණු සඳහා අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ පවතින අනෙකුත් දෙපාර්තමේන්තු මෙහෙයවීම සඳහාත් ක්‍රමානුකූල ප්‍රගති සමාලෝචන ක්‍රියාවලියක් පවත්වාගෙන යන ලදී.

ඒ අනුව සමස්ත ප්‍රතිපාදන වෙන් විම හා ප්‍රතිපාදන වැය සලකා බලන විට පෙනි යන්නේ 2017 වර්ෂය තුළ සැලසුම් කළ සංවර්ධන කාර්යයන් ක්‍රියාකාරි සැලැස්මට අනුව සාර්ථක ලෙස අවසන් කිරිමට හැකිවීම තුළින් කාර්ය සාධනය ළඟාකර ගැනිමට හැකියාව ලැබුණු බවයි.

මෙය හිස්ව තබන ලද පිටුවකි

# පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

8.1

| ආයතනය | අනුරාධපුර | පොළොන්නරුව | එකතුව |
|---|---|---|---|
| පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල | 01 | | 01 |
| ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය | 01 | 01 | 02 |
| සෞඛ්‍ය නිලධාරී කාර්යාලය | 22 | 08 | 30 |
| මූලික රෝහල් | 03 | 02 | 05 |
| ප්‍රාදේශීය රෝහල් (ඒ ශ්‍රේණිය) | 04 | 01 | 05 |
| ප්‍රාදේශීය රෝහල් (බී ශ්‍රේණිය) | 13 | 11 | 24 |
| ප්‍රාදේශීය රෝහල් (සී ශ්‍රේණිය) | 20 | - | 20 |
| ප්‍රාථමික වෛද්‍ය සත්කාරක ඒකක | 21 | 13 | 34 |
| ක්ෂය රෝග මර්ධන සායන මධ්‍යස්ථාන | 01 | 01 | 02 |
| ලිංගාශ්‍රිත බෝවන රෝග නිවාරණ ඒකක | 01 | 01 | 02 |
| වාහන සේවා මධ්‍යස්ථාන | 01 | - | 01 |
| **එකතුව** | **88** | **38** | **126** |

ඒ ශ්‍රේණිය - ඇඳන් 100ට අඩු
බී ශ්‍රේණිය - ඇඳන් 50-100
සී ශ්‍රේණිය - ඇඳන් 50ට අඩු

මහජන සෞඛ්‍ය සේවා නිළධාරී කොට්ඨාස - 104

පවුල් සෞඛ්‍ය සේවා නිළධාරි කොට්ඨාස - 430

## ප්‍රතිකාර හා සේවා

| විස්තරය | දිස්ත්‍රික්කය | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|
| බාහිර රෝගීන් | අනුරාධපුර | 2,645,417 | 2,635,718 | 2,224,028 |
| | පොළොන්නරුව | 856,179 | 880,498 | 854,620 |
| | **එකතුව** | **3,501,596** | **3,516,216** | **3,078,648** |
| නේවාසික රෝගීන් සංඛ්‍යාව | අනුරාධපුර | 183,981 | 180,066 | 172,567 |
| | පොළොන්නරුව | 64,373 | 61,995 | 59,372 |
| | **එකතුව** | **248,354** | **242,061** | **231,939** |
| සායනික ප්‍රතිකාර සේවා රෝගීන් සංඛ්‍යාව | අනුරාධපුර | 474,629 | 534,822 | 473,558 |
| | පොළොන්නරුව | 179,101 | 227,110 | 227,032 |
| **එකතුව** | | **653,730** | **761,932** | **700,590** |

### පළාතේ සෞඛ්‍ය දර්ශක

| විස්තරය | දිස්ත්‍රික්කය | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|
| ළදරු මරණ අනුපාතය (සජීවී උපත්1000 කට) | අනුරාධපුර | 10.9 | 16.7 | 16.7 |
| | පොළොන්නරුව | 9.2 | 11.6 | 7.5 |
| මාතෘ මරණ අනුපාතය (සජීවී උපත්1000 කට) | අනුරාධපුර | 28.4 | 47.7 | 32.0 |
| | පොළොන්නරුව | 27.4 | 28.4 | 28.0 |
| දළ උපත් අනුපාතය (පුද්ගලයින් 1000 කට) | අනුරාධපුර | 17.8 | 17.3 | * |
| | පොළොන්නරුව | 17.7 | 16.9 | * |
| දළ මරණ අනුපාතය ( පුද්ගලයින් 1000 කට) | අනුරාධපුර | 5.5 | 5.8 | * |
| | පොළොන්නරුව | 5.5 | 5.2 | * |

### රෝගීන් ව්‍යාප්තිය

| විස්තරය | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|
| වකුගඩු රෝගීන් | 3,515 | 4,122 | 16,464 | 19,377 |
| ඩෙංගු රෝගීන් | 809 | 637 | 953 | 1,373 |
| ක්ෂය රෝගීන් | 381 | 393 | 399 | 364 |
| පිළිකා රෝගීන් | 1,596 | 1,768 | 1,619 | 1,562 |
| ලාදුරු රෝගීන් | 140 | 176 | 137 | 131 |

### දැක්ම

‟සුව සම්පන්න හා සුරක්ෂිත ප්‍රජාවක්, සමෘද්ධිමත් පළාතක්.

### මෙහෙවර

“සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, පරිසර සහ පළාත් සභා කටයුතු සියලු පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව සංවර්ධනය කිරීම”.

### දිගුකාලීන අරමුණු හා කෙටි කාලීන අරමුණු

#### දිගුකාලීන අරමුණු

- උතුරු මැද පළාතේ සෞඛ්‍ය ආයතනයන්හී යටිතල පහසුකම් සංවර්ධනය කිරිම.
- උතුරු මැද පළාතට සුවිශේෂි වූ සෞඛ්‍ය ගැටළුවන වකුගඩු රෝගය,වස විෂ ශරිරගත වීම් සහ පිළිකා රෝග තත්වයන් අවම කිරීම.
- ප්‍රාදේශීය රෝහල් මගින් ගුණාත්මක ප්‍රතිකාර සේවාවක් ලබා දීම සහ පළාතේ මූලික රෝහල් අංග සම්පූර්ණ පහසුකම් සහිත රෝහල් ලෙස වැඩිදියුණු කිරීම.
- සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී ප්‍රජා දායකත්වය සහ අන්තර් පාර්ශවිය සම්බන්ධතා වැඩිදියුණු කිරීම.

### කෙටි කාලීන අරමුණු

- වාර්ෂිකව වෙන්වන ප්‍රතිපාදනයන් කාර්යක්ෂම ලෙස ආයෝජනය කිරීම.
- ප්‍රමුඛතාවය මත හඳුනාගත් ඉලක්කගත වැඩසටහන් කාලානුරූපව ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය.
- වකුගඩු රෝග කළමනාකරණයේදී හඳුනාගත් රෝහල් සඳහා අවශ්‍ය පහසුකම් ලබා දීම.
- වසවිෂ ශරීරගත වීම් සහ පිළිකා තත්වයන් කළමනාකරණය ඉලක්ක සහගත ලෙස ක්‍රියාත්මක කිරීම.
- සුනඛ වන්ධ්‍යාකරණ වැඩසටහන් ඉලක්ක සහගත ලෙස නියාමනය කිරීම.
- හදිසි ප්‍රතිකාර ඒකක වැඩිදියුණු කිරීම.
- තොරතුරු තාක්ෂණය යොදා ගනිමින් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ කළමනාකරණය කාර්යක්ෂම කිරීම.

## ප්‍රධාන කාර්යයන්

- ප්‍රතිකාරක සෞඛ්‍ය සේවා සැපයීම.
- රෝග නිවාරණ සෞඛ්‍ය සේවා සැපයීම.
- පර්යේෂණ, සමීක්ෂණ හා ධාරිතා සංවර්ධනය.
- අන්තර් ආංශික සම්බන්ධතා ශක්තිමත් කිරීම.

## ප්‍රධාන උපාය මාර්ගයන්

- ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත්ව අධීක්ෂණය කිරීම.
- පුහුණු වැඩසටහන් දත්ත පද්ධතියක් මගින් යාවත්කාලීන කිරීම.
- කාර්ය මණ්ඩල තොරතුරු හා පෞද්ගලික ලිපිගොනු, වැටුප් වර්ධක, පත්වීම් සම්බන්ධයෙන් ඉලක්ක සහගත ලෙස කළමනාකරණය සිදු කිරීම.
- පුහුණුකරුවන් පුහුණු කිරීම්, දැනුවත් කිරීම් සහ දැනුවත් කිරීම් වැඩසටහන් ගුණාත්මක ලෙස සිදු කිරීම.
- සෞඛ්‍ය ආයතන ආයෝජනයේදී ප්‍රතිකාර සේවා සඳහා ප්‍රමුඛතාවය ලබා දීම.
- ප්‍රදේශයේ ඇති සෞඛ්‍ය ආයතන අදාල ශ්‍රේණියට අනුව සියළු පහසුකම් ලබා දිය හැකි සෞඛ්‍ය ආයතන ලෙස ක්‍රියාත්මක කිරීම.
- පළාත තුළ ක්‍රියාත්මකවන පර්යේෂණ හා සමීක්ෂණ, පළාත් පර්යේෂණ හා සමාලෝචන කමිටුව මගින් නියාමනය කිරීම.

## කාර්ය මණ්ඩල සංයුතිය

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 4503 |
| 2 | සේවයේ නියුතු | 3891 |
| 3 | පුරප්පාඩු | 612 |
| 4 | ආදේශක | 75 |
| 5 | කොන්ත්‍රාත් පදනම මත | 35 |

### මෙහෙයුම් ප්‍රතිඵල - පුනරාවර්තන වියදම්

| වියදම් ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2017 වර්ෂයේ වියදම් ( රු.මි.) | ඉතිරිය ( රු.මි. ) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 3005.42 | 3005.42 | - | 100 |
| ගමන් වියදම් | 63.69 | 63.69 | - | 100 |
| සැපයීම් | 175.33 | 175.33 | - | 100 |
| නඩත්තු | 60.54 | 60.54 | - | 100 |
| ගිවිසුම්ගත සේවා | 134.89 | 134.89 | - | 100 |
| මාරු කිරීම් | 14.00 | 14.00 | - | 100 |
| සහනාධාර | 0.08 | 0.08 | - | 100 |
| **එකතුව** | **3453.95** | **3453.95** | **-** | **100** |

### මූලධන වියදම්

| වියදමෙ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි.) | 2017 වර්ෂයේ වියදම් ( රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 882.59 | 466.73 | 415.86 | 52.88 |
| යන්ත්‍ර සූත්‍ර සවිකිරීම් හා උපකරණ | 88.38 | 54.28 | 34.10 | 61.42 |
| වාහන | 2.25 | 0.96 | 1.29 | 42.66 |
| වෙනත් මූලධන වත්කම් පුනරාවර්තනය හා වැඩිදියුණු කිරීම | 189.93 | 94.48 | 95.45 | 49.74 |
| **එකතුව** | **1163.15** | **616.45** | **546.70** | **52** |

### *අංශය තුළින් ඉටුකර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු අංක - 03*

**නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුභසාධනය ප්‍රවර්ධනය කිරීම.**

1.1. 2030 වන විට බෝ නොවන රෝග නිසා සිදුවන අකල් මරණ, ප්‍රතිකාර වලින් හා වළක්වා ගැනීමේ ක්‍රම තුනෙන් එකකින් අඩුකර ගැනීම සහ මානසික සෞඛ්‍ය සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම.

1.5. හානිකර ආකාරයට මද්‍යසාර භාවිතය සහ අන්තරායකාරී ඖෂධ භාවිතය වැළැක්වීමේ ක්‍රියාමාර්ග සහ ප්‍රතිකාර ශක්තිමත් කිරීම.

1.6. 2030 වන විට මහාමාර්ගවල සිදුවන අනතුරුවලින් සිදුවන තුවාල වීම් සහ මරණ සංඛ්‍යාව අඩු කිරීම.

1.7. 2030 වන විට පවුල් සැලසුම් ක්‍රම පිළිබඳව තොරතුරු සහ අධ්‍යාපනය ද ඇතුළත්ව ලිංගික සහ ප්‍රජනන සෞඛ්‍ය සත්කාරක සේවා සඳහා සියළුදෙනාටම ප්‍රවේශ වීමේ අවස්ථා තහවරු කිරීම සහ ප්‍රජනන සෞඛ්‍ය ජාතික ක්‍රමෝපායන්ට සහ වැඩසටහන්වලට ඇතුළත් කිරීම.


## *අංශය තුළින් ඉටුකර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු අංක - 05*

**ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ළඟාකර සියළු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම.**

5.1. කාන්තාවන්ට හා ගැහැණු ළමුන්ට එරෙහිව සියළුම ස්ථානයන්හි සිදුවන්නා වූ සියළුම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීම.

### සංවර්ධන වැඩ කටයුතු පිළිබඳ කාර්ය සාධනය - පසුගිය වසර 03ක ප්‍රාග්ධන වැයවීම්

| වර්ෂය | PSDG (රු.මි) | PCDG (රු.මි) | WB (රු.මි) | මුළු මුදල (රු.මි) |
|---|---|---|---|---|
| 2015 | 103.57 | 1.74 | 265.39 | 370.70 |
| 2016 | 24.89 | 5.87 | 73.61 | 104.37 |
| 2017 | 313.63 | 3.91 | 297.02 | 614.56 |




### මෙහෙයුම් සමාලෝචනය හා සංවර්ධන කාර්යය පිළිබඳ කාර්ය සාධනය

2017 වර්ෂය සඳහා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ අඛණ්ඩ ව්‍යාපෘති සඳහා රු.මි.484.5ක් සහ නව ව්‍යාපෘති සඳහා රු.මි.112ක්, පළාත් සභා ප්‍රදාන යටතේ රු.මි.04ක් හා ලෝක බැංකු ආධාර යටතේ අඛණ්ඩ ව්‍යාපෘති සඳහා රු.මි.152.2ක් සහ නව ව්‍යාපෘති සඳහා රු.මි.360ක් ද වෙන් කර තිබුණි. මෙම වැඩසටහන මගින් නව ඉදි කිරීම්, අළුත්වැඩියා කිරීම්, අඛණ්ඩ ව්‍යාපෘති, වෛද්‍ය හා කාර්යාල උපකරණ මිලදී ගැනීම් හා ආකල්ප වර්ධනය හා දැනුවත් කිරීම සඳහා යොදා ගන්නා ලදී. පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ අඛණ්ඩ ව්‍යාපෘති 106ක්, නව ව්‍යාපෘති 103ක් සහ දෙවන සෞඛ්‍ය ආංශික සංවර්ධන ප්‍රදාන යටතේ අඛණ්ඩ ව්‍යාපෘති 40ක් සහ නව ව්‍යාපෘති 233ක් ද ඇතුළත් කර තිබුණි. පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ මූල්‍ය ප්‍රගතිය 51%ක් ද දෙවන සෞඛ්‍ය ආංශික සංවර්ධන ප්‍රදාන යටතේ ප්‍රගතිය 56%ක් ද විය.

කොන්ත්‍රාත් කළමනාකරණයේ යම් දුර්වලතාවයන් නිරීක්ෂණය වූ අතර එම තත්වයන් මගහරවා ගැනීම සඳහා ව්‍යාපෘති මෙහෙයුම් ඒකකයක් මගින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු සැලසුම් කර ඇත.

**උතුරු මැද පළාත් තුළ සෞඛ්‍ය සේවාවේ ප්‍රවර්ධනය උදෙසා ක්‍රියාත්මක කරන ලද සංවර්ධන කාර්යයන්**

| අ.අ | ආයතනය | සංවර්ධන කාර්යය | |
|---|---|---|---|
| 01 | පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය | පළාත් සහ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල ඉදිකිරීම |  |
| 02 | පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය | පළාත් පුහුණු ඒකකය ඉදිකිරීම |  |
| 03 | පොළොන්නරුව ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය | කටුවන්විල සායන මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම |  |

| | | | |
|---|---|---|---|
| 04 | පොළොන්නරුව ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය | සුසිරිගම සායන මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම |  |
| 05 | පොළොන්නරුව ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය | මදුරුතැන්න සායන මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම |  |
| 06 | පොළොන්නරුව ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය | සැගල සායන මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම |  |
| 07 | පොළොන්නරුව ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය | උණගලාවෙහෙර සායන මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම |  |

| | | | |
|---|---|---|---|
| 08 | පොළොන්නරුව ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය | යෝධ ඇළ සායන මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම |  |
| 09 | පොළොන්නරුව ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය | හිගුරක්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය වැඩිදියුණු කිරීම |  |
| 10 | අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය | තඹුත්තේගම මූලික රෝහලේ ජල ටැංකිය අළුත්වැඩියා කිරීම |  |
| 11 | අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය | තඹුත්තේගම මූලික රෝහලේ විශේෂඥ වෛද්‍ය නිලධාරී නිල නිවාසය ඉදිකිරීම |  |

| | | | |
|---|---|---|---|
| 12 | අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය | තඹුත්තේගම මූලික රෝහලේ වෛද්‍ය නිලධාරී නිල නිවාසය ඉදිකිරීම |  |
| 13 | අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය | කැබිතිගොල්ලෑව මූලික රෝහලේ බාහිර රෝගී අංශය ඉදිකිරීම |  |
| 14 | අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය | කහටගස්දිගිලිය නව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය ඉදිකිරීම |  |
| 15 | අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය | පූජා නගරය නව බාහිර රෝගී අංශය අළුත්වැඩියා කිරීම |  |
| 16 | අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය | පරසන්ගස්වැව රෝහල් ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම |  |
| 17 | අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය | මැදවච්චිය නව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය ඉදිකිරීම |  |

| | | | |
|---|---|---|---|
| 18 | අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය | ගල්කිරියාගම රෝහලේ හදිසි ප්‍රතිකාර ඒකකය ස්ථාපිත කිරීම |  |
| 19 | අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය | ආඩියාගල රෝහලේ හදිසි ප්‍රතිකාර ඒකකය ස්ථාපිත කිරීම |  |
| 20 | අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය | තඹුත්තේගම මූලික රෝහලේ විශේෂ ප්‍රතිකාර ඒකකය ඉදිකිරීම |  |
| 21 | අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය | තඹුත්තේගම මූලික රෝහලේ මාතෘ ඒකකය ඉදිකිරීම |  |
| 22 | අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය | පදවිය මූලික රෝහලේ විශේෂඥ වෛද්‍ය නිලධාරී නිල නිවාසය ඉදිකිරීම |  |

| | | | |
|---|---|---|---|
| 23 | අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය | කැකිරාව රෝහලේ මෘත ශරීරාගාරය නවීකරණය කිරීම |  |

## විදේශ ආධාර මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| අනු අංකය | ව්‍යාපෘතිය | තමන්ගේ විෂය පථයට හසුවන අරමුණ | මුදල (රු.මි) | | ප්‍රගති (%) | |
|---|---|---|---|---|---|---|
| | | | වෙන් කළ | වැය කළ | භෞතික | මූල්‍ය |
| 01 | ප්‍රතිකාර, නිවාරණ හා කළමනාකරණ සේවා වැඩිදියුණු කිරීම ප්‍රතිකාර, නිවාරණ හා කළමනාකරණ සේවා වැඩිදියුණු කිරීම | සෞඛ්‍ය සේවා වැඩිදියුණු කිරීම | 263.30 | 109.90 | 35 | 42 |
| | | පෝෂණය හා මාතෘ හා ළමා සෞඛ්‍ය සේවාවන් | 44.20 | 34.90 | 60 | 79 |
| | | බෝවන රෝග නිවාරණය හා කළමනාකරණය | 14.10 | 8.40 | 40 | 59 |
| | | බෝ නොවන රෝග නිවාරණය හා කළමනාකරණය | 38.40 | 9.10 | 18 | 24 |
| | එකතුව | | **360.00** | **162.30** | | |

## සෞඛ්‍ය සේවාවේ ප්‍රවර්ධනය උදෙසා අනුරාධපුර දිස්ත්‍රික්කයට අදාලව එක් එක් ඒකකයන් මගින් සිදු කරන ලද වැඩසටහන්

| අනු අංකය | ඒකකය | පැවැත්වූ වැඩසටහන් ගණන | වියදම් වූ මුදල (රු) | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|
| 1 | මැලේරියා මර්ධන ඒකකය (GFATM) | 14 | 2,026,968.73 | 875 |
| 2 | මැලේරියා මර්ධන ඒකකය (SHSDP) | 13 | 657,405.00 | 331 |
| 3 | වකුගඩු රෝග නිවාරණ ඒකකය | 20 | 667,235.00 | 2307 |
| 4 | මානසික සෞඛ්‍ය ඒකකය (SHSDP Project) | 5 | 174,930.00 | 430 |
| 5 | බෝ නොවන රෝග ඒකකය | 142 | 824,275.00 | 4602 |
| 6 | ක්ෂය රෝග මර්ධන ඒකකය (SHSDP) | 32 | 510,999.00 | 2425 |

| අනු අංකය | ඒකකය | පැවැත්වූ වැඩසටහන් ගණන | වියදම් වූ මුදල (රු) | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|
| **7** | ක්ෂය රෝග මර්ධන ඒකකය (GFATM ) | 17 | 403,350.00 | 1965 |
| 8 | දන්ත සායන ඒකකය | 18 | 273,650.00 | 7850 |
| 9 | මාතෘ හා ළමා සෞඛ්‍ය ඒකකය (UNICEF) | 20 | 421,100.00 | 9560 |
| 10 | මාතෘ හා ළමා සෞඛ්‍ය ඒකකය (SHSDP) | 158 | 2,025,336.00 | 700000 |
| 11 | ඖෂධ කළමනාකරණ ඒකකය | 4 | 109,500.00 | 3462 |
| 12 | සෞඛ්‍ය අධ්‍යාපන ඒකකය | 21 | 465,181.00 | 853 |
| 13 | සංඛ්‍යාලේඛන අංශය | 7 | 364,950.00 | 350 |
| 14 | පාසල් හා නව යොවුන් සෞඛ්‍ය ඒකකය | 409 | 1,599,571.00 | 14030 |
| **එකතුව** | | 880 | 10524450.73 | 749040 |

## සෞඛ්‍ය සේවාවේ ප්‍රවර්ධනය උදෙසා අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ පවත්වන ලද වැඩසටහන්වල ප්‍රගතිය ඇතුළත් විශේෂ අවස්ථා

| අ.අ | ඒකකයේ නම | වැඩසටහන | |
|---|---|---|---|
| 01 | බෝ නොවන රෝග ඒකකය | බෝ නොවන රෝග වැළැක්වීමේ වැඩසටහන |  |

| | | | |
|---|---|---|---|
| 01 | බෝනොවන රෝග ඒකකය | මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන |  |
| | | විශේෂ වැඩසටහන් |  |
| | | ප්‍රගති සමාලෝචන රැස්වීම් |  |
| | | නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් |  |

| | | | |
|---|---|---|---|
| 01 | බෝ නොවන රෝග ඒකකය | සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් |  |
| | | මත්ද්‍රව්‍ය වලින් තොර සේවා ස්ථානයක් පිහිටුවීමේ වැඩසටහන |  |
| 02 | ක්ෂය රෝග මර්ධන ඒකකය | දැනුවත් කිරීමේ වැඩසටහන |  |
| | | ක්ෂය රෝග මර්ධන දින වැඩසටහන |  |

| | | | |
|---|---|---|---|
| 03 | පාසල් හා නව යොවුන් සෞඛ්‍ය ඒකකය | පාසල් ළමුන්ගේ සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් |  |
| | | වැඩිහිටියන්ගේ සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා වැඩසටහන් | |
| | | සායන පැවැත්වීම | |

## පොළොන්නරුව දිස්ත්‍රික්කයට අදාලව එක් එක් ඒකකයන් මගින් සිදු කරන ලද වැඩසටහන්

| අනු අංකය | ඒකකය | පැවැත්වූ වැඩසටහන් ගණන | වියදම් වූ මුදල (රු) | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|
| 1 | වකුගඩු රෝග නිවාරණ ඒකකය | 3 | 121,460.00 | 435 |
| 2 | මානසික සෞඛ්‍ය ඒකකය | 9 | 311,493.00 | 1069 |
| 3 | බෝ නොවන රෝග ඒකකය | 13 | 2,416,581.30 | 8640 |
| 4 | ක්ෂය රෝග මර්ධන ඒකකය | 2 | 400,000.00 | 1430 |
| 5 | දන්ත සායන ඒකකය | 3 | 65,000.00 | 233 |
| 6 | මැලේරියා මර්ධන ඒකකය | 3 | 702,310.09 | 2509 |
| 7 | මාතෘ හා ළමා සෞඛ්‍ය ඒකකය | 20 | 1,565,611.00 | 5614 |
| 8 | ලිංගාශ්‍රිත රෝග මර්ධන ඒකකය | 5 | 325,000.00 | 1166 |
| 9 | ජලභීතිකා රෝග මර්ධන ඒකකය | 2 | 282,000.00 | 1008 |
| 10 | වසංගත රෝග මර්ධන ඒකකය | 10 | 1,217,200.00 | 4355 |
| 11 | ආහාර හා ඖෂධ පරීක්ෂක | 2 | 78,520.00 | 110 |
| 12 | ලාදුරු රෝග නිවාරණය | - | 77,547.00 | 1240 |
| 13 | ලීෂ්මනයිසිස් රෝග නිවාරණය | - | 975.00 | 15 |
| 14 | ඩෙංගු රෝග නිවාරණය | - | 83,278.00 | 1256 |
| 15 | සැලසුම් ඒකකය | 10 | 4,368,000.00 | 13555 |
| **එකතුව** | | 82 | 12,014,975.39 | 42635 |

## සෞඛ්‍ය සේවාවේ ප්‍රවර්ධනය උදෙසා පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ පවත්වන ලද වැඩසටහන් හා එහි ප්‍රගතිය ඇතුළත් විශේෂ අවස්ථා

| අ. අ | ඒකකය | වැඩසටහන | පවත්වන ලද ස්ථානය | |
|---|---|---|---|---|
| 01 | මානසික සෞඛ්‍ය ඒකකය | දැනුවත් කිරීමේ වැඩසටහන | අරලගංවිල හා වැලිකන්ද පොලිස් ස්ථානය, |  |
| | | ප්‍රදර්ශනය හා වෙළෙඳ සල්පිල | පුලස්තිගම, හිඟුරක්ගොඩ පොලිස් ස්ථාන, කදුරුවෙල තාක්ෂණික විදුහල, කදුරුවෙල වෘත්තීය පුහුණු විදුහල, නුවරගල මහා විද්‍යාලය, ශ්‍රීපුර මහා විද්‍යාලය |  |
| | | ගැබිනි මාතාවන් සඳහා මානසික සෞඛ්‍ය වැඩසටහන | |  |
| | | සෞඛ්‍ය කාර්ය මණ්ඩලය සඳහා පුහුණු | |  |
| | | ක්ෂේත්‍ර පරීක්ෂාවන් සිදු කිරීම | |  |
| 02 | මැලේරියා මර්ධන ඒකකය | ඉසීම් යන්ත්‍ර ක්‍රියාකරුවන්ගේ සේවය ඇගයීම | | |
| | | මැලේරියාව රෝගය පිළිබඳ දැනුවත් කිරීම | | |

| | | | | |
|---|---|---|---|---|
| 03 | දන්ත සායන ඒකකය | පාසල් දන්ත සායනවේදීන් ගේ දැනුම වැඩිදියුණු කිරීම | |  |
| | | දන්ත ශල්‍ය වෛද්‍යවරුන් ගේ කාර්තු රැස්වීම් පැවැත්වීම | |  |
| | | මාතෘ හා ළමා සෞඛ්‍ය දැනුවත් කිරීම | |  |
| 04 | ඩෙංගු රෝග නිවාරණය | ඩෙංගු රෝග ව්‍යාප්තිය | |  |

| | | | | |
|---|---|---|---|---|
| 05 | ලාදුරු රෝග නිවාරණය | ලාදුරු රෝගය ව්‍යාප්තිය පාලනය | |  |
| 06 | ලීෂ්මනයිසිස් රෝග නිවාරණය | ලීෂ්මනයිසිස් රෝගය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | |  |
| 07 | වසංගත රෝග මර්ධන ඒකකය | වසංගත රෝග ව්‍යාප්තිය පාලනය | |  |
| 08 | ආහාර හා ඖෂධ පරීක්ෂා කිරිම | ආහාර හා ඖෂධ පරීක්ෂා කිරිමේ වැඩසටහන | |  |

## පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ ප්‍රජා සෞඛ්‍ය ඒකකය මගින් ප්‍රජා සෞඛ්‍ය සංවර්ධනය උදෙසා ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්

| අනු අංකය | විස්තරය | පැවැත්වූ වැඩසටහන් ගණන | වියදම් වූ මුදල (රු) | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|
| 1 | ප්‍රජා සෞඛ්‍ය ඒකකය මගින් සිදුකරන ලද වැඩසටහන් | 10 | 302,375.00 | 2000 |
| 2 | පුනරාවර්තන වියදම් යටතේ සිදුකරන ලද වැඩසටහන් | 4 | 65,804.00 | 600 |
| 3 | පෝෂණය සම්බන්ධ වැඩසටහන් | 2 | 5,870.00 | 200 |
| 4 | පර්යේෂණ වැඩසටහන් | 5 | 96,495.00 | 225 |
| 5 | පෞද්ගලික වෛද්‍ය සේවා වැඩසටහන් | 6 | 164,468.00 | 85 |
| 6 | යුනිසෙෆ් අරමුදල මගින් සිදුකරන ලද වැඩසටහන් | 8 | 793,882.00 | 2556 |


පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ විවිධ වූ වෛද්‍ය ඒකකයන් මගින් 2017 වර්ෂය තුළ පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.


- මානසික සෞඛ්‍ය ඒකකය
  - ලෝක මානසික සෞඛ්‍ය දිනය පිළිබඳ මාධ්‍ය සාකච්ඡාව
  - ලෝක මානසික සෞඛ්‍ය දින සමාරම්භක උළෙල
  - මානසික සෞඛ්‍ය නංවාලීම හා මානසික රෝග පිළිබඳ දැනුවත් කිරීම
  - මත්ද්‍රව්‍ය භාවිතය සහ සියදිවි නසා ගැනීම පිළිබඳ වැඩසටහන

- මැලේරියා මර්දන ඒකකය
  - මැලේරියා රෝගය සඳහා අවදානම් කණ්ඩායම් දැනුවත් කිරීම
  - පාසල් ළමුන් දැනුවත් කිරීම
  - සිවිල් ආරක්ෂක නිලධාරීන් දැනුවත් කිරීම
  - මැලේරියා ලේ පටල පරීක්ෂා කිරීම
  - කීට විද්‍යා පරීක්ෂණ
  - නගරය තුළ ඩෙංගු කීට විද්‍යා සමීක්ෂණ
  - සංචාරක නියෝජිතයින් මැලේරියාව සම්බන්ධයෙන් දැනුවත් කිරීම

- දන්ත වෛද්‍ය ඒකකය
  - පාසල් දන්ත චිකිත්සක නිලධාරීන් සඳහා මාසික ප්‍රගති සමාලෝචන වැඩසටහන
  - මුඛ රෝග පිළිබඳ පාසල් ළමුන් හා දෙමාපියන් දැනුවත් කිරීම
  - මුඛ පිළිකා පිළිබඳ දැනුවත් කිරීම
  - පෙර පාසල් ගුරුවරුන් සඳහා පුහුණු වැඩමුළු

- මාතෘ හා ළමා සෞඛ්‍ය ඒකකය
  - ළදරු මරණ විමර්ශන ඒකකය
  - ජීවන නිපුනතා,යොවුන් සෞඛ්‍ය හා ළමා මානසික සෞඛ්‍ය පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීම
  - ERHMIS වැඩසටහන
  - සේවාස්ථ පුහුණු වැඩමුළු







2017 වර්ෂයේදි පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් අනුරාධපුර හා පොළොන්නරුව යන දිස්ත්‍රික්ක දෙක තුළ විවිධ වැඩසටහන් පවත්වමින් පළාතේ සෞඛ්‍ය සේවා අංශයේ සංවර්ධනය උදෙසා සැලකිය යුතු දායකත්වයක් සපයන ලදී. ඒ තුළින් 2017 වර්ෂය තුළ අපේක්ෂිත කාර්ය සාධන ඉලක්ක සාධනය කර ගැනීම පිණිස සැලකිය යුතු පරිශ්‍රමයක් දරා ඇත.

මෙය හිස්ව තබන ලද පිටුවකි

# පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව

8.2

### ආයුර්වේද රෝහල් - 09

| අනුරාධපුර දිස්ත්‍රික්කය - 04 | පොළොන්නරුව දිස්ත්‍රික්කය - 05 |
|---|---|
| අනුරාධපුර | මින්නේරිය |
| තඹුත්තේගම | වැලිකන්ද |
| ගාලදිවුල්වැව | මනම්පිටිය |
| පදවිය | සිරිපුර |
| | ඇලහැර |

### මධ්‍යම බෙහෙත් ශාලා - 30

| අනුරාධපුර දිස්ත්‍රික්කය - 21 | පොළොන්නරුව දිස්ත්‍රික්කය - 09 |
|---|---|
| නොච්චියාගම | තමන්කඩුව |
| පලුගස්වැව | දියසෙන්පුර |
| ගල්නෑව | මැදිරිගිරිය |
| තලාව | අරලගංවිල |
| මිහින්තලය | අත්තනකඩවල |
| කැකිරාව | ගල් අමුණ |
| රාජාංගනය | ලංකාපුර |
| රඹෑව | නවසේනපුර |
| මැදවච්චිය | ජයසිරිපුර |
| ඉපලෝගම | |
| ඇඳගල | |
| තිරප්පනේ | |
| කැබිතිගොල්ලෑව | |
| තන්තිරිමලේ | |
| හොරොව්පොතාන | |
| ගලෙන්බිඳුණුවැව | |
| කහටගස්දිගිලිය | |
| නාච්චාදූව | |
| පලාගල | |
| විලච්චිය | |

### ආයුර්වේද මධ්‍යස්ථාන - 04

බන්ධනාගාරය - අනුරාධපුර

ක්‍රීඩා වෛද්‍ය ඒකකය

රජරට විශ්වවිද්‍යාලය

සාලියපුර වැඩිහිටි නිවාසය

### පාරම්පරික වෙදහල -01

පුලතිසි වෙද මැදුර

### ඖෂධ නිෂ්පාදනාගාරය

තෙල්හිරියාව ඖෂධ නිෂ්පාදනාගාරය - තඹුත්තේගම

### ආයුර්වේද රෝහල්

| | අනුරාධපුර | පොළොන් නරුව | එකතුව |
|---|---|---|---|
| පළාත් රෝහල් | 01 | - | 01 |
| මූලික රෝහල් | - | 01 | 01 |
| ග්‍රාමීය රෝහල් | 03 | 04 | 07 |
| මධ්‍යම බෙහෙත් ශාලා | 21 | 09 | 30 |
| ආයුර්වේද මධ්‍යස්ථාන | 05 | - | 05 |
| ඖෂධ නිෂ්පාදනාගාර | 01 | - | 01 |
| **එකතුව** | **31** | **14** | **45** |

### ප්‍රතිකාර සේවා සැපයීම 2014-2016

| ප්‍රතිකාර ලබාගත් රෝගීන් | අනුරාධපුර | | | පොළොන්නරුව | | | පළාත | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 2014 | 2015 | 2016 | 2014 | 2015 | 2016 | 2014 | 2015 | 2016 |
| බාහිර රෝගීන් | 264924 | 306699 | 311957 | 96966 | 311314 | 133409 | 361890 | 444013 | 445366 |
| නේවාසික රෝගීන් | 1810 | 1980 | 2277 | 1331 | 1643 | 1741 | 3141 | 3623 | 4018 |
| **එකතුව** | **266734** | **308679** | **314234** | **98297** | **138957** | **135150** | **365031** | **447636** | **449384** |

### දැක්ම

"සෞඛ්‍යදහමට අනුකූල වූ නිරෝගීමත් ජනතාවක්, සමෘද්ධිමත් පළාතක් "

### මෙහෙවර

" ආයුර්වේද දර්ශනය අර්ථවත් ලෙස උපයෝගී කර ගනිමින් රෝග නිවාරණ හා ප්‍රතිකාර හා පර්යේෂණ සේවා වැඩිදියුණු කිරීම, පාරම්පරික වෛද්‍ය ක්‍රමය හා ඖෂධීය ශාක වගාව සංරක්ෂණය, ප්‍රවර්ධනය සහ ඖෂධ නිෂ්පාදනය ඉහළ නැංවීම, විනිවිදභාවයෙන් හා ආයුර්වේද සේවාවේ හා අනෙකුත් පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් යුතුව ක්‍රියාවට නැංවීම. "

### දිගුකාලීන අරමුණු හා කෙටි කාලීන අරමුණු

### දිගුකාලීන අරමුණු

- ආයුර්වේද දර්ශනය තුළින් පළාත තුළ නිරෝගීමත් ජනතාවක් බිහි කිරීම.
- ආයුර්වේද ප්‍රතිකාර භාවිතයෙන් රෝග සුව කිරීම.
- ස්වභාවධර්මයට අනුකූලව අතුරු ආබාධවලින් තොර ප්‍රතිකාර පද්ධතියක් ඇති කිරීම.
- පාරම්පරික වෛද්‍ය ක්‍රමය සංරක්ෂණය කිරීම මඟින් නිරෝගීමත් ජනතාවක් බිහි කිරීම.
- ඖෂධ වගාව කිරීම තුළින් ඖෂධ හිඟය මගහරවා ප්‍රමිතියෙන් යුත් ගුණාත්මක ඖෂධ රෝගීන් වෙත ලබා දීම.
- ස්වභාවධර්මය සුරැකීම.

### කෙටි කාලීන අරමුණු

- ආයුර්වේද දර්ශනය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම.
- ආයුර්වේද ජීවන දර්ශනයට ජනතාව හුරු පුරුදු කිරීම.
- අතුරු ආබාධවලින් තොරව නිට්ටාවටම රෝග සුව කිරීම.
- සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම මධ්‍යම බෙහෙත් ශාලාවක් ඇති කිරීම.
- පාරම්පරික වෛද්‍යවරුන් සංරක්ෂණ සභාව වෙත යොමු කර ඔවුන්ගේ දත්ත ලේඛණගත කිරීම.
- ඔසු උයන් දහයක් පළාත තුළ ඇති කිරීම.

### ප්‍රධාන කාර්යයන්

- රෝග නිවාරණ සත්කාර සංවර්ධනය.
- රෝගී ප්‍රතිකාර සේවාව සංවර්ධනය.
- පාරම්පරික වෛද්‍ය ක්‍රමය සංරක්ෂණය සහ ප්‍රවර්ධනය.
- ඖෂධීය ශාක වගාව සහ ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය සංවර්ධනය.
- ආයතනික ධාරිතා සංවර්ධනය.
- යහපාලන කටයුතු සංවර්ධනය.

### ප්‍රධාන උපාය මාර්ගයන්
### 01.රෝග නිවාරණ

ආදර්ශ ගම්මාන ඇති කිරිම, ප්‍රවර්ධන සමාජ ඇති කිරිම, පාසල් සෞඛ්‍යදාන ඒකක ඇති කිරිම, පෙර පාසල් පෝෂණ වැඩ සටහන් ඇති කිරිම, රාජ්‍ය ආයතන දැනුවත් කිරිම, ජංගම සායන පැවැත්විම.

### 02. රෝග ප්‍රතිකාර

සෑම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයකටම ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාවක්, සෑම රෝහලකම ආයුර්වේද විවිධ සායන ආරම්භ කිරිම. සෑම රෝහලක්ම හා මධ්‍යම බෙහෙත් ශාලවකම බෝ නොවන රෝග සායන පැවැත්විම.

### 03. ඖෂධ

ඔසු ගොවින් ඇති කිරිම, පළාත් ඖෂධ නිශ්පාදනාගාරය වැඩි දියුණු කිරිම, රෝහල් ආශ්‍රිතව ඔසු උයන් 7 ක් අරම්භ කිරිම.

### කාර්ය මණ්ඩල සංයුතිය

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 602 |
| 2 | සේවයේ නියුතු | 374 |
| 3 | පුරප්පාඩු | 134 |
| 4 | අනියම් | 94 |

### මෙහෙයුම් ප්‍රතිඵල - පුනරාවර්තන වියදම්

| වියදම් ස්වභාවය | ඇස්තමේන්තු ගත ශුද්ධ ප්‍රතිපාදනය (රු.මි) | 2017 වර්ෂයේ වියදම් ( රු.මි.) | ඉතිරිය ( රු.මි. ) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පෞද්ගලික පඩිනඩි | 204.00 | 235.00 | - | 100 |
| ගමන් වියදම් | 2.00 | 2.00 | - | 100 |
| සැපයිම් | 77.00 | 42.00 | - | 54.55 |
| නඩත්තු | 7.00 | 7.00 | - | 100 |
| ගිවිසුම්ගත සේවා | 14.00 | 14.00 | - | 100 |
| මාරු කිරිම් | 1.00 | 0.50 | - | 50 |
| වෙනත් | 4.00 | 4.00 | - | 100 |
| **එකතුව** | **309.00** | **304.5** | **-** | **100** |

**පුනරාවර්තන වියදම් දරමින් සංවර්ධන ස්වභාවයේ වැඩ ඉටු කිරීම.**


| අනු අංකය | ව්‍යාපෘතිය | ප්‍රධාන ක්‍රියාකාරකම | අපෙක්ෂිත ප්‍රතිඵල | ප්‍රතිලාභින් ගණන |
|---|---|---|---|---|
| 01 | කැබිතිගොල්ලෑව ආයුර්වේද මධ්‍යම බෙහෙත්ශාලාව වටා වැට හා ගේට්ටුව ඉදිකිරිම | ඉදිකිරිම | මධ්‍යම බෙහෙත් ශාලාවේ ආරක්ෂාව | 13143 |
| 02 | ගල්නෑව ඔසු උයන වටා ගේට්ටුව සහිත වැටක් ඉදිකිරිම | ඉදිකිරිම | ඔසු උයනේ ආරක්ෂාව | - |
| 03 | තඹුත්තේගම ග්‍රාමීය ආයුර්වේද රෝහලේ පිරිමි වාට්ටුවේ අළුත්වැඩියාවන් කිරීම | අළුත්වැඩියා කිරීම | රෝගීන්ට පහසුකම් වැඩිකිරිම | 27276 |
| 04 | පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සනීපාරක්ෂක පද්ධතිය අළුත්වැඩියා කිරීම | අළුත්වැඩියා කිරීම | සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම | 50 |
| 05 | අනුරාධපුර පළාත් ආයුර්වේද රෝහලේ ගෙවන වාට්ටු අළුත් වැඩියා කිරීම | අළුත්වැඩියා කිරීම | රෝගීන්ට පහසුකම් වැඩිකිරිම | 111704 |
| 06 | මනම්පිටිය ආයුර්වේද රොහලේ වෛද්‍ය නිල නිවසේ ඉතිරි වැඩ නිම කිරීම | අළුත්වැඩියා කිරීම | වෛද්‍ය නිල නිවසේ පහසුකම් වැඩිදියුණු කිරීම | 22733 |
| 07 | වලගම්බාපුර අයුර්වේද ඔසු උයනේ ජල ටැංකිය ස්ථාපනය කිරීම. | ඉදිකිරිම | ඔසු උයනේ සංවර්ධනය | - |
| 08 | පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ වෛද්‍ය විවේකාගාරයේ වැසිකිළිය හා නාන කාමරය අළුත්වැඩියා කිරීම | අළුත්වැඩියා කිරීම | සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම | 98 |
| 09 | පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ගබඩා කාමරයේ දොර අළුත්වැඩියා කිරීම | අළුත්වැඩියා කිරීම | ගබඩාවේ ආරක්ෂාව | - |
| 10 | තලාව ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාවේ රාක්ක සකස් කිරිම | අළුත්වැඩියා කිරීම | නිමි ඖෂධ නිසි පරිදි තැම්පත් කිරීම | 8671 |
| 11 | ඉපලෝගම ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාව වටා වැටක ඉදිකිරීම | ඉදිකිරිම | මධ්‍යම බෙහෙත් ශාලාවේ ආරක්ෂාව | 5216 |

## මූලධන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2017 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 24.00 | 22.00 | 2.00 | 100 |
| ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 3.00 | 3.00 | - | 100 |
| වෙනත් මූලධන වත්කම් පුනරාවර්තන හා වැඩිදියුණු කිරීම | 34.00 | 25.00 | 9.00 | 100 |
| **එකතුව** | 61.00 | 50.00 | 11.00 | - |

## සංවර්ධන වැඩ පිළිබඳ කාර්ය සාධනය - පසුගිය වසර 03 ක ප්‍රාග්ධන වැය වීම්

| වර්ෂය | PSDG (රු.මි) | PCDG (රු.මි) | වෙනත් ප්‍රතිපාදන (රු.මි) | මුළු මුදල (රු.මි) |
|---|---|---|---|---|
| 2015 | 36.00 | 8.86 | 1.82 | 46.68 |
| 2016 | 91.51 | 0.50 | - | 92.01 |
| 2017 | 49.88 | 0.49 | - | 50.37 |



## දිගුකාලින හා කෙටිකාලීන අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ප්‍රධාන කාර්යන් හා සම්බන්ධ ව්‍යාපෘති

| අ.අ | අරමුණ | අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය/ ව්‍යාපෘති | ප්‍රධාන ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් ගණන | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ගණන | වෙන්කළ මුදල (රු.මි) | ප්‍රගතිය(%) | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | භෞතික | මූල්‍ය |
| 1 | ආයුර්වේද දර්ශනය තුළින් පළාත තුළ නිරෝගීමත් ජනතාවක් පාරම්පරික වෛද්‍ය ක්‍රමය සංරක්ෂණය කිරීම මහින් නිරෝගීමත් ජනතාවක් බිහි කිරීම බිහි කිරීම | 1.ආදර්ශ ගම්මාන<br>2.දිරිළිය<br>3.ප්‍රවර්ධන සමාජ<br>4.දේශිය ආහාරයෙන් සුව ජීවයට අත්වැලක්<br>5.ජංගම සායන<br>6.පාසල් සෞඛ්‍යදාන ඒකක<br>7.බෝනොවන රෝග පිටුදැකිමු<br>8.මතින් තොර දිවියක්<br>9.සුවදායි සැදෑ සමයක්<br>10සංරක්ෂණ සභා | වැ.ස<br>740<br>692<br>480<br>664<br>120<br>280<br>520<br>230<br>302<br>220 | 222000<br>207600<br>144000<br>199200<br>36000<br>84000<br>156000<br>69000<br>90600<br>66000 | 29 | 0.6<br>0.7 | 100<br>100<br>100<br>100<br>100<br>100<br>100<br>100<br>100<br>100 | 100<br>-<br>100 |
| 2 | රෝහල් හා මධ්‍යම බෙහෙත් ශාලා | | ප්‍රතිකාර කිරීම | 560679 | 29 | | 100 | |
| 3 | අතුරු ආබාධ වලින් තොරව නිට්ටාවටම රෝග සුව කිරීම. | - | - | - | - | - | - | - |
| 4 | පාරම්පරික වෛද්‍ය ක්‍රමය සංරක්ෂණය කිරීම | දිරි ගැන්වීම සඳහා ප්‍රතිලාභ ලබාදීම | මුදල් හා ත්‍යාග ලබාදීම | 355 | 29 | 1.8 | 100 | 100 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 5 | ඖෂධ වගාව කිරීම තුළින් ඖෂධ හිඟය මගහරවා ප්‍රමිතියෙන් යුත් ගුණාත්මක ඖෂධ රෝගීන් වෙත ලබා දීම. | ඔසු උයන් වගාව | ඔසු උයන් ඇති කිරිම | | 3 | | 100 | |
| 6 | ඔසු උයන් දහයක් පළාත තුළ ඇති කිරීම. | ඔසු උයන් වගාව | ඔසු උයන් ඇති කිරිම | - | - | - | - | - |

## මෙහෙයුම් සමාලෝචනය හා සංවර්ධන කාර්ය පිළිබඳ කාර්ය සාධනය



2017 වර්ෂයේ මෙම දෙපාර්තමේන්තුවේ සංවර්ධන කාර්යයන් සඳහා පළාත් සභා සංවර්ධන ප්‍රදාන යටතේ වෙන් කරන ලද ප්‍රතිපාදන වැය කරමින් 100 % ක භෞතික ප්‍රගතිය කරා ළඟා වීමට පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවට හැකියාව ලැබුණි.

බකමූන ආයුර්වේද රෝහල විවෘත කිරිම 2017.10.01 සිදු විය.
ඒ තුළින්
ආයුර්වේද රෝහල් සංවර්ධනය තුළින් රෝගී ප්‍රතිකාර සේවාව වඩාත් පුළුල් විය.

### සංඛ්‍යාත්මකව ප්‍රතිකාර ගත් රෝගීන්ගේ මුළු සංඛ්‍යාව 2015-2017

| | 2015 | 2016 | 2017 |
|---|---|---|---|
| අනුරාධපුර පළාත් ආයුර්වේද රෝහල | 113576 | 115640 | 115704 |
| තඹුත්තේගම ග්‍රාමීය ආයුර්වේද රෝහල | 20032 | 23519 | 27276 |
| පදවිය ග්‍රාමීය ආයුර්වේද රෝහල | 10816 | 29003 | 35383 |
| ගාලදිවුල්වැව ග්‍රාමීය ආයුර්වේද රෝහල | 9417 | 9946 | 9754 |
| මින්නේරිය මූලික ආයුර්වේද රෝහල | 41093 | 47397 | 50897 |
| මනම්පිටිය ග්‍රාමීය ආයුර්වේද රෝහල | 15281 | 20391 | 22733 |
| වැලිකන්ද ග්‍රාමීය ආයුර්වේද රෝහල | 9016 | 9680 | 8002 |
| සිරිපුර ග්‍රාමීය ආයුර්වේද රෝහල | 11422 | 20452 | 21589 |
| ඇළහැර ආයුර්වේද මධ්‍යම බෙහෙත්ශාලාව | - | - | 27932 |




දෙපාර්තමේන්තුව මගින් ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය යටතේ වැඩසටහන් රාශියක් සිදු කරන ලදී.

- ආදර්ශ ගම්මාන නායකයන් සඳහා විධිමත් සෞඛ්‍ය අධ්‍යාපන පුහුණුවක් සමග ආයුර්වේද ප්‍රථමාධාර මංජුසාවක්..
- ඔසු ගොවි ව්‍යාපෘතිය මගින් ගෘහ ආර්ථිකයට අත්වැලක්..
- කාබනික ගෙවතු වගාව තුළින් වස විසෙන් තොර ආහාර වේලක් ලබා ගැනීමට කටයුතු සැලසීම.
- ඔසු පැල ලබාදීම හා ගෙවතු ඔසු උයන් සෑදීමට අවශ්‍ය උපදෙස් ලබා දීම.
- ආයුර්වේදානුකූලව නිවැරදි ආහාර , චර්යා රටා හා රෝග නිවාරණය පිළිබඳ දැනුවත් කිරීම.











සියළු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය වන පරිදි සිදුකල ජංගම සායන

සියළු ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස ආවරණය වන පරිදි රෝගී ප්‍රතිකාර සේවාව සඳහා රෝහල් පද්ධතියක් ඉදි කරන ලදී.

## ආයුර්වේද ප්‍රතිකාර සේවාවේ ප්‍රගතිය

| | 2015 | 2016 | 2017 |
|---|---|---|---|
| අනුරාධපුර පළාත් ආයුර්වේද රෝහල | 113576 | 115640 | 115704 |

| | | | |
|---|---|---|---|
| තඹුත්තේගම ග්‍රාමීය ආයුර්වේද රෝහල | 20032 | 23519 | 27276 |
| පදවිය ග්‍රාමීය ආයුර්වේද රෝහල | 10816 | 29003 | 35383 |
| ගාලදිවුල්වැව ග්‍රාමීය ආයුර්වේද රෝහල | 9417 | 9946 | 9754 |
| මින්නේරිය මූලික ආයුර්වේද රෝහල | 41093 | 47397 | 50897 |
| මන්මපිටිය ග්‍රාමීය ආයුර්වේද රෝහල | 15281 | 20391 | 22733 |
| වැලිකන්ද ග්‍රාමීය ආයුර්වේද රෝහල | 9016 | 9680 | 8002 |
| සිරිපුර ග්‍රාමීය ආයුර්වේද රෝහල | 11422 | 20452 | 21589 |
| ඇලහැර ආයුර්වේද මධ්‍යම බෙහෙත්ශාලාව | - | - | 27932 |




## අනුරාධපුර පළාත් ආයුර්වේද රෝහලේ ගෙවන වාට්ටුවල රෝගීන් සංඛ්‍යාව හා ලැබූ ආදායම් 2015-2017

| ගෙවන වාට්ටු ආදායම් හා රෝගීන් ගණන | 2015 | 2016 | 2017 |
|---|---|---|---|
| රෝගී සංඛ්‍යා ලේඛන | 17 | 123 | 150 |
| වාර්ෂික ආදායම | රු.100,087.00 | රු.1,474,650.00 | රු.1,817,400.00 |

## 2017 වසරේ ක්‍රියාත්මක ප්‍රජා සෞඛ්‍ය සේවාව

## 2017 වර්ෂය තුළ පළාත තුළ සිදුකළ දැනුවත් කිරීමේ දේශන වැඩසටහන්.

| | ව්‍යාපෘතිය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | ආදර්ශ ගම්මාන | 740 (ගම්මාන 33ක) |
| 2 | දිරිළිය | 692 |
| 3 | ආයුර්වේද ප්‍රවර්ධන සමාජ | 480 |
| 4 | දේශීය ආහාරයෙන් සුව දිවියට අත්වැලක් | 664 |
| 5 | ජංගම සායන | 120 |
| 6 | පාසල් සෞඛ්‍යදාන ඒකක | 280 |
| 7 | බෝ නොවන රෝග පිටු දකිමු (ප්‍රජාව දැනුවත් කිරීම) | 520 |
| 8 | මතින් තොර දිවියක් | 230 |
| 9 | සුවදායි සැඳෑ සමයක් | 302 |
| 10 | සංරක්ෂණ සභා | 220 |

ආයුර්වේද දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

නව ව්‍යාපෘති

| | ව්‍යාපෘති අංකය | දිස්ත්‍රික්කය | ප්‍රා.ලේ. කොට්ඨාශය | ව්‍යාපෘතිය | වෙන්කළ මුදල (රු.මි) |
|---|---|---|---|---|---|
| 1 | 17/632/73/04/02/2102/23 (i) N/C/1 | අනුරාධපුර හා පොළොන්නරුව | | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ මිලදී ගැනීම | 0.50 |
| 2 | 17/632/73/04/02/2001/24 (iii) N/A/1 | අනුරාධපුර | නැ.නු.ප | අනුරාධපුර පළාත් ආයුර්වේද රෝහලේ වාට්ටු අළුත්වැඩියාව | 16.00 |
| 3 | 17/632/73/04/02/2001/ 24 ( iv) N/A/2 | අනුරාධපුර | තඹුත්තේගම | තඹුත්තේගම ආයුර්වේද රෝහලේ බාහිර රෝගී අංශය අළුත්වැඩියාව | 10.50 |
| 4 | 17/632/73/04/02/2104/ 24 ( i)N/A/5 | අනුරාධපුර | තඹුත්තේගම | තඹුත්තේගම ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාරයට යන්ත්‍ර සූත්‍ර සවි කිරිමට 100×32 ගොඩනැගිලි ඉදිකිරීම | 6.00 |

| | ව්‍යාපෘති අංකය | දිස්ත්‍රික්කය | ප්‍රා.ලේ. කොට්ඨාශය | ව්‍යාපෘතිය | වෙන්කළ මුදල (රු.මි) |
|---|---|---|---|---|---|
| 5 | 17/632/73/04/02/ 2102/24 (ii) N/C/6 | අනුරාධපුර | පොදු | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ මිලදී ගැනීම | 2.50 |
| 6 | 17/632/73/04/0 2/2001/24 (v ) N/P/3 | පොළොන්නරුව | දිඹුලාගල | මනම්පිටිය ආයුර්වේද රෝහලේ මුළුතැන්ගෙය අළුත්වැඩියාව. | 3.00 |
| 7 | 17/632/73/04/0 2/2001/ 24 (vi) N/P/4 | පොළොන්නරුව | හිඟුරක්ගොඩ | මින්නේරිය ආයුර්වේද රෝහලේ බාහිර රෝගී අංශය අළුත්වැඩියාව | 2.00 |
| **එකතුව** | | | | | 40.50 |

**2016 වර්ෂයෙන් අවිච්ඡේද වූ ව්‍යාපෘති.....**

| | ව්‍යාපෘති අංකය | දිස්ත්‍රික්කය | ප්‍රා.ලේ. කොට්ඨාශය | ව්‍යාපෘතිය | වෙන්කළ මුදල රු. |
|---|---|---|---|---|---|
| 1 | 16/630/73/04/02/2001/2 4(i)/C/A/1 | අනුරාධපුර | නැ.නු.ප | අනුරාධපුර පළාත් ආයුර්වේද රෝහලේ වාට්ටු අළුත්වැඩියාව | 0.68 |
| 2 | 16/630/73/04/02/2104//2 4(i)/C/A /12 | අනුරාධපුර | තඹුත්තේගම | තඹුත්තේගම ආයුර්වේද රෝහලේ පිරිමි වාට්ටුව ඉදිකිරීම | 3.69 |
| 3 | 16/630/73/04/02/2104/2 4(iv)/C/A/22 | අනුරාධපුර | තඹුත්තේගම | පළාත් නිෂ්පාදනාගාරයට යන්ත්‍රසූත්‍ර සවිකිරීම සඳහා ගොඩනැගිලි ඉදිකිරීම | 1.77 |
| 4 | 16/630/73/04/02/2104/2 4(v)/C/A/23 | අනුරාධපුර | ඉපලෝගම | ඉපලෝගම ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාව ඉදිකිරීම | 6.23 |
| 5 | 16/630/73/04/02/2502//2 4(i)/C/A/26 | අනුරාධපුර | කැබිතිගොල්ලෑව | ඔසු උයන් සංවර්ධනය | 1.06 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 6 | 16/630/73/04/02/2001/2 4(i)/C/P/2 | පොළොනන්රුව | හිඟුරක්ගොඩ | මින්නේරිය මූලික ආයුර්වේද රෝහලේ වාට්ටු අළුත්වැඩියාව | 1.59 |
| 7 | 16/630/73/04/02/2001/2 4(iii)/C/P/06 | පොළොන්නරුව | ඇලහැර | අත්තනකඩවල ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලා නිල නිවාසය අළුත්වැඩියාව | 1.07 |
| 8 | 16/630/73/04/02/2104//2 4(iii)/C/P/21 | පොළොන්නරුව | තමන්කඩුව | පාරම්පරික වෛද්‍ය වරුන්ගේ බෙහෙත් අලෙවිසැල හා පෝෂණ මන්දිරය ඉදිකිරිම | 4.78 |

**2017 නව වැඩ - පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ක්‍රියාත්මක සංවර්ධන කටයුතු.**

| අනු අංකය | ප්‍රා.ලේ. කො. | ක්‍රියාකාරකම | 2017 වර්ෂයේ වෙන්කළ මුදල (රු.මි) | 2017 වර්ෂයේ වැය වු මුදල (රු.මි) |
|---|---|---|---|---|
| 1 | නැ.නු.ප | අනුරාධපුර ආයුර්වේද රොහලේ 3 හා 4 වාට්ටු දෙකක් අළුත්වැඩියා කිරිම ( I අදියර ) | 16 | 16 |
| 2 | නැ.නු.ප | දෙපාර්තමේන්තුවේ ලේඛනාගාරය වැඩිදියුණු කිරිම | 0.59 | 0.53 |
| 3 | තඹුත්තේගම | තෙල්හිරියාව ඖෂධ නිෂ්පාදනාගාරයේ ගබඩා අංශයේ වැඩි දියුණු කිරීම | 2.8 | 2.5 |
| 4 | තඹුත්තේගම | තඹුත්තේගම ආයුර්වේද රෝහලේ බාහිරාංශය ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරිම | 8.4 | 8.25 |
| 5 | තඹුත්තේගම | තඹුත්තේගම ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාරයට යන්ත්‍ර සූත්‍ර සවිකිරිමට 100 x32 ගොඩනැගිලි ඉදිකිරිම | 6 | 6 |
| 6 | කාර්යාල උපකරණ මිළදී ගැනීම හා වෛද්‍ය උපකරණ මිලදී ගැනීම | | 2.5 | 2.5 |

## 2017 වර්ෂයේ කාර්ය සාධනය ළඟාකර ගැනීම පිළිබඳ අදහස.

- අනුරාධපුර ආයුර්වේද රෝහලේ වාට්ටු දෙකක් අළුත්වැඩියා කරන ලද අතර එහි රෝගීන් නේවාසිකව ප්‍රතිකාර ලබාගන්නා අතර එක් වාට්ටුවකට රෝගීන් 25 දෙනෙකුට පමණ ප්‍රතිකාර ලබාගත හැක. පංචකර්ම ප්‍රතිකාර, නාඩි ස්වේද වැනි ප්‍රතිකාර මෙම වාට්ටුව තුළ සිදුකරයි. මෙහි භික්ෂූන් වහන්සේලා සඳහා වෙනම කොටසක්ද වෙන්කර ඇත.
- දෙපාර්තමේන්තුවේ ලේඛනාගාරය වැඩිදියුණු කිරීම සිදු කරනු ලැබූ අතර පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවට අයත් සියළු ලිපි ලේඛන මෙහි ගබඩා කරනු ලැබේ. ආයතන අංශයට අයත් ලිපි ලේඛන, සංඛ්‍යා ලේඛන, ගිණුම් අංශයට අයත් වටිනා ලේඛන, අත් පත්‍රිකා හා ආයුර්වේද සඟරා යනාදිය මෙහි ගබඩා කරනු ලබයි.
- තඹුත්තේගම ආයුර්වේද රෝහලේ බාහිරාංශය ගොඩනැගිල්ල අළුත් වැඩියා කිරිම සිදු කරන ලද අතර මාසිකව බාහිරාංශය හරහා රෝගීන් 3000 කට අධික සංඛ්‍යාවක් ප්‍රතිකාර ගනු ලබයි.
- තෙල්හිරියාව ඖෂධ නිෂ්පාදනාගාරයේ ගබඩා අංශයේ වැඩිදියුණු කිරීම මෙම වර්ෂයේදී සිදු කරන ලදී. මෙම අංශයේ නිෂ්පාදිත ඖෂධ වන අරිෂ්ඨ, ආසව, ක්වාත, තෛල වර්ග, චූර්ණ වර්ග යනාදි නිමි ඖෂධ මෙහි ගබඩා කර තබනු ලබයි.
- මීට අමතරව වියළි ඖෂධ යනාදිය ද ගබඩා කරනු ලබයි.
- තඹුත්තේගම ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාරයට යන්ත්‍ර සූත්‍ර සවිකිරිමට ගොඩනැගිලි ඉදිකිරීම මගින් නිමි ඖෂධ ලෙස පෙති නිෂ්පාදනය, කල්ක නිපදවීම, හා ඖෂධ වියලීම යනාදිය සිදු කළ හැක. ඖෂධ නිෂ්පාදන ප්‍රමාණය වැඩි කිරීමටත්, ප්‍රමිතිය වැඩි කිරීමටත් මෙමගින් හැකියාව ලැබිණි.
- කාර්යාල උපකරණ මිලදී ගැනීම හා වෛද්‍ය උපකරණ මිලදී ගැනීම මගින් කාර්යාලීය කටයුතු හා රෝගීන් සඳහා වන ප්‍රතිකාර කටයුතු 2017 වර්ෂයේදී නිසි පරිදි සිදු කළ හැකි විය.

මෙය හිස්ව තබන ලද පිටුවකි

# පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව 8.3

පරිපාලන ආයතන

| | අනුරාධපුර | පොළොන්නරුව | එකතුව |
|---|---|---|---|
| පරිවාස කාර්යාල | 04 | 02 | 06 |
| උපදේශන මධ්‍යස්ථාන | 01 | - | 01 |
| ළමා රැඳවුම් මධ්‍යස්ථාන | 02 | - | 02 |
| සහතික කළ පාසල්(ගැහැණු) | 01 | - | 01 |
| භාර ගැනීමේ නිවාස | 01 | - | 01 |
| ළමා නිවාස | 06 | 04 | 10 |
| දිවා සුරැකුම් මධ්‍යස්ථාන | 04 | 02 | 06 |

ළමා නිවාස - 15 (ළමුන් 495)

දෙපාර්තමේන්තු කළමණාකාරිත්වය යටතේ ක්‍රියාත්මක වන ළමා නිවාස

අනුරාධපුර

01. අභය ළමා නිවාසය
02. යෙහෙළිය උපදේශන මධ්‍යස්ථානය
03. මඩාටුගම සහතික කළ පාසල
04. කාන්තා ළමා රැඳවුම
05. පිරිමි ළමා රැඳවුම

ස්වේච්ඡා සංවිධානවල කළමණාකාරිත්වය යටතේ ක්‍රියාත්මක වන ළමා නිවාස

| අනුරාධපුර | පොළොන්නරුව |
|---|---|
| අවන්ති දේවි ළමා නිවාසය | පැරකුම් බාලිකා ළමා නිවාසය |
| ප්‍රීති ළමා නිවාසය | බෝසත් බාලක ළමා නිවාසය |
| අශෝක බාලක ළමා නිවාසය | බෝසත් බාලිකා ළමා නිවාසය |
| සරණ සෙවණ ළමා නිවාසය | ශාන්ත ජෝශප් බාලිකා ළමා නිවාසය |
| මිත්‍ර ළමා නිවාසය | |
| SOS ගම්මානය | |

දැක්ම

"නීති ගරුක ප්‍රජාවක්, සුරක්ෂිත ළමා පරපුරක්".

මෙහෙවර

"සමාජ විරෝධී ක්‍රියාවල යෙදෙන්නවුන්, විශෝධනය සහ ළමුන්ගේ සමස්ත අයිතීන් සුරකිමින් සියලු පාර්ශවයන්ගේ මනා සහභාගීත්වයෙන් විනිවිදභාවයෙන් යුක්තව ක්‍රියාවට නැංවීම".

දිගුකාලීනඅරමුණු හා කෙටිකාලීන අරමුණු

දිගුකාලීන අරමුණු

- යහපත් පුරවැසියන්ගෙන් සපිරි සමාජයක්.
- ඉහළ ගුණාත්මක ළමා සුභසාධනයක්.
- ගුණාත්මක සේවාවන් සපයන ආයතනයක්.
- සංහිඳියාවෙන් යුත් කාර්යාලයක්.

කෙටිකාලීන අරමුණු

- ළමා රැකවරණය හා සුභසාධනය ඉහළ යාම.

- වරදකරුවන් පුනරුත්ථාපනය (ළමා, වැඩිහිටි) ඉහළ යාම.
- ළමුන්ගේ සමස්ත අයිතීන් සුරැකීම වර්ධනය වීම.
- ළමා අපයෝජන හා අපචාර අවම වීම.
- ආයතනයේ සියලු කටයුතු හා කාර්ය සාධනය ඉහළ යාම.
- සේවක අභිප්‍රේරණය ඉහළ යාම.

## ප්‍රධාන කාර්යයන්

- සමාජ විරෝධී ක්‍රියාවල යෙදෙන්නවුන් විශෝධනය.
- ළමුන්ගේ සමස්ත අයිතීන් සුරැකීම.
- ආයතනික ධාරිතා සංවර්ධනය.
- යහ පාලනය.

## ප්‍රධාන උපාය මාර්ගයන්

- ආඥා පනත් ක්‍රියාවට නැංවීම.
- අණපනත් මඟින් ලබා දී ඇති බලාධිකාරය ක්‍රියාත්මක කිරීම.
- චක්‍රලේඛ හා වෙනත් නිවේදන ක්‍රියාවට නැංවීම.
- ප්‍රඥප්තිය හා අරමුදල් මඟින් ලබා දී ඇති බලාධිකාරිය ක්‍රියාත්මක කිරීම.
- මනා මහජන සම්බන්ධීකරණය.
- වෙනත් ආයතන සමඟ සුහදව හා මිත්‍රශීලීව කටයුතු කිරීම.
- ආචාර ධර්මයන් භාවිතා කිරීම.

## කාර්ය මණ්ඩල සංයුතිය

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 152 |
| 2 | සේවයේ නියුතු | 105 |
| 3 | පුරප්පාඩු | 41 |
| 4 | අනියම් | 07 |

## මෙහෙයුම් ප්‍රතිඵල- පුනරාවර්තන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය (රු.මි) | 2017 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 52.25 | 52.25 | - | 100 |
| ගමන් වියදම් | 1.4 | 1.4 | - | 100 |
| සැපයීම් | 8.8 | 8.8 | - | 100 |
| නඩත්තු වියදම් | 1.5 | 1.5 | - | 100 |
| ගිවිසුම්ගත සේවා | 3.2 | 3.2 | - | 100 |
| මාරු කිරීම් | 13.0 | 13.0 | - | 100 |
| **එකතුව** | **80.15** | **80.15** | **-** | **100** |

පුනරාවර්තන වියදම් දරමින් සංවර්ධන ස්වභාවයේ වැඩ ඉටු කිරිම.


| අනු අංකය | ව්‍යාපෘතිය/ වැඩසටහන | ප්‍රධාන ක්‍රියාකාරකම | අපේක්ෂිත ප්‍රතිඵල | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|
| 01 | ප්‍රජාව දැනුවත් කිරිම | දැනුවත් කිරීම් | ළමා අපයෝජන හා අපචාර වළක්වා ගැනීම පිළිබඳ සමාජය දැනුවත් කිරීම. | 6300 |

මූලධන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය (රු.මි) | 2017 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදි කිරීම් | 16.10 | 10.80 | 5.30 | 67 |
| යන්ත්‍ර සූත්‍ර සවි කිරීම් හා උපකරණ | 8.90 | 8.40 | 0.50 | 94 |
| වෙනත් මූලධන වත්කම් පුනරාවර්තන හා වැඩිදියුණු කිරීම | 10.5 | 6.20 | 4.30 | 59 |
| **එකතුව** | **35.50** | **25.40** | **10.10** | **72** |

සංවර්ධන වැඩ පිළිබඳ කාර්ය සාධනය - පසුගිය වසර 03ක ප්‍රාග්ධන වැය විම්

| වර්ෂය | PSDG (රු.මි) | PCDG (රු.මි) | මුළු වියදම (රු.මි) |
|---|---|---|---|
| 2015 | 17.00 | 11.00 | 28.00 |
| 2016 | 5.59 | 8.10 | 13.69 |
| 2017 | 35.00 | 0.50 | 35.50 |



## 2017 වර්ෂයේ මෙහෙයුම් සමාලෝචනය හා සංවර්ධන කාර්ය පිළිබඳ කාර්ය සාධනය

## ළමුන්ගේ සමස්ත අයිතීන් සුරැකීම.

### 01. පිරිමි ළමා රැඳවුම් මධ්‍යස්ථාන අළුත්වැඩියා කිරීම.

අධිකරණ නියෝග මත වයස අවුරුදු 18ට අඩු පිරිමි දරුවන් මෙම ළමා රැඳවුම් මධ්‍යස්ථානයේ තාවකාලිකව රඳවා තබන අතර මෙම ළමා රැඳවුම් නිවාසයේ ළමුන් 35 ක් පමණ රඳවා තැබිය හැක. මෙම රැඳවියන් සඳහා වෙන්කොට ඇති කාමර ඉතා අබලන් තත්ත්වයේ තිබුණු හෙයින් එම කැම කාමර අළුත්වැඩියා කිරීම සිදුකළ අතර මේ සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන මුදල ලක්ෂ 7.5 කි.

### 02. කිරිකෙටුවැව පිරිමි සහතික කළ පාසල අළුත්වැඩියා කිරීම.

මෙම සහතික කළ පාසල කැබිතිගොල්ලෑව අධිකරණ කලාපයේ කිරිකෙටුවැව පිහිටා තිබෙන අතර ළමා නිවාසයන්හි ද්විතිය අධ්‍යාපනය නිමා කරනු ලබන පිරිමි දරුවන් 50 දෙනෙකු සඳහා නේවාසිකව වෘත්තිය පුහුණු පාඨමාලා පැවැත්වීමට අපේක්ෂා කරන අතර ඒ සඳහා රු. මි. 6.5 ක මුදලක් වෙන්කොට ක්‍රියාත්මක කරන ලදි.

### 03.අභය ළමා නිවාසය සඳහා සී.සී.ටී.වී (CC TV) පද්ධතියක් සවි කිරීම.

මෙම ළමා නිවාසයේ ඉතා බිළිදු දරුවන්ගේ සිට වයස අවුරුදු 05 දක්වා ළමුන් රඳවා සිටින අතර ඉතාම සුපරික්ෂාකාරිව මෙම දරුවන් රැක බලා ගත යුතු හෙයින් හා දරුවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම උදෙසා මෙම සී.සී.ටී.වී කැමරා පද්දධතිය සවි කිරීම සිදුකළ අතර මේ සඳහා රු. මි. 0.5 ක මුදලක් වෙන්කොට ක්‍රියාත්මක කරන ලදි.

### 04.අභය ළමා නිවාසයේ පල්දෝරු පද්ධතිය සැකසීම.

අභය ළමා නිවාසයේ දරුවන් 35 දෙනෙකු පමණ රඳවා සිටින අතර ඔවුන් විසින් සිදුකරන ලබන සියළු ස්නාන කටයුතු හා ළමා නිවාසයේ අපවහන ජලය බැහැරවීම පරිසර හිතකාමී නොවන හෙයින් විධිමත් ක්‍රමවේදයකට අනුව මෙම ජල අපවහන පද්ධතිය සකසා දරුවන්ගේ සෞඛ්‍ය සුරක්ෂා කිරීම උදෙසා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ අතර, ඒ සඳහා රු.මි. 0.5 මුදලක් වැය කොට ක්‍රියාත්මක කරන ලදි.

### 05.යෙහෙළි උපදේශන සේවා මධ්‍යස්ථානයේ ගේට්ටුව හා මුරකුටිය ඉදි කිරීම.

නොයෙක් මානසික කම්පනයන්ට හා ව්‍යාධින්ට ගොදුරුව සිටින ගැහැණු දරුවන් 50 දෙනෙකු මෙම උපදේශන සේවා මධ්‍යස්ථානයේ උපදේශනය ලබයි.

ගැහැණු දරුවන්ගේ ආරක්ෂාව සැලසීම සඳහා යොදවා සිටින මුර කරුවන් හා ආරක්ෂාව සඳහා ශක්තිමත් ගේට්ටුවක් අවශ්‍ය වූ හෙයින් මෙම උපදේශන සේවා මධ්‍යස්ථානය සඳහා රු.මි. 05ක මුදලක් වැයකොට ගේට්ටුව හා මුරකුටිය ඉදිකිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදි.

### 06.සරණ ළමා නිවාසයේ තාප්පය හා කාණු පද්ධතිය ඉදි කිරිම.

වයස අවුරුදු 18 ට අඩු ගැහැණු දරුවන් 35 දෙනෙකු නේවාසිකව මෙම ළමා නිවාසයේ සිටින අතර වට ආවරණ තාප්පය හා ජල අපවහන කාණු පද්ධතිය ඉදිකිරිම මෙම ව්‍යාපෘතිය මගින් සිදුකළ අතර මේ සඳහා රු.මි. 01 වෙන් කරන ලදි.

### 07.ළමා නිවාස සඳහා උපකරණ මිලට ගැනිම.

පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ අධිකරණ යටතේ ළමා නිවාස 15 ක් තුළ ළමුන් 420 ක් පමණ නේවාසිකගත කොට ඇති අතර, මෙම ළමා නිවාසයන්හි සියළු ගෘහ උපකරණ හා ළමුන් සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනිම මෙම ව්‍යාපෘතියෙන් සිදු කරනු ලබයි. මේ සඳහා 2017 වසරේ රු.මි. 2.4 ක මුදලක් වෙන් කරන ලදී.

### 08.නිවාස ගත කිරිමි අවම කිරිම යටතේ ස්වයංරැකියා හා නිවාස ආධාර.

ආනාථ, අත්හල, අසරණ හා අනාරක්ෂිත හේතුන් පාදක කොටගෙන දරුවන් නිවාස ගත කරන ලෙස දෙමාපියන් ඉල්ලා සිටින අතර, ළමා නිවාසයන්හි රැඳවිය හැකි දරුවන් ප්‍රමාණය මේ වන විට ඉකුත්ව ඇති හෙයින් හා දරුවන් දෙමව්පිය සහෝදර ආදරය හා ආරක්ෂාව ලබා දිමේ අරමුණ ඇතිව ආර්ථික අපහසුතා ඇති අය හට ස්වයං රැකියා ආරම්භ කිරිම සහයෝගය ලබා දිම සිදු වෙයි.







එසේම අනාරක්ෂිත දරුවන් සඳහා ආරක්ෂිත නිවාසයක් සාදා දිම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන අතර 2017 වසරේ ස්වයං රැකියා ආධාර 13 ක් හා නිවාස ආධාර 05 ක් ලබා දී ඇති අතර, මෙමගින් 100 දෙනෙක්ට පමණ ප්‍රතිලාභ හිමි වී තිබේ. මේ සඳහා රු.මි. 01 මුදලක් යොදවන ලදි.

**09.ළමුන් සමාජගත කිරිම.**



ළමා නිවාසගත දරුවන්ගේ ද්විතිය අධ්‍යාපනය නිමවන හා වෘත්තිය අධ්‍යාපනය හදාරා වයස අවුරුදු 18 සම්පූර්ණ දරුවන් සමාජගත කිරිමේ ව්‍යාපෘතිය මගින් සමාජගත කරනු ලබයි. මෙහි දි ඔවුන්ගේ ආර්ථික තත්ත්වයන් හා නිවාස ගැටළු සාකච්ඡා කරනු ලබයි. එසේම නිවාස ගත දරුවන් වැඩිවිය පැමිණවීමේ චාරිත්‍ර කටයුතු හා විවාහ උත්සව, සමාජගත කිරිමේ ව්‍යාපෘතිය මගින් සිදු කරනු ලබන අතර මේ සඳහා රු.මි. 01 ක් 2017 වසරේ යෙදවූ අතර දරුවන් 11 දෙනෙකු සමාජගත කිරිමේ කටයුත්ත සිදු කරන ලදි.

**10. පරිවාසිකයින් දැනුවත් කිරිම.**

2017 වර්ෂයේ පළාත තුළ අධීක්ෂණ භාරයේ පසු වූදිතයින් නිසි මගට ගැනීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් අධිකරණ කලාපයකට 02 බැගින් ක්‍රියාත්මක කරන ලදි. ඒ සඳහා රුපියල් ලක්ෂ පහක මුදලක් වැය කළ අතර දැනුවත් කරන ලද පරිවාසිකයින් සංඛ්‍යාව 1800 කි.

**11. නිවාසගත දරුවන්ගේ වාර්ෂික බක්මහ උලෙළ**

උතුරු මැද පළාත පුරා ක්‍රියාත්මක ළමා නිවාස 14 ක නේවාසික දරුවන් 450ක ගේ සහභාගිත්වයෙන් සිංහල දෙමළ අලුත් අවුරුද්දට සමගාමීව ජාතික ක්‍රීඩාවන්ට මුල් තැනක් දෙමින් මෙම බක්මහ උළෙල පවත්වනු ලබයි. මේ සඳහා රු. ලක්ෂ පහක මුදලක් 2017 වර්ෂයේ වැය කරන ලදි.



**12. නිවාසගත දරුවන්ගේ කුසලතා වැඩි දියුණු කිරීම**

නිවාසගත දරුවන්ගේ පාසල් අධ්‍යාපනය හමාර වීමෙන් පසු ඔවුන් සමාජගත කිරීමට පෙර වෘත්තීමය පුහුණු සඳහා යොමු කරනු ලබයි.

මේ සඳහා 2017 වර්ෂයේ යොමු කරන ලද ළමුන් සංඛ්‍යාව 95 වන අතර මොවුන් සඳහා පාවහන් හා බෑග් පාඨමාලා 02 ක් හඳුන්වා දුන් අතර ඒ වෙනුවෙන් රුපියල් මිලියනයක මුදලක් වැය කරන ලදි.

## 13. නිවාසගත දරුවන්ගේ වාර්ෂික අධ්‍යාපන හා විනෝද චාරිකා



උතුරු මැද පළාත තුළ ක්‍රියාත්මක ළමා නිවාස 14 ක නේවාසික දරුවන් 450 ක සහභාගිත්වයෙන් වාර්ෂිකව ක්‍රියාත්මක කරන තෙදින අධ්‍යාපන හා විනෝද චාරිකාව 2017 වර්ෂයේ ක්‍රියාත්මක කළ අතර ඒ සඳහා රුපියල් ලක්ෂ දහයක මුදලක් යොදවන ලදි.

## 14. නිවාස ගත දරුවන්ගේ වාර්ෂික ශිල ව්‍යාපාරය

මෙම ව්‍යාපෘතිය අනුරාධපුරය හා පොළොන්නරුව දිස්ත්‍රික්ක දෙකේ පිහිටි ළමා නිවාසයන්හි නේවාසික දරුවන්ගේ ශිල ව්‍යාපාරය වෙසක් පෝය දිනට සමගාමීව දිස්ත්‍රික්ක දෙකෙහි වෙන වෙනම ක්‍රියාත්මක කරනු ලබන මෙම වැඩ සටහනට මූල්‍යය දායක්වය පරිත්‍යාගශීලින් විසින් ලබා දී ඇත. නිවාසගත ළමුන් 450 ක් පමණ දිනය පුරා ශීල ව්‍යාපාරයේ යෙදෙන ලදී.

## 2017 වර්ෂයේ කාර්ය සාධනය ළඟා කර ගැනීම.

2017 වර්ෂය සඳහා මෙම දෙපාර්තමේන්තුව සඳහා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ රුපියල් මිලියන 35 ක මුදලක් වෙන් වූ අතර පළාත් සභා සංවර්ධන ප්‍රදාන යටතේ රුපියල් මිලියන 0.5 ක මුදලක් වෙන් වූහ. ඒ යටතේ ව්‍යාපෘති 18ක් ප්‍රධාන අරමුණු 02 සාක්ෂාත් කර ගැනීම සඳහා මෙහෙය වූ අතර එම සියලු ව්‍යාපෘතීන්හි භෞතික ප්‍රගතිය 100% ක් පූර්ණ කර ගැනීමට හැකි වූහ.



### කාර්ය සාධනය කරා ළඟා කර ගැනිමේදී මුහුණ දුන් ගැටළු හා අභියෝග

මෙම වසරේ සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමට පෙර අධීක්ෂණ ක්‍රියාවලියට සහ සම්බන්ධ ප්‍රධාන ආයතනයවන ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව වෙතින් ඇස්තමේන්තු ලබා ගැනීමට කල්වේලා නොහැකි වීම හේතුවෙන් සමහරක් ව්‍යාපෘතීන්

2017.12.31 දින දක්වා ක්‍රියාත්මක කිරීමට සිදු වූ අතර එතුළින් මතු වූ අක්මුදල් හිඟය හේතුවෙන් සමහරක් ව්‍යාපෘතීන්හි ගෙවීම් බිල්පත් අතැති බිල්පත් ලෙස 2018 වර්ෂයට ඉදිරිපත් කිරීමට හේතු වූයෙන් 2018 වර්ෂය සඳහා වෙන් වූ ප්‍රතිපාදනයන්ගෙන් අතැති බිල්පත් සඳහා ගෙවීම් කිරීමට සිදු වූහ. එමගින් 2018 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘති අපේක්ෂිත අරමුණු කරා මෙහෙයවීමට බාධා සිදුවී ඇත.

## දිගුකාලීන හා කෙටිකාලීන අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ප්‍රධාන කාර්යයන් හා සම්බන්ධ ව්‍යාපෘති

| අනු අංකය | අරමුණ | අරමුණ ඉටු කර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් | ප්‍රතිලාභීන් ගණන | ආවරණය කළ ප්‍රා.ලේ. කො. ගණන | වෙන් කළ මුදල (රු.මි.) | ප්‍රගතිය (%) | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | භෞතික | මූල්‍ය |
| 1 | ළමුන්ගේ සමස්ත අයිතීන් සුරකීම | පිරිමි ළමා රැඳවුම් මධ්‍යස්ථානය අළුත්වැඩියා කිරීම | අළුත්වැඩියා කිරීම | 30 | 1 | 0.65 | 100 | 100 |
| 2 | | කිරිකෙටුවැව සහතික කළ පාසල අළුත්වැඩියා කිරීම | අළුත්වැඩියා කිරීම | 40 | 1 | 6.55 | 100 | 47 |
| 3 | | අභය ළමා නිවාසය හා ළමා රැඳවුම් මධ්‍යස්ථානය සඳහා CCTV කැමරා පද්ධතියක් සවි කිරීම | සවිකිරීම් | 35 | 1 | 0.5 | 100 | 100 |
| 4 | | අභය ළමා නිවාසයේ පල්දෝරු පද්ධතිය ඉදිකිරීම | ඉදිකිරීම් | 35 | 1 | 0.5 | 100 | - |
| 5 | | යෙහෙළි උපදේශන මධ්‍යස්ථානයේ ගේට්ටුව හා මුරකුටිය ඉදිකිරීම | ඉදිකිරීම් | 35 | 1 | 0.36 | 100 | 100 |
| 6 | | සරණ ළමා නිවාසයේ කාණු පද්ධතිය ඉදිකිරීම | ඉදිකිරීම් | 28 | 1 | 0.15 | - | - |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 7 | ළමුන්ගේ සමස්ත අයිතීන් සුරැකීම | සරණ ළමා නිවාසයේ තාප්පය හා කාණු පද්ධතිය ඉදිකිරීම | ඉදිකිරීම් | 28 | 1 | 1 | 100 | 100 |
| 8 | | ළමා නිවාස සඳහා උපකරණ මිලට ගැනීම | මිලදී ගැනීම් | 320 | 29 | 2.4 | 100 | 78 |
| 9 | | නිවාසගත කිරීම් අවම කිරීම සඳහා නිවාස හා ස්වයං රැකියා ආධාර | ආධාර | 14 | 29 | 1 | 100 | 100 |
| 10 | | ළමුන් සමාජගත කිරීම | සමාජගත කිරීම | 4 | 3 | 1 | 100 | 98 |
| 11 | | පරිවාසකයින් දැනුවත් කිරීම | දැනුවත් කිරීම් | 1800 | 29 | 0.5 | 100 | 96 |
| 12 | | පාසල් ළමුන් දැනුවත් කිරීම | දැනුවත් කිරීම් | 4200 | 29 | 0.5 | 100 | 99 |
| 13 | | නිවාසගත දරුවන්ගේ විෂයානුබද්ධ දැනුම වැඩි දියුණු කිරීම | පුහුණු | 320 | 29 | 1 | 100 | 94 |
| 14 | | නිවාසගත දරුවන්ගේ වෘත්තීය කුසලතා වැඩි දියුණු කිරීම | පුහුණු | 75 | 29 | 1 | 100 | 95 |
| 15 | ධාරිතා සංවර්ධනය | කාර්යාලය හා පරිවාස කාර්යාල සඳහා උපකරණ මිලට ගැනීම | මිලදී ගැනීම් | 152 | 29 | 1 | 100 | 98 |
| 16 | | අනුරාධපුර පරිවාස කාර්යාලය ඉදිකිරීම (අදියර ii) | ඉදිකිරීම් | - | 4 | 13.6 | 100 | 66 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 17 | ධාරිතා සංවර්ධනය | කොමසාරිස් නිල නිවාසයේ වැට සහ ගේට්ටුව ඉදි කිරීම | ඉදිකිරීම් | - | 1 | 0.5 | 100 | 81 |
| 18 | | කොමසාරිස් නිල නිවාසය ඉදිකිරීම (අදියර ii) | ඉදිකිරීම් | | 1 | 3.3 | 100 | 27 |

| සංවර්ධන ව්‍යාපෘති මගින් කෙටිකාලීනව අපේක්ෂා කරන ප්‍රතිලාභ | | |
|---|---|---|
| අංකය | ව්‍යාපෘතිය | කෙටිකාලීන බලපෑම(Outcome) |
| 01 | පිරිමි ළමා රැඳවුම් මධ්‍යස්ථානය අළුත්වැඩියා කිරීම | සුරක්ෂිත ළමා නිවාසයක් බිහිවීම. |
| 02 | කිරිකෙටුවැව සහතික කළ පාසල අළුත්වැඩියා කිරීම | නිවාසගත දරුවන්හට වෘත්තීය පුහුණු පාසලක් බිහිවීම. |
| 03 | අභය ළමා නිවාසය හා ළමා රැඳවුම් මධ්‍යස්ථානය සඳහා CCTV කැමරා පද්ධතියක් සවි කිරීම | ළමා නිවාස දරුවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම. |
| 04 | අභය ළමා නිවාසයේ පල්දෝරු පද්ධතිය ඉදිකිරීම | දරුවන්ගේ සනීපාරක්ෂාව තහවුරු කිරීම. |
| 05 | යෙහෙළි උපදේශන මධ්‍යස්ථානයේ ගේට්ටුව හා මුරකුටිය ඉදිකිරීම | දරුවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම. |
| 06 | සරණ ළමා නිවාසයේ කාණු පද්ධතිය ඉදිකිරීම | - |
| 07 | සරණ ළමා නිවාසයේ තාප්පය හා කාණු පද්ධතිය ඉදිකිරීම | දරුවන්ගේ සුරක්ෂාව තහවුරු කිරීම. |
| 08 | ළමා නිවාස සඳහා උපකරණ මිලට ගැනීම | ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම. |
| 09 | නිවාසගත කිරීම් අවම කිරීම සඳහා නිවාස හා ස්වයං රැකියා ආධාර | ස්වයං රැකියා බිහිවීම. |
| 10 | ළමුන් සමාජගත කිරීම | යහපත් පුරවැසියන් සමාජයට යොමු කිරීම. |
| 11 | පරිවාසකයින් දැනුවත් කිරීම | ළමා අපචාර හා අපයෝජන අවම කිරීම. |
| 12 | පාසල් ළමුන් දැනුවත් කිරීම | ළමා අපචාර හා අපයෝජන අවම කිරීම. |
| 13 | නිවාසගත දරුවන්ගේ විෂයානුබද්ධ දැනුම වැඩිදියුණු කිරීම | ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම. |
| 14 | නිවාසගත දරුවන්ගේ වෘත්තීය කුසලතා වැඩිදියුණු කිරීම | ස්වයං රැකියා බිහිවීම. |
| 15 | කාර්යාලය හා පරිවාස කාර්යාල සඳහා උපකරණ මිලට ගැනීම | යහ පාලනය තහවුරු වීම. |
| 16 | අනුරාධපුර පරිවාස කාර්යාලය ඉදිකිරීම | යහ පාලනය තහවුරු වීම. |
| 17 | කොමසාරිස් නිල නිවාසයේ වැට සහ ගේට්ටුව ඉදි කිරීම | යහ පාලනය තහවුරු වීම. |

### සංවර්ධන ව්‍යාපෘති තුළින් ජනිත කළ ප්‍රතිලාභ විශ්ලේෂණය කිරීම.

| අනු අංකය | ව්‍යාපෘතිය | තමන්ගේ විෂය පථයට හසුවන අරමුණ | මුදල | | ප්‍රගතිය | | ලැබුණු කෙටිකාලීන/දිගුකාලින ප්‍රතිඵල |
|---|---|---|---|---|---|---|---|
| | | | වෙන් කළ (රු.මි) | වැය කළ (රු.මි) | භෞතික (%) | මූල්‍ය (%) | |
| 1. | බෝසත් බාලිකා ළමා නිවාසයේ අළුත්වැඩියාව | ළමුන්ගේ සමස්ත අයිතීන් සුරැකීම | 2.1 | 1.5 | 100 | 72 | සුරක්ෂිත ළමා නිවාසයක් බිහිවීම |
| 2. | පැරකුම් බාලිකා ළමා නිවාසය අළුත්වැඩියාව | | 1.5 | 1.2 | 100 | 80 | |

### 2017 වර්ෂයේ කාර්ය සාධනය ළඟාකර ගැනිම පිළිබඳ සමස්ත අදහස

දිගුකාලින හා කෙටිකාලීන අරමුණු ඉටුකර ගැනිම සඳහා ක්‍රියාත්මක කළ ප්‍රධාන ව්‍යාපෘති මගින් අපේක්ෂිත ඉලක්ක කරා ළඟා විය හැකි විය. නමුත් 2018 වර්ෂය සඳහා වෙන් වූ ප්‍රතිපාදනයන්ගෙන් අතැති බිල්පත් සඳහා ගෙවීම් කිරීමට සිදු විය.

එමගින් 2018 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘති අපේක්ෂිත අරමුණු කරා මෙහෙයවීමට බාධා වෙතැයි අපේක්ෂා කෙරේ. සංවර්ධන ව්‍යාපෘති තුළින් ජනිත කළ ප්‍රතිලාභ විශ්ලේෂණය කිරීමේදි පෙනි යන්නේ පළාතේ පරිවාස හා ළමා ආරක්ෂණය සම්බන්ධයෙන් 2017 වර්ෂය තුළ කැපි පෙනෙන දායකත්වයක් ලබා දිය හැකි වූ බවයි.

මෙය හිස්ව තබන ලද පිටුවකි

# පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව

8.4

## දෙපාර්තමේන්තුව සතු ආයතන

| ආයතනය | අනුරධපුර | පොළොන්නරුව | උ.මැ.ප |
|---|---|---|---|
| වැඩිහිටි නිවාස | 01 | 01 | 02 |
| විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ පුහුණු පාසැල් | 03 | 01 | 04 |
| විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ රැකවරණ මධ්‍යස්ථාන | 01 | - | 01 |
| සංවර්ධන පුහුණු මධ්‍යස්ථාන | - | 01 | 01 |

| ආයතනය | නේවාසික පහසුකම් ලබාදිය හැකි සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | | |
|---|---|---|---|---|
| වැඩිහිඩි නිවාස | | ගැහැණු | පිරිමි | එකතුව |
| ශාන්ති සෙවන වැඩිහිටි නිවාසය - සාලියපුර | 302 | 151 | 151 | 302 |
| සැදෑ සෙවන විශ්‍රාමික වැඩිහිටි නිවාසය - බුල්නෑව | 05 | 02 | 12 | 04 |
| විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ පුහුණු පාසැල් | | | | |
| සතුට ළමා නිවාසය - සාලියපුර | 30 | 28 | - | 28 |
| ඇලගමුව වෘත්තීය පුහුණු ආයතනය | 30 | 11 | 11 | 22 |
| විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ ආයතනය - සේවාගම | 50 | - | 38 | 38 |
| විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ ආයතනය - නොච්චියාගම | 25 | - | 13 | 13 |
| අනෙකුත් ආයතන | | | | |
| ඔළුකරද රැකවරණ මධ්‍යස්ථානය | - | - | - | - |
| අත්වැල සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය | 12 | - | - | - |

## ආධාර ගෙවීම් පිළිබඳ විස්තර

| විස්තරය | අනුරාධපුර | | පොළොන්නරුව | | එකතුව | |
|---|---|---|---|---|---|---|
| | 2015 | 2016 | 2015 | 2016 | 2015 | 2016 |
| මහජන ආධාරලාභීන් | 23,750 | 23,338 | 4,876 | 28,626 | 28,626 | 27,958 |
| විශේෂ මහජනාධාර | 2,767 | 3,116 | 335 | 3,059 | 3,059 | 3,451 |
| රෝගාධාර | 1,688 | 419 | 113 | 2,306 | 2,306 | 532 |
| නිවුන්දරු ආධාර | 151 | 332 | 60 | 218 | 218 | 392 |
| විවිධ රෝග ආධාර | 3,322 | 2,949 | 168 | 3,520 | 3,520 | 3,117 |
| පූර්ණ ආබාධ ආධාර | 630 | 743 | 162 | 770 | 770 | 905 |
| පාසැල් ශිෂ්‍යාධාර | 3,507 | 4,286 | 1,172 | 4,598 | 4,598 | 5,458 |
| එකතුව | 35,815 | 35,183 | 6,630 | 43,086 | 43,086 | 41,813 |

## වැඩිහිටි ජනගහනය

| | | |
|---|---|---|
| ශ්‍රී ලංකාවේ වැඩිහිටි ජනගහනය | - | 2,650,000 |
| උතුරුමැද පළාතේ වැඩිහිටි ජනගහනය | - | 124,685 (4.7%) |
| අනුරාධපුර දිස්ත්‍රික්කය | - | 82,889 (3.13%) |
| පොළොන්නරුව දිස්ත්‍රික්කය | - | 41,796 (1.58%) |

### දැක්ම

"සමාජ රැකවරණය අවශ්‍ය වූවන්ට සුරක්ෂිත ජීවිතයක්"

### මෙහෙවර

"පළාතේ ජීවත්වන දිළිඳු, ආබාධ සහිත, වැන්දඹු භාවයට පත් සහ ව්‍යසනයන්ට ලක්වූ අසරණ ජනතාවට සාධාරණ ක්‍රමවේදයක් සමගින් ආධාර හා මග පෙන්වීම්, අවශ්‍ය සහන සහ රැකවරණය සලසමින් ,ඔවුන්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීම සහ සමාජයේ පිළිගත් පිරිසක් බවට පත් කිරීම.."

### දිගුකාලීන අරමුණු හා කෙටි කාලීන අරමුණු

### දිගුකාලීන අරමුණු

- රෝගීබව, මහළුබව, ආබාධිතබව හෝ අනාථභාවය නිසා සමාජයීය වරප්‍රසාද අහිමි වූ පුද්ගලයින්ගේ සුභසාධනය තහවුරු කිරීම.
- වැඩිහිටි නිවාස හා රැකවරණය අහිමි විශේෂ අවශ්‍යතා සහිත ළමුන් සඳහා නිවාස පවත්වාගෙන යෑම හා නඩත්තු කිරීම.
- වැඩිහිටියන් වැඩිහිටි නිවාසවලට යොමු කිරීම අවමවන පරිදි ඔවුන් රැකබලා ගැනීමේ වගකීම අදාල පවුල්වලට සහ ප්‍රජාවට පැවරෙන අයුරින් ක්‍රියාමාර්ග හා ක්‍රමවේද හඳුනා ගැනීම.
- සමාජයීය වශයෙන් අවාසි සහගත පුද්ගලයින් සඳහා සාමාජයීය වටිනාකමක් ගොඩනැගීම.
- ආධ්‍යාත්මීය වශයෙන් සංවර්ධනය වූ සාරධර්ම සුරකින , රටේ සංවර්ධනාත්මක කටයුතු සඳහා දායක වන තරුණ ප්‍රජාවක් ගොඩනැගීම.
- යහආකල්ප සංවර්ධනය වූ ගුණාත්මක මහජන සම්බන්ධතාවයන් පවත්වාගනිමින් ඵලදායී හා කාර්යක්ෂම සේවා සපයන සේවකයින් බිහිකිරීම.

### කෙටි කාලීන අරමුණු

- දිළිඳු බවින් පීඩාවට පත් පුද්ගලයින් සඳහා ආධාර ලබා දීම තුළින් ජීවත් වීමට රුකුලක් වීම.
- ශාරීරික හා මානසික වශයෙන් ආබාධ සහිත වූවන්ගේ ආර්ථික තත්ත්වය නගා සිටුවීමට කටයුතු කිරීම හා රැකවරණය සැලසීම.
- රෝගී වීම මගින් අසරණ වූ පුද්ගලයින් සඳහා සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීමට උපකාර කිරීම.
- අසරණ වූ වැඩිහිටියන් සුරක්ෂිත කිරීම හා වැඩිහිටි සුභසාධනය ඉහළ නැංවීම.
- වැන්දඹු කාන්තා පවුල්වල සුභසාධනය හා ආර්ථික සංවර්ධනය ඉහළ නැංවීම.
- හදිසි ආපදාවන්ට ලක්වූවන්ට සහන සැලසීම.
- පළාත තුළ මත්ද්‍රව්‍ය නිවාරණය.
- අන්ත දුගී පවුල්වල දක්ෂ දරුවන්ගේ අධ්‍යාපන සංවර්ධනය.

### ප්‍රධාන කාර්යයන්

- රෝගීබව, මහළුබව, ආබාධිතබව හෝ අනාථභාවය නිසා සමාජයීය වරප්‍රසාද අහිමි වූ පුද්ගලයින්ගේ සුභසාධනය තහවුරු කිරීම.
- වැඩිහිටි නිවාස හා රැකවරණය අහිමි විශේෂ අවශ්‍යතා සහිත ළමුන් සඳහා නිවාස පවත්වාගෙන යෑම හා නඩත්තු කිරීම.
- වැඩිහිටියන් වැඩිහිටි නිවාසවලට යොමුකිරීම අවමවන පරිදි ඔවුන් රැකබලා ගැනීමේ වගකීම, අදාල පවුල්වලට සහ ප්‍රජාවට පැවරෙන අයුරින් ක්‍රියාමාර්ග හා ක්‍රමවේද හඳුනා ගැනීම.
- සමාජයීය වශයෙන් අවාසි සහගත පුද්ගලයින් සඳහා සමාජයීය වටිනාකමක් ගොඩනැගීම සඳහා සුදුසු ව්‍යාපෘති හඳුනා ගනිමින් ක්‍රියාත්මක කිරීම.
- විවිධ සමාජ විරෝධී ඇබ්බැහිවීම් නිසා පුද්ගලයාට,පවුලට සහ සමාජයට තර්ජනයක්ව සිටින පුද්ගලයින් තුළ ආධ්‍යාත්මික සංවර්ධනයක් ගොඩනැංවීම සඳහා ක්‍රියා කිරීම .

### ප්‍රධාන උපාය මාර්ගයන්

- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආශ්‍රිත සියළුම ග්‍රාම නිලධාරි තුලාන්වල ජීවත්වන අඩු ආදායම්ලාභි, අන්ත අසරණ බවට පත්ව සිටින රෝගී පුද්ගලයින් සහ එම පවුල්, ආර්ථික හා වෙනත් හේතූන් මත විවිධ තර්ජනයන්ට, මානසික, කායික රැකවරණය අහිමිව සිටින වැඩිහිටි තැනැත්තන් පිළිබඳව, ආබාධ සහිත තත්ත්වය මත සාමාජයීය වරප්‍රසාද අහිමි වී සිටින පුද්ගලයින් පිළිබඳව දත්ත රැස් කරමින් එම පුද්ගල අවශ්‍යතාවයන් ඉටුකරලීම සඳහා සෘජු මැදිහත්වීම, අවශ්‍ය පරිදි මාසික සහනයන් සැලසීම සිදුකෙරේ.
- රැකවරණය අහිමිව විවිධ ස්ථානයන්වල අනාරක්ෂිතව සිටින සහ නිවෙස් තුළ අසරණව අනාරක්ෂිතව සිටින වැඩිහිටි, විශේෂ අවශ්‍යතා සහිත තැනැත්තන් සඳහා රැකවරණය සපයමින් නිවාසගත කිරීමට හෝ පවුල තුළ මානසික, කායික ආරක්ෂාව සහිතව ජීවත්වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ලබාදීමට මැදිහත් වේ.
- සමාජයීය වශයෙන් අවාසිසහගත පුද්ගලයින් සඳහා සාමාජයීය වටිනාකමක් ලබාදීම අරමුණු කරගනිමින් ඔවුන්ගේ අවශ්‍යතා ඉටුකරගැනීම සඳහා අවශ්‍ය කරන ආධාරක, උපකරණ ලබා දීම සිදු කෙරේ.
- එම පුද්ගලයින්ගේ සහ එම පවුල්වල ආර්ථික ගැටළු අවම කරමින් ජීවන උත්පාදනයන් සඳහා අවශ්‍ය දැනුම ලබාදීම සඳහා අවශ්‍ය පුහුණු සමඟ ස්වයං රැකියා අවස්ථා වෙත යොමු කරමින් එමගින් ආර්ථික වාසි ලබා ගැනීමට අවශ්‍ය මග පෙන්වීම සිදු කරනු ලැබේ.

- ස්වාමියා අහිමිවීම නිසා වැන්දඹුභාවයට හා අසරණභාවයට පත්වෙමින් තම දූ දරුවන් සමග ඔවුන්ගේ ආරක්ෂාව සම්බන්ධව වෙහෙසෙමින් ඔවුන්ගේ අධ්‍යාපනයන් සඳහා වෙහෙස වෙමින්, තම ආර්ථිකය ද ශක්තිමත් කරගැනීමට වෙර වීරිය දරන කාන්තාවන්ගේ අනාරක්ෂිත නිවාස සහ ආබාධිත, වැඩිහිටි තැනැත්තන්ගේ අනාරක්ෂිත නිවාස සකස් කරගැනීමට සුවසේ ජීවත්වීම සඳහා නිවාස ආධාර ලබාදීම ද උපාය මාර්ගයකි.
- ඉහතින් සඳහන් කරන ලද රෝගී පවුල්, වැන්දඹු සහ ආබාධ සහිත තත්ත්වයට පත්ව සිටින පවුල්වල මහත් දුෂ්කරතාවයෙන් යුතුව අධ්‍යාපනය ලබා දීමට වෙහෙසෙන මෙන්ම මහත් උනන්දුවෙන් අධ්‍යාපනය ලැබීමට වෙහෙසෙන දරුවන්ගේ අධ්‍යාපන අවශ්‍යතා සඳහා මාසිකව ශිෂ්‍යාධාර ලබාදෙමින් රටට ඵලදායී දරු පිරිසක් නිර්මාණය කිරීමට මැදිහත්වීම ද උපාය මාර්ගයකි.
- විවිධ ඇබ්බැහිවීම් සහ සමාජ විරෝධී පුද්ගලයින් කොට්ඨාශ මට්ටමින් හඳුනා ගනිමින් ඔවුන් සඳහා කඳවුරුගත නේවාසික වැඩසටහන් පවත්වා පසුවිපරම් කරමින් ඔවුන් යහමාර්ගයට ගැනීම සඳහා .

### කාර්ය මණ්ඩල සංයුතිය

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 173 |
| 2 | සේවයේ නියුතු | 123 |
| 3 | පුරප්පාඩු | 52 |

### මෙහෙයුම් ප්‍රතිඵල-පුනරාවර්තන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය (රු.මි) | 2017 වර්ෂයේ වියදම් (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩි නඩි | 58 | 58 | - | 100 |
| ගමන් වියදම් | 1.5 | 1.5 | - | 100 |
| සැපයීම් | 2.8 | 2.8 | - | 100 |
| නඩත්තු වියදම් | 3.7 | 3.7 | - | 100 |
| ගිවිසුම්ගත සේවා | 4.4 | 4.4 | - | 100 |
| මාරු කිරීම් | 374 | 374 | - | 100 |
| සහනාධාර | 0.14 | 0.14 | - | 100 |
| **එකතුව** | **444.54** | **444.54** | **-** | **100** |

පුනරාවර්තන වියදම් දරමින් සංවර්ධන ස්වභාවයේ වැඩ ඉටු කිරීම

| අනු අංකය | ව්‍යාපෘතිය/වැඩසටහන | ප්‍රධාන ක්‍රියාකාරකම | සත්‍ය වියදම (රු.මි) | ගෙවීම (රු.මි) |
|---|---|---|---|---|
| 01 | සාලියපුර වැඩිහිටි නිවාසයේ අළුත්වැඩියා කටයුතු | ශාලා අංක 1,2,3,4 අලුත් වැඩියාව | 0.87 | 0.79 |
| 02 | සාලියපුර වැඩිහිටි නිවාසයේ අළුත්වැඩියා කටයුතු | ශාලා අංක 5,6,7 අලුත් වැඩියාව | 0.62 | 0.56 |

මූලධන වියදම් - පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය (රු.මි) | උප ව්‍යාපෘති | 2017 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජ්‍යතාය (%) |
|---|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | | | | | |
| වැඩිහිටි නිවාස නවීකරණය | 1.00 | 1.සාලියපුර වැඩිහිටි නිවාසය නවීකරණය | 0.94 | 0.06 | 100 |
| | 0.41 | 2.ගිරිතලේ නිවාස ගොඩනැගිල්ලෙහි ඉතිරි කටයුතු | 0.32 | 0.09 | 100 |
| | 2.00 | 3.දිවා මධ්‍යස්ථාන නවීකරණය | 1.07 | අවිච්ඡේද | 100 |
| ආබාධිත රැඳවුම් නිවාස හා වෘත්තීය පුහුණු ආයතන නවීකරණ | 4.00 | 1.ඔළුකරද රැඳවුම් නිවාසය නවීකරණය | 1.26 | අවිච්ඡේද | 60 |
| කාර්යාල ගොඩනැගිල්ල අළුත්වැඩියාව | 0.65 | 1.කාර්යාල ගොඩනැගිල්ල අළුත්වැඩියාව | 0.26 | අවිච්ඡේද | 90 |
| නිල නිවාස අළුත් වැඩියාව | 2.00 | 2.නිල නිවාස අළුත්වැඩියාව | 1.70 | 0.29 | 100 |
| ගෘහ භාණ්ඩ හා කාර්යාලයීය උපකරණ | 3.00 | 1.වැඩිහිටි නිවාස,ආබාධිත වෘත්තීය පුහුණු ආයතන,සඳහා ගෘහ භාණ්ඩ හා කාර්යාලයීය උපකරණ මිලදී ගැනීම. | 2.99 | 134.00 | 100 |
| ගොඩනැගිලි ඉදිකිරීම් | 1.35 | 1.ආබාධ සහිත පුද්ගලයින් සඳහා සනීපාරක්ෂක පහසුකම් ලබා දීම. | 0.46 | අවිච්ඡේද | |


| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය (රු.මි) | උප ව්‍යාපෘති | 2017 වර්ෂයේ වියදම (රු.) | ඉතිරිය (රු.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|---|
| වැට මායිම් නිරවුල් කිරීම | 1.00 | සාලියපුර වැඩිහිටි නිවාසයේ වැට සකස් කිරීම | 0.01 | අවිච්ඡේද | 100 |
| වෙනත් | 3.00 | 1.මාසික මහජනාධාර ජාලගත කිරීම | 2.9 | 0.05 | 100 |
| දැනුම වර්ධනය හා ආයතනික සංවර්ධනය | 1.00 | 1.සංවර්ධන නිලධාරීන් 03 දෙනෙකු සඳහා උපදේශන ඩිප්ලෝමා පාඨමාලාව<br>2.ධාරිතා සංවර්ධන පුහුණු සැසි 02 සහ කාර්යාල පුස්තකාලය සඳහා පොත් මිළදී ගැනීම | 0.93 | 0.07 | 100 |
| **එකතුව** | **19.41** | | **12.92** | | |

## පළාත් සභා සංවර්ධන ප්‍රදාන - 2017

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය (රු.මි) | උප ව්‍යාපෘති | 2017 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 0.50 | මිතුරු සෙවන නිවාස ඉදිකිරීම | 0.50 | නැත | 100 |

## සංවර්ධන වැඩ පිළිබඳ කාර්ය සාධනය - පසුගිය වසර 03 ක ප්‍රාග්ධන වැයවීම්

| වර්ෂය | PSDG (රු.මි) | PCDG (රු.මි) | මුළු මුදල ( රු.මි) |
|---|---|---|---|
| 2015 | 7.48 | 7.52 | 15.00 |
| 2016 | 12.71 | 14.19 | 26.90 |
| 2017 | 13.43 | 0.50 | 13.93 |



## දිගුකාලීන හා කෙටි කාලීන අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ප්‍රධාන කාර්යයන් හා සම්බන්ධ ව්‍යාපෘති

### 01.මාසික මහජනාධාර ගෙවීම

| අනු අංකය | අරමුණ | අරමුණ සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | ප්‍රධාන ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් ගණන | ප්‍රා.ලේ.කො. සංඛ්‍යාව | වැය කළ මුදල (රු.මි) | ප්‍රගතිය(%) භෞතික | ප්‍රගතිය(%) මූල්‍ය |
|---|---|---|---|---|---|---|---|---|
| 01 | දුප්පත් බවින් පීඩාවට පත් පුද්ගලයින් සඳහා ආධාර ලබා දී ඔවුන් ජීවත් වීමට රුකුලක් වීම. | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ අනුව නිර්දේශ කර ලැබෙන අයදුම් පත්‍ර සඳහා ප්‍රමුඛතා අනුව ප්‍රාදේශීය ලේකම් වෙත මාසිකව ප්‍රතිපාදන නිකුත් කර තැපැල් කාර්යාල මගින් ගෙවීම් සිදු කිරීම | මහජනාධාර ගෙවීම් | 31080 | 29 | 124.53 | 100 | 93 |
| | | | විශේෂ මහජනාධාර ගෙවීම් | 3449 | 29 | 28.82 | 100 | 100 |
| 02 | | | නිවුන් දරු ආධාර | 229 | 29 | 2.85 | 100 | 100 |
| 03 | | | විශ්ව විද්‍යාල ශිෂ්‍යාධාර | 20 | 20 | 0.18 | 100 | 03 |
| 044 | ශාරීරික හා මානසික වශයෙන් ආබාධ සහිත පුද්ගලයින්ගේ ආර්ථික තත්ත්වය නගා සිටුවීමට කටයුතු කිරීමහා රැකවරණය සැලසීම | | පූර්ණ ආබාධිත ආධාර | 1160 | 29 | 23.18 | 100 | 100 |
| 05 | අන්ත දුගී පවුල්වල අධ්‍යාපනයට දක්ෂ දරුවන්ගේ අධ්‍යාපන සංවර්ධනය | | ශිෂ්‍යාධාර | 5353 | 29 | 47.12 | 100 | 100 |
| 06 | අන්ත දුගී වකුගඩු රෝගය නිසා මව/පියා අහිමි වූ පවුල්වල අධ්‍යාපනයට දක්ෂ දරුවන්ගේ අධ්‍යාපන සංවර්ධනය | | "සිසු දිරිය" මව/පියා අහිමි වකුගඩු රෝගී පවුල් | 65 | 29 | 2.26 | 100 | 100 |
| එකතුව | | | | **41356** | **-** | **228.94** | | |

## 02.මාසික රෝගාධාර ගෙවීම් සහ වෙනත් ආධාර

| අනු අංකය | අරමුණ | අරමුණ ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | ප්‍රධාන ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් ගණන | ආවරණය කළ ප්‍රාදේශීය ලේකම් | වැය කළ මුදල (රු.මි) | ප්‍රගතිය (%) | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | භෞතික | මූල්‍ය |
| 01 | රෝගී වීම මගින් අසරණ වූ පුද්ගලයින් සඳහා සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීමට උපකාර කිරීම සහ ශාරීරික හා මානසික වශයෙන් ආබාධ සහිත වූවන්ගේ ආර්ථික තත්ත්වය නගා සිටුවීමට කටයුතු කිරීම හා රැකවරණය සැලසීම | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ අනුව නිර්දේශ කර ලැබෙන අයදුම් පත්‍ර සඳහා අනුව ප්‍රාදේශීය ලේකම් වෙත මාසිකව ප්‍රතිපාදන නිකුත් කර තැපැල් කාර්යාල මගින් ගෙවීම් සිදු කිරීම | පිළිකා ආධාර ගෙවීම | 2118 | 29 | 36.70 | 100 | 84 |
| | | | තැලසීමියා ආධාර | 393 | 29 | 13.44 | 100 | 84 |
| | | | ක්ෂය රෝග ආධාර | 85 | 29 | 2.76 | 100 | 84 |
| | | | බරවා | 17 | 29 | 0.39 | 100 | 84 |
| | | | ලාදුරු | 53 | 29 | 1.76 | 100 | 84 |
| 02 | | විවිධ ශල්‍යකර්ම ආධාර | ඇටමිදුළු බද්ධ කිරීම | 07 | 07 | 3.50 | 100 | 100 |
| | | | වකුගඩු බද්ධ කිරීම | 10 | 10 | 0.63 | 100 | 100 |
| | | වකුගඩු රෝගය නිසා රුධිරය මාරුකරනු ලබන රෝගී පුද්ගලයින්ගේ සුබසාධන කටයුතු | වෙනත් ශල්‍යකර්ම | 25 | 25 | 0.56 | 100 | 100 |
| | | | සුවෝදය වියදම් (පරිපාලන, ජල බිල්, විදුලි බිල් ) | - | 22 | 0.11 | 100 | 100 |
| | | | ආහාර මුද්දර | 275 | 22 | 3.87 | 100 | 100 |
| | | | ගමන් වියදම් | 176 | 22 | 3.00 | 100 | 100 |
| | | ප්‍රා.ලේ නිර්දේශ අනුව ලැබෙන අයදුම්පත්‍ර ගෙවීම් සඳහා යොමුකෙරේ | නිවාස ආධාර | 367 | 29 | 8.71 | 100 | 100 |
| | | | ස්වයං රැකියා ආධාර | 523 | 29 | 11.28 | 100 | 100 |
| **එකතුව** | | | | **4049** | **-** | **86.71** | | |

## 03.වැඩිහිටි තැනැත්තන් සඳහා පවත්වන ලද විවිධ වැඩසටහන්

| අනුඅංකය | අරමුණ | අරමුණ ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | ප්‍රධාන ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් ගණන | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ගණන | වැය කළ මුදල (රු.මි) | ප්‍රගතිය (%) | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | භෞතික | මූල්‍ය |
| 01 | අසරණ වූ වැඩිහිටියන් , සුරක්ෂිත කිරීම හා වැඩිහිටි සුභ සාධනය ඉහළ නැංවීම. | පුහුණු වැඩසටහන්, දැනුවත් කිරීමේ වැඩසටහන් ,විනෝදාත්මක වැඩසටහන්, සෞන්දර්යාත්මක හා සංස්කෘතික වැඩසටහන් | ශාන්ති සෙවන වැඩිහිටි නිවාසය ,සංවර්ධන වැඩ | 300 | 29 | 0.22 | 100 | 100 |
| | | | ශාන්ති සෙවන වැඩිහිටි නිවාසය ,සංවර්ධන වැඩ | 300 | 29 | 14.12 | 100 | 100 |
| | | | වැඩසටහන් | 300 | 29 | 0.11 | 100 | 100 |
| | | | බුල්නෑව වැඩිහිටි නිවාසය ,සංවර්ධන වැඩ | 40 | 29 | 0.52 | 100 | 100 |
| | | | බුල්නෑව වැඩිහිටි නිවාසය ,නඩත්තු වියදම් | 40 | 29 | 0.12 | 100 | 100 |
| | | | වැඩිහිටි සංවිධාන ආශ්‍රිත සංවර්ධන කටයුතු | 4600 | 29 | 0.49 | 100 | 100 |
| | | | වැඩිහිටි සංවිධාන ආශ්‍රිත විශේෂ වැඩසටහන් (වාරිකා,රසවින්දන,අත්දැකීම් හුවමාරු,) | 4600 | 29 | 10.58 | 100 | 100 |
| | | | වැඩිහිටි සංවිධාන ආශ්‍රිත විවිධ වැඩසටහන් ( බලමණ්ඩල) | 4600 | 29 | 0.15 | 100 | 100 |
| **මුළු වියදම** | | | | 14780 | - | **26.31** | | |

## 04.විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සඳහා පවත්වන ලද විවිධ වැඩසටහන්

| අනුඅංකය | අරමුණ | අරමුණ ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | ප්‍රධාන ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් ගණන | ආවරණය කළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ගණන | වැය කළ මුදල (රු.මි) | ප්‍රගතිය (%) | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | භෞතික | මූල්‍ය |
| 02 | ශාරීරික හා මානසික වශයෙන් ආබාධ සහිත පුද්ගලයන්ගේ කායික,මානසික,ආධ්‍යාත්මික සුවතාවය ආරක්ෂා කරමින් ආර්ථික තත්ත්වය නගා සිටුවීමට කටයුතු කිරීම හා රැකවරණය සැලසීම. | ක්‍රීඩා වැඩසටහන්, ඇතුලත් කිරීමේ වැඩසටහන් ,විනෝදාත්මක වැඩසටහන්,සෞන්දර්යාත්මක හා සංස්කෘතික වැඩසටහන් | නිවාසගත කිරීම් | 06 | 06 | - | 100 | 100 |
| | | | ජාත්‍යන්තර ආබාධ සහිත දින සැමරුම් වැඩසටහන් | 17600 | 22 | 0.31 | 01 | 100 |
| | | | වන්දනා චාරිකා | 850 | 17 | 0.85 | 01 | 100 |
| | | | යථායෝග්‍යාධාර ගෙවීම් | 194 | ආයතන 07 | 2.95 | 100 | 100 |
| | | | අන්ත දිළිඳු පවුලක පූර්ණ ආබාධිත දරුවකුට විශ්ව විද්‍යාල අධ්‍යාපනය හැදෑරීම වෙනුවෙන් ආධාර කිරීම | 01 | 01 | 0.03 | 100 | 100 |
| සමස්ත වියදම | | | | 18457 | 46 | 4.14 | | |

## 05.ගෘහ මූලික කාන්තාවන් සඳහා පවත්වන ලද විවිධ වැඩසටහන්

| අනුඅංකය | අරමුණ | අරමුණ ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | ප්‍රධාන ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් ගණන | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ගණන | වැය කළ මුදල (රු.මි) | ප්‍රගතිය (%) | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | භෞතික | මූල්‍ය |
| 03 | ස්වාමියා අහිමි වීමට ආර්ථික හා සාමාජීය අභියෝග හමුවේ ජීවන අර්බුද වලට ලක්ව සිටින කාන්තා පවුල්වල සුභ සාධනය හා ආර්ථික සංවර්ධනය ඉහළ නැංවීම. | සුභ ශ්‍රී වැඩසටහන්,ඇතුළත් කිරීමේ වැඩසටහන් ,විනෝදාත්මක වැඩසටහන්,සෞන්දර්යාත්මක හා සංස්කෘතික වැඩසටහන් | ගෘහලිය සවිය ව්‍යාපෘතියට සමගාමීව මැහුම් පුහුණුව | 126 | 29 | 0.31 | 100 | 17 |
| | | | ගෘහලිය සවිය ව්‍යාපෘතියට සමගාමීව ඇන්තූරියම්, ඕකිඩ් මල් වගාව | 68 | 17 | 0.02 | 100 | 17 |
| | | | වන්දනා චාරිකා | 950 | 19 | 0.57 | 01 | 50 |
| | | | උපතේදී මව අහිමිවූ අන්ත අසරණ පවුලක දරුවකු ජීවත් කරවීම සඳහා ළදරු කිරි පිටි ගැනීම වෙනුවෙන් ආධාර ලබාදීම | 01 | 01 | 0.02 | 100 | 100 |
| සමස්ත වියදම | | | | **1145** | **66** | **0.92** | | |

## 06. සම අවස්ථා, සම අයිතිවාසිකම් ආරක්ෂාකර ගනිමින් අන්තර්කරණ සංකල්ප මත පවත්වන ලද විවිධ වැඩසටහන්

| අනුඅංකය | අරමුණ | අරමුණ ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | ප්‍රධාන ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් ගණන | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ගණන | වැය කළ මුදල (රු.මි) | ප්‍රගතිය(%) | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | භෞතික | මූල්‍ය |
| 04 | විවිධ නිධන්ගත රෝග නිසා පවුල් පරිසරය තුළ විඳවමින් ජීවත්වන ප්‍රජාවගේ මානසිකත්වය සැහැල්ලු කිරීම, ජීවිතයේ යතාර්ථය අවබෝධ කර නොගැනීම නිසා වැඩිහිටි වියේ සතුට අහිමිකරගන්නා වැඩිහිටි ප්‍රජාව,උපතේ සිට හෝ අතර මගදී විවිධ ආබාධ සහිත තත්ත්වයනට පත්ව සිටින පුද්ගලයින් තුළ ගොඩනැගෙන්නා වූ අවාසි සහගත සිතුවිලි සහිත ප්‍රජාව සහ ස්වාමියා අහිමිවීම නිසා ජීවිතයේ අවාසනාව ගැන සිතමින් පසුතැවිලි වන්නා වූ කාන්තා ප්‍රජාව ඇතුළු සැමගේ කායික,මානසික, ආධ්‍යාත්මික ,සාමාජයීය වශයෙන් සුවතාවය ආරක්ෂා කිරීම | ප්‍රජා වැඩසටහන්,ඇතුළත් කිරීමේ වැඩසටහන් ,විනෝදාත්මක වැඩසටහන්,සෞන්දර්යාත්මක හා සංස්කෘතික වැඩසටහන් | අවුරුදු උත්සව | 23200 | 29 | 1.16 | 100 | 100 |
| | | | දන මන පොබයන නැණස | 25000 | 25 | 0.82 | 01 | 100 |
| | | | සිහින ප්‍රභාෂ්වර සහ දැය නැගු පරපුරක ගායන පෙළහර | 1700 | 29 | 5.86 | 100 | 100 |
| | | | සුළු කර්මාන්ත සංවර්ධනය<br>1.ම නු ප<br>2.ඉපලෝගම<br>3.නොච්චියාගම<br>4.අනුරාධපුර මහරෝහල තැලසීමියා ඒකකය | 370 | 03 | 0.05 | 100 | 100 |
| **සමස්ත වියදම** | | | | **50270** | **-** | **7.89** | | |

## 07.දිළිඳුකම පිටුදැකීමේ සංකල්පය ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන් සහ අමාත්‍යාංශයේ යෝජනා මත ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්

| අනු අංකය | අරමුණ | ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | ප්‍රධාන ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් ගණන | ආවරණය කළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ගණන | වැය කළ මුදල (රු.මි) | ප්‍රගතිය (%) | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | භෞතික | මූල්‍ය |
| 01 | තිරසාර සංවර්ධනයක් අපේක්ෂාවෙන් අන්ත දිළිඳු පවුල් නගා සිටුවීම සහ රටේ සංවර්ධන ක්‍රියාදාමය සමග සහභාගී කරවීම | පුහුණු වැඩසටහන් සහ ගෙවතු වගා ව්‍යාපෘති | කැබිතිගොල්ලෑව ඉඟුරු වගාව සහ කටුවැල් බටු වගාව | 70 | 01 | 9.43 | 100 | 100 |
| | | | නැගෙනහිර නුවරගම් පළාත පොල් වගාව සහ මඤ්ඤොක්කා වගාව | 25 | 01 | 0. 44 | 100 | 100 |
| | | | රඹෑව කුරුඳු,ගම්මිරිස්, බුලත්,පුවක් වගාව | 77 | 01 | 0.19 | 100 | 100 |
| 02 | විවිධ දුෂ්කර ප්‍රදේශවල සිට සේවා අවශ්‍යතා සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට සහ සමාජ සේවා දෙපාර්තමේන් තුව වෙත නිතර නිතර පැමිණීම වළක්වමින් ඔවුන් සියළු දෙනාට එකම තැනකදී එකම දිනයකදී ප්‍රතිලාභ ලබාදීම | ප්‍රජා සත්කාරක වැඩසටහන් | කැබිතිගොල්ලෑව 02,රඹෑව,පදවිය,මහවිලච්චිය,තිරප්පනේ, රාජාංගනය,ගලෙන්බිඳුනුවැව,ඉපලෝගම | 10500 | 08 | 0.27 | 100 | 77 |
| සමස්ත වියදම | | | | 172 | 03 | 10.34 | | |

## 08. දුම්වැටි සහ මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා වූ වැඩසටහන්

| අනුඅංකය | අරමුණ | අරමුණ ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘති | ප්‍රධාන ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් ගණන | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ගණන | වැය කළ මුදල (රු.මි) | ප්‍රගතිය (%) | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | භෞතික | මූල්‍ය |
| 01 | දුම්වැටි, මත්ද්‍රව්‍ය භාවිතය අවම කිරීම, පුනරුත්ථාපනය කිරීම සහ විවිධ සමාජ විරෝධී ක්‍රියාවන් අවම කරමින් සමාජ සාරධර්ම සුරකින ,පෞර්ෂ වර්ධනයෙන් යුක්ත තරුණ ප්‍රජාවක් ගොඩනැගීම | කඳවුරු ගත වැඩසටහන්,දැනුවත් කිරීමේ වැඩසටහන්,පාගමන් සංවිධානය | දිරියට අත්වැලක් සමග සමාජ සවිබල ගැන්වීමේ නේවාසික කඳවුර - පොළොන්නරුව | 185 | 07 | 0.46 | 100 | 100 |
| | | | දිරියට අත්වැලක් සමග සමාජ සවිබල ගැන්වීමේ ප්‍රාදේශීය වැඩසටහන - කැකිරාව,ගල්නෑව, තඹුත්තේගම, රාජාංගනය,ඇළහැර, මැදිරිගිරිය, වැලිකන්ද | 845 | 07 | 0.25 | 100 | 100 |
| | | | දිරියට අත්වැලක් සමග සමාජ සවිබල ගැන්වීමේ නේවාසික කඳවුර - ගල්නෑව | 47 | 01 | 0. 33 | 100 | 100 |
| | | | දිරියට අත්වැලක් සමග සමාජ සවිබල ගැන්වීමේ නේවාසික කඳවුර - අනුරාධපුර | 106 | 18 | 0.58 | 100 | 100 |
| | | | දිරියට අත්වැලක් සමග සමාජ සවිබල ගැන්වීමේ නේවාසික කඳවුරු පිළිබඳ පසුවිපරම් වැඩසටහන් - පොළොන්නරුව | 115 | 07 | 0.0 4 | 100 | 100 |
| | | | දිරියට අත්වැලක් සමග සමාජ සවිබල ගැන්වීමේ නේවාසික කඳවුරු පිළිබඳ පසුවිපරම් වැඩසටහන් - අනුරාධපුර | 100 | 18 | 0.04 | 100 | 100 |
| **සමස්ත වියදම** | | | | **1398** | - | **1.66** | | |

## 09. ගුණාත්මක හා ඵලදායී රාජ්‍ය සේවාවක් මහජනයා වෙත ලබාදීම සඳහා නිලධාරි ධාරිතා සංවර්ධනය

| අනු අංකය | අරමුණ | අරමුණ ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | ප්‍රධාන ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් ගණන | වැය කළ මුදල (රු.මි) | ප්‍රගතිය (%) | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | භෞතික | මූල්‍ය |
| 01 | සාර්ථක,ඵලදායී, ගුණාත්මක හා කඩිනම් සේවාවක් ලබාදීම සඳහා ආකල්ප සංවර්ධනය,තීරණ ගැනීමේ හැකියාව නිලධාරීන් තුළ පෝෂණය කිරීම | **"පහන් සිතින් නිති උවටැන්"** පුහුණු වැඩසටහන්,දැනුවත් කිරීමේ වැඩසටහන් ,විනෝදාත්මක වැඩසටහන්, සෞන්දර්යාත්මක හා සංස්කෘතික වැඩසටහන් | උපදේශන ඩිප්ලෝමා පාඨමාලාව | 03 | 0.15 | 100 | 100 |
| | | | කිතුල්ගල ඇඩ්වෙන්චර් බේස් කැම්ප්හි දී නායකත්ව පුහුණු වැඩසටහන | 90 | 0.73 | 100 | 100 |
| | | | කාර්යාලයීය පුස්තකාලය සඳහා පොත් මිලදී ගැනීම | 173 | 0.05 | 100 | 100 |
| | | | සාලියපුර ශාන්ති සෙවන හා බුල්නෑව සැඳෑ සෙවණ විශ්‍රාමික වැඩිහිටි නිවාස කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන | 128 | 0.07 | 100 | 100 |
| | | | ගිරිතලේ "අත්වැල" සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය හා අදාල වියදම් | - | 0.15 | 100 | 100 |
| **සමස්ත වියදම** | | | | **394** | **1.15** | | |

## 10. ආබාධිත උපකරණ ලබාදීම

| අනු අංකය | අරමුණ | අරමුණ ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | ප්‍රධාන ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් ගණන | ආවරණය කළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ගණන | වැය කළ මුදල (රු.මි) | ප්‍රගතිය(%) | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | භෞතික | මූල්‍ය |
| 01 | රෝගී බව,මහළු බව,ආබාධිත බව නිසා සමාජයීය වරප්‍රසාද අහිමි වූ පුද්ගලයින්ගේ සුභසාධනය තහවුරු කිරීම සහ සමාජානුයෝජනය කිරීම | තමාගේ කටයුතු තමා විසින්ම කර ගැනීම සඳහා අවශ්‍ය ආධාරක සහ උපකරණ ලබාදීම | රෝදපුටු | 404 | 29 | 4.89 | 100 | 100 |
| | | | ළමා රෝද පුටු | 15 | 29 | 0.19 | 100 | 100 |
| | | | කොමඩ් රෝද පුටු | 204 | 29 | 2.53 | 100 | 100 |
| | | | වතුර මෙට්ට | 193 | 29 | 1.38 | 100 | 100 |
| | | | අත්වාරු | 356 | 29 | 0. 28 | 100 | 100 |
| | | | අක්ෂි කාච | 577 | 29 | 6.95 | 100 | 100 |
| | | | වෝකර් | 132 | 29 | 0.51 | 100 | 100 |
| | | | කිහිලිකරු | 187 | 29 | 0.33 | 100 | 100 |
| | | | ශ්‍රවණ උපකරණ | 125 | 29 | 2.49 | 100 | 100 |
| | | | සුදු සැරයටි | 05 | 29 | 0.003 | 100 | 100 |
| | | | ඇස් කන්ණාඩි | 4120 | 29 | 8.18 | 100 | 100 |
| | | | වායු මෙට්ට | 102 | 29 | 0.73 | 100 | 100 |
| | | | ත්‍රෛසිකල් | 76 | 29 | 2.41 | 100 | 100 |
| **සමස්ත වියදම** | | | | **6496** | **29** | **30.87** | | |

## 2017 වර්ෂයේ මෙහෙයුම් සමාලෝචනය හා කාර්ය සාධනය ළඟාකර ගැනීම පිළිබඳ අදහස.

### මූලධන වියදම් හා සම්බන්ධ ප්‍රගතිය

- 2017 සංවර්ධන වැඩසටහන තුළ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන රුපියල් මිලියන 20 ක් සහ පළාත් සභා සංවර්ධන ප්‍රදාන රුපියල් මිලියන 0.5 ක් ලෙස වෙන්වී තිබුණි. වෙන් වූ ප්‍රතිපාදන තුළින් අවිච්ඡේද වී තිබූ , ගිරිතලේ පුහුණු මධ්‍යස්ථානයේ ඉතිරි වැඩ නිමකිරීම සඳහා රුපියල් 592,638.44 ක් වෙන්කරන ලද අතර, මෙම වර්ෂයේ එහි වැඩ කටයුතු නිම කරන්නට හැකි විය. එසේම නිල නිවාස අළුතවැඩියා කටයුතු වෙනුවෙන් ලැබී තිබූ ඇස්තමේන්තුව හා බිල්පත් වෙන්කළ මුදල ඉක්මවා තිබූ බැවින් ඒ සඳහා සාලියපුර වැඩිහිටි නිවාසය සඳහා වෙන් කළ රුපියල් මිලියන 02න් මිලියන 1ක් ලබාගනිමින් වැඩ නිමකර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමන්ගෙන් අනුමැතිය ලද අතර එම පරිපූරක මුදලින් නිල නිවාස වැඩ නිමවා බිල්පත් නිරවුල් කිරීමට හැකියාව ලැබුණි. එමෙන්ම දෙපාර්තමේන්තු කාර්යාලයට පැමිණෙන විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ පහසුව පිණිස වැසිකිළියක් ඉදිකරන ලද අතර, එහි බිල්පත් ගෙවීම් සඳහා දෙපාර්තමේන්තු කාර්යාලය අළුත්වැඩියාව සඳහා වෙන්කර තිබූ රු.මි.2 න් රු.1,350,000.00 ක් නව ව්‍යාපෘතියක් ලෙස ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතියෙන් වෙන්කර ගනිමින් එහි වැඩ නිමවීමට හැකියාව ලැබුණි.

- 2017 වර්ෂයේ වැඩිහිටි දිවා මධ්‍යස්ථාන නවීකරණය හා අළුත්වැඩියාවන් සඳහා පළමුවරට රුපියල් මිලියන 02ක් වෙන්ව තිබුණි. මෙම දෙපාර්තමේන්තුවට අයත් කාර්යයන් හා ඉතා සමීපව කටයුතු කරනු ලබන, දැයේ පෙර ගමන්කරුවන් ලෙස සලකන වැඩිහිටි ප්‍රජාව විසින් මෙලෙස දිවා මධ්‍යස්ථාන නවීකරණය හා අළුත්වැඩියාව වෙනුවෙන් පළමුවරට ලද මූල්‍ය දායකත්වය අගනා සම්පතක් වූ බව ප්‍රකාශ කරන්නට වූහ. ඒ අනුව අනුරාධපුර පොළොන්නරුව වශයෙන් ක්‍රියාකාරීව පවත්වාගෙන යනු ලබන ප්‍රාදේශීය වැඩිහිටි බල මණ්ඩල 29 ක් අතුරින් දිවා මධ්‍යස්ථාන 16ක වැඩ නිම කිරීමට හැකියාව ලැබුණි. අදාල කොට්ඨාශයන් හා මුදල් ලබාදුන් ආකාරය.....

| අ.අං | කොට්ඨාශය | මුදල(රු.මි) | අ.අං | කොට්ඨාශය | මුදල(රු.මි) |
|---|---|---|---|---|---|
| 01 | මහවිලච්චිය | 0.15 | 02 | මධ්‍යම නුවර ගම් පළාත | 0.15 |
| 03 | කැබිතිගොල්ලෑව | **0.10*** | 04 | පලාගල | 0.098 |
| 05 | රඹෑව | 0.10 | 06 | තලාව | 0.18 |
| 07 | ගල්නෑව | 0.09 | 08 | මැදවච්චිය | 0.10 |
| 09 | මැදවච්චිය | 0.10 | 10 | නැගෙනහිර නුවරගම් ප | **0.14 *** |
| 11 | හිඟුරක්ගොඩ | **0.10 *** | 12 | තිරප්පනේ | **0.16 *** |
| 13 | මැදිරිගිරිය | **0.13 *** | 14 | ලංකාපුර | 0.15 |
| 15 | තමන්කඩුව | **0.18 *** | 16 | දිඹුලාගල | 0.10 |

අක්මුදල් නොලැබීම නිසා * ලකුණින් සඳහන් කර ඇති අතැති බිල් 2018 වර්ෂයේ අවිච්ඡේද ව්‍යාපෘති වශයෙන් සළකා කටයුතු කෙරේ.

- මූලධන වියදම් යටතේ නිලධාරි ධාරිතා සංවර්ධනය සඳහා වෙන්ව තිබූ රුපියල් මිලියන 01 ක් යොදවා වැඩ සටහන් කිහිපයක් කරන්නට හැකි විය. දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා අත්‍යාවශ්‍ය දැනුමක් ලබාදෙන උපදේශන ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා නිලධාරීන් 03 දෙනෙකු වෙනුවෙන් මුදල් යොදවන ලදි.

❖ ඉන් අනතුරුව දෛනික රාජකාරි කටයුතු වලින් මිදී කායික මානසික සුවතාවයක් අපේක්ෂාවෙන් මෙම දෙපාර්තමේන්තුවට අයත් ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය, දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය සහ වැඩිහිටි නිවාස කාර්ය මණ්ඩලය වශයෙන් සියළු දෙනා එක්කරමින් කණ්ඩායම් දෙකක් වශයෙන් පළාතෙන් බැහැර කිතුල්ගල ඇඩ්වෙන්චර් බේස් කෑම්ප්හි දී නායකත්ව පුහුණු වැඩසටහන් 02 ක් පවත්වන ලදි. මෙම වැඩසටහන් 2017.12.15, 16, 17 සහ 2017.12.23, 24 වශයෙන් පැවැත්වීමට කටයුතු යොදා ගත්තද , හදිසියේ ඇති වූ කාලගුණික අවදානම් තත්ත්වය මත පළමු කණ්ඩායමට යොදා ගත් දින සංශෝධනය කරමින් 2018.01.27, 28 , 29 දිනවල පවත්වන ලදි. මෙම පුහුණු වැඩමුළුව මගින් ද එක් වූ සියළු නිලධාරීන් අතර තරඟකාරීබව, අභියෝග ජයගැනීම, එකමුතුබව, සුහදතාවය වර්ධනය කර ගැනීමට මහඟු අත්වැලක් විය.

❖ පළාත් සභා සංවර්ධන ප්‍රදාන යටතේ වෙන් වූ රුපියල් ලක්ෂ 5 ක් වියදම් කරමින් මිතුරු සෙවන නිවාස ඉදිකිරීම් ව්‍යාපෘතිය යටතේ මධ්‍යම නුවරගම් පළාත,ගල්නෑව, මිහින්තලේ, හිඟුරක් ගොඩ සහ මැදිරිගිරිය කොට්ඨාශවල නිවාස 05 ක් ඉදිකිරීම් නිමකර ඇත.

❖ රුපියල් මිලියන 441,875,000.00 ක පුනරාවර්තන මුදල් මෙම දෙපාර්තමේන්තුව වෙනුවෙන් වෙන්ව තිබූ අතර එමගින් සංවර්ධන ව්‍යාපෘති රැසක් මෙම වර්ෂයේදී ඵලදායීව නිම කිරීමට හැකියාව ලැබුණි. ඒ අතරින් විශේෂයෙන්ම මෙම වර්ෂයේ වැඩිහිටි විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සහ ගෘහ මූලික කාන්තාවන් යන දෙපාර්තමේන්තුවේ සුවිශේෂී කණ්ඩායම් අන්තර්කරණය කරමින් අවුරුදු උත්සව , දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදි. ඒ තුළින් ඒ සෑම ප්‍රජා කණ්ඩායමකම සාමාජිකයින් සඳහා ගෞරවණීය බවක් අභිමානයක් සහ ජීවිතය ජීවත් කරවීමට සවියක් ලබා දෙන්නට මහඟු දායකත්වයක් ලබා දීමට හැකියාව ලැබුණි. අවුරුදු චාරිත්‍ර වාරිත්‍ර ඉටුකරමින් අවුරුදු උත්සව පවත්වන්නට, වන්දනා චාරිකා සඳහා සහභාගී වන්නට ඔවුන් සෑමට හැකියාව ලැබුණි. විශේෂයෙන්ම වැඩිහිටි චාරිකා සඳහා රේඛීය අමාත්‍යාංශයේ වැඩිහිටි මහලේකම් කාර්යාලය මගින් ලබා දෙන ලද බස්රථය ද සුවිශේෂී වූ බව සඳහන් කරන්නේ මහත් වූ ගෞරවයෙන් ය.

❖ මෙම වර්ෂයේ දෙපාර්තමේන්තු අරමුණු සාර්ථක කරමින් ඉහත සඳහන් කරන ලද අන්තර්කරණ සංකල්පය ද පෙරදැරි කරගනිමින් වැඩිහිටි විශේෂ අවශ්‍යතා සහිත සංවිධාන සහ ගෘහමූලික කාන්තා සංවිධාන යාවත්කාලීන කරන්නට ඔවුන්ගේ ආකල්ප සංවර්ධනය කරන්නට මූල්‍ය කළමණාකාරීත්වයකින් සංවිධාන ඉදිරියට පවත්වාගෙන යන්නට ආධ්‍යාත්මික වශයෙන් ජීවිතයේ වටිනාකම අවබෝධ කරලන්නට සහ සෞන්දර්යාත්මක රසාස්වාදය තුළින් ජීවිතය විඳීමට, කුසලතා ප්‍රදර්ශනය කරමින් ජීවිතයේ සතුට අත්විඳින්නට අවස්ථා ගොඩ නගමින් "දන මන පොබයන නැණස" වැඩසටහන් කොට්ඨාශ 25 ක ද ,"දෙවුවර අභිමන් "වැඩසටහන් කොට්ඨාශ 21ක ද ක්‍රියාත්මක කරන්නට හැකිවිය.

මෙම වැඩසටහන් ඉතා සාර්ථක බවට ඔවුන් සැම ඇගයීම් ලබාදී ඇති අතර ඉදිරි වර්ෂවලදීත් එම වැඩසටහන් ග්‍රාමීය සංවිධාන වෙත රැගෙන එන ලෙස ඉල්ලීම් ද සිදුකර ඇත.

❖ අරමුණු සාර්ථක කරමින් අතිගරු ජනාධිපති තුමන්ගේ "මතට තිත "සංකල්පය ක්‍රියාත්මක කරමින් මත්ද්‍රව්‍ය හා දුම්වැටි සඳහා යොමු වූ පුද්ගලයින් උදෙසා පවත්වනු ලබන" දිරියට අත්වැලක් සමග සමාජ සවි බල ගැන්වීම "වැඩසටහනෙහි දෙවන කණ්ඩායම සඳහා වූ වැඩසටහන අනුරාධපුර දිස්ත්‍රික්කයේ ද ,පළමු කණ්ඩායම ලෙස පොළොන්නරුව දිස්ත්‍රික්කයේද ,නේවාසික වැඩසටහන් 02 ක් ද, පළමු වැඩසටහනින් අනතුරුව පසුවිපරම් වැඩසටහන් ද පවත්වන ලදි.මෙම වැඩසටහන් මගින් ජීවිතයේ විවිධ ඇබ්බැහිවීම් නිසා විනාශයට යමින් සිටින පවුල් රාශියක් සංවර්ධනය කරන්නට හැකියාව ලැබුණි. ඉදිරි වර්ෂවලදීත් මෙම වැඩසටහන් නව මුහුණුවරක් ලබාදෙමින් දීර්ඝකාලීනව පවත්වාගෙන යාමට අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ද ලැබී ඇත.

❖ දෙපාර්තමේන්තුවෙහි මාසික ආධාර ලබමින් පෝෂණය වන අනෙකුත් කණ්ඩායම් අතර, රෝගී පවුල් හඳුනාගත හැකිව ඇත. ඒ අතුරින් ඉතා ශීඝ්‍ර ලෙස උතුරු මැද පළාත තුළ ව්‍යාප්තව යන වකුගඩු රෝගී පවුල් , පිළිකා රෝගී පවුල් සහ තැලසීමියා රෝගීන් සම්බන්ධ කරගනිමින් පවත්වන්නට යෙදුන "සුළු කර්මාන්ත සංවර්ධන" ව්‍යාපෘතිය "දිළිදුකම පිටුදැකීමේ සංකල්පය" සඳහා හොඳම නිදසුනක් ලෙස දැක්විය හැකිය. එම රෝගී පවුල් සම්බන්ධ කරගනිමින් මධ්‍යමනුවරගම් පළාත, ඉපලෝගම සහ නොච්චියාගම කොට්ඨාශවල මෙම වැඩසටහන නියමු වැඩ සටහනක් වශයෙන් පළමුවන දැනුවත් කිරීම සහ පුද්ගල අවශ්‍යතා මත ආදායම් උත්පාදක ව්‍යාපෘති හඳුනාගෙන 2018 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමේ අපේක්ෂාවෙන් පවතී. එමෙන්ම අනුරාධපුර මහරෝහලෙහි තැලසීමියා ඒකකය විසින් කරන ලද ඉල්ලීමකට අනුව තැලසීමියා රෝගී පුද්ගලයින් සඳහාද "පොපියන මල්" නමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන්නට යෙදුනි.

❖ මෙම රෝගී පවුල්වලට අමතරව වැඩිහිටි, විශේෂ අවශ්‍යතා සහිත ප්‍රජාව සහ ගෘහමූලික කාන්තාවන් ඒකරාශී වෙමින්" දිළිදුකම පිටුදැකීමේ" අරමුණ මූලික කරමින් කැබිතිගොල්ලෑව කොට්ඨාශයේ ඉඟුරු සහ කටුවැල් බටු වගාව ද, නැගෙනහිර නුවරගම් පළාත කොට්ඨාශයේ පොල් හා මඤ්ඤොක්කා වගාව ද, රඹෑව කොට්ඨාශයේ කුරුඳු වගාව ද ආරම්භ කර පවත්වාගෙන යනු ලැබේ. දිගුකාලීන අරමුණු ඔස්සේ ගමන් කරන මෙම ව්‍යාපෘතීන් වල ආදායම් තත්ත්වය ඉදිරි වර්ෂවලදී දී බලාපොරොත්තු වේ.

❖ තව දුරටත් වැඩිහිටි සහ විශේෂ අවශ්‍යතා සහිත ප්‍රජාව වෙනුවෙන් ඔවුන්ගේ ගායන කුසලතා කරළියට ගෙන එමින් ජාත්‍යන්තර වැඩිහිටි සහ ආබාධිත දිනයන්ට සමගාමීව "දැය නැගූ පරපුරක ගායන පෙළහරෙහි" සිව්වන දැක්ම ද "සිහින ප්‍රභාෂ්වර" පළමු දැක්ම ද ඉතා උත්කර්ශවත් ලෙසට පවත්වන්නට හැකියාව ලද්දේය. එකම දිනයකදී උදෑසන සිට රාත්‍රිය දක්වා විශේෂ අවශ්‍යතා සහිත ප්‍රජාවන් සහ වැඩිහිටි ප්‍රජාවන් 2000 ක් පමණ සහභාගී වූ මෙම වැඩසටහන දුටු සැමගේ නෙත් සිත් ආකර්ශනය කරනු ලැබූ විචිත්‍රවත් වැඩසටහනක් වූයේය.

- පවත්වනු ලැබූ වැඩසටහන් අතුරින් තවත් සුවිශේෂී වූ වැඩසටහනක් ලෙස ශාන්ති සෙවන සහ බුල්නෑව සෑදැ සෙවන විශ්‍රාමික වැඩිහිටි නිවාසයේ කාර්ය මණ්ඩලය සඳහා සංවිධානය කරන ලද "පසන් සිතින් නිති උවටැන්" නමින් වූ පුහුණු වැඩසටහන තුළින් ආකල්ප සංවර්ධනය කරගනිමින් වැඩිහිටියකු රැකබලා ගන්නා අයුරු ඔවුන්ට උපස්ථාන කරනා අයුරු රාජ්‍ය සේවකයකු ගේ වගකීම සහ වගවීම ආදී දැනුම කණ්ඩායම් 02ක් ලෙස සම්බන්ධ කරමින් ක්‍රියාත්මක කරන්නට හැකි විය. වැඩිහිටි නිවාස කාර්ය මණ්ඩලයෙන් 60 දෙනෙකු පමණ මෙම ගුණාත්මක පුහුණුව ලබමින්, තම කාර්ය සාධනය ඉහළ දැමීමට අවශ්‍ය දැනුම ලබා ගන්නා ලදී. එමගින් දිවයින පුරා අනාථ අසරණ වී, යන එන මං නොමැතිව සිටින වැඩිහිටියන් සඳහා සුවදායී පරිසරයක් ගොඩ නගන්නට, දෙනෙත් පියා ගන්නා අවසන් මොහොත මානසික වශයෙන් සතුටින් තබන්නට අවශ්‍ය පියවරයන් ලබාදෙන්නට මහඟු අත්වැලක් වූ බවට ඔවුන්ගේ ඇගයීම් මත සටහන් කර තිබුණි.

- විවිධ කායික , මානසික පීඩාවන් හමුවේ අසරණ වෙමින් මෙම දෙපාර්තමේන්තුව කරා දෛනිකව ඇදෙන මහජනයා , සෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකම බදාදා දිනට සමාජ සේවා සංවර්ධන නිලධාරියා වටා එක් රොක්වන මහජනයා අතිවිශාලය. මේ බව අවබෝධ කරගන්නා ලද සෞඛ්‍ය දේශීය වෛද්‍ය සමාජ සුභ සාධන පරිවාස හා ළමාරක්ෂක සේවා පරිසර සහ පළාත් සභා හිටපු අමාත්‍යවරුන් වන ගරු කේ.එච් නන්දසේන මැතිතුමන් සහ එච්. හේරත් බංඩා මැතිතුමන්ලාගේ ප්‍රධානත්වයෙන් ප්‍රජා සත්කාරක වැඩසටහන් රැසක් 2017 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන්නට හැකි විය. එමගින් එකම දිනයකදී එකම ස්ථානයකදී මහජන අවශ්‍යතා රැසක් සඳහා දායකත්වය ලබා දෙන්නට හැකියාව ලැබුණි. ඇස්කණ්නාඩි අක්ෂිකාච රෝදපුටු ත්‍රෛසිකල් ආදී ආබාධිත උපකරණ පාසල් උපකරණ , ස්වයං රැකියා ආධාර, නිවාස ආධාර ආදී සේවා අවශ්‍යතා රඹෑව , මහවිලච්චිය , පදවිය,තිරප්පනේ,රාජාංගනය, ගලෙන්බිඳුනුවැව,ඉපලෝගම, කැබිතිගොල්ලැව කොට්ඨාශවල ජනතාව අතරේ බෙදා දීමට හැකියාව ලැබුණි.

- සමාජ සේවා දෙපාර්තමේන්තුවේ අරමුණු හා පරමාර්ථ සාර්ථක කරගැනීම සඳහා විවිධ උපාය මාර්ග අනුගමනය කරනු ලැබේ. විශේෂයෙන්ම මෙම දෙපාර්තමේන්තුව මහජනයා සමග ඍජු හා ඉතා යහපත් මහජන සම්බන්ධතාවයන් පවත්වාගෙන යනු ලැබේ. මහජනයා සමග ගනුදෙනු කිරීමේදී යහපත් ප්‍රතිචාර ලැබෙන බව ඔවුන් සමග පිළිසඳරේ දී දැනගැනීමට ලැබේ. මෙම ආයතනය සතු ශක්තීන් හා දුර්වලතා හඳුනා ගනිමින් උපාය මාර්ගික සැලසුම් ඔස්සේ සාර්ථක ඉදිරි ගමනක් යාමට අවශ්‍යවන පසු විපරම් හා අධීක්ෂණ කටයුතු මාසිකව පවත්වන කාර්ය මණ්ඩල රැස්වීම් වලදී හඳුනාගනු ලැබේ.ආයතනයේ යහ පාලනය පවත්වා ගැනීමට බාධා, ගැටළු, දුෂ්කරතා හඳුනා ගැනීම හා සියළු දෙනාගේ අදහස් වලට සවන් දෙමින් අරමුණ කරා ළඟා වීමට, සැමවිටම නිවැරදි තීරණ ගනු ලැබේ. එසේම අන්‍යොන්‍ය සුහදතාවය වර්ධනය කරගත හැකි විවිධ වැඩසටහන් සංවිධානය කිරීම, සැලසුම් සකස් කිරීමේදී දේශපාලන අධිකාරියේ සහභාගීත්වය ලබා ගැනීම, පරිගණක භාවිතයට අවස්ථාව ලබා දීම, තුළින් නිලධාරින් සඳහා නවීන තාක්ෂණික දැනුම ලබා දීම තුළ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමට කටයුතු කිරීම ,නිලධාරීන්ගේ පුහුණු අවශ්‍යතා හඳුනා ගනිමින් ඔවුන් ඒ සඳහා යොමු කිරීම යනාදී කටයුතු සිදු කරනු ලැබේ.

ඒ තුළින් "සමාජ රැකවරණය අවශ්‍ය වූවන්ට සුරක්ෂිත ජීවිතයක් ලබාදීමේ" දැක්ම කරා ඵලදායීවත්,ගුණාත්මකවත් ගමන් කිරීමට උතුරු මැද පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවට හැකියාව ලැබුණි.
මෙම වර්ෂයේ පළාත් සභා සංවර්ධන අරමුදල් සීමාවීම මත ක්‍රියාත්මක කරන්නට අපේක්ෂිතව තිබූ ඇතැම් ව්‍යාපෘති අත්හිටුවීමට සිදු වීම, දිළිඳුකම පිටුදැකීමේ සංකල්පය මූලික කරගනිමින් ඉදිරිපත් කරන ලද කෘෂිකාර්මික ව්‍යාපෘති රැසක් මුදල් ප්‍රමාණවත් නොවීම නිසා අත්හිටුවීම හා අක්මුදල් නොලැබීම මත වැඩ අවසන් කරන ලද මූලධන ව්‍යාපෘති රැසක අතැති බිල් ගෙවා වැඩ නිම කළ නොහැකිවීම වැනි ගැටළු වලට කාර්ය සාධනය කරා ළඟාවීමේ දී මුහුණ දීමට සිදු විය.

### සංවර්ධන ව්‍යාපෘති මගින් කෙටි කාලීනව අපේක්ෂා කරන ලද ප්‍රතිලාභ

| අනු අංකය | ව්‍යාපෘතිය | කෙටිකාලීන බලපෑම |
|---|---|---|
| මූලධන ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කළ ව්‍යාපෘති | | |
| 01 | වැඩිහිටි නිවාස නවීකරණය | අසරණ වූ වැඩිහිටියන් වැඩි පිරිසකට පහසුවෙන් නේවාසික වීමේ යටිතල පහසුකම් සංවර්ධනය |
| 02 | ගිරිතලේ පුහුණු මධ්‍යස්ථානයේ අළුත්වැඩියා කටයුතු | අංග සම්පූර්ණ නේවාසික පුහුණු මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය |
| 03 | දිවා මධ්‍යස්ථානය නවීකරණය | කායික මානසික සුවතාවයෙන් යුත් තෘප්තිමත් වැඩිහිටි පිරිසක් බිහිවීම |
| 04 | ආබාධිත රැඳවුම් නිවාස හා වෘත්තීය පුහුණු නිවාස නවීකරණය | රැකවරණය අහිමි තරුණවියේ හා මැදිවියේ පසුවන ආබාධ සහිත පුද්ගලයින් සඳහා රැකවරණ අවස්ථා සලසා දීම |
| 05 | කාර්යාල ගොඩනැගිල්ල අළුත් වැඩියාව | දුෂ්කර ප්‍රදේශවල සිට සේවා අවශ්‍යතා සඳහා පැමිණෙන සේවාලාභීන් සඳහා පහසුකම් සැලසීම සහ ආයතනයේ ගුණාත්මකභාවය වර්ධනය |
| 06 | නිල නිවාස අළුත්වැඩියාව | අවම පහසුකම් සහිත නිල නිවාස සංවර්ධනය |
| 07 | ආබාධ සහිත පුද්ගලයින් සඳහා සනීපාරක්ෂක පහසුකම් සැලසීම | දෙපාර්තමේන්තුව වෙත පැමිණෙන ආබාධ සහිත පුද්ගලයින් සඳහා සනීපාරක්ෂක පහසුකම් සැලසීම |
| 08 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ මිලදී ගැනීම | අවශ්‍ය වේලාවට අවශ්‍ය පරිදි සේවා අවශ්‍යතා සම්පූර්ණ කිරීම |
| 09 | සාලියපුර වැඩිහිටි නිවාසයේ වැට සකස් කිරීම | අක්කර 50 ක පමණ වපසරියකින් යුක්ත වැඩිහිටි නිවාස භූමිය සඳහා ආරක්ෂක බව තහවුරු කිරීම |

| | | |
|---|---|---|
| 10 | මහජනාධාර ජාලගත කිරීම | දෙපාර්තමේන්තුව මගින් දෙනු ලබන සියළු ආධාර නිවැරදි ලෙස ගබඩා කිරීම බෙදාහැරීම සඳහා ක්‍රමවත් බවක් මෙන්ම කඩිනම් කරවීම |
| 11 | ධාරිතා සංවර්ධනය | මහජනයා උදෙසා ඵලදායී මෙන්ම ගුණාත්මක සේවා සැපයිම සඳහා දැනුමින් හා ආකල්පවලින් සංවර්ධිත නිලධාරී පිරිසක් බිහිවීම |
| 12 | මිතුරු සෙවන | ප්‍රදේශයේ බහුතරයකගේ ප්‍රසාදය ලබාගන්නා අන්ත අසරණ වැන්දඹු - විශේෂ අවශ්‍යතා සහිත හෝ වැඩිහිටියකු සඳහා සංවිධාන මූලිකත්වයෙන් ස්ථිර නිවසක් ඉදිකිරීම |
| පුනරාවර්තන වැය යටතේ ක්‍රියාත්මක කළ ව්‍යාපෘති | | |
| 13 | දන මන පොබයන නැණස ව්‍යාපෘතිය | දැනුම, ආකල්ප, කුසලතා මෙහෙයවමින් තම ජීවිතයට මෙන්ම සංවිධාන වටා ඒකරාශීවී සිටින කායික මානසික ආධ්‍යාත්මික සංවර්ධනයෙන් යුත් වැඩිහිටි විශේෂ අවශ්‍යතා සහිත සහ ගෘහමූලික කාන්තා බහුතරයක් නිර්මාණය වීම සහ මනා කළමණාකරණයකින් යුක්ත සංවිධාන ජාලයක් නිර්මාණය වීම |
| 14 | ගෘහලිය සවිය ව්‍යාපෘතිය | රටේ සංවර්ධන ක්‍රියාවලියට දායකත්වය දක්වන අතරම තම ආර්ථික ගැටළු අවම කරගන්නා ගෘහමූලික කාන්තා පිරිසක් නිර්මාණය වීම |
| 15 | සුළුකර්මාන්ත සංවර්ධනය | කායික, මානසික, ආධ්‍යාත්මික සුවතාවය සමග ආර්ථික ගැටළු අවම කරගනු ලබන වකුගඩු, පිළිකා, තැලසීමියා රෝගී පවුල් සංවර්ධනය |
| 16 | ගත සනහන සුව ගොවිපල | තම ජීවන උත්පාදනයන් සඳහා වෙහෙසෙන වැඩිහිටි, විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්, ගෘහ මූලික කාන්තාවන් බහුතරයක් නිර්මාණය වීම |
| 16 | I . ඉඟුරු වගාව<br>II . පොල් වගාව<br>III . මඤ්ඤොක්කා වගාව<br>IV. ගෙවතු වගාව | I.වැඩිහිටි, විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්,ගෘහ මූලික කාන්තාවන් වැඩි පිරිසකට ස්වයං රැකියා අවස්ථා ජනිත විය.<br><br>II.යැපීම් මානසිකත්වය අවම කිරීම.<br><br>III.ආර්ථිකය ශක්තිමත් කිරීම. |
| 17 | දෙටුවර අභිමන් | වැඩිහිටි, තරුණ, ළමා ප්‍රජාවන් ගේ කායික, මානසික, ආධ්‍යාත්මික සුවතාවය සමග සෞන්දර්ය කුසලතා කළඑළි ගැන්වීම. |

| | | |
|---|---|---|
| 18 | සිහින ප්‍රභාෂ්වර | පළාතේ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ කායික, මානසික, ආධ්‍යාත්මික සුවතාවය සමග කුසලතා වේදිකා ගත කිරීම. |
| 19 | දැය නැගූ පරපුරක ගායන පෙළහර | පළාතේ කුසලතා පිරි වැඩිහිටි ප්‍රජාවගේ සෞන්දර්ය කුසලතාවයන් සඳහා වේදිකාව නිර්මාණය. |
| 20 | වන්දනා චාරිකා | කායික, මානසික, ආධ්‍යාත්මික සුවතාවය සමග තෘප්තිමත් වැඩිහිටි, විශේෂ අවශ්‍යතා සහිත සහ ගෘහමූලික කාන්තා සංවිධාන නිර්මාණය කිරීම |
| 21 | දිරියට අත්වැලක් සමග සමාජ සවිබල ගැන්වීම | දුම්වැටි, විෂ මත්ද්‍රව්‍ය නිසා හානියට පත්වන තරුණ ජීවිත ඉන් මුදාලමින් ආර්ථික ගැටළු අවම කරගන්නා තරුණ ප්‍රජාකණ්ඩායම් ගොඩනැගීම |
| 22 | ප්‍රජා සත්කාරක වැඩසටහන් | මහජන දුෂ්කරතා අවම කරමින් ඔවුන්ගේ අවශ්‍යතා ඉටුකිරීම |

**වෙනත් රේඛීය අමාත්‍යංශ දෙපාර්තමේන්තු වලින් ලද ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති**

| අනුඅංකය | ව්‍යාපෘතිය | තමන්ගේ විෂය පථයට හසුවන අරමුණ | මුදල | | ප්‍රගතිය | | ලැබුණු දිගු කාලීන/ කෙටි කාලීන ප්‍රතිඵල |
|---|---|---|---|---|---|---|---|
| | | | වෙන්කළ (රු. මි) | වැය කළ (රු. මි) | භෞතික (%) | මූල්‍ය (%) | |
| 01 | දෙටුවර අභිමන් ජාත්‍යන්තර වැඩිහිටි දිනය සැමරීම<br><br>1.ළමා සමාජ දැනුම මිනුම තරග<br>11.ජාතික උත්සවය | වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් සුරැකීම | 0.10 | 0.10 | 100 | 100 | 1. වැඩිහිටියා පිළිබඳව සමාජය දැනුවත්වීම හා අවධානය වර්ධනය<br><br>11.ළමයා හා වැඩිහිටියා අතර සබඳතා වර්ධනය |

ඒ අනුව 2017 වර්ෂය තුළ කාර්ය සාධනය වඩාත් යහපත් මට්ටමක පවත්වා ගැනිමට හැකි වූ වසරක් ලෙස කිව හැක. එහිදී උතුරු මැද පළාතේ ජනතාවගේ සමාජ රැකවරණය අවශ්‍ය වන්නන්හට සුරක්ෂිත ජීවිතයක් ලබා දීම සඳහා අවශ්‍ය ආධාර මග පෙන්වීම්,සහන සහ රැකවරණය සලසමින් ඔවුන්ගේ ජීවන මට්ටම යම් සාධනීය ප්‍රමාණයකින් ඉහළ නැංවීම සඳහා දායකත්වය සැපයිය හැකි වූ වසරකි.

2017 වර්ෂය තුළදී මාසික මහජන ආධාර ගෙවීම් ,මාසික රෝගාධාර ගෙවීම් ,විශේෂිත අවශ්‍යතා සහිත පුද්ගලයින් සඳහා විවිධ වැඩසටහන් පවත්වමින් ගෘහ මූලික කාන්තාවන් සඳහා විවිධ වැඩසටහන් පවත්වමින් දිළිඳුකම පිටු දැකීම අරමුණුකර ගනිමින් හා මත්ද්‍රව්‍ය නිවාරණය වැඩ සටහන් පවත්වමින් මෙන්ම ආබාධිත වූවන්ගේ විවිධ අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය ආධාරක හා උපකරණ ලබා දෙමින් සාර්ථක ලෙස කාර්ය සාධනය කරා ළඟා වීමට කටයුතුකර ඇත.

මෙය හිස්ව තබන ලද පිටුවකි

# පළාත් සමුපකාර, වෙළෙඳ හා ආහාර, ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය

**09**

ආදායම් බලපත්‍ර නිකුත් කරන ලද වාහන සංඛ්‍යාව

| වාහන | 2015 | 2016 |
|---|---|---|
| යතුරු පැදි | 193,774 | 211,301 |
| ත්‍රීවීල් | 56,413 | 58,961 |
| බස් | 924 | 878 |
| ලොරි | 120,610 | 11,941 |
| ද්වි කාර්ය වාහන | 21,174 | 23,602 |
| විශේෂ කාර්ය වාහන | 18 | 62 |
| අවමංගල / ගිලන් රථ | 17 | 12 |
| කාර් | 16,181 | 18,454 |
| මෝටර් කෝච් | 809 | 915 |
| ඉඩම් වාහන | 9,443 | 10,871 |
| ටේලර් | - | 329 |
| එකතුව | **419,363** | **337,326** |

ප්‍රවාහන තොරතුරු

අනුරාධපුර දිස්ත්‍රික්කය

| ප්‍රධාන බස් නැවතුම්පොලවල් (14) | සංසරණය වන බස් රථ ප්‍රමාණය (දිනකට) | සංසරණය වන මගීන් ප්‍රමාණය (දිනකට) |
|---|---|---|
| අනුරාධපුර (පැරණි) | 90 | 2,700 |
| අනුරාධපුර (නව) | 65 | 1,950 |
| අනුරාධපුර (දුර සේවා) | 175 | 5,250 |
| කැකිරාව | 50 | 1,500 |
| තඹුත්තේගම | 50 | 1,500 |
| ගල්නෑව | 30 | 900 |
| ගල්කිරියාගම | 9 | 200 |
| හොරොව්පොතාන | 30 | 900 |
| කහටගස්දිගිලිය | 19 | 570 |
| මිහින්තලේ | 70 | 1300 |
| මැදවච්චිය | 12 | 360 |
| කැබිතිගොල්ලෑව | 50 | 1,000 |
| නොච්චියාගම | 35 | 1,050 |
| ගලෙන්බිඳුණුවැව | 35 | 1,050 |
| එකතුව | **720** | **20,230** |

උප බස් නැවතුම්පොලවල් - 13

### පොළොන්නරුව දිස්ත්‍රික්කය

| ප්‍රධාන බස් නැවතුම්පොළවල් (8) | සංසරණයවන බස් රථ ප්‍රමාණය (දිනකට) | සංසරණය වන මගීන් ප්‍රමාණය (දිනකට) |
|---|---|---|
| හිඟුරක්ගොඩ | 69 | 2,700 |
| කදුරුවෙල | 220 | 6,600 |
| මැදිරිගිරිය | 16 | 480 |
| බකමූණ | 18 | 540 |
| වැලිකන්ද | 09 | 270 |
| සිරිපුර | 40 | 500 |
| මින්නේරිය | 105 | 950 |
| එකතුව | 477 | 12,040 |

**උප බස් නැවතුම්පොළවල් - 09**

### ලියාපදිංචි ප්‍රවාහන සේවා පිළිබඳ තොරතුරු

| | | |
|---|---|---|
| 1 | මගී ප්‍රවාහන බස් රථ | 770 |
| 2 | පාසැල් ප්‍රවාහන බස් රථ | 14 |
| 3 | සිසු සැරිය බස් රථ | 98 |
| 4 | භාණ්ඩ ප්‍රවාහන රථ | 56 |
| 5 | ත්‍රී රෝද රථ | 1800 |
| 6 | කාර්යාල සේවා බස් රථ | 2 |

### දැක්ම

"අභිමානවත් සමාජයක්, ඉසුරුමත් පළාතක්."

### මෙහෙවර

"ප්‍රවාහන ක්‍රීඩා හා යෞවන කටයුතු, සමුපකාර වෙළෙඳ හා ආහාර සහ කර්මාන්ත අංශ සඳහා සියළු පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරිමේ ආයතන නිසි පරිදි නියාමනය කිරිම".

### අරමුණු

- කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමේ ආයතන පද්ධතියක් ඇති කිරීම.
- තෘප්තිමත් පාරිභෝගික හා වෙළඳ ප්‍රජාවක් ඇති කිරීම.
- උසස් ආහාර පරිභෝජන සංස්කෘතියක් හා පළාතේ ආහාර සුරක්ෂිතතාවය ඇති කිරිම.
- දේශීය ආහාර නිෂ්පාදකයින් හඳුනා ගැනීම හා ඔවුන්ගේ ආදායම් වර්ධනය කිරිම.

### කෙටිකාලීන අරමුණු

- දේශීය ආහාර භාවිතයේ වැදගත්කම පිළිබඳ ජනතාව තුළ නිවැරදි මතයක් නිර්මාණය කිරීම.
- පළාතේ තරුණ තරුණියන් සඳහා වෘත්තීමය රැකියා අවස්ථා ලඟාකර දීම හා ඔවුන්ගේ යහගුණ ආකල්ප සංවර්ධනය කිරීම.
- පළාතේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සංවර්ධනය තුළින් කර්මාන්තකරුවන් සවිබල ගැන්වීම.
- පළාතේ තරුණ ප්‍රජාව තුළ ආකල්පමය පරිවර්තනයක් ඇති කිරීම.
- රැකියා විරහිතව සිටින තරුණයන් ඉදි කිරීම් යන්ත්‍ර හා බරවාහන ක්ෂේත්‍රයේ රැකියා සඳහා යොමු කිරිම.
- දේශීය ආහාර නිෂ්පාදකයින් හඳුනා ගැනීම හා අභිප්‍රේරණය කිරීම.

**ප්‍රධාන කාර්යයන්**




**උපාය මාර්ගයන්**

ආයතනික සංග්‍රහයේ හා මුදල් රෙගුලාසිවලට අනුකූලව ආයතනික කටයුතු මෙහෙය වීමෙන් සංවර්ධන ව්‍යාපෘතිවල අපේක්ෂිත අරමුණු හා ඉලක්ක ළඟාකර ගැනීම මඟින් පළාතේ සංවර්ධන ක්‍රියාවලියට දායක වීම.

**කාර්යය මණ්ඩල සංයුතිය**

| විස්තරය | අනුමත සංඛ්‍යාව |
|---|---|
| අනුමත සංඛ්‍යාව | 36 |
| සේවයේ නියුතු සංඛ්‍යාව | 31 |
| පුරප්පාඩු සංඛ්‍යාව | 05 |

**මෙහෙයුම් ප්‍රතිඵල - පුනරාවර්තන වියදම්**
**(අමාත්‍යාංශ කාර්යාලය හා අමාත්‍ය මණ්ඩලය,මෝටර් රථ දෙපාර්තමේන්තුවේ ද වියදම් ඇතුළත්ව)**

| වියදමෙි ස්වභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය (රු.මි.) | 2017 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය % |
|---|---|---|---|---|
| පුද්ගල පඩි නඩි | 30.94 | 27.48 | 3.46 | 88.82 |
| ගමන් වියදම් | 1.03 | 0.53 | 0.49 | 51.46 |
| සැපයීම් | 6.25 | 4.56 | 1.60 | 72.96 |
| නඩත්තු වියදම් | 4.32 | 1.96 | 2.34 | 45.37 |
| ගිවිසුම්ගත සේවා | 4.89 | 2.82 | 2.06 | 57.67 |
| මාරු කිරීම් | 47.72 | 47.71 | - | 100 |
| වෙනත් | 10.37 | 0.24 | 10.12 | 2.31 |
| එකතුව | **105.52** | **85.30** | **20.07** | **80.83** |

**මූලධන වියදම්**


| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය (රු.මි.) | 2017 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය % |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 1.30 | 0.90 | 0.39 | 69.23 |
| යන්ත්‍රසූත්‍ර සවි කිරීම් සහ උපකරණ | 2.80 | 2.27 | 0.52 | 81.07 |
| වාහන | 0.40 | - | 0.40 | - |
| **එකතුව** | **4.50** | **3.17** | **1.31** | **70.44** |

**ආදායම් ඉපයීම**

| ශීර්ෂය | ඉලක්කය (රු.මි) | සත්‍ය ආදායම (රු.මි) |
|---|---|---|
| 10.03.01.01 මෝටර් වාහන ආදායම් බලපත්‍ර ගාස්තු | 51.92 | 56.99 |
| 20.03.03.04 මෝටර් වාහනය මත දඩ | 45.00 | 44.28 |
| 20.03.02.29 ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ ගාස්තු | 1.95 | 2.25 |

**සංවර්ධන වැඩ පිළිබඳ කාර්ය සාධනය - පසුගිය වසර 03ක ප්‍රාග්ධන වැය වීම්**

| වර්ෂය | PSDG (රු.මි) | PCDG (රු.මි) | මුළු වියදම (රු.මි) |
|---|---|---|---|
| 2015 | 12.00 | 11.94 | 23.94 |
| 2016 | 42.27 | 111.65 | 153.92 |
| 2017 | 18.50 | 19.95 | 38.45 |




## *අංශය තුළින් ඉටුකර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු අංක - 08*

**සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායි සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම.**

8.2. විවිධාංගීකරණය, තාක්ෂණය ඉහළ නැංවීම සහ නවෝත්පාදන තුළින් සහ ඉහල වටිනාකම් එකතු කරන ලද සහ ශ්‍රමය සඳහා වැඩි ඉල්ලුමක් ඇති ක්ෂේත්‍රය පිළිබඳ අවධානය යොමු කිරීම තුළින් ඉහළ මට්ටමේ ආර්ථික නිෂ්පාදිතයක් ලබා ගැනීම.

## දිගුකාලීන හා කෙටිකාලීන අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ප්‍රධාන කාර්යයන් හා සම්බන්ධ ව්‍යාපෘති

| අනු අංකය | අරමුණ | අරමුණ ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් | ප්‍රතිලාභීන් ගණන | ආවරණය කළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ගණන | වෙන් කළ මුදල (රු.මි) | ප්‍රගතිය (%) | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | භෞතික | මූල්‍ය |
| 01 | පළාතේ රැකියා විරහිත තරුණ පිරිස ඉදිකිරීම් ක්ෂේත්‍රයේ රැකියා සඳහා යොමු කිරීම මගින් තරුණ විරැකියාව අවම කිරීම | පළාතේ තෝරාගත් තරුණයන් 100ක් සඳහා 50%ක දායකත්වයෙන් ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණුව ලබාදීම | * පළාතේ වයස අවු. 18-35 අතර තරුණ පිරිස තෝරා ගැනීම. *පාඨමාලා අයදුම්කරුවන්ගෙන් 50%ක ගාස්තුව ගල්කුලම ආයතනයට ගෙවීම. *ගාස්තු ගෙවූ අයදුම්කරුවන් සඳහා ගල්කුලම ඉදිකිරීම් යන්ත්‍ර විද්‍යාලයේ පුහුණුව ලබාදීම. *ගල්කුලම ආයතනයට අමාත්‍යාංශය මඟින් ගෙවිය යුතු 50%ක ගාස්තුව ගෙවීම. | 15 | පොදු | 1.5 | 20 | 100 |
| 02 | පළාතේ රැකියා විරහිත තරුණ පිරිස සඳහා බර වාහන රියදුරු පුහුණුව ලබාදීම හා බර වාහන ක්ෂේත්‍රයේ රැකියා සඳහා යොමු කිරීම | පළාතේ තෝරාගත් තරුණයන් 50 දෙනෙකු සඳහා බර වාහන පුහුණුව ලබාදීම (ශ්‍රී ලංගම සමඟ එක්ව) | *පළාතේ වයස අවු. 18-35 අතර සැහැල්ලු වාහන බලපත්‍ර ලබා ගෙන සිටින තරුණයන් තෝරාගැනීම. *අයදුම්කරුවන්ගෙන් 50%ක ගාස්තුව ලංකා ගමනා ගමන මණ්ඩලයට ගෙවීම. *ගාස්තු ගෙවූ පිරිස සඳහා අනුරාධපුර ශ්‍රී ලංගමයෙන් පුහුණුව ලබාදීම. *පුහුණුව අවසන් වූ පසු අමාත්‍යාංශය විසින් ගෙවිය යුතු 50%ක ගාස්තුව ශ්‍රී ලංගම වෙත ගෙවීම. | 19 | පොදු | 0.5 | 24 | 100 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 03 | ස්වයං රැකියා සිදුකරන ව්‍යවසායකයන්ගේ දැනුම ආකල්ප තුලින් නිෂ්පාදන වෙළඳපොළ වර්ධනය හා ආදායම ඉහළ නැංවීම | පළාතේ තෝරාගත් තරුණ පිරිස් සඳහා ස්වයං රැකියා වෘත්තීය පුහුණු හා අධ්‍යාපන පාඨමාලා පැවැත්වීම හා මූල්‍ය දායකත්වය සැපයීම . | *ස්වයං රැකියාව ලෙස ඇඳුම් මසන ව්‍යවසායකයින් තෝරා ගැනීම.<br><br>*ස්වයං රැකියාව ලෙස රස කැවිලි නිෂ්පාදනය කරන ව්‍යවසායකයින් තෝරා ගැනීම.<br><br>*ක්ෂේත්‍රය ගැන ප්‍රවීණතාවය ලත් සම්පත්දායකයන් මඟින් පුහුණුව ලබාදීම.(පලාගල හා පලුගස්වැව ප්‍රා. ලේ. කො. තුළ)<br><br>*වැඩසටහන නිම කරන ලද ප්‍රා.ලේ. කාර්යාල වෙත මුදල් ලබාදීම. | 150 | පලාගල , පලුගස්වැව | 1.0 | 86 | 100 |
| 04 | නිර්මාණශීලී ව්‍යවසායකත්ව වෘත්තීය ක්ෂේත්‍රයන් කෙරෙහි යොමු වන තරුණ ප්‍රජාවක් ප්‍රදේශය තුළ බිහි කිරීම | තරුණ කඳවුරු පැවැත්වීම | *ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තෝරා ගැනීම.<br><br>*ප්‍රාදේශීය ලේකම් කාර්යාල නිලධාරීන් දැනුවත් කර තරුණ තරුණියන් වැඩසටහනට සහභාගි කිරීම.<br><br>*සුදුසු සම්පත්දායකයින් මඟින් තරුණ තරුණියන් දැනුවත් කිරීම හා දින දෙකක වැඩසටහන පැවැත්වීම. | 800 | මැදවච්චිය,<br>නොච්චියාගම,<br>වැලිකන්ද,<br>විලච්චිය,<br>තඹුත්තේගම,<br>මැදිරිගිරිය,<br>නාච්චාදූව,<br>පලාගල,<br>කැබිතිගොල්ලෑව | 1.5 | 85 | 100 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 05 | විශිෂ්ට ගණයේ නිර්මාණශීලි තරුණ තරුණියන් 100ක් පළාත තුළින් බිහි කිරීම මෙන්ම ඔවුන්ගේ කුසලතා ජාතික තලයට ගෙනයාම. | පළාත් තරුණ කඳවුරු පැවැත්වීම. | *ප්‍රාදේශීය තරුණ කඳවුර වැඩසටහන සඳහා සහභාගි වූ තරුණ තරුණියන් අතරින් 100ක් තෝරා ගැනීම.<br><br>*දිනය/ස්ථානය තෝරාගැනීම, සම්පත්දායකයන් තෝරා ගැනීම.<br><br>*වැඩසටහන පැවැත්වීම<br><br>*නොවැළැක්විය හැකි හේතූන් නිසා වැඩසටහන අවලංගු කිරීමට සිදුවිය. | 100 | මැදවච්චිය, නොච්චියාගම, වැලිකන්ද, විලච්චිය, තඹුත්තේගම, මැදිරිගිරිය, නාච්චාදූව, පලාගල, කැබිතිගොල්ලෑව | | 50 | 100 |
| 06 | දේශීය ආහාර භාවිතය පිළිබඳ ජනතාව දැනුවත් කිරීම තුළින් පළාතේ ජනතාව දේශීය ආහාර භාවිතයට පෙළඹවීම. | පළාතේ තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් දේශීය ආහාර හා එහි ගුණාංග පිළිබඳ ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. | ගොවිජන සේවා කොට්ඨාශ තෝරා ගැනීම<br><br>සම්පත්දායකයන් තෝරා ගැනීම.<br><br>ගොවිජන සේවා කාර්යාල මට්ටමින් දැනුවත් කර පිරිස සහභාගි කිරීම.<br><br>වැඩසටහන් පැවැත්වීම. | 1000 | කෝන්වැව ගොවිජන සේවා මධ්‍යස්ථානය (කහටගස්දිගිලිය ප්‍රා.ලේ.) ඇලයාපත්තුව (විලච්චිය ප්‍රා.ලේ.) තන්තිරිමලේ (විලච්චිය ප්‍රා.ලේ.) කැබිතිගොල්ලෑව පදවිය (ප්‍රා.ලේ) මැදිරිගිරිය බකමූණ | 0.4 | 78 | 100 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 07 | පළාතේ දේශීය ආහාර නිෂ්පාදකයින්ගේ නිෂ්පදනවල ගුණාත්මකභාවය ඇති කිරීම තුළින් වෙළඳපොල අවස්ථා ඇති කිරීම සහ ආදායම් වර්ධනය කිරීම. | තෝරාගත් දේශීය ආහාර නිෂ්පාදන කර්මාන්තකරුවන් 100 දෙනෙකුට තාක්ෂණික පුහුණුව ලබාදීම. | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් හා අමාත්‍යංශය වෙත කරන ලද ඉල්ලීම් මගින්<br><br>*පසු අස්වනු තාක්ෂණ පුහුණු ආයතනයේ සම්පත් දායකත්වය ලබාගැනීම.<br><br>*සහල් පිටි ආශ්‍රිත දේශීය පලතුරු ආශ්‍රිත, සහල් පිටි ආශ්‍රිත සොසේජස් ,අයිස්ක්‍රීම් ,කුරහන් කේක් ,සියඹලා බීම නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම. | 120 | පළාත තුළ | 0.3 | 60 | 60 |
| 08 | ජංගම අලෙවි කුටි ලබාදීම තුළින් දේශීය ආහාර ක්ෂේත්‍රයේ නිරත ව්‍යාවසායකයන්ගේ | ජංගම අලෙවි කුටි ලබාදීම.<br>*කුරහන් ඇතුළු ධාන්‍ය නිෂ්පාදකයන්ට අලෙවිකුටි ලබාදීම.<br>*දේශීය එළවළු හා පළතුරු අලෙවිකරුවන් 25කට අලෙවිකුටි | *ප්‍රතිලාභීන් තෝරාගැනීම.<br>*DECMA ආයතනයේ වෙළඳ කුටි 20ක් සඳහා ඇණවුම් ලබාදීම.<br><br>*නිම කරන ලද කුටි තෝරාගත් ප්‍රතිලාභීන්ට ලබාදීම. | 20 | කැබිතිගොල්ලෑව තඹුත්තේගම | 2.7 | 70 | 85 |
| 09 | බෝ නොවන රෝග වළක්වා ගැනීම සඳහා පළාතේ ප්‍රජාව දැනුවත් කිරීම හා ගුණාත්මක දේශීය ආහාර | දේශීය ආහාර හා එහි ගුණාංග පිළිබඳ පෝස්ටර්, අත් පත්‍රිකා සකස් කර රාජ්‍ය ආයතන හා පාසල්වලට ලබාදිම - 2017 | දේශීය ආහාර භාවිතයේ වැදගත්කම දැක්වෙන පෝස්ටර්, අත්පත්‍රිකා, ස්ටිකර් නිර්මාණය හා මුද්‍රණය කිරීම. රාජ්‍ය ආයතන, පාසල් ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රචාරණය සඳහා බෙදා දීම. | පළාතේ ප්‍රජාව | පොදු | 0.1 | 100 | 38 |

## මෙහෙයුම් සමාලෝචනය හා සංවර්ධන කාර්ය පිළිබඳ කාර්ය සාධනය

### 01. ඉදිකිරීම් යන්ත්‍ර මෙහෙයුම් පුහුණු පාඨමාලා පැවැත්වීම - රු.මි.2.0

පළාතේ තරුණ ප්‍රජාව මුහුණ දෙන ප්‍රමුඛතම ගැටළුව වන්නේ උසස් අධ්‍යාපනයෙන් පසු රැකියා විරහිතයින් බවට පත් වීමයි. විරැකියාවෙන් පෙළෙන අවම අධ්‍යාපන සුදුසුකම් සහිත තරුණියන් තෝරා ගෙන එක්ස් කැවේටර් ,ලෝඩර්, බැක්හෝ, මෝටර් ග්‍රේඩර් ඇතුළු බර වාහන 10ක් සඳහා පුහුණුව ලබා දීම සිදු කෙරේ.

- අයදුම් කළ 74ක් අතුරින් සම්මුඛ පරීක්ෂණය සමත් වූ 30ක පිරිසෙන් 15 දෙනෙකු පාඨමාලා නිම කර ඇත.
- පාඨමාලා ලාභියෙකුගෙන් 50% ක් අයකර ඉතිරිය අමාත්‍යාංශය මඟින් ගෙවීමටත් කටයුතු කර ඇත.
- ඉදිකිරීම් යන්ත්‍ර පුහුණු ක්ෂේත්‍රයේ රාජ්‍ය අංශයේ ප්‍රමුඛයාවන නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයට අයත් ගල්කුලම ඉදිකිරීම් යන්ත්‍ර පුහුණු විදුහලේ සම්පත්දායකත්වයෙන් පුහුණුව ලබා දී ඇත.
- ඉදිකිරීම් ක්ෂේත්‍රය තුළ ඇතිව තිබෙන ශීඝ්‍ර වර්ධනය හා පුහුණු ශ්‍රමය හිඟකම නිසා රැකියා අවස්ථා රැසක් නිර්මාණය කරගත හැකි අතරම NVQ 3 හා 4 මට්ටම් සඳහා ලබාදෙන සහතිකය ජාත්‍යන්තරව පවතින රැකියා අවස්ථා ලබා ගැනීමට ද හැක.

### 02. බර වාහන රියදුරු පුහුණු පාඨමාලා පැවැත්වීම - රු.මි.0.5



පළාතේ තරුණයින්ගේ විරැකියාව අවම කිරීමත්, වෘත්තීය මාර්ග වෙත යොමු කිරීමේ අදහස ඇතිව 2017 වර්ෂයේ දී අනුරාධපුර ලංකා ගමනා ගමන මණ්ඩලයේ සම්පත් දායකත්වයෙන්, සැහැල්ලු වාහන බලපත්‍ර ලබාගෙන වසර දෙකක් ගත වී ඇති පළාතේ පදිංචි තරුණයන්ගෙන් 505ක ගාස්තුවක් අයකරගෙන රියදුරු පුහුණුව ලබා දී ඇත. රාජ්‍ය අංශයේ රියදුරු බලපත්‍ර ලබාදීමේ ප්‍රමුඛ ආයතනයක් මෙන්ම විනයගරුක රියදුරන් බිහි කිරීමේ ජාතික මෙහෙවරක යෙදී සිටින ලංකා ගමනා ගමන මණ්ඩලයේ සම්පත්දායකත්වය ලබාගැනීමට හැකි වීමත් සුවිශේෂී කාරණයකි. ප්‍රාදේශීය ලේකම් කාර්යාල දැනුවත් කර එම කොට්ඨාශ මඟින් අප වෙත යොමුකරන ලද අයදුම් පත්‍ර 104ක් අතරින් පසුව පාඨමාලා හැදෑරීමට යොමු වූ පිරිස අඩු වීමෙන් පෙනී යන්නේ මෙවැනි කාර්යයන් සඳහා තරුණ පිරිස යොමුවීමේ අඩු ප්‍රවණතාවක් පවතින බවයි.

### 03. පළාතේ තෝරාගත් තරුණ පිරිස් සඳහා ස්වයං රැකියා වෘත්තීය පුහුණු හා අධ්‍යාපන පාඨමාලා පැවැත්වීම - රු.මි.1.0

ස්වයං රැකියා ආශ්‍රිතව විවිධ ක්ෂේත්‍රයන්ට අදාල රැකියා සිදුකරන සුළු පරිමාණ කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදනයන් හි ගුණාත්මක බව වර්ධනය කිරීම හා නව වෙළඳපොල අවස්ථා වෙත ඔවුන්ව පෙළඹීමේ අරමුණ ඇතිව මෙම ව්‍යාපෘති සිදුකර ඇත.ජීවනෝපාය ලෙස රෙදි මැසීම හා

ටෙඩි බෙයා නිෂ්පාදනය සහ වෙනත් නිෂ්පාදන මෙන්ම සාරි ජැකට්, ඇතුළු කාන්තා ඇඳුම් මැසීම හා අත්කම් නිෂ්පාදනවලට අදාළ නව නිර්මාණ හා තාක්ෂණය හඳුන්වා දීමත් සඳහා පලාගල සහ පලුගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වෙතින් ලද ඉල්ලීම් අනුව රස කැවිලි නිෂ්පාදනය කරන ව්‍යවසායකයන් 150ක් සඳහා මෙම වැඩසටහන් සඳහා සහභාගි විය.

### 04. තරුණ කඳවුරු පැවැත්වීම - රු මි.1.5

පළාතේ තරුණ තරුණියන්ගේ දැනුම, ආකල්ප, කුසලතා සහ නායකත්ව ගුණාංග සංවර්ධනය තුළින් නිර්මාණශීලී හා විනයගරුක තරුණ තරුණියන් ජාතියට බිහිකිරීමේ අරමුණින් තරුණ කඳවුරු වැඩසටහන 2016 වර්ෂයේ දී ආරම්භ කරන ලදී. පළාතේ තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් මෙම වැඩසටහන් 16ක් 2016 වර්ෂයේ දී පැවැත් වූ අතර 2017 වර්ෂයේ දී මැදවච්චිය, නොච්චියාගම, වැලිකන්ද, විලච්චිය, තඹුත්තේගම, මැදිරිගිරිය, නාච්චාදූව, පලාගල සහ කැබිතිගොල්ලෑව යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් මෙම වැඩසටහන් පවත්වා ඇත.

පුද්ගල පෞරුෂත්වය වර්ධනය සඳහා ක්‍රියාකාරකම් සහ දේශන මඟින් ද මත්ද්‍රව්‍ය සහ සමාජ අපචාර පිළිබඳවත් ලිංගිකත්වය හා නව යොවුන් වියේ සෞඛ්‍යමය ගැටළු සහ වෘත්තීයමය අවස්ථාවන් ඇතුළු ක්ෂේත්‍රයන්ට අදාල ප්‍රවීණතාව ලද සම්පත්දායකයින් ලෙස සම්බන්ධකර ඇත.කලාව, සාහිත්‍ය,වින්දනයක් සහිත මානව හිතවාදී තරුණ ප්‍රජාවක් බිහි කිරීමේ අදහස ඇතිව ගී රස වින්දන වැඩසටහන ද සහිත දින දෙකක වැඩසටහනක් ලෙස මෙම වැඩසටහන පවත්වා ඇත. අනුරාධපුර සහ පොළොන්නරුව දිස්ත්‍රික්ක දෙකේම තරුණ තරුණියන් 800ක් වැඩසටහන් සඳහා සහභාගී වී ඇත.

### 05. දේශීය ආහාර සහ එහි ගුණාංග පිළිබඳ ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම - රු.මි.0.4

මිනිසාගේ ජීවිතයේ පැවැත්මේ ප්‍රධාන සාධකයක් නියෝජනය කරනුයේ ආහාරයි. වෙළඳ හා ආහාර විෂය යටතේ අප අතරින් භාවිතයෙන් ඉවත්ව යන එහෙත් වියදමකින් තොරව සපයා ගත හැකි පළාතේ බහුලව තිබෙන ගුණාත්මක දේශීය ආහාර පාන භාවිතයට ජනතාව හුරු කිරීම සඳහා ඔවුන්ව දැනුවත් කිරීමත්, පළාතේ ජනතාව තුළ දේශීය ආහාර පාන ප්‍රවර්ධනයක් අරමුණු කර ගනිමින් මෙම වැඩසටහන් පවත්වා ඇත.







පළාතේ ගොවිජන සේවා බල ප්‍රදේශ මට්ටමින් පිහිටුවා ඇති කාන්තා ගොවි සංවිධාන සහභාගී කර ගනිමින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ කෝන්වැව, ඇලයාපත්තුව, තන්තිරිමලේ, කැබිතිගොල්ලෑව, පදවිය - පරාක්‍රමපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මැදිරිගිරිය, බකමූණ, යන ගොවිජන සේවා බල ප්‍රදේශවල මෙම වැඩසහටන පවත්වා ඇත. 1000ක පමණ පිරිසක් දැනුවත් කර ඇත.

බෝ නොවන රෝග වළක්වා ගැනීම, අධි පරිභෝජනවාදය විසින් කෘතිම රසකාරක අඩංගු ආහාර පාන භාවිතයට හුරුවීම නිසා දියවැඩියාව, කොලොස්ටරෝල්, අධි රුධිර පීඩනය හා වකුගඩු රෝගය වැනි රෝග වැළදීමට හේතු හා ඒවා වළක්වා ගැනීම සඳහා දේශීය ආහාර පාන භාවිතයේ වැදගත්කම පිළිබඳ දැනුවත් කිරීම සඳහා රජරට විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ ආචාර්වරුන් සහ ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ආයුර්වේද වෛද්‍ය නිලධාරීන්ගේ සම්පත් දායකත්වයෙන් ගොවිජන සේවා සංවර්ධන නිලධාරී ඇතුළු කාර්ය මණ්ඩලයේ සහභාගීත්වයෙන් මෙම වැඩසටහන් පවත්වන ලදී.

### 06.තෝරාගත් දේශීය ආහාර කර්මාන්තකරුවන් 100 දෙනෙකුට තාක්ෂණ පුහුණුව ලබාදීම - රු.මි. 0.3

ස්වයං රැකියාව ලෙස ආහාර ආශ්‍රිත කර්මාන්ත පවත්වාගෙන යන ව්‍යවසායකයන් පළාතේ ආර්ථිකයට දක්වන ලද දායකත්වය විශාලය. එමෙන්ම, පළාතේ මහජනතාව සඳහා ගුණාත්මක සෞඛ්‍ය සම්පන්න ආහාරපාන ලබාදීමෙන් පළාතේ ප්‍රජාවගේ සෞඛ්‍යය හා පෝෂණීය තත්වය ඉහළ නැංවීමට දක්වන ලද දායකත්වය විශාලය. ඒ අමාත්‍යාංශය විසින් පළාත තුළින් කර්මාන්ත සංවර්ධන අධිකාරිය වෙත ලද ඉල්ලීම් ද සලකා පසු අස්වනු තාක්ෂණ ආයතනයේ සම්පත් දායකත්වයෙන් මෙම පුහුණු වැඩසටහන් පවත්වා ඇත. සහල් පිටි ආශ්‍රිත, දේශීය පළතුරු (සියඹලා / දෙහි), සහල් පිටි ආශ්‍රිත සොසේජස් / අයිස්ක්‍රීම්, කුරහන් / මුං / උඳු ඇතුළු ධාන්‍ය භාවිතා කර කේක් වැනි ආහාර නිෂ්පාදනයන් පිළිබඳ ව්‍යවසායකයන් 120කට නවීන තාක්ෂණය හා පුහුණුව ලබා දී ඇත.



### 07. ජංගම අලෙවි කුටි ලබාදීම- රු.මි. 2.7

දේශීය ධාන්‍ය, එළවළු, පළතුරු ඇතුළු ආහාර ආශ්‍රිත නිෂ්පාදන සිදු කරන ව්‍යවසායකයන් අතුරින් පසු අස්වනු තාක්ෂණ ආයතනයේ පුහුණුව ලද ව්‍යවසායකයන් සඳහා ඔවුන්ගේ ව්‍යාපාරික අවස්ථාවන් ප්‍රවර්ධනය කිරීම තුළින් වැඩි වෙළඳාමක් මඟින් ආදායම් වර්ධනය කිරීමේ අරමුණු ඇතිව මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදි. දේශීය එළවළු හා පළතුරු, දේශීය කෙටි කෑම, කොළ කැඳ, දේශීය ධාන්‍ය නිෂ්පාදන යන ක්ෂේත්‍ර 4ක් සඳහා අලෙවි කුටි ලබාදීමට සැලසුම් කර තිබූ නමුත්, අලෙවි කුටි ලබාදීමට හැකි වූයේ 20ක් පමණි.

### 08. දේශීය ආහාර හා එහි ගුණාංග පිළිබඳ පෝස්ටර්, අත් පත්‍රිකා සකස් කර රාජ්‍ය ආයතන හා පාසල්වලට ලබාදීම - රු.මි. 0.1




පළාත තුළ පමණක් නොව ජාතිකව ගත් කළ බෝ නොවන රෝග ව්‍යාප්තියේ ශීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කරයි. කුඩා ළමුන් විශේෂයෙන් කෙටි කෑම හා රසකාරක අඩංගු ආහාර පාන බහුලව භාවිතයට පෙළඹවීමේ වර්ධනයක් පෙන්වයි. අනාගත පරපුර සහ පළාතේ ප්‍රජාව මෙම තත්වයෙන් මුදවා ගැනීමේ අරමුණ සහිතව දේශීය එළවළු, පළතුරු, පලා වර්ග, ධාන්‍ය භාවිතයේ වැදගත්කම විදහා දැක්වෙන අත් පත්‍රිකා, පෝස්ටර්, ස්ටිකර් නිර්මාණය කර මුද්‍රණය කිරීමත්, පළාතේ පාසල් ළමුන් වෙත හා රාජ්‍ය ආයතන මඟින් එහි සිටින පිරිස් හා ඒ වෙත පැමිණෙන පොදු ජනතාව වෙත ප්‍රචාරණය කිරීම තුළින් විදේශීය ආහාර වෙනුවට මෙරට තිබෙන ගුණාත්මක දේශීය ආහාර වෙත පෙළඹවීමේ අරමුණු සහිතව මෙම වැඩසටහන ක්‍රියාත්මක කර ඇත.

**සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම තුළින් අපේක්ෂිත ප්‍රතිලාභ**

| අංකය | ව්‍යාපෘතිය | කෙටිකාලීන බලපෑම |
|---|---|---|
| 01 | පළාතේ තෝරාගත් තරුණයන් 100ක් සඳහා ඉදිකිරීම් යන්ත්‍ර පුහුණුව ලබාදීම. | ◆ ඉදිකිරීම් යන්ත්‍ර රියදුරු බලපත්‍ර ලබාදීම.<br>◆ තරුණයන් රැකියා සඳහා යොමුවීම.<br>◆ තරුණයන්ගේ ආදායම් ඉහළ යාම. |
| 02 | පළාතේ තෝරාගත් තරුණයන් 50 දෙනෙකු සඳහා බර වාහන පුහුණුව ලබාදීම. | ◆ තරුණයන්ට බර වාහන රියදුරු බලපත්‍ර ලබාදීම.<br>◆ තරුණයන් බර වාහන රියදුරු ක්ෂේත්‍රයේ රැකියා සඳහා යොමුවීම. |
| 03 | පළාතේ තෝරාගත් තරුණ පිරිස් සඳහා ස්වයං රැකියා වෘත්තීය පුහුණුව හා අධ්‍යාපන පාඨමාලා පැවැත්වීම. | ◆ ක්ෂේත්‍රය තුළ නොතිබූ දැනුම,ආකල්ප,කුසලතා වර්ධනය වීම.<br>◆ නිෂ්පාදන ධාරිතාවය හා ඵලදායිතාවය ඉහලයාම.<br>◆ ආදායම් වර්ධනය වීම. |
| 04 | තරුණ කඳවුරු පැවැත්වීම. | ◆ පළාතේ තරුණයන්ගේ ආකල්ප සංවර්ධනය කිරීම.<br>◆ වෘත්තීය වශයෙන් තිබෙන පාඨමාලා වෙත යොමුවීම.<br>◆ යහපත් ජීවිතයක් ගොඩනැගීමට මඟ විවරවීම. |
| 05 | දේශීය ආහාර හා එහි ගුණාංග පිළිබඳ ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. | ◆ දේශීය ආහාර භාවිතයේ වැදගත්කමත්, කෘතිම ආදේශක ආහාර භාවිතයේ අහිතකර බවත් පිළිබඳ ජනතාව දැනුවත්වීම.<br>◆ දේශීය ආහාර භාවිතයට ජනතාව පෙළඹීම.<br>◆ දේශීය ආහාර නිෂ්පාදනයන් හඳුනාගැනීම. |

| අනු අංකය | ව්‍යාපෘතිය | කෙටිකාලීන බලපෑම |
|---|---|---|
| 06 | තෝරාගත් දේශීය ආහාර නිෂ්පාදන කර්මාන්තකරුවන් 100 දෙනෙකුට තාක්ෂණික පුහුණුව ලබාදීම. | ♦ සහල් පිටි,දේශීය පලතුරු,එළවළු යොදාගනිමින් විවිධ බීම වර්ග සහ ආහාර නිෂ්පාදනය පිළිබඳ තාක්ෂණික දැනුම වර්ධනය හා යාවත්කාලීන වීම.<br>♦ දේශීය ආහාර නිෂ්පාදනයන් ප්‍රචලිතවීම.<br>♦ නිෂ්පාදන සංවර්ධන තුලින් ආදායම් ඉහල යාම. |
| 07 | ජංගම අලෙවිකුටි ලබාදීම. | ♦ ස්ථිර ස්ථානයක් නොමැති දේශීය ආහාර නිෂ්පාදකයන් හට අලෙවි කුටි ලබාදීම මගින් තම නිෂ්පාදන ක්‍රමවත්ව අලෙවි කිරීමට හැකිවීම.<br>♦ අලෙවි මධ්‍යස්ථානය ආකර්ශණීය වීම.<br>♦ නිෂ්පාදන අලෙවිය ඉහල යාම හා ආදායම් වැඩිවීම. |
| 08 | දේශීය ආහාර හා එහි ගුණාංග පිළිබඳ පෝස්ටර්, අත්පත්‍රිකා, ස්ටිකර් සකස් කර රජයේ පාසල් හා රාජ්‍ය ආයතන වෙත ලබාදීම. | ♦ පාසල් ළමුන්, රාජ්‍ය ආයතන ඇතුළු පළාතේ ජනතාව දේශීය ආහාර පිළිබඳ දැනුවත් වීම. බෝ නොවන රෝග වළක්වා ගැනීම. |

**2017** වර්ෂය තුළදී, අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර අනුව යමින් පළාතේ සංවර්ධනය ක්‍රියාවලිය උදෙසා අමාත්‍යාංශය සතු විෂය තුළ සාධාරණයක් ඉටු කරමින් ද අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අනෙකුත් දෙපාර්තමේන්තු ද මෙහෙයවමින් විශාල කාර්යය භාරයක් යථෝක්ත වර්ෂය තුළදී ඉටුකළ අතර එය 2016 වර්ෂය හා සමඟ සසඳා බලනවිට සැලකිය යුතු මට්ටමක ප්‍රගතියකි.

මෙය හිස්ව තබන ලද පිටුවකි

# සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

**9.1**

## උතුරු මැද පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව සතු සේවා ජාලය

| විස්තරය | අනුරාධපුර | පොළොන්නරුව | එකතුව |
|---|---|---|---|
| විවිධ සේවා | 17 | 09 | 26 |
| පාරිභෝගික සමිති | 02 | - | 02 |
| සමුපකාර බැංකු | 3 | - | 3 |
| කෘෂිකාර්මික | 1 | - | 1 |
| සත්ව නිෂ්පාදන - කිරි | 3 | 1 | 4 |
| ධීවර | 2 | 4 | 6 |
| කර්මාන්ත | 1 | 1 | 2 |
| කම්කරු | - | 1 | 1 |
| තරුණ සේවා | - | 1 | 1 |
| සුභසාධන | - | 1 | 1 |
| වෙනත් ප්‍රාථමික | - | 1 | 1 |
| සේවක සංඛ්‍යාව | 711 | 606 | 1,317 |
| සාමාජික සංඛ්‍යාව | 166,706 | 130,773 | 297,479 |
| ඉන්ධනහල් | 7 | 11 | 18 |
| කෝප් සිටි | 14 | 13 | 27 |
| මිනි කෝප් සිටි | 49 | 38 | 87 |
| මෙගා කෝප් සිටි | 03 | 01 | 04 |
| ග්‍රාමීය බැංකු | 106 | 40 | 146 |
| සණස සංගම් | 70 | 43 | 113 |
| ඉතිරි කිරීමේ ගිණුම් | 129,653 | 174,023 | 303,676 |
| ස්ථාවර තැම්පතු | 8,853 | 5,132 | 13,985 |


### දැක්ම

"තිරසාර සමුපකාර ව්‍යවසායත්, සෞභාග්‍යමත් සමාජයක්"

### මෙහෙවර

"සමුපකාර ක්‍රමය හා එම ජාලය ශක්තිමත් කිරීම. සියළු පාර්ශවකරුවන් මනා සහභාගීත්වයෙන්, විනිවිද භාවයෙන් යුක්තව සහ සමුපකාර සංකල්පවලට, ප්‍රතිපත්තිවලට මුල්තැන දෙමින් සංවර්ධනය කිරීම."


### දිගුකාලීන අරමුණු හා කෙටිකාලීන අරමුණු



## කෙටිකාලීන අරමුණු

සමුපකාර ව්‍යාපාර තුළින් තාක්ෂණික උපකාර හා ක්‍රමෝපායන් සැකසීම.


## ප්‍රධාන කාර්යයන්




## ප්‍රධාන උපාය මාර්ගයන්

01. පළාතේ පාරිභෝගික ජනතාවට සහන මිලට ද්‍රව්‍ය සැපයීම.
02. පළාතේ නිෂ්පාදන සඳහා වෙළඳපොළක් ඇති කිරීම මඟින් ගොවීන්ට සහන සැලසීම.
03. පළාතේ ජනතාවට සහනදායී මූල්‍ය පහසුකම් සැපයීම.

## කාර්ය මණ්ඩල සංයුතිය




| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 178 |
| 2 | සේවයේ නියුතු | 124 |
| 3 | පුරප්පාඩු | 54 |

## මෙහෙයුම් ප්‍රතිඵල - පුනරාවර්තන වියදම්


| වියදමෙ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදන (රු.මි.) | 2017 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 61.82 | 59.57 | 2.25 | 96.36 |
| ගමන් වියදම් | 3.72 | 2.65 | 1.07 | 71.23 |
| සැපයීම් | 2.40 | 2.33 | 0.07 | 97.08 |
| නඩත්තු වියදම් | 1.98 | 1.81 | 0.17 | 91.41 |
| ගිවිසුම්ගත සේවා | 1.83 | 1.71 | 0.12 | 93.44 |
| මාරු කිරීම් | 4.70 | 4.56 | 0.15 | 97.02 |
| **එකතුව** | **76.45** | **72.63** | **3.83** | **95.00** |

මුලධන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදන (රු.මි.) | 2017 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 0.50 | 0.49 | 0.01 | 98 |
| යන්ත්‍රසූත්‍ර සවි කිරීම් හා උපකරණ | 3.60 | 0.25 | 3.35 | 6.94 |
| දැනුම වර්ධනය හා ආයතනික සංවර්ධනය | 0.20 | 0.17 | 0.03 | 85 |
| වෙනත් මුලධන වත්කම් පුනරාවර්තන හා වැඩි දියුණු කිරීම | 3.00 | 3.00 | - | 100 |
| **එකතුව** | 7.30 | 3.91 | 3.39 | 53.56 |

සංවර්ධන වැඩ පිළිබඳ කාර්ය සාධනය - පසුගිය වසර 03ක ප්‍රාග්ධන වැය වීම්

| වර්ෂය | PSDG (රු.මි) | PCDG (රු.මි) | මුදල (රු.මි) |
|---|---|---|---|
| 2015 | 4.22 | 4.64 | 8.86 |
| 2016 | - | 2.44 | 2.45 |
| 2017 | 0.55 | 3.35 | 4.41 |




අංශය තුළින් ඉටුකර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු අංක - 08

**සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායි සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම.**

8.2. විවිධාංගිකරණය ,තාක්ෂණය ඉහළ නැංවීම සහ නවෝත්පාදන තුළින් සහ ඉහළ වටිනාකම් එකතු කරන ලද සහ ශ්‍රමය සඳහා වැඩි ඉල්ලුමක් ඇති ක්ෂේත්‍රය පිළිබඳ අවධානය යොමු කිරීම තුළින් ඉහළ මට්ටමේ ආර්ථික නිෂ්පාදිතයක් ලබා ගැනීම.

## දිගු කාලීන හා කෙටි කාලීන අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ප්‍රධාන කාර්යයන් හා සම්බන්ධ සංවර්ධන ව්‍යාපෘති

දිගු කාලීන හා කෙටි කාලීන අරමුණු ඉටුකර ගැනීම සඳහා පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කළ අතර ඒ තුළින් ආයතන සංවර්ධනයත් සමුපකාර සමිතිවල කාර්යක්ෂමතාවය වැඩි කිරීම මඟින් සමුපකාර සමිති සංවර්ධනය කිරීමත් සමුපකාර සංවර්ධන ග්‍රාමීය බැංකු ජාලගත කිරීම මගින් කාර්යක්ෂමතාවය වැඩි කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීම ද සිදුවිය. ඒ අනුව අනුරාධපුර දිස්ත්‍රික්කයේ තෝරාගත් ග්‍රාමීය බැංකු ජාලගත කිරීම සඳහා අවශ්‍ය උපකරණ හා පහසුකම් සැපයීම සිදුවිය.

මානව සම්පත් සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කරමින් සමුපකාර සාමාජිකයින් හා සමුපකාර සංවර්ධන නිලධාරින් සඳහා පුහුණු වැඩමුළු පැවැත්වීම සිදුවිය. එහිදී නවීන වෙළඳපොළ අලෙවිකරණ ක්‍රම හඳුනා ගැනීම, තීරකකරණය පාඨමාලාව පිළිබඳ දැනුවත් කිරීම, සමුපකාර සංවර්ධන ග්‍රාමීය බැංකු නියාමනය පිළිබඳ දැනුවත් කිරීම හා ග්‍රාමීය බැංකු නියාමනය කිරිම, අධ්‍යයන චාරිකා මගින් අත්දැකීම් මෙන්ම දැනුම හුවමාරු කර ගැනීමට අවස්ථාව ලබා දෙන ලදී.

**දිගු කාලීන හා කෙටි කාලීන අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්රියාත්මක කළ ප්‍රධාන කාර්යයන් හා සම්බන්ධ සංවර්ධන ව්‍යාපෘති හා සම්බන්ධ ප්‍රගතිය**

| අනු අංකය | අරමුණ | අරමුණ ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | කෙටි කාලීන ඉලක්ක | වෙන් කළ මුදල (රු.මි.) | ප්‍රගතිය (%) | |
|---|---|---|---|---|---|---|
| | | | | | භෞතික | මූල්‍ය |
| 1 | ආයතනික සංවර්ධනය | දෙපාර්තමේන්තු ගොඩනැගිල්ලේ වහලය නවීකරණය කිරීම. | සතුටුදායක සේවා පරිශ්‍රයක් ඇති කිරීම | 0.5 | 100 | 99 |
| 2 | ආයතනික සංවර්ධනය | සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යාලය සහ අනුරාධපුර උප කාර්යාල සඳහා ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ මිලදී ගැනීම | සතුටුදායක සේවා පරිශ්‍රයක් ඇති කිරීම | 2.75 | 100 | 100 |
| 3 | ආයතනික සංවර්ධනය | පොළොන්නරුව උප කාර්යාලය සඳහා උපකරණ මිල දී ගැනීම | සතුටුදායක සේවා පරිශ්‍රයක් ඇති කිරීම | 0.75 | 100 | 100 |

| අ.අ | අරමුණ | අරමුණ ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ වැඩසටහන | ප්‍රධාන ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් | ප්‍රා.ලේ.කො. ගණන | වෙන් කළ මුදල (රු.මි.) | ප්‍රගතිය(%) | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | භෞතික | මූල්‍ය |
| 1 | ආයතන සංවර්ධනය | තමුත්තේගම මානව සම්පත් මධ්‍යස්ථානය අවශ්‍යතා සම්පූර්ණ කිරීම (තිර රෙදි හා ගෘහ භාණ්ඩ මිලදී ගැනීම) | ➢ සමූපකාර සමිති සඳහා කාර්යක්ෂම සේවාවක් ලබාදීම<br>➢ සතුටුදායක සේවා පරිශ්‍රයක් ඇති කිරීම සඳහා අවශ්‍ය පහසුකම් ලබාදීම | 500 ට වැඩි | 1 | 0.2 | 100 | 95 |
| 2 | මානව සම්පත් සංවර්ධනය | සමූපකාර සාමාජිකයින් හා සමූපකාර සංවර්ධන නිලධාරින් සඳහා පුහුණු වැඩමුළු පැවැත්වීම | ➢ නවීන වෙළඳපොළ අලෙවිකරණ ක්‍රම හඳුනාගැනීම<br>➢ අධ්‍යයන චාරිකා<br>➢ තිරසකරණය පාඨමාලාව පිළිබඳ දැනුවත් කිරීම<br>➢ සමූපකාර සංවර්ධන ග්‍රාමීය බැංකු නියාමනය | 250 ට වැඩි | 1 | 0.1 | 100 | 93 |
| 3 | සමූපකාර සමිතිවල කාර්යක්ෂමතාවය වැඩි කිරීම මඟින් සමූපකාර සමිති සංවර්ධනය කිරීම | අනුරාධපුර දිස්ත්‍රික්කයේ තෝරාගත් ග්‍රාමීය බැංකු ජාලගත කිරීම සඳහා අවශ්‍ය උපකරණ හා පහසුකම් සැපයීම | සමූපකාර සංවර්ධන ග්‍රාමීය බැංකු ජාලගත කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීම (දෘඩාංග හා මෘදුකාංග ලබාදීම) | 300 ට වැඩි | 1 | 3 | 100 | 100 |
| 4 | මානව සම්පත් සංවර්ධනය | සමූපකාර සාමාජිකයින් හා සමූපකාර සංවර්ධන නිලධාරින් සඳහා පුහුණු වැඩමුළු පැවැත්වීම | 1.නවීන වෙළඳපොළ අලෙවිකරණ ක්‍රම හඳුනාගැනීම<br>2.අධ්‍යයන චාරිකා තිරසකරණය පාඨමාලාව පිළිබඳ දැනුවත් කිරීම<br>3.සමූපකාර සංවර්ධන ග්‍රාමීය බැංකු නියාමනය | 250 ට වැඩි | 1 | 0.1 | 100 | 100 |

වෙන් වූ පුනරාවර්තන ප්‍රතිපාදන අනුව අපේක්ෂිත ඉලක්ක ළඟාකර ගැනීමට හැකි වූ අතර 2017.12.31 දින වනවිට මූලධන ව්‍යාපෘති සියල්ලේ වැඩ අවසන් කර තිබුන අතර අත්තිකාරම් බී ගිණුම අනුමත සීමාවන් තුළ ප්‍රගතියක් අත්කර ගෙන ඇති අතර ලැබුණු අක්මුදල් 100%ක ප්‍රගතියක් අත්කර ගෙන ඇත.

දෙපාර්තමේන්තුවේ අරමුණ හා ප්‍රධාන කාර්යයන් ඉටුකර ගැනීමේ දී අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු විශාල ප්‍රමාණයක් පැවතීම හා ප්‍රධාන ගැටළු වශයෙන් පැවතුන ද සේවයේ නියුක්ත කාර්ය මණ්ඩල මනා කාර්ය සාධනයෙන් යුක්තව, සමූපකාර සේවකයින්ගේ හා පළාතේ පාරිභෝගික ජනතාවගේ සුබසිද්ධිය උදෙසා කැපවීමෙන් කටයුතු කරන ලද අතර ආයතනික විනය හා මූල්‍ය විනය යහපත් හා විධිමත්ව පවත්වා ගනිමින් මහජන ප්‍රසාදය ලබා ගැනීමට ප්‍රයත්න දරා ඇත.

### කාර්ය සාධනය කරා ළඟා වීමේදී මුහුණ දීමට සිදු වූ ගැටළු.

- සංවර්ධන කාර්යයන් නිම කළ ද අදාළ කාලයට අක්මුදල් නොලැබීම.
- නිලධාරි පුරප්පාඩු පැවතීම,
- ප්‍රමාණවත් පරිදි වාහන නොමැතිවීම නිසා ක්ෂේත්‍ර අධීක්ෂණ කටයුතු යම් පමණකට අතපසු වීම.

ඉහත කී අභියෝග හා ගැටළුකාරී තත්වයන් තිබුණද 2017 වර්ෂය තුළදී ඉලක්ක කරන ලද වැඩසටහන තුළ සැලසුම් කරන ලද සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය සාපේක්ෂව ඉහළ මට්ටමකින් ළඟාකර ගැනීමට හැකි වීම සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව සතු දැක්ම කරා ළඟා වීමට පිටුවහලක් විය.

# පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව 9.2

### දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මකවන ආයතන

අනුරාධපුර පේෂකර්ම මධ්‍යස්ථාන - 27
පොළොන්නරුව පේෂකර්ම මධ්‍යස්ථාන- 15
අනුරාධපුර අලෙවි මධ්‍යස්ථාන - 03
පොළොන්නරුව අලෙවි මධ්‍යස්ථාන- 01

### අනුරාධපුර පේෂකර්ම මධ්‍යස්ථාන - 27

| | |
|---|---|
| නොච්චියාගම | පල්ලේකාගම |
| මුදිතාගම | වලච්චේගම |
| රළපනාව | මානෑව |
| පණ්ඩුලගම | කලාකරඹෑව |
| පෙරිමියන්කුලම | හිරිපිටියාගම |
| කටුකැලියාව | නෙළුඹෑව |
| රුවන්ගම | කල්පේ |
| පුබ්බෝගම | 21 ජනපදය |
| මානේරුව | ගෝමරන්කල්ල |
| නෙළුම්පත්ගම | හුරුළු නිකවැව |
| රාජාංගනය | තිරප්පනේ |
| රඹෑව | මාමිනියාව |
| දෙමටගල | හුරිගස්වැව |
| නාමල්පුර | |

### පොළොන්නරුව පේෂකර්ම මධ්‍යස්ථාන - 15

| | |
|---|---|
| පත්තිනි පෙදෙසගම | බුද්ධයාය |
| නෙළුම්විල | අතරගල්ලෑව |
| කඩලවැව | අත්තනකඩවල |
| බෝ අත්ත | අරලගන්විල |
| කුමාරගම | පැරකුම් |
| රජඇලගම | බැදිවැව |
| පුලතිසිගම | තල්පොත |
| හිඟුරක්දමන | |

### අලෙවි මධ්‍යස්ථාන - 04

කඩ පනහ අනුරාධපුර
කච්චේරිය අනුරාධපුර
තිරප්පනේ
පොළොන්නරුව - රජ ඇලගම

### වඩු පාසල් - 10

| | |
|---|---|
| සෙලෙස්තිමඩුව යාන්ත්‍රික වඩු පාසල | නාච්චාදූව |
| කලාවැව යාන්ත්‍රික වඩු පාසල | ඉපලෝගම |
| නොච්චියාගම යාන්ත්‍රික වඩු පාසල | නොච්චියාගම |
| කැකිරාව යාන්ත්‍රික වඩු පාසල | කැකිරාව |
| ගලෙන්බිඳුණුවැව යාන්ත්‍රික වඩු පාසල | ගලෙන්බිඳුණුවැව |
| මානිංගමුව යාන්ත්‍රික වඩු පාසල | මානිංගමුව |
| ඔරුබැදිසියඹලාව යාන්ත්‍රික වඩු පාසල | ඇලහැර |
| ගිරිපොකුණ යාන්ත්‍රික වඩු පාසල | දිඹුලාගල |
| මැදිරිගිරිය යාන්ත්‍රික වඩු පාසල | මැදිරිගිරිය |
| ඒරියාගම දැව තාක්ෂණ උසස් පුහුණු ආයතනය | තලාව |

### පේෂකර්ම ගම්මාන - අනුරාධපුර - 10

- කුරටියාව
- කවරක්කුලම
- බුලංකුලම
- පූනෑව
- කාශ්‍යපගම
- සාලියපුර
- උට්ටිමඩුව
- කිරිගල්වැව
- රුවන්පුර (පදවිය)
- සඳරැස්ගම

### පේෂකර්ම ගම්මාන - පොළොන්නරුව - 04

- බිසෝ බණ්ඩාරගම
- සිංහ උදාගම
- පුලතිසිගම
- ගිරිතලේ

## දැක්ම

"නිර්මාණශීලි කර්මාන්ත ප්‍රජාවක්, අභිමානවත් පළාතක්".

## මෙහෙවර

"කර්මාන්ත ක්ෂේත්‍රයේ මානව සම්පත්, ආයෝජන, නිෂ්පාදන හා වෙළඳපළ අවස්ථා, පර්යේෂණ හා සංවර්ධන, සියළු පාර්ශ්වකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව ප්‍රවර්ධනය කිරීම".

## දිගුකාලීන අරමුණු හා කෙටිකාලීන අරමුණු

### දිගුකාලීන අරමුණු

උතුරු මැද පළාතේ හස්ත කර්මාන්ත, පේෂකර්මාන්ත හා කුඩා කර්මාන්ත ක්ෂේත්‍රයන්හි නිෂ්පාදනය ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව ඉහළ නැංවීම තුළින් ජාතික නිෂ්පාදනයට කරනු ලබන්නා වූ දායකත්වය ඉහළ නංවාලීම හා ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නංවාලීම.

### කෙටිකාලීන අරමුණු

උතුරු මැද පළාතේ හස්ත කර්මාන්ත, පේෂකර්මාන්ත හා කුඩා කර්මාන්ත ක්ෂේත්‍රයන්හි ශිල්පීන්හට රැකියා අවස්ථා සලසා දීම හා ඔවුන්ගේ නිෂ්පාදනවල ගුණාත්මකභාවය ජාතික ප්‍රමිත තත්ත්වයට නංවාලීම හා පවත්නා නිෂ්පාදන අලෙවි ආදායම් මට්ටම ඉහළ නැංවීම හා වැඩිකිරීම.

### කාර්ය මණ්ඩල සංයුතිය


| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 157 |
| 2 | සේවයේ නියුතු (සංවර්ධන නිළධාරි 01 අතිරික්තය) | 127 |
| 3 | පුරප්පාඩු | 31 |

## ප්‍රධාන කාර්යයන්

- කර්මාන්ත ක්ෂේත්‍රයේ මානව සම්පත් සංවර්ධනය.
- කර්මාන්ත අංශයේ ආයෝජන ප්‍රවර්ධනය.
- නිෂ්පාදන හා වෙළඳපළ අවස්ථා සංවර්ධනය.
- පර්යේෂණ හා සංවර්ධනය.
- ආයතනික ධාරිතා සංවර්ධනය.
- යහපාලනය.

## ප්‍රධාන උපාය මාර්ගයන්

- හස්ත කර්මාන්තය, පේෂ කර්මාන්ත, හා වඩු කර්මාන්ත යන අංශවල කර්මාන්තකරුවන් හා ශිල්පීන් සඳහා නව තාක්ෂණය පිළිබඳ පුහුණුව ලබා දීමෙන් ගුණාත්මක නිර්මාණ හා නිෂ්පාදන එළිදැක්වීමට කටයුතු කිරීම.
- ස්වයං රැකියාවන්ට යොමු කිරීමට අවශ්‍ය ප්‍රාග්ධන ආධාර ලබා දී අලෙවි පහසුකම් ද සලසා දීමෙන් ඔවුන්ගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම.



**මෙහෙයුම් ප්‍රතිඵල - පුනරාවර්තන වියදම්**

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2017 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩි නඩි | 63.39 | 59.90 | 3.49 | 94 |
| ගමන් වියදම් | 1.99 | 1.50 | 0.49 | 75 |
| සැපයීම් | 3.86 | 2.89 | 0.97 | 75 |
| නඩත්තු වියදම | 2.89 | 2.03 | 0.86 | 70 |
| ගිවිසුම්ගත සේවා | 3.94 | 2.81 | 1.13 | 71 |
| මාරු කිරීම් | 0.63 | 0.45 | 0.18 | 71 |
| සහනාධාර | 15.04 | 13.54 | 1.50 | 90 |
| **එකතුව** | **91.74** | **83.12** | **8.62** | **91** |

ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය (රු.මි) 91.74 ක් වු අතර 2017 වර්ෂයේ වියදම (රු.මි) 83.12 ක් ද විය. එහි සමස්ත උපයෝජනය 91% කි.

**පුනරාවර්තන වියදම් දරමින් සංවර්ධන ස්වභාවයේ වැඩ ඉටු කිරීම තුළින් ආයතනයේ ඉහළ කාර්ය සාධනයක් කරා ගමන් කිරීම සඳහා දැරූ දායකත්වය**

**1. වාර්ෂිකව පවත්වන කර්මාන්ත ප්‍රදර්ශනය පැවැත්වීම.**

**01.** පේෂ කර්මාන්ත ආයතනවලින් ප්‍රදර්ශනයට අදාලව නව නිර්මාණ (සාරි ) නිෂ්පාදනය කර එම සාරිවලින් කොළඹ පැවැත්වෙන ජාතික කර්මාන්ත ප්‍රදර්ශනයට ඉදිරිපත් කරලීම සඳහා කමිටුවක් පත්කර 1,2,3 ස්ථාන තෝරා ගනු ලබයි. එම තෝරාගනු ලබන නිර්මාණ කොළඹ පැවැත්වෙන ජාතික කර්මාන්ත ප්‍රදර්ශනයට ඉදිරිපත් කරනු ලබයි. එහිදි දිනුම් ලබන නිර්මාණ සඳහා ජනාධිපති සම්මාන ලැබේ. මෙම නිර්මාණ ප්‍රදර්ශන භූමිය නැරඹීමට පැමිණෙන අයට දැකබලා ගැනීමට හා අවශ්‍ය දෑ මිලදි ගැනීමට කටයුතු සලස්වනු ලබයි.

**02.** හස්ත කර්මාන්ත කටයුතුවල නියැලෙන ශිල්පීන්ව දැනුවත්කර ප්‍රදර්ශනයට අවශ්‍ය පන්, මැටි, වේවැල්, තල්කොල හා වෙනත් දේශීය අමුද්‍රව්‍ය යොදා නිෂ්පාදනය කරනු ලබන ජාතික භාණ්ඩ ලබාගෙන එම භාණ්ඩ අතුරින් ජාතික කර්මාන්ත ප්‍රදර්ශනයට අවශ්‍ය භාණ්ඩ තෝරාගෙන එම භාණ්ඩ හැර ඉතිරි දෑ ප්‍රදර්ශන භූමියේ නැරඹීමට පැමිණෙන අයට දැකබලා ගැනීමට හා අවශ්‍ය දෑ මිලදි ගැනීමට කටයුතු කිරීම.

**03.** මෙම ප්‍රදර්ශන භූමිය තුළ විවිධ වු දේශිය භාණ්ඩ අලෙවිය සඳහා අලෙවි කුටි සුළු පරිමාණ වෙළඳ කටයුතුවල නියැලෙන නිෂ්පාදනකරුවන්ට ලබා දෙමින් ඔවුන්ගේ ආදායම් වැඩිකර ගැනීමට කටයුතු කිරීම.

**04.** පසල් මට්ටමින් මෙම ප්‍රදර්ශනය පිළිබඳ දැනුවත්කර ඔවුනට දේශීය රෙදි විවීම, මැටි කර්මාන්ත, බීරළු වැඩ වැනි දැහි කාර්ය දැක බලා ගැනීමට සැලැස්වීම.

**05.** කර්මාන්ත ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කරන හස්ත කර්මාන්ත, පේෂ කර්මාන්ත, වඩු කර්මාන්ත සඳහා ඉදිරිපත් කරනු ලබන භාණ්ඩවලින් පළමු, දෙවන, තෙවන ස්ථාන ලබන නිපැයුම් කරුවන් ද, වැඩිම නිෂ්පාදනය කරන පේෂ මධ්‍යස්ථාන සඳහා ද, වඩු කර්මාන්ත හා හස්ත කර්මාන්ත ක්ෂේත්‍රවල නියුතු වුවන්ද ඇගයීම සඳහා ත්‍යාග, සහතිකපත්, සම්මාන පිරිනමනු ලබයි. එමඟින් ඔවුන් දිරිගැන්වීමක් අපේක්ෂා කරනු ලබයි.

**මූලධන වියදම්**


| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි.) | 2017 වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි හා ඉදි කිරීම් (PSDG/PCDG) | 12.2 | 10.8 | 1.40 | 89 |
| යන්ත්‍රසූත්‍ර සවිකිරීම් හා උපකරණ | 2.60 | 2.30 | 0.30 | 88 |
| වෙනත් මූලධන වත්කම් පුනරාවර්තනය හා වැඩිදියුණු කිරීම | 0.10 | 0.10 | - | 100 |
| **එකතුව** | **14.90** | **13.20** | **1.70** | **88.59** |

**ආදායම්**

| ශීර්ෂය | ඉලක්කය (රු.මි.) | සත්‍ය වියදම (රු.මි.) | එකතු කිරීම් ප්‍රගතිය (%) |
|---|---|---|---|
| 20.02.01.01 | 0.02 | 0.02 | 106% |
| 20.02.02.02 | 0.79 | 0.70 | 89% |
| 20.03.02.99 | 0.08 | 0.09 | 119% |

**සංවර්ධන වැඩ පිළිබඳ කාර්ය සාධනය - පසුගිය වසර 03 ක (2015-2017) ප්‍රාග්ධන වැයවීම්**

| වර්ෂය | PSDG (රු.මි) | PCDG (රු.මි.) | වෙනත් ප්‍රතිපාදන (රු.මි.) | මුළු මුදල (රු. මි.) |
|---|---|---|---|---|
| 2015 | 9.87 | 5.74 | - | 15.61 |
| 2016 | 11.85 | 22.51 | 2.50 | 34.36 |
| 2017 | 0.49 | 18.94 | 30.78 | 19.43 |



## අංශය තුළින් ඉටුකර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු - 08

**සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායි සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම.**

8.2. විවිධාංගීකරණය , තාක්ෂණය ඉහළ නැංවීම සහ නවෝත්පාදන තුළින් සහ ඉහළ වටිනාකම් එකතු කරන ලද සහ ශ්‍රමය සඳහා වැඩි ඉල්ලුමක් ඇති ක්ෂේත්‍රය පිළිබඳ අවධානය යොමු කිරීම තුළින් ඉහළ මට්ටමේ ආර්ථික නිෂ්පාදිතයක් ලබා ගැනීම.

### දිගුකාලින හා කෙටිකාලීන අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ප්‍රධාන කාර්යයන් හා සම්බන්ධ ව්‍යාපෘති

දිගුකාලින හා කෙටිකාලීන අරමුණු ඉටුකර ගැනීම සඳහා ආයතනය විසින් හඳුනාගත් ප්‍රධාන කාර්යයන් ක්‍රියාවට නැංවීම සඳහා වූ සැලසුම් සහගතව හඳුනාගත් ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී.

- **කර්මාන්ත ක්ෂේත්‍රයේ මානව සම්පත් සංවර්ධනය.**

පේෂකර්මාන්ත ක්ෂේත්‍රයේ පේෂ උපදේශිකාවන්, කාර්මිකාවන් ද වඩු කර්මාන්ත ක්ෂේත්‍රයේ වඩු උපදේශකයින් හා වඩු පුහුණුවන්නන් පුහුණු කිරීම, හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ නියුතු වූවන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම මඟින් ආකල්ප හා කුසලතා සපිරි මානව සම්පත් බිහි කිරීම.

- **කර්මාන්ත අංශයේ ආයෝජන ප්‍රවර්ධනය.**

වඩු කර්මාන්ත අංශයේ හා පේෂ කර්මාන්ත අංශයේ පුහුණුව ලබන පුහුණුලාභීන්ගෙන් අයදුම්පත් ලබාගෙන එම අයදුම්පත්වලින් සුදුස්සන් තෝරා ඔවුනට නිෂ්පාදනයට අවශ්‍ය ආම්පන්න 50% දායකත්වය යටතේ ලබාදීම මඟින් තම ආර්ථික අවශ්‍යතා තමන් විසින් සම්පූර්ණ කර ගන්නා පිරිසක් බිහිවීම සිදු වේ.
පේෂකර්ම ගම්මාන 03 ක් වන ගිරිතලේ, නොච්චියාගම,මහ කැකිරාව යන ගම්මානවල සිටින පේෂකාර්මිකාවන් පුහුණු කර අවශ්‍ය නූල් හා අවශ්‍ය වෙනත් උපකරණ ලබා දී මෙම ගම්මානවල ශිල්පීන්ගේ නිෂ්පාදනය ඉහළ නැංවීම (කාර්යක්ෂමතාවය හා ගුණාත්මක බව)

- **නිෂ්පාදන හා වෙළඳපළ අවස්ථා සංවර්ධනය.**

වඩු පුහුණු මධ්‍යස්ථාන සඳහා අවශ්‍ය නව තාක්ෂණික උපකරණ මිලදී ගැනීම තුළින් නව තාක්ෂණික මෙවලම් සමඟ ආධුනිකයන් පුහුණු කිරීම හා නිෂ්පාදනය ඉහළ නැංවීමට කටයුතු සිදු කිරීම.
පේෂකර්ම මධ්‍යස්ථාන සඳහා අවශ්‍ය අත්යන්ත්‍ර මිලදී ගැනීම තුළින් සාපේක්ෂව ඉහළ කාර්යක්ෂමතාවයකින් සහ උසස් ප්‍රමිතියෙන් යුතුව රෙදි විවීම.

- **පර්යේෂණ හා සංවර්ධන.**

වඩු පුහුණු මධ්‍යස්ථාන හා පේෂකර්ම මධ්‍යස්ථාන අළුත්වැඩියා කිරීම තුළින් නිෂ්පාදනයට සුදුසු පහසුකම් සහිත ගොඩනැගිලි ඇති කිරීම හා අංක 1.1, 1.2, 1.3, 1.5 යන කාර්යයන් ඉටු කිරීම මඟින් හස්ත කර්මාන්ත, පේෂ කර්මාන්ත කුඩා කර්මාන්ත, නිෂ්පාදන ක්ෂේත්‍රයන්හි නිෂ්පාදනයේ ප්‍රමාණාත්මක හා ගුණාත්මකව ඉහළ නැංවීම තුළින් නිෂ්පාදනයට කරනු ලබන දායකත්වය ඉහළ නංවා ජනතාවගේ ජීවන තත්වය ඉහළ නැංවීම.

- **ආයතනික ධාරිතා සංවර්ධනය.**

අත්දැකීම් හුවමාරු වැඩසටහන් යටතේ හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ කාර්මිකාවන් වෙනත් පළාත් සභාවක තෝරාගත් ආයතන කිහිපයකට ගෙන ගොස් නව නිර්මාණ පිළිබඳ අදහස් හුවමාරු කර ගැනීමට සැලසීම.(මහ නුවර)

අත්දැකීම් හුවමාරු වැඩ සටහන් යටතේ පේෂකර්මාන්ත ක්ෂේත්‍රයේ කාර්මිකාවන්, පේෂ උපදේශිකාවන් වෙනත් පළාත් සභාවක තෝරාගත් ආයතන කිහිපයකට ගෙන ගොස් නව නිර්මාණ බලා අදහස් හුවමාරු කර ගැනීමට සැලසීම . (යාපනය).

- **යහපාලනය.**

අත්දැකීම් හුවමාරු වැඩසටහන් යටතේ හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ කාර්මිකාවන් වෙනත් පළාත් සභාවක තෝරාගත් ආයතන කිහිපයකට ගෙන ගොස් නව නිර්මාණ බලා අදහස් හුවමාරුකර ගැනීමට සැලසීම(මහ නුවර).

අත්දැකීම් හුවමාරු වැඩ සටහන් යටතේ පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයේ කාර්මිකාවන්, පේෂ උපදේශිකාවන් වෙනත් පළාත් සභාවක තෝරාගත් ආයතන කිහිපයකට ගෙන ගොස් නව නිර්මාණ බලා අදහස් හුවමාරු කර ගැනීමට සැලසීම (යාපනය).

### පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන මගින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති

| අනු අංකය | අරමුණු | ක්‍රියාත්මක කළ ව්‍යාපෘති | ප්‍රධාන ක්‍රියාකාරකම | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | වෙන් කළ මුදල(රු.මි) | ප්‍රගතිය (%) | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | භෞතික | මූල්‍ය |
| 1 | පුහුණු පාඨමාලා පැවැත්වීමට හා නිෂ්පාදන කටයුතු සඳහා සුදුසු පහසුකම් සහිත ගොඩනැගිලි | අළුත්වැඩියා | කලාවැව වඩු පුහුණු මධ්‍යස්ථානය අළුත්වැඩියාව | ඉපලෝගම | 1.72 | 100 | 97 |
| 2 | කාර්මිකාවන්ට වැඩ කිරීමට සුදුසු පහසුකම් සහිත ගොඩනැගිලි | අළුත්වැඩියා | ගලෙන්බිඳුණුවැව වඩු පුහුණු මධ්‍යස්ථානය අළුත්වැඩියාව | ගලෙන්බිඳුණුවැව | 0.52 | 100 | 89 |
| 3 | කාර්මිකාවන්ට වැඩ කිරීමට සුදුසු පහසුකම් සහිත ගොඩනැගිලි | අළුත්වැඩියා | වලව්වේගම පේෂකර්ම මධ්‍යස්ථානය අළුත්වැඩියාව | ඉපලෝගම | 0.24 | 100 | 78 |
| 4 | කාර්මිකාවන්ට වැඩ කිරීමට සුදුසු පහසුකම් සහිත ගොඩනැගිලි | අළුත්වැඩියා | රඹෑව පේෂකර්ම මධ්‍යස්ථානය අළුත්වැඩියාව | රඹෑව | 0.80 | 100 | 74 |
| 5 | කාර්මිකාවන්ට වැඩ කිරීමට සුදුසු පහසුකම් සහිත ගොඩනැගිලි | අළුත්වැඩියා | පල්ලේකාගම පේෂකර්ම මධ්‍යස්ථානය අළුත්වැඩියාව | ඉපලෝගම | 1.04 | 100 | 79 |

| අනු අංකය | අරමුණු | අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කල ව්‍යාපෘති | ප්‍රධාන ක්‍රියාකාරකම | ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය | වෙන්කළ මුදල(රු.මි) | ප්‍රගතිය (%) | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | භෞතික | මුල්‍ය |
| 6 | කාර්මිකාවන්ට වැඩ කිරීමට සුදුසු පහසුකම් සහිත ගොඩනැගිලි | අළුත්වැඩියා | දෙමටගල පේෂකර්ම මධ්‍යස්ථානය අළුත්වැඩියාව | රඹෑව | 0.68 | 100 | 96 |
| 7 | පුහුණු පාඨමාලා පැවැත්වීමට හා නිෂ්පාදන කටයුතු සඳහා සුදුසු පහසුකම් සහිත ගොඩනැගිලි | අළුත්වැඩියා | ගිරිපොකුණ වඩු පුහුණු මධ්‍යස්ථානය අළුත්වැඩියාව | දිඹුලාගල | 0.64 | 100 | 98 |
| 8 | කාර්මිකාවන්ට වැඩ කිරීමට සුදුසු පහසුකම් සහිත ගොඩනැගිලි | අළුත්වැඩියා | අතරගල්ලෑව පේෂකර්ම මධ්‍යස්ථානය අළුත්වැඩියාව | ඇලහැර | 1.62 | 100 | 96 |
| 9 | කාර්මිකාවන්ට වැඩ කිරීමට සුදුසු පහසුකම් සහිත ගොඩනැගිලි | අළුත්වැඩියා | අත්තනකඩවල පේෂකර්ම මධ්‍යස්ථානය අළුත්වැඩියාව | ඇලහැර | අවලංගුකර ඇත | - | - |
| 10 | කාර්මිකාවන්ට වැඩ කිරීමට සුදුසු පහසුකම් සහිත ගොඩනැගිලි | අළුත්වැඩියා | පැරකුම්පුර පේෂකර්ම මධ්‍යස්ථානය අළුත්වැඩියාව | දිඹුලාගල | 0.46 | 100 | 83 |
| 11 | කාර්මිකාවන්ට වැඩ කිරීමට සුදුසු පහසුකම් සහිත ගොඩනැගිලි | අළුත්වැඩියා | කඩවලවැව පේෂකර්ම මධ්‍යස්ථානය අළුත්වැඩියාව | තමන්කඩුව | 0.28 | 100 | 85 |
| 12 | කාර්මිකාවන්ට වැඩ කිරීමට සුදුසු පහසුකම් සහිත ගොඩනැගිලි | අළුත්වැඩියා | බැදිවැව පේෂකර්ම මධ්‍යස්ථානය අළුත්වැඩියාව | තමන්කඩුව | අවලංගුකර ඇත | - | - |

| අනු අංකය | අරමුණ | අරමුණ ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ වැඩසටහන් | ප්‍රධාන ක්‍රියාකාරකම | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | වෙන් කළ මුදල(රු.මි) | ප්‍රගතිය (%) | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | භෞතික | මූල්‍ය |
| 13 | කාර්මිකාවන්ට වැඩ කිරීමට සුදුසු පහසුකම් සහිත ගොඩනැගිලි | අළුත්වැඩියා | කුරිගස්වැව පේෂකර්ම මධ්‍යස්ථානය අළුත්වැඩියාව | තඹුත්තේගම | 2.5 | 100 | 89 |
| 14 | මධ්‍යස්ථානවල සෞඛ්‍ය පහසුකම් ඇති කිරීම | අළුත්වැඩියා | අත්තනකඩවල පේෂකර්ම මධ්‍යස්ථානයේ බැසිකිලිය අළුත්වැඩියා කිරීම | ඇලහැර | 0.19 | 100 | 83 |
| 15 | සාපේක්ෂව ඉහළ කාර්යක්ෂතාවකින් සහ උසස් ප්‍රමිතියෙන් යුතුව රෙදි විවීම | අත්යන්ත්‍ර අළුත්වැඩියාව ( අනුරාධපුර දිස්ත්‍රික්කය) | පේෂකර්ම මධ්‍යස්ථාන සඳහා අත්යන්ත්‍ර අළුත්වැඩියාව ( අනුරාධපුර දිස්ත්‍රික්කය) | පොදු | 0.30 | 100 | 100 |
| 16 | සාපේක්ෂව ඉහළ කාර්යක්ෂතාවකින් සහ උසස් ප්‍රමිතියෙන් යුතුව රෙදි විවීම | අත්යන්ත්‍ර අළුත්වැඩියාව (පොළොන්නරුව දිස්ත්‍රික්කය) | පේෂකර්ම මධ්‍යස්ථාන සඳහා අත්යන්ත්‍ර අළුත්වැඩියාව ( පොළොන්නරුව දිස්ත්‍රික්කය) | පොදු | 0.20 | 100 | 99 |
| 17 | නව තාක්ෂණික මෙවලම් සමඟ ආධුනිකයන් පුහුණු කිරීම හා නිෂ්පාදන කටයුතු සිදුවීම | යන්ත්‍ර උපකරණ මිලදී ගැනීම ( අනුරාධපුර දිස්ත්‍රික්කය) | වඩු පුහුණු මධ්‍යස්ථාන සඳහා යන්ත්‍ර උපකරණ මිලදී ගැනීම ( අනුරාධපුර දිස්ත්‍රික්කය) | පොදු | 0.10 | 85 | 59 |

| අනු අංකය | අරමුණු | ක්‍රියාත්මක කළ ව්‍යාපෘති | ප්‍රධාන ක්‍රියාකාරකම | ප්‍රා.ලේ.කො | වෙන් කළ මුදල(රු.මි) | ප්‍රගතිය (%) | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | භෞතික | මූල්‍ය |
| 18 | නව තාක්ෂණික මෙවලම් සමඟ ආධුනිකයන් පුහුණු කිරීම හා නිෂ්පාදන කටයුතු සිදුවීම | යන්ත්‍ර උපකරණ මිලදී ගැනීම ( පොලොන්නරුව දිස්ත්‍රික්කය) | වඩු පුහුණු මධ්‍යස්ථාන සඳහා යන්ත්‍ර උපකරණ මිලදී ගැනීම ( පොලොන්නරුව දිස්ත්‍රික්කය) | පොදු | 0.10 | 85 | 50 |
| 19 | සාපේක්ෂව ඉහළ කාර්යක්ෂතාවකින් සහ උසස් ප්‍රමිතියෙන් යුතුව රෙදි විවීම | අත්යන්ත්‍ර මිලදී ගැනීම ( අනුරාධපුර දිස්ත්‍රික්කය) | පේෂකර්ම මධ්‍යස්ථාන සඳහා අත්යන්ත්‍ර මිලදී ගැනීම ( අනුරාධපුර දිස්ත්‍රික්කය) | පොදු | 0.50 | 100 | 99 |
| 03 | තෝරාගත් වැන්දඹු හා කාන්තා මූලික අඩු ආදායම්ලාභි පවුල් සඳහා නිවාස ඉදිකිරීම හෝ අළුත්වැඩියා කිරීම් හා ආධාර වැසටහන | 1. නිවාස ගැටළුව විසඳීමට දායක වීම<br>2. ස්ථිර නිවාස ඇති පවුල් බිහි කිරිම<br>3. යහපත් මානසික තත්ත්වයෙන් යුත් පවුල් බිහිකිරිම |
| 04 | අඩු ආදායම්ලාභී පවුල් සඳහා නිවාස ආධාර ලබා දීම | |
| 05 | අඩු ආදායම්ලාභී පවුල් සඳහා නිවාස මූල්‍ය ආධාර ලබා දීම | |

## මෙහෙයුම් සමාලෝචනය හා කාර්ය සාධනය ළඟාකර ගැනීම පිළිබඳ සමස්ත අදහස



2016 වර්ෂයට සාපෙක්ෂව 2017 වර්ෂයේදීත් අමාත්‍යාංශය සාර්ථකත්වයෙන් යුතු ඉලක්ක ගත වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. අමාත්‍යාංශය යටතේ ඇති පළාත් වාරිමාර්ග පළාත් ඉඩම් හා ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවල සංවර්ධන වැඩසටහන් වර්ෂයේ මුල සිටම සැලසුම් කරන ලද අතර එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය හා සම්බන්ධිකරණය ක්‍රියාශීලි මට්ටමෙන් ක්‍රමවත්ව සිදු කරන ලදි. එසේම එම දෙපාර්තමේන්තු මඟින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය අඛණ්ඩව පරීක්ෂා කරන අතර එමඟින් සතුටුදායක මට්ටමක සාර්ථකත්වයක් ලබා ගෙන ඇති පෙන්වා දිය හැක.



2017 මැයි මස 18දින මෙම අමාත්‍යාංශය වෙත පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය හා නිවාස සංවර්ධන විෂය පැවරුණ අතර එම විෂයයන් යටතේ ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන්වල මෙහෙයවීම සම්බන්ධීකරණය හා අධික්ෂණය මෙන්ම ප්‍රගති පාලනය කිරීමට සිදු විය.

අමාත්‍යාංශය යටතේ සෘජුවම ක්‍රියාත්මක වන විෂය වන කාන්තා කටයුතු හා නිවාස විෂය (2018.මැයි.18 දින පැවරුණු) යටතේ වැඩ සටහන් කිහිපයක් ක්‍රියාත්මක කරන ලදි.

කාන්තා කටයුතු විෂය යටතේ ජාත්‍යන්තර කාන්තා දින සැමරුම් වැඩසටහන මාර්තු මස 30 වන දින සාර්ථකව නිම කරන ලදී. එමෙන්ම තෝරාගත් අඩු ආදායම්ලාභී වැන්දඹු හෝ කාන්තා මූලික පවුල් සඳහා නිවාස ආධාර දීමේ වැඩසටහන් සාර්ථකව ක්‍රියාත්මක කර අවසන් කරන ලදි. ඒ සඳහා අනුරාධපුර හා පොළොන්නරුව යන දිස්ත්‍රික්ක දෙකෙහි ප්‍රතිලාභීන් තුන්සිය තිස් පහකට (335) ප්‍රතිලාභ අත්විය.

ස්වයං රැකියාවලට කාන්තාවන් යොමු කිරීමේ අරමුණ පෙරදැරිව දිරිය කාන්තා වැඩසටහන ක්‍රියාත්මක විය. ස්වයං රැකියාවක් කිරීමේ හැකියාව හා අභිලාශය ඇති කාන්තාවන් එකසිය හැට එකක් (161) පළාත තුළින් තෝරාගෙන ඔවුන්ට සහන පදනම මත මහන මැෂින් ලබා දීමේ වැඩ සටහන සාර්ථකව අවසන් කෙරිණි.

කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මකව පැවති නිවාස සංවර්ධන විෂය 2017.05.18 දින මෙම අමතාත්‍යාංශය වෙත පැවරුණ අතර එසේ එම අමාත්‍යාංශය මඟින් ක්‍රියාතක්මක කරන ලද නිවාස සංවර්ධන වැඩසටහන් ඒ අයුරින්ම ක්‍රියාත්මකකර සාර්ථකව අවසන් කෙරිණි.

මෙය හිස්ව තබන ලද පිටුවකි

# පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව

**10.1**

## පළාත් වාරිමාර්ග පද්ධති

| විස්තරය | අනුරාධපුර | පොළොන්නරුව | එකතුව |
|---|---|---|---|
| වාරිමාර්ග වැව් ප්‍රමාණය | 2991 | 235 | 3,226 |
| වැව් මගින් වගා කරන ලද කුඹුරු අක්කර ප්‍රමාණය (අක්කර) | 128,608 | 19,881 | 138,877 |
| ගොවි පවුල් සංඛ්‍යාව | 83,885 | 5,779 | 89,664 |

## ප්‍රධාන කෘෂිකාර්මික ජලාශ

| අනුරාධපුර දිස්ත්‍රික්කය | | | |
|---|---|---|---|
| වැවේ නම | ජල ධාරිතාවය (අක්කර අඩි) | ධාරා ප්‍රදේශය (අක්කර) | මතුපිට විශාලත්වය (අක්කර) |
| පදවිය | 85,000 | 83,200 | 6,000 |
| වාහල්කඩ | 43,000 | 12,600 | 2,500 |
| නාච්චාදූව | 45,150 | 94,400 | 3,000 |
| තුරුවිල වැව | 5,190 | 12,200 | 500 |
| නුවර වැව | 36,050 | 13,000 | 2,500 |
| මහකනදරා වැව | 36,250 | 50,400 | 3,200 |
| මහවිලච්චිය වැව | 31,500 | 56,560 | 2,500 |
| තිසා වැව | 3,500 | 800 | 350 |
| බසවක්කුලම වැව | 1,910 | 1,440 | 200 |
| රාජාංගනය වැව | 81,603 | 1,188,000 | 4,000 |
| අංගමුව වැව | 14,400 | 5,000 | 1,200 |
| හුරුළු වැව | 55,000 | 308,000 | 3,500 |
| මානන්කට්ටිය වැව | 7,600 | 9,520 | 750 |

| පොළොන්නරුව දිස්ත්‍රික්කය | | | |
|---|---|---|---|
| වැවේ නම | ජල ධාරිතාවය (අක්කර අඩි) | ධාරා ප්‍රදේශය (අක්කර) | මතුපිට විශාලත්වය (අක්කර) |
| පරාක්‍රම සමුද්‍රය | 110,000 | 17,920 | 6,275 |
| මින්නේරි වැව | 110,000 | 59,264 | 6,300 |
| ගිරිතලේ වැව | 18,800 | 6,016 | 775 |
| රොට වැව | 1,028 | 4,800 | - |
| කවුඩුළු වැව | 104,000 | 22,400 | 6,400 |
| බෙබියා වැට | 938 | 1,856 | 261 |
| අඹගස් වැව | 4,000 | 12,512 | 318 |
| මහහල්මිල්ල වැව | 900 | 1,575 | 260 |
| ඇල්ලේ වැව | 1,100 | 330 | - |
| ජේස්කුලම වැව | 1,750 | 439 | 535 |

අස්වද්දා ඇති බිම් ප්‍රමාණය අක්කර 200ට වැඩි (විශාල වාරි මාර්ග) කෘෂි කාර්මික කටයුතු සඳහා ජලය ලබාගන්නා ජලාශ

### දැක්ම

"ප්‍රශස්ත වාරි කළමනාකරණයක්, සෞභාග්‍යමත් ගොවි ප්‍රජාවක්."

### මෙහෙවර

"අතීත උරුමයන් ආරක්ෂා කර ගනිමින්, තාක්ෂණික හා උපදේශන සේවා සැපයීමෙන් සියළු පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුතුව සුළු හා මධ්‍ය වාරි කර්මාන්තයන්හී ගුණාත්මක සංවර්ධනය, නඩත්තුව, පරිසර ආරක්ෂණය සහ ජල සම්පත ප්‍රශස්ථ ලෙස උපයෝජනය කිරීම මගින් පළාතේ තිරසාර සංවර්ධනයේ ප්‍රමුඛ හවුල්කරු වීම."

### දිගුකාලීන හා කෙටිකාලීන අරමුණු

#### දිගුකාලීන අරමුණු

- සංවර්ධිත හා මනා නඩත්තුවෙන් යුතු සුළු හා මධ්‍ය පරිමාණ වාරිමාර්ග පද්ධතියක් බිහි කිරීම.
- ජල කළමනාකරණය පිළිබඳ ප්‍රශස්ත දැනුමක් සහ අවබෝධයක් ලබා දීම.
- සංරක්ෂිත හා ආරක්ෂිත පාරිසරික පද්ධතියක් ඇති කිරීම.
- වර්ධනය වු ආයතනික ධාරිතාවයක් ඇති කිරීම.
- යහපාලනය.

#### කෙටිකාලීන අරමුණු

- ඇළ මාර්ග පද්ධතීන් මනා ලෙස සංවර්ධනය කරමින් නිසි පරිදි නඩත්තු වැඩ පිළිවෙළක් පවත්වාගෙන යාම.
- ගංවතුර උවදුර අවම මට්ටමකට පත් කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
- අවදානම් තත්වයේ පවතින වැව් සංවර්ධනය කිරීම.
- වාරිමාර්ග රක්ෂිත සලකුණු කිරීම මගින් අනවසර ක්‍රියා අවම කිරීම.
- රොන්මඩ හා ජලජ ශාක ඉවත් කිරීම තුළින් ජල ධාරිතාවය සංවර්ධනය.
- දැනුමෙන් හා හැකියාවෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් පවත්වාගෙන යාම.
- පසු අස්වනු හානිය අවම කිරීම,යාන්ත්‍රික කෘෂි කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම.

### ප්‍රධාන කාර්යයන්

- වාරි පද්ධති පුනරුත්ථාපනය කිරීම.
- වාරි පද්ධති නඩත්තු කිරීම.
- වාරි පද්ධතිවල අවශ්‍ය අංග අලුතින් ඉදි කිරීම.
- ජල කළමනාකරණ භාවිතයන් සංවර්ධනය කිරීම.
- ජල ගැලීම් හා හානි කළමනාකරණය කිරීම.
- පෝෂක ප්‍රදේශ සංවර්ධනය කිරීම.
- අංග සම්පූර්ණ දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම.
- තත්ත්ව පාලන ඒකකය පවත්වාගෙන යාම.
- කාර්යාල පද්ධති ධාරිතාවය ඉහළ නැංවීම.

### ප්‍රධාන උපාය මාර්ගයන්

| අංකය | කාර්යය | උපායමාර්ග (ය) |
|---|---|---|
| 01 | වාරි පද්ධති පුනරුත්ථාපනය කිරිම | • මුලස්ථායි වැඩ කොටස් පුනරුත්ථාපනය |
| | | • ඇල වේලි පුනරුත්ථාපනය |
| | | • කෘෂි මාර්ග පුනරුතථාපනය |
| | | • පෝෂක ඇල මාර්ග පුනරුත්ථාපනය |
| | | • පෝෂක ප්‍රදේශ පුනරුත්ථාපනය |
| | | • අපවහන ඇල මාර්ග පුනරුත්ථාපනය |
| | | • එල්ලංගා පද්ධති පුනරුත්ථාපනය |
| 02 | වාරි පද්ධති නඩත්තු කිරිම | • මුලස්ථායි වැඩ කොටස් නඩත්තු කිරිම |
| | | • ඇල වේලි නඩත්තු කිරිම |
| | | • කෘෂි මාර්ග නඩත්තු කිරිම |
| | | • පෝෂක ඇල  නඩත්තු කිරිම |
| | | • අපවහන ඇල  නඩත්තු කිරිම |
| | | • පෝෂක ප්‍රදේශ  නඩත්තු කිරිම |
| | | • එල්ලංගා පද්ධති  නඩත්තු කිරිම |
| 03 | වාරි පද්ධතිවල අවශ්‍ය අංග අළුතින් ඉදි කිරීම | • අමුණු ඉදිකිරීම |
| | | • ඇල වේලි ඉදිකිරිම |
| | | • කෘෂි මාර්ග ඉදිකිරිම |
| | | • පෝෂක ඇල  ඉදිකිරිම |
| | | • මුලස්ථායි වැඩ කොටස් ඉදිකිරිම |
| | | • අපවහන ඇල මාර්ග ඉදිකිරීම |
| | | • පවතින ඇල මාර්ග කොන්ක්‍රීට් කිරීම |
| 04 | ජල කළමනාකරණ භාවිතයන් සංවර්ධනය කිරිම | • ජල කළමනාකරණටය අදාල නිර්මිත ඉදිකිරීම |
| | | • ගොවි සංවිධාන (වාරි කළමණාකරණ කමිටු) බල ගැන්විම |
| | | • දැනුවත් කිරීමේ වැඩසටහන් |
| | | • තාක්ෂණික පුහුණුව |
| | | • ගොවි උපකරණ ලබා දිම |
| 05 | ජල ගැලීම සහ හානි කළමනාකරණය කිරිම | • දත්ත රැස් කිරිම හා ගවේෂණය |
| | | • ආපදා හඳුනා ගැනීම හා පිළියම් යෙදීම |
| | | • දෙපාර්තමේන්තුවේ ආපදා කළමනාකරණ කමිටුව සක්‍රියව පවත්වාගෙන යාම හා ධාරිතා සංවර්ධනය |
| 06 | පෝෂක ප්‍රදේශ සංවර්ධනය කිරිම | • සුදුසු ගස් වර්ග සිටුවීම හා නඩත්තුව |
| | | • ප්‍රදේශ නිර්ණය කිරිම හා මැනුම් කිරිම |
| | | • ගොවීන් දැනුවත් කිරිමේ වැඩසටහන් |
| | | • සීමා මායිම් ලකුණු කිරිම |
| | | • නෛතික රාමුව බලාත්මක කිරීම |

| | | |
|---|---|---|
| 07 | අංග සම්පූර්ණ දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම | • දත්ත පද්ධතිය ස්ථාපනය කිරිම<br>• දත්ත පද්ධතිය වාර්ෂිකව යාවත්කාලින කිරිම<br>• තොරතුරු කළමනාකරණ ඒකකයේ ධාරිතාවය ඉහළ නැංවීම |
| 08 | තත්ත්ව පාලන ඒකකය පවත්වාගෙන යාම | • මානව හා භෞතික සම්පත් ඉහළ නැංවීම |
| 09 | කාර්යාල ධාරිතාවය ඉහළ නැංවිම | • මානව හා භෞතික සම්පත් වැඩිදියුණු කිරීම |

## කාර්ය මණ්ඩල සංයුතිය

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 104 |
| 2 | සේවයේ නියුතු | 76 |
| 3 | පුරප්පාඩු | 28 |
| 4 | අනියම් | 05 |

## මෙහෙයුම් ප්‍රතිඵල- පුනරාවර්තන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය (රු.මි) | 2017 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩි නඩි | 35.51 | 35.50 | 0.01 | 100 |
| ගමන් වියදම් | 1.03 | 1.03 | 0.00 | 100 |
| සැපයිම් | 3.37 | 3.32 | 0.05 | 98 |
| නඩත්තු වියදම් | 102.70 | 85.67 | 17.03 | 83 |
| ගිවිසුම්ගත සේවා | 6.04 | 4.49 | 1.55 | 74 |
| මාරු කිරීම් | 0.15 | 0.12 | 0.03 | 80 |
| සහනාධාර | 0.03 | 0.03 | 0.01 | 83 |
| **එකතුව** | **148.83** | **130.15** | **18.67** | **87** |

පුනරාවර්තන වියදම් දරමින් සංවර්ධන ස්වභාවයේ වැඩ ඉටු කිරීම.

| අනු අංක ය | ව්‍යාපෘතිය | ප්‍රධාන ක්‍රියාකාරකම | අපේක්ෂිත ප්‍රතිඵල | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|
| 1 | වැව් ප්‍රතිසංස්කරණය | වැවෙහි ප්‍රධාන අංග අළුත්වැඩියා කිරීම | ජල කාන්දුව අවම කිරීම, ජල පරිමාව වැඩි කිරීම ,අස්වනු ඉහළ දැමීම | 883 |
| 2 | ඇළවේලි, අමුණු ප්‍රතිසංස්කරණය | වාන් ඇල හා අමුණු ප්‍රතිසංස්කරණය කිරීම | වාන් ජලය ක්‍රමවත්ව පිට කිරීම හා වැඩි ජල ප්‍රමණයක් රඳවා ගැනීම, වගා භූමියට ජලය ලබා ගැනීම | 754 |
| 3 | කෘෂි මාර්ග ප්‍රතිසංස්කරණය | කෘෂි මාර්ග ප්‍රතිසංස්කරණය | කෘෂි මාර්ග ප්‍රතිසංස්කරණය පසු අස්වනු හානිය අවම කිරීම, යාන්ත්‍රික කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම | 610 |


මූලධන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2017 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදි කිරීම් | 0.50 | 0.44 | 0.06 | 88 |
| යන්ත්‍ර සූත්‍ර සවි කිරීම් හා උපකරණ | 1.50 | 1.40 | 0.10 | 93 |
| වෙනත් මූලධන වත්කම් පුනරාවර්තන හා වැඩිදියුණු කිරීම | 11.00 | 7.27 | 3.73 | 66 |
| පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන | 70.31 | 50.44 | 19.87 | 72 |
| පළාත් සභා සංවර්ධන ප්‍රදාන | 21.22 | 13.84 | 7.38 | 65 |
| එකතුව | **104.53** | **73.39** | **31.14** | **70** |

සංවර්ධන වැඩ පිළිබඳ කාර්ය සාධනය - පසුගිය වසර 03ක ප්‍රාග්ධන වැය වීම් (වියදම්)

| වර්ෂය | PSDG (රු.මි) | PCDG (රු.මි) | වෙනත් ආයතන වලින් ලද (රු.මි) | මුළු වියදම (රු.මි) |
|---|---|---|---|---|
| 2015 | 65.98 | 130.75 | - | 196.73 |
| 2016 | 32.32 | 151.81 | - | 184.14 |
| 2017 | 50.44 | 13.83 | 18.37 | 82.65 |

## සංවර්ධන වැඩ පිළිබඳ කාර්ය සාධනය - පසුගිය වසර 03ක ප්‍රාග්ධන වැය වීම් (වියදම්)




## අංශය තුළින් ඉටුකර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු අංක - 13

**දේශගුණික විපර්යාස සහ ඒවායේ බලපෑම්වලට එරෙහිව කඩිනමින් ක්‍රියාත්මක කිරීම.**

13.1. කාලගුණය සම්බන්ධ විපත් සහ ස්වභාවික ආපදාවලට ඔරොත්තු දීමේ සහ එවැනි තත්වයන්ට මුහුණ දීමේ හැකියාව ශක්තිමත් කිරීම.

13.1. කාලගුණ වෙනස්වීම් අවම කිරීම, ඒ අනුව හැඩ ගැසීම, බලපෑම අවම කිරීම.

### දිගුකාලීන හා කෙටිකාලීන අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ප්‍රධාන කාර්යයන් හා සම්බන්ධ ව්‍යාපෘති

| අංකය | අරමුණ | අරමුණ ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් | ප්‍රතිලාභීන් ගණන | ප්‍රා. ලේ. ගණන | වෙන් කළ මුදල (රු.මි) | ප්‍රගතිය(%) | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | භෞතික | මූල්‍ය |
| 1 | සංවර්ධිත හා මනා නඩත්තුවෙන් යුතු සුළු හා මධ්‍ය පරිමාණ වාරිමාර්ග පද්ධතියක් බිහි කිරීම | පළාත් වාරිමාර්ග පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම | වාරිමාර්ග ප්‍රධාන අංග පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම,කෘෂි මාර්ග ප්‍රතිසංස්කරනය, ගංවතුරින් හානියට පත් වැව් පිළිසකර කිරීම,ඇළවේලි සංවර්ධනය. අමුණු ප්‍රතිසංස්කරණය, රොන් මඩ ඉවත් කිරීම | 6100 | 16 | 212.3 | 88.50 | 66 |

දිගුකාලීන හා කෙටිකාලීන අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ප්‍රධාන කාර්යයන් හා සම්බන්ධ ව්‍යාපෘති

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 2 | ජල කළමනාකරණය පිළිබඳ ප්‍රශස්ථ දැනුමක් සහ අවබෝධයක් ලබා දීම | දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්විම | දැනුවත් කිරීමේ හා පැහැදිලි කිරීමේ වැඩසටහන් පැවැත්වීම,ගොවි සංවිධාන සාකච්ඡා පැවැත්වීම | 6100 | 16 | - | 100 | - |
| 3 | සංරක්ෂිත හා ආරක්ෂිත පාරිසරික පද්ධතියක් ඇති කිරිම | වැව් රක්ෂිත වෙන් කිරිම | වැව් රක්ෂිතය වෙන් කිරිම,පිඹුරුපත් සැකසීම,පැල සිටුවීම, අනවසර අල්ලා ගැනීම සම්බන්ධව ග්‍රාම නිලධාරී හා ගොවි සංවිධාන දැනුවත් කිරිම | - | 3 | 3.0 | 100 | 88 |
| 4 | වර්ධනය වු ආයතනික ධාරිතාවයක් ඇති කිරිම | ආයතනික ධාරිතා සංවර්ධනය | පුහුණු වැඩමුළු පැවැත්විම, කාර්යාල උපකරණ මිලදි ගැනිම,ආයතනික ගොඩනැගිලි අළුත්වැඩියාව | 76 | 2 | 3.40 | 100 | 85 |

සංවර්ධන ව්‍යාපෘති මගින් කෙටි කාලීනව අපේක්ෂා කරන ප්‍රතිලාභ

| අනු අංකය | ව්‍යාපෘතිය | කෙටි කාලීන බලපෑම |
|---|---|---|
| 1 | ගොවි බිම් ප්‍රවේශ මාර්ග වැඩි දියුණු කිරිම | • පසු අස්වනු හානි අවම කිරීම<br>• යාන්ත්‍රික කෘෂි කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම. |
| 2 | පළාත් වාරිමාර්ග පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරිම | • වගා තීව්‍රතාවය වැඩි වීම<br>• ගංවතුර උවදුර අවම මට්ටමකට පත් කිරීම.<br>• අවදානම් තත්ත්වයේ පවතින වැව් සංවර්ධනය කිරීම තුළින් අවදානම අඩු වීම.<br>• රොන් මඩ හා ජලජ ශාක ඉවත් කිරීම තුළින් ජල ධාරිතාවය වර්ධනය. |

| | | |
|---|---|---|
| 3 | ඇළ වේලි සංවර්ධනය | • ඇළ මාර්ග පද්ධතීන් මනා ලෙස සංවර්ධනය කරමින් නිසි පරිදි නඩත්තු වැඩපිළිවෙලක් පවත්වාගෙන යාම. |
| | | • නිසි ජල කළමනාකරණයට ගොවි ජනතාව හුරු කිරීම. |
| | | • ගංවතුර උවදුර අවම මට්ටමකට පත් කිරීම. |
| | | • වැව් ආශ්‍රිත අනවසර ක්‍රියාකාරකම් අඩු වීම. |

## වෙනත් රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලින් ලද ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| අංකය | ව්‍යාපෘතිය | තමන්ගේ විෂයපථයට හසුවන අරමුණ | මුදල (රු.මි) | | ප්‍රගතිය (%) | |
|---|---|---|---|---|---|---|
| | | | වෙන් කළ | වැය කළ | භෞතික | මූල්‍ය |
| 01 | පාරිසරික සංවේදී කලාප සංරක්ෂණය කිරීම, ප්‍රවර්ධනය කිරීම හා පරිසර පද්ධති සේවා නඩත්තුව | සංවර්ධිත හා මනා නඩත්තුවෙන් යුතු සුළු හා මධ්‍ය පරිමාණ වාරිමාර්ග පද්ධතියක් බිහි කිරීම, ජල කළමනාකරණය පිළිබඳ ප්‍රශස්ථ දැනුමක් සහ අවබෝධයක් ලබාදීම, සංරක්ෂිත සහ ආරක්ෂිත පාරිසරික පද්ධතියක් ඇති කිරීම. | 34.61 | 18.37 | 67 | 53 |

## 2017 වර්ෂය තුළ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ව්‍යාපෘති වියදම්

| සංරචකය | 2017ට වෙන්කළ ප්‍රතිපාදන (රු.මි) | අඛණ්ඩ ව්‍යාපෘති ගණන | නව ව්‍යාපෘති ගණන | අනුමත ව්‍යාපෘති ගණන | අනුමත මුදල (රු.මි) | දෙසැම්බර් 31 දක්වා ගෙවීම (රු.මි) | අතැති බිල් වටිනාකම (රු.මි) | අඛණ්ඩ මුදල (රු.මි) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|---|---|---|---|
| වාරිමාර්ග පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 58.36 | 21 | 11 | 32 | 57.02 | 41.61 | 8.89 | 0.96 | 73 |
| කෘෂි මාර්ග වැඩිදියුණු කිරීම | 6.79 | 7 | 0 | 7 | 6.79 | 4.60 | 0.96 | - | 68 |
| වෙනත් මූලධන වත්කම් - සුළු වාරිමාර්ග | 2.83 | 1 | 1 | 2 | 2.83 | 2.36 | - | - | 100 |
| සුළු වාරිමාර්ග නඩත්තු | 7.00 | 0 | 3 | 3 | 7.00 | 3.63 | 0.23 | 2.48 | 52 |
| ගංවතුරින් හානියට පත් වැව් ප්‍රතිසංස්කරණය | 8.21 | 6 | 3 | 9 | 7.94 | 4.73 | - | 0.70 | 60 |
| පළාත් වාරිමාර්ග පුනරුත්ථාපන වැඩිදියුණු කිරීම | 75.00 | 0 | 17 | 17 | 74.51 | 39.50 | 15.75 | 33.97 | 53 |
| ගොවිබිම් ප්‍රවේශ මාර්ග | 10.00 | 0 | 6 | 6 | 9.84 | 5.45 | 1.94 | 1.42 | 55 |
| **එකතුව** | **168.19** | **35** | **41** | **76** | **165.93** | **101.88** | **27.77** | **39.53** | **61** |

| සංරචකය | 2017ට වෙන්කළ ප්‍රතිපාදන (රු.මි) | අඛණ්ඩ ව්‍යාපෘති ගණන | නව ව්‍යාපෘති ගණන | අනුමත ව්‍යාපෘති ගණන | වැඩ අවසන් ව්‍යාපෘති | අනුමත මුදල (රු.මි) | දෙසැම්බර් 31 දක්වා ගෙවීම (රු.මි) | අතැති බිල් වටිනාකම (රු.මි) | අඛණ්ඩ මුදල (රු.මි) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| පළාත් වාරිමාර්ග පුනරුත්ථාපන වැඩිදියුණු කිරීම | 75.00 | 0 | 17 | 17 | 6 | 74.51 | 39.50 | 15.75 | 33.97 | 53 |
| ගොවිබිම් ප්‍රවේශ මාර්ග | 10.00 | 0 | 6 | 6 | 5 | 9.84 | 5.45 | 1.94 | 1.42 | 55 |
| වෙනත් මූලධන වත්කම් - සුළු වාරිමාර්ග | 2.83 | 1 | 1 | 2 | 2 | 2.83 | 2.36 | - | - | 100 |
| වාරිමාර්ග පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 58.36 | 21 | 11 | 32 | 30 | 57.02 | 41.61 | 8.89 | 0.96 | 73 |
| කෘෂි මාර්ග වැඩිදියුණු කිරීම | 6.79 | 7 | 0 | 7 | 7 | 6.79 | 4.60 | 0.96 | - | 68 |
| මූලධන වත්කම් පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 13.36 | 1 | 0 | 1 | 1 | 1.33 | 1.29 | - | - | 100 |
| මූලධන වත්කම් අත්පත් කර ගැනීම- ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 0.98 | 1 | 1 | 2 | 2 | 0.98 | 0.55 | 0.39 | - | 100 |

| සංරචකය | 2017ට වෙන්කළ ප්‍රතිපාදන (රු.මි) | අඛණ්ඩ ව්‍යාපෘති ගණන | නව ව්‍යාපෘති ගණන | අනුමත ව්‍යාපෘති ගණන | වැඩ අවසන් ව්‍යාපෘති | අනුමත මුදල (රු.මි) | දෙසැම්බර් 31 දිනට ගෙවීම (රු.මි) | අතැති බිල් බරිතාකම (රු.මි) | අඛණ්ඩ මුදල (රු.මි) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ගංවතුරින් හානියට පත් වැව් ප්‍රතිසංස්කරණය | 8.21 | 6 | 3 | 9 | 8 | 7.94 | 4.73 | 1.01 | 0.70 | 60 |
| සුළු වාරිමාර්ග නඩත්තු | 7.00 | 0 | 3 | 3 | 0 | 7.00 | 3.63 | 0.23 | 2.48 | 52 |
| ගොඩනැගිලි හා ඉදිකිරීම් | 0.50 | 0 | 1 | 1 | 1 | 0.50 | 0.44 | - | - | 100 |
| ගොඩනැගිලි හා ඉදිකිරීම් | 0.50 | 0 | 1 | 1 | 1 | 0.50 | 0.49 | - | - | 98 |
| ආයෝජන වැව් 100 ක් මැණීම කටයුතු | 3.00 | 0 | 14 | 14 | 14 | 3.00 | 2.63 | - | - | 100 |
| ගෘහ භාණ්ඩ හා කාර්යාලිය උපකරණ | 0.50 | 0 | 1 | 1 | 1 | 0.50 | 0.40 | - | - | 100 |
| යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණ | 1.00 | 0 | 1 | 1 | 1 | 1.00 | 0.99 | - | - | 100 |
| දැනුම වර්ධනය හා ආයතනික සංවර්ධනය | 0.50 | 0 | 1 | 1 | 1 | 0.50 | 0.49 | - | - | 100 |
| **එකතුව** | **188.53** | **37** | **61** | **98** | **80** | **174.24** | **109.16** | **1.64** | **39.53** | **63** |

## 2017 වර්ෂයේ කාර්ය සාධනය ළඟා කර ගැනීම පිළිබඳ අදහස

2017 වර්ෂය තුළ මුදල් වියදම් කිරීමේදී වාරිමාර්ග නව ව්‍යාපෘති 80ක් පමණ ක්‍රියාත්මක කළ අතර ඉන් ව්‍යාපෘති 51ක් සම්පූර්ණයෙන්ම අවසන් කිරීමට හැකි වූ අතර ව්‍යාපෘති 29ක වැඩ අවසන් කිරීමට නොහැකි විය. වැව් මැනීමේ ව්‍යාපෘතිය යටතේ වැව් 14ක මැනුම් කටයුතු සිදුකර අවසාන පිඹුරුපත් පිළියෙල කිරීමට 2017 වර්ෂය තුළදී හැකි විය. මූලධන වත්කම් අත්පත්කර ගැනීම හා වැඩි දියුණු කිරීම යටතේ සිදු කරන ලද ගොඩනැගිලි ඉදි කිරීම් හා පුනරුත්ථාපන ව්‍යාපෘති 3ද අවසන් කරන ලදී. ඒ අනුව සමස්ත දෙපාර්තමේන්තු මූල්‍ය ප්‍රගතිය 81%ක් විය.

ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමග එක්ව රු.මි.33.4 පමණ වටිනාකමකින් යුත් ව්‍යාපෘති 87ක් සඳහා ඇස්තමේන්තු සකස් කිරීම අධීක්ෂණය කිරීම හා අවසාන බිල්පත් සකස් කිරීමේ කටයුතු ද සිදු කෙරිණි. විදේශ ව්‍යාපෘතියක්වන පාරිසරික සංවේදි කලාප සංරක්ෂණය කිරීම ප්‍රවර්ධනය කිරීම හා පරිසර පද්ධති සේවා නඩත්තුව යටතේ .රු.මි 34.6ක් යටතේ හබරවත්ත එල්ලංගා පද්ධතියට අදාල වාරි ව්‍යාපෘති 04ක අධීක්ෂණ කටයුතු කිරීම හා කොන්ත්‍රාත් පරිපාලනය හා ගෙවීම් කටයුතු සිදු කරන ලදි.

### කාර්යය සාධනය කරා ලඟා වීමේදී මුහුණ දුන් ගැටළු හා දුෂ්කරතා

පරිපූරක ප්‍රතිපාදන ලැබීම ප්‍රමාද වීම හේතුවෙන් ව්‍යාපෘති ආරම්භ කිරීම ප්‍රමාද විය. එබැවින් සමහර ව්‍යාපෘති 2018 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට සිදු විය. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ප්‍රධාන වශයෙන් සමහර ව්‍යාපෘති සඳහා ජලය ලබා ගැනීම ගැටළුකාරී තත්වයක් පැන නැගිනි. ඊට හේතු වූයේ පසුගිය වසර තුළ ප්‍රධාන වශයෙන් වර්ෂාව නොමැති වීමයි.

රජයේ යම් ප්‍රතිපත්තිමය තීරණ මත බොරළු, පස් හා පිඩලි සපයා ගැනීම දුෂ්කර කාර්යයක් වූ බැවින් සංවර්ධන ව්‍යාපෘතින් නියමිත කාලය තුළදී නිම කිරීමට අසීරු විය. එම නිසාම සමහර සංවර්ධන ව්‍යාපෘතින් ප්‍රමාද වී ඇත.

පළාත් තුළ සැලකිය යුතු කාර්යභාරයක් ඉටුකරන පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව සඳහා ස්ථිර ගණකාධිකාරවරයෙකු නොමැති වීම නිසාවෙන් ප්‍රායෝගික ගැටළු රැසකට මුහුණපෑමට සිදු වී ඇත. එසේ වුවද පැවති අපහසුතා යම් පමණකට මගහරවා ගැනීම තුළින් දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්යභාරය ඉටු කිරීමට හැකි වී ඇත.

# පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව 10.2

ඉඩම් පරිහරණය

| | අනුරාධපුර (හෙක්ටයාර) | පොළොන්නරුව (හෙක්ටයාර) | උතුරු මැද පළාත (හෙක්ටයාර) |
|---|---|---|---|
| ගෙවතු | 96,424 | 48,926.14 | 145,350.14 |
| කුඹුරු | 131,222 | 83,453.56 | 214,675.56 |
| පොල් | 1,865 | 873.24 | 2,738.24 |
| වෙනත් වගාවන් | 8,577 | 3374.99 | 11,951.99 |
| වනාන්තර | | | |
| • ඝණ | 199,428 | 163163.05 | 362,591.05 |
| • විවෘත | 15,922 | 4445.64 | 20,367.64 |
| • වගා කළ | 5,477 | 1718.68 | 7,195. 68 |
| • ලදු කැලෑ | 191,100 | 11473.13 | 202,573.13 |
| වගුරු බිම් | 2,542 | 4156.45 | 6,698.45 |
| ජලාශ | 55,241 | 16240.86 | 71,481.86 |
| ඉදිකිරීම් | 1,585 | 1229.44 | 2,814.44 |
| ගල්පර | 2,949 | 5576.66 | 8,525.66 |
| මුඩු බිම් | 82 | 2006.03 | 2088.03 |
| වෙනත්/සුසාන භූමි/මාර්ග | 5,486 | 0 | 5,486 |
| **එකතුව** | **717,900** | **346,637.86** | **1,064,537.87** |

### දැක්ම

"නීත්‍යානුකූල ඉඩමක් - සංවර්ධිත ප්‍රජාවක්".

### මෙහෙවර

"නෛතික රාමුවට අනුකූලව යෝග්‍ය රජයේ ඉඩම් සුදුසුකම් සහිත ප්‍රජාවට විධිමත්ව ලබාදීම, ඉඩම් සංවර්ධනය හා සංරක්ෂණය, රජයේ ඉඩම්වල සුරක්ෂිතභාවය සංර්ධනය, සියළු පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙවන් හා විනිවිදභාවයෙන් යුක්තව ක්‍රියාවට නැංවීම."

### දිගුකාලීන හා කෙටිකාලීන අරමුණු

#### දිගුකාලීන අරමුණු

- සුදුසුකම් සහිත ජනතාවට ඉඩම් හිමිකම නීත්‍යානුකූලව ලබා දීම.
- ඉඩම්වල වටිනාකම සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා හඳුනාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල යටිතල පහසුකම් සංවර්ධනය.
- අනාගත සංවර්ධන අවශ්‍යතා වෙනුවෙන් ඉඩම් සම්පත සුරක්ෂිත කිරීම.
- ගුණාත්මක සේවාවක් සැපයීම සඳහා නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය.
- ගුණාත්මක සහ කාර්යක්ෂම සේවාව ලබාදෙන ආයතනයක් ඇති කිරීම.
- පළාත් සභා ආදායම් ඉහළ නැංවීම.

#### කෙටිකාලීන අරමුණු

- වර්ෂයකදී දළ වශයෙන් හිමිකම් පත්‍ර 15000කට ආසන්න සංඛ්‍යාවක් ලබා දීම.

- සෑම වර්ෂයකමදීම එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන් ආවරණය වන පරිදි දැනුවත් කිරීමේ වැඩ සටහනක් පැවැත්වීම.
- දිස්ත්‍රික්ක දෙකම ආවරණය වන පරිදි එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක හෝ සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියා කිරීම.
- අනවසර අල්ලා ගැනීම් පෙර වර්ෂයට සාපේක්ෂව අවම කිරීම.
- වසරින් වසර විවිධාංගීකරණය කරන ලද පුහුණු වැඩසටහන් සැලසුම් කර විවිධ අංශයන්ගෙන් දැනුම ලබා දීම.
- ඵලදායිතා සංකල්ප හඳුන්වා දෙමින් ආයතනයේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම.
- පෙර වසරට වඩා ඉහළ හා හිඟ අවම වූ බදු ආදායමක් එකතු කිරීම.

## ප්‍රධාන කාර්යයන්

- යෝග්‍ය රජයේ ඉඩම් සුදුසුකම සහිත ප්‍රජාවට විධිමත්ව ලබා දීම සංවර්ධනය.
- ඉඩම් සංවර්ධනය හා සංරක්ෂණය.
- රජයේ ඉඩම්වල සුරක්ෂිතතාව සංවර්ධනය.
- ආයතනික ධාරිතා සංවර්ධනය.
- යහපාලන කටයුතු සංවර්ධනය.
- රජයට ලැබිය යුතු බදු මුදල් විධිමත්ව හා කාර්යක්ෂමව ලබා ගැනීම හා ඒ වෙනුවෙන් ක්‍රියා කිරීම.
- නව සංවර්ධන ව්‍යාපෘතීන් හඳුනා ගැනීම හා ඒ සඳහා සුදුසු ආයෝජකයින් යෙදවීම.

## ප්‍රධාන උපාය මාර්ගයන්

- ✓ 2008/04 චක්‍රලේඛයේ කටයුතු කාර්යක්ෂමව සිදු කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් වෙත අවශ්‍ය මානව, භෞතික, මූල්‍ය සම්පත් ලබා දීම.
- ✓ අනවසර අල්ලා ගැනීම් සම්බන්ධයෙන් විධිමත් වාර්තාකරණය සඳහා වැඩසටහන් සකස් කිරීම.
- ✓ විවිධ අංශයන්ගෙන් පිරිපුන් දැනුමක් සහිත පුද්ගලයින් බිහි වීම තුළින් ආයතනයේ කාර්යක්ෂමතාවය ඉහළ නංවා ගැනීම.
- ✓ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් බදු කරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන්.

## කාර්ය මණ්ඩල සංයුතිය

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අනුමත | 112 |
| 2 | සේවයේ නියුතු | 91 |
| 3 | පුරප්පාඩු | 20 |
| 4 | අනියම් | 01 |

### මෙහෙයුම් ප්‍රතිඵල - පුනරාවර්තන වියදම් -2017

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2017 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 52.27 | 49.67 | 2.60 | 95 |
| ගමන් වියදම් | 2.20 | 1.85 | 0.35 | 84 |
| සැපයිම් | 3.33 | 2.37 | 0.96 | 71 |
| නඩත්තු වියදම් | 1.40 | 1.18 | 0.22 | 84 |
| ගිවිසුම්ගත සේවා | 0.57 | 0.52 | 0.05 | 91 |
| මාරු කිරීම් | 0.69 | 0.68 | 0.01 | 97 |
| **එකතුව** | **60.46** | **56.27** | **4.19** | **93** |

### පුනරාවර්තන වියදම් දරමින් සංවර්ධන ස්වභාවයේ වැඩ ඉටු කිරිම.

| අංකය | ව්‍යාපෘතිය/වැඩසටහන | ප්‍රධාන ක්‍රියාකාරකම | අපේක්ෂිත ප්‍රතිඵල | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|
| 01 | ඉඩම් නිරවුල් කිරීමේ කඳවුර | මහජනතාව වෙත ගොස් ඔවුන්ගේ ඉඩම් ගැටළු හඳුනා ගැනීම/පැවරීම/මැනුම් නිරවුල් කිරීම්/දීමනා පත්‍ර බෙදා දිම | මහජනතාවගේ ඉඩම් ගැටළු විසඳීම | 2381 |

### මූලධන වියදම්


| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2017 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 0.50 | 0.50 | 0.00 | 100 |
| යන්ත්‍ර සූත්‍ර සවි කිරීම් හා උපකරණ | 9.40 | 9.29 | 0.11 | 98 |
| වෙනත් මූලධන වත්කම් පුනරාවර්තන හා වැඩිදියුණු කිරීම | 3.00 | 2.10 | 0.90 | 70 |
| එකතුව | **12.90** | **11.89** | **1.01** | **92** |

## ආදායම් ඉපයීම 2017

| ශීර්ෂය | ඉලක්කය (රු.මි) | සත්‍ය ආදායම (රු.මි) | එකතු කිරීමේ ප්‍රගතිය (%) |
|---|---|---|---|
| 20.02.01.03 ඉඩම් හා අනෙකුත් බලපත්‍ර ගාස්තු ,වෙනත් ඉපයීම් | 96 | 151.9 | 158 |

## සංවර්ධන වැඩ පිළිබඳ කාර්ය සාධනය - පසුගිය වසර 03ක ප්‍රාග්ධන වැයවීම් (වියදම්)

| වර්ෂය | PSDG (රු.මි) | PCDG (රු.මි) | මුළු වියදම (රු.මි) |
|---|---|---|---|
| 2015 | 4.91 | 1.96 | 6.87 |
| 2016 | 1.98 | - | 1.98 |
| 2017 | 3.03 | 8.87 | 11.9 |



## දිගුකාලීන හා කෙටිකාලීන අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ප්‍රධාන කාර්යයන් හා සම්බන්ධ ව්‍යාපෘති

| අරමුණ | ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් | ප්‍රතිලාභීන් ගණන | වෙන් කළ මුදල (රු.මි) | ප්‍රගතිය (%) | |
|---|---|---|---|---|---|---|
| | | | | | භෞතික | මූල්‍ය |
| සුජුතාම සහිත ඵලදායී ඉඩම් හිමිකම ක්‍රියාශීලීව ලබා දීම | • ජංගම සේවා වැඩසටහන් පැවැත්වීම.<br>• ඉඩම් නොමැති පුද්ගලයින් ලියාපදිංචි කර ගැනීම සඳහා වන මූලික සමීක්ෂණ හා ඉඩම් කච්චේරිය පැවැත්වීම.<br>• තේරී පත්වන ඉඩම්ලාභීන් සඳහා බලපත්‍ර/දීමනාපත්‍ර ලබා දීමට නියමු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.<br>• ඉඩම් කාර්යය සංග්‍රහයේ මූලික අවශ්‍යතාවයන් ලෙස දක්වා ඇති ඉඩම් නීතිය සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.<br>• තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ඉඩම් බදු ආදායම එකතු කිරීම,වාර්තා කිරිම හා ගිණුම්ගත කිරිම කඩිනම් කිරිම සඳහා අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>• රක්ෂිත හඳුනා ගැනීම සහ ඒවා නියාමනය කිරීමේ වැඩසටහන්<br>• පළාත් කාර්යාලය සහ ප්‍රා දේශීය ලේකම් කාර්යාලවල බලපත්‍ර, දීමනාපත්‍ර හා ඉඩම් ගැටළු සම්බන්ධ පසු කටයුතු හා ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම. | උතුරු මැද පළාතේ සියළු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය වන පරිදි ඉඩම් ගැටළු නිරාකරණය සඳහා ජංගම සේවා පැවැත්විම | 2381 | 05 | 73 | 73 |

| අරමුණ | ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් | ප්‍රතිලාභීන් ගණන | වෙන් කළ මුදල (රු.මි) | භෞතික (%) | මූල්‍ය (%) |
|---|---|---|---|---|---|---|
| ඉඩම්වල වටිනාකම සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා හඳුනාගත් ප්‍රාද්ශීය ලේකම් කොට්ඨාසවල යටිතල පහසුකම් සංවර්ධනය | ප්‍රවේශ මාර්ග සංවර්ධනය | මාර්ග මෝටර් ග්‍රේඩර්කර බොරළු යොදා සැකසීම | පවුල් 150 | 02 | 100 | 100 |
| ගුණාත්මක සේවාවක් සැපයීම සඳහා නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය | පුහුණු වැඩසටහන් පැවැත්විම | ඉඩම් නිල ධාරීන් හා සංවර්ධන නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරිම. | 61 | 01 | 60 | 63 |

## සංවර්ධන ව්‍යාපෘති මගින් කෙටිකාලීනව අපේක්ෂා කරන ප්‍රතිලාභ.

| අ. අ | ව්‍යාපෘතිය | කෙටිකාලීන බලපෑම(Outcome) |
|---|---|---|
| 01 | ඉඩම් නිරවුල් කිරීමේ කඳවුරු | • නිරවුල් හිමිකම් පත්‍රයක් හිමි පුද්ගලයින් බිහි වීම.<br>• එක් දිනයක දී ඉඩම් රාජකාරිවලට අදාල සියළු ආයතන මැදිහත්වී ජනතාවට කඩිනමින් සේවයක් සැපයිම. |
| 02 | නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් | • ඉඩම් කච්චේරිය හා මූලික සමීක්ෂණ පැවැත්විමේදී ඇතිවන ගැටළු අවම කර ගත හැකි වීම.<br>• පසුකාලීනව මායිම් ආරවුල් හා සංශෝධන ආදිය ඇති වීම අවම විම.<br>• ජනතාවට කාර්යක්ෂම සේවයක් සැපයීමට හැකි වීම. |

## මෙහෙයුම් සමාලෝචනය හා සංවර්ධන කාර්ය පිළිබඳ කාර්ය සාධනය

| අ.අ | ව්‍යාපෘතියේ නම | ව්‍යාපෘතියේ අරමුණ | නිමැවුම/ක්‍රියාකාරකම /ප්‍රගතිය | වියදම (රු.) |
|---|---|---|---|---|
| 1 | E-Land ව්‍යාපෘතිය | අංග සම්පූර්ණ විධිමත් හා යාවත්කාලීන කරන ලද දත්ත පද්ධතියක් තුළින් මහජනතාව වෙත කාර්යක්ෂම හා ඵලදායි සේවයක් සැපයිම.<br>1.රක්ෂිත හා අනෙකුත් රජයේ ඉඩම්වල සුරක්ෂිතතාව ඇති කිරිම.<br>2.ඉඩම් හිමිකම් පත්‍ර ලබාදීම කඩිනම් කිරීම.<br>3.බදු ආදායම් එකතු කිරීම විධිමත් කිරීම. | අංග සම්පූර්ණ ඉඩම් දත්ත පද්ධතියක් සහිත ජාලගත ක්‍රමවේදයකට සකස් වූ ඉඩම් හිමිකම් පතක් නිකුත් කිරීමේ ජාලගත තොරතුරු පද්ධතිය | 8,971,200 (ජාලගත කිරීමට අවශ්‍ය උපකරණ මිලදී ගැනිම) |
| 2 | රජයේ ඉඩම් කාර්ය හා නීති පිළිබඳව ප්‍රා.ලේ.කො මට්ටමින් නිලධාරීන් දැනුවත් කිරීමේ ව්‍යාපෘතිය | පසුකාලීනව මතුවන ගැටළු අවම කරමින් මහජනතාවට කාර්යක්ෂම සේවයක් සැපයිම සඳහා සන්නද්ධ වූ නිලධාරීන් පිරිසක් බිහි කිරීම. | •ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල මාණ්ඩලික නිලධාරින් ඉඩම් නිලධාරින්, සංවර්ධන නිලධාරීන්, කලමනාකරණ සහකාරවරුන් , ග්‍රාම නිලධාරින්. | 630,983 |

| අ.අ | ව්‍යාපෘතියේ නම | ව්‍යාපෘතියේ අරමුණ | නිමැවුම/ක්‍රියාකාරකම/ ප්‍රගතිය | වියදම (රු.) |
|---|---|---|---|---|
| 3 | ඉඩම් නිරවුල් කිරීමේ කඳවුරු පැවැත්වීමේ ව්‍යාපෘතිය | සුදුසුකම් සහිත ජනතාවට ඉඩම් හිමිකම නිත්‍යානුකූලව ලබාදීමට අවශ්‍ය කටයුතු කඩිනම් කිරීම සඳහා ජංගම සේවා වැඩසටහන් පැවැත්වීම. | •පවත්වන ලද ජංගම සේවාවන් ගණන 8කි.<br>•අනුරාධපුර -05 (ගල්නෑව,නොච්චියාගම, තිරප්පනේ,පලාගල, කැබිතිගොල්ලෑව)<br>•පොළොන්නරුව -03 (ඇළහැර/හිගුරක්ගොඩ/ මැදිරිගිරිය) | 3,651,754. |
| 4 | යටිතල පහසුකම් හා වත්කම් සංවර්ධනය | •බෙදාදෙන ලද ඉඩම් වල පහසුකම් නැංවීම සඳහා අභ්‍යන්තර මාර්ග,පාංශු සංරක්ෂණ ක්‍රම ,ඇලමාර්ග හා වැටි යෙදීම. | •මේ යටතේ මහවිලච්චිය,කහටගස්දිගි ලිය, හා හිගුරක්ගොඩ ප්‍රා.ලේ.කොට්ඨාශවල මාර්ග 3ක් මොටර් ග්‍රේඩර් කර බොරළු අතුරා ප්‍රතිසංස්කරණය කර ඇත. | 1,980,516 |

## 2014 -2017 වසර දක්වා ලබා ගෙන ඇති ප්‍රගතිය මෙන්ම 2018 වර්ෂයේදි ළඟාකර ගැනීමට අපේක්ෂිත ප්‍රගතිය - අනුරාධපුර දිස්ත්‍රික්කය

| විස්තරය | 2018 (අපේක්ෂිත) | 2017 | 2016 | 2015 | 2014 |
|---|---|---|---|---|---|
| රජයේ ඉඩම් ආඥා පනත යටතේ ඔප්පු ලබාදීමට මේ වන විට හඳුනාගෙන ඇති ඉඩම් කට්ටි සංඛයාව | 2900 | 5353 | 4673 | 4401 | 3947 |
| එම ආඥා පනත යටතේ දැනට නිකුත් කර ඇති දීර්ඝකාලීන බදු බලපත්‍ර සංඛ්‍යාව | 1022 | 149 | 170 | 144 | 122 |
| දීර්ඝ කාලීන බදු බලපත්‍ර වලින් එකතු කරන ආදායම (රු.මි) | 126.14 | 109.34 | 91.26 | 59.10 | 45.03 |
| ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍ර ලබාදීමට මේ වන විට හඳුනාගෙන ඇති ඉඩම් කට්ටි සංඛ්‍යාව | 9287 | 6963 | 6493 | 3539 | 3823 |

**2014 -2017 වසර දක්වා ලබා ගෙන ඇති ප්‍රගතිය මෙන්ම 2018 වර්ෂයේදි ළඟාකර ගැනීමට අපේක්ෂිත ප්‍රගතිය-අනුරාධපුර දිස්ත්‍රික්කය ඉතිරි කොටස...**

| විස්තරය | 2018 (අපේක්ෂිත) | 2017 | 2016 | 2015 | 2014 |
|---|---|---|---|---|---|
| එම ආඥා පනත යටතේ දැනට නිකුත් කර ඇති සංවර්ධන බලපත්‍ර සංඛ්‍යාව | 5214 | 3095 | 3211 | 3883 | 2917 |
| රජයේ ආයතන වල පරිහරණය සඳහා ලබා දී ඇති ඉඩම් සංඛ්‍යාව | 169 | 584 | 316 | 299 | 405 |
| රජයේ ආයතන වල පරිහරණය සඳහා ලබා දී ඇති ඉඩම් වලට අදාළව නිකුත් ඇති බලපත්‍ර සංඛ්‍යාව | 289 | 36 | 19 | 15 | 25 |
| ආගමික ස්ථාන සඳහා වෙන් කර ඇති ඉඩම් සංඛ්‍යාව | 233 | 389 | 217 | 194 | 218 |
| එම ඉඩම් වලින් දැනට බලපත්‍ර ලබා දී ඇති සංඛ්‍යාව | 94 | 23 | 15 | 25 | 27 |

පොළොන්නරුව දිස්ත්‍රික්කය 2014 -2017 වසර දක්වා ලබා ගෙන ඇති ප්‍රගතිය මෙන්ම 2018 වර්ෂයේදි ළඟාකර ගැනීමට අපේක්ෂිත ප්‍රගතිය.

| විස්තරය | 2018 (අපේක්ෂිත) | 2017 | 2016 | 2015 | 2014 |
|---|---|---|---|---|---|
| රජයේ ඉඩම් ආඥා පනත යටතේ ඔප්පු ලබාදීමට මේ වන විට හඳුනාගෙන ඇති ඉඩම් කට්ටි සංඛයාව | 864 | 42 | 36 | 111 | 21 |
| එම ආඥා පනත යටතේ දැනට නිකුත් කර ඇති දීර්ඝකාලීන බදු බලපත්‍ර සංඛ්‍යාව | 79 | 22 | 20 | 10 | 16 |
| දීර්ඝකාලීන බදු බලපත්‍රවලින් එකතු කරන ආදායම (රු.මි) | 15.13 | 12.04 | 1.48 | 0.66 | 1.79 |
| ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍ර ලබාදීමට මේ වන විට හඳුනාගෙන ඇති ඉඩම් කට්ටි සංඛ්‍යාව | 1656 | 212 | 57 | 76 | 2250 |
| එම ආඥා පනත යටතේ දැනට නිකුත් කර ඇති සංවර්ධන බලපත්‍ර සංඛ්‍යාව | 1624 | 3112 | 34 | 63 | 2195 |
| රජයේ ආයතන වල පරිහරණය සඳහා ලබා දී ඇති ඉඩම් සංඛ්‍යාව | 25 | 88 | 0 | 0 | 0 |
| රජයේ ආයතන වල පරිහරණය සඳහා ලබා දී ඇති ඉඩම් වලට අදාළව නිකුත් ඇති බලපත්‍ර සංඛ්‍යාව | 3 | 0 | 2 | 5 | 1 |
| ආගමික ස්ථාන සඳහා වෙන් කර ඇති ඉඩම් සංඛ්‍යාව | 11 | 55 | 0 | 0 | 0 |
| එම ඉඩම් වලින් දැනට බලපත්‍ර ලබා දී ඇති සංඛ්‍යාව | 12 | 9 | 2 | 0 | 0 |

කාර්ය සාධනය කරා ළඟා වීමේදී ප්‍රමාණවත් මානව සම්පතක් නොමැති විම සහ සමහර අංශ සම්බන්ධයෙන් දැනුම අඩු වීම වැනි ගැටළුවලට මුහුණ දීමට සිදු වුවද 2017 වර්ෂය තුළදී දෙපාර්තමේන්තුව සතු විෂය පථයට අදාල සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම තුළින් අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනිම අතින් සාධනිය මට්ටමක් කරා ළඟා විය හැකි විය.

මෙය හිස්ව තබන ලද පිටුවකි

# පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව

10.3

ග්‍රාමීය කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථාන -11

| |
|---|
| හොරොව්පතාන |
| මැදවච්චිය |
| රඹෑව |
| පදවිය |
| කැබිතිගොල්ලෑව |
| මිහින්තලේ |
| කැකිරාව |
| ඉපලෝගම |
| නොච්චියාගම |
| නාච්චාදූව |
| පලුගස්දමන |

ලිය සවිය මධ්‍යස්ථානය - 14

| | |
|---|---|
| තිරප්පනේ | වැලිකන්ද |
| හිඟුරක්ගොඩ | මැදිරිගිරිය |
| මධ්‍යම නුවරගම් පළාත | රඹෑව |
| කහටගස්දිගිලිය | කැබිතිගොල්ලෑව |
| ගල්නෑව | තලාව |
| පලුගස්වැව | රාජාංගනය |
| ඉපලෝගම | පදවිය |

ග්‍රාම සංවර්ධන සමිති පිළිබඳ තොරතුරු

| අංකය | ප්‍රාදේශිය ග්‍රාම සංවර්ධන කාර්යාලය | ග්‍රාම සං. සමිති සංඛ්‍යාව | මූල්‍ය වත්කම (රු) | තුලාන සංඛ්‍යාව | ගම් සංඛ්‍යාව | පවුල් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| 1 | නැ.නු.ප | 54 | 22,632,659 | 29 | 72 | 16,382 |
| 2 | ම.නු.ප | 32 | 2,159,575 | 40 | 181 | 15,721 |
| 3 | මහ විලච්චිය | 21 | 2,300,000 | 17 | 102 | 6,817 |
| 4 | නොච්චියාගම | 36 | 4,618,870 | 36 | 110 | 16,355 |
| 5 | රාජාංගනය | 21 | 870,000 | 21 | 53 | 10,521 |
| 6 | තඹුත්තේගම | 26 | 1,000,000 | 26 | 63 | 13,843 |
| 7 | ගල්නෑව | 35 | 2,425,259 | 30 | 71 | 11,374 |
| 8 | පලාගල | 35 | 907,402 | 35 | 98 | 11,124 |
| 9 | නාච්චාදූව | 37 | 4,389,525 | 19 | 49 | 7,995 |
| 10 | තලාව | 52 | 3,595,376 | 39 | 120 | 19,433 |
| 11 | ඉපලෝගම | 36 | 1,600,000 | 32 | 106 | 10,225 |
| 12 | කැකිරාව | 59 | 1,744,174 | 53 | 118 | 18,873 |
| 13 | මිහින්තලේ | 45 | 3,688,365 | 25 | 82 | 9,890 |
| 14 | තිරප්පනේ | 42 | 1,100,000 | 41 | 81 | 8,031 |
| 15 | පලුගස්වැව | 19 | 1,487,806 | 16 | 38 | 5,419 |
| 16 | හොරොව්පොතාන | 19 | 16,000,000 | 37 | 112 | 11,400 |
| 17 | ගලෙන්බින්දුනුවැව | 38 | 875,000 | 41 | 115 | 15,951 |
| 18 | කහටගස්දිගිලිය | 31 | 815,000 | 40 | 127 | 11,346 |

ග්‍රාම සංවර්ධන සමිති පිළිබඳ තොරතුරු ඉතිරි කොටස...

| අංකය | ප්‍රාදේශිය ග්‍රාම සංවර්ධන කාර්යාලය | ග්‍රාම සං. සමිති සංඛ්‍යාව | මූල්‍ය වත්කම (රු) | තුලාන සංඛ්‍යාව | ගම් සංඛ්‍යාව | පවුල් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| 19 | කැබිතිගොල්ලෑව | 38 | 1,222,000 | 26 | 103 | 8,118 |
| 20 | පදවිය | 45 | 3,850,000 | 15 | 45 | 6,520 |
| 21 | මැදවච්චිය | 44 | 15,060,101 | 37 | 112 | 16,309 |
| 22 | රඹෑව | 38 | 2,675,000 | 38 | 104 | 11,853 |
| **අනුරාධපුර** | | **803** | **95,016,112** | **693** | **2,062** | **263,500** |
| 23 | තමන්කඩුව | 53 | 6,400,000 | 56 | 117 | 23,259 |
| 24 | හිඟුරක්ගොඩ | 54 | 4,060,998 | 53 | 140 | 19,211 |
| 25 | මැදිරිගිරිය | 87 | 9,064,158 | 45 | 111 | 20,195 |
| 26 | ලංකාපුර | 31 | 10,002,000 | 28 | 51 | 11,381 |
| 27 | වැලිකන්ද | 34 | 4,500,000 | 29 | 48 | 12,120 |
| 28 | දිඹුලාගල | 49්6 | 9,500,000 | 56 | 90 | 24,745 |
| 29 | ඇළහැර | 33 | 9,893,398 | 28 | 89 | 10,797 |
| **පොළොන්නරුව** | | **338** | **53,420,554** | **295** | **646** | **121,708** |
| **මුළු එකතුව** | | **1141** | **148,436,666** | **988** | **2,708** | **385,208** |

### දැක්ම

"උරුමය සුරකින පිරිපුන් ගමක්, සෞභාග්‍යමත් පළාතක්."

### මෙහෙවර

"උරුමය සුරකින පිරිපුන් ගමක් බිහි කිරීම සඳහා ප්‍රජාව සංවිධානගත කිරීම, ආයතනගත කිරීම හා දැනුම ආකල්ප හා කුසලතාවලින් සන්නද්ධ කිරීම සහ ග්‍රාම සංවර්ධනයට අත්‍යවශ්‍ය යටිතල පහසුකම් සියලු පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් හා විනිවිද භාවයකින් යුක්තව සංවර්ධනය කිරීම".

### දිගුකාලීන හා කෙටිකාලීන අරමුණු

### දිගුකාලීන අරමුණු

- සාරධර්ම සුරකින සමාජයක් බිහි කිරීම.
- පාරම්පරික තාක්ෂණ ශිල්පීය දැනුම, දේශීය සම්පත්, සුරැකිව උපයෝගී කොටගෙන ග්‍රාමීය සංවර්ධනය සිදු කිරීම තුළින් යහපත් පරිසරයක් මතු පරපුරට දායාද කිරීම.

- අභිමානවත් සංස්කෘතියක හිමිකරුවන් ලෙස සමාජයට අවබෝධයක් ලබා දෙමින් තිරසාර සංවර්ධනයක් සඳහා සමාජය පෙළ ගැස්වීම.
- ප්‍රජාව තුළ ගුණාත්මක සහ ධනාත්මක ආකල්ප වර්ධනය හා හැකියාවන් වර්ධනය කොට යහපත් ගෘහණියක් බවට පත් කිරිම.
- රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන අතර සම්බන්ධීකරණයක් ගොඩ නගා එහි යහපත් ප්‍රතිපල ජනතාවට ලැබිමට සැලැස්විම.
- ග්‍රාමීය ප්‍රජාව තුළ සවිමත් ආර්ථිකයක් ඇති කිරිම සඳහා පහසුකම් සැලසිම.

## කෙටිකාලින අරමුණු

- ග්‍රාම සංවර්ධන සමිති , කාන්තා සමිති ශක්තිමත් කිරිම.
- ග්‍රාමීය යටිතල පහසුකම් වැඩි දියුණු කිරිම තුළින් ග්‍රාමීය නිෂ්පාදන ඉහළ නැංවිම.
- පාසැල් හැර ගිය තරුණ තරුණියන්ගේ කුසලතා හා ආකල්ප වර්ධනය කිරිම.
- ග්‍රාමීය ප්‍රජාව තුළ ජිවන වින්දනයක් ඇති කිරිම තුළින් ක්‍රියාශිලි ප්‍රබෝධමත් පවුල් ඒකක ඇති කිරිම.

## ප්‍රධාන කාර්යයන්

- ග්‍රාම සංවර්ධන සමිති පිහිටුවිම හා පවත්වාගෙන යාම .
- ග්‍රාම සංවර්ධන ප්‍රාදේශිය සංගම් හා දිස්ත්‍රික් සංගම් පිහිටුවීම හා පවත්වාගෙන යාම හා සමිති ව්‍යවසායකයන් නඟා සිටුවීම, ග්‍රාමීය නායකයින් දැනුවත් කිරීම, ග්‍රාම සංවර්ධන දින සැමරුම හා සමිති ඇගයීම.
- කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථාන සහ ලියසවිය මධ්‍යස්ථාන මගින් මැහුම් පාඨමාලා පවත්වාගෙන යාම කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථාන නිර්මාණ ඇගයීම .
- අඩු රාජ්‍ය මැදිහත් විමෙන් වැඩි ග්‍රාමිය සම්පත් සහ ශ්‍රම දායකත්වයෙන් සංවර්ධන ව්‍යාපෘති නිම කිරිම (ග්‍රාමීය කෘෂි ප්‍රවේශ මාර්ග සඳහා බෝක්කු ඉදිකිරීම/ග්‍රාමීය පුස්තකාල නඟා සිටුවීමේ ව්‍යාපෘතිය)
  - දැහැමි නිවහන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.
  - ගම්දොර අභියස වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
  - ශ්‍රමාභිමානි නිවාස ව්‍යාපෘතිය.
  - කාන්තා අභිවෘද්ධී මධ්‍යස්ථාන සඳහා මහන මැෂින් ලබාදීම.
  - කාන්තා අභිවෘද්ධී මධ්‍යස්ථානය ඉදිකිරීම.
  - පුහුණු වැඩසටහන.
  - ග්‍රාම සංවර්ධන දත්ත පද්ධතිය

**ප්‍රධාන උපාය මාර්ගයන්**

පළාත් සභාව විසින් සපයනු ලබන

- පළාත් සභා සංවර්ධන ප්‍රදාන
- පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන
- ග්‍රාම සංවර්ධන සමිති සතු අරමුදල්

අරමුදල් උපයෝගී කරගනිමින් හා ග්‍රාම සංවර්ධන නිලධාරින්ගේ සම්බන්ධීකරණයෙන් ග්‍රාම සංවර්ධන සමිතිවල නිලධාරීන්ගේ සහ සාමාජිකයින්ගේ සහභාගිත්වයෙන් මැහුම් උපදේශිකාවන්ගේ උපදෙස් හා මගපෙන්වීම අනුව කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථාවල පුහුණුලාභින්ගේ හැකියාවන් ප්‍රවර්ධනය.

**කාර්ය මණ්ඩල සංයුතිය**

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | අනුමත | 89 |
| 02 | සේවයේ නියුතු | 57 |
| 03 | පුරප්පාඩු | 32 |

**මෙහෙයුම් ප්‍රතිඵල - පුනරාවර්තන වියදම්**


| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (රු.මි) | 2017 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| පුද්ගල පඩි නඩි | 28.7 | 28.68 | 0.02 | 99.93 |
| ගමන් වියදම් | 1.20 | 1.20 | - | 100 |
| සැපයීම් | 0 .88 | 0.76 | 0.12 | 86.36 |
| නඩත්තු වියදම් | 0 .54 | 0.39 | 0.15 | 72.22 |
| ගිවිසුම්ගත සේවා | 0.68 | 0.47 | 0.21 | 30.88 |
| මාරු කිරීම් | 0.46 | 0.36 | 00.1 | 78.26 |
| වෙනත් | 0.94 | 0.93 | 0.01 | 98.94 |
| **එකතුව** | **33.4** | **32.79** | **0.61** | **98.17** |

**මූලධන වියදම්**

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2017 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 5.00 | 2.65 | 2.35 | 53 |
| යන්ත්‍ර සූත්‍ර සවි කිරීම් හා උපකරණ | 2.35 | 2.24 | 0.11 | 95 |
| වෙනත් මූලධන වත්කම් පුනරාවර්තන හා වැඩිදියුණු කිරීම | 4.80 | 4.80 | - | 100 |
| **එකතුව** | **12.15** | **9.69** | **2.46** | **80** |

## සංවර්ධන වැඩකටයුතු පිළිබඳ කාර්යය සාධනය – පසුගිය වසර 03 ක ප්‍රාග්ධන වැයවීම්

| වර්ෂය | PSDG (රු.මි) | PCDG (රු.මි) | මුළු වියදම (රු.මි) |
|---|---|---|---|
| 2015 | 12.00 | 2.10 | 14.10 |
| 2016 | 15.00 | 5.00 | 20.00 |
| 2017 | 25.00 | 2.90 | 27.90 |




**2017** වර්ෂයේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කළ අතර ,පළාතේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකටම සාධාරණීයත්වයක් ඉටුවන අයුරින් වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. මෙහිදී දෙපාර්තමේන්තුවේ පවතින උග්‍ර කාර්යය මණ්ඩලය ඌනතාවය නිසා සැලසුම් කළ පරිදි කාර්යයන් නියමිත වේලාවට අවසන් කිරීමට නොහැකි විය.දෙපාර්තමේන්තුවේ ග්‍රාම සංවර්ධන නිලධාරීන් ,සංවර්ධන නිලධාරීන්, කළමණාකරන නිලධාරීන් 32කගේ පුරප්පාඩු සම්පූර්ණ කරගැනීමට නොහැකි විය. නමුත් වර්ෂය පුරා සේවයේ නියුතු නිලධාරීන්ගේ කැප වීම තුළ කාර්ය සාධන මට්ටම උසස් මට්ටමකින් පවත්වාගෙන යාමට ද හැකිය.

### දිගුකාලීන හා කෙටිකාලීන අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘති

| අංකය | අරමුණ | ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | ප්‍රධාන ක්‍රියාකාරකම | වෙන්කළ මුදල (රු.මි) | ප්‍රගතිය(%) | |
|---|---|---|---|---|---|---|
| | | | | | භෞතික | මූල්‍ය |
| 1 | පවුල්වල සමාජිකයින්ගේ දැනුම වර්ධනය කිරීමේ වැඩමුළු එම පවුල් මඟින් කාබනික ගෙවත්තක් නිර්මාණය කිරිම හා ගැමි ආර්ථික ස්වයං පෝෂිත වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | දැහැමි නිවහන ව්‍යාපෘතිය. . | ප්‍රා.ලේ.කො 29 කින් එක් ගම්මානය බැගින් තෝරාගෙන මූලික දැනුවත් කිරීම් වලින් පසු තෝරාගනු ලැබූ පවුල් මඟින් කාබනික ගෙවත්තක් නිර්මාණය කළ යුතු අතර ,ඒ සඳහා අවශ්‍ය බීජ වර්ග , උර ආදී අනෙකුත් අවශ්‍යතා සපයා ගැනීම සඳහා දෙපාර්තමේන්තුව මඟින් සමිතිය වෙත මූල්‍යාධාර ලබා දීම. | 1.48 | 100 | 82 |

| අංකය | අරමුණ | ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් | වෙන් කළ මුදල (රු.මි) | ප්‍රගතිය (%) | |
|---|---|---|---|---|---|---|
| | | | | | භෞතික | මූල්‍ය |
| 2 | ස්වෝත්සාහයෙන් නැගී සිටීමට උත්සාහ දරන සාමාජික පිරිස් හඳුනාගෙන, පුහුණුව ලබාදී මූල්‍යාධාර සමිති වලට සපයා එමඟින් අදාළ පුද්ගලයින් ප්‍රවර්ධනය කිරීම | ව්‍යවසායකයි න් නගා සිටුවීම. | ස්වෝත්සාහයෙන් නැගී සිටීමට උත්සහ දරන සාමාජික පිරිස් හඳුනාගෙන එක් කොට්ඨාසයකින් 05 දෙනකු බැගින් කොට්ඨාශ 19 කින් 75 තෝරා පුහුණුව ලබාදී මූල්‍යාධාර අදාළ පුද්ගලයින් සඳහා ලබා දීම. | 0.98 | 100 | 100 |
| 3 | සමිති නායකයින් සඳහා සමිති කටයුතු පිළිබඳ හා ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය පිළිබඳව දැනුවත් කිරීම | ග්‍රාමීය නායකයින් දැනුවත් කිරීම. | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 19ක තෝරාගත් සමිති නායකයින් සමිති කටයුතු පිළිබඳ හා ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය පිළිබඳ දැනුවත් කිරීම. | 0.45 | 100 | 100 |
| 4 | කෘෂි ප්‍රවේශ මාර්ග සඳහා බොක්කු ඉදිකිරීම | ග්‍රාමීය මාර්ග සඳහා බෝක්කු ලබා දීම. | සංවර්ධනය නොවූ කෘෂි ප්‍රවේශ මාර්ගවලට බෝක්කුවක් සපයා ගැනීම සඳහා රු. 40000ක මුදලක් සමිතියට දෙනු ලබන අතර ප්‍රජාවගේ සහභාගිත්වයෙන් බෝක්කු ඉදිකරනු ඇත.(ප්‍රා.ලේ.කො.19) | 1.5 | 100 | 82 |
| 5 | ග්‍රාමීය පුස්තකාල ඇතිකිරීම තුළින් ග්‍රාමීය ජනතාවගේ දැනුම ආකල්ප වර්ධනය කිරීම | ග්‍රාමීය පුස්තකාල ව්‍යාපෘතිය. | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 29 දුෂ්කර ගම්මානවල තෝරාගත් එක් සමිතියක් විසින්, පොදු ස්ථානයක්, පුටු,කබඩ් ආදිය සපයා ගත යුතු අතර ,සමිතිය විසින් පුස්කාල භාරකරුවකු පත්කර ගැනීමෙන් දෙපාර්තමේන්තුව විසින් පුස්තකාල භාරකරු පුහුණු කරනු ඇත. අනතුරුව ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පොත් කට්ටලයක් සමිතිය වෙත ලබා දෙනු ලැබේ. | 0.93 | 100 | 99 |
| 6 | ප්‍රජාවගේ කුසලතා හා හැකියාවන් ඇගයීමටත් සාරධර්ම සුරැකිව පවත්වාගෙන යාම සඳහා ගම්දොර කලා මංගල්‍ය පැවැත්වීම. | ගම්දොර අභියස ව්‍යාපෘතිය. | | 6.00 | 100 | 99 |

දිගුකාලීන හා කෙටිකාලීන අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘති ඉතිරි කොටස...

| අංකය | අරමුණ | ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | මුදල (රු.මි) | භෞතික (%) | මූල්‍ය (%) |
|---|---|---|---|---|---|
| 7 | ග්‍රාම සංවර්ධන ව්‍යාපාරයේ වෘත්තීය පුහුණු අංශය හා සමිති පිළිබඳව මූලික දැනුවත් කිරීම | ග්‍රාම සංවර්ධන දින සැමරුම හා සමිති ඇගයීම. | 1.00 | 100 | 100 |
| 8 | චක්‍රීය ණය මූල්‍ය පහසුකම් අඩු පොලී අනුපාතයක් ඔස්සේ ණය පහසුකම් සලසනවා ඇත | දිස්ත්‍රික් සංගම් බල ගැන්වීම. | 0.8 | 100 | 100 |
| 9 | නිර්මාණ ඇගයීමකට ලක්කිරීම | කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථාන නිර්මාණ ඇගයීම | 0.30 | 100 | 100 |
| 10 | අඩු ආදයම්ලාභී නිවාස හිමියන් නගා සිටුවීම | ශ්‍රමාභිමානී නිවාස ව්‍යාපෘතිය | 2.23 | 100 | 93 |

දිගුකාලීන හා කෙටිකාලීන අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ව්‍යාපෘති ඉතිරි කොටස...

| | | | | | |
|---|---|---|---|---|---|
| 11 | ලිය සවිය සම්පත් දායක දීමනා ගෙවීම | ලිය සවිය ව්‍යාපෘතිය | 1.87 | 100 | 97 |
| 12 | ගොඩනැගිලි අවශ්‍යතා සම්පූර්ණ කිරීම | කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීම - දෙවන අදියර | 2.65 | 100 | 99 |
| 13 | ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තු සියලු කටයුතු එකරාශි කොට යාවත්කාලීන කිරීම | ග්‍රාම සංවර්ධන දත්ත පද්ධතිය දෙවන අදියර | 0.72 | 100 | 97 |
| 14 | දැනුම,ආකල්ප ,කුසලතා වර්ධනය කිරීම | පුහුණු වැඩසටහන | 0.63 | 100 | 87 |
| 15 | පහසුකම් වැඩිදියුණු කිරීම | ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ බිම්මහලේ නවීකරණ කටයුතු | 2.35 | 100 | 100 |
| 16 | අවශ්‍යතා සපුරාලීම | ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා කාර්යාලීය උපකරණ ලබාදීම. | 0.50 | 100 | 100 |
| 17 | අවශ්‍යතා සපුරාලීම | ග්‍රාම සං. දෙපා. ඉහළ මාලයේ නවීකරණය | 2.44 | 100 | 100 |

2017- පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් උතුරු මැද පළාත පුරා ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති තුළින් පළාතේ ජනතාවට දිගුකාලීනව අරමුණු ඉටුකර ගැනීමේ හැකියාව ලැබී ඇත

## 2017 වර්ෂය තුළදී සාර්ථකව නිම කරන ලද ව්‍යාපෘති

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | |
|---|---|---|
| 01 | ග්‍රාමීය කෘෂි ප්‍රවේශ මාර්ග<br>සඳහා<br>බෝක්කු ලබා දීමේ ව්‍යාපෘතිය. |  |
| 02 | ව්‍යවසායකයින්<br>නඟා සිටුවීමේ<br>ව්‍යාපෘතිය. |  |
| 03 | සපිරි ගම්දොර ව්‍යාපෘතිය<br>හා<br>ගම්දොර අභියස ව්‍යාපෘතිය. |  |
| 04 | ශ්‍රමදාන<br>වැඩසටහන් පැවැත්වීම. |  |
| 05 | දැහැමි නිවහන<br>දැනුවත් කිරීමේ වැඩසටහන්. |  |

| | | |
|---|---|---|
| 06 | මහන මැෂින්<br>ලබාදීමේ ව්‍යාපෘතිය |  |
| 07 | ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තු<br>සමස්ත කෘතිය<br>නිර්මාණය කිරීමේ වැඩසටහන |  |
| 08 | කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථානවල<br>පවත්වාගෙන යනු ලබන මැහුම් පාඨමාලා<br>ව්‍යාපෘතිය |  |
| 09 | ශ්‍රමාභිමානි නිවාස ව්‍යාපෘතිය / ගම්දොර<br>නිවාස ව්‍යාපෘතිය |  |

**ග්‍රාම සංවර්ධන සමිති පිහිටුවීම හා පවත්වාගෙන යාම**

අනුරාධපුර දිස්ත්‍රික්කය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 22කින් සහ පොළොන්නරුව දිස්ත්‍රික්කය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 07කින් සමන්විත වේ. ඒ අනුව උතුරු මැද පළාත තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 29 ක් ඇති අතර ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ ග්‍රාම සංවර්ධන සමිති පවත්වාගෙන යනු ලබයි.

### ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ක්‍රියාත්මක ග්‍රාම සංවර්ධන සමිති.

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ග්‍රාම සංවර්ධන සමිති සංඛ්‍යාව |
|---|---|---|
| 01 | නැගෙනහිර නුවරගම් පළාත | 36 |
| 02 | මධ්‍යම නුවරගම් පළාත | 19 |
| 03 | මහ විලච්චිය | 17 |
| 04 | නොච්චියාගම | 13 |
| 05 | රාජාංගනය | 11 |
| 06 | තඹුත්තේගම | 15 |
| 07 | ගල්නෑව | 15 |
| 08 | පලාගල | 17 |
| 09 | නාච්චාදූව | 35 |
| 10 | තලාව | 20 |
| 11 | ඉපලෝගම | 11 |
| 12 | කැකිරාව | 22 |
| 13 | මිහින්තලය | 28 |
| 14 | තිරප්පනේ | 17 |
| 15 | පලුගස්වැව | 10 |
| 16 | හොරොව්පොතාන | 07 |
| 17 | ගලෙන්බිඳුණුවැව | 14 |
| 18 | කහටගස්දිගිලිය | 13 |
| 19 | කැබිතිගොල්ලෑව | 08 |
| 20 | පදවිය | 07 |
| 21 | මැදවච්චිය | 15 |
| 22 | රඹෑව | 30 |
| | අනුරාධපුර දිස්ත්‍රික්කය | 380 |
| 23 | තමන්කඩුව | 25 |
| 24 | හිඟුරක්ගොඩ | 32 |
| 25 | මැදිරිගිරිය | 23 |
| 26 | ලංකාපුර | 23 |
| 27 | වැලිකන්ද | 18 |
| 28 | දිඹුලාගල | 16 |
| 29 | ඇළහැර | 18 |
| | පොළොන්නරුව දිස්ත්‍රික්කය | 155 |
| | උතුරු මැද පළාත | 535 |

ග්‍රාම සංවර්ධන ප්‍රාදේශිය සංගම් හා දිස්ත්‍රික් සංගම් පිහිටුවීම හා පවත්වාගෙන යාම හා සමිති ව්‍යවසායකයන් නඟා සිටුවීම, ග්‍රාමීය නායකයින් දැනුවත් කිරීම, ග්‍රාම සංවර්ධන දින සැමරුම හා සමිති ඇගයීම.

උතුරු මැද පළාතේ අනුරාධපුර හා පොළොන්නරු දිස්ත්‍රික්කයේ අනුරාධපුර දිස්ත්‍රික් සංගමය හා පොළොන්නරු දිස්ත්‍රික් සංගමය වශයෙන් දිස්ත්‍රික් සංගම් දෙකක් පිහිටුවා ඇත. එම දිස්ත්‍රික් සංගම් දෙක යටතේ ප්‍රාදේශිය සංගම් 29 ක් ද ඇත. ප්‍රාදේශිය සංගම් 29 යටතේ 535 ක් වූ ග්‍රාම සංවර්ධන සමිති පිහිටුවා ඇත.

සියලු ග්‍රාම සංවර්ධන සමිතිවල ප්‍රධාන නිලධාරීන් (භාණ්ඩාගාරික/ලේකම්/සභාපති ) තිදෙනාගේ එකතුවෙන් ප්‍රාදේශිය සංගමය සෑදී ඇත.එසේම ප්‍රාදේශිය සංගම්වල ප්‍රධාන නිලධාරීන්ගෙන් දිස්ත්‍රික් සංගමය සෑදී ඇත.

ග්‍රාම සංවර්ධන ව්‍යාපාර තුළ ක්‍රියාත්මක ග්‍රාම සංවර්ධන සමිති තුළින් , එම සමිති වල සිටින සියලු සාමාජික පිරිස්ගේ පවුල්වල ජීවන මට්ටම ඉහළ නැංවීමේ හා ස්වයං රැකියා අවස්ථා ඉහළ නැංවීමේ අවස්ථාව .(**චක්‍රීය ණය වැඩසටහන**) යටතේ උදා වී ඇත. අඩු පොලි ක්‍රමයට සහනදායි ලෙස ණය ලබා දීම තුළින් සමස්ථ උතුරු මැද ජනතාවගේ දුගී දුප්පත් භාවය තුරන් වි යනු ඇත.

**2017 වසරේ ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සමිති ව්‍යවසායකයින් නඟා සිටුවීමේ ව්‍යාපෘතිය හා ග්‍රාමීය නායකයින් දැනුවත් කිරීමේ ව්‍යපෘතිය**

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | නිමකල වැඩසටහන් ගණන | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ගණන | ප්‍රතිලාභීන් ගණන | ලබාදුන් මුදල (රු.මි) |
|---|---|---|---|---|---|
| 01 | සමිති ව්‍යවසායකයින් නඟා සිටුවීම | 17 | 17 | 74 | 740000.00 |
| 02 | ග්‍රාමීය නායකයින් දැනුවත් කිරීම | 05 | 19 | 19 | 450000.00 |
| 03. | ග්‍රාම සංවර්ධන දින සැමරුම හා සමිති ඇගයීම | (29*3) = 87 | 29 | සමිති 87 හි (භාණ්ඩාගාරික /ලේකම්/ සභාපති ඇතුළුව) සාමාජික පිරිස | 1000000.00 |

2017 - ග්‍රාම සංවර්ධන සමිති ව්‍යවසායකයින් නඟා සිටුවීම ව්‍යාපෘතිය යටතේ දෙපාර්තමේන්තුව විසින් ආධාර ලබා දුන් තඹුත්තේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගඩොල් කර්මාන්තය, සුරතල් මත්ස්‍ය වගාව, බිම්මල් වගාව, කුකුල් පාලනය, පදවිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගොටුකොළ වගාව, විලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කුකුල් පාලනය, ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බිම්මල් වගාව, තඹුත්තේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ විසිතුරු මල් වගාව, නාච්චාදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉදල් නිෂ්පාදනය, කැකිරාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සුර නිෂ්පාදනය, කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථාන සහ ලියසවිය මධ්‍යස්ථාන මගින් මැහුම් පාඨමාලා පවත්වාගෙන යාම කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථාන නිර්මාණ ඇගයීම

2017 වසරේ කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථාන 39ක් හා ලියසවිය මධ්‍යස්ථාන 10ක් පවත්වාගෙන යන ලදි. ඒ අනුව වසර අවසානයේ නිර්මාණ ඇගයීමක් පවත්වන ලදි. සියලුම කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථාන හා ලියසවිය මධ්‍යස්ථානවල දක්ෂ සිසුන්ගේ නිර්මාණ සියල්ල ප්‍රදර්ශනයකට තබා ඒ අතුරින් තෝරාගත් නිර්මාණ ඇගයීමකට භාජනය කොට ප්‍රථම ,දෙවන සහ තෙවන ස්ථාන සඳහා සහතිකපත් පිරිනමන ලදි.

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | නිමකළ වැඩසටහන් ගණන | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ගණන | ප්‍රතිලාභීන් ගණන | ලබා දුන් මුදල (රු) |
